# ගෝලත්වය



ක්‍රිස්තු චරිතය වැලඳගැනීමට ප්‍රායෝගික අත්පොතක්

Copyright 2005 Grace Communion International. www.gci.org

**ගෝලත්වය 101**
**ඒකකය 1 අ**



# දෙවියන්වහන්සේ හැඳින්වීම

කිතුනුවන් ලෙස, දෙවියන්වහන්සේ සිටින්නා වූ (පවතින්නා වූ) කෙනෙක් යන්න අපගේ මූලික විශ්වාසයකි. දෙවියන්වහන්සේ යනු අප ගැන සලකන්නා වූ, අප කරන දේවල් පිළිබඳ සලකන්නා වූ, අපගේ ජීවිතවලට සම්බන්ධ වී සිටින්නා වූ තැනැන්වහන්සේ වන සේක. උන්වහන්සේ සියලු දේ මැවූ, බලවන්ත වූ ආත්මයක් සහ උන්වහන්සේගේ යහපත්කම නිසා අපට සදාකාලික ජීවනය දෙන්නා වූ දෙවියන්වහන්සේ වන සේක.

මනුෂ්‍යයින්ට දෙවියන්වහන්සේ සම්පූර්ණ ලෙස තේරුම් ගත නොහැකිය. එහෙත් අපට දෙවියන්වහන්සේ කවුද සහ උන්වහන්සේ අපගේ ජීවිතවල කරන්නේ කුමක්ද යන්න තේරුම් ගැනීමට ස්ථිර ආරම්භක කරුණක් තිබිය හැකි ය. නව ඇදහිලිවන්තයෙකු හට ඉතා වැදගත් වන දෙවියන්වහන්සේගේ ගුණාංග වෙත අවධානය යොමු කරමු.

## උන්වහන්සේගේ පැවැත්ම

බොහෝ මනුෂ්‍යයින්ට, දිගුකාලීන ඇදහිලිවතුන්ට පවා. දෙවියන්වහන්සේගේ පැවැත්ම පිළිබඳ ඔප්පු කිරීමක් අවශ්‍යය. එහෙත්, සෑම පුද්ගලයෙක්ම ඒත්තු ගන්නා ලෙස දෙවියන්වහන්සේගේ පැවැත්ම පිළිබඳ "ඔප්පු" කිරීමට කිසිම ක්‍රමයක් නැත. සාධක පිළිබඳ කතා කිරීම ඔප්පු කිරීම පිළිබඳ කතා කිරීමට වඩා යෝග්‍ය ය. එම සාධක තුළින් දෙවියන්වහන්සේ පවතින්නා වූ/ සිටින්නා වූ කෙනෙක් බවට සහ බයිබලයේ විස්තර කරන ආකාරයේ පුද්ගලයෙක් බවට අපට සහතික කරන බව නිසැකය.

දෙවියන්වහන්සේ "තමන්වහන්සේ ගැන සාක්ෂි නොදී නොසිටිය සේකැයි", පාවුල්තුමා ලුස්ත්‍රාවේ දී පැවසීය (ක්‍රියා 14:17). එසේ නම්, එම සාධක මොනවා ද?

**මැවිල්ල** : ගීතාවලිය 19 : 1 මෙලෙස පවසයි. "අහස දෙවියන්වහන්සේගේ මහිමය ප්‍රකාශ කරයි". රෝම 1 : 20 මෙලෙස පවසයි. "මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදාකාලික වූ බලය සහ දේවිකම මවන ලද දේවලින් තේරුම් ගොස් පැහැදිලි ලෙස පෙනී යන්නේ ය". මුළු මැවිල්ලම දෙවියන්වහන්සේ පිළිබඳ යමක් අපට පවසයි.

පොළොව, ඉර සහ තරු ඒවා පවතින ආකාරයට තිබෙන පිණිස යම් දෙයක් හේතු වූවා යයි විශ්වාස කිරීම හේතු සහගත වේ. විශ්වය මහත් වූ පිපිරීමකින් ආරම්භ වූ බව විද්‍යාඥයෝ

පවසති. යමක් පිපිරීමට හේතුවක් ඇති බව විශ්වාස කිරීම යුක්ති සහගතය. අප විශ්වාස කරන පරිදි ඒ දෙවියන්වහන්සේ වන සේක.

**නිර්මාණය**

භෞතික නීතිවලට අනුව මැවිල්ල පිළිවෙළක ලකුණු පෙන්නුම් කරයි. විවිධ දේවල්, සංසිද්ධීන් විවිධත්වයෙන් යුතු නම්, පොළොව පවතින්නේ නැත. එසේම, මනුෂ්‍යයා පවතින්නේ ද නැත. පොළොවේ ප්‍රමාණය නැතහොත් කක්ෂය වෙනස් නම්, මෙම ග්‍රහලෝකයේ මිනිසුන්ට ජීවත් වීමට සුදුසු තත්වයක් පවතින්නේ නැත. සමහර මිනිසුන් සිතන්නේ මෙය විශ්වයේ අහඹුවක් ලෙස ය. තවත් අය වඩාත්ම හේතු සහගත පැහැදිලි කිරීම වූ කලි සෞර ග්‍රහමණ්ඩලය බුද්ධිමත් මැවුම්කරුවෙකුගේ නිර්මාණයක් බව විශ්වාස කරති.

**ජීවිතය**

ජීවිතය විශ්වාස කළ නොහැකි සංකීර්ණ රසායනික ද්‍රව්‍ය සහ ඒවායේ ප්‍රතික්‍රියා මත පදනම් වී ඇත. සමහර මිනිස්සු විශ්වාස කරන්නේ ජීවිතයට බුද්ධිමය හේතුවක් ඇති බවයි. අනෙක් අය එය අහම්බෙන් ඇති වූ බව සිතති. තවත් අයට විද්‍යාඥයින් විසින් අවසානයේ දී දෙවියන්වහන්සේ නොවන මූලාරම්භයක් ජීවිතය සඳහා පෙන්නුම් කරනු ඇතැයි විශ්වාසයක් පවති. එහෙත් බොහෝ මිනිසුන් හට ජීවිතයේ පැවැත්ම වූ කලි, දෙවියන්වහන්සේගේ පැවැත්ම පිළිබඳ සාධකයකි /සාක්ෂියකි.

**මනුෂ්‍යයා**

මිනිසා යනු හෘදය සාක්ෂියක් සහිත ෂත්තාවක් වන අතර. ඔහු විශ්වය ගවේෂණය කරන්නේ ය. ජීවිතයේ අරුත ඕනෑකමින් සොයා බලයි. සුවිශේෂී අනන්‍යතාවක් සොයයි. ශාරීරික කුසගින්න ආහාරවල පැවැත්ම හඟවයි. පිපාසය අපගේ පිපාසය සංසිඳවීමට යමකය හැකි බව දක්වයි. අරමුණක් සඳහා වූ අපගේ බුද්ධිමය ආශාව/ අභිලාෂය යම් අර්ථයක් සොයා ගැනීමට හැකි බව හඟවන්නේ ද? බොහෝ මනුෂ්‍යයින් පවසන්නේ දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවයෙන් අර්ථයක් සොයා ගත හැකි බවයි.

**සදාචාරය**

බොහෝ දෙනෙකුගේ පාලනයේ කැමැත්ත නිවැරදි නැතිනම් වැරදි ද? නැතහොත් අධිමානුෂික අධිකාරිය යහපත සහ නපුර නිර්වචනය කරන්නේ ද? දෙවි කෙනෙක් නොමැති නම්, කිසි දෙයක් නපුරු බව ප්‍රකාශ කිරීමට මනුෂ්‍යයා හට පදනමක් ඇත්තේ නැත. වර්ගවාදය, ජනතාව ඝාතනය කිරීම, වධ හිංසා දීම, හෝ මොන යම් හෝ කෲර දාමරිකකම් කිසිවක් නපුරු බව කීමට හේතුවක් ද නැත. එම නිසා නපුරේ පැවැත්මක් තිබීම දෙවියන්වහන්සේගේ පැවැත්ම ඇති බවට වූ සාධකයකි / සාක්ෂියකි. දෙවි කෙනෙක් නොමැති නම්, බලය විසින් පාලනය කරනු ලැබිය යුතු ය. දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම යුක්ති සහගත ය.

**උතුම්කම**

දෙවියන්වහන්සේ කුමනාකාර සත්තාවක් වන සේක් ද? උන්වහන්සේ අපට සිතා ගැනීමට හැකි ප්‍රමාණයට වඩා විශාල විශ්වය මැවූ සේක් නම්, උන්වහන්සේ විශ්වයට වඩා විශාල වන සේක. එසේම උන්වහන්සේ කාලය, අවකාශය හෝ ශක්තියෙන් සීමා වී නොමැත. මන්ද කාලය, පදාර්ථය සහ ශක්තිය ඇති විමට ප්‍රථමයෙන් උන්වහන්සේ සිටි බැවිනි.

2 තිමෝති 1 : 9 දෙවියන්වහන්සේ කළ දෙයක් පිළිබඳ "කාලයේ ආරම්භයට ප්‍රථමයෙන්" යනුවෙන් දක්වයි. කාලයට ආරම්භයක් විය. එසේම දෙවියන්වහන්සේ එයට පෙර වූ සේක. වර්ෂවලින් මිනිය නොහැකි, කාලයට හසු නොවන පැවැත්මක් උන්වහන්සේට තිබේ. උන්වහන්සේ සදාකාලික වන සේක. අනන්ත වූ යුග ගණනක් සහ අනන්ත යුග බිලියන ගණනක එකතුවක්. අපගේ ගණිත කර්ම දෙවියන්වහන්සේගේ පැවැත්ම විස්තර කිරීමට නොහැකි තරමට සීමාසහිත ය.

දෙවියන්වහන්සේ සියලු පදාර්ථයන් මැවූ බැවින්, උන්වහන්සේ පදාර්ථයට ප්‍රථමයෙන් සිටි සේක. එසේම උන්වහන්සේ කිසිම පදාර්ථයකින් සාදා නැත. උන්වහන්සේ ආත්මයක් වන සේක. එහෙත් උන්වහන්සේ "ආත්මයකින්" සැදී නැත. දෙවියන්වහන්සේ කිසිම ආකාරයකින් සාදන ලද කෙනෙක් නොවන සේක. උන්වහන්සේ නිරායාසයෙන් ඇති වූ සේක. එසේම ආත්මයක් ලෙස උන්වහන්සේ පවතින සේක. උන්වහන්සේ තම පැවැත්ම නිර්වචනය කරන සේක. උන්වහන්සේ ආත්මයක් සහ දෙයක් ලෙස නිර්වචනය කරයි.

දෙවියන්වහන්සේ ද්‍රව්‍යවලට ප්‍රථමයෙන් සිටි සේක. ද්‍රව්‍ය මිනුම් සහ දේපළවලට උන්වහන්සේ අදාළ කළ නොහැකි ය. උන්වහන්සේ සැතපුම් හෝ කිලෝ වොට්වලින් මැනිය නොහැකි ය. උස් වූ ස්වර්ගයට දෙවියන්වහන්සේ සීමා කළ නොහැකි බව සලමොන් තේරුම් ගත්තේ ය (1 රාජාවලිය 8:27). උන්වහන්සේ ස්වර්ගය සහ පොළොව පුරවන සේක (යෙරමියා 23: 23). උන්වහන්සේ සැම තැන සිටින සේක. නැතිනම් සර්වව්‍යාපී වන සේක. උන්වහන්සේ නොමැති කිසි ස්ථානයක් විශ්වයේ නැත.

දෙවියන්වහන්සේ කෙතරම් බලවන්ත ද? දෙවියන්වහන්සේට විශාල පිපිරීමක් සිදු කළ හැකි නම්, සෞර ග්‍රහ මණ්ඩලය නිර්මාණය කළ හැකි නම්, ඝන් හි අණු නිර්මාණය කළ හැකි නම්, සැම බල අංශුවක්ම කළමණාකරණය කළ හැකි නම්, උන්වහන්සේ බලයෙන් සීමාරහිත

**දෙවියන්වහන්සේ ගැන දැනගැනීමට කරුණු පහක් :**

1. දෙවියන්වහන්සේ සර්ව බලධාරී වන සේක. - තමන්වහන්සේ කැමති ඕනෑම දෙයක් කිරීමට උන්වහන්සේට හැකි ය. උන්වහන්සේ සියලු බලය ඇති දෙවියන්වහන්සේ වන සේක.

2. දෙවියන්වහන්සේ අමරණීය වන සේක. චරිත ස්වභාවයෙන් වෙනස් නොවන සේක. සැම විටම විශ්වාස කළ හැකි ය. උන්වහන්සේ සදාකාලික වන සේක.

3. දෙවියන්වහන්සේ සර්වව්‍යාපී වන් සේක. අවකාශයෙන් සහ කාලයෙන් සීමා කළ නොහැකි ය. උන්වහන්සේ සැම විටම නුදුරුව සිටින සේක.

4. දෙවියන්වහන්සේ සර්ව ඥානය ඇති දෙවියන්වහන්සේ ය. සියලු සත්‍ය සහ සියලු ප්‍රඥාව දන්නා සේක. පියාණන්වහන්සේ හොඳම දේ දන්නා සේක.

5. දෙවියන්වහන්සේ නිත්‍ය වශයෙන්ම යහපත් ය. කිසි විටක ආත්මාර්ථකාමී නොවන සේක. දෙවියන්වහන්සේ ප්‍රේමයයි.

වන සේක. නැතිනම් සර්ව බලධාරී වන සේක. "දෙවියන්වහන්සේට සියල්ල කළ හැකි ය" යනුවෙන් ලූක් 1 : 37 අපට පවසයි. දෙවියන්වහන්සේට කිරීමට අවශ්‍ය වන ඕනෑම දෙයක් උන්වහන්සේට කළ හැකි ය.

දෙවියන්වහන්සේගේ නිර්මාණශීලීත්වය. අපට තේරුම් ගත හැකි ප්‍රමාණයට වඩා උසස් වූ බුද්ධිමත්භාවයක් පෙන්නුම් කරයි. උන්වහන්සේ විශ්වය එහි නොකඩව පැවතීම සිදු කරමින් පාලනය කරන සේක. (හෙබ්‍රෙව් 1 : 3). එයින් අර්ථ දැක්වෙන්නේ විශ්වය පුරාවට සිදු වන්නේ කුමක්ද යන්න උන්වහන්සේ අනිවාර්යෙන් දැනගත යුතු බවයි. උන්වහන්සේ බුද්ධියෙන් අසීමිත ය. සර්ව ඥානය ඇති සේක. උන්වහන්සේ විසින් දැනගත යුතු ඕනෑම දෙයක් උන්වහන්සේ දන්නා සේක.

දෙවියන්වහන්සේ නිවැරදි සහ වැරදි දේ අර්ථ දක්වන නිසාවෙන් උන්වහන්සේම නිවැරදි වන සේක. එමෙන්ම සැම විටම නිවැරදි දේ කිරීමට උන්වහන්සේට බලය ඇත. "දෙවියන්වහන්සේ නපුරෙන් පරීක්ෂා කිරීමට නුපුළුවන" (යාකොබ් 1:13). උන්වහන්සේ නිත්‍ය සහ සම්පූර්ණයෙන්ම ධර්මිෂ්ඨය (ගීතාවලිය 11: 7). උන්වහන්සේගේ ප්‍රමිතීන් නිවැරදිය. උන්වහන්සේගේ තීරණ නිවැරදිය. උන්වහන්සේ ධර්මිෂ්ඨකමින් ලෝකය විනිශ්චය කරන සේක. උන්වහන්සේ එතුමන්ගේ ස්වභාවයෙන්ම ධර්මිෂ්ඨ සහ නිවැරදි වන සේක.

මේ ආකාරවලින් දෙවියන්වහන්සේ අපගෙන් බොහෝ වෙනස් වන සේක. එම නිසා දෙවියන්වහන්සේ උදෙසා පමණක් අපි විශේෂ වචන භාවිත කරන්නෙමු. දෙවියන්වහන්සේ පමණක් සර්ව ඥානය ඇති සේක. සර්වවාසී වන සේක. සර්ව බලවත් වන සේක. සදාකාලික වන සේක. අපි ද්‍රව්‍ය වන්නෙමු. උන්වහන්සේ ආත්මයක් වන සේක. අපි කාලික අය වෙමු. උන්වහන්සේ සදාකාලිකය. උන්වහන්සේ සහ අප අතර වන මෙම මහත් වෙනස අපි හඳුන්වන්නේ උන්වහන්සේගේ උත්තරීතර බව ලෙසය. උන්වහන්සේ අපට වඩා උත්තරීතර බව, අපට ඉහළින් සිටින බව, අප හා සමාන නොවන බව අර්ථවත් වේ.

වෙනත් පැරණි සංස්කෘතීන්වල දෙවිවරු දේවතාවුන් විශ්වාස කළ අතර, එම දෙවි දේවතාවුන් එකිනෙකාට විරුද්ධව යුධ කළහ. ආත්මාර්ථකාමී ලෙස හැසිරුණහ. ඔවුන් කෙරෙහි විශ්වාසය තැබීමට නොහැකි ය. එහෙත් සම්පූර්ණ පාලනයක් යටතේ සිටින, කිසිවෙකුගෙන් කිසිවක් අවශ්‍ය නොවන, එම නිසාම අන්‍යයන්ට උපකාර කිරීමට පමණක් ක්‍රියා කරන දෙවි කෙනෙක් පිළිබඳ බයිබලය අපට එළිදරව් කරයි. උන්වහන්සේ නිත්‍ය ලෙසම වෙනස් නොවන අයෙකු වන සේක. උන්වහන්සේගේ හැසිරීම සම්පූර්ණයෙන්ම ධර්මිෂ්ඨ සහ සම්පූර්ණයෙන්ම විශ්වාස සහගත ය. දෙවියන්වහන්සේ ශුද්ධයි, සදාචාරාත්මක ලෙස සම්පූර්ණයි යන්නෙන් දැක්වීමේ දී බයිබලය අර්ථවත් කරන්නේ මෙයයි.

මෙය ජීවිතය මඳක් සරල ... කරන්නේ ය. මිනිසුන් විවිධාකාර දෙවිවරු 10 ක් හෝ 20 ක් සතුටු කිරීම අවශ්‍ය නැත. ඇත්තේ එකම දෙවි කෙනෙකි. සියලුලේ මැවුම්කරුවාණන්වහන්සේ සියල්ල පාලනය කරන තැනැන්වහන්සේ ය. එසේම උන්වහන්සේ සියල්ලේ විනිශ්චයකරුවාණන් වන සේක. අපගේ අතීතය, වර්තමානය සහ අනාගතය එක දෙවියන්වහන්සේගෙන් තීරණය වේ. සියල්ල දන්නා වූ, සියලු බලය ඇති සදාකාලික දෙවියන්වහන්සේය.

**යහපත්කම**

අපි සියලු දෙනාම දෙවියන්වහන්සේ පිළිබඳ දන්නා දෙය නම් උන්වහන්සේට අප පිළිබඳ විශ්වාස නොකළ හැකි බලයක් ඇති බවත්, ගරු බියෙන් යුතුව, දණ නමමින් යටත් හදකින් අපි උන්වහන්සේට කීකරු විය යුතු බවත් ය. එහෙත් දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ස්වභාවයේ තවත් අංගයක් අපට එළිදරව් කළ සේක. විශ්වාස කළ නොහැකි අයුරින් උතුම් වන දෙවියන්වහන්සේ විශ්වාස කළ නොහැකි අයුරින් මෘදු සහ යහපත් වන සේක.

යේසුන්වහන්සේගේ ගෝලයෙක් උන්වහන්සේගෙන් මෙසේ ඇසී ය. "අපට පියාණන්වහන්සේ පෙන්නුව මැනව" (යොහන් 14: 8). ඔහුට දෙවියන්වහන්සේ කෙබඳු තැනැත්තෙක් ද යන්න දැනගැනීමට අවශය විය. ඔහු ඇවිලෙන පඳුර, සීනයිහි වළාකුළ සහ ගිනි ටැඹ ගැන දැන සිටියේ ය. එසේම එසකියෙල් දුටු අහසේ සිංහාසනය සහ එළියාට ඇසුණු නිශ්ශබ්දතාවය (නික්මයාම 3:4, 13: 21, 1 රාජාවලිය 19: 12, එසකියෙල් 1) ගැන දැන සිටියේ ය. දෙවියන්වහන්සේට මේ සැම ආකාරයකින්ම පෙන්නුම් විය හැකි ය. එහෙත් ඇත්තෙන්ම උන්වහන්සේ කුමනාකාර ද? අපි බැලිය යුතු වන්නේ කොහේ ද?

යේසුන්වහන්සේ මෙසේ කී සේක. "මා දුටු තැනැත්තේ පියාණන්වහන්සේ දුටුවේ ය" (යොහන් 14 : 9). දෙවියන්වහන්සේ කොයි ආකාර ද යන්න අපට දැනගැනීමට අවශ්‍ය නම්, අපි යේසුන්වහන්සේ දෙස බැලිය යුතු වෙමු. අපට ස්වභාව ධර්මයෙන් දෙවියන්වහන්සේ පිළිබඳ බිඳක් දැනගැනීමට පුළුවන. උන්වහන්සේ තමන් පිළිබඳ පැරණි ගිවිසුමේ එළිදරව් කර ඇති ආකාරයෙන් අපට උන්වහන්සේ පිළිබඳ බොහෝ දේ දත හැකි ය. එහෙත් අපට තමන්වහන්සේම යේසුන්වහන්සේ තුළින් එළිදරව් කිරීමෙන් අපට වඩා වැඩිපුර දේ දැනගත හැකි ය.

දෙවියන්වහන්සේ කෙබඳු ආකාර ද යන්න යේසුන්වහන්සේ අපට පෙන්නුම් කළ සේක. උන්වහන්සේ එම්මානුවෙල් වන සේක. එයින් අර්ථවත් වන්නේ දෙවියන්වහන්සේ අප සමග වන සේක. යන්නයි (මතෙව් 1 : 23). උන්වහන්සේ පාප රහිතව ජීවත් වූ සේක. ආත්මාර්ථයෙන් තොරව ජීවත් වූ සේක. උන්වහන්සේ දයානුකම්පාවේ දෙවි කෙනෙකි. උන්වහන්සේට ප්‍රේමයේ, ප්‍රීතියේ, අධෛර්ය වීමේ සහ කෝපයේ හැඟීම් තිබේ. උන්වහන්සේ අප එකිනෙකා පිළිබඳ සලකන සේක. උන්වහන්සේ ධර්මිෂ්ටකම උදෙසා කැඳවන සේක. උන්වහන්සේ පාප කමා කරන සේක. උන්වහන්සේ තමාගේ දුක් විඳීම සහ මරණයේ දී පවා අන්‍යයන්ට සේවය කළ සේක.

දෙවියන්වහන්සේ එයාකාර වන සේක. උන්වහන්සේ තමා මෝසෙස්ට මෙලෙස විස්තර කළ සේක. "මම සමිඳාණන්වහන්සේය. මම දයානුකම්පාවෙන් පූර්ණ, වහා නොකිපෙන සුලු මහා කාරුණික සහ විශ්වාසදායි දෙවියන්වහන්සේය. මම දහස් ගණනකට කරුණාව පාමින්, දුෂ්ටකමට ද නපුරට  හා පාපයට ද කමාව දෙන්නෙමි. එහෙත් වරදකරුවන් නිදහස් නොකර, පියවරුන්ගේ පව් නිසා තුන් වන හතර වන දරු පරපුර දක්වා ඔවුන්ගේ දරුමුණුබුරන්ට දඬුවම් කරන දෙවියන්වහන්සේ මමය" (නික්මයාම 34 : 6 - 7).

මුළු මැවිල්ලට ඉහළින් සිටින තැනැන්වහන්සේට මැවිල්ල තුළ ක්‍රියා කිරීමට නිදහස ඇත. මෙය උන්වහන්සේගේ සර්වවාසී බවය. උන්වහන්සේ අප සමග සිටීම ය. දෙවියන්වහන්සේ විශ්වයට සහ විශ්වයේ ඇති සැම තැන්වලට වඩා විශාල වුව ද, නොඅදහන අය සමග නොසිටින ආකාරයෙන් උන්වහන්සේ අප සමග සිටින සේක. අති විශාල දෙවියන්වහන්සේ සැම

විටම අපට සමීප ය. උන්වහන්සේ නුදුරුව සිටින සේ ම, ඒ මොහොතේම දුරස්ව සිටින සේක (යෙරමියා 23 : 23).

යේසුන්වහන්සේ තුළ උන්වහන්සේ මනුෂ්‍ය ඉතිහාසයට, අවකාශයට සහ කාලයට ඇතුළු වූ සේක. උන්වහන්සේ මනුෂ්‍ය මාංශයෙන් ක්‍රියා කළ සේක. එහිදී මාංශයේ දී ජීවිතය කුමනාකාර විය යුතු ද යන්න අපට පෙන්වමින් සහ දෙවියන්වහන්සේට අපගේ මාංශයට වඩා ජීවිතය බොහෝ අවශය බව පෙන්වූ සේක. අපි සදාකාල ජීවනය ලද අය වෙමු. එය අපි දැන් දන්නා ශාරීරික සීමාවන්ට ඔබ්බෙන් වූ ජීවිතයකි. අපි ආත්මික ජීවිතයක් ලත් අය වෙමු. දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේම අප තුළට පැමිණී අප තුළ වාසය කරමින් අප දෙවියන්වහන්සේගේ දරුවන් කළ බැවින්, (රෝම 8 : 1, 1 යොහන් 3 : 2) දෙවියන්වහන්සේ දිගටම අප සමග සිටිමින් අවකාශයේ සහ කාලයේ ක්‍රියා කරමින් අපට උපකාර කරන සේක.

උතුම් වූ සහ බලවන්ත වූ දෙවියන්වහන්සේ මෘදු සහ කරුණාවන්ත දෙවියන්වහන්සේ ද වන සේක. සම්පූර්ණයෙන්ම ධර්මිෂ්ට විනිශ්චයකරුවාණන්වහන්සේම කරුණාවන්ත සහ ඉවසීමේ ගැළවුම්කරුවාණන්වහන්සේ ද වන සේක. පාපයට කෝප වන දෙවියන්වහන්සේම පාපයෙන් ගැළවීම ද සලසා දෙන සේක. උන්වහන්සේ කරුණාවෙන් බලවත් ය. මෘදුකමින් බලවන්ත ය. ෂත් හි ජාන මැවූ, දේදුන්නේ වර්ණ මැවූ සත්තාවකින් අප හට බලාපොරොත්තු විය හැකි වන්නේ මෙයයි. දෙවියන්වහන්සේ කරුණාවන්ත සහ මෘදු යන කරුණ නැතිනම්, අපට කොහෙත්ම පැවැත්මක් නැත.

දෙවියන්වහන්සේ අපට ඇති උන්වහන්සේගේ සම්බන්ධතාවය විවිධ අයුරින් විස්තර කරන සේක. එක් විග්‍රහයක උන්වහන්සේ පියාණන් සහ අපි උන්වහන්සේගේ දරුවෝ වෙමු. තවත් එකක උන්වහන්සේ ස්වාමි පුරුෂයා සහ උන්වහන්සේගේ සෙනඟ සියල්ලෝ භාර්යාව වේ. නැතිනම්, උන්වහන්සේ රජෙක් සහ අපි උන්වහන්සේගේ යටත් වැසියෝ වන්නෙමු. උන්වහන්සේ එඬේරෙක් සහ අපි බැටළුවෝ වෙමුව. මෙම විග්‍රහයන් සියල්ලේම දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟගේ අවශ්‍යතාවයන් සැපයීමට සහ ඔවුන් ආරක්ෂා කිරීමේ වගකීමක් ඇති ස්ථානයක තමන්වහන්සේ තබා ඇත.

අපි කෙතරම් කුඩා ද යන්න දෙවියන්වහන්සේ දන්නා සේක. තමන්වහන්සේගේ ඇඟිල්ලේ පහරකින් අප අතුගා දැමිය හැකි බව උන්වහන්සේ දන්නා සේක. එහෙත් දෙවියන්වහන්සේ අපට කෙතරම් ප්‍රේම කරන සේක් ද යන්න උප ගැන සලකන්නේ ද යන්න යේසුන්වහන්සේ තුළ අපට දැක් වූ සේක. යේසුන්වහන්සේ නිහතමානී වූ සේක. අපට උපකාරයක් වන්නේ නම්, පීඩා විඳීමට තරම් කැමති වූ සේක. උන්වහන්සේ අපට ඇති වේදනාව දන්නා සේක. මන්ද උන්වහන්සේම එය වින්ද බැවිනි. නපුරා ගෙන එන වේදනාව උන්වහන්සේ දන්නා සේක. අපට දෙවියන්වහන්සේ විශ්වාස කළ හැකි බව පෙන්වන පිණිස උන්වහන්සේ එය පිළිගත් සේක.

දෙවියන්වහන්සේ මෙන් වන පිණිස අප මවා ඇති බැවින් (උත්පත්ති 1 : 27), දෙවියන්වහන්සේ වෙත අප උදෙසා වූ සැලසුම් තිබේ. බලවත්කමින් නොව, යහපත්කමින් වඩ වඩා උන්වහන්සේ මෙන් වන පිණිස උන්වහන්සේ අපට ආරාධනා කරන සේක. යේසුන්වහන්සේ තුළ දෙවියන්වහන්සේ අපට අනුගමනය කිරීම පිණිස ආදර්ශයක් මානුෂිකත්වයේ ආදර්ශයක්, පරාර්ථකාමී සේවයේ, දයාවේ සහ ප්‍රේමයේ ඇදහිල්ල සහ බලාපොරොත්තුවක් දෙන සේක.

“දෙවියන්වහන්සේ ප්‍රේමයයි” යනුවෙන් යොහන් ලිවිය (1 යොහන් 4 : 8). අපගේ පාප වෙනුවෙන් මැරෙන්නට යේසුන්වහන්සේ එවීම තුළින් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමය පෙන්නුම් කළ සේක. එමගින් දෙවියන්වහන්සේ සහ අප අතර තිබෙන බාධා ඉවත්ව යනු ඇත. අපි උන්වහන්සේ සමඟ සදාකාලික ප්‍රීතියකින් ජීවත් වනු ඇත. දෙවියන්වහන්සේගේ ප්‍රේමට අපගේ පැතුමක් නොවේ. අපගේ ගැඹුරු අවශ්‍යතාවයන්හි දී අපට උපකාර වන ක්‍රියාවකි.

යේසුන්වහන්සේගේ උත්ථානයට වඩා උන්වහන්සේගේ කුරුසිපත් වීම තුළින් අපි දෙවියන්වහන්සේ පිළිබඳ ඉගෙන ගන්නෙමු. උපකාර ලැබූ මනුෂ්‍යයින් විසින්ම පීඩා පැමිණෙවූ අවස්ථාවල දී පවා, යේසුන්වහන්සේ පීඩා විඳීමට කැමති වූ බව පෙන්නූ සේක. උන්වහන්සේගේ ප්‍රේමය අපට ආරාධනා කරන අතර අප ධෛර්යමත් කරන්නේ ය. උන්වහන්සේගේ කැමැත්ත කරන පිණිස උන්වහන්සේ අපට බල නොකරන සේක.

අපගේ ආදර්ශය වන යේසුන්වහන්සේ තුළ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමය පැහැදිලි ලෙස අපට පෙන්නූ සේක. “ප්‍රේමය යන්නෙන් මා අදහස් කරන්නේ අප දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම නොව, උන්වහන්සේ අපට ප්‍රේම කර සිය පුත්‍රයාණන් අපේ පාපය නැසීමේ පිළියමක් වශයෙන් එවීමය. ප්‍රේමවන්තයෙනි, දෙවියන්වහන්සේ අපට මෙසේ ප්‍රේම කළ සේක් නම්, අපත් එකිනෙකාට ප්‍රේම කළ යුතු ය” (1 යොහන් 4 : 10 - 11). අපි ප්‍රේමයෙන් ජීවත් වන්නෙමු නම්, අපට පමණක් නොව, අප සමඟ සිටින අයට ද සදාකාල ජීවනය ප්‍රීතියක් වනු ඇත.

අපි යේසුන්වහන්සේ අපගේ ජීවිතයෙන් අනුගමනය කරන්නෙමු නම්, උන්වහන්සේගේ මරණය සහ උත්ථානයේදීත් අපි උන්වහන්සේ අනුගමනය කරන්නෙමුව. යේසුන්වහන්සේ මළවුන්ගෙන් නැගිටෙවූ දෙවියන්වහන්සේම අපව ද නැගිටුවා අපට සදාකාල ජීවනය දෙනු ඇත (රෝම 8 : 11). එහෙත් අප ප්‍රේම කිරීමට ඉගෙන ගන්නේ නැතිනම්, අපි සදාකාල ජීවනය භුක්ති විඳින්නේ ද නැත. දෙවියන්වහන්සේ අපට පරිපූර්ණ ආදර්ශයක් දෙමින්, අපගේ හදවත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ අප තුළ වාසය කරමින් අපට අනුගමනය කළ හැකි වේගයකින් අපට ප්‍රේම කිරීමට උගන්වන සේක. හිරුගේ න්‍යෂ්ටික උදුන පාලනය කරන බලය මෘදු ලෙස අපගේ හදවත් තුළ ක්‍රියා කරමින්, අප ආශා සහ කැමැත්ත දිනා ගනිමින් අපගේ අපගේ පක්ෂපාතිත්වය දිනාගන්නා සේක.

දෙවියන්වහන්සේ අපගේ ජීවිතවලට අර්ථයක්, මාර්ගයක්, සදාකාල ජීවිතයට බලාපොරොත්තුවක් දෙන සේක. අප යහපත් දේ කරමින් පීඩා විඳින අවස්ථාවේ දී පවා අපට උන්වහන්සේ විශ්වාස කළ හැකි ය. දෙවියන්වහන්සේගේ යහපත්කම උන්වහන්සේගේ බලයෙහි අනුබලය ඇත. උන්වහන්සේගේ ප්‍රේමය උන්වහන්සේගේ ප්‍රඥාවෙන් මඟපෙන්වන්නකි. විශ්වයේ සියලු බලයන්ගේ පාලනය උන්වහන්සේ වෙත තිබේ. එසේම අපගේ ශුභසිද්ධිය උදෙසා උන්වහන්සේ ඒවා භාවිත කරන සේක. “උන්වහන්සේට ප්‍රේම කරන අයට සියල්ලෙහි දීම උන්වහන්සේ ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපි දනිමු” (රෝම 8 : 28).

**ප්‍රතිචාරය**

ඉතා උතුම් සහ මෘදු, ඉතා භයානක සහ මොළොක් දෙවියන්වහන්සේට අපි ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? අපි නමස්කාරයෙන් ප්‍රතිචාර දක්වන්නෙමු : උන්වහන්සේගේ මහිමය

නිසා ගරුබිය පාන්නෙමු, උන්වහන්සේගේ ක්‍රියාවන් නිසා ප්‍රශංසා කරන්නෙමු, උන්වහන්සේගේ ශුද්ධත්වය නිසා බිය වන්නෙමු. උන්වහන්සේගේ බලය නිසා ගෞරව කරන්නෙමු. උන්වහන්සේගේ පරිපූර්ණත්වය අභියස පසුතැවිලි වන්නෙමු, උන්වහන්සේගේ ප්‍රඥාව සහ සත්‍යයේ ඇති අධිකාරීත්වයට කීකරු වන්නෙමු.

උන්වහන්සේගේ කරුණාවට අපි ස්තුතිවන්තකමින් යුතුව ප්‍රතිචාර දක්වන්නෙමු: උන්වහන්සේගේ අනුග්‍රහයට අපගේ පක්ෂපාතිත්වයෙන්, උන්වහන්සේගේ යහපත්කමට අපගේ ප්‍රේමයෙන් ප්‍රතිචාර දක්වන්නෙමු. අපි උන්වහන්සේට ප්‍රශංසා නමස්කාර කරන්නෙමු. උන්වහන්සේ ඔසවන්නෙමු, අපිට බොහෝ දේ දීමට ඇති මුත්, අපි උන්වහන්සේගේ අපගේ ජීවිත දෙන්නෙමු. උන්වහන්සේ තමන්වහන්සේගේ ප්‍රේමය අපට පෙන්වූ පරිදි, අප වටා සිටින මිනිසුන්ට ප්‍රේම කිරීමට හැකි වන සේ, උන්වහන්සේගේට අප වෙනස් කිරීමට ඉඩ හරින්නෙමු. යේසුන්වහන්සේ කළාක් මෙන්, අපිට ඇති සියල්ල, අපි කවුද යන්න, උන්වහන්සේ අපට දුන් සියල්ල අන් අයට සේවය කිරීම පිණිස අපි භාවිත කරන්නෙමු.

උන්වහන්සේ අපගේ සෑම වචනයක්ම අසන බව අපගේ සෑම සිතුවිල්ලක්ම දන්නා බව, අපට අවශ්‍ය දේ දන්නා බව, අපගේ හැඟීම් ගැන සලකන බව, අප තුළ සදාකාලයටම ජීවත් වීමට උන්වහන්සේට අවශය බව, අපගේ සෑම ඉල්ලීමක්ම ඉටු කිරීමට උන්වහන්සේට බලය ඇති බව, අපට අවශ්‍ය නොවන්නේ තුමක්ද යන්න පිළිබඳ උන්වහන්සේට ප්‍රඥාව ඇති බව දැනගෙන අපි මේ දෙවියන්වහන්සේට යාච්ඤා කරන්නෙමු.

යේසුන් ක්‍රිස්තුන්වහන්ස්ගේ විශ්වාසවන්ත බව උන්වහන්සේ තමා ඔප්පු කළ සේක. දෙවියන්වහන්සේ ආත්මාර්ථකාමී වීමට නොව, සේවය කිරීමට පැවතෙන සේක. උන්වහන්සේගේ බලය සෑම විටම ප්‍රේමයෙන් භාවිත කළ සේක. අපගේ දෙවියන්වහන්සේ බලයෙන් උසස්ය. ප්‍රේමයෙන් උසස්ය. සෑම දෙයක් සම්බන්ධයෙන්ම අපට උන්වහන්සේ විශ්වාස කළ හැකිය.

1. මැවිල්ල සම්බන්ධ පාදක සටහන: ජීවිතයේ විවිධත්වය වෙනම ප්‍රශ්නයකි. සමහර මිනිස්සු පරිණාමවාදයේ න්‍යාය පිළිගනිති. තවත් අය එය ප්‍රතික්ෂේප කරති. සමහර මිනිස්සු පරිණාමවාදයේ න්‍යාය ජීව විද්‍යාත්මක විවිධත්වය දෙවියන්වහන්සේ ඇති කරන බව විශ්වාස කරති. තවත් අය දෙවියන්වහන්සේ වෙනත් මාර්ගයකින් ක්‍රියා කරන බව විශ්වාස කරති. පරිණාමවාදය සම්බන්ධ මතභේදයන්ට තුඩු දෙන කරුණු මෙහි තීරණය කිරීමට සංකීර්ණ වැඩි ය. අපි සරල ලෙස දක්වන්නේ පළමු ස්ථානයේ දී ජීවිතය කෙසේ ආරම්භ වූවා ද යන ප්‍රශ්නයට එයින් බාධාවකි නැති බවයි. එසේම, සුළු පිරිසක් පරිණාමවාදය ඔවුන්ගේ නිගමනයන් ඉදිරිපත් කිරීමට සෑහෙන බව අධ්‍යයනය කර ඇත. බොහෝ විට, ඔවුහු “ප්‍රවීණයන්ගේ” වචන පිළිගනිති. එහි ප්‍රතිවිරුද්ධතා මෙන්ම එයට උපකාර ද ඇතුළත් වේ. වැඩිදුර අධ්‍යයනයට *මැවීම සහ පරිණාමවාදය පිළිබඳ තුන් ආකාර දැක්ම* බලන්න. ජේ. පී. මොරලන්ඩ් සහ ජෝන් මාක් රෙනෝල්ඩ්ස් (සෝන්ඩවෑන්, 1999).

සාකච්ජාව සඳහා වූ ප්‍රශ්න

1. මේ ලෝකයේ නපුරු දේවල් දෙවියන්වහන්සේ කෙරෙහි ඇති අපගේ ඇදහිල්ල දුර්වල කරන්නේ ද, ශක්තිමත් කරන්නේ ද?
2. දෙවියන්වහන්සේ යහපත් නම්, මනුෂ්‍යයා වැටෙන සුළු බවින්, වැරදි දේ තෝරාගැනීමට හැකියාව සහිතව සැදුවේ මන් ද?
3. දෙවියන්වහන්සේගේ මැවිල්ල අප ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳ උන්වහන්සේ පවසන්නේ මොනවා ද?
4. දෙවියන්වහන්සේ එක් පුද්ගලයෙකුගෙන් ඈත්ව සිටින්නේ සහ තවත් කෙනෙකුට සමීපව සිටින්නේ කෙසේ ද?
5. යහපත් එහෙත් බලයෙන් අඩු දෙවි කෙනෙකු කෙරෙහි අපට විශ්වාසය තැබිය හැකි ද?
6. දෙවියන්වහන්සේ යේසුන්වහන්සේ මෙන් වන්නේ කුමන ආකාරවලින් ද, යේසුන්වහන්සේගෙන් වෙනස් වන්නේ කමන ආකාර වලින් ද?
7. දෙවියන්වහන්සේගේ අනුග්‍රහය උන්වහන්සේ පිළිගැනීමට ඔබ යොමු කරන්නේ ද, නැතිනම් උන්වහන්සේ ප්‍රතික්ෂේප කිරීමට ඔබ යොමු කරන්නේ ද?

වැඩිදුර කියවීම සඳහා

ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ හැඳින්වීමක් ලබාගත්තෙහි ය. උන්වහන්සේ වඩා හොඳින් දැනගැනීමට ඔබ කැමති නැද්ද? අපි දෙවියන්වහන්සේ කිහිප ආකාරයකින් දැනගන්නෙමුව : ස්වභාව ධර්මය තුළින්, ශුද්ධාත්මයාණන්වහන්සේ සමඟ අත්දැකීම් තුළින්, ශුද්ධ ලියවිලි තුළින්, ආත්මික විනයන් තුළින් සහ වෙනත් ඇදහිලිවන්තයින්ගේ වචන තුළින් ය.

දෙවියන්වහන්සේ පිළිබඳ වැඩිදුර දැනගැනීමට බයිබලය කියවන්න. විශේෂයෙන් නව ගිවිසුම කියවන්න.

# ගෝලත්වය 101
# ඒකකය 1 ආ



## ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේට ප්‍රතිචාර දැක්වීම

ඉහත ලිපිය දෙවියන්වහන්සේගේ ගුණාංග දෙකක් මතු කර දක්වා ඇත. උන්වහන්සේගේ උතුම්කම සහ උන්වහන්සේගේ යහපත්කම. දෙවියන්වහන්සේ නිතරම උන්වහන්සේගේ අතිවිශාල බලය තමන්ගේ සෙනඟ උදෙසා වූ ප්‍රේමයේ සහ අනුග්‍රහයේ පොරොන්දුව පෙන්වීමට භාවිත කරයි. උන්වහන්සේ මෘදු, ආදරණීය, කෝප වීමට ප්‍රමාද, කරුණාවෙන් පිරි තැනැන්වහන්සේ ය.

මෙහිදී "ඉතින් මොක ද?" යන ප්‍රශ්නයට අප යොමු වීම අවශ්‍ය වේ. මෙය අපට අදාළ වන්නේ කෙසේ ද? එය අපගේ ජීවිතයේ කුමනාකාර වෙනසක් සිදු කරන්නේ ද? එකම අවස්ථාවේ දී බලවත් සහ මෘදු දෙවි කෙනෙකු හට අප ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? අවම වශයෙන් දෙයාකාරයකින් අපි ප්‍රතිචාර දක්වන්නෙමු. මෙම කොටසෙහි අප විශ්වාසය පිළිබඳ බලන්නෙමු. මී ළඟ කොටසෙහි අපි නමස්කාරය පිළිබඳ සාකච්ඡා කරන්නෙමු.

**විශ්වාසය**

දෙවියන්වහන්සේට තමන් කැමති කොයි යම් හෝ දෙයක් කිරීමට සියලු බලය ඇති බව සහ එය සැම විටම මානුෂිකත්වයේ යහපත උදෙසා භාවිත කරන බව අප තේරුම් ගත කල අප සිටින්නේ යහපත් අත්වල බවට නියත සහතිකයක් අපට තැබිය හැකි වේ. අපගේ කරුළිකාරකමේ දී පවා උන්වහන්සේට සහ එකිනෙකාට විරුද්ධව පාවා දීම් කරන විට, ඒ සියල්ල අපගේ ගැළවීම දෙසට ක්‍රියාත්මක කිරීමට උන්වහන්සේට හැකියාව සහ අරමුණ ඇත. උන්වහන්සේ සම්පූර්ණයෙන්ම විශ්වාස කළ හැකි කෙනෙකි. අපගේ විශ්වාසය ලැබීමට වටිනා / සුදුසු කෙනෙකි.

අප පරීක්ෂාවන්, පීඩා සහ මරණය මධ්‍යයේ සිටින විට දෙවියන්වහන්සේ තවමත් අප සමඟ සිටින බවට, උන්වහන්සේ අප ගැන සලකන බවට, සියල්ල උන්වහන්සේගේ පාලනය යටතේ තිබෙන බවට අපට සහතිකයක් තැබිය හැකි ය. එය එසේ නොපෙනෙන්නට පුළුවන. අප පාලනයක් යටතේ සිටින බවට අපට හැඟෙන්නේ නැති වීමට පුළුවන. එහෙත් අපට දෙවියන්වහන්සේ අත් හැර නැති ආරක්ෂාකරුවෙකු බවට සහතික විය හැකි ය. උන්වහන්සේට ඕනෑම අවස්ථාවක්, ඕනෑම අවාසනාවක් අපගේ යහපතට මුදවාලීමට හැකියාව ඇති අතර, උන්වහන්සේ එසේ කරන සේක.

දෙවියන්වහන්සේ අපට ඇති ආදරය කිසි විට සැක කිරීමට අවශ්‍ය නැත. "අප උදෙසා ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය ප්‍රත්‍යක්ෂ වන්නේ අප පව්කාරයන්ව සිටියදීම ක්‍රිස්තුන්වහන්සේ අප උදෙසා දිවි පිදූ බැවිනි" (රෝම 5 : 8). "ප්‍රේමය යනු කුමක්දැයි අප දන්නේ ක්‍රිස්තුන්වහන්සේ සිය ජීවිතය අප උදෙසා පරිත්‍යාග කළ බැවිනි" (1 යොහන් 3 : 16). තමන්ගේම පුත්‍රයා වළක්වා නොගත් දෙවියන්වහන්සේ අපගේ සදාකාලික සතුට උදෙසා උන්වහන්සේගේ පුත්‍රයා තුළින් අපට අවශ්‍ය සියල්ල දෙන බවට විශ්වාසය තැබිය හැකි ය.

දෙවියන්වහන්සේ වෙන කිසිවෙක් නොවූ සේක. දෙවියන්වහන්සේගේ පුත්‍රයා, දේවත්වයට සුදුසු තැනැන්වහන්සේ මනුෂ්‍යයෙක් මෙන්, අප වෙනුවෙන් මැරෙන්නට සහ අප වෙනුවෙන් උත්ථාන වීමට (හෙබ්‍රෙව් 2 : 14) වූ සේක. අප මිදීම ලැබුවේ සතුන්ගේ ලේවලින් නොවේ. එමෙන්ම හොඳ මිනිසෙකුගේ ලේ වලින් ද නොවේ. මිනිසෙක් බවට පත් වූ දෙවියන්වහන්සේගේ ලේ වලිනි. අපි සහභාගිකමේ භෝජනය ගන්නා සැම විටම උන්වහන්සේ අප කෙරෙහි ඇති අතිවිශාල ප්‍රේමය මෙනෙහි කරන්නෙමුව. උන්වහන්සේ අපට ප්‍රේම කරන බවට අපට සහතිකයක් තැබිය හැකි ය. උන්වහන්සේ අපගේ විශ්වාසය දිනාගෙන සිටින සේක.

"දෙවියන්වහන්සේ විශ්වාසවන්තය" පාවුල්තුමා අපට පවසයි. "ඔබට දරාගත නොහැකි පරීක්ෂා ඔබ පිට පැමිණීමට ඉඩ නොහරින සේක" (1 කොරින්ති 10 : 13). "ස්වාමින්වහන්සේ විශ්වාසවන්තය. උන්වහන්සේ ඔබ ශක්තිමත් කොට නපුරාගෙන් ඔබ ආරක්ෂා කරන සේක" (2 තෙසලෝනික 3 : 3). "අප අවිශ්වාසවන්ත වුවත් දෙවියන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක" (2 තිමෝති 2 : 13). අප අවශ්‍ය වීමේ, කැඳවීමේ, අපට කරුණාව දැක්වීමේ උන්වහන්සේගේ මනස උන්වහන්සේ වෙනස් කරන්නේ නැත. "පොරොන්දුව දුන් තැනැන්වහන්සේ විශ්වාසවන්ත බැවින් අප පිළිගත් බලාපොරොත්තුවෙහි නොසෙල්වී ස්ථිරව පිහිටා සිටිමු." (හෙබ්‍රෙව් 10 : 23).

උන්වහන්සේ අපට කැපවීමක් කර ඇත. අප මිදීම පිණිස, අපට සදා ජීවනය දීම පිණිස, සදහටම අපට ප්‍රේම කිරීමට, අප සමඟ ගිවිසුමක් කර ඇත. අප නැතිව උන්වහන්සේ සිටින්නේ නැත. උන්වහන්සේ විශ්වාසවන්ත ය. එහෙත් අප උන්වහන්සේට ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? අපි කරදර වන්නෙමු ද? උන්වහන්සේගේ ප්‍රේමයට වටිනා අය වීමට අපි අරගල කරන්නෙමු ද? නැතිනම්, අපි උන්වහන්සේ විශ්වාස කරන්නෙමු ද?

අපි කිසිදාක දෙවියන්වහන්සේගේ බලය සැක නොකළ යුතු වෙමු. යේසුන්වහන්සේ මරණයෙන් උත්ථාන වීමෙන් මෙය පෙන්නුම් විය. දෙවියන්වහන්සේ මරණයට ඉහළින් බලය ඇති, උන්වහන්සේ මැවූ සියලු දෙනාට ඉහළින් බලය ඇති, අන් සියලු බලයන්ට ඉහළින් බලය ඇති තැනැන්වහන්සේ වන සේක (කොලොස්සි 2 : 15). උන්වහන්සේ කුරුසිය තුළින් සියලු දෙය ජයගත් සේක. එමෙන්ම උන්වහන්සේගේ උත්ථානය තුළින් එය පෙන්නුම් කළ සේක. මරණයට උන්වහන්සේ රඳවා තබාගැනීමට නොහැකි විය. මන්ද උන්වහන්සේ ජීවනයේ කර්තෘවරයාණන් වන බැවිනි (ක්‍රියා 3 : 15).

යේසුන්වහන්සේ මරණයෙන් නැගිටෙවූ එම බලයම අපට සදාතන ජීවනය දෙනු ඇත (රෝම 8 : 11). අප උදෙසා වූ උන්වහන්සේගේ පොරොන්දු සම්පූර්ණ කිරීම පිණිස, උන්වහන්සේට බලය, ආශාව ඇති බවට අපට විශ්වාස කළ හැකි ය. සියලු දේවල දී අපට උන්වහන්සේ විශ්වාස කිරීමට හැකි ය. එය යහපත් දෙයක් බැවින් අන් දෙයක් කෙරෙහි විශ්වාස කිරීම

අනුවණ ක්‍රියාවකි. අපගේ හැකියාවෙන් අපි අසමත් වන්නෙමු. ඉර පවා අසමත් වේ. එයට ඉඩ හරින්න. හිරුට වඩා, විශ්වයට වඩා බලසම්පන්න වූ, කාලයට සහ අවකාශයට වඩා විශ්වාසවන්ත දෙවි කෙනෙකු කෙරෙහි අපගේ එකම බලාපොරොත්තුව ඇත. අපට එම සහතික බලාපොරොත්තුව යේසුන්වහන්සේ අපගේ ගැළවුම්කරුවාණන්වහන්සේ තුළ ඇත්තේය.

**විශ්වාසය සහ ඇදහිල්ල**

යේසුන් ක්‍රිස්තුන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන සියල්ලෝම ගළවනු ලබන්නෝය (ක්‍රියා 16:31). යේසුන් ක්‍රිස්තුන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම යන්නෙන් කුමක් අදහස් කෙරේ ද? යක්ෂයා පවා යේසුන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ බව, දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව විශ්වාස කරයි. ඔහු එයට අකමැතිය. එහෙත් එය සැබෑවක් බව ඔහු දනියි. තවදුරටත් දෙවියන්වහන්සේ විද්‍යමාන බවත්, උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන බවත් දනියි (හෙබ්‍රෙව් 11 : 6).

ඉතින් අපගේ විශ්වාසය සහ යක්ෂයාගේ විශ්වාසය අතර ඇති වෙනස කුමක් ද? යාකොබ්තුමා අපට පිළිතුරක් දෙන්නේ ය: සැබෑ ඇදහිල්ල ක්‍රියාවෙන් පෙන්නුම් වෙන්නේ ය (යාකොබ් 2 : 18 - 19). අපි කරන දෙයින් අපි විශ්වාස කරන්නේ කුමක්ද යන්න සැබෑ ලෙස පෙන්නුම් වේ. ඇතැම් මිනිස්සු වැරදි හේතුවලට කීකරු වුව ද, හැසිරීම ඇදහිල්ලෙහි සාධකයක් විය හැකි ය. යක්ෂයා පවා ක්‍රියාත්මක වනුයේ දෙවියන්වහන්සේ විසින් පනවා ඇති බලාත්කාරය මධ්‍යයේය. ඔහු එසේ කිරීමට අකමැති වුව ද, එසේ කරන්නේ ය.

ඉතින් ඇදහිල්ල යනු කුමක් ද? එය විශ්වාසයෙන් වෙනස් වන්නේ කෙසේ ද?

සරලම පැහැදිලි කිරීම වන්නේ ගළවනු ලබන විශ්වාසය *ඇදහිල්ල* වේ යන්නයි. අප ගැන සැලකීමට, නපුර නොව, අප ගැන යහපත කිරීමට, අපට සදා ජීවනය දීමට අපි දෙවියන්වහන්සේ විශ්වාස කරන්නෙමුව. විශ්වාසය යන්නෙන් අර්ථවත් වන්නේ දෙවියන්වහන්සේ සිටින බවත්, උන්වහන්සේට අවශ්‍ය සැම දෙයක්ම කිරීමට බලය ඇති බව මෙන්ම, එය අපගේම යහපත උදෙසා කරනවා ඇතැයි විශ්වාස කිරීම වේ.

**ඇදහිල්ල ගැන දැනගැනීමට කරුණු පහක්**

1. අපි දෙවියන්වහන්සේගේ සතුරන්ව සිටිය දී පවා උන්වහන්සේ අපට ප්‍රේම කළ සේක. සැම අවස්ථාවක දීම උන්වහන්සේ විශ්වාසව සිටින සේක.

2. යේසුන්වහන්සේගේ උත්ථාන වීමෙන් අප මරණයෙන් පවා ගළවා ගැනීමට දෙවියන්වහන්සේට හැකි බව පෙන්නුම් වේ.

3. අපි දෙවියන්වහන්සේ විශ්වාස කරන කල, උන්වහන්සේගේ අණපනත් අපගේ යහපත සඳහාම බව දැනගෙන අපි උන්වහන්සේට කීකරු වන්නෙමු.

4. කිසිවෙකුට පරිපූර්ණ ඇදහිල්ලක් නොමැත. ජීවන අත්දැකීම් තුළින් අපි ඇදහිල්ල වර්ධනය කරගන්නෙමු.

5. සැකයන් සහ ප්‍රශ්න නොදැන හෝ ක්‍රිස්තුන්වහන්සේ විශ්වාස කිරීමට අපට මඟපෙන්විය හැකි ය.

විශ්වාසය යනු අප උන්වහන්සේ යටතේ සිටීමට ඇති කැමැත්තකි. බියෙන් නොව, ප්‍රේමයෙන් කීකරු වීමට ඇති කැමැත්තකි. අපි දෙවියන්වහන්සේට ප්‍රෙම කරන කල උන්වහන්සේට ප්‍රේම කරන්නෙමු.

අපි කරන දෙයින් ඇදහිල්ල පෙන්නුම් වේ. එහෙත් ක්‍රියාව ඇදහිල්ල නොවේ. එයින් ඇදහිල්ල නිර්මාණය වන්නේ ද නැත. එය ඇදහිල්ලේ ප්‍රතිඵලයක් පමණි. සැබෑ ඇදහිල්ල යනු මුළුමනින්ම ක්‍රිස්තුන් යේසුන් වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම වේ.

**දෙවියන්වහන්සේගේ ත්‍යාගයන්**

මෙවැනි ඇදහිල්ල පැමිණෙන්නේ කෙසේ ද? අප ගැන ක්‍රියා කිරීමට හැකි වූ දෙයක් නොවන්නේ ය. අප එයට ඇතුළත් කර කතා කළ නොහැකි ය. නැතිනම් සම්පූර්ණ නිවැරදි සිද්ධියක් ගොඩනගන්නට මනුෂ්‍ය තර්ක භාවිත කළ නොහැකි ය. දෙවියන්වහන්සේ පිළිබඳ ප්‍රතිවිරුද්ධතාවයක්, දාර්ශනික තර්ක අන්වරණය කිරීමට කෙදිනකවත් අපට කාලය ලැබෙන්නේ නැත. එහෙත් දිනපතාම තෝරාගැනීමක් කිරීමට අපට බල කෙරේ. අපි දෙවියන්වහන්සේ විශ්වාස කරන්නෙමු ද? නොකරන්නෙමු ද? මෙම තීරණය ගැනීම ප්‍රමාද කිරීම තුළම තීරණයක් ඇත. අපි තවමත් දෙවියන්වහන්සේ විශ්වස කරන්නේ නැත.

සැම කිතුනුවෙක් හටම ක්‍රිස්තුන්වහන්සේ තුළ විශ්වාස කිරීමට ගත් තීරණය උදෙසා වූ කාරණයක් ඇත. ඇතැම් අය එය ඉතා හොඳින් සිතා ගත් තීරණයකි. සමහර අයට එය තර්කයෙන් තොර වූ තීරණයකි. වැරදි හේතු මත ගත් තීරණයකි. එහෙත් තීරණය (කෙසේ හෝ) නිවැරදි වුවකි. අපට වෙන කිසිම කෙනෙක් හෝ අපම හෝ විශ්වාස කළ නොහැකි ය. අපගේම හැකියාවෙන් අප අපගේ ජීවිත අවුල් කරගන්නෙමු. වෙනත් මානුෂික අධිකාරීන් විශ්වාස කිරීමට අපට නොහැකි ය. අපගෙන් ඇතැම් අයට ඇදහිල්ල බලාපොරොත්තුවෙන් තොර වූ තෝරාගැනීමකි. ක්‍රිස්තුන්වහන්සේ වෙත හැරෙන්නට මිස, අපට යන්නට වෙන කිසි තැනක් නොමැත (යොහන් 6 : 68).

අපගේ පළමු ඇදහිල්ල නොමේරූ ඇදහිල්ලක් වීම සාමාන්‍ය දෙයකි. හොඳ ආරම්භයක් වුව ද එය රැඳී සිටීමට හොඳ ස්ථානයක් නොවන්නේ ය. අපගේ ඇදහිල්ලේ *වර්ධනය වීම* අවශ්‍ය දෙයකි. එක් මනුෂ්‍යයෙක් යේසුන්වහන්සේට කී පරිදි : "මම අදහමි. මාගේ අවිශ්වාසයෙන් බැහැර වීමට මට උපකාර කරන්න" (මාක් 9 : 24). උත්ථාන වූ යේසුන්වහන්සේට නමස්කාර කිරීමෙන් පසුව පවා ගෝලයන්ට සැකයන් තිබිණි (මතෙව් 28 : 17).

ඇදහිල්ල පැමිණෙන්නේ කොතැනින් ද? එය දෙවියන්වහන්සේගෙන් වූ ත්‍යාගයකි. එපීස 2 : 8 ගැළවීම දෙවියන්වහන්සේගේ ත්‍යාගයක් බව පවසයි. එයින් අදහස් කරන්නේ ගැළවීම කරා මඟපෙන්වන ඇදහිල්ලත් උන්වහන්සේගේ ත්‍යාගයක් බවයි. ක්‍රියා 15 : 9 දෙවියන්වහන්සේ අදහන්නන්ගේ හදවත් ඇදහිල්ලෙන් පවිත්‍ර කරන බව දක්වා ඇත. දෙවියන්වහන්සේ ඔවුන්ගේ හදවත්වල ක්‍රියා කරමින් එය සිදු කරන සේක. "ඇදහිල්ලේ දොරක් ඇර දුන්" (ක්‍රියා 14 : 27) දෙවියන්වහන්සේ උන්වහන්සේ ය. දෙවියන්වහන්සේ එය කළ සේක. මන්ද අපට ඇති ඇදහිල්ල ශක්තිමත් කරන්නේ උන්වහන්සේ නිසාවෙනි.

දෙවියන්වහන්සේ උන්වහන්සේ විශ්වාස කිරීමට හැකියාව අපට නුදුන් සේක් නම්, අපි උන්වහන්සේ විශ්වාස කරන්නේ නැත. මනුෂ්‍යයෝ තමාගේම ශක්තියෙන් හෝ ප්‍රඥාවෙන් හෝ දෙවියන්වහන්සේ විශ්වාස කරන්නට හෝ අදහන්නට හෝ නොහැකි ලෙස පාපය නිසා දූෂිත වී සිටිති. ගැළවීම සඳහා ඇදහිල්ලට "ක්‍රියාවන්" මගින් අපි සුදුස්සන් නොවන්නේ ඒ නිසාවෙනි. සුදුසුකම් තිබීමෙන් අපට ලකුණු නොලැබේ. ඇදහිල්ල ත්‍යාගය උදෙසා ස්තුතිවන්ත වීමෙන්

ලබන්නා වූ ත්‍යාගයකි. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ත්‍යාගය ලැබීමට සහ එය භුක්ති විඳීමට හැකියාව දෙන සේක.

**විශ්වාසවන්තභාවය**

අපට විශ්වාස කිරීමට සහ ගැළවීම ලැබීමට සම්පූර්ණයෙන්ම විශ්වාසවන්ත කෙනෙකු සිටින බැවින්, අපට ඇදහිල්ල දීමට යහපත් හේතු දෙවියන්වහන්සේට ඇත. . උන්වහන්සේ අපට දෙන ඇදහිල්ල අපගේ ගැළවීම උදෙසා මාංසවත් වූ උන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ මුලය වන එකකි. අප වෙනුවෙන් අපගේ ගැළවීම මිලයට ගත් ගැළවුම්කරුවෙක් සිටින බැවින්, අපට ඇදහිල්ල ඇතිව සිටීමට යහපත් හේතු තිබේ. උන්වහන්සේ සියල්ල කළ සේක. සියල්ලන් වෙනුවෙන් එක් වරක්, අත්සන් කර, මුද්‍රා තබා මුදවා ගැනීම. අපගේ ඇදහිල්ලට ශක්තිමත් අත්තිවාරමක් ඇත : ඒ යේසුන් ක්‍රිස්තුන්වහන්සේ ය.

යේසුන්වහන්සේ අපගේ ඇදහිල්ලෙහි කර්තෘවරයාණන් සහ සම්පූර්ණ කරන්නා වන සේක (හෙබ්‍රෙව් 12 :2). එහෙත් උන්වහන්සේ තනිවම වැඩ නොකරන සේක. යේසුන්වහන්සේ කරන්නේ පියාණන්වහන්සේට අවශ්‍ය දේ පමණි. එසේම උන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් අප හදවත්වල ක්‍රියා කරන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ අපට උගන්වන සේක, වරද පෙන්වා දෙන සේක, අපට ඇදහිල්ල දෙන සේක (යොහන් 14 : 26, 15 : 26, 16 : 10).

**වචනය තුළින්**

දෙවියන්වහන්සේ (පියාණන්වහන්සේ. පුත්‍රයාණන්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේ) අපට ඇදහිල්ල දෙන්නේ කෙසේ ද? සාමාන්‍යයෙන් දේශනා කරනු ලබන වචනය තුළිනි. "ඇදහිල්ල පැමිණෙන්නේ පණිවිඩය ඇසීම තුළිනි. දේශනාව යේසුන්වහන්සේගේ වචනය තුළින් ඇසේ" (රෝම 10 : 17). පණිවිඩය ඇත්තේ ලිඛිත වචනය වන බයිබලය තුළ ය. එසේම එය වාචික වචනයතුළ ද තිබේ. දේවස්ථානයේ දේශනාවක හෝ එක් පුද්ගලයෙක් අනෙක් පුද්ගලයා හට කියන සරල සාක්ෂියේ තිබේ.

ශුභාරංචියේ වචනය අපට යේසුන්වහන්සේ පිළිබඳ පවසයි. දෙවියන්වහන්සේගේ වචනය, සහ ශුද්ධාත්මයාණන්වහන්සේ මෙම වචනය අප ආලෝකනය කිරීමට භාවිත කරන සේක. කෙසේ හෝ අපට මෙම වචනය විශ්වාස කිරීමට ඉඩ හරියි. මෙය ඇතැම් විට හඳුන්වන්නේ, "ශුද්ධාත්මයාණන්වහන්සේගේ සාක්ෂිය" ලෙස ය. එහෙත් එය අපට ප්‍රශ්න ඇසිය හැකි උසාවි සාක්ෂිකරුවෙකු මෙන් නොවන්නේ ය.

එය බොහෝ දුරට දේශනා කරනු ලබන සුබ ආරංචිය පිළිගන්නා පිණිස අපට ඉඩ හරින අප තුළ ඇති ඇතුළාන්ත ස්විචයක් මෙනි. එය නිවැරදි බව හැඟෙයි: අපට තවමත් ප්‍රශ්න තිබෙන නමුත්, මෙම පණිවිඩයෙන් ජීවත් විය හැකි බව අපි විශ්වාස කරමු. අපට අපගේ ජීවිත ඒ මත පදනම් කරගත හැකි වේ. අපට ඒ මත පදනම් වූ තීරණ ගත හැකි වේ. එය හැඟීමක් ඇති කරන්නේ ය. එය කළ හැකි හොඳම තෝරා ගැනීම වේ.

දෙවියන්වහන්සේ උන්වහන්සේ විශ්වාස කිරීමට අපට හැකියාව දෙන සේක. එසේම ඇදහිල්ලෙහි වර්ධනය වීමට උන්වහන්සේ අපට හැකියාව දෙන සේක. වර්ධනය වන්නා වූ බීජයක් ඇදහිල්ලෙහි මුල් ගෙවීම වන්නේ ය. ශුභාරංචිය වඩා හොඳින් තේරුම් ගැනීම පිණිස

එය අපගේ මනස සහ උද්වේගයන් පිළියෙළ කර, ශක්තිමත් කරන්නේ ය. යේසුන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ අපට එළිදරව් වන විට, එය දෙවියන්වහන්සේ පිළිබඳ වඩා දැනගැනීම පිණිස අපට උපකාර කරයි. පැරණි ගිවිසුමේ රූපකයක් භාවිත කිරීමට අපි දෙවියන්වහන්සේ සමඟ ගමන් කිරීම අවශ්‍ය වේ. අපි උන්වහන්සේ තුළ ජීවත් වන්නෙමු, උන්වහන්සේ තුළ සිතන්නෙමු, උන්වහන්සේ තුළ විශ්වාස කරන්නෙමු.

**සැකයන්**

එහෙත් බොහෝ කිතුනුවන් නොයෙක් අවස්ථාවල දී ඇදහිල්ල සමඟ අරගල කරති. අපගේ වර්ධනය සැම විටම සෞම්‍ය, නියත එකක් නොවන්නේ ය. එය පරීක්ෂාවන් සහ ප්‍රශ්න මැදින් එන එකකි. ඇතැම් අයට සැක ඇතිවන්නේ පීඩා විඳීම් හෝ තදබල වේදනාවන් නිසාවෙනි. තවත් අයට එය සවුලත්වය හෝ යහපත් කාලයන් නිසා අපට නොතේරෙන ලෙසින් දෙවියන්වහන්සේ වෙනුවට ද්‍රව්‍යමය දේ මත යැපීමට පරීක්ෂාවන් ගෙන දෙයි. අපගේ ඇදහිල්ලට මේ දෙයාකාර වූ අභියෝගයන් වලට අපගෙන් බොහෝ දෙනෙක් මුහුණ දෙන්නෙමු.

දිළිඳු මනුෂ්‍යයින්ට බොහෝ විට ධනවත් මනුෂ්‍යයින්ට වඩා ශක්තිමත් ඇදහිල්ලක් තිබේ. බොහෝ විට මනුෂ්‍යයෝ පරීක්ෂාවලට පැමිණෙන විට දෙවියන්වහන්සේ හැර වෙන බලාපොරොත්තුවක් නැති බව දනිති. උන්වහන්සේ විශ්වාස කිරීම හැර වෙන තෝරාගැනීමක් නැත්තේ ය. සංඛ්‍යා ලේඛන පෙන්නුම් කරන්නේ ධනවත් මිනිසුන්ට වඩා දිළිඳු මනුෂ්‍යයින් තමාගේ ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් සභාවට දෙන බව ය. එයින් පෙන්නුම් කෙරෙන්නේ ඔවුන්ගේ ඇදහිල්ල (පරිපූර්ණ නොවුව ද) වඩා ස්ථිර බවයි.

ඇදහිල්ලෙහි ප්‍රධාන සතුරා වන්නේ, සැම දෙයක්ම හොඳින් සිදු වීම බව පෙනේ. මනුෂ්‍යයෝ තමාට ඇති සියල්ල තමාගේ ශක්තිය හෝ තමාගේ බුද්ධිය නිසා ළඟා කරගත් බව සිතීමට පෙළඹෙති. ළදරුවෙකු මෙන් දෙවියන්වහන්සේ මත යැපීමේ හැඟීම ඔවුහු නැති කර ගනිති. දෙවියන්වහන්සේ වෙනුවට ඔවුන්ට තිබෙන දේ මත ඔවුහු යැපෙති.

මෙම ලෝකයේ ජීවිතය ප්‍රශ්නවලින් බහුල එකක් වන බව සහ ඔවුන්ට ඇති කුඩාම ප්‍රශ්නය දෙවියන්වහන්සේ වන බව ඉගෙන ගැනීම පිණිස දිළිඳු මිනිස්සු ඉතා හොඳ තත්වයක සිටිති. ඔවුන් උන්වහන්සේ තුළ විශ්වාස කරන්නේ අන් සියලු දේ අවිශ්වාසවන්තභාවය ඔප්පු කර ඇති නිසාවෙනි. මුදල්, සෞඛ්‍ය සම්පන්න බව සහ මිතුරන් යන සියල්ල අස්ථිර ය. අපට මේවා මත යැපිය නොහැකි ය.

අපට යැපිය හැකි දෙවියන්වහන්සේගෙන් පමණි. එසේ වුවත්, අප කැමති ආකාරයේ සාධක අපට හමු නොවේ. එම නිසාවෙන් අපි උන්වහන්සේ විශ්වාස කළ යුතු වෙමු. යෝබ් පැවසූ පරිදි, උන්වහන්සේ මා මැරුවත්, මම උන්වහන්සේ විශ්වාස කරන්නෙමි (යෝබ් 13 : 15). සදාකාල ජීවනයේ බලාපොරොත්තුව උන්වහන්සේ විසින් පිරිනමන ලද දෙයකි. උන්වහන්සේ විසින් දෙනු ලබන බලාපොරොත්තුව ජීවිතයේ කිසියම් අර්ථයක් හෝ අරමුණක් ගෙන දේ.

**වර්ධනයේ අංග**

එහෙත් තවමත්, අපට සැක ඇති වේ. එය ජීවිතයේ වඩා දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට ඉගෙන ගනිමින් ඇදහිල්ලෙහි වර්ධනය වන විට සිදු වන සාමාන්‍ය දෙයකි. අපි විවිධ තෝරාගැනීම්වලට මුහුණ දෙන්නෙමු. එසේම අපි නැවත වරක් දෙවියන්වහන්සේ අපගේ හොඳම තෝරාගැනීම කරගන්නෙමු.

ගත වර්ෂ ගණනාවකට පෙර බ්ලෙයිසි පැස්කල් කී ලෙස, අපට විශ්වාස කිරීමට කිසි හේතුවක් නොමැතිව විශ්වාස කරන්නෙමු නම්, දෙවියන්වහන්සේ හොඳම ඔට්ටුව ලෙස ගෙන විශ්වාස කළ හැකි වේ. අපි උන්වහන්සේ අනුගමනය කරන අය ලෙස උන්වහන්සේ සිටින්නේ නැති නම්, අපි කිසිවක් අහිමි කරගන්නේ නැත. එහෙත් අපි උන්වහන්සේ අනුගමනය නොකර උන්වහන්සේ සිටින සේක් නම්, අපි සියල්ල අහිමි කරගන්නෙමු. එම නිසා අපිට අහිමි කරගැනීමට කිසිවක් නැත. එසේම විශ්වයේ නියත සත්‍යතාවය උන්වහන්සේ බව සිතමින් සහ ජීවත් වෙමින් සැම දේම දෙවියන්වහන්සේ තුළ විශ්වාස කිරීම මඟින් ලබාගත හැකි ය.

මෙය අපි සියල්ල අවබෝධ කරගන්නා බව අදහස් නොකරයි. නැත. අපි කිසි දිනක සියල්ල අවබෝධ කරගන්නේ නැත. ඇදහිල්ල යනු අපට සැම විටම තේරුම් ගැනීමට නොහැකි වුවත්, දෙවියන්වහන්සේ විශ්වාස කිරීම වේ. අපට සැක තිබිය දී පවා අපට උන්වහන්සේ නමස්කාර කළ හැකි ය (මතෙව් 28 : 17). ගැලවීම යනු බුද්ධිමය වාදයක් නොවේ. සැම සැකයකටම පිළිතුරු දෙන දාර්ශනික තර්ක විතර්කවලින් ගැළවීම දෙන ඇදහිල්ල පැමිණෙන්නේ නැත. ඇදහිල්ල පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙනි. සැම ප්‍රශ්නයකටම පිළිතුරු ලැබීම මත අප රැඳී සිටියහොත්, අපි දෙවියන්වහන්සේ මත රැඳී නොසිටින්නෙමුව.

අපට දේව රාජ්‍යයේ සිටීමට හැකි එකම හේතුව වන්නේ අපගේ ගැළවුම්කරු වන යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළින් වන අනුග්‍රහයයි. අපගේ කීකරුකම මත හෝ අපි කරන වෙන දෙයක් මත හෝ අපි රැඳී සිටින්නෙමු නම්, අපි වැරදි දෙයක් මත, රැඳී සිටිය නොහැකි යමක් මත රැඳී සිටින්නෙමුව. යේසුන්වහන්සේ තුළට, උන්වහන්සේ තුළ පමණක් අපගේ ඇදහිල්ල නැවත හැඩගස්වාගැනීම (දෙවියන්වහන්සේට අපගේ ඇදහිල්ල නැවත හැඩගැස්වීමට ඉඩ හැරීමෙන්) අපට අවශ්‍ය වේ.

ක්‍රියාවන්, යහපත් ක්‍රියාවන් පවා, අපගේ ගැළවීම සඳහා පදනම වන්නේ නැත. කීකරුකම, යේසුන්වහන්සේගේ අණපනත්වලට කීකරුවීම පවා, අපගේ සුරක්ෂිත බවේ මූලය වන්නේ නැත. ක්‍රිස්තුන්වහන්සේ පමණක් විශ්වාසවන්ත වන සේක.

අප ආත්මික මුහුකුරා යාමට සඳහා වර්ධනය වන විට, අපගේ පාප පිළිබඳ සැලකිලිමත් වීම සහ අපගේ පාපිෂ්ට බව පිළිබඳ සැලකිලිමත් වීම බොහෝ විට සිදු වේ. අපි ක්‍රිස්තුන්වහන්සේගෙන් කොපමණ දුරස්ව සිටින්නෙමු ද යන්න අපට අවබෝධ වේ. මෙය අපට සැක ඇති වීමට හේතුවක් ද වේ. දෙවියන්වහන්සේ සැබවින්ම තම පුත්‍රයා අප මෙන් හිතුවක්කාර මනුෂ්‍යයින් වෙනුවෙන් මැරෙන පිණිස එවූ සේක.

සැකය, එය කෙතරම් සත්‍යය ද යන්න ප්‍රශ්නයක් නැත, අප නැවත ක්‍රිස්තුන්වහන්සේ තුළ ශ්‍රේෂ්ඨ ඇදහිල්ලට මඟ පෙන්විය යුතු ය. උන්වහන්සේ තුළ පමණක් අපට කුමන හෝ අවස්ථාවක් ඇත්තේ ය. අපට යන්නට වෙන කිසි තැනක් නොමැත. උන්වහන්සේගේ වචන සහ

ක්‍රියාවලින් අප කෙතරම් හිතුවක්කාර ද යන්න අපි වෙනුමෙන් මැරෙන පිණිස පැමිණීමට පෙරම උන්වහන්සේ ඉතා හොඳින් දැන සිටි බව අපට පෙනේ. අප හොඳින් අප දකින විට, දෙවියන්වහන්සේගේ අනුග්‍රහයට අප යොමු වීමට අවශ්‍ය බව අපට වඩා හොඳින් පෙනෙන්නේ ය. අප අපගෙන්ම ගළවා ගැනීමට සහ අපගේ සැකයන්වලින් ගළවා ගැනීමට උන්වහන්සේ පමණක් යහපත් වන අතර, උන්වහන්සේ පමණක් එසේ කරන සේක.

**සහභාගීත්වය**

දෙවියන්වහන්සේ සමඟ අප එලදායි සම්බන්ධතාවයක් පවත්වන්නේ ඇදහිල්ල තුළින් වේ. අපි යාච්ඤා කරන්නේ ඇදහිල්ලෙනි, අපි නමස්කාර කරන්නේ ඇදහිල්ලෙනි, දේශනාවලින් සහ සහභාගිත්වයෙන් අප උන්වහන්සේගේ වචන අසන්නේ ඇදහිල්ලෙනි. පියාණන්වහන්සේ, පුත්‍රයාණන්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ සමඟ සහභාගිත්වයට ඇදහිල්ල අපට බලය දෙන්නේ ය. යේසුස් ක්‍රිස්තුන් වහන්සේ, අපගේ ගැළවුම්කරුවාණන්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ හදවත්වල ක්‍රියා කිරීම තුළ දෙවියන්වහන්සේට අපගේ පක්ෂපාතිත්වය දෙන්නට හැකි බලය ලැබෙන්නේ ඇදහිල්ල තුළින් ය.

අප අන් මනුෂ්‍යයින්ට ප්‍රේම කරන්නේ ඇදහිල්ලෙනි. අපහාස සහ ප්‍රතික්ෂේපය නිසාවෙන් වන බියෙන් අප නිදහස් කරන්නේ ඇදහිල්ලයි. අපට මනුෂ්‍යයින් කුමක් කරයිද යන්න පිළිබඳ කරදර නොවී ඔවුන්ට ප්‍රේම කළ හැකි ය. මන්ද, අපට නිර්ලෝභී ලෙස ප්‍රතිවිපාක දෙන ක්‍රිස්තුන්වහන්සේ තුළ අපි විශ්වාස කරන්නෙමුව. දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ල තුළින් අපට අන් අය සමඟ ත්‍යාගශීලි ලෙස ක්‍රියා කළ හැකි ය.

දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ල තුළින් අපගේ ජීවිතවල ප්‍රථම ස්ථානයේ උන්වහන්සේ තැබීමට අපට හැකි ය. උන්වහන්සේ කී ලෙස යහපත්ව උන්වහන්සේ කවුද යන්න අප දෙවියන්වහන්සේ විශ්වාස කරන කල, අපට සියල්ලට ඉහළින් උන්වහන්සේ වටින්නේ ය. අපගෙන් උන්වහන්සේ ඉල්ලන පූජාව කිරීමට කැමති වන්නෙමු. අපි උන්වහන්සේ විශ්වාස කරන්නෙමු. එසේම, එම විශ්වාසයෙන් අපි ගැළවීමේ ප්‍රීතිය අත්දකින්නෙමුව. කිතුනු ජීවිතය යනු, ආරම්භයේ සිට අවසානය දක්වා දෙවියන්වහන්සේ තුළ විශ්වාස කිරීම වේ.

**සාකච්ඡාව සඳහා ප්‍රශ්න**

- ඔබට වඩාත්ම සුරක්ෂිතතාවක් ඇත්තේ කුමකින් ද: දෙවියන්වහන්සේගේ ප්‍රේමය ද, උන්වහන්සේගේ බලය ද?
- දෙවියන්වහන්සේට විරුද්ධව කරුළි ගසන විට පවා උන්වහන්සේ අපට ප්‍රේම කරන සේක් ද?
- ඔබ පළමුවෙන් විශ්වාස කළ විට ඔබගේ ඇදහිල්ල මුහුකුරා නොගියේ කෙසේ ද?
- ශුද්ධ ලියවිල්ල ඔබගේ ඇදහිල්ල වර්ධනය කළේ ද?
- සවුලත්වය ඔබගේ ඇදහිල්ල දුර්වල කළේ ද?
- ඔබ වෙනත් දෙයක් විශ්වාස කිරීමට නැඹුරු වුවෙහි ද - මුදල්, රජය හෝ මිතුරන්?

ජෝසප් කාව්

**ගෝලත්වය 101**
**ඒකකය 1 ඇ**



# නමස්කාරයෙන් දෙවියන්වහන්සේට ප්‍රතිචාර දැක්වීම

අපි නමස්කරයෙන් දෙවියන්වහන්සේට ප්‍රතිචාර දක්වන්නෙමු. මන්ද, නමස්කාරය දෙවියන්වහන්සේට උචිත දේ දීමයි. උන්වහන්සේ නමස්කාරය ලැබීමට සුදුසු වන්නේ, උන්වහන්සේගේ බලය නිසා පමණක් නොව, උන්වහන්සේගේ මෘදු බව ද නිසාවෙනි. බොහෝ මිනිස්සු බලය වර්ණනා කරති. එහෙත් මෘදු බව ද ප්‍රශංසා ලැබිය යුතු වේ. අපි ඒ පිළිබඳ කල්පනා කරමු. අමිශ්‍ර වූ බලයක් යහපත් හෝ අයහපත් හෝ වන්නේ නැත. එයම ඒ පිළිබඳ ප්‍රශංසා නොකරන අතරම, පහත් කර සිතන්නේ ද නැත. ඒකාධිපතියාට බලය තිබේ. ගිනි කඳුවලට බලය ඇත. එසේම බැක්ටීරියාවලට ද බලය ඇත. එහෙත් එවැනි බලයන් අපි වර්ණනා නොකරමු. බලයක් පැසසුමට ලක් වන්නේ එය යහපත් ආකාරයෙන් භාවිත වන විට පමණි. එය අන් අයට උපකාරයක් වන අයුරින් භාවිත වන විට පමණි.

දෙවියන්වහන්සේ ප්‍රේමයයි. උන්වහන්සේ කරන සියල්ලම ප්‍රේමයෙන් කරන සේක. මෙය පැසසුමට ලක් විය යුතු වේ. අපි මනුෂ්‍ය තරාතිරමින් ප්‍රේමය පසසන්නෙමුව. එසේ නොවේ ද? තමන්ගේ ජීවිතය අන් අයට උපකාරයක් වන පිණිස දෙන මනුෂ්‍යයින් අපි පසසන්නෙමුව. ඔවුන්ට තමන්ගේම ජීවිත ගළවාගැනීමට තරම්වත් බලයක් නැත. එහෙත් ඔවුන්ට තිබෙන්නා වූ බලය අන් අයට උපකාරයක් කිරීමට ඔවුහු භාවිත කරති. එය ප්‍රශංසා කටයුතු ය. සාපේක්ෂව තමාට උපකාර කිරීමට බලය ඇතත් එය ප්‍රතික්ෂේප කරන අය අපි විවේචනය කරන්නෙමු. යහපත්කම සහ උතුම්කමට ප්‍රශංසා ලැබිය යුතු ය. එසේම දෙවියන්වහන්සේ යහපත් සහ උතුම් වන සේක.

අප සහ දෙවියන්වහන්සේ අතර ඇති ප්‍රේමයේ බැඳීම ප්‍රශංසාව ගැඹුරු කරවයි. දෙවියන්වහන්සේ අපට ඇති ප්‍රේමට කිසිදිනක අඩු වන්නේ නැත. එහෙත් අපි උන්වහන්සේට ඇති ප්‍රේමට බොහෝ විට දුර්වල බවට පත් වේ. ප්‍රශංසාව තුළ අප කෙරෙහි ඇති උන්වහන්සේගේ ප්‍රේමය අත්දකිමු, එහි බලපෑමක් ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ ආරම්භ කළ ප්‍රේමයේ ගින්න දල්වාගනිමු. දෙවියන්වහන්සේ කෙතරම් පුදුම ද කියා මතක් කර ගැනීම සහ අත්දැකීම අපට යහපත් දෙයකි. එයින් අපි ක්‍රිස්තුන්වහන්සේ තුළ ශක්තිමත් වන අතර, උන්වහන්සේගේ යහපත්කම තුළ ක්‍රිස්තුන්වහන්සේ මෙන් වීමට ඇති අපගේ උනන්දුව වර්ධනය කරගනිමු. එය අපගේ ප්‍රීතිය වර්ධනය කරන්නේ ය.

අප දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමේ අරමුණෙන් මවා ඇති අතර (1 පේදුරු 2 : 9), උන්වහන්සේට මහිමය සහ ගෞරවය දීම මෙන්ම, උන්වහන්සේ තුළ වූ ජීවිතයේ අරමුණ උදෙසා සමගියෙන් සිටීම තුළින් අධික වූ ප්‍රීතිය අත්වනු ඇත. අප මවා ඇති අරමුණ ඉටුකරන විට ජීවිතය ඉතාම හොඳින් තෘප්තිමත් විය හැකි වේ. එනම් දෙවියන්වහන්සේ

ගෞරවයට පත් කිරීමයි. එය අපි සිදු කරන්නේ නමස්කාරයෙන් පමණක් නොව, අපි දිනපතා ජීවත් වන ආකාරයෙන් ද වේ. අපට දෙවියන්වහන්සේ දී ඇති ත්‍යාග භාවිත කරමින් අන් අයට සේවය කරන කල, අපි උන්වහන්සේට ගෞරව කරන්නෙමු. පළි නොගෙන සමාව දීමෙන් අපි දෙවියන්වහන්සේට ගෞරව කරන්නෙමුව.

අපි දෙවියන්වහන්සේ වටා අපගේ ජීවිත සකස් කරගන්නා විට, අපි ලෝකයේ දේවලට වඩා වැඩියෙන් උන්වහන්සේගේ ආදරණීය වචන අගය කරන කල, අපි දෙවියන්වහන්සේට ගෞරව කරන්නෙමුව, අපි සමාජය වෙනුවට ශුද්ධ ලියවිලි බලන්නෙමු නම්, අන් අය වෙන් නොකොට, ඔවුන් සම්බන්ධයෙන් වූ අපගේ වගකීම් සහ යුතුකම් ඉටු කරන කල, අපි දෙවියන්වහන්සේට ගෞරව කරන්නෙමුව.

**ජීවන රටාව**

නමස්කාරය ජීවන රටාවකි. අපි අපගේ ශරීර සහ මනස ජීවමාන යාගයක් කොට ඔප්පු කරන්නෙමු (රෝම 12 : 1 - 2). දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේගේ ශුභාරංචිය බෙදාගන්නා විට අපි දෙවියන්වහන්සේට නමස්කාර කරන්නෙමුව (රෝම 15 : 16). අපි මුදල් පූජා කරන කල, දෙවියන්වහන්සේට නමස්කාර කරන්නෙමුව (පිලිප්පි 4 : 18). අපි අනෙක් මනුෂ්‍යයින්ට උපකාර කරන විට අපි දෙවියන්වහන්සේට නමස්කාර කරන්නෙමුව (හෙබ්‍රෙව් 13 : 16). අපි අපගේ කාලය, අවධානය සහ පක්ෂපාති බව ලබාගැනීමට උන්වහන්සේ වටිනා බව පවසන්නෙමුව. අපි උන්වහන්සේගේ බලය සහ උන්වහන්සේගේ ඉවසීම පසසන්නෙමුව. අපි උන්වහන්සේගේ මහිමය සහ අප වෙනුවෙන් අප මෙන් මනුෂ්‍යයෙක් වීම පසසන්නෙමුව. අපි උන්වහන්සේගේ ධර්මිෂ්ඨ බව සහ අනුග්‍රහය පසසන්නෙමුව. අපි උන්වහන්සේගේ සැබෑ ස්වරූපය පසසන්නෙමුව.

අප මවනු ලැබ ඇත්තේ දෙවියන්වහන්සේගේ ප්‍රශංසාව ප්‍රකාශ කිරීම උදෙසා ය. දෙවියන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන ආකාරයෙන් ජීවත් වන විට ජීවිතය ඉතා හොඳින් ක්‍රියාත්මක වේ. මෙය අපගේ බුද්ධිමය සේවය වේ. අප මැවූ තැනැන්වහන්සේට, අප වෙනුවෙන් මැරී, අප ගළවා ගැනීම සහ අපට සදාතන ජීවනය දීම පිණිස නැවත නැගිටි තැනැන්වහන්සේට, උන්වහන්සේ මෙන් වීම පිණිස අපට උපකාර කරන තැනැන්වහන්සේට ප්‍රශංසා කිරීම සරල වශයෙන් නිවැරදි ය. අපගේ පක්ෂපාති බවෙන් අපි උන්වහන්සේ ණයව සිටින්නෙමු. එසේම අපගේ ප්‍රේමයෙන් අපි උන්වහන්සේට ණයව සිටින්නෙමුව.

අපි මවා ඇත්තේ දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම උදෙසා ය. අපි සදාකාලිකව කරන්නට යන්නේ මෙයයි. යොහන්ට අපගේ අනාගතය පිළිබඳ දර්ශනයක් ලැබිණි: “තවද ස්වර්ගයෙහිත්, පොළොවෙහිත්, පොළොවෙන් යට සහ මුහුද පිට ඇත්තා වූ සියලු මැවිලි වන එහි ඇති සියල්ලෝ: සිංහාසනයෙහි වැඩහිඳින තැනැන්වහන්සේටත්, බැටළු පෝතකයාණන්ටත් ප්‍රශංසාව ද, ගෞරවය ද, මහිමය ද, පරාක්‍රමය ද සදහටම වේවා යි කියනවා ඇසීමි” (එළිදරව් 5 : 13). මෙය අපගේ නිවැරදි ප්‍රතිචාරය වේ: උතුම් වූ දෙවියන්වහන්සේ ඉදිරියේ ගරුබිය දැක්වීම, ගෞරවාන්විත දෙවියන්වහන්සේට ගෞරව කිරීම, ප්‍රශංසා ලැබිය යුතු දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම සහ විශ්වාසවන්ත දෙවියන්වහන්සේට පක්ෂපාති වීම.

**නමස්කාරය උදෙසා මූලික ප්‍රතිපත්ති පහක්**

ගීතාවලිය 33 : 1 - 3 අපට මෙසේ පවසයි. "දමිටුනි, හිමිතුමන් කෙරේ ප්‍රීති සන්තෝෂ වන්න. ප්‍රශංසාව අවංක අයට හොබනා දෙයකි. වීණාව වයා හිමිතුමන් පසසන්න. තත් දසයේ වීණාව ගෙන එතුමන්ට පැසසුම් ගීත ගයන්න. එතුමන්ට නව ගීතයක් නගන්න. මහ හඬකින් දක්ෂ ලෙස වාදනය කරන්න". ස්වාමින්වහන්සේට අලුත් ගීතිකාවක් ගායනා කරන්නට ශුද්ධ ලියවිල්ල අපට පවසයි. ප්‍රීතියෙන් ශබ්ද නඟන්නට පවසයි, වීණා, නලා, ගිගිරි රබන්, හොරණෑ, කයිතාලම් වැයීමට පවසයි, නැටීමෙන් පවා නමස්කාර කිරීමට පවසයි (ගීතාවලිය 149 - 150). ප්‍රීතිමත් බවේ ඉහළම අවස්ථාවේ චිත්‍රයක්, කිසිම තහනමක් නැතිව ප්‍රීතිය පෙන්නුම් කිරීමේ අවස්ථාවක් පෙන්නුම් වේ.

නිරායාසයෙන් නික්මෙන නමස්කාරය පිළිබඳ බයිබලය අපට නිදසුන් දෙයි. එසේම එය නමස්කාරය උදෙසා වූ ශතවර්ෂ ගණනාවක් පුරා පැවති ඒකාකාර නමස්කාර පිළිවෙත් සම්බන්ධ ඉතාම සාමාන්‍ය ප්‍රවේශ සඳහා ද නිදසුන් දෙයි. නමස්කාරය සම්බන්ධයෙන් වූ මෙම ප්‍රවේශ දෙකම සුදුසු විය හැකි ය. එයින් එකක් හෝ දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමේ සත්‍ය වූ ක්‍රමය ලෙස ගත නොහැකි ය. නමස්කාරයට ඇතුළත් වන පුළුල් ප්‍රතිපත්ති කිහිපයක් මෙසේ ය.

**නමස්කාරය පිළිබඳ කාරණා පහක්**

1. අප නමස්කාර කිරීම දෙවියන්වහන්සේට අවශ්‍ය වේ. ප්‍රශංසාවෙන් සහ ස්තුති දීමෙන් උන්වහන්සේට ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය වේ.
2. අපගේ නමස්කාරය සහ සම්පූර්ණ පක්ෂපාතී බව ලැබීමට සුදුසු වන්නේ දෙවියන්වහන්සේ පමණි.
3. නමස්කාරය සැබෑවක් විය යුතුය. එය ක්‍රියාකාරීත්වයක් නොවිය යුතු ය.
4. අපි සැබෑ ලෙසම දෙවියන්වහන්සේට ගෞරව කරමින් ප්‍රේම කරන්නෙමු නම්, උන්වහන්සේ පැවසූ දෙය කරන්නෙමුව.
5. නමස්කාරය යනු හුදෙක් අපි දේවස්ථානයේ දී කරන දෙයක් නොවේ - එයට අපි කරන සියල්ල ඇතුළත් වේ.

**1. අපි කැඳවා ඇත්තේ නමස්කාර කිරීම සඳහා ය.**

පළමුවෙන්ම, අපි දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම උන්වහන්සේට අවශ්‍ය වේ. ශුද්ධ ලියවිල්ලේ එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා අපි දකින්නා වූ ස්ථිර වූ දෙය මෙයයි (උත්පත්ති 4 : 4; යොහන් 4 : 23; එළිදරව් 22 : 9). අප කැඳවා ඇති එක් හේතුවක් වන්නේ නමස්කාර කිරීමයි : උන්වහන්සේගේ ප්‍රශංසාව ප්‍රකාශ කිරීමටයි (1 පේදුරු 2 : 9). දෙවියන්වහන්සේගේ ජනතාව උන්වහන්සේට ප්‍රේම කරමින් කීකරු වනවා පමණක් නොව, ඔවුහු විශේෂ ලෙස නමස්කාර කිරීම උදෙසා සිටිති. ඔවුහු පූජාවන් කරති, ප්‍රශංසා ගායනා කරති, යාච්ඤා කරති.

ශුද්ධ ලියවිල්ලේ නමස්කාර කළ හැකි ක්‍රමවල විශාල විවිධත්වයක් අපි දකිමු. මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහි විශේෂ ආකාරයෙන් විස්තර දක්වා ඇත. විශේෂ වේලාවන්හි දී සහ විශේෂ ස්ථානවල දී, විශේෂ ක්‍රියාකාරකම් කිරීමට විශේෂ මිනිස්සු පත් කර තිබිණි. කවරෙක් ද, කුමක් ද, කුමන වේලාවේ දී ද, කොතැන දී ද සහ කෙසේ ද යන්න පවසා තිබිණි. එයට සාපේක්ෂ ලෙස මුල් පියවරු නමස්කාර කළ ආකාරයේ ඉතා සුළු වශයෙන් නීති කිහිපයක් උත්පත්ති

පොතෙහි අපි දකින්නෙමු. නියමිත පූජක තනතුරක්, නියම කළ ස්ථානයක් ඔවුන්ට නොවීය. එසේම පූජා කළ යුතු දේ සහ කළ යුතු කාලය පිළිබඳ දක්වා ඇත්තේ ද සුළු වශයෙනි.

නව ගිවිසුමේ නමස්කාර කරන්නේ කෙසේ ද සහ කුමන වේලාවේ ද යන්න පිළිබඳ අප දකින්නේ සුළු වශයෙනි. විශේෂිත ජන කණ්ඩායමකට හෝ විශේෂිත ස්ථානයකට නමස්කාරය සීමා කර නැත. මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ නියමය සහ සීමා කිරීම යේසුන්වහන්සේ ඉවත් කළ සේක. සෑම ඇදහිලිවන්තයෙක්ම පූජකයෙක් වන අතර, තම ජීවිත ජීවමාන යාගයක් ලෙස නොකඩව ඔප්පු කළ යුතු ය.

## 2. දෙවියන්වහන්සේට පමණක් නමස්කාර කිරීම

නමස්කාර රටාවන්වල විශාල විවිධත්වයක් තිබියදීත්, ශුද්ධ ලියවිල්ල පුරාම අපි එක සරල නියත තත්වයක් දකින්නෙමු: දෙවියන්වහන්සේ පමණක් නමස්කාරය ලැබිය යුතු තැනැන්වහන්සේ වන සේක. නමස්කාරය පිළිගත හැකි සම්පූර්ණ වූවක් විය යුතු ය. දෙවියන්වහන්සේ අපගේ සම්පූර්ණ ප්‍රේමය, සම්පූර්ණ පක්ෂපාතී බව අපේක්ෂා කරන සේක. දෙවිවරු දෙදෙනෙකුට නමස්කාර කිරීමට අපට නොහැකි ය. අපි උන්වහන්සේට විවිධ රටාවන්වලට අනුව නමස්කාර කළ ද, අපි උන්වහන්සේ තුළ නමස්කාර කරන්නෙමු යන කරුණ තුළින් අපි එක්සත් වන්නෙමු.

පැරණි ඉශ්‍රායෙලයේ, සතුරු දෙවියා වූයේ බොහෝ විට බාල් ය. යේසුන්වහන්සේගේ කාලයේ දී, එය ආගමික චාරිත්‍ර, ස්ව - ධර්මිෂ්ඨභාවය සහ වංචාව විය. ඇත්තෙන්ම අප සහ දෙවියන්වහන්සේ අතරට පැමිණෙන කොයි දෙයක් වුවත්, දෙවියන්වහන්සේට අකීකරු වීමට අප යොමු කරන කොයි දෙයක් වුවත් බොරු දෙවියෙකි, පිළිමයකි. වර්තමානයේ ඇතැම් අයට එය මුදල් වේ. තවත් අයට අය ලිංගිකත්වය වේ. ඇතැම් අයට ආඩම්බරය විශාල ප්‍රශ්නයකි. නැතිනම්, අනෙක් මිනිස්සු අප ගැන සිතන ආකාරය ගැන සැලකිල්ල දක්වති. යොහන්තුමා පොදු බොරු දෙවිවරු සමහරක් ඔහුගේ ලිපියේ දැක්වී ය.

ලෝකයට හෝ එහි ඇති කිසි දෙයකට ප්‍රේම නොකරන්න. යමෙක් මේ ලෝකයට ප්‍රේම කෙරේ නම්, පියාණන්වහන්සේගේ ප්‍රේමය ඔහු තුළ නැත. ලෝකයේ තිබෙන සියල්ල - පාපී මනුෂ්‍යයාගේ අත්වැඩ වේ. ඔහුගේ ඇසෙහි තෘෂ්ණාව සහ තමාට ඇති දේ සහ තමා කරන දේ පිළිබඳ පුරසාරම් කීම පැමිණෙන්නේ පියාණන්වහන්සේගෙන් නොව, ලෝකයෙනි. ලෝකයත් එහි ඇති සියල්ලත් පහව යන්නේ ය. එහෙත් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන්නා සදාකාලයටම පවතින්නේ ය (1 යොහන් 2 : 15 - 17).

අපගේ දුර්වලතාව කුමක් වුව ද කම් නැත. බොරු දෙවිවරු ඉවත් කිරීම පිණිස, එය කුරුසිපත් කිරීම අවශ්‍ය වේ. එය මරා දැමීම අවශ්‍ය වේ. දෙවියන්වහන්සේට කීකරු වීමෙන් අප වළක්වන යමක් ඇත්නම්, අප එයින් පළා යා යුතු වේ. දෙවියන්වහන්සේට අවශ්‍ය උන්වහන්සේට පමණක් නමස්කාර කරන මනුෂ්‍යයින් ය.

## 3. අවංකකම

නමස්කාරය පිළිබඳ ශුද්ධ ලියවිල්ලෙහි අප දකින තුන්වන වෙනස් නොවන ප්‍රතිපත්තිය වන්නේ, නමස්කාරය අවංක විය යුතු බවයි. අපගේ හදවත්වලින් සැබෑ ලෙසම දෙවියන්වහන්සේට ප්‍රේම නොකරන්නෙමු නම්, නිවැරදි ක්‍රමවලින්, නිවැරදි ගීතිකා ගයමින්, නිවැරදි දිනවල හමු වෙමින්, නිවැරදි වචන කියමින් නමස්කාර කිරීමෙන් කිසි යහපතක් නැත. තමාගේ දිව්වලින් දෙවියන්වහන්සේට ගෞරව කරන, එහෙත් නිකරුණේ දෙවියන්වහන්සේට නමස්කාර කරන මනුෂ්‍යයින් යේසුන්වහන්සේ විවේචනය කළ සේක. මන්ද ඔවුන්ගේ හදවත් දෙවියන්වහන්සේට සමීපව නොතිබිණි. ඔවුන්ගේ චාරිත්‍ර (ඔවුන්ගේ ප්‍රේමය සහ නමස්කාරය ප්‍රකාශ කරන පිණිස ඇති කරන ලද) සැබෑ ප්‍රේමයට සහ නමස්කාරයට බාධාවක් විය.

යේසුන්වහන්සේ ආත්මයෙන් ද සැබෑවෙන් ද නමස්කාර කළ යුතු බව (යොහන් 4 : 24) කීමෙන් අවංකකමේ අවශ්‍යතාවය අවධාරණය කළ සේක. සැබවින්ම දෙවියන්වහන්සේගේ අණ පනත්වලට අප්‍රිය කරමින් අපි උන්වහන්සේට ප්‍රේම කරන බව පවසන්නෙමු නම්, අපි වංචාකාරයෝ වන්නෙමු. උන්වහන්සේගේ අධිකාරියට වඩා අපගේ නිදහස අගය කරන්නෙමු නම්, අපිට සැබෑ ලෙස උන්වහන්සේට නමස්කාර කළ නොහැකි වේ. උන්වහන්සේගේ ගිවිසුම අපගේ තොල්වල තබාගෙන උන්වහන්සේගේ වචන ප්‍රතික්ෂේප කිරීම අපට කළ නොහැකි ය (ගීතාවලිය 50 : 16 - 17). උන්වහන්සේට ස්වාමින්වහන්සේ යයි අමතමින්, උන්වහන්සේ කී දේ ප්‍රතික්ෂේප කිරීමට අපට නොහැකි ය.

## 4. කීකරුකම

සැබෑ නමස්කාරයට කීකරුකම ඇතුළත් වන බව ශුද්ධ ලියවිල්ල පුරාම අපි දකිමු. මෙම කීකරුකමට දෙවියන්වහන්සේගේ වචන ගැන අවධානය යොමු කරමින් අප එකිනෙකාට සලකන ආකාරය ද ඇතුළත් වේ. දෙවියන්වහන්සේගේ දරුවන්ට අගෞරව කරමින් උන්වහන්සේට ගෞරව කිරීමට අපට නොහැකි ය. යමෙක් යමෙක් "මම දෙවියන්වහන්සේට ප්‍රේම කරමි" යි කියමින් තම සහෝදරයාට වෛර කරයි නම්, ඔහු බොරුකාරයෙකි. පෙනෙන සහෝදරයාට ප්‍රේම නොකරන්නාට නොපෙනෙන දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නට බැරිය (1 යොහන් 4 : 20 - 21). එය සමාජයේ අසාධාරණකම් කරමින් නමස්කාර පිළිවෙත් පවත්වන අයට යෙසායාගේ විවේචනය මට මතක් කර දෙයි :

නුඹලාගේ නිමක් නැති පූජාවලින් මට වැඩක් ඇද් ද? බැටළුවන් දවන පූජා ද තර සතුන්ගේ තෙල් ද මට තිත්ත වී ඇත. එළු, බැටළු, ගව ලේ මට රුස්සන්නේ නැත. නුඹලා මා නමදින්න පැමිණෙන විට මේවා ගෙනෙන්න කීවේ කවරෙක් ද? ඔය නිෂ්ඵල පූජා තවත් නොගෙනෙන්න. දුම් පූජා මට ඉවසිය නොහැකි ය. අමාවක් උත්සව ද, සබත් දවස් ද, ආගමික රැස්වීම් ද මට රිසි නැත. නුඹලාගේ පාපවලින් ඒවා දූෂණය වී ඇත. නුඹලාගේ අමාවක් උත්සව හා වන්දනා ගමන් මාගේ හද පත්ලෙන් මම හෙළා දකිමි. තවත් උසුලන්න බැරි තරමට ඒවා මට මහා බරකි. මට අයදින පිණිස නුඹලා අත් ඔසවන කල එය නොදකින ලෙස මම මාගේ ඇස් වසාගන්නෙමි. නොකඩවා යාච්ඤා කළත් කිසිසේත් සවන් නොදෙන්නෙමි (යෙසායා 1 : 11 - 15).

අපට කිව හැකි ප්‍රමාණයට මනුෂ්‍යයින් සුවඳ දුම් හෝ සත්ව පූජාවන් ගෙනඒම සහ විවිධ දිනයන් පැවැත්වීම කිසි වරදක් නැත. ප්‍රශ්නය වූයේ වෙනත් වේලාවල දී ඔවුන් ජීවත් වූ

ආකාරයයි. "ඔබගේ අත් ලෙයින් පිරී තිබේ" ඔහු කීවේ ය. තව දුරටත්, මිනී මැරූ මනුෂ්‍යයින් පිළිබඳ පමණක් වූ ප්‍රශ්නයක් නොවූ බව මට සහතිකය.

ඔහු අවබෝධාත්මක විසඳුමක් කරා මනුෂ්‍යයින් කැඳවී ය : "ස්නානය කොට පිරිසිදු වන්න. මා ඇස් හමුයෙන් ඔය පව් දුරු කරන්න. නපුරුකම් තවත් නොකරන්න. යහපත කරන්න ඉගෙන ගන්න. පීඩා විඳින්නන්ට පිහිට වන්න. අනාථයන්ගේ හිමිකම් රැක දෙන්න. වැන්දඹුවන් උදෙසා ඉදිරිපත් වන්න. මෙසේ යුක්තිය ඉටු කරන්න" (16 - 17 පද). ඔවුන්ගේ ඇතුළාන්ත සම්බන්ධතාවය පිළිවෙළක් කිරීම අවශ්‍ය විය. ජාතිවාදී පක්ෂපාති බව, සමාජ පංති ආකෘතිය, අසාධාරණ ආර්ථික ක්‍රියාකාරකම් ඉවත් කිරීම අවශ්‍ය විය.

## 5. සම්පූර්ණ ජීවිතයෙන්ම

නමස්කාරය, සැබෑ එකක් වීමට නම්, සතියේ දින හතේම අපි එකිනෙකාට සලකන ආකාරයේ වෙනසක් ඇති විය යුතු ය. මෙය ශුද්ධ ලියවිල්ල පුරාම අපි දකින අනෙක් ප්‍රතිපත්තිය වේ.

අපි නමස්කාර කරන්නේ කෙසේ ද? මීකා ප්‍රශ්නය අසා පිළිතුරු දෙයි :

මම සමිඳුන් අබිමුවට කුමක් රැගෙන පැමිණෙම් ද? සගයේ දෙවිඳුන් හට කෙසේ නමඳිම් ද? දවන යාග පූජා ද, අවුරුද්දක් වයසැති එළ වස්සන් ද රැගෙන පැමිණෙම් ද? දහස් ගණන් බැටළු පැටවුන්ටත්, දහස් ගණන් තෙල් ලංලාවලටත් සමිඳාණෝ ප්‍රසන්න වන සේක් ද? මාගේ පාපවලට වන්දියක් වශයෙන් මාගේ කුළුඳුල් දරුවා උන්වහන්සේට පූජා කද? එම්බා මනුෂ්‍යය! යහපත් දේ කුමක්දැයි සමිඳ❑ාණන් ඔබට පෙන්වා දී ඇත. එතුමාණන් ඔබෙන් ඉල්ලන්නේ කුමක් ද? යුක්තිය ඉටු කිරීමත්, දයා පෙම දැක්වීමත්, යටහත් ලෙස ඔබේ සමිඳුන් සමඟ හැසිරීමත් පමණකි.

(මීකා 6 : 6 - 8).

හොෂෙයා ද යාන්ත්‍රික නමස්කාරයට වඩා ඇතුළාන්ත සම්බන්ධතාව වැදගත් බව අවධාරණය කරන්නේ ය : "මම පූජාවට වඩා කරුණාවට කැමැත්තෙමි. දවන යාග පූජාවලට වඩා දෙවියන්වහන්සේ පිළිබඳ අවබෝධයට කැමැත්තෙමි" (හොෂෙයා 6 : 6). අපි නමස්කාර කිරීමට පමණක් නොව, යහපත් ක්‍රියා කිරීම උදෙසා ද කැඳවා ඇත්තෙමු (එපීස 2:10).

නමස්කාරය පිළිබඳ වූ අපගේ සංකල්පය සංගීතය, දවස්වලට වඩා ඔබ්බෙන් යා යුතු ය. මෙම විස්තර අපි ජීවත් වන ආකාරය තරම් වැදගත් නැත. සහෝදරයින් අතර භේද ඇති කරමින් සබත් පැවැත්වීම වංචාසහගත වේ. විස්තර කර ඇති ආකාරයෙන් නමස්කාර නොකර හුදෙක් ගීතිකා ගායනා කිරීම වංචා සහගත ය. මනුෂ්‍යයින්ට ආදර්ශයක් පිණිස වූ මාංශවත් වීම සැමරීම පිළිබඳ උඩඟුවීම වංචා සහගත වේ. යේසුන්වහන්සේගේ සාධාරණ බව සහ කරුණාව සොයන්නේ නැතිව, යේසුන්වහන්සේට ස්වාමින්වහන්සේ යයි ඇමතීම වංචා සහගත වේ.

සැබෑ නමස්කාරය යනු බාහිර ක්‍රියාවලට වඩා වැඩි දෙයකි. එය ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ඇති කරන ලද හැසිරීම් රටාවේ පරිපූර්ණ වූද, හදවත පත්ලෙන්ම වූ මූලයෙහි

වෙනසකි. මෙම වෙනසට උපකාරී වන්නේ ස්වාමින්වහන්සේ සමඟ යාච්ඤාවෙන් ගත කිරීමට ඇති කැමැත්ත, අධ්‍යයනය සහ ආත්මික හික්මවීම වේ. තවද, එම විපර්යාසය දෙවියන්වහන්සේ සමඟ ගත කරන්නා වූ සහභාගිත්වයේ කාලයන් තුළින් මිස, මායම් වචනයෙන් හෝ මායා ජලයෙන් නොලැබේ. නමස්කාරය මුළු ජීවිතයම සම්බන්ධ වූවකි. මෙය අපට පාවුල්තුමාගේ වචනය තුළින් මනාව පිළිඹිඹු වේ.

**නමස්කාරය පිළිබඳ පාවුල්තුමාගේ පුළුල් දැක්ම**

පාවුල්තුමා පූජාවීමේ සහ නමස්කාරයේ වචන මාලාව මේ අයුරින් භාවිත කළේ ය : "සහෝදරයෙනි, දෙවියන්වහන්සේ ඉමහත් දයාවක් ලෙන්නු බැවින්, ඔබගේ ශරීර දෙවියන්වහන්සේට කැප කළ, උන්වහන්සේට ප්‍රසන්න වූ ජීවමාන යාගයක් කොට ඔප්පු කරන මෙන් ඔබගෙන් උදක්ම ඉල්ලමි. සැබෑ බුද්ධමය නමස්කාරය එය වේ" (රෝම 12 : 1). සතියේ පැය කිහිපයක් පමණක් නොව, සම්පූර්ණ ජීවිතය ඇත්තේ නමස්කාර කිරීම පිණිස ය. ඇත්තෙන්ම, අපගේ සම්පූර්ණ ජීවිතයම නමස්කාරයට කැපවී ඇත්නම්, මෙයට අනිවාර්යයෙන්ම සතියේ පැය කිහිපයක් අනෙක් කිතුනුවන් සමඟ සිටීම ද ඇතුළත් වේ.

රෝම 15 : 16 දී දෙවියන්වහන්සේ තමාට දුන් අනුග්‍රහය පිළිබඳ කතා කරන විට, පූජාව සහ නමස්කාරය පිළිබඳ පාවුල්තුමා වචන බොහොමයක් භාවිත කරයි. "විජාතීන් උදෙසා යේසුන් ක්‍රිස්තුන් වහන්සේගේ සේවකයෙකු වීමට දෙවියන්වහන්සේ දෙවා වදාළ වරප්‍රසාදය නිසා ය. ඒ පූජක සේවය විජාතීන් ශුද්ධාත්මයාණන් විසින් කැප කරනු ලැබ දෙවියන්වහන්සේට ප්‍රියමනාප පූජාවක් වන අයුරින් සුබ අස්න දේශනා කිරීම ය". මෙහිදී වචනය දේශනා කිරීම ද නමස්කාරයේ එක් ආකාරයක් බව අපි දකිමු.

අපි සියල්ලෝ පූජකයින් වන නිසා, අප කැඳෙවු තැනැන්වහන්සේට ප්‍රශංසා කිරීමේ පූජක කාර්ය අප සතුව ඇත (1 පේදුරු 2 : 9). සැම සාමාජිකයෙකුටම කළ හැකි නමස්කාරයක් - නැතිනම්, අන් අයට උපකාර කිරීමෙන් ශුභාරංචිය ප්‍රකාශ කිරීමට සහභාගි වීම. තමාට මුදල් ආධාර එවීම සම්බන්ධයෙන් පිලිප්පිවරුන් හට පාවුල්තුමා ස්තුති කරන කල, ඔහු නමස්කාරයේ වචන භාවිත කළේ ය : " ඔබ එපප්‍රෝදිතස් අත මා වෙත එවූ දේවල් ද ලබා පූර්ණව සිටිමි. ඒවා දෙවියන්වහන්සේට මිහිරි සුගන්ධයක් හා ප්‍රියමනාප පූජාවක් වී ඇත" (පිලිප්පි 4 : 18).

අනෙක් කිතුනුවන්ට දෙන මුදල් ආධාර නමස්කාරයක් විය හැකි ය. වචනයෙන් සහ ක්‍රියාවෙන් නමස්කාර කළ හැකි බව හෙබ්‍රෙව් 13 විස්තර කරන්නේ ය : "එබැවින් යේසුන්වහන්සේ මඟින් දෙවියන්වහන්සේට අපේ පැසසුම් පූජාව නොකඩව පුද කරමු. උන්වහන්සේගේ නාමයට අපේ මුවින්ම පැසසුම් දෙමු. යහපත කිරීමට ද, ඔබ සතු දෙය අනුන් සමඟ බෙදාහදා ගැනීමට ද අමතක නොකරන්න. එවැනි පූජාවලට දෙවියන්වහන්සේ ප්‍රසන්න වන සේක" (15 - 16 පද).

නමස්කාරය දිනපතා කීකරුකම, යාච්ඤාව සහ අධ්‍යයනය ඇතුළත්ව ජීවන රටාවක් ලෙස අපි තේරුම්ගන්නා විට, දවස් සහ සංගීතය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් අපට වඩා හොඳ දැක්මක් ඇති වේ. අවම වශයෙන් දාවිත්ගේ කාලයේ සිට සංගීතය නමස්කාරයේ වැදගත් අංගයක් වුවත්, සංගීතය නමස්කාරයේ වැදගත්ම අංගය නොවන්නේ ය..

එයට සමානව, පැරණි ගිවිසුමේ පවා නමස්කාරයේ දවස අප අසල්වැසියාට සලකන ආකාරය තරම් වැදගත් නොවන බව අවබෝධ කරගෙන ඇත. නව ගිවිසුම නමස්කාරය උදෙසා විශේෂ

දවසක් නියම නොකරයි. එහෙත් එය එකිනෙකා වෙනුවෙන් ප්‍රායෝගික ක්‍රියාවන් නියම කරන්නේ ය. එහි දී අපි හමු වීම නියම කරයි, එහෙත් අපි හමු වන්නේ කවදාද යන්න නියම නොකරයි.

මිතුරනි. අප කැඳවා ඇත්තේ දෙවියන්වහන්සේට නමස්කාර කිරීම, සැමරීම සහ මහිමය දීම උදෙසා ය. උන්වහන්සේගේ ප්‍රශංසාවන් ප්‍රකාශ කිරීම, අපගේ ගැළවුම්කාරු සහ ස්වාමින්වහන්සේ වන යේසුන්වහන්සේ තුළින් උන්වහන්සේ අප තුළ කළ දේ පිළිබඳ ශුභාරංචිය ප්‍රකාශ කිරීම අපගේ ප්‍රීතියකි.

ගෝලත්වය 101

ඒකකය 2 අ



# යේසුන්වහන්සේ යනු කවරෙක් ද?

යේසුන්වහන්සේ තම ගෝලයින්ගෙන් මෙසේ ඇසූ සේක. "මනුෂ්‍යයින් මා කවරෙක් කියා කියන්නේ ද?". මෙම ප්‍රශ්නය අපට ද අභියෝගයකි. මෙම මනුෂ්‍යයා කවරෙක් ද? ඔහුට ඇත්තේ කුමන අධිකාරීත්වයක් ද? අපි උන්වහන්සේ විශ්වාස කරන්නේ මන් ද?

කිතුනුවන්ගේ ඇදහිල්ල යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තුළ කේන්ද්‍රගත වේ. උන්වහන්සේ කුමනාකාර මනුෂ්‍යයෙක් ද යන්න අප අවබෝධ කරගත යුතු වේ.

**සම්පූර්ණ මනුෂ්‍යත්වය - සහ ඇතැම් දේ**



යේසුන්වහන්සේ සාමාන්‍ය ආකාරයෙන් උපත ලැබූ සේක. සාමාන්‍ය ආකාරයෙන් හැදී වැඩුණු සේක. උන්වහන්සේට බඩගින්න, පිපාසය සහ විඩාව දැනිණි. උන්වහන්සේ කෑම බීම ගත් සේක, නිදාගත්සේක. උන්වහන්සේ සාමාන්‍ය අයෙකු සේ පෙනිණි. සාමාන්‍ය භාෂාවෙන් කතා කළ සේක. සාමාන්‍ය ආකාරයෙන් ඇවිද්ද සේක. උන්වහන්සේට අනුකම්පාව, පුදුමය, වේදනාව සහ බිය වැනි හැඟීම් දැනිණි (මතෙව් 9 : 36; ලූක් 7 : 9; යොහන් 11 : 38; මතෙව් 26 : 37). මනුෂ්‍යයින් කළ යුතු ලෙස උන්වහන්සේ දෙවියන්වහන්සේට යාච්ඤා කළ සේක. උන්වහන්සේ තමා මනුෂ්‍යයෙක් ලෙස හඳුන්වා දුන් අතර, අනෙක් මනුෂ්‍යයින් උන්වහන්සේට මනුෂ්‍යයෙක් ලෙස කතා කළහ. උන්වහන්සේ මනුෂ්‍යයෙක් වූ සේක.

එහෙත් යේසුන්වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයෙකුට වඩා වැඩි ය. උන්වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලැබූ කල, උන්වහන්සේ කිසි සේත්ම මනුෂ්‍යයෙකු නොවන බව සමහර මිනිස්සු ප්‍රකාශ කළහ (2 යොහන් 7). උන්වහන්සේ ඉතාම ශුද්ධ බැවින්, මාංශයෙහි, එහි අපිරිසිදු බවෙහි, දහඩියෙහි, ජීරණ ක්‍රියාවලිය සහ අඩුපාඩුකම් සම්බන්ධව උන්වහන්සේට කිරීමට කිසිවක් නොමැති බව ඔවුහු සිතූහ. සැබවින්ම මිනිසෙකු බවට පත් වී, සමහර විට උන්වහන්සේ දේවදූතයින් මනුෂ්‍යයින් ලෙස ඇතැම් විට පෙනෙන පරිදි පෙනෙන්නට තිබුණි.

නව ගිවිසුම යේසුන්වහන්සේ සැබෑ ලෙසම මනුෂ්‍යයෙකු වූ බව පෙන්නුම් කරන්නේ ය. යොහන්තුමා අපට මෙසේ පවසයි. "ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වාසය කළ සේක" (යොහන් 1 : 14). උන්වහන්සේ හුදෙක් මාංශය ලෙස පෙන්නුම් නොවූ සේක. නැතහොත් මාංශයෙක් ඇඳුම් නොපැළැඳි සේක. උන්වහන්සේ මාංශවත් වූ සේක. "ක්‍රිස්තුන්වහන්සේ මිනිසත්

බව රැගෙන වැඩම කළ බව ඒත්තු ගන්නා වූ ..." (1 යොහන් 4 : 2). උන්වහන්සේ දැක, උන්වහන්සේ ස්පර්ශ කළ බැවින් (1 යොහන් 1 : 1 - 2), අපි දනිමු යයි යොහන්තුමා පවසයි.

යේසුන්වහන්සේ "අප හා සමාන මිනිස් කෙනෙක් වූ සේක" (පිලිප්පි 2 :7), "ව්‍යවස්ථාව යටතේ උපන්" (ගලාති 4 : 4), "පාපි වූ මිනිස් කයට සමාන කයක් දී එවමින්" (රෝම 8 : 3) යනුවෙන් පාවුල්තුමා පැවසිය. උන්වහන්සේ මිනිසුන් ගළවා ගැනිම පිණිස පැමිණි බැවින්, උන්වහන්සේ "මිනිස් ස්වභාවයට පංගුකාර" (හෙබ්‍රෙව් 2 : 14 - 17) වීම යෝග්‍ය බව හෙබ්‍රෙව් කතුවරයා හේතු දක්වන්නේ ය.

අපගේ ගැළවීම රැඳා ඇත්තේ යේසුන්වහන්සේගේ මනුෂ්‍යත්වයේ සත්‍යතාවය මත ය. අපගේ මැදහත්කරුවාණන්, අපගේ උත්තම පූජකයා ලෙස උන්වහන්සේගේ භූමිකාව රැඳී ඇත්තේ උන්වහන්සේගේ මනුෂ්‍යයෙක් ලෙස ලද අත්දැකීම් මත ය (හෙබ්‍රෙව් 4 : 15). උන්වහන්සේගේ උත්ථානයට පසුව පවා, උන්වහන්සේට මාංශයක් සහ ඇටකටු තිබිණි (යොහන් 20 : 27, ලූක් 24 : 39). ස්වර්ගීය මහිමයේ දී පවා උන්වහන්සේ මනුෂ්‍යයෙක් වශයෙන් සිටින සේක (1 තිමෝති 2 : 5).

**දෙවියන්වහන්සේ මෙන් ක්‍රියා කිරීම**

"මේ මනුෂ්‍යයා කවරෙක් ද?" යේසුන්වහන්සේ පව් කමා කරනු ඇසූ පරිසිවරු ඇසූහ. "දෙවියන්වහන්සේට මිස, පව් කමා කරන්න පුළුවන් අන් කාට ද?" (ලූක් 5 - 21). පාපය යනු, දෙවියන්වහන්සේට විරුද්ධ වීම ය. එසේ නම්, දෙවියන්වහන්සේ වෙනුවෙන් මනුෂ්‍යයෙකුට කතා කර විරුද්ධත්වයේ වාර්තාව අත්හැර දැමූ බව කිව හැකි වන්නේ කෙසේ ද? එය වරදකි, ඔවුහු පැවසූහ. ඔවුන් ඒ පිළිබඳ සිතුවේ කුමක්දැයි යේසුන්වහන්සේ දැනගත් සේක. එහෙත් උන්වහන්සේ පාපයට සමාව දී එය ඉවත් කළ සේක. එපමණක් නොව, ඒ ඔහුගේම පාපයක් නොවන බව කී සේක (යොහන් 8 : 46). උන්වහන්සේ ඇතැම් මවිතකර ප්‍රකාශයන් කළ සේක.

- ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ දකුණුපස තමා හිඳගන්නා බව උන්වහන්සේ කී සේක - යුදෙව් නායකයින් වරදක් යයි සිතූ තවත් ප්‍රකාශනයක් (මතෙව් 26 : 63 - 65).
- උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව ප්‍රකාශ කළ සේක - දෙවියන්වහන්සේට සමාන යයි කීම (යොහන් 5 : 18, 19 : 7) ඔවුන්ගේ සංස්කෘතිය අනුව තවත් වරදකි.
- යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ සමඟ පරිපූර්ණ සන්නිවේදනයක් පවත්වන බව සහ දෙවියන්වහන්සේට අවශ්‍ය දේ පමණක් තමා කරන බව පැවසූ සේක (යොහන් 5:19)
- දෙවියන්වහන්සේ සහ තමා එක්කෙනෙක් බව උන්වහන්සේ ප්‍රකාශ කළ සේක (10 : 30), යුදෙව් නායකයෝ මෙය ද වරදක් යයි කීවෝ ය (10 : 33).
- තමා දෙවියන්වහන්සේ හා සමාන බවත් දෙවියන්වහන්සේ දෙස බැලීමට තමා දෙස බලන පිණිසත් උන්වහන්සේ ප්‍රකාශ කළ සේක (යොහන් 14 : 9, 1 : 18).
- දෙවියන්වහන්සේගේ ආත්මය එවීමට තමාට හැකි බව උන්වහන්සේ ප්‍රකාශ කළ සේක (යොහන් 16 : 7).
- උන්වහන්සේට එවීමට හැකි දේවදූතයින් සිටින බව උන්වහන්සේ ප්‍රකාශ කළ සේක (මතෙව් 13 : 41).

- දෙවියන්වහන්සේ ලෝකයේ විනිශ්චයකරුවාණන්වහන්සේ බව උන්වහන්සේ දැන සිටි සේක. එමෙන්ම තමා විනිශ්චයකරුවෙක් බව උන්වහන්සේ ප්‍රකාශ කළ සේක (යොහන් 5 : 22).
- තමාට මළවුන් නැගිටවිය හැකි බව, තමා පවා නැගිටවිය හැකි බව උන්වහන්සේ කී සේක (යොහන් 5 : 21, 6 : 40, 10 : 18).
- සැම දෙනාගේම සදාතන ජීවනය රැඳී ඇත්තේ උන්වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවය මත බව උන්වහන්සේ කී සේක (මතෙව් 7 : 23).
- මෝසෙස්ගේ වචන ප්‍රමාණවත් නොවන බව උන්වහන්සේ කී සේක (මතෙව් 5 : 21 - 48).
- සබත් දවසේ ස්වාමියා බව - දෙවියන්වහන්සේ දුන් ව්‍යවස්ථාවේ ස්වාමියා බව උන්වහන්සේ ප්‍රකාශ කළ සේක (මතෙව් 12 : 8).

උන්වහන්සේ මිනිසෙක් පමණක් නම්, උන්වහන්සේගේ ඉගැන්වීම් අහංකාර සහ පාපී ඒවා ය. එහෙත් යේසුන්වහන්සේ ඇතැම් පුදුම ක්‍රියා සමඟ තම වචනවලින් සනාථ කළ සේක. "මා පියාණන්වහන්සේ තුළ ද, පියාණන්වහන්සේ මා තුළ ද සිටින බවට මාගේ වචනය විශ්වාස කරන්න. එසේ නැත්නම්, මාගේ ක්‍රියා නිසාවත් මා විශ්වාස කරන්න" (යොහන් 14 : 11). හාස්කම් නිසා විශ්වාස කිරීම පිණිස කිසිවෙකුට බල කළ නොහැකිය. එහෙත් ඒවායින් ප්‍රබල උපකාරක සාක්ෂි ලබා දීමට හැකි ය.

යේසුන්වහන්සේට පව් කමා කිරීමට අධිකාරිය ඇති බව පෙන්වීමට, උන්වහන්සේ අංශභාග රෝගියෙකු සුව කළ සේක (ලූක් 5 : 23 - 25). උන්වහන්සේ තමා පිළිබඳ පැවසූ දේ සත්‍ය බව පෙන්වීමට උන්වහන්සේගේ හාස්කම් සාක්ෂියක් විය. උන්වහන්සේ මනුෂ්‍යයෙකුට වඩා වැඩි නිසා, උන්වහන්සේට මනුෂ්‍යයෙකුට වඩා බලය තිබිණි. යේසුන්වහන්සේ වෙනුවෙන් සත්‍ය වූ ප්‍රකාශන වෙනත් කිසි කෙනෙකු කීවා නම් වැරදි වන්නට තිබිණි. උන්වහන්සේ දෙවියන්වහන්සේ සහ මාංශවත් වූ බැවින්, උන්වහන්සේට දෙවියන්වහන්සේ මෙන් කතා කිරීමට හැකි ය. ක්‍රියා කිරීමට හැකි ය.

**උන්වහන්සේ තමා කවුරුන් යයි සිතූ සේක් ද ?**

යේසුන්වහන්සේට ස්ව - අනන්‍යතාව පිළිබඳ පැහැදිලි හැඟීමක් විය. වයස අවුරුදු 12 හි දී පවා උන්වහන්සේට තම පියාණන්වහන්සේ හා සමඟ විශේෂ සම්බන්ධතාවයක් තිබිණි (ලූක් 2 : 49). උන්වහන්සේගේ බෞතිස්මයේ දී, උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා යයි හඬක් ස්වර්ගයෙන් උන්වහන්සේට ඇසිණි (ලූන් 3 : 22). තමාට මෙහෙයක් ඉටු කිරීමට ඇති බව උන්වහන්සේ දැන සිටි සේක (ලූක් 4 : 43, 9 : 22, 13 : 33, 22 : 37).

"ඔබ ක්‍රිස්තුවරයාණෝ ය. ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ යයි" පේදුරු කී විට, "යෝනාගේ පුත් සීමොන්, ඔබ ඉතා භාග්‍යවන්තය. ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන්වහන්සේ මිස, මනුෂ්‍ය මඟකින් මෙය ඔබට එළිදරව් නොකරන ලද්දේය" යේසුන්වහන්සේ පිළිතුරු දුන් සේක (මතෙව් 16 : 16 - 17). යේසුන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා වූ සේක. උන්වහන්සේ ක්‍රිස්තුන්වහන්සේ විය - මෙසියස්වහන්සේ, විශේෂ මෙහෙයක් උදෙසා අද්විතීය ආකාරයෙන් දෙවියන්වහන්සේගේ ආලේපය ලත් පුද්ගලයා විය.

යේසුන්වහන්සේ ඉශ්‍රායෙල් ගෝත්‍රයකින් එක් අයෙක් බැගින්, ගෝලයින් 12 දෙනා කැඳවූ අවස්ථාවේ, තමා එම දොළොස් දෙනා අතර කෙනෙක් ලෙස ගණන් නොගත් සේක. උන්වහන්සේ ඉශ්‍රායෙල්ට ඉහළින් සිටින බැවින්, උන්වහන්සේ ඔවුන්ට ඉහළින් සිටි සේක. අවසන් රාත්‍රි භෝජනයේ දී, තමා නව ගිවිසුමේ, දෙවියන්වහන්සේ සමඟ නව සම්බන්ධතාවයේ මූලය බව උන්වහන්සේ ප්‍රකාශ කළ සේක. දෙවියන්වහන්සේ ලෝකයේ සිදු කරමින් පවතින දේ තුළ තමා කේන්ද්‍රීය බව උන්වහන්සේ දුටු සේක.

**යේසුන්වහන්සේ පිළිබඳ කරුණු පහක්**

1. යේසුන්වහන්සේ ශාරීරික, මැරෙන සුළු මනුෂ්‍යයෙක් වූ සේක.

2. යේසුන්වහන්සේට දෙවියන්වහන්සේගේ අධිකාරීත්වය තිබිණි.

3. දෙවියන්වහන්සේගේ මහිමයෙහි කොටස්කරුවෙකු වන බව යේසුන්වහන්සේ කී සේක.

4. මිනිස්සු යේසුන්වහන්සේට නමස්කාර කිරීම යෝග්‍ය බව නව ගිවිසුම පවසයි.

5. දෙවියන්වහන්සේ කවුරුන්දැයි සහ මනුෂ්‍යත්වය කෙබඳු විය යුතුදැයි දක්වමින් යේසුන්වහන්සේ සැබෑ ලෙසම මනුෂ්‍යයෙක් සහ සැබෑ ලෙසම දෙවිඳුන් වන සේක.

යේසුන්වහන්සේ චාරිත්‍රවලට විරුද්ධව, ව්‍යවස්ථාවට විරුද්ධව, දේවමැළිගාවට විරුද්ධව, ආගමික නායකයින්ට විරුද්ධව ඉතා තදින් කතා කළ සේක. සියල්ල අත්හැර තමා අනුගමනය කිරීමට, ඔවුන්ගේ ජීවිතවල ප්‍රථම ස්ථානය උන්වහන්සේට දීමට, සම්පූර්ණ පක්ෂපාතීත්වය උන්වහන්සේට දීමට තම ගෝලයින්ගෙන් උන්වහන්සේ ඉල්ලූ සේක. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ අධිකාරියෙන් යුක්තව කතා කළ සේක - එහෙත් උන්වහන්සේ තමාගේම අධිකාරියෙන් යුක්තව කතා කළ සේක.

යේසුන්වහන්සේ තමා පැරණි ගිවිසුමේ දිවැසිවාක්‍යවල සම්පූර්ණත්වය වන බව විශ්වාස කළ සේක. මිනිසුන් ඔවුන්ගේ පාපයෙන් මුදවාගැනීමේ මිලයක් වීම පිණිස මැරෙන දුක් විඳීමේ සේවකයා උන්වහන්සේ වූ සේක (යෙසායා 53 : 4- 5, මතෙව් 26 : 24, මාක් 9 : 12, ලූක් 22 : 37, 24 : 46 ). කොටළුවෙකු පිට නැඟී යෙරුසලමට යන සාමයේ රජතුමා උන්වහන්සේ ය (සෙකරියා 9 : 9 - 10, මතෙව් 21 : 1 - 9). සියලු බලය සහ අධිකාරිය පවරනු ලැබූ මනුෂ්‍ය පුත්‍රයා උන්වහන්සේ ය (දානියෙල් 7 : 13 - 14, මතෙව් 26 : 64).

## පූර්ව ජීවිතය

ආබ්‍රහම් ඉපදෙන්නට පෙර උන්වහන්සේ සිටි බව යේසුන්වහන්සේ ප්‍රකාශ කළ සේක : "ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. ආබ්‍රහම් උපදින්නටත් පෙර මම වීමි" (යොහන් 8 : 58). යේසුන්වහන්සේ දිව්‍යමය දෙයක් පවසන බවට යුදෙව් ආගමික නායකයෝ සිතූහ. එම නිසා උන්වහන්සේට ගල් ගසා මැරීමට ඔවුන්ට අවශ්‍ය විය (59 පදය). "මම වීමි" යන වාක්‍යාංශය, දෙවියන්වහන්සේ මෝසෙස් හට තම නාමය එළිදරව් කළ, නික්මයාම 3 : 14හි ප්‍රති-නිරූපණයකි: "ස්වයංභූ තැනැන්වහන්සේ ඔබ වෙත මා එවූ සේකැයි නුඹ ඉශ්‍රායෙල් ජනයාට කිව යුතු යයි වදාළ සේක." යේසුන්වහන්සේ මෙම නාමය උන්වහන්සේ උදෙසා භාවිත කළ සේක.

ලෝකයේ ආරම්භයට ප්‍රථමයෙන් තමා දෙවියන්වහන්සේගේ මහිමයට පංගුකාර වූ බව යේසුන්වහන්සේ කී සේක (යොහන් 17 : 5). වචනය ලෙස, උන්වහන්සේ කාලයේ ආරම්භයට පෙර සිටි බව යොහන් අපට පවසයි (යොහන් 1 : 1). වචනය තුළින් විශ්වය මවන ලද බව යොහන් පවසයි (යොහන් 1 : 3). පියාණන්වහන්සේ නිර්මාණකරුවාණන් වූ සේක, එම නිර්මාණය සිදු කළේ වචනයයි. "මුළු විශ්වයම උන්වහන්සේ කරණකොටගෙන ද උන්වහන්සේ උදෙසා ද මවා තිබේ " (කොලොස්සි 1 :16, 1 කොරින්ති 8 : 6). පුත්‍රයාණන් තුළින් පියාණන්වහන්සේ විශ්වය සැදූ බව හෙබ්‍රෙව් 1 : 2 පවසයි.

පුත්‍රයාණන් විශ්වය ස්ථිරසාර කරන බව හෙබ්‍රෙව් සහ කොලොස්සි යන පොත් දෙකම අපට පවසයි (හෙබ්‍රෙව් 1:3, කොලොස්සි 1:17). උන්වහන්සේ "අදෘශ්‍යමාන දෙවියන්වහන්සේගේ දෘශ්‍යමාන ස්වරූපය" බව පොත් දෙකම අපට පවසයි ( කොලොස්සි 1:15). " උන්වහන්සේ දෙවියන්වහන්සේගේ මහිමතාවයේ ප්‍රභාවය ද දෙවත්වයේ ස්වරූපය ද වන සේක" (හෙබ්‍රෙව් 1:3)

යේසුන්වහන්සේ යනු කවරෙක් ද? උන්වහන්සේ මාංශවත් වූ දෙවිඳුන් වන සේක. උන්වහන්සේ ආරම්භයේ දී දෙවියන්වහන්සේ සමඟ සිටි සේක. උන්වහන්සේ සියල්ලෙහි මැවුම්කරුවාණෝය. ජීවිතයෙහි කර්තෘවරයාණෝය (ක්‍රියා 3 : 15). උන්වහන්සේගේ ස්වභාවය නියම ලෙසම දෙවියන්වහන්සේ මෙන් වේ, එසේම දෙවියන්වහන්සේට පමණක් ඇති බලය උන්වහන්සේට විය. මාංශයෙහි පවා උන්වහන්සේ දෙවියන්වහන්සේ බව ගෝලයෝ නිගමනය කළෝ ය.

**නමස්කාරය ලැබීමට වටිනා**

යේසුන්වහන්සේ අධි - ස්වභාවික ආකාරයකට පිළිසිඳගත් සේක (මතෙව් 1 : 20,ලූක් 1 : 35). කිසි විටක පාපයක් නොකර උන්වහන්සේ ජීවත් වූ සේක (හෙබ්‍රෙව් 4 : 15). උන්වහන්සේ නිර්දෝෂී මෙන්ම, අපවිත්‍ර බවින් තොර වූ සේක ( හෙබ්‍රෙව් 7 : 26, 9 : 14). උන්වහන්සේ කිසි පාපයක් නොකළ සේක (1 පේදුරු 2 : 22). උන්වහන්සේ තුළ කිසි පාපයක් නොවී ය (1 යොහන් 3 : 5). උන්වහන්සේ කිසි පාපයක් දැනනොගත් සේක (2 කොරින්ති 5 : 21). පාපය කෙතරම් පොළඹවන සුළු ද යන්න ගැටලුවක් නැත. යේසුන්වහන්සේ සැම විටම දෙවියන්වහන්සේට කීකරු වීමට උසස් ආශාවකින් පසු වූ සේක. උන්වහන්සේගේ මෙහෙය දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීම විය (හෙබ්‍රෙව් 10 : 7).

විවිධ අවස්ථාවල දී යේසුන්වහන්සේට මිනිස්සු නමස්කාර කළෝ ය (මතෙව් 14 : 33, 28 : 9, 17, යොහන් 9 : 38). දේවදූතයෝ නමස්කාරය ප්‍රතික්ෂේප කළෝ ය (එළිදරව් 19 : 10), එහෙත් යේසුන්වහන්සේ එසේ නොකළ සේක. ඇත්තෙන්ම දේවදූතයෝ පවා, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේට නමස්කාර කළෝ ය (හෙබ්‍රෙව් 1 : 6). ඇතැම් යාච්ඤාවලින් කතා කරන්නේ යේසුන්වහන්සේට ය (ක්‍රියා 7 : 59-60, 2 කොරින්ති 12 : 8, එළිදරව් 22 : 20). උන්වහන්සේ නමස්කාරය ලැබීමට සුදුසු තැනැන්වහන්සේ ය.

සාමාන්‍යයෙන් දෙවියන්වහන්සේට පමණක් වෙන් වූ ස්තුති ගීතිකාවන් සහිත විචිත්‍ර ප්‍රශංසාවන් නව ගිවිසුම යේසුන්වහන්සේ හට දෙයි : "උන්වහන්සේට සදාකාලයෙන් සදාකාලයට මහිමය වේවා" (2 තිමෝති 4: 18, 2 පේදුරු 3 : 18, එළිදරව් 1 : 6). කුමන කාලයේදී හෝ දෙනු ලැබිය හැකි උසස්ම පදවි නාමය උන්වහන්සේට විය (එපීස 1 : 21 -22). අපි

දෙවියන්වහන්සේ යයි උන්වහන්සේට කතා කරන කල පවා, එම පදවි නාමය උන්වහන්සේට උසස් වැඩි නැත.

එළිදරව් පොතේ, දෙවියන්වහන්සේට සහ බැටළු පැටවාණන්ට එක සමාන ප්‍රශංසාව දී ඇත, සමානත්වය හඟවා ඇත : "සිංහාසනයෙහි වැඩහිඳින තැනැන්වහන්සේටත්, බැටළු පෝතකයාණන්ටත් ප්‍රශංසාව ද, ගෞරවය ද, මහිමය ද, පරාක්‍රමය ද සදහටම වේවා" (එළිදරව් 5 : 13). පියාණන්වහන්සේ හා සමඟ එක සමාන ගෞරවයක් පුත්‍රයාණන්වහන්සේට දෙනු ලැබේ (යොහන් 5 : 23). යේසුන්වහන්සේ සහ දෙවියන්වහන්වහන්සේ යන දෙදෙනාටම අල්ෆා සහ ඕමෙගා, සියල්ලෙහි ආරම්භය සහ අවසානය යයි කියනු ලැබේ (එළිදරව් 1 : 8, 17, 21 : 6, 22 : 13).

පරණි ගිවිසුමේ දෙවියන්වහන්සේ පිළිබඳ කොටස් ගෙන බොහෝ විට නව ගිවිසුම එය යේසුන්වහන්සේට අදාළ කරයි. මෙම කොටස්වලින් නමස්කාරය පිළිබඳ ඉතා මනහර එකක් මෙසේ ය : "එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේ අති උසස් තැනට නංවා සියලු නාමයන්ට වඩා අග්‍ර නාමය උන්වහන්සේට දුන් සේක. එසේ කළේ ස්වර්ගයෙහි ද, පොළොවෙහි ද, පාතාල ලෝකයෙහි ද සියල්ලන් "ජේසුස්" යන නාමයට දණ නමන පිණිසත්, යේසුන් ක්‍රිස්තුන් වහන්සේ දෙවියන්වහන්සේ යයි දෙවි පියාණන් වහන්සේගේ මහිමය සඳහා සෑම දිවකින්ම ප්‍රකාශ කරන පිණිසත් ය" (පිලිප්පි 2 : 9 - 11 සඳහන් යෙසායා 45 : 23 උපුටා දැක්වීම). යෙසායා සඳහන් කළ දෙවියන්වහන්සේට දෙනු ලබන ගෞරවය සහ ප්‍රශංසාව යේසුන්වහන්සේ ලබා ගන්නා සේක.

සිටින්නේ එකම ගැළවුම්කරුවෙක් බව යෙසායා පවසයි (යෙසායා 43 11, 45 : 21). පාවුල්තුමා ඉතා පැහැදිලි ලෙස, දෙවියන්වහන්සේ ගැළවුම්කරුවාණන් වන බව සහ යේසුන්වහන්සේ ගැළවුම්කරුවාණන් වන බව පවසයි (තිතස් 1 : 3 - 4, 2 : 10, 13). එමනිසා, සිටින්නේ එක් ගැළවුම්කරුවෙක් ද? නැතිනම් දෙදෙනෙක් ද? මුල් කිතුනුවෝ ඇත්තේ එකම දෙවියන්වහන්සේ සහ එකම ගැළවුම්කරුවාණන් වුව ද, පියාණන්වහන්සේ දෙවියන්වහන්සේ බවත්, යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ බවත් නිගමනය කළහ. පියාණන්වහන්සේ සහ පුත්‍රයාණන්වහන්සේ ස්වභාවයෙන් එක සමාන (දෙවියන්වහන්සේ) වන සේක. එහෙත් පුද්ගලත්වය අතින් වෙනස් වන සේක.

නව ගිවිසුමේ වෙනත් පද බොහොමයක් ද යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ බව කතා කරයි. යොහන් 1 : 1 මෙසේ පවසයි. "ධර්මයාණෝ දෙවියන්වහන්සේවම සිටි සේක". 18 වන පදය "කිසිවෙකු කවදාවත් දෙවියන්වහන්සේ දුටුවේ නැත. පියාණන්ගේ ළයෙහි උන්වහන්සේගේ එකම පුත්‍රයාණෝම උන්වහන්සේ ප්‍රකාශ කර වදාළ සේක" යයි පවසයි. පියාණන්වහන්සේ දැනගැනීම පිණිස වූ දෙවියන්වහන්සේ යේසුන්වහන්සේ වන සේක. උත්ථානයෙන් පසුව, යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ බව තෝමස් හඳුනා ගත්තේ ය : "මාගේ ස්වාමිනි, මාගේ දෙවියනි" (යොහන් 20 : 28).

පිතෘ මූලිකයින් ශ්‍රේෂ්ඨ බව පාවුල්තුමා පැවසීය. මන්ද "මනුෂ්‍යයෙකු ලෙස ක්‍රිස්තුන් වහන්සේ උපන්නේත් එම පෙළපතෙහිම ය. මුළු විශ්වයට අධිපති වූ දෙවියන්වහන්සේට සදහටම ප්‍රශංසා වේවා! ආමෙන්" (රෝම 9 : 5). හෙබ්‍රෙව් පෙතේ, යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ යයි දෙවියන්වහන්සේම කී සේක. "එහෙත් පුත්‍රයාණන් ගැන : දෙවියන්වහන්ස, ඔබගේ සිංහාසනය සදහටම පවත්නේය" (හෙබ්‍රෙව් 1 : 8).

“ක්‍රිස්තුන්වහන්සේ තුළ උන්වහන්සේගේ මිනිස් බවෙහිම දේවත්වයේ පරිපූර්ණතාව වැඩවාසය කරයි” (කොලොස්සි 2 : 9) පාවුල්තුමා කීවේ ය. යේසුන් ක්‍රිස්තුන්වහන්සේ දැන් පවා ශරීරාකාරයෙන් සිටියේ වී නමුත්, සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේ වන සේක. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ නියම නියෝජනය - මාංශවත් වූ දෙවියන්වහන්සේ වන සේක. යේසුන්වහන්සේ මනුෂ්‍යයෙක් පමණක් වූයේ නම්, උන්වහන්සේ තුළ අපගේ විශ්වාසය තැබීම වැරදි ය. එහෙත් උන්වහන්සේ දෙවියන්වහන්සේවන නිසා, උන්වහන්සේ විශ්වාස කිරීමට අපට *අණ* කර තිබේ. උන්වහන්සේ දෙවියන්වහන්සේ වන නිසාවෙන්, සම්පූර්ණයෙන්ම විශ්වාස කටයුතු ය.

කෙසේ වුව ද, වචන දෙක අතර සරල සමානකමක් තිබූ බැවින්, “යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ” යයි කීම වැරදි මඟපෙන්වීමකි. එකක් අනුව, යේසුන්වහන්සේ මනුෂ්‍යයෙක් ද වන සේක. දෙවනුව, යේසුන්වහන්සේ සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේ නොවන සේක. “යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ” යයි අපට පැවසිය නොහැකි ය. බොහෝ අවස්ථාවල දී, “දෙවියන්වහන්සේ” යනුවෙන් අදහස් කරන්නේ “පියාණන්වහන්සේ ය”. බයිබලය යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ යයි ඉතා අඩු වශයෙන් පවසන්නේ ඒ නිසාවෙනි. එහෙත්, යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ වන නිසාවෙන්, එම වචනය යේසුන්වහන්සේ උදෙසා ද සුදුසු ලෙස භාවිත කළ හැකි ය. දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලෙස, ත්‍රිත්වයේ දේවත්වයේ උන්වහන්සේ එක් පුද්ගලයෙකි. යේසුන්වහන්සේ වූ කලි, දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යත්වය එක් වූ අද්විතිය පුද්ගලයෙකි.

යේසුන්වහන්සේගේ දේවත්වය අපට ඉතා වැදගත් වේ. මන්ද උන්වහන්සේ දෙවියන්වහන්සේ වන සේක් නම් පමණක් ඉතා නිවැරදිව දෙවියන්වහන්සේ අපට අනාවරණය කළ හැකි බැවිනි (යොහන් 1 : 8, 14 : 9). දිව්‍යමය පුද්ගලයෙකුට පමණක් අපගේ පාපවලට සමාව දිය හැකි වේ, අප මුදවාගත හැකි වේ, දෙවියන්වහන්සේ සමඟ අප සමාදාන කළ හැකි වේ. දිව්‍යමය පුද්ගලයෙකු පමණක් අප සම්පූර්ණ පක්ෂපාතීත්වය දක්වන ස්වාමීන්වහන්සේ. අප ගීතිකාවෙන් සහ යාච්ඤාවෙන් නමස්කාර කරන මිදුම්කරුවාණන්, අපගේ ඇදහිල්ලෙහි මූලය විය හැකි ය.

**සැබෑ ලෙසම මනුෂ්‍යයෙක්, සැබෑ ලෙසම දෙවියන්වහන්සේ**

ඉහත සඳහන් ශුද්ධ ලියවිලි යොමුවලින් නව ගිවිසුම පුරා යේසුන්වහන්සේ පිළිබඳ බයිබලීය තොරතුරු විසිරී ඇති බව ඔබ දුටුවෙහි ය. රූපණය අනුරූප වේ. එහෙත් එයින් අදහස් කරන්නේ සියල්ල එක් තැනකට ඇදගනු ලැබූ බවක් නොවන්නේ ය. මුල් සභාව කරුණු එකට එකතු කළ යුතුව තිබිණි. ඔවුහු මෙම නිගමනයන් බයිබලීය එළිදරව්වෙන් ඇදගත්හ.

- යේසුන්වහන්සේ, දෙවියන්වහන්සේගේ පුත්‍රයා, සැබවින්ම දෙවියන්වහන්සේ වන සේක.
- දෙවියන්වහන්සේගේ පුත්‍රයා සැබවින්ම මිනිසෙකු වූ සේක. එහෙත් පියාණන්වහන්සේ එසේ නොවූ සේක.
- දෙවියන්වහන්සේගේ පුත්‍රයා සහ පියාණන්වහන්සේ වෙනස් ය. ඔවුහු එක්කෙනෙක් නොවෙති.
- සිටින්නේ එකම දෙවියන්වහන්සේ ය.
- පුත්‍රයාණන් සහ පියාණන් යනු එම එකම දෙවියන්වහන්සේගේ පුද්ගලභාවයන්ය.

පියාණන්වහන්සේගේ ස්වභාවය ඇති යේසුන්වහන්සේ. දෙවියන්වහන්සේගේ පුත්‍රයා, දේවත්වයෙන් යුතු බව නයිසියානු කවුන්සලය (ක්‍රි. ව. 325) ප්‍රකාශ කළේ ය. එසේම උන්වහන්සේ මනුෂ්‍යයෙකු බව චාල්සෙන්ඩන් කවුන්සිලය (ක්‍රි. ව. 451) පැහැදිලි කළේ ය.

යේසුන් ක්‍රිස්තුන් වහන්සේ වන අපගේ ස්වාමීන්වහන්සේ එක්කෙනෙක් සහ එකම පුත්‍රයාණන්වහන්සේ වන සේක. දේවත්වයේ එක සමාන සම්පූර්ණත්වය සහ මනුෂ්‍යත්වයේ එක සමාන සම්පූර්ණත්වය දරන සේක. සැබවින්ම දෙවියන්වහන්සේ සහ සැබවින්ම මිනිසෙක් වන සේක ... සියලු යුගවලට පෙර පියාණන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් සහ උන්වහන්සේගේ දේවත්වය ඇති ... උන්වහන්සේගේ මනුෂ්‍යත්වය පිළිබඳ ... කන්‍යා මරියතුමියගේ පුත්‍රයාණන් බව: එකම සහ ක්‍රිස්තුන්වහන්සේම වන, පුත්‍රයාණන්, ස්වාමින්වහන්සේ, ඒක ජාතක, ස්වභාවයන් දෙකකින් පෙන්නුම් කරනු ලැබුවා වූ ... ස්වභාවයන්ගේ වෙනස්කම ඇතත් කිසිවක් ඉවත් කර නැති එකමුතු බව සහිත පුද්ගලයා තුළ සිටින සේක.

අවසාන කොටස ඇතුළත් කර තිබෙන්නේ සමහර මිනිස්සු යේසුන්වහන්සේගේ මනුෂ්‍ය ස්වභාවයේ දිව්‍යමය ස්වභාවයේ බලය වැඩියෙන් ඇති බැවින් උන්වහන්සේ ඇත්තෙන්මමනුෂ්‍යයෙක් නොවන බව පවසන නිසාවෙනි. අනෙක් පිරිස එම ස්වභාවයන් දෙකම තුන්වන ස්වභාවයක් නිර්මාණය කිරීමට එක් වී ඇති බව සම එම නිසා යේසුන්වහන්සේ මනුෂ්‍යයෙක් හෝ දෙවියන්වහන්සේ හෝ නොවන බව පවසති. නැත. බයිබලිය දත්ත පවසන්නේ උන්වහන්සේ සැබවින්ම මනුෂ්‍යයෙක් සහ සැබවින්ම දිව්‍යමය බව පවසන අතර, සභාව විසින් ද එය පැවසිය යුතු වේ.

**මෙය සිදුවිය හැකි කෙසේ ද?**

අපගේ ගැළවීම රැඳී ඇත්තේ යේසුන්වහන්සේගේ මනුෂ්‍යත්වය සහ දේවත්වය මතය. එහෙත් එය සිදු විය හැකි කෙසේ ද? අසීමිත දෙයක් සීමිත බවට පත් වන්නේ කෙසේ ද? දෙවියන්වහන්සේගේ ශුද්ධ වූ පුත්‍රයාණන් පාපිෂ්ට මාංශයේ සමානත්වය ලෙස මනුෂ්‍යයෙක් බවට පත් වන්නේ කෙසේ ද?

අපගේ ප්‍රශ්නය පැමිණෙන්නේ ප්‍රධාන වශයෙන් දැනට අපට පෙනෙන දූෂිත සහ අපගේ මනුෂ්‍යත්වය පමණක් නිසාවෙනි. එහෙත් දෙවියන්වහන්සේ එය මැව්වේ එවන් ආකාරයකින් නොවන්නේ ය. සැබෑ මනුෂ්‍යත්වය කුමක්ද යන්න යේසුන්වහන්සේ අපට පෙන්වන සේක. එක් කරුණක් වන්නේ, උන්වහන්සේ පියාණන්වහන්සේ කෙරෙහි සම්පූර්ණයෙන්ම රඳා සිටින මනුෂ්‍යයෙක් පෙන්නුම් කළ සේක. මනුෂ්‍යත්වය මේ ආකාර විය යුතු වේ.

එසේම යේසුන්වහන්සේ දෙවියන්වහන්සේට කළ හැකි කුමක්ද යන්න ද පෙන්නු සේක. උන්වහන්සේට තමාගේ මැවිල්ලේම කොටසක් බවට පත් වීමට හැකි ය. මැවිල්ලේ සහ මවනු නොලැබූ දෙයෙහි, ශුද්ධ සහ පාපී දෙය අතර පාලමක් වීමට උන්වහන්සේට පුළුවන. අපට අමාරු යයි සිතන දේවල් දෙවියන්වහන්සේට පහසු වේ. නව මැවිල්ලේ මනුෂ්‍යත්වය කෙබඳු වේදැයි යේසුන්වහන්සේ පෙන්නු සේක. උන්වහන්සේගේ පැමිණීමේ දී, අප ඔසවාගනු ලැබීමේ දී අපි උන්වහන්සේ මෙන් වන්නෙමු (1 යොහන් 3 : 2). අපිට උන්වහන්සේගේ ශරීරයට සමාන මහිමාන්විත ශරීර ඇති වේ (1 කොරින්ති 15 : 42 - 49).

අපට දෙවියන්වහන්සේ වෙත යේසුන්වහන්සේ තුළින් මාර්ගය පෙන්නු යේසුන්වහන්සේ අපගේ පුරෝගාමියා වන සේක. උන්වහන්සේ මනුෂ්‍යයෙකු බැවින්, අපගේ දුර්වලතාවයෙහි දී උන්වහන්සේ දුක් වන සේක. උන්වහන්සේ දේවත්වය දරන නිසාවෙන්, දෙවියන්වහන්සේගේ දකුණුපස හිඳ අප උදෙසා සවිලවත් ලෙස මැදහත්කම් කරන සේක. අපගේ ගැළවුම්කරුවාණන් ලෙස යේසුන්වහන්සේ සමඟ අපගේ ගැළවීම සුරක්ෂිත බවට අපට සහතිකයක් ඇත්තේ ය.

## ගෝලත්වය 101
## 2 ආ ඒකකය



## බලාපොරොත්තතු වීමට හේතුව

පැරණි ගිවිසුම වූ කලි බිඳුණු බලාපොරොත්තුවේ කතාවකි. එය ආරම්භ වන්නේ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූ බව අනාවරණය කරමිනි. එහෙත් එයට ටික කාලයකට පසු මනුෂ්‍යයින් පාපය කිරීම නිසාවෙන් පාරාදීසයෙන් එළවා දමනු ලැබිණි. එහෙත් විනිශ්චයේ වචනය සමඟින් පොරොන්දුවේ වචනය ද පැමිණියේ ය - ඒවගේ පරම්පරාවෙන් පැවතෙන කෙනෙක් සාතන් පොඩි කරන බව දෙවියන්වහන්සේ සාතන්ට කී සේක (උත්පත්ති 3 : 15). මිදුම්කරුවෙක් පැමිණෙනු ඇත.

ඒව තම පළමු දරුවා විසඳුම වනු ඇතැයි කල්පනා කළා ය. එහෙත් ඒ ප්‍රශ්නයේ කොටසක් කායින් විය. පාපය නොකඩව පැවතිණි. එය ඉතා නරක අතට පත් විය. නෝවාගේ කාලයේ දී ගැළවීමේ කොටසක් ඇති වූ නමුත්, පාපය නොකඩව පැවතිණි. කානාන්ගේ පාපය ද ඉන් පසුව බාබෙල් පාපය ද විය. මනුෂ්‍යත්වය දිගටම ප්‍රශ්න සහිතව, වඩා හොඳ යමක් පිළිබඳ බලාපොරොත්තුව ඇතිව සිටිය ද, එය ළඟා නොවිය.

ආබ්‍රහම් හට ඇතැම් වැදගත් පොරොන්දු දෙනු ලැබිණි. එහෙත් සියලු පොරොන්දු ලබා ගැනීමට පෙර ඔහු මිය ගියේ ය. ඔහු පුත්‍රයෙක් ලැබී ය. එහෙත් දේශයක් නොලැබී ය. එසේම ඒ වන විට ඔහු සියලු ජාතීන්ට ආශිර්වාදයක් නොවී ය. එහෙත් පොරොන්දුව නොකඩව පැවතිණි. එය නැවත වරක් ඊසාක් හට ද, පසුව යාකොබ් හට ද දෙනු ලැබිණි.

යාකොබ් සහ ඔහුගේ පවුල ඊජිප්තුවට ගොස් විශාල ජාතියක් බවට පත් වූහ. එහෙත් ඔවුහු වහල්ලු වූහ. එහෙත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දුවලට විශ්වාසවන්තව සිටි සේක. ඉතා විශිෂ්ට හාස්කම් සහිතව දෙවියන්වහන්වහන්සේ ඔවුන් ඊජිප්තුවෙන් පිටතට ගෙනා සේක.

එහෙත් ඉශ්‍රායෙල් ජාතියට පොරොන්දුව හිමි කර ගැනීමට නොහැකි විය. හාස්කම් උපකාරයක් නොවිණි. ව්‍යවස්ථාව උපකාර නොවී ය. ඔවුහු දිගටම පාපයේ සිටියහ, පරාජයට පත් වෙමින් සිටියහ, සැක කරමින් සිටියහ, දින 40ක් මංමුළා වී සිටියහ. එහෙත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පොරොන්දුවලට සත්‍යවාදීව සිටි සේක. උන්වහන්සේ බොහෝ හාස්කම් සමඟින්, ඔවුන් කානාන් දේශයට ගෙනා සේක. ඔවුන්ට දේශය හිමි කර දුන්සේක.

එහෙත් ඔවුන්ගේ ප්‍රශ්න විසඳ ගැනීමට නොහැකි විය. ඔවුහු තවමත් පාපිෂ්ට මිනිස්සු වූහ. වීරාවලිය පොතෙහි ඔවුන්ගේ පාපවල ඇතැම් විපාක දක්වා ඇත. මෙම අවුල් වූ ජාතිය අන්‍ය ජාතීන්ට සැමදාටම ආශිර්වාදයක් වන්නේ කෙසේ ද? ඔවුහු දිගටම පාපයේ නිරත වූහ. රූපවැඳීමට නැවත නැවත යොමු වූහ. අවසාන වශයෙන් දෙවියන්වහන්සේ උතුරු රාජධානියේ

ගෝත්‍ර අසිරියාව විසින් වහල්කමට ගෙන යාමට ඉඩ හැරිය සේක. එය යුදෙව්වරුන්ට මනස්ටාපනය වීමට හේතුවක් වී යයි ඔබට සිතෙන්නට පුළුවන. එහෙත් ඔවුහු පසුතැවිලි නොවූහ. මනුෂ්‍යයෝ නැවතත් වැරදි කළ බැවින් දෙවියන්වහන්සේ ඔවුන් වහල්කමට රැගෙන යාමට ඉඩ හැරිය සේක.

එසේ නම් පොරොන්දුව දැන් කොහේ ද? ආබ්‍රහම් ආරම්භ කළ ස්ථානයේ මනුෂ්‍යයෝ දැන් සිටිති. පොරොන්දුව කොහේ ද? පොරොන්දුව බොරු නොකියන දෙවියන්වහන්සේ තුළ විය. මනුෂ්‍යයෝ කෙතරම් දුර්වල ලෙස අසමත් වුව ද දෙවියන්වහන්සේ තම පොරොන්දුව ඉටු කරන සේක.

යුදෙව්වරුන්ට බබිලෝනියේ අවුරුදු 70ක් සිටින්නට දෙවියන්වහන්සේ ඉඩ හැරිය සේක. එයට පසුව, ඔවුන්ගෙන් කුඩා ප්‍රතිශතයක් නැවත යෙරුසලමට පැමිණියෝ ය. යුදෙව් ජාතිය ඔවුන්ගේ පෙර පැවති ස්වභාවයේ සෙවණැල්ලක් බවට පත්වූහ. ඔවුහු නිදහසේ රසය වින්දාහ. එසේම රෝමවරුන් විසින් පාලනය කරනු ලැබීමේ රසය වින්දාහ. ඊජිප්තුවේ හෝ බයිලෝනියේ සිටිනවාට වඩා හොඳින් ඔවුහු පොරොන්දු දේශයේ සිටියේ නැත. ඔවුහු කෙඳිරිගාමින් : දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු කොයි ද? අපි අන්‍ය ජාතින්ට ආලෝකයක් වන්නේ කෙසේ ද? අපට අප පාලනය කළ නොහැකි නම් දාවිත්ට දුන්නා වූ පොරොන්දු ඉටු වන්නේ කෙසේ ද? යයි ඇසූහ.

මනුෂ්‍යයින්ගේ බලාපොරොත්තු සුන් විය. ඇතැම් අය බලාපොරොත්තු අත්හැරියහ. සමහරු රහසේ විරුද්ධවාදී සංගම්වලට එක් වූහ. අනෙක් අය වඩා ආගමික බවක් ඇති කරගන්නට උත්සහා කරමින්, දෙවියන්වහන්සේගේ ආශිර්වාද ලැබීමට වඩා සුදුසු අය බවට පත් වන්නට උත්සහා දැරූහ. සැම දෙනාම දෙවියන්වහන්සේ විසින් යමක් කරනු ලබනු ඇතැයි සිතූහ.

**බලාපොරොත්තුවේ මඳ ආලෝකය**

දෙවියන්වහන්සේ ඉතාම කුඩා පහසු ආකාරයෙන් ආරම්භ කළ සේක - කන්‍යාවකගේ ගර්භයෙන්. යෙසායා තුළින් උන්වහන්සේ බලව, මම ලකුණක් ඔබට දෙන්නෙමි යනුවෙන් පැවසූ සේක. කන්‍යාව ගර්භනීව පුත්‍රයෙකු වදන්නීය. ඔහුට එම්මානුවෙල් යන නම තබන්න. එහි අර්ථය "දෙවියන්වහන්සේ අප සමඟය" යන්නයි. එහෙත් උන්වහන්සේ පළමුකොට යෙෂුවා (යේසුස්) නමින් අමතනු ලැබේ. එහි අර්ථය දෙවියන්වහන්සේ අප ගළවන සේක යන්නයි.

විවාහයට බාහිරව දරුවෙක් පිළිසිඳගැනීම තුළින් දෙවියන්වහන්සේ තම පොරොන්දුව සම්පූර්ණ කිරීම ආරම්භ කළ සේක. මෙය සමාජ අපකීර්තියට ලක් වන කරුණක් විය. අවුරුදු 30කට පසුව පවා යුදෙව් නායකයෝ යේසුන්වහන්සේගේ පෙළපත පිළිබඳ ප්‍රෝඩාකාර මත දැරූහ (යොහන් 8 : 41. දේවදූතයින් සහ අධි ස්වභාවික ගැබ්ගැනීම පිළිබඳ වූ මරියතුමියගේ කතාව කවරෙක් නම් විශ්වාස කරයි ද?

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟගේ බලාපොරොත්තු සම්පූර්ණ කිරීම ආරම්භ කළේ ඔවුන් නොපිළිගන්නා ආකාරයකට ය. "නිත්‍යානුකූල නොවන" බිළිඳ ජාතියකගේ බලාපොරොත්තු උදෙසා වූ පිළිතුර බවට කිසිවෙක් අනුමාන කරන්නේ නැත. බිළිඳෙකු හට කිසිත් කළනොහැකි ය. කිසිවෙකුට ඉගැන්විය නොහැකි ය. කිසිවෙකුට උපකාර කළ නොහැකි ය. කිසිවෙකු ගළවාගත නොහැකි ය. එහෙත් බිළිඳුන්ගේ හැකියාවන් වර්ධනය වේ.

බෙත්ලෙහෙමේ ගැළවුම්කරුවෙකු උපන් බව දේවදූතයෝ එඬේරුන්ට පැවසූහ (ලූක් 2 : 11). එහෙත් ඒ මොහොතේ දී උන්වහන්සේ කිසිවෙකු ගළවා ගත්තේ නැත. උන්වහන්සේට තමාවම ගළවාගැනීමට පවා සිදු විය. යුදෙව්වරුන්ගේ රජ වූ හෙරොද්ගෙන් දරුවා ගළවාගැනීම පිණිස පවුලේ අයට පළා යාමට සිදු විය.

කිසිවෙකුගේ උපකාරයක් නැති එම දරුවා ගැළවුම්කාරයා යයි දෙවියන්වහන්සේ කී සේක. එම බිළිඳා කරන්නට යන දේ උන්වහන්සේ දැන සිටි සේක. ඉශ්‍රායෙලයේ සියලු බලාපොරොත්තු එම දරුවා තුළ විය. අන්‍ය ජාතීන්ට ආලෝකය උන්වහන්සේ තුළ විය. සියලු ජාතීන්ට ආශිර්වාදය උන්වහන්සේ තුළ විය. ලෝකය පාලනය කරනු ලබන දාවිත්ගේ පුත්‍රයා එහි විය. සියලු මනුෂ්‍ය වර්ගයාගේ සතුරා පොඩි කරනු ලබන ඒවගේ පුත්‍රයා උන්වහන්සේ විය. එහෙත් උන්වහන්සේ ගව ඕරුවක උපත ලද, ජීවිතය පවා අනතුරේ ඇති ළදරුවෙක් පමණක් වූ සේක. එහෙත් උන්වහන්සේගේ උපත සියල්ල වෙනස් කළේ ය.

යේසුන්වහන්සේ උපන් කල, ඉගෙනගැනීම පිණිස අන්‍ය ජාතීන් ක්ෂණයකින් යෙරුසලමට පැමිණියේ නැත. දේශපාලන හෝ ආර්ථික හෝ ශක්තියක් පිළිබඳ ලකුණක් නොවී ය. කන්‍යාවක ගර්භනීව පුත්‍රයෙකු වැදූ බව මිස වෙන ලකුණක් නොවී ය. එය යුදයෙහි කිසිවෙකු විශ්වාස නොකරන්නක් විය.

එහෙත් දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ පොරොන්දුවලට විශ්වාසවන්ත නිසාවෙන් අප වෙත පැමිණි සේක. උන්වහන්සේම අපගේ බලාපොරොත්තුවල මූලය වන සේක. අපගේ මාර්ගය ක්‍රියාත්මක නොවන බව ඉශ්‍රායෙල් ඉතිහාසය නැවත නැවත අපට පෙන්නුම් කරන්නේ ය. මනුෂ්‍ය හැකියාවෙන් දෙවියන්වහන්සේගේ අරමුණු ළඟා කරගැනීමට අපට නොහැකි ය. අප සිතන අයුරින් දෙවියන්වහන්සේ ක්‍රියා නොකරන සේක. එහෙත් උන්වහන්සේ දන්නා අයුරින් සියල්ල සිදු වේ. අපගේ මාර්ග සැම විට වියවුල් වේ. අප සිතන්නේ නීතිය, දේපළ, රජුන් සහ රාජධානි යන මේ ලෝකයේ දේවල් ඇසුරිනි. දෙවියන්වහන්සේ ඉතා සුළු ආරම්භයන්ගෙන්, භෞතික දේවලට වඩා ආත්මික දේ ඇසුරින් සිතන සේක. බලයට වඩා දුර්වලකමේ දී ජය ලැබීම පිළිබඳ උන්වහන්සේ සිතන සේක.

දෙවියන්වහන්සේ අපට යේසුන්වහන්සේ දුන් කල, උන්වහන්සේකී සියල්ල සිදු කරමින්, උන්වහන්සේගේ පොරොන්දු සම්පූර්ණ කළ සේක. එහෙත් ඒ මොහොතේ දී අපි පොරොන්දු සම්පූර්ණ වීම අපි නුදුටිමු. අපි දුටුවේ ළදරුවෙක් පමණි. බොහෝ දෙනා එය විශ්වාස කළේ නැත. විශ්වාස කළ අයට පවා එය බලාපොරොත්තුවක් පමණක් විය.

**සම්පූර්ණ කිරීම**

අපගේ පාප වෙනුවෙන් වන්දියක් ලෙස තම ජීවිතය දීමට, අපට සමාව ලබා දීමට, අන්‍ය ජාතීන් හට ආලෝකයක් වීමට, යක්ෂයා පරාජය කිරීමට සහ උන්වහන්සේගේ මරණයෙන් සහ උත්ථානයෙන් මරණය පරාජය කිරීමට යේසුන්වහන්සේ වැඩුණු බව අපි දැන් දනිමු. යේසුන්වහන්සේ දෙවියන්වහන්සේගේ පොරොන්දුවල සම්පූර්ණත්වය වූයේ කෙසේද යන්න අපට පෙනෙන්නේ ය.

වසර 2,000කට පෙර යුදෙව්වන්ට පෙනුණාට වඩා අපට පෙනෙන නමුත්, අපට තවමත් ඇති සියලු දේ පෙනෙන්නේ නැත. අපි තවමත් සියලු පොරොන්දු සම්පූර්ණ වූ බව නොදකින්නෙමු. සාතන් බඳිනු ලැබූ බවත්, තවදුරටත් ජාතීන් රැවටීමට ඔහුට නොහැකි බවත් තවම අපි

නොදකින්නෙමු. සියලු ජාතීන් දෙවියන්වහන්සේ දැනගෙන සිටින බව අපි තවම නොදකින්නෙමු. හැඬීමෙහි, කඳුලෙහි සහ මරණයෙහි අවසානයක් වී ඇති බව අපි තවම නොදකින්නෙමු. අපි තවමත් අවසාන පිළිතුර දෙස ආශාවෙන් බලා සිටින්නෙමු. එහෙත් යේසුන්වහන්සේ තුළ අපිට බලාපොරොත්තුව සහ සුරක්ෂිත බව තිබේ.

අපට පොරොන්දුවක් ඇත. දෙවියන්වහන්සේ විසින් සහතික කළ, පුත්‍රයාණන්වහන්සේ විසින් වලංගු කළ, ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මුද්‍රා කරනු ලැබූ පොරොන්දුවක් ඇත. සියල්ල සිදු වන බවට අපි විශ්වාස කරමු. ක්‍රිස්තුන්වහන්සේ උන්වහන්සේ ආරම්භ කළ වැඩය සම්පූර්ණ කරන බව අපි විශ්වාස කරමු. අපේ බලාපොරොත්තුව එල දැරීමේ ආරම්භයයි. සියලු පොරොන්දු සම්පූර්ණ වන බවට අපිට සහතිකයක් තැබිය හැකි ය. අපි බලාපොරෙත්තු වන ආකාරයෙන් නොව, දෙවියන්වහන්සේ සැලසුම් කළ ආකාරයෙන් එය සිදු වනු ඇත.

පොරොන්දු වූ අයුරින් උන්වහන්සේගේ පුත්‍ර වූ ක්‍රිස්තුන්වහන්සේ තුළින් උන්වහන්සේ එය ඉටු කරනු ඇත. අපි එය දැන් දකින්නේ නැත. එහෙත් දෙවියන්වහන්සේ දැනටමත් ක්‍රියා කර ඇත. අපට නොපෙනන අයුරින් උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට උන්වහන්සේ ක්‍රියා කරමින් සිටින සේක. ළදරු යේසුන්වහන්සේ තුළ අපට ගැළවීමේ බලාපොරෙත්තුවක් සහ පොරොන්දුවක් තිබුණා සේම, උත්ථාන වූ යේසුන්වහන්සේ තුළ සම්පූර්ණත්වයේ බලාපොරොත්තුවක් සහ පොරොන්දුවක් ඇත්තේ ය. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ වර්ධනය සම්බන්ධයෙන් එය සත්‍ය ය. සභාවේ කාර්ය සම්බන්ධයෙන් එය සත්‍ය වේ. අපගේ ජීවිත සම්බන්ධයෙන් එය සත්‍ය වේ.

**අප උදෙසා වූ බලාපොරොත්තුව**

මනුෂ්‍යයන් ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ලට පැමිණෙන කල උන්වහන්සේගේ වැඩය ඔවුන් තුළ වර්ධනය වීම ආරම්භ වේ. අපි නැවත ඉපදිය යුතු බව යේසුන්වහන්සේ පැවසූ සේක. අප උන්වහන්සේ තුළ විශ්වාස කිරීමට පැමිණෙන කල ශුද්ධාත්මයාණන්වහන්සේ අප මුවා කරමින් අප තුළ නව ජීවිතයක් උපදවන සේක. යේසුන්වහන්සේ පොරොන්දු වූ පරිද්දෙන්, උන්වහන්සේ අප තුළ වසන්නට පැමිණෙන සේක.

කෙනෙක් වරක් මෙසේ පැවසීය, "යේසුන්වහන්සේට 1000 වතාවක් ඉපදෙන්නට හැකිය. එහෙත් උන්වහන්සේ මා තුළ ඉපදුණේ නැති නම්, එයින් මට යහපතක් සිදු නොවේ". යේසුන්වහන්සේ ලෝවට දෙන බලාපොරොත්තුව අපි උන්වහන්සේ අපගේ බලාපොරොත්තුව ලෙස පිළිගත්තේ නැති නම් අපට යහපතක් වන්නේ නැත. යේසුන්වහන්සේ අප තුළ ජීවත් වීමට ඉඩහැරීම අවශ්‍ය වේ.

කෙසේ වෙතත්, දෙවියන්වහන්සේ දුන් සියලු පොරොන්දුවල සම්පූර්ණත්වය අපි තවමත් ලබා නැත්තෙමු. උන්වහන්සේ පිළිගන්වන සියලු යහපත්කම් සහ ජීවිතය අපි ලබා නැත්තෙමු. අපට ඇත්තේ බලාපොරොත්තුව ය. එසේම පූර්ව ගෙවීමකි. එමෙන්ම, පැමිණෙන්නට ඇති දේවල් පිළිබඳ පොරොන්දුවකි. අපට දැන් තිබෙන දෙය දෙවියන්වහන්සේ විසින් අපට දෙන්නට යන මහිමයට සාපේක්ෂව බලන කල බිළිඳෙකි.

අපි අප දෙසම බලා මට මෙහි වඩා වැඩි දෙයක් නොපෙනේ යයි සිතීමට පුළුවන. මම මීට වසර 20කට පෙර වඩා හොඳ නොවූයෙමි. මම තවමත් පාපය සමඟ පොරබදිමි. සැක කරමින්, වරදකාරී සිතිවිලි ඇතිව සිටිමි. මම තවමත් ආත්මාර්ථකාමී සහ මුරණ්ඩු අයෙක්

වෙමි. පැරණි ඉශ්‍රායෙලයට වඩා මම හොඳ අයෙක් නොවෙමි. දෙවියන්වහන්සේ සැබවින්ම මා තුළ යමක් කරන සේක්දැයි මම මවිතයට පත් වෙමි. මම කිසිම ප්‍රගතියක් ලබා ඇති බවක් නොපෙනේ.

පිළිතුර වන්නේ යේසුන්වහන්සේ සිහිකරන්න යනුයි. අපගේ ආත්මික ආරම්භය හොඳ යයි දැනට නොපෙනෙන්නට හැකි ය. එහෙත් එය හොඳය. මන්ද එය එසේ යයි දෙවියන්වහන්සේ පවසන සේක. අප තුළ ඇති දේ මූලික ගෙවීමක් පමණි. එය ආරම්භයකි. එසේම එය දෙවියන්වහන්සේ වෙතින් වූ සහතිකයකි. අප තුළ ඇති ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණෙන්නට ඇති මහිමතාවයේ මුල් ගෙවීමකි.

යේසුන්වහන්සේ ඉපදුණු අවස්ථාවේ දී දේවදූතයෝ ගීත ගායනා කළ බව ලූක්තුමා අපට පවසයි. එය මනුෂ්‍යයෝ ඒ ආකාරයෙන් නොදුටුව ද ජයග්‍රාහී අවස්ථාවකි. දේවදූතයෝ නිසැක ලෙසම ජයග්‍රහණය ඇති බව දැන සිටියහ. මන්ද දෙවියන්වහන්සේ ඔවුන්ට එසේ පවසා තිබිණි.

පව්කරුවෙකු පසුතැවිලි වන අවස්ථාවේ දී දේවදූතයෝ ප්‍රීති වන බව යේසුන්වහන්සේ පවසන සේක. ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ලට පැමිණෙන සැම පුද්ගලයා වෙනුවෙන්ම ඔවුහු ගායනා කරති. මන්ද ඔවුන් බිළිඳෙකු උපන් බැවිනි. එම බිළිඳා ඉතා හොඳින් සියල්ල සිදු නොකරනු ඇත. ඔහුට බොහෝ දුෂ්කරතා තිබේ. එහෙත් ඔහු දෙවියන්වහන්සේගේ දරුවෙකි. එසේම දෙවියන්වහන්සේ තම වැඩය කරන පිණිස ඒ දෙස බලන සේක. උන්වහන්සේ අප ගැන සලකන සේක. අපගේ ආත්මික ජීවිත සම්පූර්ණ නැති වුව ද, දෙවියන්වහන්සේ තම වැඩය කරන තුරු අප තුළ උන්වහන්සේ ක්‍රියා කරන සේක.

බිළිඳු යේසුන්වහන්සේ තුළ අතිවිශාල බලාපොරොත්තුවක් ඇත්තා සේම, බිළිඳු කිතුනුවා තුළ ද අතිවිශාල බලාපොරොත්තුවක් ඇත්තේ ය. ඔබ කෙතරම් කලක් කිතුනුවෙකු වී සිටියා ද යන්න ප්‍රශ්නයක් නැත. ඔබට අතිවිශාල බලාපොරොත්තුවක් ඇත්තේ ය. මන්ද දෙවියන්වහන්සේ ඔබ තුළ ආයෝජනය කර ඇති සේක. උන්වහන්සේ ඔබ තුළ ආරම්භ කළ වැඩය හැර දමන්නේ නැත.

# ගෝලත්වය 101

# ඒකකය 2 ඇ



## අපගේ එදිනෙදා ජීවිතයේ මාංශවත් වීමේ අදාළත්වය

යේසුන්වහන්සේ දෙවියන්වහන්සේගේ මාංශවත් වීමයි. උන්වහන්සේ විශේෂිත මනුෂ්‍යයෙකි. උන්වහන්සේ මාංශවත් වී පැමිණීම අතිශයින් වැදගත් වේ. මන්ද අප වෙනුවෙන් උන්වහන්සේට මැරෙන්නට හැකි වුයේ එබැවිනි. මී ළඟ ඒකකයෙහි ඒ පිළිබඳ අපි වැඩිදුරට පවසන්නෙමු. මෙහි දී, අපගේ එදිනෙදා ජීවිතයට එය වැදගත් වන්නේ කෙසේ ද යන්න දක්වන්නෙමු.

උපතේ සිට මරණය දක්වා යේසුන්වහන්සේට ඉතා අමාරු ජීවිතයක් ගත කරන්නට සිදු විය. උන්වහන්සේට ප්‍රීතිජනක අවස්ථා සහ වේදනාත්මක අවස්ථා විය. අපි උන්වහන්සේට වඩා උතුම් නොවෙමු. ඒ නිසා ප්‍රශ්නවලින් තොර ජීවිතයක් අපට අපේක්ෂා කළ නොහැකි ය. මේ ලෝකයෙහි අපට පීඩා ඇති බව යේසුන්වහන්සේ කී සේක. උන්වහන්සේ අනුගමනය කිරීමේ මිලය පිළිබඳ උන්වහන්සේගේ ගෝලයින්ට අනතුරු ඇඟවූ සේක : යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇති ඔවුන්ගේ ඇදහිල්ල නිසා ඔවුන් දිනපතා තමන්ගේ කුරුසිය රැගෙන පැමිණිය යුතු විය. දුක් විඳීමට සහ මරණය විඳීමට කැමති විය යුතු විය (ලූක් 9 : 23).

අපි යේසුස් ක්‍රිස්තුන් වහන්සේ විශ්වාස කළත්, නැතත් අපට ගැටලු ඇති වේ. එහෙත් අපි උන්වහන්සේ විශ්වාස කරන කල, උන්වහන්සේ අපගේ ප්‍රශ්න *තේරුම්ගන්නා* බවට අපට සහතික විය හැකි ය. අපේ පීඩාවේ තත්වය උන්වහන්සේ දන්නා සේක. එයින් අපගේ පීඩාව පහව යන්නේ නැත. එහෙත් දෙවියන්වහන්සේ පවා මනුෂ්‍යයෙක්ව සිටි කල ප්‍රශ්නවලින් තොරව නොසිටිය බව දැනගැනීමට එය උපකාරයක් වේ. යේසුන්වහන්සේ තමා විඳි දේවලින් ඉගෙන ගත් සේක (හෙබ්‍රෙව් 5 : 8). ඒ නිසාවෙන්, "පරීක්ෂා කරනු ලබන්නන්ට උපකාර කරන්නට උන්වහන්සේට පුළුවන" (හෙබ්‍රෙව් 2 : 18).

අපි මනුෂ්‍යයන් වීම නිසාවෙන් අරගල කරන්නේ නම්, අපගේ ගැළවුම්කරුවාණන් ද එසේ අරගලයක යෙදුණු බව දැනගැනීම උපකාරයක් වේ. එය කෙසේදැයි දන්නා ගැළවුම්කරුවෙක් අපට සිටින සේක. යේසුන්වහන්සේ තුළ දෙවියන්වහන්සේම පීඩා විඳීමට කැමති වූ බව අපි දකිමු. එයින් අදහස් වන්නේ අපට අපගේ පීඩාවන් තේරුම්ගත නොහැකි වුව ද, ඒවාට යහපත් හේතුවක් ඇති බවයි. අපි යේසුන්වහන්සේගේ උත්ථාන වූ ශරීරය පමණක් නොව, උන්වහන්සේගේ පීඩා විඳීමේ ජීවිතයේත් පංගුකාරයින් වන බව පාවුල්තුමා පවසයි (පිලිප්පි 3 : 10 - 11). අපි මෙම ජීවිතයේ අමාරුකම් තිබේ. එසේම බොහෝ ප්‍රීතිය ද ඇත. මේ දෙකම එක්ව තිබේ.

# පීඩාවන් සහ ප්‍රීතිය



යෙරමියා මඩ ළිඳකට දැමීම (යෙරමියා 38 : 6).
චිත්‍රය : කෙන් ටනල් විසිනි.

“ඔබ තව ස්වල්ප කලකට විවිධාකාර පරීක්ෂාවලින් පීඩා කරනු ලැබිය යුතු නමුත්, ඒ ගැළවීම ගැන ඔබ ඉතා ප්‍රීති වන්නහු ය” යනුවෙන් පේදුරුතුමා ලිවීය (1 පේතීස් 1:6). බොහෝ කිතුනු නොවන අය, ඇතැම් විට කිතුනුවෝ පවා, මෙම පීඩාවේ සහ ප්‍රීතියේ සංයෝජනය පිළිබඳ විශ්මයට පත් වෙති. අපි *පීඩා විඳින* විට ප්‍රීති වන්නේ කෙසේ ද? ඇත්තෙන්ම, අපට පීඩා ඇති නිසා අපි ප්‍රීති වන්නේ නැත (පීඩා විඳීමේ කිසිම යහපතක් නැත). එහෙත් පීඩාව තිබිය දී පවා අපි ප්‍රීති වන්නෙමු. එය සිදු වන්නේ කෙසේ ද?

පේදුරුතුමා ලියූ දේ බලමු. “ඒ ගැළවීම ගැන ඔබ ඉතා ප්‍රීති වන්නහු ය”. අපට ඉමහත් ප්‍රීතියක් ගෙන දෙන්නේ කුමක් ද? එනම්, ගැළවීමයි. දෙවියන්වහන්සේ අපට සදාකාල උරුමයක් දෙන බවට අපට සහතික විය හැකි ය. අප වෙනුවෙන් යහපත් අනාගතයක් සලසා ඇත්තේ ය. මෙය අපට පෙන්නමු කරනු ලැබුවේ යේසුන් වහන්සේ මරණයෙන් උත්ථාන කිරීම තුළින් ය. අපි පොරොන්දුවේ මහිමය ලබන තුරු දෙවියන්වහන්සේගේ බලය අප වසාගනු ඇත (3 - 5 පද). යේසුන්වහන්සේ උත්ථාන කළ එම බලයම අපව ද සදාකාලික මහිමතාවට නැගිටුවනු ලබනවා ඇත !

පේදුරුතුමා 8 වන පදයෙහි ප්‍රීතිය පිළිබඳ නැවත කතා කරයි. අපි තවමත් අපගේ ගැළවුම්කරුවාණන් දැක නැති බව ඔහු පිළිගනියි. අපි තවමත් පොරොන්දුවේ උරුමය ලබා නැත්තෙමු. අපි සියලූ ආකාර පීඩාවලින් වේදනා විඳින්නෙමු. එහෙත් අපට ප්‍රීති වීමට පුළුවන. ඒ මන් ද? “ඔබගේ ඇදහිල්ලෙහි අරමුණ වන ඔබගේ ආත්ම ගැළවීම ලබන” (9 පදය) නිසාවෙනි. අපි දැනටමත් ඇදහිල්ල තුළින් ලබන ගැළවීම තුළ ප්‍රීති වන්නෙමු.

ඇදහිල්ලට අපගේ මනස, අපගේ හදවත් සහ අපගේ කැමැත්ත අයත් වේ. එයින් අදහස් වන්නේ දෙවියන්වහන්සේ පිළිබඳ යම් කාරණා අපි තේරුම්ගෙන පිළිගන්නා බවයි. එහි අදහස අපි චිත්තවේගී ලෙස මේ දේවලට ප්‍රතිචාර දක්වන බවයි. උන්වහන්සේ අපට ප්‍රේම කරන බව තේරුම්ගෙන ප්‍රේමයෙන් ද, උන්වහන්සේ අපට බොහෝ සෙයින් දෙන බව තේරුම්ගෙන ප්‍රීතියෙන් ද, අපගේ සදාකාලික ගැළවීම උදෙසා වන උන්වහන්සේගේ පොරොන්දු තේරුම්ගෙන විශ්වාස කරමින් ඇදහිල්ලෙන් ද ප්‍රතිචාර දක්වන්නෙමුව. අපගේ තේරුම්ගැනීම සහ අපගේ චිත්තවේග එකඟව ඇති විට, අපගේ කැමැත්ත ද එකඟ වේ. දිනපතා අප ගන්නා තීරණ දෙවියන්වහන්සේට ප්‍රසන්න වන අතර, එසේ වන්නේ අපි උන්වහන්සේගේ කැමැත්ත කරන ස්ථානයට උන්වහන්සේ අප ගෙනැවිත් ඇති බැවිනි.

එහෙත් තවමත් අපි පොරොන්දුවේ උරුමය ලබා නැත්තෙමු. අපි තවමත් හැඬීමක්වත්, මරණයක්වත් තවදුරටත් නැති කාලයට ළඟා වී නැත්තෙමු. අපි සියල්ලෝ හැඬීමත්, මරණයත් අත්දකින්නෙමුව. අපගේ වේදනාව සහ දුක ඇති කරන්නේ සතුරා වන පාපයයි.

අප පීඩා විඳින්නේ අපගේම වරද සහ පාපය නිසාවෙනි. එසේම අප අවට සිටින මිනිස්සු පාපයේ වහලුන් නිසා අපි දුක් විඳින්නෙමු. පාපය පව්කරුවා පමණක් නොව, ඔහු වටා සිටින අහිංසක අයට ද හානි ගෙන දෙයි. අපි බොහෝ විට අන් අයගේ පාපයට වැටීම නිසා පීඩා විඳින අය වෙමු. දෙවියන්වහන්සේගේ සතුරා සහ මහා ප්‍රොඩාකාරයා වන සාතන්, සැම මිනිසාගේම පාපි ස්වභාවය පෝෂණය කිරීමටත්, ධෛර්යමත් කිරීමටත් වෙහෙස ගනියි. එම නිසා, ශුද්ධවන්තයින්ට පීඩා කිරීම ඇතුළුව සියල්ලන්ට වඩාත් වේදනාව සහ විනාශය ගෙන දෙයි.

දෙවියන්වහන්සේ පීඩාවල දී අපට උපකාර කිරීමට පමණක් පොරොන්දු නොවූ අතර, උන්වහන්සේ අපට පීඩා ඇති වන බවට ද පොරොන්දු වූ සේක. ක්‍රිස්තුන්වහන්සේ පැමිණීයේ ප්‍රශ්නවලින් තොර ජීවිතයක් අපට ලබා දීමට නොවේ. ඒ වෙනුවට, උන්වහන්සේ නිසාවෙන් අප පවුල්වල භේද ඇති වන බවට (මතෙව් 10 : 43 - 36). අපට පීඩා ඇති වන බවට (යොහන් 16 : 33), අප පීඩාවට පත් කරන බවට (යොහන් 15 : 20) අනතුරු ඇඟවූ සේක. අපි දේව රාජ්‍යයට ඇතුළු වන්නේ බොහෝ පීඩා තුළින් ය (ක්‍රියා 14 : 22). සැම කිතුනුවෙක්ම පීඩාවට පත් වනු ඇත (2 තිමෝති 3 : 12). අපට පීඩා පැමිණෙන කල එය අමුතු දෙයක් යයි නොසිතිය යුතු ය (1 පේදුරු 4 : 12).

යේසුන්වහන්සේ මෙසේ කී සේක. ඔබ මා අනුව එන්ට කැමැත්තෙහි නම්, ඔබගේ කුරුසිය රැගෙන එන්න. ඔබ මා අනුව එන්ට කැමැත්තෙහි නම් පීඩා විඳීමට, ඔබගේ ජීවිතය නැති කරගැනීමට පවා කැමති වන්න. කිතුනු ජීවිතයට පීඩා ද ඇතුළත් වේ. ඒවා පැමිණෙන විට පුදුමයට පත් විය යුතු නැත. දාසයෙක් ස්වාමියෙකුට වඩා උතුම් නොවේ යයි යේසුන්වහන්සේ කී සේක. අපගේ ස්වාමින්වහන්සේ සහ ගුරුවරයා වන යේසුන්වහන්සේ අප ගළවා ගැනීම පිණිස දුක් විඳීමටත්, මරණය විඳීමටත් මනුෂ්‍යයෙක් වූයේ නම්, පීඩා විඳීම උන්වහන්සේගේ පුහුණුවේ කොටසක් වූයේ නම් (හෙබ්‍රෙව් 2 : 10, 5 : 8), එය අප ජීවිතවල ද කොටසක් වීම පුදුමයක් නොවේ.

**සංසන්දනය කිරීමට නොවටිනා වූ**

එහෙත් අප ඇතැම් විට අත්දකින පීඩාව මධ්‍යයේ පවා අපි ගැළවීම තුළ ප්‍රීති වන්නෙමු. අපගේ පීඩාව මධ්‍යයේ අපි ප්‍රීති වන්නේ කෙසේ ද පාවුල්තුමා මෙයට පැහැදිලි කිරීමක් ගෙන දෙයි : “මේ ජීවිතයේ දුක් වේදනා, අපට මතු එළිදරව් වන්නට යන මහිමය සමඟ කිසිසේත් සැසඳිය නොහැකි යයි කල්පනා කරමි” (රෝම 8 : 18).

අපි මහත් උරුමයක් ලබන බව පාවුල්තුමා පැහැදිලි කරයි. ඇත්තෙන්ම අපි “ක්‍රිස්තුන්වහන්සේ හා සමඟ හවුල් උරුමක්කාරයෝ වම්හ” (17 පදය). වර්තමානයේ දී අපි උන්වහන්සේගේ පීඩාවේ පංගුකාරයෝ වෙමුව. එහෙත් අපි උන්වහන්සේගේ මහිමයේ සම්පූර්ණයෙන්ම පංගුකාර වන දිනයක් පැමිණේ. වර්තමාන පීඩා අප උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්මේ කොටසකි. එය ක්‍රිස්තුන්වහන්සේගේ මහිමයට සම්පූර්ණයෙන්ම ඇතුළු වීමට අප සූදානම් කිරීමේ කොටසකි. “දැන් උන්වහන්සේගේ (ක්‍රිස්තුන්වහන්සේගේ) දුක් විඳීමේ පංගුකාරයන් වීමෙන් අනාගතයේ දී උන්වහන්සේගේ මහිමයේ පංගුකාරයෝ ද වම්හ” (17 පදය).

අපගේ ස්වාමින්වහන්සේ දුක් විඳි තැනැත්තෙකි. එසේද වුවත් උන්වහන්සේට සම්පූර්ණ ප්‍රීතිය තිබිණි (යෙසායා 53 : 3, ලූක් 10 : 21). උන්වහන්සේ පීඩා විඳින කල, ඒ වෙනුවෙන් මිදීම සහ මහිමය ළඟා වන බවට සහතිකය ඇතිව පීඩා විඳි සේක (හෙබ්‍රෙව් 2 : 12).

ගැළවීම තුළ ප්‍රීති වන්න කියා යේසුන්වහන්සේ තම ගෝලයින්ට පැවසූ සේක. සැබවින්ම, අපට ලැබෙන්නට යන මහිමයේ උතුම්කම නිසාවෙන්, වර්තමානයේ දී යේසුන්වහන්සේ සහ ශුද්ධවන්තයින් සමඟ අපගේ වර්තමාන පීඩා මධ්‍යයේ ප්‍රීති වීමට පුළුවන. ගැළවීමේ ප්‍රීතිය සහ මහිමයේ බලාපොරොත්තුව අපගේ වර්තමාන වේදනාවන්ට වඩා සැසඳීමට නොහැකි තරම් අතිශයින් උතුම් ය. මිලියනයට එක අනුපාතයටත් වඩා එය ඉතාම වැඩි ය !

දෙවියන්වහන්සේ විශ්වාස කිරීමටත්, උන්වහන්සේගේ උතුම් සහ වටිනා පොරොන්දු කෙරෙහි විශ්වාස කිරීමටත් ඇදහිල්ලේ ඇස් ද, කන් ද උන්වහන්සේ අපට දෙන සේක්වා. උන්වහන්සේගේ ප්‍රේමවන්ත දරුවෙනි, අපගේ අඳුරු තත්වයන්හි දී පවා, උන්වහන්සේ අප සමඟය. උන්වහන්සේ අප අත්හරින්නේවත්, අප දමා යන්නේවත් නැත. අවසානය දක්වා, සෑම පීඩාවක් තුළ දීම, සෑම වේදනාවක් සහ සෑම පාපයක් තුළදී ම උන්වහන්සේ අප දෙස බලන සේක. අප එය දැනගැනීමට තරම් දුර්වල වුව ද, උන්වහන්සේ සැම විටම අපගේ ළඟින් සිටින අතර, අපට ප්‍රේම කිරීම නවතන්නේ නැත. දෙවියන්වහන්සේගේ සදාකාලික ප්‍රේමය නිසා උන්වහන්සේට ප්‍රශංසා වේවා !

**ශුභාරංචිය තුළ ප්‍රීතිය**

අපි මහත් ඵලවිපාක ලබන බවට පොරොන්දු ඇත. එය ප්‍රීති වීමට අපට හොඳ හේතුවක් ගෙන දේ. අපි දැන සිටින තත්වය කුමක් වුවත් කමක් නැත. පාවුල්තුමා මෙසේ ලියුවේ ය. "අපේ සියලු දුක් විපත්වල දී මම ධෛර්යයෙන් පිරී ප්‍රීතියෙන් පිනා යමි" (2 කොරින්ති 7 : 4).

අපගේ ප්‍රීතිය අනෙක් අය ගැළවීම ලැබීම නිසාවෙන් වඩා අධික වේ. පාවුල්තුමා එය මෙසේ පවසයි "අපගේ ජේසුස් ස්වාමින් වහන්සේගේ ආගමනයේ දී, උන්වහන්සේ ඉදිරියෙහි අපගේ බලාපොරොත්තුවත්, ප්‍රීතියත් ප්‍රෞඪ කිරීටයත් කවරෙක් ද? ඔබම නොවන්නෙහු ද? එසේය. ඔබ අපගේ ගෞරවයත් ප්‍රීතියත්ය" (1 තෙසලෝනික 2 : 19 - 20). පව්කරුවෙක් පසුතැවිලි වන විට ස්වර්ගයෙහි ප්‍රීතිය ඇති වන්නා සේම, පොළොවේ ද, දෙවියන්වහන්සේගේ සදාකාලික දැක්මෙන් ජීවිතය දෙස බලන අය තුළ ප්‍රීතිය ඇති වේ.

යේසුන් ක්‍රිස්තුන්වහන්සේගේ ශුභාරංචිය පතුරුවන විට දෙවියන්වහන්සේගේ මිනිස්සු ප්‍රීති වීම පුදුමයක් නොවේ. පිලිප්පයේ සභාවට පාවුල්තුමා මෙසේ ලිව් ය "කෙසේ වුවත් කමක් නැත. වංක ලෙස වේවා, අවංක ලෙස වේවා, හැම අයුරින්ම ක්‍රිස්තුන්වහන්සේ දේශනා කරනු ලබන බැවින්, ඒ ගැන මම ප්‍රීති වෙමි" (පිලිප්පි 1 : 18). පණිවුඩයට ඇදහිල්ල තුළ ප්‍රතිචාර දක්වන්නට මිනිසුන් ඉගෙන ගැනීම, අපගේ ගැළවුම්කරුවාණන්ගේ පැමිණීමේ දී ශුද්ධවන්තයින් සමඟ පිළිගන්වනු ලැබීම ගැන පාවුල්තුමා ප්‍රීති විය.

ප්‍රේරිත වූ යොහන්තුමා මෙම ප්‍රීතිය තියුණු කරමින් "ඔබ සත්‍යයෙහි ස්ථිරව සිටින බවට සහෝදරයන් ඇවිත් සාක්ෂි දුන් විට මම අතිශයින් ප්‍රීති වීමි. සැබවින්ම ඔබේ කල්ක්‍රියාව සත්‍යයට අනුකූල ය. මාගේ දරුවන් සත්‍යය අනුව ජීවත් වන බව ඇසීමට වඩා ලොකු ප්‍රීතියක් මට නැත" (3 යොහන් 3 - 4).

දෙවියන්වහන්සේගේ දරුවන් ලෙස අපි සියලු ශුද්ධවන්තයින්, ස්වර්ගයේ දේවදූතයින් සහ දෙවියන්වහන්සේ හා සමඟ ප්‍රීතිය බෙදාගන්නෙමු - ශුභාරංචිය දේශනා කිරීම තුළ ප්‍රීතිය, ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ලට මිනිසුන් පැමිණි බව ඇසීම තුළ ප්‍රීතිය සහ ඇදහිල්ලේ මාර්ගයේ මනුෂ්‍යයින් නොකඩව ගමන් කරනවා ඇසීම තුළ ප්‍රීතිය. දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවා ඇති මනුෂ්‍යයින් මිදීම සහ ගැළවීම තුළ ලබන එවැනි පිරිසිදු ප්‍රීතිය, අප තුළ ක්‍රියා කරන ශුද්ධාත්මයාණන්ගේ ඵලය අපගේ ආශාවන්, අපගේ වටිනාකම් සහ අපගේ ඉලක්ක හැඩගස්වනවා ඇත.

එකිනෙකා වෙනුවෙන් අපගේ කාලය භාවිත කිරීම, අපගේ සිතිවිලි පුරුදු, අපගේ චිත්තවේගවල නිරෝගී බව සහ අපගේ කතාවේ සහ ක්‍රියාවේ ගුණාත්මක බව ආදිය දෙවියන්වහන්සේගේ ප්‍රේමය, කරුණාව සහ බලය තුළින් ජීවිත පවිත්‍ර කිරීම සඳහා ශුභවාදී ලෙස බලපෑමක් කරන්නේ ය. අපගේ පෞද්ගලික නමස්කාර කාලය, සභාව සමඟ අපගේ සාමූහික නමස්කාරය, අපගේ ස්වෙච්ඡා සේවය, සභාවට සහ අවශ්‍යතා ඇති අය උදෙසා අපගේ කාලය දීම, කුඩා කණ්ඩායම් සමඟ අපගේ යාච්ඤා සහභාගිත්වය, වචනය සහ නමස්කාරය පිළිබඳ ඉගෙන ගැනීම - මේ සියල්ල දෙවියන්වහන්සේ අප තුළ සිටීමේ ප්‍රීතිය පෙන්නුම් වේ. උන්වහන්සේගේ බලවත් ක්‍රියාව නිසා අපගේ ජීවිත තුළ සහ අන් අයගේ ජීවිත තුළ ප්‍රීතිය ඇති වී තිබේ.

සභාවේ වැඩ උදෙසා දෙන අපගේ මූල්‍යමය උපකාර පවා දෙවියන්වහන්සේ අගය කරන දේවල් සඳහා වූ අපගේ ප්‍රීතිය නිරූපණයකි. අපි සභාවට දීමෙන් පෙන්නුම් කෙරෙන්නේ මේ ලෝකයේ දේවල්වලට සාපේක්ෂව දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ දේවල් උදෙසා අප දී ඇති වැදගත්කමයි.

සභාව තුළින් අපි ශුභාරංචි පණිවිඩය සමඟ ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරය ලෙස පිටත සිටින අය වෙත ළඟා වෙමු. අප තුළ ක්‍රියා කරන්නා වූ දෙවියන්වහන්සේගේ වෙනස් කිරීමේ බලයට අපවම දෙන අතර, අප ශුභාරංචිය දෙන්නෙමු. පෞද්ගලික ලෙස අපි දෙවියන්වහන්සේට සේවය කරනවාට උන්වහන්සේ කැමති වන සේක. එසේම එක ශරීරයක් ලෙස - ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරය ලෙස උන්වහන්සේට සහ එකිනෙකාට සේවය කිරීම උන්වහන්සේගේ කැමැත්ත ය. පාවුල්තුමා මෙසේ ලිව් ය. “ඔබ සියල්ලෝම අවයවයෝ ය”. එකිනෙකාගෙන් තොරව දෙවියන්වහන්සේ හා සමඟ සම්බන්ධතාවය පැවැත්වීමට අප කැඳවා නොමැත. අප කැඳවා ඇත්තේ දෙවියන්වහන්සේගේ සෙනඟ සමඟ සහභාගිත්වයට ය. දෙවියන්වහන්සේගේ නිවැසියන් වීමට ය. ක්‍රිස්තුන්වහන්සේ තුළ අපට දෙවියන්වහන්සේ සමඟ සන්නිවේදනය ඇති අතර, ක්‍රිස්තුන්වහන්සේ තුළින් එකිනෙකා සමඟ සන්නිවේදනය ඇත. යේසුන්වහන්සේගේ ආඥාව වන්නේ, උන්වහන්සේගේ ශරීරය වූ සභාව ලෙස එකිනෙකාට ප්‍රේම කරමින් උන්වහන්සේගේ ශුභාරංචිය ලෝව පුරා ප්‍රකාශ කිරීම සහ උන්වහන්සේගේ මාර්ගයන් ඉගැන්වීම වේ.

අපි සභාවට දෙන්නේ ඒ නිසාය. අපි දෙවියන්වහන්සේට ප්‍රේම කරන නිසා සහ උන්වහන්සේගේ වැඩය - ශුභාරංචියේ කිරීමට ආශා නිසාය. තනි පුද්ගලයින් ලෙස කරන බලපෑමට වඩා සාමූහිකව අපිට විශාල බලපෑමක් කළ හැකිය. අපගේ පෞද්ගලික බලපෑම මුළු ශරීරයේම සෞඛ්‍ය සම්බන්න බවට උපකාරී වේ. අප සියල්ලන්ටම ප්‍රීතියේ මූලය ශුභාරංචිය වේ. පණිවිඩය ලබා ගැනීමේ සහ එය අන් අයට දීමේ ප්‍රීතියය.

# ගෝලත්වය 101
# ඒකකය 3 අ



## යේසුන්වහන්සේ මැරුණේ මන් ද?



යේසුන්වහන්සේට දහස් ගණනකට ඉගැන්වීමෙන් සහ සුව කිරීමෙන් වූ පුදුමාකාර ඵලදායි මෙහෙයක් විය. උන්වහන්සේ බොහෝ ජනකායක් ආකර්ෂණය කරගත් අතර, තවත් එසේ කිරීමට හැකියාව විය. වෙනත් ප්‍රදේශවල ජීවත් වූ යුදෙව්වන් සහ අන්‍ය ජාතීන් වෙත ගමන් කර තවත් දහස් ගණනක් සුව කිරීමට උන්වහන්සේට හැකියාව විය.

එහෙත් යේසුන්වහන්සේ තමන්ගේ මෙහෙය ක්ෂණික අවසානයකට පැමිණීමට ඉඩහැරිය සේක. උන්වහන්සේට තමන් අත්අඩංගුවට ගැනීම වැළකීමට හැකියාව විය. එහෙත් උන්වහන්සේ තමන්ගේ මෙහෙය ව්‍යාප්ත කරනු වෙනුවට මරණය තෝරා ගත් සේක. උන්වහන්සේගේ ඉගැන්වීම් වැදගත් වන නමුත් උන්වහන්සේ පැමිණියේ ඉගැන්වීමට පමණක් නොව මරණය විඳීමටත් ය. එසේම තමාගේ ජීවත් වීමට වඩා මරණයෙන් උන්වහන්සේ බොහෝ දේ සම්පූර්ණ කළ සේක.

මරණය වූ කලි යේසුන්වහන්සේගේ වැදගත්ම මෙහෙයයි. අපි උන්වහන්සේ සිහි කරන්නේමෙ අයුරිනි. එනම්, කුරුසිය තුළින් කිතුනු බවේ සංඛේතය සමඟින් හෝ ස්වාමින්වහන්සේගේ රාත්‍රි භෝජනයේ රොටි සහ මිදි යුෂ තුළින් හෝ වේ. අපගේ මිදුම්කරුවාණන්වහන්සේ මළා වූ මිදුම්කරුවාණන් කෙනෙකි.

### මැරෙන පිණිස උපන්

විවිධ අවස්ථාවන්හි දී දෙවියන්වහන්සේ මනුෂ්‍යයෙක් ලෙස පෙනුණු බව පැරණි ගිවිසුම අපට පවසයි. යේසුන්වහන්සේ හට සුව කිරීම සහ ඉගැන්වීම පමණක් අවශ්‍ය වූයේ නම්, සරල ලෙස පෙන්නුම් වීමට උන්වහන්සේට හැකියාව තිබිණි. එහෙත් උන්වහන්සේ එයට වඩා යමක් කළ සේක : ඒ මන් ද? එසේ වීමෙන් උන්වහන්සේට මැරෙන්නට හැකි බැවිනි. යේසුන්වහන්සේ අවබෝධ කරගැනීමට නම්, උන්වහන්සේගේ මරණයත් අප විසින් තේරුම්ගත යුතුව ඇත. උන්වහන්සේගේ මරණය වූ කලි ශුභාරංචියේ තීරණාත්මක කොටස වන සහ සෑම කිතුනුවෙකු විසින්ම දැනගත යුතු දෙයක් ද වන්නේ ය.

යේසුන්වහන්සේ මෙසේ පැවසූ සේක. "මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ සේවය ලබන්න නොව, සේවය කරන්නටත්, බොහෝ දෙනෙකුගේ මිදීම උදෙසා සිය දිවි පිදීමටත් ය" (මතෙව් 20 : 28). උන්වහන්සේ පැමිණියේ තමාගේ ජීවිතය දීමට ය, මරණය විඳීමට ය, එසේම උන්වහන්සේගේ මරණයෙන් අනෙක් අයට ගැළවීම මිලදී ගත්තේ ය. මෙය උන්වහන්සේ පොළොවට පැමිණීමේ ප්‍රාථමික හේතුව වේ. උන්වහන්සේගේ රුධිරය අන් අය වෙනුවෙන් වගුරුවන ලද්දේ ය (මතෙව් 26 : 28).

යේසුන්වහන්සේ තමා දුක් විඳ මරණය විඳින බවට අනතුරු ඇඟවීම් කළද, ගෝලයින් එය විශ්වාස නොකළහ. "එවක් පටන් යේසුන්වහන්සේ තමන් යෙරුසලමට වැඩම කර ප්‍රජා මූලිකයන්ගෙන් හා නායකපූජකයන්ගෙන් ද, විනයධරයන්ගෙන් ද බොහෝ දුක් වේදනා විඳින්ටත්, මරනු ලබන්ටත් තුන්වන දා උත්ථාන කරනු ලබන්ටත් යන බව සිය ශ්‍රාවකයන්ට දන්වන්න පටන්ගත් සේක. එවිට පේදුරු උන්වහන්සේ පැත්තකට කැඳවා තරවටු කරන්න පටන්ගෙන ස්වාමිනි එය ඔබ කෙරෙන් දුරු වේවා. එවැන්නක් ඔබට කවදාවත්ම සිදු නොවේවායි කීය" (මතෙව් 16 : 21 - 22).

තමා *අනිවාර්යෙන්ම* මරණයට පත් විය යුතු බව යේසුන්වහන්සේ දැන සිටි සේක, මන්ද ශුද්ධ ලියවිල්ල එලෙස පවසා ඇත. "මනුෂ්‍ය පුත්‍රයාණෝ බොහෝ දුක් විඳින්ටත්, නිග්‍රහ කරනු ලබන්ටත් යුතු යයි ඔහු ගැන සඳහන්ව තිබෙන්නේ කෙසේද?" (මාක් 9 : 12, 9 : 31, 10 : 33 - 34). "ක්‍රිස්තුන්වහන්සේ ඒ දුක් විඳ ඉක්බිති ස්වකීය තේජසට පැමිණිය යුතුව තිබුණා නොවේ ද?" (ලූක් 24 : 26 - 27, 46).

සියල්ල දෙවියන්වහන්දේගේ සැලැස්ම ලෙස සිදු විය : හෙරොද් සහ පිලාත් දෙවියන්වහන්සේ "සිදුවන්නට පෙර නියම කළ සියල්ල ඉටු වන පිණිස" (ක්‍රියා 4 : 28) ක්‍රියා කළේ ය. ගෙත්සෙමන උයනේ දී වෙන් මාර්ගයක් තිබේදැයි ඇසුව ද, වෙනත් මාර්ගයක් නොවී ය (ලූක් 22 : 42). උන්වහන්සේගේ මරණය අපගේ ගැළවීමට අත්‍යවශ්‍ය වේ.

**දුක්විඳීමේ සේවකයා**

එය ලියා ඇත්තේ කොහේ ද? යෙසායා 53 පැහැදිලිම අනාවැකිය වේ. යේසුන්වහන්සේ "අපරාධකරුවන් සමඟ ගණන් ගනු ලැබේ යයි ලියා තිබෙන ඒ කීම මා තුළින් මුදුන්පත් විය යුතුය. මා ගැන ලියා තිබෙන දේ සම්පූර්ණ වන්නේම ය." (ලූක් 22 : 37) යනුවෙන් කී අවස්ථාවේ දී යෙසායා 53 : 12 උපුටා දක්වා ඇත. යේසුන් වහන්සේ පාපය නැති අයෙක් වුව ද, පව්කරුවන් සමඟ ගණන් ගනු ලැබූ සේක. යෙසායා 53 ලියා ඇති වෙනත් දේ මොනවාදැයි බලන්න :

එබැවින් එතුමාණන් ඉසුළුවේ අපේ දුකය. දරාගත්තේ අපේ පීඩා ය. මේවා දඬුවම් යයි අපට සිතුණේ ය. දෙවිතුමන් දුන් පහර යයි අපට හැඟුණේ ය. එහෙත් එතුමන් තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය. පොඩි කරනු ලැබුවේ අපේ පව් නිසාය. එතුමන් ලත් දඬුවමින් අපට සමාදානය ලැබී ඇත. එහෙත් එතුමන් පෙළනු ලැබුවේත් දුකට පත් කරනු ලැබුවේත් සමිඳුණන්ගේ කැමැත්ත ලෙස ය. මෙසේ එතුමන්ගේ මරණය පව් කමා කරන පූජාවක් වේ. (4 - 12 පද).

තමාගේම පාප නිසාවෙන් නොව, අන් අයගේ පාප නිසා දුක් විඳින මනුෂ්‍යයෙකු යෙසායා විස්තර කරයි. මේ මනුෂ්‍යයා "මනු ලොවින් සිඳ දමනු" (8 පදය) ලැබුව ද, එය කතාවේ අවසානය නොවන්නේ ය. "එතුමන් සිය දුක් වේදනාවේ ප්‍රතිඵල දැක තෘප්තියට පැමිණෙනු ඇත." (11, 10 පද)

**ගැළවීමේ ප්‍රතිරූප හත**

ක්‍රිස්තුන් වහන්සේගේ ක්‍රියාව පෙන්නුම් කිරීම සඳහා නව ගිවිසුම ප්‍රතිරූප විශාල ප්‍රමාණයක් භාවිත කරයි. මේවා විග්‍රහයන්, ආදර්ශයන් හෝ උපමා ලෙස අපි විස්තර කරන්නෙමු. මේ සියල්ල රූපයෙන් කොටසක් පමණක් දක්වන්නේ ය :

**මිදීමේ මිලය සැබිදප :** තව කෙනෙකුගේ නිදහස ලබා ගැනීමට ගෙවන මිලය. මෙහි දී අවධානය යොමු වන්නේ මිලයෙහි ස්වභාවය නොව, නිදහස් වීම යන අදහසට ය.

**මුදා ගැනීම :** මූලික අදහස වන්නේ "නැවත මිල දී ගැනීම" හෝ වහලෙක් උදෙසා නිදහස මිලට ගැනීම.

**ධර්මිෂ්ඨ කරනු ලැබීම :** දෙවියන්වහන්සේ සමඟ නිවැරදි ලෙසට පත් කරනු ලැබීම, උසාවියක දී නිවැදරි පැත්තෙහි බව පැහැදිලි කිරීම.

**ගැළවීම :** මූලික අදහස වන්නේ මිදීම හෝ භයානක අවස්ථාවකින් මුදවාගැනීම ය. මෙම වචනය සම්පූර්ණත්වයට ප්‍රතිස්ථාපනය, සුව කිරීම යන්න සඳහා ද භාවිත කළ හැකි ය.

**සමාදාන කිරීම :** බිඳුණු සම්බන්ධතාවයක් අලුත්වැඩියා කිරීම. දෙවියන්වහන්සේ තමාට අප සමගි කරගත් සේක. උන්වහන්සේ මිත්‍රත්වයක් සමගි කිරීම උදෙසා ක්‍රියා කළ සේක. එසේම අපි උන්වහන්සේගේ ප්‍රමුඛත්වයට ප්‍රතිචාර දක්වන්නෙමුව.

**දරුකමට පිළිගැනීම :** අප දෙවියන්වහන්සේගේ නීත්‍යානුකූල දරුවන් බවට පත් කිරීම. ඇදහිල්ල පිටස්තර අයෙකු පවුලේ සාමාජිකත්වයට ගෙන ඒමෙන් අපගේ තත්වයෙහි වෙනසක් ඇති කරයි.

**සමාව දීම :** මෙය දෙයාකාරයකින් දැකිය හැකි ය. නීත්‍යානුකූල හෝ මූල්‍යමය වචනවල සමාව දීම යනු ණයක් අවලංගු කරදැමීම හා සමාන වේ. පෞද්ගලික සම්බන්ධතාවයන්හි දී පෞද්ගලික ලෙස රිදවීමෙන් හෝ තුවාල කිරීමෙන් වැළකී සිටීම වේ.

යේසුන් වහන්සේ යෙසායා විසින් ලියන ලද දෙය සම්පූර්ණ කළ සේක. තමාගේ බැටළුවන් උදෙසා තම ජීවිතය පූජා කළ සේක (යොහන් 10 : 15). උන්වහන්සේගේ මරණයේ දී

උන්වහන්සේ අපගේ පාපයන් උසුලාගෙන, අපගේ අපරාධයන් උදෙසා පීඩා වින්ද සේක. අප දෙවියන්වහන්සේ සමඟ සමඟි වන පිණිස උන්වහන්සේ දඬුවම් වින්ද සේක. උන්වහන්සේගේ පීඩා විඳීමෙන් සහ මරණයෙන් අපගේ ආත්මික රෝගී බව සුව විය, අප ධර්මිෂ්ඨ කරනු ලැබ ඇත - අපගේ පාපයන් ඉවතට දමා ඇත.

නව ගිවිසුමෙහි මෙම සත්‍යයන් සවිස්තරාත්මකව වර්ධනය කර ඇත්තේ ය.

**ශාපලත් මරණයක් විඳීම**

"එල්ලා මරන ලද තැනැත්තා දේව ශාපයට පාත්‍ර වූ කෙනෙකි" ද්විතිය නීති සංග්‍රහය 21 : 23 පවසයි. මෙම පදය නිසා, කුරුසිපත් වන ඕනෑම මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ විසින් පහත් කරනු ලැබූ බව යුදෙව්වෝ සැලකූහ. යෙසායා ලියා ඇති පරිදි, උන්වහන්සේ "දෙවියන්වහන්සේගේ දඬුවම් ලත් අයෙක්" ලෙස මනුෂ්‍යයන් විසින් සලකනු ලබයි.

යුදෙව් නායකයෝ මෙය යේසුන් වහන්සේගේ ගෝලයින් විසින් නවත්වනු ඇතැයි ඇතැම් විට සිතන්නට ඇත. එය ඔවුන් අපේක්ෂා කළ අයුරින් ඉටු විය -- කුරුසිපත් වීම ගෝලයින්ගේ අපේක්ෂා විසුරුවනු ලැබී ය. ඔවුහු අධෛර්ය වී මෙසේ පැවසූහ. "ඉශ්‍රායෙල් මුදාලීමට සිටි එකම තැනැන්වහන්සේ උන්වහන්සේ ය යනු අපගේ බලාපොරොත්තුව විය" (ලූක් 24 : 21). එහෙත් ඔවුන්ගේ අපේක්ෂාවන් යේසුන් වහන්සේ උත්ථානයෙන් පසුව ඔවුන්ට පෙනුණු අවස්ථාවේ දී නැවත අලුත් විය. එසේම පෙන්තකොස්ත දිනයේ දී යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇති ගැළවීම ප්‍රකාශ කිරීමට නව සහතිකයක් සහිතව ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් පූර්ණ කළ සේක. ඔවුන් තුළ නොසෙලවිය හැකි ඇදහිල්ලක් වීරයෙක් කෙරහි මෙන් විය : කුරුසිපත් වූ මෙසියස් වහන්සේ.

පේදුරුතුමා යුදෙව් නායකයින්ට මෙසේ කිය. "අප පියවරුන්ගේ දෙවියන්වහන්සේ ඔබ විසින් කුරුසියක එල්ලා මරණයට පත් කළ යේසුන්වහන්සේ උත්ථාන කොට වදාළ සේක" (ක්‍රියා 5 : 30). *ගස* යන වචනය භාවිත කිරීමෙන් පේදුරුතුමා නායකයින්ට කුරුසිපත් වීමේ ශාපය මතක් කළේ ය. එහෙත් යේසුන් වහන්සේ වෙත ලජ්ජාව නොවී ය, එය උන්වහන්සේ කුරුසිපත් කළ මනුෂ්‍යයන්ට වන බව ඔහු කීහ. උන්වහන්සේ විඳි ශාපය ලබන්නට උන්වහන්සේ නොවටිනා බැවින් දෙවියන් වහන්සේ උන්වහන්සේට ආශිර්වාද කළ සේක. දෙවියන්වහන්සේ කැළල අවලංගු කළ සේක.

පාවුල්තුමා ගලාති 3 : 13 හි මෙම ශාපය පිළිබඳ දක්වා ඇත. "ගසක එල්ලනු ලබන සියල්ලෝ ශාප ලද්දෝ යයි ශුද්ධ ලියවිල්ලේ ලියා තිබෙන ලෙස ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා එම ශාපය විඳ ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදාගත් සේක". යේසුන්වහන්සේ අප වෙනුවෙන් ශාපයක් වූ නිසාවෙන් අපට නීතියේ ශාපයෙන් ගැළවීමට හැකි ය. උන්වහන්සේ තමන් නොවන දෙයක් බවට පත් වූ සේක, එසේ කළේ අපට අප නොවන දෙයක් බවට පත් වීම උදෙසාය. "දෙවියන්වහන්සේ පාපය නොදත් ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා මනුෂය පාපී බව හා සම වීමට සැලසූ සේක. එසේ කළේ ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකමට අප පංගුකාරයින් වන පිණිසය" (2 කොරි. 5 : 21).

අප උන්වහන්සේ තුළින් ධර්මිෂ්ඨ යයි ප්‍රකාශ කරන පිණිස, උන්වහන්සේ අප වෙනුවෙන් පාපය බවට පත් වූ සේක. අප ලබන්නට සුදුසු දුක්විඳීම උන්වහන්සේ වින්ද සේක, එහෙයින් උන්වහන්සේ අප ශාපයෙන් හෝ නීතියේ දඬුවමින් මුදවාගත් සේක. "දඬුවමින් සමඟිය අපට

වූයේ උන්වහන්සේ මත ය". උන්වහන්සේ දඬුවම වින්ද බැවින්, අපට දෙවියන්වහන්සේ සමඟ සමාදානය භුක්ති විඳීමට හැකි ය.

**කුරුසියේ පණිවුඩය**

යේසුන්වහන්සේ මැරුණු ලජ්ජා සහගත ආකාරය ගෝලයෝ කිසිවිට අමතක නොකළහ. ඇත්තෙන්ම සමහර අවස්ථාවල දී එයම පණිවුඩයේ අවධානය විය : "එහෙත් අපි කුරුසියේ ඇණ ගසනු ලැබූ ක්‍රිස්තුන් වහන්සේ දේශනා කරමුව" (1 කොරි. 1 : 23). පාවුල්තුමා පවා ශුභාරංචිය "කුරුසියේ පණිවුඩය" (18 පදය) ලෙස හැඳින්වීය. පාවුල්තුමා "කුරුසියෙහි ඇණගසන ලද යේසුන් ක්‍රිස්තුන් වහන්සේ ඔබගේ ඇස් ඉදිරියෙහි ප්‍රසිද්ධ ලෙස දක්වනු ලැබූ නමුත්" (ගලාති 3 : 1) යනුවෙන් ගලාතිවරුන්ට මතක් කළේ ය. ඔහු ශුභාරංචිය සාරාංශගත කළේ එසේ ය.

කුරුසිය ශුභාරංචිය වන්නේ මන් ද? කුරුසිය මත දී අප මුදනු ලැබූ අතර, අපගේ පාපයන් ඒවා සඳහා සුදුසු දඬුවම ලැබූ නිසා ය. පාවුල්තුමා කුරුසිය වෙත අවධානය යොමු කරන්නේ ය. මන්ද යේසුන් වහන්සේ අපට ශුභාරංචිය වීමේ යතුර එය වන නිසාවෙනි. අපගේ පාපයන් වාර්තාවෙන් ඉවත් කරනු නොලැබුවේ නම්, ක්‍රිස්තුන්වහන්සේ තුළ අප "දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම" නොලැබුවේ නම් අප මහිමයට ඔසවනු ලබන්නේ නැත. එයින් පමණක්ම අප යේසුන් වහන්සේ සමඟ මහිමයට එක් වනු ඇත්තේ ය. කුරුසිපත් වීම එය කළ හැකි දෙයක් බවට පත් කළේ ය.

යේසුන්වහන්සේ "අප වෙනුවෙන්" (රෝම 5 : 6 - 8, 2 කොරි. 5 : 14, 1 තෙස. 5 : 10) මැරුණු බව පාවුල්තුමා පවසයි. එසේම ඔහු උන් වහන්සේ "අපගේ පාපයන් වෙනුවෙන්" (1 කොරි. 15 : 3, ගලාති 1 : 4) මැරුණු බව පවසයි. "උන්වහන්සේම ගස පිටදී අපගේ පාප උසුලාගත් සේක" (1 පේදුරු 2 : 24, 3 : 18). පාවුල්තුමා අප ක්‍රිස්තුන් වහන්සේ සමඟ මැරුණු බව ද පවසයි (රෝම 6 : 3 - 8). උන්වහන්සේ තුළ ඇදහිල්ල තුළින් අපි උන්වහන්සේගේ මරණයට සහභාගි වන්නෙමු.

යේසුන් ක්‍රිස්තුන් වහන්සේ අපගේ ගැළවුම්කරුවාණන් ලෙස අප පිළිගත් විට, උන්වහන්සේගේ මරණය අපගේ මරණය මෙන් ගණන් ගනු ලැබේ. අපගේ පාපයන් උන්වහන්සේගේ පාපයන් ලෙස ගණන් ගනු ලැබේ, එසේම උන්වහන්සේගේ මරණය එම පාපයන් උදෙසා වූ මිල ගෙවා ඇත්තේ ය. එහෙත් උන්වහන්සේ එය කළේ අප වෙනුවෙන් ය. එසේම උන්වහන්සේ එසේ කළ බැවින්, අප ධර්මිෂ්ඨ කරනු ලැබ ඇත. නැතහොත් ධර්මිෂ්ඨ අය ලෙස ගණන් ගෙන ඇත. උන්වහන්සේ අපගේ පාපයන් සහ මරණය ගත් සේක. උන්වහන්සේ අපට ධර්මිෂ්ඨකම සහ ජීවිතය දෙන සේක. දිළිඳු වූ අප රජකුමරුන් බවට පත් වන පිණිස, රජ කුමරාණන් වහන්සේ දිළින්දෙක් වූ සේක.

යේසුන් වහන්සේ *මිදීමේ මිලය* යන වචනය අපගේ මිදීම උදෙසා භාවිත කළ ද, විශේෂිත කෙනෙක් හට එම මිල ගෙවනු නොලැබී ය - මෙය කතා ව්‍යවහාරයක් වන අතර, එයින් අදහස් වන්නේ අප නිදහස් කිරීම උදෙසා යේසුවහන්සේ අතිවිශාල මිලයක් වූ බව ය. එසේම යේසුන් වහන්සේ අප මුදන බව, අපගේ නිදහස මිලට ගත් බව පාවුල්තුමා පවසයි. එහෙත් උන්වහන්සේ කිසිවෙකුට ගෙවීමක් කළේ නැත.

ඇතැම් අය තම පියාණන් වහන්සේගේ නෛතික නියමයක් ගෙවනු ලැබීමට යේසුන් වහන්සේ මැරුණු බව පවසති - එසේම තම පුත්‍රයාණන් මෙම සුවිශේෂ අරමුණ ඉටු කිරීම පිණිස එවීමෙන් පියාණන් වහන්සේම එම මිලය ගෙවූ තැනැන්වහන්සේ බව ද (යොහන් 3 : 16, රෝම 5 : 8) පැවසිය හැකිය. ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ තමාටම දඬුවම උරාගත් සේක. එම නිසා අපට දඬුවම් විඳීම අවශ්‍ය නැත. "දෙවියන්වහන්සේගේ කරුණාවෙන් සියල්ලන් උදෙසා දිවි පුදන පිණිස" ය (හෙබ්‍රෙව් 2 : 9).

**දෙවියන් වහන්සේගේ උදහසින් වැළකීම**

දෙවියන් වහන්සේ මනුෂ්‍යයින්ට ප්‍රේම කරන සේක - එහෙත් උන් වහන්සේ පාපයට වෛර කරන සේක. මන්ද පාපය මනුෂ්‍යයාට රිදවන නිසා ය. එම නිසා දෙවියන්වහන්සේ ලෝකය විනිශ්චය කරන විට "දෙවියන් වහන්සේගේ උදහසේ දවසක්" පැමිණෙනු ඇත (රෝම 1 : 18, 2 : 5). සත්‍යය ප්‍රතික්ෂේප කරන මනුෂ්‍යයින් දඬුවම් විඳිනු ඇත (8 පදය). දෙවියන් වහන්සේගේ අනුග්‍රහයේ සත්‍යය ඔවුහු ප්‍රතික්ෂේප කරන්නෝ නම්, ඔවුහු දෙවියන් වහන්සේගේ අනෙක් පැත්ත, එනම් කෝපය අත්දකිනු ඇත. සැම දෙනාම පසුතැවිලි වීම දෙවියන් වහන්සේට අවශ්‍ය වේ (2 පේදුරු 3 : 9), එහෙත් එසේ නොවන අය ඔවුන්ගේ පාපයේ ප්‍රතිඵලයෙන් පීඩා විඳිනු ඇත.

යේසුන් වහන්සේගේ මරණයේ දී, අපගේ පාපවලට සමාව ලැබිණි, උන් වහන්සේගේ මරණය තුළින් අපි දෙවියන් වහන්සේගේ උදහසින් වැළකුණෙමු, පාපයේ දඬුවම අහෝසි විය. එහෙත් ආදරණීය යේසුන් වහන්සේ කෝපයේ දෙවියන්වහන්සේ සතුටු කිරීමට "ගෙවීමක් කළ" බව මෙයින් අදහස් නොවේ. පියාණන්වහන්සේ මෙන්ම යේසුන්වහන්සේ ද පාපය කෙරෙහි කෝපයෙන් පසු වන සේක. උන්වහන්සේ ප්‍රේම කරන මනුෂ්‍යයින්ට පාපය රිදවන බැවින් උන්වහන්සේ පාපය කෙරෙහි කෝප වන සේක. යේසුන්වහන්සේ දඬුවම් දෙන විනිශ්චයකරුවාණන් වන සේක (මතෙව් 25 : 31 - 46). එසේම පව්කරුවන් හට අති මහත් ලෙස ප්‍රේම කරන විනිශ්චයකරුවාණන් වන නිසා, ඔවුන්ගේ දඬුවම ගෙවූ සේක.

දෙවියන්වහන්සේ අපට සමාව දුන් අවස්ථාවේ දී,උන්වහන්සේ හුදෙක් එය නැවත නොපෙණෙන පිණිස බොරුවට ඉවත් නොකළ සේක. නව ගිවිසුම පුරාම පාපය පිළිබඳ සැලකිල්ලක් දක්වන ලද බව යේසුන්වහන්සේගේ මරණය තුළින් උන්වහන්සේ අපට උගන්වන සේක. පාපයට බරපතල ප්‍රතිවිපාක තිබේ. ක්‍රිස්තුන්වහන්සේගේ කුරුසිය තුළින් අපට එම ප්‍රතිවිපාක දැකිය හැකි වේ. එය යේසුන්වහන්සේට වේදනාව, ලජ්ජාව සහ මරණය ළඟා කරවීය. අප විසින් ලැබිය යුතු දඬුවම උන්වහන්සේ උසුලාගත් සේක.

අපට සමාව දීමෙන් දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨ ලෙස ක්‍රියා කළ බව ශුභාරංචිය එළිදරව් කරන්නේ ය (රෝම 1 : 17). උන්වහන්සේ අපගේ පාප නොසලකා හරින්නේ නැත. එහෙත් යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඒවා ගැන සලකන සේක. අපගේ සමාව උදෙසා වූ පූජාවක් ලෙස දෙවියන්වහන්සේ යේසුන්වහන්සේ ත්‍යාග කළ සේක. "එසේ කළේ උන්වහන්සේගේ සාධාරණකම පෙන්වන පිණිසය" (රෝම 3 : 25). දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨ බව කුරුසිය එළිරව් කරයි. නොසලකා හැරීමට බැරි තරම් පාපය බරපතල බව එය පෙන්වයි. පාපය දඬුවම් ලැබීම සුදුසු වේ. එසේම යේසුන්වහන්සේ අප වෙනුවෙන් දඬුවම විඳීමට ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වූ සේක. කුරුසිය දෙවියන්වහන්සේගේ ප්‍රේමය සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨ බව පෙන්නුම් කරන්නේ ය (රෝම 5 : 8).

යෙසායා කී පරිදි, ක්‍රිස්තුන්වහන්සේ දඬුවම විඳි බැවින් අපට දෙවියන්වහන්සේ සමඟ සමාදානය ඇත. වරක් අපි දෙවියන්වහන්සේගේ සතුරෝව සිටියෙමුව. එහෙත් ක්‍රිස්තුන්වහන්සේ තුළින් අපි ළං කරනු ලැබුවෙමු (එපීස 2 : 13). වෙනත් වචනවලින් කියතොත්, කුරුසිය තුළින් අප දෙවියන්වහන්සේ සමඟ සමාදාන කර ඇත (16 පදය). එය දෙවියන්වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවය යේසුන් ක්‍රිස්තුන්වහන්සේගේ මරණය මත රඳා ඇති බවට වූ අපගේ ප්‍රාථමික කිතුනු ඇදහිල්ල වේ.

ක්‍රිස්තියානිකාරකම යනු යම් දේවල් ලැයිස්තුවක් ඉටු කිරීමක් නොවන්නේ ය. අපි දෙවියන්වහන්සේ සමඟ නිවැරදි යයි දැක්වෙන පිණිස යේසුන් වහන්සේ සියල්ල කර ඇති බවට වූ ඇදහිල්ල වේ. උන්වහන්සේ එය සිදු කළේ කුරුසිය මත දිය. "අප සතුරන්ව සිටියදීම දේව පුත්‍රයාණන්ගේ මරණය නිසා උන්වහන්සේ සමඟ සමඟි කරනු ලැබුවෙමු" (රෝම 5 : 10). "කුරුසිය මත පුත්‍රයාණන්ගේ දිව්පිදීම හේතුකොටගෙන සමාදානය ඇති කරමින්" (කොලොස්සි 1 : 20) ක්‍රිස්තුන්වහන්සේ තුළින් විශ්වය දෙවියන්වහන්සේට සමාදාන විය. අපි උන්වහන්සේ තුළින් සමාදාන කරනු ලැබුවෙමු නම්, අපගේ සියලු පාපවලට සමාව ලැබී ඇත (22 පදය). සමාදාන කිරීම, සමාව දීම, ධර්මිෂ්ඨකරණය යන සියල්ලේ අදහස සමාන වේ. එනම්, දෙවියන්වහන්සේ සමග සාමය වේ.

**ජයග්‍රහණය !**

යේසුන් වහන්සේ "භූතාධිපතීන් ද බලධාරීන් ද නිරායුධ කොට ප්‍රසිද්ධියේ ජය පෙරහරින් ගොස් ප්‍රදර්ශනය කළ සේක" (කොලො. 2 : 15) යනුවෙන් ලිවීමේ දී ගැළවීමේ පිළිබඳ රසවත් ප්‍රතිරූපයක් පාවුල්තුමා භාවිත කරයි. ඔහු හමුදා පෙළපාළියක් උදෙසා මෙම වචනය භාවිත කරයි : ජය ගත් සේනාපතියා අල්ලාගනු ගැබූ විරුද්ධ හේවායින් ජයග්‍රාහී පෙළපාළියකින් නිවසට ගෙන එයි. ඔවුහු ආයුධ රහිත, අවමානයට පත් කළ, සියල්ලන්ට පෙනෙන ලෙස ගෙන යන අය වෙති. පාවුල්තුමා මෙහිදී පවසන්නේ කුරුසියෙහි දී යේසුන් වහන්සේ මෙය කළ බව ය.

යේසුන්වහන්සේ වෙත ලජ්ජා සහගත මරණයක්ව පෙනුණු දෙයම ඇත්තෙන්ම දෙවියන්වහන්සේගේ සැලැස්මේ මහිමාන්විත ජයග්‍රහණයක් වූයේ ය. මන්ද, සාතන් ඇතුළුව නපුරු බලවේගයන්, පාපය සහ මරණය පරදවා යේසුන්වහන්සේ ජය ගත්තේ කුරුසිය තුළින් වන බැවිනි. අහිංසක කෙනෙකුගේ මරණයෙන් අප කෙරෙහි වූ ඔවුන්ගේ අයිතිය සම්පූර්ණයෙන්ම සංතෘප්තියට පත් විය. උන්වහන්සේ විසින් ගෙවන ලද දෙයට වඩා වැඩියෙන් ඉල්ලීමට ඔවුන්ට නොහැකි ය.

"උන්වහන්සේගේ මරණයෙන්" යේසුන්වහන්සේට "මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයා මරණය මඟින් විනාශ කිරීමට" (හෙබ්‍රෙව් 2 : 14) හැකි වූ බව අපට පවසා ඇත. "දෙවියන්වහන්සේගේ පුත්‍රයා ප්‍රකාශ වූයේ යක්ෂයාගේ මේ ක්‍රියා විනාශ කරන පිණිසය" (1 යොහන් 3 : 8). කුරුසිය මත දී ජයග්‍රහණය දිනාගනු ලැබිනි.

**පූජා වීම**

යේසුන්වහන්සේගේ මරණය පූජා වීමක් ලෙස විස්තර කළ හැකි ය. පූජා වීම යන අදහස පැරණි ගිවිසුමේ පූජාවන්ගේ සංකල්පයෙන් ගෙන ඇත. යෙසායා අපගේ මිදුම්කරුවාණන් "පව් කමා කරන පූජාවක්" (53 : 10) ලෙස දක්වා ඇත. යොහාන් බව්තීස්ත උන්වහන්සේ "ලෝකයේ පාපය දුරු කරන" (යොහන් 1 : 29) බැටළු පැටවාණන් ලෙස හඬගසයි. පාවුල්තුමා උන්වහන්සේ "සමඟිකිරීමේ පූජාවක්" "පාපයේ පූජාවක්" "පාස්කු බැටළුවා" "මිහිරි සුවඳ පූජාවක්" (රෝම 3 : 25, 8 : 3, 1 කොරින්ති 5 : 7, එපීස 5 : 2) ලෙස දක්වා ඇත. හෙබ්‍රෙව් පොතේ "පාපය උදෙසා පූජාවක්" (10 : 12) ලෙස දක්වයි. යොහන් උන්වහන්සේ "අපේ පාපය නැසීමේ පිළියම උන්වහන්සේය" (1 යොහන් 2 : 2, 4 : 10) ලෙස දක්වයි.

යේසුන්වහන්සේ කුරුසියෙහි දී සම්පූර්ණත්වයට පත් කළේ කුමක්ද යන්න පැහැදිලි කිරීමට විවිධ වචන භාවිත කර ඇත්තේ ය. නව ගිවිසුමේ විවිධ කතුවරු විවිධ වචන හෝ ප්‍රතිරූපයන් මෙම අදහස ඉදිරිපත් කිරීමට භාවිත කර ඇත. ඉතාම නිවැරදි පාරිභාෂිත වචනය හෝ ශබ්ද මාලාව වැදගත් වන්නේ නැත. වැදගත් වන්නේ, යේසුන්වහන්සේගේ මරණය තුළින් අප ගළවනු ලැබ ඇති බවයි. "උන්වහන්සේගේ තුවාල වලින් අපට සුවය ලැබී තිබේ". උන්වහන්සේ මැරුණේ අප නිදහස් කිරීම උදෙසා ය, අපගේ පාප ඉවත් කිරීමට ය, අපගේ දඬුවම විඳීමට ය, අපගේ ගැළවීම මිලට ගැනීමට ය. "ප්‍රේමවන්තයෙනි. දෙවියන්වහන්සේ අපට මෙසේ ප්‍රේම කළ සේක් නම්, අපත් එකිනෙකාට ප්‍රේම කළ යුතු ය" (1 යොහන් 4 : 11).

# ගෝලත්වය 101
# ඒකකය 3 ආ



## කුරුසිපත් කිරීම සිහිකිරීමෙන් ප්‍රතිචාර දැක්වීම

වසර දෙදහසකට පමණ පෙර, යුදෙව් වඩුවෙක් භයානක ආගමික සහ දේශපාලනික කැරැළිකරුවෙකු ලෙස හෙළා දක්නා ලදී. ඔහු ඉතාම වේදනාකාරී මෙන්ම ලජ්ජා සහගත මරණයකට පත් කරනු ලැබිණි. මෙම තාඩන පීඩා සහ කුරුසිපත් කරනු ලැබීම කවරදාකත් යුදෙව් සහ අන්‍ය ජාති දෙපිරිසටම නින්දා සහගත විය. කෙසේ වුවද යේසුන්වහන්සේගේ ගෝලයෝ උන්වහන්සේගේ මරණය සිහිපත් කිරීමට කරුණක් බවට පත් කළහ. එනම්, උන්වහන්සේ මැරුණු කාරණය පමණක් නොව, එවන් වූ ලජ්ජා සහගත ආකාරයකින් මරණයට පත් වීම පිළිබඳවයි. යේසුන්වහන්සේ පිළිබඳ ලියැවුණු ඔවුන්ගේ කතාන්දරවල ඔවුහු එම භයංකර මරණය පිළිබඳ ලිවීමට දීර්ඝ කොටස් වෙන් කළහ. ඔවුහු උන්වහන්සේගේ මරණය අනුස්මරණය කිරීමට සෑම වසරකම එක් දිනක් වෙන් කළහ.

කිතුනුවන්ට ක්‍රිස්තුන්වහන්සේගේ මරණය මෙතරම් වැදගත් වන්නේ මන්ද? එසේම එය කිතුනු ඇදහිල්ලේ කේන්ද්‍රය වන්නේ මන් ද?

### උතුම් වැදගත්කමින් යුතු

යේසුන්වහන්සේගේ මරණය පාවුල්තුමාගේ ශුභාරංචි පණිවුඩයේ "පළමු වැදගත්කම" ලෙස ලැයිස්තුගත කර ඇත. "මා ඔබට බාර දුන්නේ මා ලබාගත් දෙයම බව ප්‍රධාන කොට කිව යුතු ය. එනම්, ශුද්ධ ලියවිල්ලේ ප්‍රකාර ක්‍රිස්තුන්වහන්සේ අපගේ පාප උදෙසා මළ බවත්, වළලනු ලැබූ බවත්, ශුද්ද ලියවිල්ලේ ප්‍රකාර තුන්වනදා උත්ථාන කරනු ලැබූ බවත් ... දර්ශනය වූ බවත් ය" (1 කොරින්ති 15 : 3 - 5). පාවුල්තුමා තමාගේ දේශනා "කුරුසියේ පණිවුඩය" (1 කොරින්ති 1 : 18) ලෙස දක්වන්නේ ය. "අපි කුරුසියේ ඇණගසනු ලැබූ ක්‍රිස්තුන්වහන්සේ දේශනා කරමු" (23 පදය) යනුවෙන් ඔහු පවසා ඇත.

යේසුන්වහන්සේගේ මරණය ශුද්ධ ලියවිලිවල දක්වා තිබූ අතර, එය අත්‍යවශ්‍ය දෙයක් ද විය (ලූක් 24 : 25 - 26, ක්‍රියා 3 : 18, 17 : 3). මෙසියස්වහන්සේ *මරණයට පත් වීම* පමණක් අවශ්‍ය දෙයක් නොවූ අතර, සමහර විට වේදනාකාරී අන්දමින් *දුක් විඳීම* සහ අපගේ ගැළවීම උදෙසා කුරුසිපත් වීම ද අත්‍යවශ්‍ය විය. එය යේසුන්වහන්සේගේ මෙහෙයේ අවශ්‍යම අංගයක් විය. එසේම ශුභාරංචියේ අත්‍යවශ්‍යම අංගයකි. යේසුන්වහන්සේ තමාගේම දුක්විඳීම සහ මරණය - කුරුසියේ මරණය පවා, දැනසිටි සේක (මාක් 8 : 31 - 32, 9 : 31, 10 : 33 - 34, මතෙව් 20 : 19, 26 : 2, යොහන් 12 : 32 - 33). එය සිද්ධ වූ ආකාරයටම සිදු විය යුතුව තිබූ බවට උන්වහන්සේට සහතිකයක් විය (මතෙව් 26 : 54). එය උන්වහන්සේගේ

අරමුණ විය. මෙහෙය විය (යොහන් 12 : 27). යෙසායා 53 අනාවැකිය උන්වහන්සේ විසින් සම්පූර්ණ කළ යුතුව තිබිණි (ලූක් 22 : 37).

තමාගේ මරණය අනෙක් මනුෂ්‍යයින් ගැළවීම උදෙසා වූ මිදීමේ මිලයක් බව යේසුන්වහන්සේ පැවසූ සේක (මාක් 10 : 45). උන්වහන්සේගේ අවසන් භෝජනයේ දී තමාගේ ශරීරය අනෙක් මනුෂ්‍යයින් උදෙසා දුන් බවත්, තමාගේ රුධිරය නව ගිවිසුමක් පිහිටුවීමට දුන් බවත්, එනම් සමාව දීම මත පදනම් වූ මනුෂ්‍යයා සහ දෙවියන්වහන්සේ අතර වූ නව සම්බන්ධතාවයක් උදෙසා දුන් බවත් යේසුන්වහන්සේ පැවසූ සේක (ලූක් 22 : 19 - 20, මතෙව් 26 : 28). යෙසායා කී පරිදි උන්වහන්සේ පාපය උදෙසා මිලයක් වීමට දුක්විඳ මැරුණු අහිංසක මනුෂ්‍යයෙකි. දෙවියන්වහන්සේ අපගේ පාපයන් යේසුන්වහන්සේ මත තැබූ සේක. උන්වහන්සේ අපගේ වරද නිසා අපගේ නිදහස මිලට ගැනීම පිණිස මරනු ලැබූ සේක.

යේසුන්වහන්සේ තම මරණය පිළිබඳ දැන සිටියා පමණක් නොව, අපට එහි සුවිශේෂත්වය ද උන්වහන්සේ පැහැදිලි කර දුන් සේක. එය ශුභ ආරංචියක් වන්නේ එම නිසාවෙනි. උන්වහන්සේ තම ශරීරය අප උදෙසා දුන් සේක - අපගේ යහපත උදෙසා දුන් සේක. අපට සමාව ලැබෙන පිණිස තම රුධිරය වැගිරවීමට උන්වහන්සේ ඉඩ හැරිය සේක. යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර මැදහත්කරුවාණන් වූ සේක. උන්වහන්සේගේ මරණය අපට දෙවියන්වහන්සේ සමඟ ගිවිසුමක් ඇති කරගැනීමට පොළඹවයි. පොරොන්දුවේ සහ පක්ෂපාතිත්වයේ සම්බන්ධතාවක් ඇති කරගැනීමට පොළඹවයි. ඇත්තෙන්ම ක්‍රිස්තුන්වහන්සේගේ මරණය අපගේ ගැළවීම සඳහා වූ එකම මාර්ගය වේ. එම නිසාම යේසුන්වහන්සේ තමාට විඳීමට තිබෙන වේදනාව කුමනාකාරද යන්න දැනගෙන පවා "යෙරුසලම බලා යන අධිෂ්ඨනයෙන්" (ලූක් 9 : 51). උන්වහන්සේ පැමිණි හේතුව එයයි.

**අපකීර්තියක් ප්‍රසිද්ධියට පත් කිරීම**

යේසුන්වහන්සේගේ උත්ථානය පුදුම ආරංචියක් වේ. එය බලාපොරොත්තුවෙන් පිරුණු පණිවුඩයකි. යේසුන්වහන්සේගේ ගෝලයින්ට උන්වහන්සේගේ ලජ්ජා සහගත මරණය අත්හැර උත්ථානය පිළිබඳ පමණක් කතා කිරීම පහසුවෙන් කළ හැකි විය. ඇත්තෙන්ම, ක්‍රියා පොතේ දී ඔවුන් උත්ථානය පිළිබඳ දේශනා කළ බව අපි කියවන්නෙමු - එහෙත් ඔවුහු යේසුන්වහන්සේ විඳි නින්දිත දඬුවම මනුෂ්‍යයින් හට මතක් කළහ (ක්‍රියා 2:22-24, 3:13-15, 4:10, 5:30-31, 7:51-53, 10:37-40, 13:27-30).

ඔවුහු කුරුසිය පිළිගත්තා පමණක් නොව, එය *ගසක්* ලෙස ද හැඳින්වූහ. එම වචනය යුදෙව්වන්ට ද්විතිය නීති සංග්‍රහය 21 : 22 - 23 පද මතක් කර දෙයි. එහි දැක්වෙන්නේ ගසක එල්ලන කවරෙක් නමුත් දේව ශාපයට යටත් බව ය. *ගස* යන වචනය භාවිත කිරීමෙන් යේසුන්වහන්සේ විඳි ලජ්ජා සහගත මරණය වෙත වැඩි අවධානයක් ගෝලයෝ යොමු කළහ. යේසුන්වහන්සේ මැරුණු ලජ්ජා සහගත ආකාරයට ඔවුන් වැඩි අවධානයක් ලබා දුන්නේ මන් ද? හේතුව එය වැදගත වන නිසාවෙනි. ශුද්ධ ලියවිල්ලේ එහි අනාවැකි විය. එසේම අපගේ ගැළවීම උදෙසා එය අත්‍යාවශ්‍ය වන බැවිනි.

කුරුසියට ලජ්ජාව සහ වේදනාව දෙකම අයත් වේ (හෙබ්‍රෙව් 12 : 2). එයට "ශාපය" (ගලාති 3 : 13 - 14) ඇතුළත් වේ. පාවුල්තුමා කුරුසිපත් කිරීම අපරාධයක් බව දැනගෙන එය මනුෂ්‍යයින්ට වරද තබන්නට නොව, ඔහුට හැකි උපරිමයෙන් එයට අවධානය යොමු කළේ ය

(ගලාති 5 : 11, 3 : 1, 6 : 14). කුරුසිය ඔහුගේ ශුභාරංචියේ *කේන්ද්‍රය* විය ( 1 කොරින්ති 1 : 23, 2 : 2, පිලිප්පි 3 : 18).

පාවුල්තුමා කුරුසියේ ආධ්‍යාත්මික වැදගත්කම පෙන්වා දෙයි : අප උදෙසා ශාපයක් වීමෙන් යේසුන්වහන්සේ ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදාගත් සේක. උන්වහන්සේ අප උදෙසා ශාපයක් වූ සේක (2 කොරින්ති 5 : 21). අප ධර්මිෂ්ඨ අය වන පිණිස, නැතිනම් නිවැරදි අය යයි ප්‍රකාශ කිරීම වූ පූජාව උන්වහන්සේ වූ සේක. එම නිසාවෙන් අපගේ පාපය නිසාවෙන් අපට ලැබිය යුතු වූ දඬුවම අපට ලැබෙන්නේ නැත (රෝම 3 : 24 - 26). උන්වහන්සේ තම කුරුසිය මත දී අපගේ පාපය සහ එහි දඬුවම දරාගත් සේක (1 පේදුරු 2 : 24). "ක්‍රිස්තුන් වහන්සේ ඔබේ පව් උදෙසා වරක් දිවි පිදූ සේක. උන්වහන්සේ ධර්මිෂ්ඨව සිටි නමුත්, දෙවියන්වහන්සේ වෙතට ඔබ පමුණුවන පිණිස අධර්මිෂ්ඨයින් උදෙසා දිවි පිදූ සේක" (1 පේදුරු 3 : 18).

ආබ්‍රහම් හට පොරොන්දු වූ ආශිර්වාද අපට ලැබෙනුයේ කුරුසිය තුළින් ය (ගලාති 3 : 14). අප දෙවියන්වහන්සේට සමඟි කරනු ලැබුවේ කුරුසිය තුළින් ය (එපීස 2 : 16). දෙවියන්වහන්සේ අපට සමාව දුන්නේ, අපට විරුද්ධව තිබූ ණයවල ලිඛිත සටහන ඉවත් කරනු ලැබුවේ කුරුසිය තුළින් ය (කොලොස්සි 2 : 13 - 14). අපගේ ගැළවීම රඳා පවතින්නේ ක්‍රිස්තුන්වහන්සේගේ කුරුසිය මත වේ.

අපට ව්‍යවස්ථාව සම්පූර්ණ ලෙස පිළිපැදිය නොහැකි බැවින්, අපි එහි ශාපයට යටත් වන්නෙමු (ගලාති 2 : 10). අපි සියල්ලෝම මරණයට සුදුස්සෝ වමුව (රෝම 3 : 23, 6 : 23). යේසුන්වහන්සේ පාප රහිත අයෙක් ලෙස, මරණය ලැබිය යුතු නොවුව ද, අපගේ පාපයේ දඬුවම අප වෙනුවෙන් කැමැත්තෙන් වින්ද සේක. අධර්මිෂ්ඨයින් උදෙසා ධර්මිෂ්ඨ අයෙක් මළ සේක. අප විසින් ලැබීමට සුදුසු දඬුවම උන්වහන්සේ ලැබූ සේක. එබැවින් අප විසින් ලැබීමට සුදුසු නොවුව ද, අපට සමාව ලැබිය හැකි ය. අප ජිවිතය ලබන පිණිස උන්වහන්සේ මරණය වින්ද සේක.

ජෝන් ස්ටොට් කුරුසිය සත්‍යතාවන් තුනක් පෙන්වන බව ලියයි:

පළමුවැන්න, අපගේ පාපය ඉතා දරුණු ය. කුරුසිය තරම් එහි බරපතල බව පෙන්වන අන් දෙයක් නොමැත. ක්‍රිස්තුන් වහන්සේ තුළ තමන්වහන්සේම එය දරාගැනීම හැරෙන්නට ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේ හට ධර්මිෂ්ඨ ආකාරයකින් අපගේ අධර්මිෂ්ඨකමට සමාව දීමට අන් මාර්ගයක් නොමැත. එය ඇත්තෙන්ම ඉතාම බරපතල වේ.

දෙවනුව, දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ අවබෝධයට වඩා වැඩියෙන් අපූර්ව ය. උන්වහන්සේ අපගේ පාපය, වරදකාරී බව, විනිශ්චය සහ මරණය දරාගත් කුරුසියේ හුදෙකලා කටුක වේදනාව කරා පවා අප ලුහුබැඳ යන සේක. එවැනි වූ ප්‍රේමයකින් වෙනස් නොවී සිටීමට නම් දැඩි සහ ගල් හදවතක් තිබිය යුතු ය.

තුන්වනුව, ක්‍රිස්තුන්වහන්සේගේ ගැළවීම අනිවාර්යෙන්ම නොමිලයේ වූ ත්‍යාගයක් විය යුතු ය. උන්වහන්සේ එය අප වෙනුවෙන් "මිල දී ගත්තේ" උන්වහන්සේගේම රුධිරය නම් වූ විශාල මිල ගෙවීමෙනි. ඉතිං, අප හට ගෙවීමට ඉතිරිව ඇත්තේ කුමක් ද? කිසිවක් නොමැත. :*ඔයැ කරදි දම සයරසිඑල* ව්ටැ 83-

**මරණයේ අනුස්මරණයක්**

මිනිසෙක් ලෙස යේසුන්වහන්සේගේ මෙහෙයේ යොමුව කුරුසිය වේ. උන්වහන්සේගේ කලුරුසිපත් වීම සිදු වන තුරු උන්වහන්සේගේ වැඩය සිදු නොවිය. යේසුන්වහන්සේ තමා කළ භාස්කම් සිහි කරන්නට ගෝලයින්ට කීවේ නැත - ඔවුහු උන්වහන්සේගේ *මරණය* සිහි කළ යුතු විය. යේසුන්වහන්සේ බොහෝ චාරිත්‍ර අවම කළ සේක. එහෙත් නව ආඥාවක් කළ සේක : ස්වාමින්වහන්සේගේ භෝජනයේ රෝටි සහ මිදි යුෂ වේ. උන්වහන්සේ මෙම සිහිකිරීම්වලට සහභාගි වන්නට පැවසූ අතර, උන්වහන්සේගේ මරණයට සහ උන්වහන්සේගේ මරණයට අපගේ සහභාගීත්වය අපගේ ගැළවීමට යතුර වන නිසාවෙනි. අපි යේසුන්වහන්සේගේ මරණය සිහි කරන්නේ හුදෙක් යේසුන්වහන්සේට සිදු වූ දෙයක් ලෙස නොවන්නේ ය - එය අදට අපට අදාළ වන නිසා ය. ස්වාමින්වහන්සේගේ භෝජනය අතීතය බලන්නේ ය - යේසුන්වහන්සේ සස්ව කැමැත්තෙන් අප උදෙසා ජීවිතය දුන්සේක - වර්තමානය උදෙසා - අප සමඟ දැන් තිබෙන උන්වහන්සේගේ එක්සත් බව - එසේම අනාගතය උදෙසා - උන්වහන්සේගේ නැවත පැමිණීමේ පොරොන්දුව.

බෞතිස්ම ස්නාපනයේ දී, යේසුන්වහන්සේගේ මරණය සමඟ අපගේ සහභාගිත්වය අපි නිරූපණය කරන්නෙමු (රෝම 6 : 3). ආධ්‍යාත්මික කටනයේ දී අපි ක්‍රිස්තුන්වහන්සේ සමඟ කුරුසිපත් කර ඇත්තෙමු (ගලාති 2 :20). දිනපතා අපි අපගේ පාපිෂ්ට ආශාවන් සහ අභිලාෂයන් කුරුසිපත් කළ යුතු වන්නෙමු (ගලාති 5 : 24, රෝම 8 : 13). යේසුන්වහන්සේ අනුගමනය කිරීමට අප දිනපතා අපගේ කුරුසිය රැගෙන යා යුතු වෙමු (ලූක් 9 : 23). වැරදි ආශාවන් වළක්වා ගැනීමට කැමති විය යුතු වෙමු. අපගේ ජීවිතයේ ඇත්තේ කුමක් සඳහා ද යන්න ස්වාමින්වහන්සේගේ රාත්‍රී භෝජනය සිහිපත් කරවන්නේ ය.

යේසුන්වහන්සේගේ මරණය අපගේ දිනපතා ජීවිතය උදෙසා වූ ජීවත් වීමේ රටාව වේ. එය දෙවියන්වහන්සේට සම්පූර්ණ යටත් වීමේ නිරූපණයයි, පාපය ප්‍රතික්ෂේප කොට ධර්මිෂ්ඨකම තෝරාගැනීමේ කැමැත්ත නිරූපණයයි. යේසුන්වහන්සේ අප උදෙසා මැරුණු සේක, එම නිසා අපි තව දුරටත් අප වෙනුවෙන් ජීවත් විය යුතු නොවන බවත්, ඒ වෙනුවට යේස්නුවහන්සේට සේවය කිරීම පිණිස ජීවත් විය යුතු බවත් පාවුල්තුමා පවසයි (2 කොරින්ති 5 : 15). අපගේ පරණ මමත්වය ක්‍රිස්තුන්වහන්සේ සමඟ කුරුසිපත් කර ඇති නිසාවෙන් "අපි තව දුරත් පාපයේ වහල්ලු නොවන්නෙමු" (රෝම 6 : 6). ඒ වෙනුවට අපි අපගේ ජීවිත ජීවමාන යාගයක් කොට දෙවියන්වහන්සේට පුජා කළ යුතු වෙමු, උන්වහන්සේට සේවය කිරීමට කැමති විය යුතු වෙමු (රෝම 6 : 13, 12 : 1) මන්ද උන්වහන්සේ අප වෙනුවෙන් මැරුණු සේක. අපි "පාපයට මැරී ධර්මිෂ්ඨකම උදෙසා ජීවත් විය යුතු ය" (1 පේදුරු 2 : 24).

යේසුන්වහන්සේගේ මරණය දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරන බවට වූ සාධකයකි - එයින් අපට උන්වහන්සේ අප ගැන බොහෝ සෙයින් සලකන බවත්, ගැටලුව විසඳීමට යමක් කර ඇති බවත්, අපගේ පාපිෂ්ට බව අපට ගෙනා මරණයෙන් අප මුදවාගත් බවත් පෙන්නුම් කරයි (රෝම 5 : 8 - 10). දෙවියන්වහන්සේ තමන්ගේම පුත්‍රයාණන් වළක්වා නොගත් නිසාවෙන් අපගේ ගැළවීමට අවශ්‍යසියලු දේ උන්වහන්සේ ලබා දෙන බවට අපට සහතික විය හැකි ය (රෝම 8 : 32). උන්වහන්සේගේ ප්‍රේමය අප විසින් එකිනෙකාට කෙතරම් ප්‍රේම කළ යුතු ද යන්නට ආදර්ශයකි (එපිස 5 : 1 - 2).

යේසුන්වහන්සේගේ මරණය අපට වැදගත් නිදහස්කම් ලබා දෙන්නේ ය :

- අපි තවදුරටත් ව්‍යවස්ථාවේ සිරකරුවෝ නොවන්නෙමු (ගලාති 3 : 23, රෝම 7 : 6)
- අපි තවදුරටත් පාපයේ සහ ආශාවේ වහල්ලු නොවන්නෙමු යොහන් 8 : 34 - 36, රෝම 6 : 6 -7, තිතස් 3 : 3)
- අපි තවදුරටත් මරණයේ සහ බියේ වහල්ලු නොවන්නෙමු (රෝම 8 : 2, හෙබ්‍රෙව් 2 : 14 - 15)
- අපි ලෝකය සහ නපුරා පරාජය කොට ඇත්තෙමු (1 යොහන් 5 : 4 - 5, 1 යොහන් 2 : 13 - 14, එළිදරව් 12 : 11)

මෙම නිදහස්කම් ඇතිව, අපි ධර්මිෂ්ඨකමේ වහල්ලු විය යුතු වෙමු. යේසුන් ක්‍රිස්තුන් වහන්සේගේ වහල්ලු විය යුතු වෙමු. උන්වහන්සේ අප වෙනුවෙන් මැරුණේ අප උන්වහන්සේ වෙනුවෙන් ජීවත් වන පිණිස ය (2 කොරින්ති 5 : 14 - 15). ක්‍රිස්තුන්වහන්සේගේ කුරුසියෙන් අපට පෙන්නුම් කරන ලද දෙවියන්වහන්සේගේ ප්‍රේමයට අප විසින් ප්‍රතිචාර දැක්විය යුතු වන්නේ මේ ආකාරයෙනි.

අප පීඩා විඳින විට ද කුරුසිය අපට ආදර්ශයකි. ජේදුරුතුමා අපට මතක් කර දෙන්නේ අප නිස්කාරණයේ පීඩා විඳින විට යේසුන්වහන්සේ අපට ආදර්ශයක් සේ අප වෙනුවෙන් නිස්කාරණයේ පීඩා විඳි බව සිහි කරන්න කියා ය (1 ජේදුරු 2 : 19 - 23). හෙබ්‍රෙව් කතුවරයාද පවසන්නේ අප ප්‍රශ්නවලින් හෙම්බත් වී සිටින විට යේසුන්වහන්සේ සිහි කරන්න යනුවෙනි. මන්ද උන්වහන්සේ අපට ශ්‍රේෂ්ඨ උපහැරණයක් වන නිසාවෙනි (හෙබ්‍රෙව් 12 : 2 - 4). නිස්කාරණයේ අසාධාරණ ලෙස පීඩා විඳීම කිතුනු කැඳවීමේ එක් අංගයකි. එසේම යේසුන්වහන්සේ අපට දුන් ආදර්ශයේ කොටසක් ද වන්නේ ය. "සේවකයෙක් ස්වාමියාට වඩා උතුම් නොවන්නේ ය" (යොහන් 15 : 20). අවසාන රාත්‍රී භෝජනය යේසුන්වහන්සේගේ ජීවිතය කුමක් සඳහා වූවක් ද යන්න අපට සිහිගන්වයි. එසේම අප කැඳවා ඇත්තේ ද උන්වහන්සේ අනුගමනය කිරීම පිණිස ය.

අප පීඩා විඳින කල, යේසුන්වහන්සේට මෙන්ම අප වෙනුවෙන් මහිමයේ ඔටුන්නක් තබා තිබෙන බව දැනගැනීම අපට ධෛර්යයක් වේ. අපි උන්වහන්සේ සමඟ උන්වහන්සේගේ කුරුසියෙහි දී හඳුනාගනු ලබන කල අපි උන්වහන්සේගේ මහිමයට ද පංගුකාරයෝ වන්නෙමු (රෝම 8 : 17 - 18, 2 කොරින්ති 4 : 17).

මනුෂ්‍යයින්ට නම් කුරුසිය මෝඩකමක් වීමට හැකිය, එහෙත් එය දෙවියන්වහන්සේගේ ප්‍රඥාව පෙන්වන්නේ ය (1 කොරින්ති 1 : 17 - 25). එය ශ්‍රේෂ්ඨ බුද්ධිමතුන් හට පහරකි, බුද්ධිමත් උපායකි. එය පාපය කෙතරම් කැත ද යන්න සහ දෙවියන්වහන්සේගේ ප්‍රේමය කෙතරම් අලංකාර ද යන්න එකවිටම පෙන්වයි. එය තිරණාත්මක ලෙස පාපයට දඬුවම් කොට සමාව පිළිගන්වයි. එය සාධාරණකම සහ අනුග්‍රහය යන දෙකම පෙන්නුම් කරයි. එය පාපයේ සහ මරණයේ බලය බිඳ හෙළා, අපට එයින් ජය ගැනීමට බලය ලබා දෙයි. එක් වරක් සියලු දෙනා වෙනුවෙන්ම අපගේ පාපය සමඟ ගනුදෙනු කර ඇති බවත්, අපගේ දුක් විඳීම් නිෂ්ඵල නොවන බවත්, අපගේ ස්වාමි වූ යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළින් මහිමයේ ඔටුන්න අපට තබා ඇති බවත් කුරුසිය දෘශ්‍යමාන සාධකයක් පෙන්නුම් කරයි. එය නිසැක ලෙසම වටිනා සිහි කිරීමක් වේ.

# ගෝලත්වය 101

# ඒකකය 3 ඇ



## අපගේ මාංශවත් වීමේ පීඩාව සහ ඇදහිල්ල

බොහෝ කිතුනුවන්ට උගන්වා ඇත්තේ ඔවුන්ට පීඩාවලින් පළා යාමට සහතිකයක් ඇති බවයි. ඔවුහු දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් කෙරෙහි ඇදහිල්ල ඇති අය උදෙසා දෙවියන්වහන්සේ මැදිහත් වන බවට වූ බයිබලීය පොරොන්දු පෙන්වති.

කෙසේ වුව ද, දෙවියන්වහන්සේ අපගේ පීඩාවල දී අපට උපකාර කිරීමට පොරොන්දු වනවා පමණක් නොව, අපට පරීක්ෂාවන් පැමිණෙන බවට ද පොරොන්දු වූ සේක ! ක්‍රිස්තුන්වහන්සේ පැමිණියේ අපට ප්‍රශ්නවලින් තොර ජීවිතයක් දීමට නොවේ. ඒ වෙනුවට, අපගේ පවුල් තුළ උන්වහන්සේ නිසාවෙන් භේද ඇති වන බවට අනතුරු ඇඟවූ සේක (මතෙව් 10 : 34 -36). අපට පරීක්ෂා ඇති වන බව කී සේක (යොහන් 16 : 33). එසේම, පීඩාවට පත් වන බව කී සේක (යොහන් 15 : 20). අප දේව රාජ්‍යයට පැමිණෙන්නේ බොහෝ පීඩා තුළින් ය(ක්‍රියා 14 : 22). එසේම සැම කිතුනුවෙක්ම පීඩා විඳිනු ඇත (2 තිමෝති 3 : 12). පීඩාවලින් දුකට පත්වන විට එය අසාමාන්‍ය දෙයක් යයි නොසිතිය යුතු ය (1 පේදුරු 4 : 12).

එහෙත්, අප යේසුන්වහන්සේගේ නාමයෙන් යම් දෙයක් ඉල්ලන කල, අප වෙනුවෙන් උන්වහන්සේ එය කරන බව බයිබලය පවසයි (යොහන් 14 : 13 - 14). හොඳයි. මෙසේ ඇතැම් කිතුනුවෝ අපට ගැටලුවලින් තොර ජීවිතයක් ඉල්ලීමට හැකි බව සිතති. අපට පමණට වඩා ඇදහිල්ල තිබේ නම්, යේසුන්වහන්සේ ගැටලු රහිත ජීවිතයක් ගත කිරීමට හැකියාව ගෙන දෙන සේක.

යොහන් 14 : 13 - 14 අප ඉල්ලන කොයි දෙයක් වුවත් අපට ලැබෙන බව පවසයි. එය අපට අවශ්‍ය ඕනෑම දෙයක් ලබාගැනීමට හැකි පොරොන්දුවක් ලෙස ප්‍රකාශ කිරීමට හැකියාව තිබේ ද? නැත - මෙවන් කොටසක දක්වා නොමැති සුදුසුකම් ශුද්ධ ලියවිල්ලේ වෙනත් ස්ථානවල පැහැදිලිව දක්වා ඇත. මෙම කරුණ දෙස මොහොතක් අවධානය යොමු කරන්න : ඇතැම් කිතුනුවෝ ඉතා උනන්දුවෙන් ඇදහිල්ලෙන් යුතුව යාච්ඤා කර පැට් රොබින්සන් ජනාධිපති ධුරයට පත් වන ලෙස ඉල්ලති. තවත් අය යේසුන්වහන්සේගේ නාමයෙන් ඒ සඳහා ජෝජ් බුෂ් ද, තවත් සමහරු බිල් ක්ලින්ටන් ද ඉල්ලති. සැම කණ්ඩායමකටම අයත් ඇතැම් අය ඇදහිල්ලෙන් යාච්ඤා කරති. එහෙත් යේසුන්වහන්සේ ඔවුන් සියල්ලන්ගේ ඉල්ලීම්වලට එකම අයුරින් පිළිතුරු නොදෙන සේක.

ප්‍රකාශ කර නොමැති සුදුසුකම් වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව පමණක් පිළිතුරු ලබා දෙන බවයි (1 යොහන් 5 : 14). දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සර්වබලධාරී කැමැත්ත උල්ලංඝනය වන අයුරින් කෙරෙන අපගේ යාච්ඤාවන්ට ප්‍රතිචාර නොදක්වන සේක.

උන්වහන්සේ වෙත අපට නොපෙනෙන හේතූන් ඇත්තේ ය. අපි උන්වහන්සේගේ කැමැත්ත සම්පූර්ණ ලෙස නොදන්නෙමුව. එසේම සත්‍ය නොවන දෙයක් විශ්වාස කිරීම අපට තරමක් පහසු ය. යාච්ඤාවෙන් අප ඉල්ලන දේ ලැබීම අපගේ ඇදහිල්ල සහතික නොකරන බැවින් එය අපගේ ඇදහිල්ල වරදවා ගැනීමකි. තවමත් මට වාචික ලෙස කන්දක් මුහුදට හෙළීම පිළිබඳ අසන්නට ලැබේ.

සමහර කිතුනුවෝ බිල් ක්ලින්ටන් දෙවියන්වහන්සේ විසින් කාර්යාලයෙන් ඉවත් කරනු ඇතැයි ද, තවත් කිතුනුවෝ එසේ නොවනු ඇතැයි ද විශ්වාස කරති. එක් පිරිසක් එක් ප්‍රතිඵලයක් උදෙසා ද, තවත් පිරිසක් තව ප්‍රතිඵලයක් උදෙසා ද යාච්ඤා කරති. එහෙත් ඒ දෙකම සැබෑ නොවේ. අපට දෙවියන්වහන්සේගෙන් ඩොලර් මිලියනයක් ඉල්ලීමට පුළුවන. බොහෝ කිතුනුවෝ එසේ ඉල්ලූව ද ලැබෙන්නේ නැත. දෙවියන්වහන්සේ සපයන බවට වූ සහතිකය ඇතිව "ඇදහිල්ලෙන්" අපි කෙතරම් දේ මිලදී ගත්ත ද ප්‍රශ්නයක් නැත. යේසුන් ක්‍රිස්තුන්වහන්සේ අප ගළවන බවට අපට සම්පූර්ණ සහතිකයක් තිබිය හැකි වුවත්, ඇදහිල්ල නැතිව අපි නිවැරදි වචන භාවිත කරමින් විශ්වාසයෙන් යුතුව උන්වයහන්සේගේ නාමයෙන් ඉල්ලන නිසාවෙන් පමණක් එය අපගේ සැම ඉල්ලීමක් ඉෂ්ට කරන බලවේගයක් නොවේ.

**ඇදහිල්ල සහ සුවය**

බොහෝ කිතුනුවෝ දෙවියන්වහන්සේ විසින් තම ආදරණීය අයෙකු සුවපත් කරනු ඇතැයි ස්ථිර ලෙස විශ්වාස කරති. ඔවුහු ඇදහිල්ලෙන් යාච්ඤා කරති. ඇතැම් අය වෙනත් ඇදහිලිවතුන්ගෙන් හෝ වෙනත් භාසකම්වලින් තමන්ට සහතිකයක් ඇති බව සිතති. එම නිසා තම ආදරණීය හිතවතා මැරුණු විට ඉතා පුදුමයට පත් වෙති. තැති ගනිති. ඔවුහු ස්ථිර ලෙසින්ම විශ්වාස කළ දෙය සත්‍ය නොවන දෙයක් බවට හැරී ඇත. ඔවුන්ගේ ඇදහිල්ලට මනුෂ්‍යයෙකු සුවපත් කළ නොහැකි ය - දෙවියන්වහන්සේට පමණක් සුව කළ හැකි ය. එසේම උන්වහන්සේම සුව නොකරන්නට තෝරාගන්නා සේක. ඔවුන්ගේ යාච්ඤාව, ඇදහිල්ල, දෙවියන්වහන්සේගේ ප්‍රේමය සහ දෙවියන්වහන්සේගේ පොරොන්දුව නොසලකා හැර ඇත.

මෙවන් අධෛර්යට පත් වීම් සිදු වන කල, අලුත් පරීක්ෂාවක් ඇති වේ. සුවය තුළ වූ ඇදහිල්ල වැරදි ලෙසට හැරී ඇත්නම්, ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ල පිළිබඳ කුමක් සිතන්න ද? එයත් වැරදීමක් ද? "ඇදහිල්ලේ වචනය" පිළිබඳ දේශනා කිරීමේ එක් භයානක දෙයක් වන්නේ එයයි. එය ගැළවුම්කරුවාණන්වහන්සේ තුළ වූ අපගේ ඇදහිල්ල විශේෂිත අනාවැකිවලට සම්බන්ධ කරවන්නේ ය. යේසුන්වහන්සේ සැම රෝගයක්ම සුව කරන්නට පොරොන්දු වූ සේක් ද? උන්වහන්සේ එපප්‍රොදිතස් ඔවුන්ට අවශ්‍ය වූ ලෙස ඉක්මණින් සුව නොකළ සේක (පිලිප්පි 2 : 27). මේ ලෝකයේ උන්වහන්සේගේ මෙහෙයේදී පවා යේසුන්වහන්සේ සියල්ලන්ම සුව නොකළ සේක (යොහන් 5 : 3 - 9).

යේසුන්වහන්සේ අපගේ සියලු පාපවලට වන්දිය ගෙවා අප වෙනුවෙන් පීඩා නොවිඳි සේක් ද? එයින් අදහස් වන්නේ අපට පීඩා විඳීමට කිසිම හේතුවක් නැති බව ද? සමහරු එසේ කියති. එහෙත් අපි මෙයට හේතුව තවත් කරුණක් සමඟ විමසා බැලිය යුතු ය : යේසුන්වහන්සේ අප වෙනුවෙන් මැරුණු සේක. එයින් අදහස් වන්නේ අපි කෙදිනකවත් මැරෙන්නේ නැත කියා ද? පාපයේ වන්දිය සම්පූර්ණයෙන් ගෙවා ඇත. එම නිසා අප මැරෙන්නට අවශ්‍ය නොවේ. අපට දැනටමත් සදාකාල ජීවනය තිබේ (යොහන් 5 : 24, 11 : 26). එහෙත් සැම කිතුනුකේම

මිය යන්නේ ය. එබැවින්, මෙම හේතුවේ යම් වරදක් තිබේ. අපි තවමත් යේසුන්වහන්සේ අප වෙනුවෙන් සම්පූර්ණ කළ සියල්ල අත්දකින්නේ නැත.

අනාගතයේ අපි අමරණීය ස්වභාවයෙන් නැගුටුවනු ලබන කාලයක් පැමිණේ. කිසි වේදනාවක් අත්දකින්නේ නැති කාලයක් පැමිණේ. යේසුන්වහන්සේගේ මිදීමේ සියලු වරප්‍රසාද අපි ලබාගන්නා කාලයක් පැමිණේ. එහෙත් ඒ කාලය තවම පැමිණ නැත. වර්තමානයේ දී අපි යේසුන්වහන්සේගේ පීඩා විඳීමෙහි පංගුකාරයෝ වෙමු ( 1 පේදුරු 2 : 20 - 21).

යේසුන්වහන්සේ පීඩාව පොරොන්දු වූ සේක. වේදනාවෙන් සහ දුකෙන් මිදීමක් පොරොන්දු වූයේ නැත. යේසුන්වහන්සේ පාපයේ වන්දිය සම්පූර්ණයෙන්ම ගෙවා තිබුණ ද, පාවුල්තුමාට පහර දෙන විට, ගල් ගසන විට සහ සිර ගෙයි දැමූ විට ඔහුට වේදනාව දැණුනි. පාවුල්තුමාට විශාල ඇදහිල්ලක් තිබිණි. එසේම බොහෝ පීඩා ද විය (2 කොරින්ති 1 : 5, පිලිප්පි 3 : 10, 4 : 12). යේසුන්වහන්සේ සැම පාපයක් උදෙසාම සමාව දී තිබුණ ද, කිතුනුවෝ තම ඇදහිල්ල තිබියදීත් පීඩා විඳිති. සමහර විට ඔවුන්ගේ ඇදහිල්ල නිසා පීඩා විඳිති.

අපි පීඩා විඳින්නෙමු. පාපය ඇති ලෝකයේ ජීවත් වන විට සිද්ධීන් නිසා වේදනාවට පත්වන්නෙමු. පාපය අහිංසක මිනිසුන් රිදවයි. ඇතැම් විට රිදවනු ලබන අහිංසක මිනිස්සු අපි වෙමු. සමහර විට මේ ලෝකයේ මරණයට පත් වීම එහි ප්‍රතිඵලය වේ. ඇතැම් විට එය ඉතා සෙමින් වූ වේදනාකාරී මරණයකි. දවනු ලැබීමෙන්, පහර දෙනු ලැබීමෙන්, වාහන අනතුරකින් හෝ ඇස්බැස්ටෝස් කැබලිවලින් හෝ අපිට ශාරීරික හානියක් සිදු වේ. සීතලට නිරාවරණය වීමෙන්, නිවසක් ගිනි ගැනීමෙන් ඇති වන දුමෙන් හෝ ආහාරවල රසායනික ද්‍රව්‍ය නිසාවෙන් අපගේ සෞඛ්‍ය සම්පන්න බව නැති වේ. අපි ලොකු, කුඩා වන සතුන්ගෙන්, ඇතැම් විට ශුද්‍ර ජීවීන්ගෙන් පවා පීඩා විඳින්නට පුළුවන. සිදු විය හැකි සැම ප්‍රශ්නයකින්ම දෙවියන්වහන්සේගේ සෙනඟ ආරක්ෂා කරන බවට උන්වහන්සේ සහතික කර නැත.

ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ල ඇති අය සැම විටම සුව කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත ද? බයිබලීය සාක්ෂිය වන්නේ උන්වහන්සේ ඇතැම් විට එසේ සුව කරන බව සහ සමහර විට සුව නොකරන බවයි. ස්තේපන් මරනු ලැබීය, යාකොබ් මරනු ලැබීය. අවසානයේ දී සැම මුල් කිතුනුවෙක්ම කුමනාකාරයෙන් හෝ මරණයට පත් වූහ. එහෙත්, ඔවුන් අවසානයේ දී එසේ මිය යාමට පෙර දෙවියන්වහන්සේ කී වතාවක් ඔවුන් බේරා ගත් සේක් ද? බොහෝ වරක් එසේ සිදු විය.

තමා ඇස් කණ්ණාඩි පැළඳ සිටින අතරම, සියලු ආබාධිත තත්වයන් සුව කරන බවට දේශනා කරන අය ගැන ඔබ කෙදිනක හෝ පුදුම වී තිබේ ද? එක් ආකාරයක රෝගයකට අදාළ වන සහ තවත් ආකාරයක රෝගයකට අදාළ නොවන ආකාරයේ බයිබලීය පොරොන්දු ඇත්තේ මන්දැයි හේතු නොමැත. ඇස් පෙනීම, වයස, හදිසි අනතුරු හෝ වෙන කුමනාකාර දෙයක් සම්බන්ධයෙන් වුව ද ශුද්ධ ලියවිලිවල ඇති සුවය සඳහා වූ විශ්වීය පොරොන්දු වෙනස් වන්නේ නැත. ශුද්ධ ලියවිල්ල සහ අත්දැකීම් යන දෙකම මෙම පද විශ්වීය සහතිකයක් නොවන බව අපට පවසයි.

ඔව්. ඇතැම් අය විශ්මයජනක අයුරින් සුවය ලබති. මේවා විශේෂිත උපකාරයේ, අනුග්‍රහයේ සහ කරුණාවේ නිදර්ශනයන් ය. මේවා අතිරේක අනුග්‍රහයේ නිදර්ශන ලෙස ගනිමින් ඒවායින් විශ්වීය පොරොන්දු නිර්මාණය නොකළ යුතු වෙමු.

එසේම මෙලෙස සුවය නොලද අයට ඇදහිල්ල නැතැයි අදහස් නොකළ යුතු ය. සමහර විට ඔවුන්ගේ ඇදහිල්ල පෙන්නුම් කෙරෙනුයේ ඔවුන්ගේ පීඩාව තුළිනි. ඔවුහු ඉතා සතුටින් දෙවියන්වහන්සේ ඉතාම හොඳ දෙය ඔවුන් උදෙසා කරනු ඇත යන සහතිකය ඇතිව සිටිති. ඔවුහු ජීවත් වුව ද, මැරුණ ද, ඔවුන් ධනවත් වුව ද, දිළිඳු වුව ද, ඔවුහු දෙවියන්වහන්සේ තුල විශ්වාස කරති. ඔවුන්ගේ ඇදහිල්ලෙහි කිසිම වරදක් නැත්තේ ය. වරද ඇත්තේ ඔවුන් කුමන හෝ දෙයක් නොකරන බව අදහස් කරමින් කරන ඉගැන්වීම්වල ය.

**පරීක්ෂාවල අරමුණු**

හොඳයි. දෙවියන්වහන්සේ අපට පීඩා පොරොන්දු වී ඇති බැවින්, එම පීඩාවල දී අපට උපකාර කිරීමට පොරොන්දු වී ඇති බැවින්, ඒවා පැමිණෙන්නේ කුමක් නිසාවෙන් ද? දෙවියන්වහන්සේ කුමනාකාර හෝ නපුරු දෙයකට ඉඩ හරින්නේ මන් ද? අපි ඒ ගැන සම්පූර්ණ ලෙස නොදන්නෙමු. එහෙත් දෙවියන්වහන්සේ නපුරට ඉඩ හරින බවත්, යේසුන්වහන්සේම ඒවා කැමැත්තෙන් ඉවසූ බවත්, තවමත් උන්වහන්සේ ඉවසීමෙන් යුතුව ඒවා දරාගන්නා බවත් අපි දනිමු. පරීක්ෂාවල ඇති ප්‍රයෝජන සමහරක් ශුද්ධ ලියවිල්ල අපට පවසයි :

- “පීඩා විඳීමෙන් ඉවසිල්ල ද, ඉවසිල්ලෙන් තැන්පත් බව ද, තැන්පත් බවෙන් බලාපොරොත්තුව ද උපදින බව දැන (රෝම 5 : 3 - 4). “දඬුවමක් ලබන කල එය දුකට මිස ප්‍රීතියට කාරණයක් මෙන් නොපෙනේ. එහෙත් එයින් හික්මුණු අයට පසුව දැහැමි, සාමකාමී ජීවිතයක ඵල අත් වේ” (හෙබ්‍රෙව් 12 : 11).
- “ඔබ තව ස්වල්ප කලකට විවිදාකාර පරීක්ෂාවලින් පීඩා කරනු ලැබිය යුතු නමුත්, ඒ ගැළවීම ගැන ඔබ ඉතා ප්‍රීති වන්නහු ය. එසේ පීඩා කරනු ලබන්නේ ඔබේ ඇදහිල්ල ගින්නෙන් සෝදිසි කරනු ලබන රනටත් වඩා අනර්ඝ බව දැක්වීමට ය” (1 පේදුරු 1 : 6 - 7).

කෙටියෙන් කියතොත්, අපිට පාඩම් කිරීමෙන් ඉගෙන ගත නොහැකි දේවල් පීඩා විඳීමෙන් උගත හැකි වේ. වචනයෙන් සම්පූර්ණ ලෙස විස්තර නොකළ හැකි පරිදි, පීඩා විඳීම අපගේ චරිතය හැඩගස්වන්නේ ය. යේසුන්වහන්සේ පවා උන්වහන්සේගේ පීඩා විඳීමෙන් ඉගෙනගත් සේක (හෙබෙව් 5 : 8). එසේම අප ද කැඳවා ඇත්තේ කුරුසියක් රැගෙන උන්වහන්සේ සමඟ පීඩා විඳීම පිණිස ය. “අපි දරුවෝ නම් උරුමක්කාරයෝ ද වම්හ. දෙවියන්වහන්සේගේ උරුමක්කාරයෝ ද ක්‍රිස්තුන්වහන්සේ හා සමඟ හවුල් උරුමක්කාරයෝ ද වම්හ. මන්ද දැන් උන්වහන්සේගේ දුක් විඳීමේ පංගුකාරයන් වීමෙන් අනාගතයේ දී උන්වහන්සේගේ මහිමයේ පංගුකාරයෝ ද වම්හ” (රෝම 8 : 17).

පරීක්ෂාවන් සතුටුදායක වන නේ නැත. එහෙත් දෙවියන්වහන්සේ අපගේ ජීවිත තුළ ක්‍රියා කරන සේක යන කරුණ නිසා අපට සැනසීමට හැකිය. එසේම සියලු දේවලින් යහපත ලබා ගැනීමට උන්වහන්සේට හැකි ය. උන්වහන්සේගේ මහිමාන්විත අරමුණ උදෙසා අපගේ ජීවිත තුළ ක්‍රියා කිරීමට උන්වහන්සේ වෙත දැනුම සහ දයානුකම්පාව ඇත්තේ ය. පරීක්ෂාවකින් අප ඉගෙන ගත යුතු විශේෂිත පාඩම කුමක්දැයි අපට සැම විටම තේරුම් ගත නොහැකි ය. එහෙත්, සමස්ත පාඩම වන්නේ සැම විටම දෙවියන්වහන්සේ විශ්වාස කිරීම වේ.

බොහෝ විට, ඇදහිල්ලේ පරීක්ෂාව *ඇදහිල්ල* පරීක්ෂාවක් පමණක් විය හැකි ය. පරීක්ෂාවලදී අපි අපගෙ ශාරීරික තත්වය නොසලකා දෙවියන්වහන්සේ විශ්වාස කළ යුතු වෙමු. එසේ

දෙවියන්වහන්සේ විශ්වාස කිරීමෙන් අපි අපි අපගේ ඇදහිල්ලෙහි උන්වහන්සේ සමඟ සම්බන්ධතාවයෙහි වර්ධනය වන්නෙමු. මෙය අප්‍රමාණ ලෙස වැදගත් වේ. අපි ක්‍රිස්තුන්වහන්සේ තුළ සිටින නිසාවෙන් අපට විය හැකි සියල්ල වන්නෙමු. උන්වහන්සේගෙන් තොරව අපි කිසිත් නැති අය වෙමු.

පරීක්ෂා නොකළ ඇදහිල්ල දුර්වල විය හැකි ය. සියලු දේ යහපත්ව ඇති විට ඕනෑම අයෙකුට නොපසුබට විය හැකි ය. පරීක්ෂා කරනු ලැබූ ඇදහිල්ල ශක්තිමත් ය, එසේම අප සහ දෙවියන්වහන්සේ අතර ඇති බැඳීම ද ශක්තිමත් ලෙස වර්ධනය වේ. දෙවියන්වහන්සේට උන්වහන්සේගේ දරුවන් සමඟ පෞද්ගලික සම්බන්ධතාවයක්, එනම් ඇදහිල්ල, විශ්වාසය සහ ප්‍රේමය යන ගුණාංගවලින් යුතු සම්බන්ධතාවයක් අවශ්‍ය වේ. මෙම ඇදහිල්ලෙහි බැඳීම පරීක්ෂාවලින් ශක්තිමත් බවට පත් වේ. අපගේ සෑම අවශ්‍යතාවක් උදෙසා ම දෙවියන්වහන්සේ මත යැපීමට පරීක්ෂා අපට උගන්වයි. අපගේ පරීක්ෂාව සෞඛ්‍ය වුව ද, මුදල් වුව ද, සම්බන්ධතා වුව ද, සභාවේ ප්‍රශ්න වුව ද අපි ක්‍රිස්තුන්වහන්සේ දෙස බැලිය යුතු වෙමු.

## ගෝලත්වය 101

## ඒකකය 4 අ



# ජේසුස්වහන්සේ : සදහටම ජීවමානය

ජේසුස්වහන්සේ මළවුන් අතර බොහෝ කල් නොසිටි සේක. ඉරුදින උදෑසන, හිරු නැගෙන්නට ආසන්නයේ දී, පුත්‍රයාණන්වහන්සේ නැවත නැගිටි බව ඇතැම් ගෝලයින්ට අවබෝධ විය. ඔවුහු නැවත නැගිටීම නොදුටුවෝ ය. එහෙත් ඔවුහු ජීවමාන ජේසුස්වහන්සේ හොඳින් සිටිනවා දුටුවෝ ය. දින 40 ක කාලයකට පසුව, ඔවුහු ජේසුස්වහන්සේ බොහෝ වාර ගණනක් දුටුවෝ ය. පසුව උන්වහන්සේ ස්වර්ගයට නැගුණු සේක.



එහෙත් ජේසුස්වහන්සේ මෙහෙය හමාර නොකළ සේක. උන්වහන්සේගේ මෙහෙය ස්වර්ගයෙහි දී පවා, නොකඩව සිදු කෙරුණි. අප වෙනුවෙන් මැදහත්කාරකම් කරමින්, අපට උපකාර කරමින්, සදාකාලික තේජසට අප සූදානම් කරමින් උන්වහන්සේ සභාවට සේවය කරමින් මඟ පෙන්වන සේක. ක්‍රිස්තුන්වහන්සේ නැවත පැමිණෙන සේක. උන්වහයන්සේ සතුරා පරාජයට පත් කළ පසුව. සියල්ල පියාණන්වහන්සේට දෙන සේක. ඉන්පසු මෙහෙය සම්පූර්ණ වේ.

**නැවත නැගිටීම**

ජේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව විශ්වාස කිරීම බොහෝ දෙනාට අපහසු දෙයකි. ඔවුන්ගේ අත්දැකීමට අනුව මැරුණු අය සැම විටම මළවුන් අතර සිටිති. මෙවැනි අසාමාන්‍ය විශ්වාසයක් පිළිබඳ ඔවුහු සැක පහළ කරති. ගෝලයින්ට වැරදුණා විය හැකිය, නැතිනම් එය ඔවුන් විසින් ගොතන ලද්දක් යයි ඔවුහු පවසති.

මුල දී ගෝලයෝ ද මෙය සැක කළහ. ඔවුහු සොහොනට ගිය විට, මෘත ශරීරය දැකීමට බලාපොරොත්තු වූහ. ඔවුහු මෘත ශරීරය නොදුටු විට, එය කවුරුන් විසින් හෝ සොරකම් කරගෙන ගොස් ඇති බව ඔවුහු සිතූහ. ඔවුහු නැවත නැගිටීමක් බලාපොරොත්තු නොවූහ. ජේසුස්වහන්සේ ඔවුන්ට *පෙනුණු* අවස්ථාවේ දී උන්වහන්සේ ජීවමානව සිටින බවට ඔවුහු විශ්වාස කළහ.

සියල්ලෝම විනිශ්චය සඳහා නැගිටිනු ලබන මේ යුගයේ අවසානයේ දී නැවත නැගිටීමක් සිදු වන බව බොහෝ යුදෙව්වෝ විශ්වාස කළහ (දානියෙල් 12 : 12). එහෙත් ඒ අවසාන යුගයට ප්‍රථම තේජසට නැවත නැගිටීමක් වූ කලි, කුරුසිපත් වූ මෙසියස්වහන්සේ මෙන්ම අපේක්ෂා නොකළ සිදුවීමකි. ජේසුස්වහන්සේ මෙම අදහස් පිළිබඳ උගන්වා තිබුණ ද (මතෙව් 16 : 21, 17 : 23, මාක් 9 : 9), ගෝලයෝ මෙය තේරුම් ගත්තේවත්, විශ්වාස කළේවත් නැත (10 පදය). ඔවුහු ජේසුස්වහන්සේ මළවුන් අතර සිටින්නේ යැයි බලාපොරොත්තු වූහ.

**නැවත නැගිටීමෙන් පසුව දර්ශනය වීම**

හිරු නැගීමට පළමුවෙන් මග්දලාහි මරියා සොහොන විවර වී ඇති බවත්, ශරීරය එහි නොමැති බවත් දුටුවා ය (යොහනු 20 : 1 - 2). අනෙක් කාන්තාවන් පැමිණි විට දේවදූතයෝ ගෝලයින්ට මේ බව දන්වන ලෙස ඔවුන්ට කීවෝ ය (මතෙව් 28 : 5 - 7, ලූක් 24 : 1 - 9). ගෝලයෝ සොහොනට ගොස් එය හිස්ව ඇති බව දුටුවෝ ය (යොහන් 20 : 3 - 10).

1. ජේසුස්වහන්සේ මග්දලාහි මරියාට පෙනුණු සේක (යොහන් 20 : 11 - 18).

2. ජේසුස්වහන්සේ කාන්තාවන් දෙදෙනෙකුට පෙනුණු සේක (මතෙව් 28 : 9 - 10).

3. ජේසුස්වහන්සේ එම්මාවුස්ට යන මාර්ගයේ දී මිනිසුන් දෙදෙනෙකුට පෙනුණු සේක

   (ලූක් 24 : 13 - 33).

4. සඳහනක් නොමැති ස්ථානයක දී ජේසුස්වහන්සේ පේදුරුට පෙනුණු සේක (34 පදය).

5. ජේසුස්වහන්සේ ගෝලයෝ 11 න් 10කට  පෙනුණු සේක (36 පදය, යොහන් 20 : 24).

6. සතියකට පසුව, ජේසුස්වහන්සේ තෝමස් සිටින අවස්ථාවේ දී පෙනුණු සේක

   (යොහන් 20 : 26 - 29).

7. පසුව ගලීලයේ මුහුද ළඟ දී ගෝලයෝ සත් දෙනෙක් ජේසුස්වහන්සේ දුටුහ (යොහන් 21 : 1 - 22).

8. ගලීලයේ කන්ද මුදුනේ දී එකොළොස් දෙනා ජේසුස්වහන්සේ හමු වූහ (මතෙව් 28 : 16 - 20).

9. ජේසුස්වහන්සේ තවත් වේලාවක දී ජාකොබ්ට පෙනුණු සේක (1 කොරින්ති 15 : 6).

10. සඳහනක් නොමැති ස්ථානයක දී ජේසුස්වහන්සේ 500 කට පෙනුණු සේක (7 පදය).

11. ස්වර්ගයට ඔසවාගනු ලැබීමට පෙර ජේසුස්වහන්සේ එකොළොස් දෙනාට පෙනුණු සේක (ක්‍රියා 1 : 6 - 11).

උපුටා ගැනිම : එමරර්හ ඍඟ ඡ්රරසිල *3 ඎරමජස්ක*_*ලමැඑසදබ්* '*ඉදමඑ ඡ්මිල* චචග 107-109ග

එහෙත් ජේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පාප රහිත පුත්‍රයා වූ සේක. මිනිසුන් බිලියනයක් අතර උන්වහන්සේ අද්විතිය අයෙකි. උන්වහන්සේ මරණය ලැබීමට සුදුසු කෙනෙක් නොවීය. උන්වහන්සේ උත්ථාන කරනු *නොලැබුවේ නම්* අපි මවිත විය යුතු වෙමු. ජේසුස්වහන්සේ මරණයෙන් නැවත නැගිටි බවට විශ්වාසවන්ත සාධක ද අපට තිබේ (අපගේ මී ළඟ සටහනෙන් එය ආවරණය කරන්නෙමු).

අපි බොහෝ දෙනෙකුට දෙවියන්වහන්සේ වැඩසිටින බවත්, ඇතැම් විට උන්වහන්සේ හාස්කම් කරන බවත්, ජේසුස්වහන්සේ ජීවමාන බව සහ ශුද්ධාත්මයාණන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟ තුළ ක්‍රියා කරන බව ඔප්පු කිරීමට අපගේම ජීවිතවල අත්දැකීම් ඇත.

**උත්ථාන වීමේ වැදගත්කම**

උත්ථානය යනු ජේසුස්වහන්සේ උදෙසා වූ ජීවිතයකි. එය වඩා හොඳ, උන්වහන්සේගේ මාංශවත් වීමට පෙර පියාණන්වහන්සේ සමඟ වූ මහිමතාවේ ජීවිතයකි (යොහන් 17 : 5). උන්වහන්සේගේ උත්ථානය තුළින් දෙවියන්වහන්ස්ගේ පුත්‍රයාණන් ලෙස උන්වහන්සේ බලයෙන් යුක්තව එළිදරව් කරනු ලැබූ සේක (රෝම 1 : 4). උන්වහන්සේ කවුරුන්ව සිටියේ ද යන්න උත්ථානය තුළින් ප්‍රකාශ විය. ක්‍රිස්තුන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ ලෝකය විනිශ්චය කරන්නට යන බව උත්ථානය තුළින් ඔප්පු වේ (ක්‍රියා 17 : 31).

එහෙත් උත්ථානය *අපට ද* ජීවනය ගෙන දෙන්නකි. පාවුල්තුමා පවසන ආකාරයට, "ක්‍රිස්තුන්වහන්සේගේ ජිවිතය නිසා ගැළවීම ලබමු" (රෝම 5 : 10). "දෙවියන්වහන්සේ උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ බව සිතින් අදහන්නෙහි නම් ඔබ ගළවනු ලබන්නෙහි ය" (රෝම 10 : 9). "ක්‍රිස්තුන්වහන්සේ උත්ථාන කරනු නොලැබූ සේක් නම් අපගේ දේශනා කිරීම නිරර්ථක ය. ඔබගේ ඇදහීමත් නිරර්ථක ය" (1 කොරින්ති 15 : 14). අපගේ ගැළවීම රඳා පවතින්නේ ජේසුස්වහන්සේගේ මරණය මත පමණක් නොව, උන්වහන්සේගේ උත්ථානය මත ද රඳා පවති (1 පේදුරු 3 : 21).

ධර්මිෂ්ඨ කරනු ලැබීමේ දී පවා, ජේසුස්වහන්සේගේ මරණය සමඟ බොහෝ විට සම්බන්ධ කරනු ලැබේ. එයත් උන්වහන්සේගේ උත්ථානයේ ප්‍රතිඵලයකි (රෝම 4 : 24 - 25). අපගේ ගැළවීම රඳා පවතින්නේ උන්වහන්සේගේ උපත, සේවය, මරණය සහ උත්ථානය යන මාංශවත් වීමේ සියලු අංග මත වේ.

අපගේ බෞතිස්මයෙන් ක්‍රිස්තුන්වහන්සේගේ මරණය සහ උත්ථානය සමඟ වූ අපගේ සහභාගිත්වය නිරූපණය වේ. වතුරෙන් නැගිටීම අපගේ නව ජිවිතය නිරූපණය කරයි (රෝම 6 : 4). එසේම අය අපගේ අනාගතය නිරූපණය කරයි. "උන්වහන්සේගේ උත්ථානය වැනි සිද්ධියකින් ද අපි උන්වහන්සේ හා සමඟ එක් වන්නෙමු" (5 පදය). "උන්වහන්සේ ප්‍රකාශ වන විට අපි උන්වහන්සේට සමාන වන බව දනිමු" (1 යොහන් 3 : 2). අපගේ උත්ථාන වූ ශරීර උන්වහන්සේගේ මෙන් වනු ඇත (1 කොරින්ති 15 : 42 - 49).

දෙවියන්වහන්සේ "ක්‍රිස්තුන්වහන්සේ සමඟ අප ජිවත් කළ සේක. ... ක්‍රිස්තුන් ජේසුස්වහන්සේ සමඟ අප උත්ථාන කළ ... සේක" (එපීස 2 : 5 - 6). අපි "ක්‍රිස්තුන්වහන්සේ සමඟ උත්ථාන කරනු ලැබ" ඇත (කොලොස්සි 2 : 12). ක්‍රිස්තුන්වහන්සේ තුළ වූ අපගේ ඇදහිල්ල තුළ අපි ආත්මිකව උන්වහන්සේට එකාබද්ධ කරනු ලැබ සිටිමු. අපගේ පාප උන්වහන්සේට දෙනු ලැබ, උන්වහන්සේ විසින් වන්දි ගෙවනු ලැබී ය. උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම සහ ජීවිතය අපට දී

ඇත. අපි උන්වහන්සේ සමඟ උන්වහන්සේගේ උත්ථානයෙන් සම්බන්ධ වන්නෙමු. "ක්‍රිස්තුන් ජේසුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ තැනැන්වහන්සේ ඔබ තුළ වසන ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන ඔබගේ මරණීය ශරීර ජීවමාන කරන සේක" (රෝම 8 : 11).උන්වහන්සේගේ උත්ථානය අපද නැවත ජීවත් වන බවට වූ පොරොන්දුවකි !

## ස්වර්ගාරෝහණය

ජේසුස්වහන්සේ උත්ථාන වූ පසුව, "උන්වහන්සේගේ මරණයෙන් පසු, සතලිස් දවසක් අතරතුර ඔවුන්ට දර්ශනය වෙමින් ද දෙවියන්වහන්සේගේ රාජ්‍ය ගැන දේශනා කරමින් ද බොහෝ නිසැක සාක්ෂිවලින් උන්වහන්සේ ජීවමානව ප්‍රකාශ වූ සේක" (ක්‍රියා 1 : 3). අවසාන දවසෙහි දී, "උන්වහන්සේ මෙසේ වදාරා ඔවුන් බලා සිටියදීම ඔසවාගනු ලැබ, වලාකුළකින් වැසී ඔවුන්ට නොපෙනී ගිය සේක" (9 පදය). උන්වහන්සේ අතුරුදන් වූයේ නැත. උන්වහන්සේ ස්වර්ගයට යන බවට වූ පෙනෙන්නා වූ සාධකයක් ඇතිව, උන්වහන්සේ ශාරීරිකව අහසට නැගුණු සේක. උත්ථානයට පසුව උන්වහන්සේගේ දර්ශනය වීම් අවසානයකට පත් විය (පසුව පාවුල්තුමාට උන්වහන්සේගේ දර්ශනය වීම අසාමාන්‍ය ය - 1 කොරින්ති 15 : 8).

ගෝලයෝ අහස දෙස බලා සිටිය දී දේවදූතයෝ දෙදෙනෙක් පෙනී, ජේසුස්වහන්සේ "ජේසුස්වහන්සේ ස්වර්ගයට නගිනු දුටු සේ ම ආපසු වඩිනු ඇතැයි" කීහ (ක්‍රියා 1 : 11). මේ කාලය තුළ දී ගෝලයෝ විසින් සිදු කළ යුතුව තිබුණේ කුමක් ද? ඔවුන් ශුද්ධාත්මයාණන්වහන්සේ ලබන තුරු ජෙරුසලමේ නැවතී සිටිය යුතු විය (4 පදය). ඉන්පසුව ඔවුන් ලෝකය පුරාම ජේසුස්වහන්සේගේ සාක්ෂිකාරයෝ විය යුතු විය (8 පදය). .ඔවුහු උන්වහන්සේ ජීවමාන බවත්, උන්වහන්සේ තුළින් ගැළවීම ලැබෙන බවටත් සාක්ෂි දුන්නෝ ය.

## දෙවියන්වහන්සේගේ දකුණු පස

ජේසුස්වහන්සේ නිකම්ම ස්වර්ගයට ගියේ නැත. "උන්වහන්සේ දෙවියන්වහන්සේගේ දකුණතින් උසස් කරනු ලැබූ" සේක (ක්‍රියා 2 : 33). "එම තැනැන්වහන්සේ නායකයාණන් ද ගැළවුම්කාරයන් ද වන පිණිස දෙවියන්වහන්සේ සිය දකුණතින් දකුණතට උසස් කර වදාළ සේක" (ක්‍රියා 5 : 31). "දකුණුපස සිටීම" යන්න "උසස් අධිකාරීත්වයක් ඇතුව සිටීම" යන අරුත් දෙයි. දෙවියන්වහන්සේට පමණක් දෙවැනි වූ, විශ්වයේ ඉතාම උසස් ස්ථානයට ජේසුස්වහන්සේ උසස් කරනු ලැබූ සේක (පිලිප්පි 2 : 9, 1 කොරින්ති 15 : 27). උන්වහන්සේ ස්වර්ගවලට වඩා උසස් කරනු ලැබ, සියලු දේවල උරුමක්කාරයාණන් කරනු ලැබූ සේක (හෙබ්‍රෙව් 7 : 27, 1 : 2).

පියාණන්වහන්සේගේ දකුණු පස ජේසුස්වහන්සේ සිටින බව බව ශුද්ධ ලියවිල්ල අවම වශයෙන් 12 වතාවක් සඳහන් කරයි. එයින් පහක් ගීතාවලිය 110 : 1 හි උපුටා දැක්වීම් වේ. "සමිඳාණෝ මා සමිඳුන්ට කතා කොට, මා නුඹේ සතුරන් නුඹේ පා යට ලන තෙක් මාගේ දකුණුපස අසුන් ගන්නැයි වදාළ සේක". මෙයින් නිරූපණය වන්නේ, සතුරන් මැඩපවත්වන අතර පවා, පියාණන්වහන්සේ යේසුන්වහන්සේට සිංහාසනයක් දෙන බවයි. දෙවියන්වහන්සේ සතුරන් බලාගන්නා සේක. ජේසුස්වහන්සේ උන්වහන්සේගේ අධිකාරීත්වයෙහි සුරක්ෂිතව සිටින සේක. "අසුන්ගන්න" යනුවෙන් භාවිත වන ලතින් වචනය ඇතැම් විට ක්‍රිස්තුන්වහන්සේ තමන් සිංහාසනයෙහි අසුන් ගෙන "කටයුතු කරන කාලය" යනුවෙන් හැඳින්වේ.

**මෙහෙය**

උන්වහන්සේ ස්වර්ගයෙහි බලයෙන් යුක්තව සිටින තත්වය භාවිත කරමින්, ජේසුස්වහන්සේ දිගටම අපගේ ගැළවීම උදෙසා වැඩ කරන සේක. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ අප වෙත එවන සේක (යොහන් 15 : 26, 16 : 7). එසේම ශුද්ධාත්මයාණන්වහන්සේ යේසුන්වහන්සේ පිළිබඳ සාක්ෂි දෙන සේක, උන්වහන්සේ ඉගැන්වූ දේ තේරුම්ගැනීමට අපට උපකාර කරන සේක (යොහන් 14 : 26, 15 : 26). පියාණන්වහන්සේ සහ පුත්‍රයාණන්වහන්සේ අප තුළ වැඩවාසය කරන ආකාරය නම් ශුද්ධාත්මයාණන්වහන්සේ ය (14 : 18, 23).

ජේසුස්වහන්සේ අපගේ මැදහත්කරුවාණන් වන සේක (1 යොහන් 2 : 1). උන්වහන්සේ "අප වෙනුවෙන් පියාණන්වහන්සේ වෙත" සිටින මැදහත්කරුවෙක් වන සේක. යමෙක් අපට චෝදනා කරන්නේ නම්, ජේසුස්වහන්සේගේ පූජාවෙන් අපගේ පාපයන් වසාගනු ලැබූ බව නිත්‍ය ලෙසම මතක් කිරීමට උන්වහන්සේ සිටින සේක. එම නිසා චෝදනා කිරීමෙන් වැඩක් නැත (රෝම 8 : 33 - 34). ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ල ඇති අයට නඩු තීන්දුවක් නැත (1 පදය).

චෝදනාවලින් අප ආරක්ෂා කිරීමටත්, අපට උපකාර කිරීමටත් ජීවමාන ජේසුස්වහන්සේ අප වෙනුවෙන් මැදහත්කාරකම් කරන සේක. "උන්වහන්සේ මඟින් දෙවියන්වහන්සේ වෙතට ළඟා වන්නන් සදහටම ගළවන්නට උන්වහන්සේට පිළිවන. මන්ද ඔවුන් උදෙසා මැදහත් වීමට උන්වහන්සේ සදහටම ජීවත් වන බැවිනි" (හෙබ්‍රෙව් 7 : 25). "උන්වහන්සේම පරීක්ෂා කරනු ලැබ දුක් වින්ද බැවින්, පරීක්ෂා කරනු ලබන්නන්ට සරණ වීමට උන්වහන්සේට පිළිවන" (හෙබ්‍රෙව් 2 : 18). අපගේ දුර්වලකම්වල දී උන්වහන්සේ දුක් වන සේක. අපගේ දුක් කරදරවල දී අපට අවශ්‍ය උපකාරය උන්වහන්සේ අපට ලබා දෙන බවට සහතික විය හැකි ය (හෙබ්‍රෙව් 4 : 15 - 16).

උන්වහන්සේ අප වෙනුවෙන් ජීවිතය පූජා කළ, අපට උපකාර කරන පිණිස දැන් ජීවමානව සිටින අපගේ උත්තම පූජකයා යයි හෙබ්‍රෙව් කතුවරයා පවසයි (හෙබ්‍රෙව් 2 : 17, 3 : 1). උන්වහන්සේගේ මරණය තුළින් අපගේ පාප කමා කර ඇති බැවින්, අපිට දෙවියන්වහන්සේ වෙත නිසැකකමින් ළඟා වීමට පුළුවන (හෙබ්‍රෙව් 10 : 19). "දෙවියන්වහන්සේ වෙත අපට උත්තම පූජකයෙක් සිටින නිසා" "අවංක සිතක් හා ඒකාන්ත ඇදහීමේ සහතිකය ද ඇතිව දෙවියන්වහන්සේ වෙත ළඟා වීමට" (22 පදය) ධෛර්ය දී ඇත.

ජේසුස්වහන්සේ ගැටලු විසඳමින් අප දෙවියන්වහන්සේ වෙත පමුණුවන අපගේ මැදහත්කරුවාණෝ වන සේක (1 තිමෝති 2 : 5). උන්වහන්සේ දෙවියන්වහන්සේ අපට ඉතා කැමැත්තෙන් සවන් දෙන බව සහතික කරමින්, ස්වර්ගයෙහි සිංහාසන කුටියට අපට මඟපෙන්වන සේක. මෙය ක්‍රිස්තුන් යේසුන්වහන්සේගේ නොකඩව සිදු කරන මෙහෙයෙහි කොටසකි.

ජේසුස්වහන්සේ අපගේ එඬේරාණෝ ද වන සේක (යොහන් 10 - 11, හෙබ්‍රෙව් 13 : 20). උන්වහන්සේ අපට ප්‍රේම කරමින්, අප ආරක්ෂා කරමින් අපට සපයන සේක. "ඔබගේ ජීවිතවල එඬේරා ද, භාරකාරයා ද" (1 පේදුරු 2 : 25) යනුවෙන් ජේසුස්වහන්සේට පැවසීමෙන් පේදුරුතුමා මේ සමාන චිත්‍රයක් අප මනසට ගෙන එයි. ජේසුස්වහන්සේ අප දෙස බලා සිටින සේක. අප වෙනුවෙන් තමාවම පූජා කළා වූ බැටළු පැටවාණන් කෙනෙකු මඟින් එඬේරෙක් මෙන් අප මඟපෙන්වනු ලබන බව එළිදරව් පොත කියයි (එළිදරව් 7 : 17). උන්වහන්සේ අපගේ අවශ්‍යතාවන් දන්නා බැවින්, ඒවා සපයන සේක.

ජේසුස්වහන්සේ සභාවේ හිස වන පිණිස දෙවියන්වහන්සේ විසින් පත් කරනු ලැබූ සේක (එපීස 1 : 22, 4 : 15). එසේම සභාව සියල්ලෙහි දී තම නායකත්වයට යටත් විය යුතු වේ (එපීස 5 : 24). හිස ලෙස උන්වහන්සේට සියල්ල කෙරෙහි අධිකාරී බලයක් ඇත (කොලොස්සි 1 : 18, 2 : 10). ජේසුස්වහන්සේට දැනටමත් ස්වර්ගයෙහි සහ පොළොවෙහි සියලු අධිකාරය ඇත (මතෙව් 28 : 18). සෑම බලයක් සහ අධිකාරයකටම ඉහළින් දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේ අසුන්ගන්වා ඇත (එපීස 1 : 20 - 22, කොලොස්සි 2 : 10).

ඇදහිල්ල තුළින්, අපි ක්‍රිස්තුන්වහන්සේ සමඟ උන්වහන්සේගේ මවිතකර චාරිකාවට හවුල් වන්නෙමු. අපි උන්වහන්සේ සමඟ කුරුසිපත් කර ඇත්තෙමු, උන්වහන්සේ සමඟ උත්ථාන කර ඇත්තෙමු, ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් අපි උන්වහන්සේ සමඟ සම්බන්ධ වී ඇත්තෙමු. අපි මහිමය ලැබ සදාකාලයටම උන්වහන්සේ සමඟ රජකම් කරන්නෙමුව (2 තිමෝති 2 : 11 - 12). ශුභාරංචිය විශ්වාස කරන්න !

මයිකල් මොරිසන්

# ගෝලත්වය 101

# ඒකකය 4 ආ



## ජේසුස්වහන්සේගේ උත්ථානය පිළිබඳ සාක්ෂි



කිතුනුවන්, යුදෙව්වන් සහ අදේවවාදීන් ජේසුස්වහන්සේ කුරුසිපත් කර, තැන්පත් කර ඇති බවට එකඟ වෙනවා. කිතුනුවන්ගේ ඉතා වැදගත්ම විශ්වාසය වන්නේ උන්වහන්සේ උත්ථාන වූ බවයි. එමගින් උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බවට, සත්‍යයේ ගුරුවරයාණන්, ගැළවීමේ මාර්ගයත්, දොරත්, උත්ථානයේ කුළුඳුලාණන් බවටත් වූ සාධකයකි. මෙහි උන්වහන්සේගේ උත්ථානයට සාක්ෂි දක්වා තිබේ :

පළමුවැන්න, මුල් ගෝලයෝ ජේසුස්වහන්සේ උත්ථාන වූ බව *විශ්වාස කළ* බවට බොහෝ ඉතිහාසඥයින් එකඟ වී තිබේ. ජේසුස්වහන්සේගේ මරණයේ දී ඔවුහු බියපත් වී සිටිය ද, ඉතා ඉක්මනින් ඔවුහු වෙනස් වූහ : ජේසුස්වහන්සේ පිළිබඳ කතා කිරීම උදෙසා ඔවුහු නිතරම තම ජීවිත අවදානමට යටත් කළහ. දෙවන සහ තුන්වන සියවස්වල කිතුනුවෝ පවා (එසේම වර්තමානයේ බොහෝ දෙනා), ජේසුස්වහන්සේ පිළිබඳ දේශනා කිරීමෙන් තම ජීවිත අවදානමට ලක් කළහ. ඇත්තෙන්ම අසත්‍ය අදහස් අධිකව ඇති අතර, එම අසත්‍ය අදහස් උදෙසා මනුෂ්‍යයෝ තම ජීවිත පූජා කරන්නේ ඒවා සත්‍ය බව ඔවුන් *සිතනවා* නම් පමණි. තමා විශ්වාස නොකරන දේවල් සම්බන්ධ මාර්ගයකට මනුෂ්‍යයෝ තමන්ගේ ජීවිත නොදෙති. ජේසුස්වහන්සේගේ උත්ථානය පිළිබඳ විශ්වාසය සම්බන්ධයෙන් ගෝලයෝ කිසි විට නොසැලුණහ. පීඩා විඳීමේ වේදනාව තුළ පවා ඔවුන්ගෙන් කිසිවෙක් තම කතාව වෙනස් කළේ නැත. ජේසුස්වහන්සේ උත්ථාන වූ බව ගෝලයෝ විශ්වාස කළා යැයි  ඥානවාදී ඉතිහසඥයින් පවා පිළිගෙන තිබේ.

දුසිම් ගණන් ගෝලයෝ මෙම විශ්වාසය ඇති කරගත්තේ කෙසේද යන්න පිළිබඳ අපි අවධානය යොමු කරමු. අපට අවධානය යොමු කළ හැකි සිදු විය හැකි පළමු දේ වන්නේ, ජේසුස්වහන්සේ සැබවින්ම මැරුණේ නැත යන්නයි. ඇතැම් විට කුරුසියේ සිටියේ උන්වහන්සේ නොවේ. යුදස් වැරදි පුද්ගලයෙකු හේවායින්ට හඳුන්වා දෙන්නට ඇත. කෙසේ හෝ අවසාන මොහොතේ වෙනත් පුද්ගයෙක් ආදේශකයක් ලෙස (මුස්ලිම්වරු විශ්වාස කරන පරිදි) යොදන්නට ඇත. කුරුසියේ සිටිය දී, කුරුසියෙන් ගෙන මෘත ශරීරය තැන්පත් කරන පිණිස ඔතන අවස්ථාවේ දී පවා ආදේශකයක් ලෙස වෙනත් අයෙක් සිටිනබව හඳුනා ගන්නට බැරි තරම් ගෝලයෝ වියවුල්ව සිටියෝ ද? සොහොන කෙසේ හෝ හිස් වීමත්, උන්වහන්සේ නැවත පෙනුණු බව ගෝලයෝ සිතීමත් එක විට සිදු විය හැකි දේවල් ද?

**තර්කයන් නැවත පිළියෙළ කිරීම**

ජේසුස්වහන්සේ උත්ථාන වූ බව ප්‍රකාශ කිරීමේ දී මනුෂ්‍යයින් ප්‍රතිචාර දැක්වූයේ කෙසේ ද? බොහෝ විට සියලු දෙනාගේම (ගෝලයෝ ඇතුළුව) ප්‍රධාන ප්‍රතිචාරය වන්නට ඇත්තේ "එය විකාරයක්" බවයි. ඉතා බරපතල ප්‍රතිචාරයක් මතෙව් 28 : 11 - 15 වාර්තා වී ඇත :

ස්ත්‍රීවරුන් මඟ යද්දී මුර සෙබළුන්ගෙන් සමහරෙක් නුවරට පැමිණ, ඒ මුළු සිද්ධිය නායක පූජකවරුන්ට දැන්වූහ. එවිට ඔවුහු ප්‍රජා මූලිකයන් හා සමඟ රැස්ව කුමන්ත්‍රණය කොට භේවායන්ට බොහෝ මුදල් දී, "අප රෑ නිදා සිටිය දී, ඔහුගේ ශ්‍රාවකයෝ අවුත්, ඔහු සොරාගෙන ගියහ"යි කියන්න. මේ බව ආණ්ඩුකාරයාට ආරංචි වුණොත්, අපි ඔහු කැමති කරවාගෙන ඔබ බේරා ගන්නෙමු"යි කීහ. ඔවුහු මුදල් රැගෙන තමන්ට ඉගැන්වූ ලෙස කළහ. මෙසේ ඒ කීම යුදෙව්වන් අතරේ ප්‍රසිද්ධ වී අද දක්වාත් පැවත එයි.

ඇතැම් විචාරකයෝ මතෙව්තුමා විසින් මෙම කොටස ගොතන ලද බවත්, එහෙත් ඒ සඳහා කතාව සංකීර්ණ වැඩි බවත් විශ්වාස කරති. එය තර්කයේ විවිධ මට්ටම් පෙන්නුම් කරන්නේ ය. එය හුදෙක් දුරස්තර මතකයක් නොවේ, එහෙත් එය ලියන ලද අවස්ථාවේ පැහැදිලි කරගත් කරුණක් වාර්තා කරන්නේ ය : මුරකරුවන් නිදා සිටින අවස්ථාවේ දී ගෝලයෝ මෘත ශරීරය සොරකම් කළ බවට අවිශ්වාසී යුදෙව්වෝ කියා සිටියහ.

එවන් වූ ප්‍රකාශයකට ප්‍රතිචාර දැක්වීමට මතෙව් තම ශුභාරංචියට මෙම කොටස ඇතුළත් කර ඇතැයි සිතන්නට පුළුවන. එසේම, එම ප්‍රකාශය ඉතා වටිනා නිෂ්ප්‍රභ කිරීමක් බව ඔහු තේරුම් ගන්නට ඇත. අවිශ්වාසී යුදෙව්වෝ ජේසුස්වහන්සේගේ සොහොන හිස්ව තිබූ බවට එකඟ වූ බව පෙනෙන්නේ ය. ජේසුස්වහන්සේ වෙන ස්ථානයක තැන්පත් කළ බවට හෝ ගෝලයෝ වැරදි සොහොනකට ගිය බවට හෝ චෝදනා නොකළහ.

තර්කයන් නැවත පිළියෙළ කිරීමට :

1. පළමුවැන්න, සොහොන හිස් බව ගෝලයෝ පැවසීම.

2. අවිශ්වාසී යුදෙව්වෝ එය ගෝලයෝ මෘත ශරීරය සොරකම් කළ නිසාවෙන් බව කීම.

3. විශ්වාස කළ අය මුරකරුවෙක් සිටි බැවින් අපට කළ නොහැකි වී යැයි කීම.

4. විශ්වාස නොකරන අය මුරකරුවා නිදා සිට විට ගෝලයෝ මෘත ශරීරය සොරකම් කළ බව (මුරකරුවෙක් සිටීම ප්‍රතික්ෂේප නොකර) කීම.

5. අවසන් වශයෙන්, එසේ කීමට මුරකරුවා අල්ලසක් ගත් බව මතෙව් වාර්තා කරයි.

| |
|---|
| මතෙවිතුමාගේ කාලයේ දී තිබුණා යැයි සැලකෙන මෙම තර්කය, සොහොන අසල මුරකරුවෙක් සිටි බවට විශ්වාස නොකරන යුදෙව්වන් කතා කළ බවට කල්පනා කළ හැකිය. මෙය උත්ථානය හුදෙක් ප්‍රතික්ෂේප කරන බොහෝ උත්සහායන් නොසලකා, විවිධ ආකාරයෙන් සාක්ෂි පැහැදිලි කිරීමට හේතු වේ. |
| |

නැත. මේ සියල්ල උපකල්පනයන් බොහෝ වූ බවත්, ඒ නිසාවෙන් මෙය බරපතල ලෙස නොසිතූ බවත් පෙන්නුම් කරයි.

එසේ නම්, සමහර විට ජේසුස්වහන්සේ කුරුසිය මත මැරුණේ නැති බවත්, උන්වහන්සේ සිහි නැති වී සිට පසුව පණ ආ බවත් කිව හැකි ය. මෙය ව්‍යාජ ලෙස ඓතිහාසිකව සිදු විය හැකි ද? රෝම හේවායින් කුරුසිපත් කර, තවමත් ජීවත් වනවාදැයි නොබලා ශරීරය බිමට ගනියි ද? මේ බරපතල තුවාල ලැබූ, සුව විය හැකි මිනිසෙක්, තමාගේ සොහොන් වස්ත්‍ර ඉවත් කර, තමාගේම සොහොන් ගල ඉවතට පෙරළා, ගෝලයින්ට තමා හොඳ ශරීර සෞඛ්‍යයෙන් පසුවන බවට පිළිගැන්විය හැකි ද? ඉන්පසුව දින 40කට පසු ඔහු නැවත කිසි දිනක නොදැක සිටිය හැකි ද? නැත. මෙය ඉතා අඥාන කාරණයකි.

ජේසුස්වහන්සේ නැවත පණගන්වන්නට සමහර විට ගෝලයෝ උපකාර කරන්නට ඇත. ඔවුහු ගල ඉවතට පෙරළූහ. ඔතා තිබූ ඇඳුම් ඉවත් කළහ. තුවාල බැන්ඳහ. තම නායකයා සොහොනෙන් ඉවත් කර ජීවත් කරවීමට කතාවක් කියන්නට ඇත. එම කතාව ඉක්මනින්ම උත්ථානය, විශ්මිත දර්ශනය වීම් සහිත ගෝලයෝ කිසි විට එක දිගට කියන්නට උත්සහා නොකළ දිග කතාන්දරයක් බවට පත් වන්නට ඇත. මෙය ඓතිහාසිකව විශ්වාස කළ නොහැකි දෙයක් පමණක් නොවන අතර, මෙයින් ගෝලයින් ප්‍රෝඩාකරුවන් සහ වංචාකරුවන් බවට පත් කරයි. අපි ඉහත සඳහන් කළ ආකාරයට, මනුෂ්‍යයෝ වැරදි යයි දන්නා දෙයකට තම ජීවිතය දෙන්නේ නැත. පළමුවන සියවසේ මුල් ඇදගත් (ස්ථාපිත කෙරුණු) ජේසුස්වහන්සේ මරණයෙන් උත්ථාන වූ බවට වූ ස්ථිර විශ්වාසය මත පදනම් වූ කිතුදහමේ නැගීමට විශ්වාස කළ හැකි පැහැදිලි කිරීමක් මෙයින් සපයන්නේ නැත. මෙම ඇදහිල්ල පළමුව ඉතා ඉක්මණින්ම කරුණු සොයා දැනගත හැකි යෙරුසලමෙහි පැතිර ගියේ ය!

ජේසුස්වහන්සේට කුරුසිපත් වීමෙන් බේරුණු බව ඓතිහාසිකව සිතිය හැකි දෙයක් නොවේ. එසේ නම්, ගෝලයින්ට උත්ථානය ගෙතිය හැකි දෙයක් ද? ඔවුහු මෘත ශරීරය සොරකම් කර, වෙනත් ස්ථානයක සඟවා තැබුවෝ ද? පසුව මුරකරුවන්ගේ කතාව සොයාගෙන ප්‍රත්‍යක්ෂ ලෙස උත්ථානය දේශනා කළෝ ද? මෙය කිසි තේරුමක් නැති දෙයකි. ජීවිතය සහ මරණය සම්බන්ධ ඔවුන් දන්නා සියලු කරුණුවලට ප්‍රතිවිරුද්ධව යමින්, එකල තිබූ සියලු ආගමික විශ්වාසයන්ට ප්‍රතිවිරුද්ධව, යුදෙව් සහ රෝමානු අධිකාරයන්ට ප්‍රතිවිරුද්ධව, ඔවුන්ගේ ජීවිත ඔවුන් ගෙතූ කතාව නිසා අවදානමට පත් කරමින්, ද්‍රෝහි ලෙස ඔවුන්ගෙන් කිසිවෙක් පාවා නොදී ඉතිහාසයේ ලොකුම බොරුව මෙම ධීවරයින් හට ගෙතිය නොහැකි ය. නැත. මොවුහු කුමන්ත්‍රණකාරී බොරුකාරයෝ නොවූහ. ඔවුන්ගේ කථාව සහ ක්‍රියාවන්ගෙන් එය මුළාවක් බව නොදැක්විණි. ඔවුන්ගේ හැසිරීම ඔවුන්ගේ පණිවුඩයට ගැළපුණේ ය.

මෙම කරුණෙහි තවත් රසවත් පැත්තක් වන හිස් වූ සොහොන සම්බන්ධ සෘජු නොවන සාක්ෂි නිරීක්ෂණය කළ යුතු ය. (එය හිස්ව නොතිබුණේ නම්, මෘත ශරීරය පෙන්වීමෙන් සම්පූර්ණ ප්‍රශ්නය යුදෙව් නායකයින් විසින් නතර කළ යුතුව තිබිණි). ශුභාරංචි කතාවලට අනුව, ගෝලයෝ සියලු දෙනාම හිස් වූ සොහොන පිළිබඳ සත්‍යතාව තහවුරු කර නොගත්හ. ඔවුන් ඒත්තු ගත්තේ ජේසුස්වහන්සේ දර්ශනය වීමෙන් පසුව පමණි. එසේම, ඔවුන් උත්ථානය දේශනා කළේ දර්ශනය වීමේ පදනම මත ය. ඔවුහු මෘත ශරීරය සොරකම් කිරීමට ගියෝ නම්, ඇත්තෙන්ම ඔවුන් විසින් තමාගේ සාක්ෂියේ කොටසක් වශයෙන් හිස් වූ සොහොන ගැන දේශනා කළ යුතුව තිබිණි. ඔවුහු එසේ නොකළහ. ඔවුන් වෙත වූ සාක්ෂිය වඩාම හොඳ සාක්ෂිය බවට ඔවුන් සිතූ බව පවසයි : එනම්, ජීවමාන ජේසුස්වහන්සේ ඇසින් දැක තිබීම ය.

ඔවුන්ගේ ඇදහිල්ලෙහි අව්‍යාජ බව පිළිබඳ වූ තවත් සෘජු නොවන සාක්ෂියක් ලෙස, ජේසුස්වහන්සේගේ හිස් වූ සොහොන සහ උත්ථාන වූ ක්‍රිස්තුන්වහන්සේ මුලින්ම දුටුවේ කාන්තාවන් බවට ශුභාරංචිවල ඇති වාර්තාවන් අපට නිරීක්ෂණය කළ හැකිය. කාන්තාවන්ගේ සාක්ෂිය එම සංස්කෘතියේ පිළිගත්තේ නැත. ගෝලයෝ කතාවක් ගෙතීමට උත්සහා කළෝ නම්, වැඩි ආධිපත්‍යයක් ඇති සාක්ෂිකරුවන් ඔවුන් විසින් සොයා ගත යුතුව තිබිණි. මෙම ධීවරයින් සාක්ෂි නිර්මාණය කිරීමට ඉතා දක්ෂ යයි කිව නොහැකි ය. එසේම දේශනා කිරීමට එතරම් නිර්භීත යයි කිව නොහැකි ය. ශුභාරංචි කතාන්තර යම් ආකාරයකට වෙනස් වීම සම්බන්ධ කරුණ කුමක් ද? මෙය අති විශාල කුමන්ත්‍රණයක් වුයේ නම්, සියලු දෙනාම පවසන දේවල් නියම ලෙසම එක සමාන බවට සහතික කළ නොහැකිව තිබිණි ද? වඩාම විශ්වාස කළ හැකි පැහැදිලි කිරීම වූ කලි, ජේසුස්වහන්සේ උත්ථාන වූ බව ගෝලයෝ විශ්වාස කිරීමත්, ඔවුන්ට මතක තිබූ ආකාරයට එය පැවසීමත් ය.

අපි දැන් තවත් කොටසකට අවධානය යොමු කරමු : සොහොන මංකොල්ල කෑ පිරිස (ධනවත් මනුෂ්‍යයෙකුගේ සොහොනේ වස්තුව බලාපොරොත්තුවෙන්) මුරකරුවන්ට වයින් දී ඔවුන් නිදාගැනීමට සැලැස්වීම. පසුව මංකොල්ලකරුවෝ මෘත ශරීරය රැගෙන කාන්තාරයට විසි කිරීම. මුරකරුවන්ට තමාගේ අසමත් වීම ආවරණය කිරීමටත්, ආගමික නායකයින්ගෙන් වන හිරිහැර දැනගෙන දේවදූතයෝ සහ උත්ථානය පිළිබඳ කතාවක් ගෙතුහ. පසුව ගෝලයින්ට වරද පැටවීමට අල්ලසක් ගත්හ. ඉන්පසුව ගෝලයෝ ජීවමාන ජේසුස්වහන්සේ පිළිබඳ මායාවකට පත් වූහ.

කෙසේ වෙතත්, ගෝලයෝ සියලු දෙනාම එකම මායාවක, බොහෝ කාලයක් පුරා, ඔවුන්ගේ අපේක්ෂාවන්ට ප්‍රතිවිරුද්ධව, ඔවුන්ගේ විශ්වාසයන්ට ප්‍රතිවිරුද්ධව සිටියෝ ද? මායාවකට කෑමට, බීමට, කතා කිරීමට හැකි ද? එසේම 40 දිනකට පසුව ක්ෂණිකව නතර වීමට හැකි ද? මායාවක් ක්‍රියා කරන්නේ මේ ආකාරයට නොවේ. සාක්ෂි මේ කල්පිතයට ද නොගැළපේ.

අපි තව එක් කරුණක් දෙස අවධානය යොමු කරමු. උත්ථාන වීමේ අදහස ආගමික රූපකයක් පමණි (ඇතැම් විට මෙය ආගමික අදහස් විස්තර කර තිබෙන දෘෂ්ටාන්ත කතාවල "මිථ්‍යාවක්" ලෙස විස්තර කර ඇත), එසේම කිතුදහම වසර 2,000 පමණ මෙය වචනාර්ථයෙන් ගෙන විශාල වරදක් කර ඇත. මෙම අදහසෙහි විශාල ගැටලු ප්‍රමාණයක් තිබේ. පළමුවැන්න, ශුභාරංචි මිථ්‍යා කතා රටාවකින් ලියවුණේ නැත. පළමුවැනි සියවසෙහි පවා උත්ථානය වචනාර්ථයෙන් තේරුම් ගත් බව පැහැදිලි වේ. එකල එම කතාවට සහයෝගය දක්වන හෝ එය වැරදි බව ඔප්පු කරන ජේසුස්වහන්සේ ඇසින් දුටු සාක්ෂිකරුවෝ සිටියහ. මිථ්‍යා කතාවක් ගොඩනැගීම සඳහා ප්‍රමාණවත් කාලයක් තිබුණේ නැත. බයිබලීය කතුවරයෝ

අපට ඉතිහාසය දක්වති : මා දුටුවේ මෙයයි. මා අදහස් කරන්නේ මෙයයි. ඔවුහු උත්ථානය මිථ්‍යාවක් යන අදහස ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කරති. ඔවුහු තමන් දුටු දේ ඉදිරිපත් කරති.

ගෝලයෝ රැවටුණේ නැත. ඔවුහු රැවටිලිකාරයෝ ද නොවූහ. ඔවුහු පැවසුවේ ඔවුහු විශ්වාස කළ දේ ය. ඔවුහු ජේසුස්වහන්සේ මැරී තැන්පත් කළ බවත්, උත්ථාන වූ බවත් විශ්වාස කළ බව පැහැදිලි වේ. ඔවුන් එසේ විශ්වාස කිරීමට හේතුව වූයේ එය ඔවුන්ගේම ඇස්වලින් දැකීම නිසා බව පැහැදිලි ය.

අනාදියේ පටන් වූ ජීවනයේ ධර්මයාණන් ගැන අපි ඔබට ලියමු. අපි උන්වහන්සේ කණින් ඇසීමු, අපේ ඇස්වලින් දුටිමු, දැක බලා, අපේ අත්වලින් ස්පර්ශ කළෙමු. මේ ජීවනය දෘශ්‍යමාන විය. අපි එය දැක, ඒ ගැන සාක්ෂි දරමින්, පියාණන්වහන්සේ සමඟ වැඩ විසූ, අපට දෘශ්‍යමාන කරන ලද සදාතන ජීවනය ඔබට ප්‍රකාශ කරමු. අප ඔබටත් ප්‍රකාශ කරන්නේ අප ඇසූ දුටු දේම ය. අප එසේ කරන්නේ පියාණන්වහන්සේ ද, උන්වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස් ක්‍රිස්තුන් වහන්සේ ද සමඟ පවත්නා අපේ පොදු ජීවිතයේ සහභාගිකමට ඔබත් පංගුකාර වන පිණිස ය (1 යොහන් 1 : 1 - 3).

ජේසුස්වහන්සේ මරණයෙන් උත්ථාන වූ බව ගෝලයෝ පැහැදිලිවම විශ්වාස කළෝ ය. ඔවුහු එය විශ්වාස කළේ මන් ද? වඩා පිළිගත හැකි පැහැදිලි කිරීම වන්නේ ඔවුන්ගේ සාක්ෂිය පිළිගැනීමයි. අනෙක් සියලු න්‍යායාන් වූ කලි, සත්‍යයෙන් බැහැර සහ ඓතිහාසිකව පදනම් වූ ඒවා නොවේ. අප ගළවාගැනීම පිණිස, මනුෂ්‍යත්වය සඳහා දෙවියන්වහන්සේගේ මැදහත් වීමේ අවශ්‍යතාවය, මනුෂ්‍යයින් උදෙසා තම ජීවිතය දෙන්නා වූ පැරණි ගිවිසුමේ දක්වා තිබෙන දුක් විඳින සේවකයා තේරුම් ගතහොත්, ගෝලයෝ ජේසුස්වහන්සේ උත්ථාන වූ බවට විශ්වාස කළ බව පැහැදිලි කෙරේ. මන්ද ජේසුස්වහන්සේම ඔවුන්ට පෙනී, තමා උත්ථාන වූ බව *කී සේක*. ඔවුන්ගේ විශ්වාසයෙහි ඒ ආකාර වෙනස් වීමක් සිදු වූයේ එබැවිනි. ප්‍රත්‍යක්ෂ ලෙස ඔවුන් දේශනා කළේ එබැවිනි. ලූක් පවසන ආකාරයට සාක්ෂි බැලීමෙන් අපට "උගන්වා ඇති කරුණුවල නියම සත්‍ය පහදාගත හැකි ය" (ලූක් 1 : 4).

මයිකල් මොරිසන්

# ගෝලත්වය 101

## ඒකකය 4 ඇ



උත්ථාන වූ ජේසුස්වහන්සේට අපි ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? හෙබ්‍රෙව් පොත අපට මෙසේ පවසයි: ජේසුස්වහන්සේ අපගේ උතුම් පූජකයා ලෙස ස්වර්ගයට නැගුණු බැවින්, අවංක සිතක් හා ඒකාන්ත ඇදහීමේ සහතිකය ද ඇතිව, දෙවියන්වහන්සේ වෙත ළඟා වෙමු (හෙබ්‍රෙව් 10 : 19 - 22).

"එබැවින්, අහස් මඬල ඉක්මවා ගිය දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් නම් ශ්‍රේෂ්ඨ උත්තම පූජකයෙකු අපට සිටින නිසා, අපි අපේ ඇදහිල්ලෙහි නොසෙල්වී පවතිමු. ... එබැවින් අපේ ඕනෑකම්වල දී අපේ සරණ සඳහා දයානුකම්පාව ලබන පිණිස බිය සැක නැතිව කරුණාවේ සිංහාසනය වෙත ළඟා වෙමු" (හෙබ්‍රෙව් 4 : 14 - 16). වෙනත් වචනවලින් කියතොත්, ජේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට සිටින බැවින්, අපි යාච්ඤා කළ යුතු අතර, එය නිසැකකමින් කළ යුතු වෙමු.

*යාච්ඤාව තුළින්* උත්ථාන වූ ජේසුස්වහන්සේ අපගේ ජීවිත වෙනස් කරන සේක. මන්ද උන්වහන්සේ දැන් ස්වර්ගයේ සිටින බැවින්, අපේ යාච්ඤාවන් අසනු ලබන බවට සහතිකයක් අපට ඇත. අප "ජේසුස්වහන්සේගේ නාමයෙන්" යාච්ඤා කරන්නෙමු. උන්වහන්සේ අප වෙනුවෙන් මැදහත්කම් කරන සේක. අප වෙනුවෙන් යාච්ඤා කරන සේක. ජේසුස්වහන්සේට සවන් දෙන ආකාරයෙන්ම දෙවියන්වහන්සේ අපට ද සවන් දෙන සේක.

යාච්ඤාව පිළිබඳ බොහෝ වැරදි සංකල්ප ඇත. යාච්ඤාව යනු කුමක්ද සහ අපි යාච්ඤා කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ පහත ලිපිය වඩා පැහැදිලි කරන්නේ ය.

## යාච්ඤාව : උපකාරය සඳහා හඬගැසීමක්

ඇතැම් මිනිස්සු යාච්ඤාව විශ්වාසවන්ත කිතුනුවන් විසින් කළ යුතු අනිවාර්ය කාර්යක් ලෙස දකිති. තවත් අය අපි දිනකට සත් වරක් හෝ තුන් වරක් හෝ යාච්ඤා කළ යුතු බව, නැතිනම් රාත්‍රිය පුරා යාච්ඤා කළ යුතු බව, නැතිනම් අලුයම කාලයෙහි හෝ ප්‍රසිද්ධ මනුෂ්‍යයෙක් ආදර්ශයට ගනිමින් අවම වශයෙන් දිනකට පැය දෙකක් හෝ යාච්ඤා කළ යුතු බව සිතති.



මා සිතන ආකාරයට කිතුනුවා යාච්ඤා කළ යුතු වන්නේ යුතුකමක් හෝ කාර්යක් ඉටු කිරීමක් ලෙස නොව, *අවශ්‍යතාවයක්* ලෙස ය. යාච්ඤාවන් වූ කලි, ඉල්ලීම් ය. නියමිත වේලාවල, නියමිත ආකාරයෙන් යාච්ඤා කළ යුතු බවට බයිබලයේ අපට අණ කර නැත. ජේසුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කරමින් රාත්‍රිය පුරාම හෝ දානියෙල් ආදර්ශයට ගෙන යෙරුසලම දෙසට හැරී හෝ යාච්ඤා කළ යුතු බව අපට කියා නැත.

එහෙත් ශුද්ධ ලියවිල්ලෙහි සෑම තැනම දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයින් යාච්ඤා කළ බව පෙන්වා දෙයි. අපි නියමිත වාර ගණනක් යාච්ඤා කළ යුතු බව නොව, සෑම විටම යාච්ඤා කළ යුතු බව (1 තෙසලෝනික 5 : 17, එපීස 6 : 18) දන්වා ඇත. අපි යාච්ඤා කරන විට දණ නැමීමට හෝ සිටගැනීමට හෝ පොළොවේ වැතිරීමට හෝ පවසා නැත. ඒ වෙනුවට, අපි යාච්ඤා කරන කල මේ සියල්ල කිරීමට පවසා ඇත (පිලිප්පි 4 : 6).

**මෙපමණ යාච්ඤාවන් මන් ද?**

යාච්ඤාව යනු, සරල වශයෙන් ඉල්ලීමකි. යාච්ඤාව යන්නට ඇති හෙබ්‍රෙව් සහ ග්‍රීක පදවල සාමාන්‍ය අර්ථය "ඉල්ලන්න" යන්න වේ. අපි දෙවියන්වහන්සේගෙන් කුමන හෝ දෙයක්, ඉල්ලන කල, අපි යාච්ඤා කරන්නෙමු. එසේ ඉල්ලීම නිවැරදි දෙයකි. තමන්ට අවශ්‍ය කුමන දේ වුව ද ඉල්ලන ලෙසට පාවුල්තුමා පිලිප්පිවරුන්ට කීවේ ය (පිලිප්පි 4 : 6).

අපි යාච්ඤා කළ යුතු වන්නේ ඒ නිසාවෙනි : අපි දෙවියන්වහන්සේගෙන් අවශ්‍ය දේවල් ඉල්ලිය යුතු වෙමු. අපි අප ගැන වඩා හොඳින් දන්නා තරමට, අපි ඉතා විශාල වශයෙන් අවශ්‍යතා ඇති අය බව අපට වඩා හොඳින් දැනෙයි. අපිටම කිසිත් කළ නොහැකි ය. අපට ප්‍රයෝජනවත් යමක් කරන්නට අවශ්‍ය නම්, දෙවියන්වහන්සේගේ උපකාරය සෙවිය යුතු වෙමු. අපි උන්වහන්සේ මත රැඳීම අවශ්‍ය වේ. යාච්ඤාව යනු, උපකාරය උදෙසා වූ හඬගැසීමකි. අපගේ අවශ්‍යතාවන් කෙළවර නොවන නිසා, අපගේ යාච්ඤාවන් ද නොකඩව කළ යුතු වේ.

**දෙවියන්වහන්සේ මත රැඳීම (විශ්වාසය තැබීම)**

තමා පිළිබඳවම විශ්වාස කිරීම පාපයකි. ඉතා කුඩා මැව්ලි වන අපි, අපට අවශ්‍ය ඕනෑම දෙයක් කිරීමට තමාට හැකි යයි සිතීම, අපගේ ඉරණම පාලනය කිරීමට හැකි බව සිතීම, වැරදි සහ නිවැරදි දෙය සම්බන්ධයෙන් අපටම තීරණය කළ හැකි යයි සිතීම අහංකාරකමකි. සත්‍යය වන්නේ මනුෂ්‍යයින්ට ප්‍රඥාව හෝ බලය නොමැති බවයි. විශ්වය පවතින්නේ ක්‍රිස්තුන්වහන්සේ තමාගේ වචනයේ බලයෙන් එය උසුලාගෙන සිටින බැවිනි (හෙබ්‍රෙව් 1 : 3). අප පවතින්නේ අපගේ මැවුම්කරුවාණන්වහන්සේ අපගේ අවශ්‍යතා සපුරාලන නිසාවෙනි (ක්‍රියා 14 : 17).

එසේ වුවත් (මා කතා කරන්නේ අත්දැකීමෙන්ය), මිනිත්තුවෙන් මිනිත්තුවට අපට දෙවියන්වහන්සේගේ උපකාරය අවශ්‍ය බව ඇදහිලිවන්තයෝ පවා ඇතැම් විට අමතක කරති. එසේම අප සිතන්නේවත් නැතිව දවස ඉතා අමාරුවෙන් ගත වුවත්, දෙවියන්වහන්සේ අප වෙනුවෙන් කරන දේ උදෙසා ස්තුතිවන්ත විය යුතුය. අපි උන්වහන්සේ ප්‍රතික්ෂේප කළ ද, උන්වහන්සේ අප උසුලාගෙන සිටින සේක.

අපි ප්‍රශ්නවලට මුහුණපාන විට පවා, අපගේ අවශ්‍යතාවන් සහ ආශාවන් දෙවියන්වහන්සේ සමඟ යාච්ඤාවෙන් බෙදා නොගෙන අපගේම ශක්තියෙන්, අපගේම ක්‍රමයට ප්‍රශ්න විසඳීමට

උත්සහා කිරීමෙන් ඇතැම් විට නිතර නිතර අරගල කරන්නෙමුව (පිලිප්පි 4 : 6). ඇත්තෙන්ම සියල්ල දෙවියන්වහන්සේ මත රැඳී තිබුණද, අපි ක්‍රියා කරන්නේ සියල්ල අප මත රැඳී ඇති ආකාරයටය. උන්වහන්සේ අපේ අවශ්‍යතාවන් දන්නා අතර, අපි උන්වහන්සේ විශ්වාස කිරීම උන්වහන්සේ අපේක්ෂා කරන සේක.

විශේෂයෙන්ම අප වෙනුවෙන් ඉල්ලීමට අපි නොදන්නා විට, ශුද්ධාත්මයාණන්වහන්සේ අප වෙනුවෙන් මැදහත්කම් කිරීම ගැන ස්තුතිවන්ත විය යුතුය (රෝම 8:26-27). ශුද්ධාත්මයාණන්වහන්සේ අතරමැද සිටගෙන අප නොදන්නා මාර්ග පිළිබඳ අපට උපකාර කරන සේක. අපි නිතර යාච්ඥා කිරීමට අසමත් වන විට, ශුද්ධාත්මයාණන්වහන්සේ අප වෙනුවෙන් එය කරන සේක. එසේ වුවත්, අපගේ සියලු යාච්ඥාවන් ශුද්ධාත්මයාණන්වහන්සේට යොමු කර, උන්වහන්සේට කතා කරන්නට ඉඩ හැර ජීවිතය නොදැනුවත්කමින් ගත කරන්නට අපට නුපුළුවන.

අපි යාච්ඥා කිරීම *අවශ්‍ය වේ.* දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි අප සිටින බව සිතෙහි තබා ගත් විට අපි සතුටින්, පීඩනයකින් තොරව, වඩා පූර්ණව සිටිය හැකිය. උන්වහන්සේ තුළ අපි ජීවත් වන්නෙමු. හැසිරෙන්නෙමු, පවතින්නෙමු (ක්‍රියා 17 : 28). අපි දෙවියන්වහන්සේ පිළිබඳ වඩා හොඳින් දැනගන්නා තරමට, අපට ජීවිතය පිළිබඳ වඩා හොඳින් අවබෝධ කරගත හැකිය. මන්ද අපට අවශ්‍ය වන ජීවිත රාමුව උන්වහන්සේ වන බැවිනි. අපි උන්වහන්සේගේ සන්දර්භයෙන් ජීවිත දකින කල, අපි එය නිරවද්‍ය ලෙස දකින්නෙමු.

දෙවියන්වහන්සේ අපගේ අවශ්‍ය සෑම පැතුමක්ම ඉටු කර දෙන බහිරවයෙක් නොවේ. අපිට ඇත්තෙන්ම අවශ්‍ය මොනවාදැයි අපි බොහෝ විට තේරුම් නොගන්නේ මේ නිසාවෙනි. අපි පරීක්ෂාවලින් බේරීමට යාච්ඥා කරන්නෙමු. එහෙත් දෙවියන්වහන්සේ එම පරීක්ෂාව තාවකාලික සැනසුමට වඩා වැදගත් යමක් අපට ඉගැන්වීම පිණිස භාවිත කරන සේක. අසල්වැසියෙක් ක්‍රිස්තුන්වහන්සේ වෙත පැමිණීම වෙනුවෙන් අපි යාච්ඥා කරනවා වෙන්නට පුළුවන (අපට එම ආශාව තිබිය යුතු වේ). එහෙත් මෙය නිවැරදි වේලාව නොවන බව දෙවියන්වහන්සේ දන්නා සේක. පුද්ගලයාගේ ජීවිතයට වඩා සම්බන්ධව සිටීම දෙවියන්වහන්සේගේ අවශ්‍යතාවය වීමට පුළුවන.

සෘජුවම, මේ ලෝකයේ දේවල් බොහොමයක් වැරදි වන බැවින්, අප උදෙසා, අපගේ සහාවන් උදෙසා, මේ ලෝකය උදෙසා අපට ආශාවන් තිබිය යුතු ය. අපි ඒ පිළිබඳ වැඩිපුර යාච්ඥා කළ යුතු ය.

යාච්ඥාව යනු, අපගේ උපකාරය උදෙසා වූ හඬගැසීමකි. අපට තනිවම කිසිවක් කළ නොහැකි බවත්, අපගේම ශක්තියෙන් කිසිවක් පාලනය කළ නොහැකි බවත් අපි යාච්ඥා කිරීමේදී ඒත්තු ගන්නෙමු. දෙවියන්වහන්සේ සහ අප අතර ඇති සම්බන්ධතාවය යාච්ඥාවෙන් අපි තේරුම් ගන්නෙමු. දෙවියන්වහන්සේ අපගේ අවශ්‍යතාවන් සපුරාලීමට පොරොන්දු වී ඇති බවත්, වඩාම හොඳ යයි උන්වහන්සේ දන්නා ආකාරයට අපට ආශිර්වාද කරන බවත් ඒත්තු ගන්නෙමු. යාච්ඥාව නමස්කාරයේ ක්‍රියාවකි. එයින් දෙවියන්වහන්සේට බලය ඇති බවත්, උන්වහන්සේ මත රැඳිය හැකි විශ්වාසවන්ත අයෙක් බවත් පෙන්නුම් කෙරේ.

**ස්තුති දීම**

දෙවියන්වහන්සේ අපගේ අවශ්‍යතා සපයන සේක. එසේ කිරීම නිසාවෙන් උන්වහන්සේට අපි ස්තුති කිරීම සුදුසු ය. අපි ගන්නා සැම හුස්මක්ම උන්වහන්සේගෙන් අප ලද ත්‍යාගයක් වේ. ස්වභාව ධර්මයෙහි සියලු අලංකාරය උන්වහන්සේගේ ත්‍යාගයක් වේ. අපිට පෙනෙන දේ, ශබ්ද, දැනෙන සුවඳ සහ ස්වභාව දහමේ රටාවන් උන්වහන්සේගෙන් ලද ත්‍යාගයන් වේ. දෙවියන්වහන්සේ සමඟ අපගේ සංවාදයන්වලට ඉල්ලීම් මෙන්ම ස්තුති දීම ද ඇතුළත් විය යුතු වේ. මෙය සියලු යහපත් දෙය ලබා දෙන්නේ උන්වහන්සේ බව හඟවන ප්‍රශංසාවේ ක්‍රමයකි.

අපි දෙවියන්වහන්සේට ස්තුති කරන කල, විශ්වයේ අපට ඇති ස්ථානය අපි මතක් කරගන්නෙමු. දෙවියන්වහන්සේගේ දයාවන්තකමේ හේතුවක් ලෙස උතුම් ස්ථානයක් සහ උන්වහන්සේගේ අනුග්‍රහය මත රැඳීමේ ස්ථානය තේරුම් ගන්නෙමු. ස්තුති දීම අපි කවුරුන්ද සහ අපි පවතින්නේ මන්ද යන්න දැනගැනීමේ මාර්ගයකි. විශ්වය ක්‍රියා කරන්නේ උන්වහන්සේගේ ත්‍යාගයක් ලෙස බව අපට මතක් කර දෙන්නේ ය.

සමහරු මෙසේ පවසති : "මා දැනටමත් එය දන්නවා. එය දිගටම කියන්නේ ඇයි?" අපගේ මනසට සැබවින්ම එය දැනෙන්නේ එය කීමෙන් පමණක් බව මා සිතනවා. අපටම නොදැනීම දවස් ඉතා පහසුවෙන් ගත කළ හැකි වන්නේ ජීවිතය ක්‍රියාව උතුම් ත්‍යාගයක් ලෙස මතකයේ රඳවා ගැනීමෙනි. ස්තුති දීමට බයිබලිය අණපනත්වලින් අපට පවසයි. නොකඩව අපගේ යාච්ඤාවලින් දෙවියන්වහන්සේට ස්තුති දීමට කියයි (1 තෙසලෝනික 5 : 17 -18).

මෙයට සමාන ලෙසම බයිබලය එකම ඉල්ලීම නැවත නැවත දක්වමින් ධෛර්යමත්ව යාච්ඤා කරන්නට පවසයි. පළමු වතාවේම දෙවියන්වහන්සේ එය ඇසූ බව අපි ඇදහිල්ලෙන් දනිමු. අපගේ ධෛර්යයෙන් තොරව පවා ඇති අපගේ උනන්දුව උන්වහන්සේ දන්නා සේක. එම නිසා ධෛර්යවන්තව යාච්ඤා කිරීම උදෙසා වූ උන්වහන්සේගේ අණ අපගේම යහපත සඳහා බව අවධාරණයෙන් කියමි. අපගේ හදවතේ ඇති ආශාවන් මොනවාද යන්න අපටම නැවත නැවත කීම අවශ්‍ය වේ.

යාච්ඤාව යනු හුදෙක් අපටම කතා කරගැනීමක් බව මින් අදහස් නොවන අතර, පරම සත්‍ය පිළිබඳ අපට මතක් කරදීමක් ද නොවේ. යාච්ඤාව යනු දෙවියන්වහන්සේ සමඟ වූ පිවිතුරු සංවාදයක් බව කිසිම ශුද්ධ ලියවිල්ලක් සහතික නොකරයි. අපගේ ඉල්ලීම් සැබවින්ම ස්වර්ගයට යන අතර, දෙවියන්වහන්සේ විසින් අසනු ලැබ පිළිතුරු ලැබෙන්නේ ය. අපගේ ස්තුති දීම් සැබවින්ම දෙවියන්වහන්සේ වෙත යන්නේය යන රූපණය තුළ අපි දෙවියන්වහන්සේ දැකිය යුතු වෙමු. බොහෝ විට, දෙවියන්වහන්සේ යාච්ඤාව තුළින් අපට කතා කරන්නේ අප උන්වහන්සේ තුළ සිතිය යුතු, දැකිය යුතු දේ පිළිබඳ දැනගැන්මේ වර්ධනය වන විටය.

දෙවියන්වහන්සේ අපට දිනපතා කරන දේවල් නිසා කියා නිම කළ නොහැකි ස්තුති දීම් අපට ඇත්තේ ය. අපගේ අනාගතය උදෙසා උන්වහන්සේ දී ඇති පොරොන්දු ගැන ස්තුති දීම, දැනටමත් අපගේ අනාගතය සුරක්ෂිත කිරීම පිණිස ක්‍රිස්තුන්වහන්සේ තුළ උන්වහන්සේ කර ඇති දෙයට ස්තුති දීම. යේසුන් ක්‍රිස්තුන්වහන්සේට වූ අපගේ ස්තුතිවන්තකම දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට අප ස්වභාවිකවම යොමු කරයි. අපට මෙතරම් ප්‍රේම කරන තැනැන්වහන්සේට විශ්වාසවන්තව ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය වේ.

අපගේ පැවැත්ම, අපගේ ප්‍රීතිය, අපගේ සතුට, අපගේ සිහිය යන සියල්ල යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ අපට දිනපතා දක්වන්නා වූ කරුණාව මත රඳා පවතී. ඇත්තෙන්ම අපිට ස්තුතිවන්ත වීමට බොහෝ දේ තිබේ. අපට ඇති සියල්ල සහ අපි ලබාගැනීමට බලාපොරොත්තු වන සියල්ල ත්‍යාගයන් වන නිසා අපි ස්තුතිවන්ත විය යුතු වේ.

දෙවියන්වහන්සේ කවුරුන්ද යන්න උදෙසා ඇගයීමක් අපගේ යාච්ඤාවල ඇතුළත් විය යුතුය. එසේම ස්තුති දීම සහ ප්‍රශංසාව අපගේ යාච්ඤාවට ඇතුළත් විය යුතුය. අපි උන්වහන්සේගේ බලය, උන්වහන්සේගේ ප්‍රඥාව, උන්වහන්සේගේ කරුණාව, උන්වහන්සේගේ ප්‍රේමයේ අලංකාරත්වය උසස් කරන්නෙමු. උන්වහන්සේ අපට දෙන දේවල්වලට පමණක් නොව, උන්වහන්සේ කවුරුන්ද යන්න ගැන අපි උන්වහන්සේට ප්‍රශංසා කරන්නෙමු. උන්වහන්සේ ඇත්තෙන්ම තමන්වහන්සේම අපට දෙන සේක.

**උපකාරය උදෙසා මාගේ හඬගැසීම**

අවසාන වශයෙන්, මාගේ මිත්‍රවරුනි, ඔබගේ ප්‍රාදේශිය සභාව උදෙසා යාච්ඤා කරන මෙන් ඉල්ලමි. ඔබගේ ප්‍රජාවෙහි දේවරාජ්‍යයෙහි වෙනසක් ඇති කරවීම උදෙසා ඔබගේ සෙනඟට එය දෙවියන්වහන්සේගේ ශක්තිය ලබා දෙන්නේ ය. එකට වැඩ කිරීමට සහ කළ නොහැකි දේ සම්බන්ධයෙන් ඔබට දිව්‍යමය උපකාරය අවශ්‍ය වේ. ඔබ යාච්ඤා කිරීමට අවශ්‍යයි. ඔබගේ ප්‍රාදේශිය නායකයින් උදෙසා ද යාච්ඤා කරන්න. නමස්කාරය, සංගීතය මෙහෙයවන අයට දිව්‍යමය ආශිර්වාදය අවශ්‍ය වේ. කතා කරන අය දෙවියන්වහන්සේගේ වචන කතා කළ යුතු වේ (1 පේදුරු 4 : 11). මෙය මනුෂ්‍ය ප්‍රඥාවෙන් කළ නොහැකි දෙයකි.

මා උදෙසා ද යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේ මට දුන් කාර්ය ඉටු කිරීමට තලෙන්තවලින් පූර්ණ අයට පවා නොහැකි වී ඇත. මට දිව්‍යමට උපකාරය අවශ්‍ය වේ. මම ඒ උදෙසා යාච්ඤා කරමි. මට එය ලැබෙන්නේ ය. පාවුල්තුමා තමාගේ සහාවන්ට ඔහු උදෙසා යාච්ඤා කිරීමට ඉල්ලුවා සේ (කොලොස්සි 4 : 2 - 3, ආදිය) මා උදෙසා යාච්ඤා කරන මෙන් මම ඔබෙන් ඉල්ලමි. මා පෞද්ගලිකව මුහුණ දෙන අමාරුකම්, සභාවෙහි සේවයෙහි දී මා මුහුණ දෙන අමාරුකම්වලින් මට දෙවියන්වහන්සේගේ උපකාරය අවශ්‍ය බව හැඟවේ. අප සියල්ලන්ට දෙවියන්වහන්සේගේ උපකාරය අවශ්‍ය වේ. අප සියල්ලන්ට යාච්ඤාව අවශ්‍ය වේ.

## ශෝලත්වය 101

## ඒකකය 5 අ



# ශුද්ධාත්මයාණන්වහන්සේ



ශුද්ධාත්මයාණන්වහන්සේ යනු මවන, කතා කරන, අප වෙනස් කරන - අප තුළ සිටින, අප තුළ ක්‍රියා කරන දෙවියන්වහන්සේ වන සේක. අපගේ දැනුමෙන් තොරව ශුද්ධාත්මයාණන්වහන්සේට මෙම දේවල් කළ හැකි වුවත්, අප මේ ගැන වැඩිපුර දැනගැනීම උපකාරයක් වේ.

**ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේය**

ශුද්ධාත්මයාණන්වහන්සේට දෙවියන්වහන්සේගේ චරිත ගුණාංග ඇත. දෙවියන්වහන්සේ සහ සමාන වන සේක. දෙවියන්වහන්සේ කරන දේ පමණක් කරන සේක. දෙවියන්වහන්සේ මෙන්, ආත්මයාණන්වහන්සේ ද ශුද්ධ ය. ඉතාම ශුද්ධ වූ ආත්මයාණන්වහන්සේට නින්දා කිරීම දෙවියන්වහන්ගේ පුත්‍රයාණන්වහන්සේ පයින් පාගා දැමීමට සමාන (හෙබ්‍රෙව් 10 : 29) පාපයක් වේ. ශුද්ධාත්මයාණන්වහන්සේට විරුද්ධව අවමන් කිරීම සමාව දිය නොහැකි පාපයකි (මතෙව් 12 : 32). මෙයින් දැක්වෙන්නේ ශුද්ධ බවට පත් කළ දේව මාලිගාව මෙන් නොව, ස්වභාවයෙන්ම ආත්මයාණන්වහන්සේ ශුද්ධ බව ය.

දෙවියන්වහන්සේ මෙන්ම, ශුද්ධාත්මයාණන්වහන්සේ ද සදාකාලිකය (හෙබ්‍රෙව් 9 : 14). දෙවියන්වහන්සේ මෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ ද සැම තැනම වැඩවාසය කරන සේක (ගීතාවලිය 139 : 7 - 9). දෙවියන්වහන්සේ මෙන්ම ශුද්ධාත්මයාණන්වහන්සේ ද සියල්ල දන්නා සේක (1 කොරින්ති 2 : 10 - 11, යොහන් 14 : 26). ශුද්ධාත්මයාණන්වහන්සේ මවන සේක (යෝබ් 33 : 4, ගීතාවලිය 104 : 30). එසේම හාස්කම් කිරීමට බලය පවරන සේක (මතෙව් 12 : 28, රෝම 15 : 18 - 19).

පියාණන්වහන්සේ, පුත්‍රයාණන්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ දේවත්වයෙන් එක සමාන බව බොහෝ කොටස් පැහැදිලි කරයි. ආත්මික දීමනා පිළිබඳ පාවුල්තුමාගේ සාකච්ජාවේ ශුද්ධාත්මයාණන්වහන්සේ, ස්වාමීන්වහන්සේ සහ දෙවියන්වහන්සේ සමාන්තර තත්වයෙහි තබා පාවුල්තුමා කතා කරයි (1 කොරින්ති 12: 4 - 6). ඔහු කොටස් තුනක යාච්ඤාවකින් ලිපියක් අවසාන කරයි (2 කොරින්ති 13:14). පේදුරුතුමා විවිධ වූ කොටස් තුනක වචන මාලාවකින් ලිපිය ආරම්භ කරයි (1 පේදුරු 1:2). මේවා ඒකත්වය ඔප්පු කිරීමක් නොවන නමුත්, එයට උපකාරයක් සපයයි.

බෞතිස්මය පිළිබඳ වචන මාලාවේ ඒකත්වය පිළිබඳ ප්‍රබල පෙන්නුම් කිරීමක් ඇත. "පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන්" (ඒක වචන) (මතෙව් 28:19). පැවැත්මෙහි එකම ස්වභාවය දක්වමින් තිදෙනාටම එක නමක් ඇත.

ශුද්ධාත්මයාණන්වහන්සේ යමක් කරන විට, එය දෙවියන්වහන්සේ කරන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ කතා කරන විට, දෙවියන්වහන්සේ කතා කරන සේක. අනනියස් ශුද්ධාත්මයාණන්වහන්සේට බොරු කී විට, ඔහු දෙවියන්වහන්සේට බොරු කීවේ ය (ක්‍රියා 5: 3-4). පේදුරුතුමා කී ලෙස, අනනියස් බොරු කීවේ දෙවියන්වහන්සේගේ නියෝජිතයන්ට නොව, දෙවියන්වහන්සේට ය. පෞද්ගලිකත්වයෙන් තොර බලයකට මනුෂ්‍යයෝ "බොරු" නොකියති.

කිතුනුවන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගාව බව පාවුල්තුමා එක් කොටසක පවසයි (1 කොරින්ති 6:19). තවත් ස්ථානයක අපි දෙවියන්වහන්සේගේ මාලිගාව බව ඔහු පවසයි (1 කොරින්ති 3:16). මාලිගාවක් තිබෙන්නේ දිව්‍යමය තැනැත්තෙකුට නමස්කාර කිරීම පිණිස මිස, මනුෂ්‍යයෙකු නොවන බලයකට නමස්කාර කිරීමට නොවේ. පාවුල්තුමා "ශුද්ධාත්මයාණණ්වහන්සේගේ මාලිගාව" යනුවෙන් ලිවීමේ දී, ශුද්ධාත්මයාණන්වහන්සේ යනු දෙවියන්වහන්සේ බව ඔහු අදහස් කරයි.

ශුද්ධාත්මයාණන්වහන්සේ සහ දෙවියන්වහන්සේ එකම බව ක්‍රියා 13:2 හි දැක්වේ: "ශුද්ධාත්මයාණන්වහන්සේ කතා කොට, "මා විසින් බාර්ණබස් ද සාවුල් ද කැඳවනු ලැබූ සේවය සඳහා ඔවුන් මට වෙන් කරන්නැ"යි වදාළ සේක". මෙම පදයෙහි, ශුද්ධාත්මයාණන්වහන්සේ පුද්ගලභාවයෙන්, දෙවියන්වහන්සේ ලෙස කතා කරන සේක. එයට සමානව, ශුද්ධාත්මයාණන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන් "මා සෝදිසි කිරීමෙන් පරීක්ෂා කළ" බව පවසන සේක. "ඔවුහු මාගේ විශ්‍රාමස්ථානයට ඇතුළු නොවන්නෝ යයි මාගේ උදහසෙන් දිවුළෙමි" යයි ශුද්ධාත්මයාණන්වහන්සේ පවසන සේක (හෙබ්‍රෙව් 3 : 7 - 11).

එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේ යන්න දෙවියන්වහන්සේගේ තවත් නමක් නොවේ. යේසුන්වහන්සේගේ බෞතිස්මයේ දී පෙන්නුම් කළ පරිදි (මතෙව් 3:16-17), ශුද්ධාත්මයාණන්වහන්සේ පියාණන් සහ පුත්‍රයාණන්ගෙන් වෙනස් වන සේක. තුන්දෙනාම වෙනස් වන නමුත් එක් කෙනෙක් වන සේක.

ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ ජීවිතවල දෙවියන්වහන්සේගේ කාර්ය කරන සේක. අපි දෙවියන්වහන්සේගෙන් උපත ලබා ඇත්තෙමු (යොහන් 1 : 12). එය ශුද්ධාත්මයාණන්ගෙන් උපත ලබනවා හා සමාන වේ (යොහන් 3 : 5). දෙවියන්වහන්සේ අප තුළ ජීවත් වන බව ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් හැඟවේ (එපිස 2 : 22, 1 යොහන් 3 : 24, 4 : 13). ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ ජීවත් වන සේක (රෝම 8 : 11, 1 කොරින්ති 3 : 16). ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ ජීවත් වන නිසා, දෙවියන්වහන්සේ අප තුළ ජීවත් වන බව අපට කිව හැකි ය.

**ආත්මය පුද්ගලභාවයක් වේ**

ශුද්ධාත්මයාණන්වහන්සේට පෞද්ගලික චරිත ලක්ෂණ ඇති බව ශුද්ධ ලියවිල්ල විස්තර කරන්නේ ය.

- ශුද්ධාත්මයාණන්වහන්සේ ජීවත් වන සේක (රෝම 8 : 11, 1 කොරින්ති 3 : 16).
- ශුද්ධාත්මයාණන්වහන්සේ කතා කරන සේක (ක්‍රියා 8 : 29, 10 : 19, 11 : 12, 21 : 11, 1 තිමෝති 4 : 1, හෙබ්‍රෙව් 3 : 7 ආදිය).
- ශුද්ධාත්මයාණන්වහන්සේ ඇතැම් විට "මම" යන සර්වනාමය භාවිත කරන සේක (ක්‍රියා 10 : 20, 13 : 2).
- ශුද්ධාත්මයාණන්වහන්සේට කතා කිරීමට, පරීක්ෂා කිරීමට, දුක් දීමට, අපහාස කිරීමට හෝ වරද තැබීමට අපට පුළුවන (ක්‍රියා 5 : 3, 9, එපීස 4 : 30, හෙබ්‍රෙව් 10 : 29, මතෙව් 12 : 31).
- ශුද්ධාත්මයාණන්වහන්සේ මඟ පෙන්වන සේක, මැදහත්කම් කරන සේක, කැඳවන සේක, ආලේප කරන සේක (රෝම 8: 14, 26, ක්‍රියා 13 : 2, 20 : 28).

රෝම 8:27 පදයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ "මනස" පිළිබඳ දක්වා ඇත. උන්වහන්සේ විනිශ්චය කරන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේට "යහපත් යයි පෙනෙන" තීරණ ගන්නා සේක (ක්‍රියා 15 : 28). ශුද්ධාත්මයාණන්වහන්සේ "දන්නා" සේක. එසේම "තීරණය" කරන සේක (1 කොරින්ති 2 : 11, 12 : 11). මෙය පුද්ගලභාවයෙන් තොර බලයක් නොවේ.

යේසුන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ සැනසිලිදායකයාණන්, විනිශ්චයකරුවාණන් හෝ උපදේශකයාණන් ලෙස පරිවර්තනය වී ඇති *පරාක්ලේටොස්* (*පිරිනකැළිදි-* යනුවෙන් හැඳින්වූ සේක. "එවිට මම පියාණන්වහන්සේගෙන් අයදින්නෙමි. උන්වහන්සේ ද ඔබ සමඟ සදහටම සිටින පිණිස වෙන සහායදායකයෙකු දෙන සේක. ඒ සහායදායකයාණෝ සත්‍යතාවේ ආත්මයාණෝය" (යොහන් 14 : 16 -17). යේසුන්වහන්සේ මෙන්ම, ගෝලයින්ගේ පළමුවන උපදේශකයාණෝ වූ ශුද්ධාත්මයාණන්වහන්සේ උගන්වන සේක, සාක්ෂි දෙන සේක, වැරදි හඟවන සේක, මඟ පෙන්වන සේක, සත්‍යය එළිදරව් කරන සේක (යොහන් 14 : 26, 15 : 26, 16 : 8, 13 - 14). මේවා පුද්ගලයෙකුගේ භූමිකා වේ.

යොහන්තුමා පරාක්ලේටොස් යන පුරුෂලිංග පදය භාවිත කරයි. එය නපුංසකලිංග පදයක් බවට පත් කිරීම අවශ්‍ය නැත. යොහන් 16 : 14 පදයෙහි පුරුෂලිංග සර්වනාමය (ඔහු) යන්න " ශුද්ධාත්මයාණන්වහන්සේ" යන නපුංසක ලිංග පදයට පසුව පවා යොදා ඇත. පහසුවෙන්ම නපුංසකලිංග සර්වනාමය (එය) භාවිත කළ හැකිව තිබුණ ද යොහන්තුමා එසේ නොකරයි. ශුද්ධාත්මයාණන්වහන්සේ *ඔහු* ලෙස හැඳින්විය හැකිය. කෙසේ වෙතත්, ව්‍යාකරණ පරස්පරය වැදගත් වන්නේ නැත. වැදගත් වන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ වෙත පුද්ගල චරිත ලක්ෂණ ඇති බවයි. උන්වහන්සේ පුද්ගලත්වයෙන් තොර බලයක් නොවන සේක. උන්වහන්සේ අප තුළ වාසය කරන බුද්ධිමත් සහ දිව්‍යමය උපකාරකරුවෙකු වන සේක.

## පැරණි ගිවිසුම තුළ ආත්මයාණන්වහන්සේ

බයිබලයෙහි "ශුද්ධාත්මයාණන්වහන්සේ" යනුවෙන් ඇති මාතෘකා සහිත ස්ථාන නැත. ශුද්ධ ලියවිල්ල ශුද්ධාත්මයාණන්වහන්සේ කරන දේ කුමක්ද යන්න පිළිබඳ තැනින් තැන සුළු වශයෙන් දක්වා ඇති දෙයින් අපි ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන ඉගෙන ගන්නෙමු. පැරණි ගිවිසුමේ මේ පිළිබඳ දක්වන්නේ මඳ වශයෙනි.

මැවීමේ සහ සියලු ජීවිත තිරසාර කිරීමේ කාර්යට ශුද්ධාත්මයාණන්වහන්සේ සහභාගි වී ඇත (උත්පත්ති 1 : 2, යෝබ් 33 : 4, 34 : 14). දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ මණ්ඩපය ගොඩනැගීම සඳහා කුසලතාවයෙන් බෙශලෙල් පූර්ණ කළ සේක (නික්මයාම 31:3-5). උන්වහන්සේ මෝසෙස් පූර්ණ කර නායකයින් 70 දෙනා මත වැඩිය සේක (ගණන් කතාව 11 : 25). උන්වහන්සේ යොෂුවා ප්‍රඥාවෙන් ද, සැම්සොන් වැනි නායකයින් ශක්තියෙන් නොඑසේ නම්, සටන් කිරීමේ හැකියාවෙන් පූර්ණ කළ සේක (ද්විතිය නීති 34 : 9, විනිශ්චයකාරයා 6 : 34, 14 : 6).

දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ සාවුල්ට දෙනු ලැබ පසුව නැවත ගත් සේක (1 සාමුවෙල් 10 : 6, 16 : 14). ආත්මයාණන්වහන්සේ දාවිත්ට දේව මාලිගාවේ සැලසුම් ගෙන දුන්සේක (1 වංශාවලිය 28 : 12). ආත්මයාණන්වහන්සේ කතා කිරීම පිණිස ප්‍රොපේතවරුන් ආලේප කළ සේක (ගණන් කතාව 24 : 2, 2 සාමුවෙල් 23 : 2, 1 වංශාවලිය 12 : 18, 2 වංශාවලිය 15 : 1, 20 : 14, එසකියෙල් 11 : 9, සෙකරියා 7 - 12, 2 පේදුරු 1 : 21).

ආත්මයාණන්වහන්සේ නව ගිවිසුමෙහි ද එලිසබෙත්, සෙකරියා සහ සීමොන් (ලූක් 1 : 41, 67, 2 : 25-32) ඇතුළත්ව මනුෂ්‍යයින් කතා කිරීමට සැලැස්වූ සේක. උපතේ සිට පවා යොහන් බෞතිස්ත ආත්මයාණන්ගෙන් පූර්ණ වී සිටියේ ය (ලූක් 1 : 15). ඔහුගේ ඉතා වැදගත්ම කාර්ය වූයේ වතුරෙන් පමණක් නොව, "ආත්මයාණන්ගෙන් ද, ගින්නෙන්ද" (ලූක් 3:16) මනුෂ්‍යයින් බෞතිස්ම කරන යේසුන්වහන්සේගේ පැමිණීම ප්‍රකාශ කිරීමයි.

## ආත්මයාණන්වහන්සේ සහ යේසුන්වහන්සේ

ශුද්ධාත්මයාණන්වහන්සේ යේසුන්වහන්සේගේ ජීවිතය පුරාම සම්බන්ධ වී සිටි සේක. උන්වහන්සේගේ පිළිසිඳගැනීම ආත්මයාණන් හේතුකොටගෙන සිදු විය (මතෙව් 1:20). උන්වහන්සේගේ බෞතිස්මයේ දී උන්වහන්සේ මතට බැස ආ සේක (මතෙව් 3:16). පාලුකරයට උන්වහන්සේ මඟපෙන්වනු ලැබූ සේක (ලූක් 4:1). එසේම ශුභාරංචිය දේශනා කිරීමට උන්වහන්සේ ආලේප කළ සේක (ලූක් 4:18). දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන යේසුන්වහන්සේ යක්ෂයින් පළවා හැරිය සේක (මතෙව් 12:28). පාපය උදෙසා වූ පූජාවක් ලෙස තමන්වහන්සේම පූජා කළේ ආත්මයාණන් තුළිනි (හෙබ්‍රෙව් 9:14). එම ආත්මයාණන් කරණකොටගෙනම උන්වහන්සේ මරණයෙන් නැගිටුවනු ලැබූ සේක (රෝම 8:11).

පීඩා කාලවල දී උන්වහන්සේගේ ගෝලයින් තුළින් ආත්මයාණන්වහන්සේ කතා කරන බව යේසුන්වහන්සේ ඉගැන්වූ සේක (මතෙව් 10:19-20). පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයට අනුගාමිකයින් බෞතිස්ම කරන්නට උන්වහන්සේ ඔවුන්ට පැවසූ සේක (මතෙව් 28:19). ඉල්ලන අයට දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන් දෙන බවට උන්වහන්සේ කී සේක (ලූක් 11 : 13).

ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ යේසුන්වහන්සේගේ වැදගත්ම ඉගැන්වීම් යොහන් පොතේ ඇත. පළමුවැන්න, මනුෂ්‍යයින් "වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද" ඉපදිය යුතු ය (යොහන් 3:5). මනුෂ්‍යයින්ට ආත්මික පිබිදීමක් අවශ්‍ය වේ. එය ඔවුන්ගේම ඇතුළාන්තයෙන් නික්මෙන්නේ නැත. එය දෙවියන්වහන්සේගේ තිළිණයකි. ආත්මයාණන්වහන්සේ නොපෙනෙන නමුත්, ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ ජීවිත තුළ වෙනසක් ඇති කරන සේක (8 පදය).

"යමෙක් පිපාසයෙන් සිටිත් නම්, ඔහු මා වෙතට පැමිණ පානය කෙරේවා. ශුද්ධ ලියවිල්ලෙහි කියා තිබෙන පරිදි මා කෙරෙහි අදහන්නා තුළින් ජීවන දායක ජලධාරා ගලන්නේ ය" (යොහන් 7:37-38) යනුවෙන් ද යේසුන්වහන්සේ ඉගැන්වූ සේක. යොහන් මෙම පැහැදිලි කිරීම ඇතුළත් කරන්නේ ය : "උන්වහන්සේ මෙසේ වදාළේ තමන්වහන්සේ කෙරෙහි අදහා ගත්තවුන් මතු ලබන්ට සිටි ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව ය" (39 පදය). ශුද්ධාත්මයාණන්වහන්සේ අභ්‍යන්තර පිපාසයක් සංසිඳුවන සේක. උන්වහන්සේ අප මවා තිබෙන අරමුණ, එනම් දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවය දෙන සේක. අපි යේසුන්වහන්සේ වෙත පැමිණීම මඟින් ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගන්නෙමු. ශුද්ධාත්මයාණන්වහන්සේට අපගේ ජීවිත පූර්ණ කළ හැකි ය.

යොහන්තුමා මෙසේ ද පවසයි. "ශුද්ධාත්මයාණන්වහන්සේ ඒ තාක් නොදෙන ලද්දේ ය. මන්ද, යේසුන්වහන්සේ ඒ තාක් මහිමයට පත් නොවූ බැවිනි" (39 පදය). යේසුන්වහන්සේට පෙර ශුද්ධාත්මයාණන්වහන්සේ විවිධ කාන්තාවන් සහ පුරුෂයින් පූර්ණ කළ සේක. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේ පෙන්තකොස්තයේ දී ඉතා ඉක්මනින් වඩා බලවත් ආකාරයකින් පැමිණෙනු ඇත. දැන් අපගේ ස්වාමීන් වන දෙවියන්වහන්සේ විසින් කැඳවනු ලබන සියල්ලන්ට (ක්‍රියා 2: 38-39) ශුද්ධාත්මයාණන්වහන්සේ වඩා විශාල ලෙස මැන දෙනු ලබන්නේය.

ගෝලයින් තුළ වසන සත්‍යතාවේ ආත්මයාණන් දෙනු ලබන බවට උන්වහන්සේ පොරොන්දු වූ සේක (යොහන් 14 : 16-18). මෙය යේසුන්වහන්සේම තම ගෝලයින් තුළට පැමිණෙනවා හා සමාන වේ (18 පදය). මන්ද යේසුන්වහන්සේ මෙන්ම පියාණන්වහන්සේ විසින් යවන ලද ක්‍රිස්තුන්වහන්සේගේ ආත්මය සහ පියාණන්වහන්සේගේ ආත්මය වන බැවිනි (යොහන් 15 :26). ශුද්ධාත්මයාණන්වහන්සේ සියල්ලන්ට යේසුන්වහන්සේ ලබා දී උන්වහන්සේගේ කාර්ය නොකඩව කරන සේක.

යේසුන්වහන්සේ ඉගැන්වූ දේවල් ශුද්ධාත්මයාණන්වහන්සේ ගෝලයින්ට උගන්වමින් මතක් කරන සේක (යොහන් 14 : 26). යේසුන්වහන්සේගේ උත්ථානයට පෙර ගෝලයින්ට තේරුම් ගත නොහැකි වූ දේවල් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූ සේක (යොහන් 16 : 12 -13).

ශුද්ධාත්මයාණන්වහන්සේ යේසුන්වහන්සේ ගැන සාක්ෂි දෙන සේක (යොහන් 15 : 26, 16 : 14). උන්වහන්සේ තමාම උසස් කරගන්නේ නැතිව, යේසුන් ක්‍රිස්තුන්වහන්සේ සහ පියාණන්වහන්සේ වෙතට මනුෂ්‍යයින් මඟ පෙන්වන සේක. උන්වහන්සේ තමන්වහන්සේගෙන්ම උපදවා කතා නොකර, පියාණන්වහන්සේට අවශ්‍ය දේ කතා කරන සේක (යොහන් 16 : 13). මිලියන ගණන් සෙනඟ තුළ ශුද්ධාත්මයාණන්වහන්සේට වාසය කළ හැකි බැවින්, යේසුන්වහන්සේ අප අත්හැර ශුද්ධාත්මයාණන්වහන්සේට අප තුළ වාසය කිරීමට එවීවේ අපගේම යහපතට ය (යොහන් 16:7).

එවැන්ජලිස්ත සේවයේ දී ලෝකයාට ඔවුන්ගේ පාපය, ඔවුන්ගේ වරදකාරී බව, ධර්මිෂ්ඨභාවය සඳහා වූ ඔවුන්ගේ අවශ්‍යතාවය සහ විනිශ්චයේ නියතභාවය හඟවා දෙමින්

ශුද්ධාත්මයාණන්වහන්සේ ක්‍රියා කරන සේක (8-10 පද). මනුෂ්‍යයාගේ වරදට විසඳුම සහ ධර්මිෂ්ටකමේ මූලය වන යේසුන්වහන්සේ වෙත ශුද්ධාත්මයාණන්වහන්සේ මිනිසුන් මඟපෙන්වන සේක.

**ආත්මයාණන්වහන්සේ සහ සභාව**

යේසුන්වහන්සේ මනුෂයයින් ශුද්ධාත්මයාණන්ගෙන් බෞතිත්ම කරන බව යොහන් බෞතිස්ත කිවේය (මාක් 1 : 8). මෙය යේසුන්වහන්සේගේ ස්වර්ගාවරෝහණයෙන් පසුව, පෙන්තකොස්ත දිනයේ දී විශ්මයානුකූල ලෙස ගෝලයින්ට ශුද්ධාත්මයාණන්වහන්සේ නව බලයක් දීමේ දී සිදු විය (ක්‍රියා 2). මෙයට වෙනත් ජාතීන් විසින් අවබෝධ කරගත හැකි වූ කථා කිරීම් ද ඇතුළත් වේ (6 පදය). සභාව වර්ධනය වන කල මෙයට සමාන භාසකම් ඇතැම් විට සිදු විය (ක්‍රියා 10:44 -46, 19 : 1-6).

ඉතිහාසඥයෙක් ලෙස, ලූක්තුමා අසාමාන්‍ය මෙන්ම නියම සිදුවීම් ද වාර්තා කරයි. නව ඇදහිලිවතුන් සියල්ලන්ටම මෙම භාසකම් සිදු වූ බව දක්වා නැත. සැම ඇදහිලිවන්තයෙක්ම ශුද්ධාත්මයාණන්වහන්සේ තුළ එකම ශරීරයකට - එකම සභාවට බෞතිස්ම කරන ලද බව පාවුල්තුමා පවසයි (1 කොරින්ති 12 :13). ඇදහිල්ල ඇති සියල්ලන්ටම ශුද්ධාත්මයාණන්වහන්සේ දුන් සේක (රෝම 10 : 13, ගලාති 3 : 14). ඔවුන්ට භාසකම් සිදු වුණත්, නැතත්, සියලුම ඇදහිලිවතුන් ශුද්ධාත්මයාණන්ගෙන් බෞතිස්ම කර ඇත. මෙය ඔප්පු කිරීම සඳහා කිසියම් භාසකමක් සෙවීම අවශ්‍ය වන්නේ නැත.

ශුද්ධාත්මයාණන්ගේ බෞතිස්මය සෙවීමට කිසිම ඇදහිලිවන්තයෙකුට බයිබලය අණ කර නැත. ඒ වෙනුවට, සැම ඇදහිලිවන්තයෙක්ම නොකඩව ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන ලෙසට ධෛර්ය කර ඇත (එපීස 5 : 18). ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීමට සම්පූර්ණ ලෙස ප්‍රතිචාර දැක්වීමට ධෛර්ය දී ඇත. මෙය එක් වතාවක් පමණක් කරන දෙයක් නොව, නොකඩව කළ යුතු කාර්යකි.

භාසකමක් සෙවීමට වඩා, අපි දෙවියන්වහන්සේ සෙවීම අවශ්‍ය වේ. භාසකම් සිදු වීම දෙවියන්වහන්සේගේ තීරණයට භාර දිය යුතු වේ. දෙවියන්වහන්සේගේ බලය භාසකම් සම්බන්ධයෙන් නොව, ඇතුළාන්ත ශක්තිය, බලාපොරොත්තුව, ප්‍රේමය, ඉවසීම, සේවය කිරීම, තේරුම් ගැනීම, පීඩා විඳීම සහ නිර්භීත ලෙස දේශනා කිරීම යනුවෙන් බොහෝ විට පාවුල්තුමා විස්තර කරයි (රෝම 15 : 13, 2 කොරින්ති 12 : 9, එපීස 3 : 7, 16 - 18, කොලොස්සි 1 : 11, 28 - 29, 2 තිමෝති 1 : 7 - 8). මනුෂ්‍යයින්ගේ ජීවිතවල ක්‍රියා කරන දෙවියන්වහන්සේගේ බලය එය වේ.

ක්‍රියා පොත සමීක්ෂණයෙන් අපට පෙනෙන පරිදි, සභාවේ වර්ධනයට හේතු වූ බලය ශුද්ධාත්මයාණන්වහන්සේ වන සේක. යේසුන්වහන්සේ පිළිබඳ සාක්ෂි දැරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ගෝලයින්ට බලය දුන් සේක (8 පදය). ක්‍රිස්තුන්වහන්සේ දේශනා කිරීම පිණිස විශාල නිර්භීතකමක් උන්වහන්සේ ගෝලයින්ට දුන් සේක (ක්‍රියා 4 : 8, 31, 6 : 10). උන්වහන්සේ පිලිප්ට මාර්ගෝපදේශ දී පසුව ඔහු ගෙන ගිසේක (ක්‍රියා 8 : 29, 39).

ශුද්ධාත්මයාණන්වහන්සේ සභාව ධෛර්යමත් කර, එහිනායකයින් පත් කළ සේක (ක්‍රියා 9 : 31, 20 : 28). අන්තියෝකියේ දී උන්වහන්සේ පේදුරුතුමාට සහ සභාවට කතා කළ සේක (ක්‍රියා 10 : 19, 11 :12, 13 :2). සාගතයක් පිළිබඳ දැන්වීමට අගබස් ද, ශාපයක් ගැන

දැන්වීමට පාවුල් ද උන්වහන්සේ ආලේප කළ සේක (11 : 28, 13 : 9). උන්වහන්සේ පාවුල් සහ බාර්ණබස්ට ඔවුන්ගේ චාරිකාවල දී මඟපෙන්වූ සේක (13 : 4, 16 : 6-7). යෙරුසලමේ මන්ත්‍රණ සභාවට තීරණයක් ගැනීමට උපකාර කළ සේක (15 : 28). උන්වහන්සේ පාවුල්තුමා යෙරුසලමට යවමින් එහි සිදු වන්නට යන දේ පිළිබඳ අනතුරු ඇඟවූ සේක (20: 22-23, 21 :11). සභාව පවතිමින් වර්ධනය වූයේ ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවතුන් තුළ ක්‍රියා කළ නිසාවෙනි.

**ආත්මයාණන්වහන්සේ සහ වර්තමාන ඇදහිලිවන්තයින්**

ශුද්ධාත්මයාණන්වහන්සේ වන දෙවියන්වහන්සේ වර්තමාන ඇදහිලිවන්තයින්ගේ ජීවිත තුළ සමීප ලෙස සම්බන්ධ වී සිටින සේක.

- උන්වහන්සේ පසුතැවිලි වීමට මඟපෙන්වා, අපට නව ජීවිතයක් දෙන සේක (යොහන් 16:8, 3:5-6).
- උන්වහන්සේ අප තුළ ජීවත් වන සේක, අපට උගන්වන සේක, අපට මඟපෙන්වන සේක (1 කොරින්ති 2:10-13, යොහන් 14:16-17, 26, රෝම 8:14). ශුද්ධ ලියවිල්ල, යාච්ඤාව සහ අනෙක් කිතුනුවන් තුළින් උන්වහන්සේ අපට මඟපෙන්වන සේක.
- උන්වහන්සේ ප්‍රඥාවේ ආත්මයාණෝය, නිසැකකමින් යුතුව තෝරාගැනීම් කිරීමටත්, ප්‍රේමයට සහ ස්ව- හික්මවීමටත් උපකාර කරන සේක (එපීස 1:17, 2 තිමෝති 1:7).
- ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ අරමුණ උදෙසා අප වෙන් කර තබමින්, අපගේ හදවත් චර්මඡේදනය කරන සේක, අප මුද්‍රා කරන සේක, අප පාරිශුද්ධ කරන සේක (රෝම 2:29, එපීස 1:14).
- උන්වහන්සේ ප්‍රේමය සහ ධර්මිෂ්ටකමේ ඵල අප තුළ නිපදවන සේක (රෝම 5:5, එපීස 5:9, ගලාති 5:22-23).
- උන්වහන්සේ අප සභාවට එක් කරමින්, අපි දෙවියන්වහන්සේගේ දරුවන් බව දැනගැනීමට අපට උපකාර කරන සේක (1 කොරින්ති 12:13, රෝම 8:14-16).

අපගේ මනස ආත්මයාණන්වහන්සේට අවශ්‍ය ආකාරයට හසුරුවා ගනිමින් අපි "ආත්මයෙන්" දෙවියන්වහන්සේට නමස්කාර කළ යුතු වෙමු (පිලිප්පි 3:3, 2 කොරින්ති 3:6, රෝම 7:6, 8:4-5). අපි උන්වහන්සේ ප්‍රසන්න කිරීමට උත්සහා කළ යුතු වෙමු (ගලාති 6:8). අපි ආත්මයාණන්වහන්සේ මඟින් පාලනය කරනු ලබන්නෙමු නම්, උන්වහන්සේ ජීවිතය සහ සමාදානය අපට දෙන සේක (රෝම 8 : 6). උන්වහන්සේ පියාණන්වහන්සේ වෙතට යන මාර්ගය අපට දෙන සේක (එපීස 2 : 18). උන්වහන්සේ අප උදෙසා මැදහත්කම් කරමින්, අපගේ දුර්වලකම්වල දී උපකාර කරන සේක (රෝම 8 : 26 -27)

ශුද්ධාත්මයාණන්වහන්සේ ආත්මික දීමනා ද, සභාවේ නායකයින් ද (එපීස 4:11), සභාව ඇතුළත මූලික ක්‍රියාකාරීත්වයන් (රෝම 12: 6-8), සුවිශේෂ අරමුණු උදෙසා හැකියාවන් ද (1 කොරින්ති 12: 4-11) දෙන සේක. කිසිවෙකුට සැම දීමනාවක්ම ඇත්තේ නැත. එසේම, එකම දීමනාව සියල්ලන්ටම ලබා දී නැත්තේ ය (1 කොරින්ති 12: 28-30 පද). ආත්මික හෝ "ස්වභාවික" හෝ සියලු දීමනා, පොදු යහපත සඳහා, සමස්ත සභාවේම උපකාරයට භාවිත කළ යුතු වේ (1 කොරින්ති 12:7, 14:12). සැම දීමනාවක්ම වැදගත් ය (1 කොරින්ති 12:22 - 26).

දැන් අපට ඇත්තේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පළමු ඵල පමණක්ය, අපගේ අනාගතයේ දී වඩා වැඩියෙන් ලැබෙන බවට සහතික වූ තැන්පතුවක් පමණී (රෝම 8:23, 2 කොරින්ති 1:22, 5:5, එපීස 1 : 13-14).

සාරාංශයක් ලෙස, ශුද්ධාත්මයාණන්වහන්සේ යනු අපගේ ජීවිත තුළ ක්‍රියා කරන දෙවියන්වහන්සේ වන සේක. දෙවියන්වහන්සේ කරන සියල්ලම උන්වහන්සේගේ ආත්මයාණන් තුළින් කරන සේක. පාවුල්තුමා එම නිසා අප මෙසේ ධෛර්යමත් කරන්නේ ය: "අපි ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන ජීවත් වෙමු නම්, ආත්මයාණන්වහන්සේගෙන් මඟපෙන්වීම ලබමු . . . ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙන්න . . . ශුද්ධාත්මානුභාවයට අවහිර නොකරන්න" (ගලාති 5:25, එපීස 4:30, 1 තෙසලෝනික 5:19). ශුද්ධාත්මයාණන්වහන්සේ පවසන දෙයට අවධානය යොමු කරන්න. උන්වහන්සේ කතා කරන කල, දෙවියන්වහන්සේ කතා කරන සේක.

---

# ශුද්ධ ත්‍රිත්වය

**1+1+1**

**මෙය හුදෙක් එකතු කිරීමක් නොවේ.**

පියාණන්වහන්සේ දෙවියන්වහන්සේ වන සේක, පුත්‍රයාණන්වහන්සේ ද දෙවියන්වහන්සේ වන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ ද දෙවියන්වහන්සේ වන සේක. "මොහොතක් ඉන්න" ඇතැම් මිනිස්සු පවසති. "එක එකතු කිරීම, එක එකතු කිරීම එක සමානයි එක? මෙය නිවැරදි විය නොහැකියි. එය එකතු වන්නේ නැත".

එය ඇත්තයි. එය එකතු කර නැත. එය එකතු කිරීමට අවශ්‍ය නැත. එකතු කිරීමට දෙවියන්වහන්සේ භාණ්ඩයක් නොවන සේක. සිටිය හැකි වන්නේ සර්ව බලධාරී, සර්ව ඥානය ඇති, සර්වවාසී එක් අයෙකු පමණය. එම නිසා සිටිය හැකි එකම දෙවියන්වහන්සේ ය. ආත්මික ලෝකයක පියාණන්වහන්සේ, පුත්‍රයාණන්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේ වන සේක. ද්‍රව්‍යමය දේවලට එක් වීමට නොහැකි අයුරින් ඒකත්වයක් වී ඇත. අපගේ ගණිතමය සංකල්ප ද්‍රව්‍යමය දේ මත පදනම්ව පවතී. එය සැම විටම අනන්ත වූ, ආත්මික ක්ෂේත්‍රයක් තුළ ක්‍රියා කරන්නේ නැත.

පියාණන්වහන්සේ දෙවියන්වහන්සේ වන සේක. පුත්‍රයාණන්වහන්සේ ද දෙවියන්වහන්සේ වන සේක. එහෙත් ඇත්තේ දෙවියන්වහන්සේ වන එකම සත්තාවකි/පැවැත්මකි. මෙය දිව්‍යමය පුද්ගලයන්ගේ පවුලක් හෝ කමිටුවක් හෝ නොවේ. කණ්ඩායමක් යයි කිව හැකි නොවේ. "මා සමාන කිසිවෙක් නැත." (යෙසායා 43 : 10, 44 : 6, 45 : 5). දෙවියන්වහන්සේ එකම දිව්‍යමය සත්තාවකි/පැවැත්මකි. එක පුද්ගලයෙකුට වඩා එකම දෙවියන්වහන්සේය. මුල් කිතුනුවෝ මෙම අදහස මිථ්‍යා දෘෂ්ටියකින් හෝ දර්ශනවාදයකින් හෝ ගත්තේ නැත. ඔවුහු ශුද්ධ ලියවිලිවලින් එයට යොමු වූහ.

ශුද්ධ ලියවිල්ල යේසුන් ක්‍රිස්තුන්වහන්සේගේ දිව්‍යමය බව උගන්වන්නා සේම, එය ශුද්ධාත්මයාණන්වහන්සේ ද දිව්‍යමය සහ පුද්ගලභාවයක් වන බව උගන්වන්නේ ය. ශුද්ධාත්මයාණන්වහන්සේ කරන ඕනෑම දෙයක් දෙවියන්වහන්සේ කරන සේක. පියාණන්වහන්සේ සහ පුත්‍රයාණන්වහන්සේ මෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ ද දෙවියන්වහන්සේ වන සේක. පුද්ගලභාවයන් තුනක් සම්පූර්ණ වශයෙන් එකම දෙවියන්වහන්සේ තුළ ඒකත්වයක් වී තිබේ: එනම්, ශුද්ධ ත්‍රිත්වය.

# ගෝලත්වය 101

# ඒකකය 5 ආ



## ඔබට ශුද්ධාත්මයාණන්වහන්සේගේ හඬ ඇසෙනවා ද?

අන්තියෝකියේ සභාව නමස්කාරය පිණිස රැස් වූ අවස්ථාවේ දී, ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන්ට කතා කළ සේක : "මා විසින් බාර්ණබස් ද සාවුල් ද කැඳවනු ලැබූ සේවය සඳහා ඔවුන් මට වෙන් කරන්න". වර්තමානයේ දී ශුද්ධාත්මයාණන්වහන්සේ අපට කතා කරනවා ද? උන්වහන්සේ අද අපට පවසන දේ අපට ඇසෙනවා ද?

ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මඟපෙන්වනු ලබන අය දෙවියන්වහන්සේගේ දරුවන් බව පාවුල්තුමා අපට පවසයි (රෝම 8 : 14). ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම අප බලාපොරොත්තු විය යුතු අතර, උන්වහන්සේ එය කරන්නේ කෙසේද යන්න අප දැනගත යුතු වේ.

**විවිධ ආකාරයෙන්**

දෙවියන්වහන්සේ විවිධ මනුෂ්‍යයින් සම්බන්ධයෙන් විවිධ අයුරින් ක්‍රියා කරන සේක. ආදම්, ආබ්‍රහම්, මෝසෙස්, දෙබෝරා, සාමුවෙල්, එළියා, මරියා සහ පාවුල් වැනි අයට උන්වහන්සේ විවිධ ආකාරයෙන් කතා කළ සේක. උන්වහන්සේට වර්තමානයේ අපටද විවිධ ආකාරයෙන් කතා කළ හැකි ය. පිලිප් හට (ක්‍රියා 8 : 29) සහ පේදුරු හට (ක්‍රියා 10 : 19) සුවිශේෂ ආකාරයෙන් පණිවිඩය දෙනු ලැබිණි. මෙහි වෙනස් වූ වචන අන්තර්ගත විය. එහෙත් ඔහු වෙනස් වූ ආකාරයකින් යෙරුසලමේ මන්ත්‍රණ සභාවේ දී කතා කළේ ය (ක්‍රියා 15). අපෝස්තුළුවරුන්ගේ සාකච්ඡාවේ අවසානයේ දී ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන් උදෙසා තීරණය ගත් බව නිගමනය කළෝ ය (28 පදය).

විවිධ මනුෂ්‍යයින්ට විවිධ හැකියාවන් දීමට ශුද්ධාත්මයාණන්වහන්සේ තීරණය කළා සේම (1 කොරින්ති 12 : 11), උන්වහන්සේ අප තුළ ද විවිධ අයුරින් ක්‍රියා කරන සේක. අනුකම්පාවේ දීමනාව ලත් පුද්ගලයාට වඩා වෙනස් ආකාරයට භාෂ්කමේ වචන දීමනාව ලත් පුද්ගලයාට ආත්මයාණන්වහන්සේගේ හඬ ඇසෙන්නේ ය. ගුරුවරයෙකුට දේව සේවකයෙකුට වඩා වෙනස් ලෙසින් ආත්මයාණන්වහන්සේ මඟපෙන්වන සේක. මන්ද, එකිනෙක මනුෂ්‍යයාට විවිධ වූ කාර්යක් උන්වහන්සේ වෙත ඇති නිසාවෙනි.

ශුද්ධාත්මයාණන්වහන්සේ විවිධ අයුරින් අප හැඩගස්වන සේක. එහි ප්‍රතිඵලයක් ලෙස අපගේ ඉලක්ක විවිධ වේ. පරිපාලනය සම්බන්ධ දීමනාව ලත් පුද්ගලයා පිළිවෙළ සහ සංවිධානය අගය කරයි, සේවය කිරීම සඳහා වූ දීමනාව ලත් පුද්ගලයා මනුෂ්‍යයින්ට උපකාර ලැබේදැයි අසයි. ධෛර්යමත් කිරීමේ දීමනාව ලත් පුද්ගලයා මනුෂ්‍යයන්ගේ ආකල්ප කෙරේ අවධානය

යොමු කරයි. ත්‍යාගවන්තකමේ දීමනාව ලත් පුද්ගලයින් තමාට සැපයිය හැකි පුද්ගලයින්ගේ අවශ්‍යතා පිළිබඳ සොයා බලයි. අපගේ කැමැත්ත සහ වටිනාකම් අනුව, අපට කිරීමට උන්වහන්සේ දී ඇති කාර්ය කිරීමට උන්වහන්සේ අප තුළ ක්‍රියා කරන සේක.

ඇතැම් අයට උන්වහන්සේ සාමාන්‍ය ප්‍රතිපත්තිවලින් තේරුම් ගැනීමට අමාරු ආකාරයෙන් කතා කරන සේක. තවත් අයට, නොවරදින විස්තර සහිතව උන්වහන්සේ කතා කළ යුතු ය. අපි එකිනෙකා දෙවියන්වහන්සේ අප මවා ඇති ආකාරයෙන්, අප සමඟ ගනුදෙනු කිරීමට උන්වහන්සේ තෝරාගත් ආකාරයෙන් සවන් දිය යුතු වෙමු. වැදගත් දෙය වන්නේ අප සවන් දීමයි. අපි උන්වහන්සේ කියන දේ ඇසීමට සූදානම්ව කැමැත්තෙන් ඇසිය යුතු වෙමු. උන්වහන්සේගේ නායකත්වය ප්‍රතික්ෂේප නොකර එය සෙවිය යුතු වෙමු.

**අනතුරු**

ගණන් ගත යුතු වූ ඇතැම් අනතුරු මෙසේ ය. පළමුවැන්න, සෑම වර්ගයේම මිනිසුන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන්ට කතා කරන්නේ නැතිව, උන්වහන්සේගේ හඬ ඇසූ බව කියා සිටියි. ඔවුන් බොරු අනාවැකි කියා ඇත. මෝඩ අවවාද දී තිබේ. කිතුදහම වැරදි ලෙස පෙන්වා, මිනිසුන් මිථ්‍යා ලබ්ධීන් වෙත මඟපෙන්වා ඇත. දෙවියන්වහන්සේ ඔවුන්ට කතා කළ සේක් නම්, උන්වහන්සේ කී දෙය ඔවුන් වැරදි ලෙස තේරුම් ගෙන ඇත. එම නිසා දෙවියන්වහන්සේ කෙදිනකවත් නොකියන ලද දේවලට “සවන් දීමේ” අනතුරක් තිබේ. උන්වහන්සේගේ නාමය නිකරුණේ භාවිත නොකිරීමට අපි පරෙස්සම් විය යුතු වෙමු.

දෙවන අනතුර වන්නේ, සමහර මිනිස්සු වැරදි දෙයට සවන් දීමට බිය වෙති. ඒ නිසාවෙන් සවන් දීම ප්‍රතික්ෂේප කරති. එහෙත්, ඩැලස් විලාඩ් දැක්වූ පරිදි, අපි “සත්‍ය වූ දෙය බොරු දෙය හා සමානව තිබෙන නිසාවෙන්, සත්‍ය මඟහැරිය යුතු නැත” (ස්වර්ගයේ සිට දෙවියන්වහන්සේට සවන් දීම, 88 පිටුව). අපගේ ස්වර්ගීය පියාණන්වහන්සේ අපට කතා කරන සේක, ශුද්ධාත්මයාණන්වහන්සේ අපට මඟපෙන්වන සේක, අපි අපගේ කන් වසාගෙන සිටියහොත් අපගේ වෙනසක් ඇති වන්නේ නැත.

ආත්මයාණන්වහන්සේ ශුද්ධ ලියවිල්ලේ වචනවලින් කතා කරන බවත්, අපි උන්වහන්සේ පවසන දේ අනුගමනය කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතු බවත් හෙබ්‍රෙව් 3:7 පවසයි. උන්වහන්සේ වර්තමානයේදී අප විසින් කළ යුතු දේ පෙන්වා දෙමින්, දෙවියන්වහන්සේට සේවය කරන්නේ කෙසේදැයි මඟපෙන්වමින් අප සමඟ සන්නිවේදනය කරන සේක.

තුන්වන අනතුර වන්නේ, ඇතැම් මිනිස්සු ආත්මාර්ථකාමී හේතූන් සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ සෙවීමයි. කුමන රැකියාවක් කරන්නදැයි ඔවුන්ට පැවසීමට, කුමන මනුෂ්‍යයා විවාහ කරගන්නදැයි පැවසීමට, කුමන අවස්ථාවේදී වෙනත් ස්ථානයකට යන්නද සහ කෙසේ ජීවත් වන්නදැයි කීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන් වෙනුවෙන් තීරණ ගැනීමට ඔවුන්ට අවශ්‍ය ය. තීරණ ගැන සිතීමේ දී සහ ක්‍රියාවට නංවීමේ දී පැනනගින ගැටලුවලින් ආරක්ෂා කිරීම පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේ භූතාත්ම ලියවිල්ලක් හෝ හඳහනක් හෝ වීම ඔවුන්ට අවශ්‍ය ය.

එහෙත් අප අත්දැකීම්වලින් වැරදි සහ නිවැරදි දේ කුමක්ද යන්න ඉගෙන ගනිමින්, පරිණතව වර්ධනය වීම දෙවියන්වහන්සේට අවශ්‍ය වේ (හෙබ්‍රෙව් 5:12- 14). අපි මුහුණ දෙන බොහෝ තීරණ පාපය සහ ධර්මිෂ්ඨකම සම්බන්ධ දේවල් නොවේ. ඒවා සරල තෝරාගැනීම් වේ. අපි

කුමන දේ තෝරා ගත්ත ද දෙවියන්වහන්සේට අප සමඟ ක්‍රියා කළ හැකි ය. එම නිසා තෝරාගැනීම කිරීම උන්වහන්සේ අපට දී ඇත. එම නිසා අපට අවශ්‍ය පරිදි සියල්ල සම්බන්ධයෙන්ම ශුද්ධාත්මයාණන්වහන්සේ අපට පවසන්නේ නැත.

ඇතැම් මිනිසුන්ට තමා සමඟ සාකච්ජා කරන හිතවතෙක් ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේ සහභාගිකම් පැවැත්වීම අවශ්‍ය වේ. ඔවුන්ට කතා කිරීමට අවශ්‍ය වන නමුත්, ශුද්ධාත්මයාණන් වහන්සේ නිකරුණේ වචන භාවිත නොකරන සේක. උන්වහන්සේ තමා වෙනුවෙන් අවධානය යොමු කර නොගන්නා සේක (යොහන් 15 : 26). එසේම උන්වහන්සේ කලින්ම අවශ්‍ය පමණ තොරතුරු සහ අවවාද දී තිබෙන බැවින්, බොහෝ විට නිශ්ශබ්දය. උන්වහන්සේ මේ වන විටත් අපට ලබා දී ඇති දේ අප විසින් භාවිත කිරීම උන්වහන්සේට අවශ්‍ය වේ. අප මුහුණ දෙන දේවල දී නිවැරදිව ප්‍රතිචාර දැක්වීමට උන්වහන්සේ අපගේ හෘදය සාක්ෂිය පුහුණු කරන සේක. අපි අප මතම රැඳීමක් ඉන් අදහස් නොවේ. එහෙත් දෙවියන්වහන්සේ මේ වන විටත් අපගේ ජීවිතවල කර තිබෙන දේ සහ අපට ඉගැන්වූ දේ මත රැඳී සිටීම අදහස් වේ.

## ශුද්ධ ලියවිලි

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවයෙන් ලියා කැනොනිකරණය කර ඇති ශුද්ධ ලියවිලිවලින් මූලිකවම උන්වහන්සේ අපට කතා කරන සේක. මෙය අපගේ ඇදහිල්ල සහ ජීවිතයේ මූලික පදනම වේ. සියලු දෙනා ප්‍රවේශ වන වචනය වේ. පරමාර්ථ ඇතිව අධ්‍යයනය කළ හැකි සහ සාකච්ජා කළ හැකි වචනය වේ. නිරතුරු අප විසින් ඇසිය යුතු වචනය දැනටමත් ලියා තිබෙන අතර, ආත්මයාණන්වහන්සේ විසින් එය අපගේ මනසට ගෙන ආ යුතුය. නිදසුනක් ලෙස, යේසුන්වහන්සේ යක්ෂයාගෙන් පරීක්ෂා කරනු ලැබූ අවස්ථාවේදී, උන්වහන්සේගේ ප්‍රතිචාරයන් ශුද්ධ ලියවිල්ලෙන් උපුටා ගත් ඒවා විය. උන්වහන්සේ එම වචන අධ්‍යයනය කර, මතකයේ තබාගෙන තිබිණි. සෑම අවස්ථාවේ දීම සුදුසු ප්‍රතිචාරය දැක්වීමට ශුද්ධාත්මයාණන්වහන්සේ උන්වහන්සේට මඟපෙන්වූ සේක.

ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ සිතීමට ඇති අවශ්‍යතාවය, උන්වහන්සේගේ වචනය කියවීමට සහ මෙනෙහි කිරීමට ඇති අවශ්‍යතාවය මඟහැර යන්නේ නැත. ශුද්ධ ලියවිලිවලින් උන්වහන්සේ දැනටමත් අපට දී ඇති වචන අප සොයන්නේ නැති නම්, අලුත් අවස්ථාවන් උදෙසා අලුත් වචන උන්වහන්සේ දෙනු ඇතැයි අප බලාපොරොත්තු නොවිය යුතුය. අමාරු ප්‍රශ්නවලට ශුද්ධ ලියවිලි යන්තමින් බලා අහඹු ලෙස යහපත් පිළිතුරු සලස්වා ගැනීම නොකළ යුතු වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ කතා කිරීමට තෝරාගෙන නැති අවස්ථාවලදී කතා කිරීම පිණිස උන්වහන්සේට බල කිරීමට හෝ පෙළඹවීමට හෝ අපට නොහැකිය.

අපි බයිබලය කියවා යාච්ඤා කරන කල සහ දෙවියන්වහන්සේගේ අභිමුඛයේ නිවැරදි ලෙස ජීවත් වන විටශුද්ධ ලියවිල්ල දෙවියන්වහන්සේ සමඟ නියත සම්බන්ධතාවයක් පවත්වාගැනීමට උපකාරී වේ. අපි යාච්ඤා කරන කල, සවන් දීමද කළ යුතු වෙමු. මන්ද අප විසින් කළ යුතු දේ ගැන තේරුම් ගැනීම සඳහා උපකාර කිරීමට අපගේ මෙනෙහි කිරීම් දෙවියන්වහන්සේ භාවිත කරන සේක. අපගේ මනසේ තිබෙන වචනවලින් ආත්මයාණන්වහන්සේ ක්‍රියා කරන බැවින්, කියවීම සහ අධ්‍යයනය කිරීමට අපට වගකීමක් තිබේ. අපගේ වචන මාලාව, අපගේ තර්කයන්, උන්වහන්සේ අපට දී ඇති ආශාවන් සහ වටිනාකම් සමඟ උන්වහන්සේ ක්‍රියා කරන සේක.

යක්ෂයාටත් ශුද්ධ ලියවිලි භාවිත කළ හැකි ය. බයිබලය බොහෝ විට වැරදි ලෙස තේරුම් ගෙන වැරදි ලෙස භාවිත කර ඇත. එහෙත්, ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මඟපෙන්වනු ලැබීම සහ උන්වහන්සේගේ හඬට සවන් දීම වැදගත් වේ. දෙවියන්වහන්සේගෙන් පැමිණෙන සියලු වචනවල සංසන්දනාත්මක ප්‍රමිතිය ශුද්ධ ලියවිල්ල වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ යමක් කිරීමට අපට මඟපෙන්වන බව අපි සිතන්නෙමු නම්, අපගේ පළමු ප්‍රශ්නය විය යුත්තේ, "මෙය ශුද්ධ ලියවිල්ලට එකඟ වේද?" යන්නයි. ආත්මයාණන්වහන්සේ තමාටම විරුද්ධ වන්නේ නැත. උන්වහන්සේ බොරු කීමට, සොරකම් කිරීමට, ඕපාදූප කීමට හෝ ලෝභ වීමට මඟපෙන්වන්නේ නැත. මන්ද මේවා දෙවියන්වහන්සේගෙන් නොවන බවට උන්වහන්සේම කියා ඇති බැවිනි.

එම නිසා, ශුද්ධාත්මයාණන්වහන්සේ අපට යම් මාර්ගයක මඟපෙන්වන බව අපි සිතන්නෙමු නම්, එය ශුද්ධ ලියවිල්ල සමඟ පරීක්ෂා කළ යුතු වේ. එය දැනගැනීමට අපට කළ හැකි එකම දෙය වන්නේ ඒ සම්බන්ධව ශුද්ධ ලියවිල්ල පවසන දේ බැලීමයි. අපි එය ඉගෙනගත යුතු වේ. අපට කිසි විටකත් එය සම්පූර්ණයෙන්ම දැනගත නොහැකි නිසා, නොකඩව එය අධ්‍යයනය කළ යුතු වෙමු. කටපාඩම් කිරීම ප්‍රයෝජනවත් විය හැකිය. එහෙත් වඩා වැදගත් වන්නේ එය තේරුම් ගැනීමයි. දෙවියන්වහන්සේ අප සමඟ ක්‍රියා කරන ආකාරය දැනගැනීමට උපකාරයක් වන ගැළවීමේ ප්‍රතිපත්ති, කිතුනු ජීවිතයේ ප්‍රතිපත්ති, දිව්‍යමය ප්‍රේමයේ ප්‍රතිපත්ති, දෙවියන්වහන්සේ තමාගේ සෙනඟ සමඟ ක්‍රියා කරන ආකාරය පිළිබඳ ප්‍රතිපත්ති බැලිය යුතුය.

**අත්දැකීම**

අපගේ අත්දැකීම් තුළින් අපට ශුද්ධාත්මයාණන්වහන්සේට සවන්දිය හැකිය. දෙවියන්වහන්සේ ඇතැම් විට උන්වහන්සේගේ ක්‍රමවේදයන් වෙනස් කරන සේක. එහෙත් බොහෝ විට උන්වහන්සේ වසරෙන් වසර එකම ආකාරයකින් අප සමඟ ක්‍රියා කරන සේක. අත්දැකීම් තුළින් අපගේ යාච්ඤාවන්ට උන්වහන්සේ පිළිතුරු දුන්නේ කෙසේද යන්න සහ අතීත සිදුවීම්වල දී අපට මඟපෙන්වූයේ කෙසේද යන්න අපි දකිමු. මෙය උන්වහන්සේ වර්තමානයේදී අපට කතා කරන කල, උන්වහන්සේගේ "හඬ" හඳුනාගැනීමට අපට උපකාරී වේ. අත්දැකීම් ඇතිවන්නේ කාලය, යටහත් වීම සහ භාවනාව තුළිනි. ශුද්ධාත්මයාණන්වහන්සේ තමා උසස් කරගන්නා අයට නොව, යටහත් අයට උපකාර කරන සේක.

වෙනත් කිතුනුවන්ගේ අත්දැකීම් සලකා බැලීමෙන් අපට වඩා ප්‍රඥාව ලැබේ. ශුද්ධාත්මයාණන්වහන්සේ අප තනි නොකර, තවත් ඇදහිලිවන්තයන් ප්‍රජාවක් සිටින සභාවේ තබන සේක. අපි එක්ව සිටින පිණිසත්, එක්ව ක්‍රියා කරන පිණිසත්, එකිනෙකාගේ ශක්තියෙන් ප්‍රයෝජන ලබන පිණිසත් උන්වහන්සේ තමන්වහන්සේගේ දීමනාවන් බෙදා දෙන සේක (1 කොරින්ති 12:7). මෙයට සමාන ආකාරයෙන්, අපි එකිනෙකාට දෙවියන්වහන්සේ අපගේ ජීවිත තුළ ක්‍රියා කරන්නේ කෙසේද යන්න පිළිබඳ වෙනස් වූ අත්දැකීම් ඇති බැවින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ හඬට සවන් දීම පිණිස එකිනෙකාට උපකාර කිරීමට අපට හැකිය.

එක් මනුෂ්‍යයෙකුට දෙවියන්වහන්සේගෙන් පණිවුඩයක් පැමිණි කල, අනෙක් මනුෂ්‍යයින් ප්‍රවේශමෙන් එයට අවධානය යොමු කළ යුතුය (1 කොරින්ති 14: 29). ඔවුහු එක කරුණක් ගැන එනම්, එම වචනය සැබෑ ලෙසම දෙවියන්වහන්සේගෙන් පැමිණි එකක්දැයි සලකා බැලිය යුතු ය. ප්‍රජාවක් තුළින් මෙන්ම තනි පුද්ගලයන් තුළින් ද ආත්මයාණන්වහන්සේ කතා කළ හැකි ය. යෙරුසලමේ මන්ත්‍රණ සභාව මෙයට හොඳ නිදසුනකි. අන්‍ය ජාතීන් හා සමඟ වූ

අත්දැකීම්වලින් ඔවුහු ඉගෙන ගත් අතර, එම අත්දැකීම් ශුද්ධ ලියවිල්ල හා එකඟ වන බව ඔවුහු දුටුහ (ක්‍රියා 15:15). එසේම සාකච්ඡාව තුළින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ තීන්දුව ඔවුන්ට ඇසිණි (28 පදය).

ශුද්ධාත්මයාණන්වහන්සේ බොහෝ විට වෙනත් මනුෂ්‍යයින් තුළින් එනම්, නමස්කාර ගීතිකාවලින්, කුඩා කණ්ඩායම් සාකච්ඡා, රහසින් ධෛර්යමත් කිරීමේ වචනයක්, නිහඬ සිනහවක්, චිත්‍රයක් හෝ සඟරාවක ලිපියක් තුළින් මිනිසුන්ට කතා කරන සේක. වෙනත් අයගෙන් අපට ඉගෙන ගැනීමට, දේව මඟපෙන්වීම ලබා ගැනීමට හැකි ආකාර බොහෝ ඇත. එහෙත් මෙය එකිනෙකාට වෙන් කර හඳුනාගැනීම අවශ්‍ය වේ. එක් මනුෂ්‍යයෙකුට තවත් කෙනෙකුට අණ දීමට ශුද්ධාත්මයාණන්වහන්සේ පවසන්නේ කලාතුරකිනි.

දේශනා යනු පොදුවේ ආත්මික කථන වේ. කතා කරන අය දෙවියන්වහන්සේගේ වචන කතා කිරීමට උත්සහා කළ යුතු ය (1 පේදුරු 4:11). සභාවේ කතා කරන අය දේශනා සූදානම් කරන අවස්ථාවේදී දෙවියන්වහන්සේගේ හඬට සවන් දීමට උත්සහා කළ යුතු ය. දේශනා අසන අය ස්වාමින්වහන්සේගේ වචනවලට සවන්දිය යුතුය. අපගේ නමස්කාර මෙහෙයන්වල දී සවන්දීමේ, සිතීමේ, දෙවියන්වහන්සේ සමඟ සන්නිවේදනය කිරීමේ කාලවලට ඉඩහැරිය යුතුය. එසේ කිරීමෙන් අප ක්‍රිස්තුන්වහන්සේ මෙන් වීම පිණිස වෙනස් කිරීමට උන්වහන්සේට ඉඩ හරින්නෙමු. අපි උන්වහන්සේට සමීප වෙමු, එවිට උන්වහන්සේ අප වෙනස් කරන සේක.

"ආත්මයාණන්වහන්සේ සෝදිසි කිරීම" සඳහා අවස්ථාවන්/ සිදුවීම් තවත් අත්දැකීමකි. අපට විවෘත දොරක් තිබිය හැකි ය. නැතිනම්, සියලුම දොරවල් වසා තිබීමට පුළුවන. බාධාවන්ගෙන් අපගේ අවබෝධය පරීක්ෂා කෙරේ. එසේ නොමැති නම්, ඒවා අපගේ මාර්ග නිවැරදි ලෙස තේරුම්ගෙන තිබේදැයි ඇසීමට සංඥා කෙරේ. නැවත වරක් සිතීමට, නැවත වරක් දෙවියන්වහන්සේ සෙවීමට, ශුද්ධ ලියවිල්ල පරීක්ෂා කර බැලීමට, ආත්මික පරිණත බවින් යුතු අය සමඟ පරීක්ෂා කර බැලීමට ඒවා අපට බල කරයි.

**ශුද්ධාත්මයාණන්වහන්සේට ප්‍රතිචාර දැක්වීම**

අපට අසන්නට අවශ්‍ය නම්, සවන් දිය යුතු ය. එහෙත් බයිබලීය අර්ථයෙන් අපට අසන්නට අවශ්‍ය නම්, එසේම අපි කීකරු විය යුතු වෙමු. අපට උන්වහන්සේගේ හඬ ඇසුණොත්, දෙවියන්වහන්සේ අපට යමක් කිරීමට පවසන බව විශ්වාස කරනවා නම්, අපි ප්‍රතිචාර දැක්විය යුතු වෙමු. උන්වහන්සේ අපට දී තිබෙන සහජ හැකියාවන් ලෙස කළ යුතු වෙමු. අපි දෙවියන්වහන්සේට යටහත් විය යුතු වෙමු. මන්ද උන්වහන්සේ පවසන දේ අපගේම යහපත පිණිස වන බැවිනි. අපි උන්වහන්සේගේ කැමැත්ත කිරීමෙන් උන්වහන්සේට ගෞරවය ගෙනෙන්නෙමු, අපට ද ආශිර්වාද ගෙනෙන්නෙමු. එය ආරම්භ වන්නේ සවන් දීමෙනි. ඔබට ශුද්ධාත්මයාණන්වහන්සේගේ හඬ ඇසෙනවා ද? එය සිතා බැලීමට වටිනා දෙයකි.

## ගෝලත්වය 101

## ඒකකය 5 ඇ



# ඔබ ගළවාගැනීම උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේ විශ්වාස කරන්නෙහි ද?

තමා අවුරුදු 20 දී බෞතිස්මය ලැබුවේ තමාට ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ලබාගැනීමට අවශ්‍ය නිසා බවත්, එවිට සියලු පාපවලින් නිදහස් වීමට හැකි නිසා බවත් මෑතකදී මිත්‍රයෙක් පැවසීය. ඔහුගේ අභිප්‍රායන් යහපත් ඒවා විය. එහෙත් ඔහුගේ තේරුම් ගැනීමෙහි වරදක් ඇත. (කිසිවෙක් සම්පූර්ණ ලෙස තේරුම් ගන්නේ නැත. ඇත්තෙන්ම අපගේ නොතේරුම්කම තිබියදීත්, අප ගැළවීම ලැබුවේ දෙවියන්වහන්සේගේ කරුණාවෙනි.)

ශුද්ධාත්මයාණන්වහන්සේ යනු, අපගේ අරමුණු ඉටුකරගැනීම පිණිස දැල්විය හැකි අද්විතිය ස්විචයක් නොවන අතර, අපගේ කැමැත්ත උදෙසා වූ බල වර්ධනයක් ද නොවන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ වර්තමානයේ අප සමඟ සහ අප තුළ සිටින, අපට ප්‍රේමය, සුරක්ෂිත බව සහ ක්‍රිස්තුන්වහන්සේ තුළ අප උදෙසා වන සමීප සහභාගිකම සපයන දෙවියන්වහන්සේ වන සේක. ක්‍රිස්තුන්වහන්සේ තුළින් පියාණන්වහන්සේ අප උන්වහන්සේගේම දරුවන් බවට පත් කරගත් සේක. එය තේරුම් ගැනීමේ ආත්මික හැකියාව ශුද්ධාත්මයාණන්වහන්සේ දෙන සේක (රෝම 8:16).

ක්‍රිස්තුන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ සමඟ අසීමිත සහභාගිකම ශුද්ධාත්මයාණන්වහන්සේ අපට දෙන සේක. එහෙත් උන්වහන්සේ දිනපතා පව් කිරීමට ඇති අපගේ හැකියාව අත්හිටුවන්නේ නැත. තවමත් අප වෙත වැරදි ආශාවන්, වැරදි පෙළඹවීම්, වැරදි සිතිවිලි, වැරදි වචන සහ ක්‍රියාවන් ඇත්තේ ය. අපට යම්කිසි පුරුද්දක් නතර කිරීමට අවශ්‍ය වුවත්, එය කිරීමට අපට අපහසු බව දැනෙයි. මෙම ප්‍රශ්නවලින් අප නිදහස් වීම දෙවියන්වහන්සේගේ කැමැත්ත බව අපි දනිමු. එහෙත් එහි බලපෑම නැති කිරීමට අපට බලයක් නොමැති බව අපට පෙනෙන්නේ ය.

අප ඉතා "හොඳ" කිතුනුවන් නොවන නිසා, විශේෂයෙන්ම කිසිවක්ම සිදු නොවන බව අපට පෙනෙන විට, ශුද්ධාත්මයාණන්වහන්සේ අප ජීවිත තුළ ක්‍රියා කරන බව අපට විශ්වාස කළ හැකි ද? අප නැවත නැවතත් පාපය සමඟ අරගල කරන විට, අප තුළ සැලකිය යුතු වෙනසක් නොවන බව පෙනෙන විට, අපි වියවුල් වී දෙවියන්වහන්සේට පවා ප්‍රශ්නය විසඳිය නොහැකි බව නිගමනය කරන්නෙමු ද?

**ළදරුවන් සහ යෞවනයින්**

අපි ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ලට පැමිණි කල, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් අපි නැවත ඉපදුණ නැවත ජනිත වූ අය වන්නෙමු. අපි නව මැවිලි, නව මිනිසුන්, ක්‍රිස්තුන්වහන්සේ තුළ ළදරුවන් වන්නෙමු. ළදරුවෝ වනාහි බලවත් නොවන. හැකියාවන්ගෙන් පූර්ණ නොවූ, තනිවම පිරිසිදු කරගත නොහැකි අය වෙති. ඔවුහු වර්ධනය වන විට, යම් හැකියාවන් ලබාගනිති. එමෙන්ම ඔවුන්ට කළ නොහැකි බොහෝ දේ ඇති බව තේරුම් ගනිති. ඇතැම් විට මෙය ඉජ්ජාභංගත්වයට, කළකිරීමට හේතු වේ. ඔවුහු පාට කූරු සහ කතුරුවලින් යම් දේවල් කරමින් තමන්ට වැඩිහිටියන්ට මෙන් එම දේවල් කළ නොහැකි යයි සිතති. එහෙත් ප්‍රයෝජනවත් වන්නේ ඔවුන්ගේ කළකිරීම නොව, කාලය සහ ක්‍රියාකාරකම් පමණි.

අපගේ ආත්මික ජීවිත සම්බන්ධයෙන් ද මෙය සත්‍යයකි. ඇතැම් විට නව ඇදහිලිවන්තයින්ට මත්ද්‍රව්‍ය භාවිතය අත්හැරීමට හෝ ප්‍රකෝපකාරී බව අත් හැරීමට බලයක් ලැබේ. සමහර විට නව ඇදහිලිවන්තයින් සභාවට ක්ෂණික “වත්කම්” වේ. එහෙත් බොහෝ විට එය සිදු නොවේ. නව ඇදහිලිවතුන් තමන්ගේ පෙර තිබූ පාපයන් සහිතව, පෙර වූ පෞරුෂත්වයන් සහිතව, පෙර තිබූ බිය සහ කළකිරීම් සමඟ පොරබදිනු දැකිය හැකිය. ඔවුහු ආත්මික යෝධයෝ නොවෙති.

යේසුන්වහන්සේ පාපය ජයගත් බව අපට පවසා ඇත. එහෙත් තවමත් පාපය අප ග්‍රහණය කරගෙන ඇති බව නිසැක ලෙස පෙනේ. අපගේ පාපී ස්වභාවය පරාජයට පත් කර ඇත. එහෙත් එය තවමත් අප එහි සිරකරුවන් ලෙස සලකනු ලබයි. අනේ මා වැනි කාලකණ්ණි මිනිහෙක්! මේ මරණීය ශරීරයෙන් මා මුදන්නේ කවරෙක් ද? අපේ ස්වාමි වූ යේසුන් ක්‍රිස්තුන්වහන්සේමය (රෝම 7:24-25). උන්වහන්සේ ජය ගෙන අපටද ජයග්‍රහණය දුන්සේක.

අහෝ! අපි තවමත් ජයග්‍රහණයේ සම්පූර්ණත්වය දැක නැත්තෙමු. මරණය අභිබවා ඇති උන්වහන්සේගේ බලයත්, අපගේ ජීවිතවල පාපය සම්පූර්ණ ලෙසම අවසන් වීමත් අපි තවමත් දැක නැත්තෙමු. හෙබ්‍රෙව් 2:8 පවසන පරිදි, අපගේ පාදවලට සියල්ල යටත් කර ඇති බව අපි තවමත් නොදකිමු. අපි කරන්නේ යේසුන්වහන්සේ විශ්වාස කිරීමය. උන්වහන්සේ ජයගත් බවට අපි උන්වහන්සේගේ වචනය විශ්වාස කරන්නෙමු. උන්වහන්සේ තුළ අපත් ජයග්‍රාහකයින් බවට අපි උන්වහන්සේගේ වචනය විශ්වාස කරන්නෙමු.

අපි ක්‍රිස්තුන්වහන්සේ තුළ ශුද්ධ හා පවිත්‍ර බව දන්නා නමුත්, අපගේ පෞද්ගලික පාපයන් ජයගැනීමේ ප්‍රවණතාවක් දැකීමට අපි කැමති වෙමු. එවන් වූ ප්‍රවණතාවයක් ඇතැම් විට අතිශය වේදනාකාරී ලෙස ප්‍රමාද බව පෙනේ. එහෙත් අපගේ සහ වෙනත් අයගේ ජීවිත තුළ උන්වහන්සේ පොරොන්දු වූ දේ ඉටු කිරීමට අපට දෙවියන්වහන්සේ විශ්වාස කළ හැකිය. සියල්ලට පසුව, එය උන්වහන්සේගේ මිස, අපගේ කාර්ය නොවේ. උන්වහන්සේගේ මිස, අපගේ බලය නොවේ. උන්වහන්සේගේ න්‍යාය පත්‍රය මිස, අපගේ නොවේ. අපගේ ජීවිත දෙවියන්වහන්සේට භාර දෙන කල, උන්වහන්සේ වෙත රැඳී සිටීමට කැමති විය යුතු ය. උන්වහන්සේ නිවැරදි යයි දන්නා ආකාරයටත්, නියමිත වේගයටත් එම කාර්ය අප තුළ කිරීම පිණිස උන්වහන්සේ විශ්වාස කිරීමට අපි කැමති විය යුතු වෙමු.

තම පියවරුන්ට වඩා තමා දන්නා බව යෞවනයෝ බොහෝ විට සිතති. ජීවිතය ගැන සියල්ල ඔවුන් දන්නා බවත්, ඔවුන්ට කැමති ආකාරයකට එය හැඩගස්වා ගත හැකි බවත් ඔවුහු සිතති (සැම යෞවනයෙක්ම එසේ නැත. එහෙත් ඇතැම් සාධක මත මෙය පදනම්ව ඇත).

කිතුනුවන් ලෙස අපි ද ඇතැම් විට යෞවනයින් සේ සිතන්නෙමු. ආත්මිකව "වර්ධනය වීම" පදනම් වන්නේ නිවැරදි හැසිරීමෙන් බව සිතා, දෙවියන්වහන්සේ සමඟ අපගේ සිටගැනීම අපගේ හැසිරීම මත තීරණය වන බව සිතන්නෙමු. අපි නිවැරදිව හැසිරෙන විට, ඒ ආකාර හොඳින් හැසිරෙන්නේ නැති අයගේ ජීවිත දෙස පහත් ලෙස බැලීමට පෙළඹවීමක් ඇති වේ. අපි හොඳින් හැසිරෙන්නේ නැති විට, දෙවියන්වහන්සේ අප අත්හැර දමා ඇතැයි බලාපොරොත්තු සුන් කරගෙන දොම්නසට පත් වන්නෙමු.

එහෙත් දෙවියන්වහන්සේ සමඟ අපගේ ජීවිත නිවැරදි කිරීම දෙවියන්වහන්සේ අපෙන් ඉල්ලන්නේ නැත. දුෂ්ට අය ධර්මිෂ්ඨ කරන (රෝම 4:5), අපට ප්‍රේම කරන සහ ක්‍රිස්තුන්වහන්සේ වෙනුවෙන් අප ගළවනු ලැබූ උන්වහන්සේ විශ්වාස කිරීමට උන්වහන්සේ අපෙන් ඉල්ලන සේක. අපි ක්‍රිස්තුන්වහන්සේ තුළ පරිණත වන විට, අප උදෙසා අධික ලෙස ක්‍රිස්තුන්වහන්සේ තුළ ප්‍රකාශ කරනු ලැබූ දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙහි අපි වඩා ස්ථිර ලෙස විවේක ගන්නෙමු (1 යොහන් 4:9). අපි උන්වහන්සේ තුළ විවේක ගන්නා විට, "උන්වහන්සේ ඔවුන්ගේ දෙනෙතින් සියලු කඳුළු පිසදමන සේක. මරණය තවත් නැත. වැලපීම ද, හැඬීම ද වේදනාවද තවත් නැත. පළමු පිළිවෙළ පහව ගියේ ය" යන එළිදරව් 21:4 සඳහන් වන ඉදිරියේ ඇති දිනය බලාසිටින්නෙමු.

**සම්පූර්ණත්වය !**

එම දිනය පැමිණි විට, මොහොතකින්, ඇසිපිය හෙළන සැණෙකින් අපි සියල්ලෝ වෙනස් කරනු ලබන බව පාවුල්තුමා පවසයි. එවිට අපි අමරණීය, අජරාමර, නොදිරන ස්වභාවයට පත් වන්නෙමු (1 කොරින්ති 15:52-53). දෙවියන්වහන්සේ බාහිර මනුෂ්‍යයා නොව, අභ්‍යන්තර මනුෂ්‍යයා මුදන සේක. උන්වහන්සේ දුර්වල සහ දිරන සුළු අපගේ ඇතුළාන්ත මනුෂ්‍යයා තේජාන්විත සහ පාප රහිත (සියල්ලට වඩා වැදගත්ම දේ) ස්වභාවයට වෙනස් කරන සේක.

ක්ෂණයකින්, අන්තිම හොරණෑව පිඹින කල, අපි වෙනස් කරනු ලබන්නෙමු. අපගේ ශරීර ගළවනු ලබන්නේ ය (රෝම 8:23). එහෙත් එයටත් වඩා, අවසානයේ දී, උන්වහන්සේගේ ප්‍රකෘති ස්වභාවයෙහිම අපි උන්වහන්සේ දකින්නෙමු (1 යොහන් 3:2). ක්‍රිස්තුන්වහන්සේ තුළ දෙවියන්වහන්සේ සත්‍යයක් බවට පත් කළ දැනට අදෘශ්‍යමානව තිබෙන යථාර්ථය දකින්නෙමු.

ක්‍රිස්තුන්වහන්සේ තුළින්, අපගේ පැරණි පාපි ස්වභාවය පරාජය වී, බිඳවැටී ඇත. ඇත්තෙන්ම එය මැරී ඇත. "මන්ද ඔබ මැරුණු බැවින්, දැන් ඔබේ ජීවිතය ක්‍රිස්තුන්වහන්සේ සමඟ දෙවියන්වහන්සේ තුළ සැඟවී පවතියි" (කොලොස්සි 3:3) යනුවෙල් පාවුල්තුමා පවසයි. "පහසුවෙන් අප වෙළා ගන්නා" පාපය "ඉවත දමා" (හෙබ්‍රෙව් 12:1) ඇත. එය ක්‍රිස්තුන්වහන්සේ තුළ සිටීමට දෙවියන්වහන්සේ සෑදූ නව මනුෂ්‍යයාගේ කොටසක් නොවේ. ක්‍රිස්තුන්වහන්සේ තුළ අපට නව ජීවිතයක් ඇත.

ක්‍රිස්තුන්වහන්සේගේ පැමිණීමේ දී, ක්‍රිස්තුන්වහන්සේ තුළ අපගේ පියාණන්වහන්සේ අප සාදා ඇති ආකාරය අපි දකින්නෙමු. අප සැබවින්ම සිටින ආකාරයෙන්, අපගේ සැබෑ ජීවනය වන ක්‍රිස්තුන්වහන්සේ තුළ සම්පූර්ණ ලෙස අප දකින්නෙමු (කොලොස්සි 3:3-4). අප මැරී, ක්‍රිස්තුන්වහන්සේ සමඟ නැවත නැගිටුවනු ලැබුවේ අප තුළ තිබෙන ලෞකික දේ "නසා දැමීම" (5 පදය) පිණිසය.

අප සාතන්ගෙන් (පාපයෙන් සහ මරණයෙන්) ජයග්‍රහණය ලබන්නේ එක් ආකාරයකින් පමණි. එනම් බැටළු පැටවාණන්ගේ ලේ තුළින් පමණි (එළිදරව් 12:11). අපට පාපය සහ මරණය පරදා ජයග්‍රහණය ඇත්තේ ක්‍රිස්තුන් යේසුන්වහන්සේ කුරුසිය මත දී දිනාගත් ජයග්‍රහණය තුළින් මිස, පාපයට විරුද්ධව අප කළ සටනින් නොවේ. පාපයට විරුද්ධව අපගේ සටන අප ක්‍රිස්තුන්වහන්සේ තුළ සිටින බව, තවදුරටත් අප දෙවියන්වහන්සේගේ සතුරන් නොව මිතුරන් බවත්, දෙවියන්වහන්සේගේ යහපත් කැමැත්ත කිරීමට අප තුළ ක්‍රියා කරන (පිලිප්පි 2:13) ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් උන්වහන්සේ සමඟ සහභාගිත්වය දරන බවත් විදහා පාන්නකි.

ක්‍රිස්තුන්වහන්සේ තුළ වූ අපගේ ධර්මිෂ්ඨකම පාපයට විරුද්ධ වූ අපගේ සටන හේතුවෙන් ඇති නොවේ. එය ශුද්ධකම ඇති නොකරයි. ක්‍රිස්තුන්වහන්ස් තුළ අප කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේම ප්‍රේමය සහ අනුග්‍රහය අපගේ ගැළවීම සඳහා වූ එකම හේතුව වන්නේ ය. ක්‍රිස්තුන්වහන්සේ තුළ අප ධර්මිෂ්ඨ කරනු ලැබ, සියලු පාපවලින් සහ අභක්තියෙන් අප මුදවා ඇත. එසේ කළේ දෙවියන්වහන්සේ ප්‍රේමයෙන් සහ අනුග්‍රහයෙන් පූර්ණ බැවින් මිස, වෙන හේතුවක් නිසා නොවන්නේය. ක්‍රිස්තුන්වහන්සේ තුළ අපට දී තිබෙන අලුත් සහ ධර්මිෂ්ඨ ඵලයක් මිස, පාපයට හේතුකාරකයක් නොවේ. අප පව්කාරයින්ව සිටියදීම ක්‍රිස්තුන්වහන්සේ අප උදෙසා මැරුණු සේක (රෝම 5:8).

ක්‍රිස්තුන්වහන්සේ තුළ අප ජීවත් වීමට දෙවියන්වහන්සේ සැලැස්වූ නිසාත්, ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ ක්‍රියා කරන නිසාත්, අපි පාපයට වෛර කරන්නෙමු, පාපය සමඟ අරගල කරන්නෙමු, පාපය විසින් අපට සහ අනෙක් අයට ඇති කරන වේදනාව සහ දුක මඟහැරීමට අපට අවශ්‍යය. අප ක්‍රිස්තුන්වහන්සේ තුළ සිටින නිසා "පහසුවෙන් අප වෙළාගන්නා" (හෙබ්‍රෙව් 12:1) පාපයන්වලට විරුද්ධව සටන් කළ හැකි වේ. එහෙත් අප ජය ලැබුවේ අපගේම හැකියාවෙන් නොව, ශුද්ධාත්මයාණන්වහන්සේ මඟින් බලගන්වන ලදුව අපගේම හැකියාවෙන් ද නොවේ. අප ජය ලැබුවේ ක්‍රිස්තුන්වහන්සේගේ රුධිරය තුළිනි. දෙවියන්වහන්සේගේ මාංශවත් වූ පුත්‍රයාණන් ලෙස, අප වෙනුවෙන් මාංශවත් වූ දෙවියන්වහන්සේගේ මරණය සහ උත්ථාන වීම තුළිනි.

අපගේ ගැළවීම උදෙසා අවශ්‍ය වූ සියල්ල දෙවියන්වහන්සේ ක්‍රිස්තුන්වහන්සේ තුළ දැනටමත් සිදු කර හමාරය. එසේම, ක්‍රිස්තුන්වහන්සේ තුළ උන්වහන්සේ දැනගැනීමට කැඳවීම කරණකොටගෙන අපගේ ජීවිතය සහ භක්තිමත්කම සඳහා අවශ්‍ය සියල්ල දැනටමත් දී තිබේ. උන්වහන්සේ අතිශයින්ම යහපත් නිසාවෙන් මෙය සිදු කර ඇත්තේ ය (2 පේදුරු 1 : 2-3).

හැඬීමක්වත්, වැළපීමක්වත්, රිදවීමක්වත්, වේදනාවක්වත් නොමැති කාලයක් පැමිණෙන බව එළිදරව් පොත අපට අපවසි. එහි අර්ථය වන්නේ වේදනාව ඇති කරන පාපය තව දුරටත් නොමැති බවයි. ක්ෂණයකින්, ඇසිපිය හෙළන සැණෙකින් අන්ධකාරය අහෝසි වී, අපි පාපයේ සිරකරුවන් බවට වූ සිතිවිල්ලෙන් අප රැවටීමට තවදුරටත් පාපයට නොහැකි වනු ඇත. අපගේ සැබෑ නිදහස, ක්‍රිස්තුන්වහන්සේ තුළ වූ අපගේ නව ජීවිතය එහි තේජාන්විත අසිරිමත් බව සහිතව උන්වහන්සේ සමඟ බැබළෙනු ඇත. එසේම, අපි උන්වහන්සේගේ පොරොන්දුවේ වචනය විශ්වාස කරමු. එය සිතා බැලීමට වටිනා කරුණකි.

## ගෝලත්වය 101

## ඒකකය 6 අ



# ගැළවීම

මුදවාගැනීම! ගැළවීම යනු මුදවාගැනීමේ කාර්යකි. ගැළවීම තේරුම්ගැනීමට නම්, ප්‍රශ්නය කුමක් ද යන්න, ඒ සඳහා දෙවියන්වහන්සේ කළේ කුමක් ද යන්න සහ අප විසින් ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න අප විසින් දැනගත යුතු වේ.

**මනුෂ්‍යයෝ යනු කවරහු ද?**

දෙවියන්වහන්සේ මනුෂ්‍යයින් මවනු ලද අවස්ථාවේ දී, උන්වහන්සේගේම "ස්වරූපයෙන්" ඔවුන් මැවූ සේක. එසේම උන්වහන්සේ තමාගේ මැවිල්ල "ඉතා යහපත්" බව කී සේක (උත්පත්ති 1 : 26 - 27, 31). මනුෂ්‍යයෝ ඉතා මනහර මැවිල්ලක් වූහ. : දූවිල්ලෙන් මවන ලද නමුත්, දෙවියන්වහන්සේගේ හුස්මෙන් බලවත් කරන ලද්දෝ ය (උත්පත්ති 2 : 7).

"දෙවියන්වහන්සේගේ ස්වරූපය" යන්නට සාමාන්‍යයෙන් බුද්ධිමත්භාවය, නිර්මාණාත්මක බව සහ බලය ඇතුළත් වේ. එසේම සම්බන්ධතාවයන් පැවැත්වීමේ හැකියාව සහ සදාචාරාත්මක තෝරාගැනීම් කිරීමේ හැකියාව ද එයට ඇතුළත් වේ. අපි යම් ආකාරයකින් දෙවියන්වහන්සේ හා සමාන වන්නෙමු. දෙවියන්වහන්සේ ගේ මනසේ අප වෙනුවෙන්, උන්වහන්සේගේ දරුවන් වෙනුවෙන් විශේෂ යමක් ඇත්තේ ඒ නිසාවෙනි.



දෙවියන්වහන්සේ විසින් නොකරන්නට යයි අනතුරු ඇඟවූ යමක් පළමු මනුෂ්‍යයින් කළ බව (උත්පත්ති 3 : 1-13) උත්පත්ති පොත අපට පවසයි. ඔවුන්ගේ අකීකරුකම ඔවුන් දෙවියන්වහන්සේ විශ්වාස නොකළ බව පෙන්වන්නේ ය. ඔවුන් කෙරෙහි වූ දෙවියන්වහන්සේගේ විශ්වාසය උල්ලංඝනය කිරීමක් විය. ඇදහිල්ල නොමැතිකමින්, ඔවුන් තම සම්බන්ධතාවය බිඳගත් අතර, දෙවියන්වහන්සේට ඔවුන්ගෙන් අවශ්‍ය දේ කිරීමට ඔවුන්ට නොහැකි විය. ඔවුහු දෙවියන්වහන්සේ මෙන් වීමෙන් අඩු වූහ. දෙවියන්වහන්සේ පැවසූ පරිදි, එහි ප්‍රතිඵලය වූයේ වියවුල, වේදනාව සහ මරණයයි (16-19 පද). ඔවුහු මැවුම්කරුවාණන්ගේ මඟපෙන්වීම් ක්‍රියාත්මක නොකරන්නෝ නම්, ඔවුහු අමාරුවෙන් වැඩකටයුතු කළ යුතු වන්නෝ ය.

මනුෂ්‍යයෝ එකම අවස්ථාවේ දී උදාර මෙන්ම අශිෂ්ට වෙති. අපට උසස් කාල්පනික දේ තිබිය හැකිය. එසේ වුවත් තවමත් අශිෂ්ට විය හැකි ය. අපි දෙවියන්වහන්සේ මෙන් වුව ද,

අභක්තික අය වෙමු. අප සිටින්නේ අප සිටිය යුතු ආකාරයට නොවේ. අපි අපගේ ජීවිත අවුල් කරගෙන තිබුණේ වී නමුත්, තවමත් දෙවියන්වහන්සේ අප තුළ උන්වහන්සේගේ ස්වරූපය හැඩගස්වමින් සිටින සේක (උත්පත්ති 9:6). විය හැකි දෙය නම්, තවමත් දෙවියන්වහන්සේ මෙන් වීමට අපට හැකිය. උන්වහන්සේට අප මුදවාගැනීමට, ගළවා ගැනීමට, උන්වහන්සේ සමඟ පැවති සම්බන්ධතාවය ප්‍රතිස්ථාපනය කිරීමට උන්වහන්සේට අවශ්‍ය ඒ නිසාවෙනි.

අපට සදාකාල ජීවනය, වේදනාවෙන් නිදහස දීමට සහ දෙවියන්වහන්සේ සහ එකිනෙකා සමඟ යහපත් සබඳතාවයක් ඇති කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍ය වේ. යහපත සඳහා අපගේ බුද්ධිය, නිර්මාණශීලි බව සහ බලය භාවිත කිරීම උන්වහන්සේට අවශ්‍ය වේ. පළමුවන මනුෂ්‍යයින් සිටියාට වඩා හොඳින් අප දෙවියන්වහන්සේ මෙන් වනවාට උන්වහන්සේට අවශ්‍ය වේ. මෙය ගැළවීම වේ.

**සැලැස්මේ කේන්ද්‍රය**

අප ගැළවීම ලැබීම අවශ්‍ය වේ. දෙවියන්වහන්සේ මෙය ඉටු කළ සේක - එහෙත් උන්වහන්සේ එසේ කළේ කිසිම මනුෂ්‍යයෙකු බලාපොරොත්තු වූ ආකාරයට නොවේ. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් මනුෂ්‍යයෙකු බවට පත් වී සම්පූර්ණ ජීවිතයක් ගත කළ අතර, අපි උන්වහන්සේ මරා දැමුවෙමු. දෙවියන්වහන්සේ පවසන පරිදි, එය අපට අවශ්‍ය වන ගැළවීම වේ. කෙතරම් උත්ප්‍රාසයක් ද! අපි ගැළවීම ලැබුවේ බිලි දීමක් මඟිනි. අප වෙනුවෙන් පාපයට දඬුවම් ලැබීමට හැකි වන පිණිස අපගේ මැවුම්කරුවාණෝ මාංශවත් වූ සේක. එහෙත් දෙවියන්වහන්සේ නැවත උන්වහන්සේ ජීවනයට නැගිටෙවූ සේක. යේසුන්වහන්සේ තුළින් අපව ද නැවත නැගිටුවන බවට උන්වහ්සේ පොරොන්දු වූ සේක.

යේසුන්වහන්සේගේ මරණය සහ උත්ථානය තුළ මනුෂ්‍යයින්ගේ මරණය සහ ගැළවීම නියෝජනය වූ අතර, එය විය හැකි දෙයක් බවට පත් විය. අපගේ අසමර්ථකමට සුදුසු දෙය වන්නේ උඋන්වහන්සේගේ මරණයයි. එසේම අපගේ මැවුම්කරුවාණන් ලෙස, අපගේ අසමර්තකම් සියල්ල වෙනුවෙන් උන්වහන්සේ මිලයක් ගෙවූ සේක. උන්වහන්සේ මරණය ලබන්නට සුදුසු නැති වුවත්, අපගේ පාප වෙනුවෙන්, අප වෙනුවෙන් කැමැත්තෙන් මැරුණු සේක.

යේසුන් ක්‍රිස්තුන් වහන්සේ අප වෙනුවෙන් මැරුණු සේක. එසේම අප වෙනුවෙන් නැවත නැගිටුවනු ලැබූ සේක (රෝම 4:25). අපගේ පැරණි ස්වභාවය උන්වහන්සේ සමඟ මැරුණේය. නව ස්වභාවයක් උන්වහන්සේගේ ජීවනය සමඟ ගෙනෙනු ලැබීය (රෝම 6:3-4). එක පූජාවක් තුළ යේසුන්වහන්සේ "සකල ලෝකයාගේ පව් උදෙසා" (1 යොහන් 2:2) මිලය ගෙවූ සේක. ගෙවීම සිදු කර අවසානය. ප්‍රශ්නය වන්නේ අප එහි ප්‍රතිලාභ ලබනවාද යන්නයි. පසුතැවිලි වීම සහ ඇදහිල්ල තුළින් අපි මෙම සැලැස්මට සහභාගි වන්නෙමු.

**පසුතැවිලි වීම**

යේසුන්වහන්සේ පැමිණියේ මිනිසුන් පසුතැවිලි වීම සඳහා කැඳවීමට ය (ලූක් 5:32). පසුතැවිලි වී කමාව ලබන පිණිස දෙවියන්වහන්සේ වෙත හැරෙන ලෙස පේදුරුතුමා කීවේ ය (ක්‍රියා 2:38, 3:19). "මනස්ථාපනයෙන් දෙවියන්වහන්සේ වෙත හැරෙන ලෙස" පාවුල්තුමා මිනිසුන්ට කිවේය (ක්‍රියා 20:21).

මනස්ථාපනය යනු පාපයෙන් ඉවත් වී දෙවියන්වහන්සේ වෙත හැරීමයි. නොදන්නා කාලයේ දී කළ රූප වන්දනය දෙවියන්වහන්සේ බලා සිටි බවත්, එසේ වුවත් "දැන් සියලු මනුෂ්‍යයින්ට සියලු තැන්හි මනස්ථාපනය වන්නට දැන් අණ කරන සේක" යයි පාවුල්තුමා ඇතනිසියන්වරුන්ට කීවේය (ක්‍රියා 17:30). ඔවුහු තමුන්ගේ රූප වැඳීම නතර කළ යුතු විය.

කොරින්තියේ ඇතැම් කිතුනුවන් තමුන්ගේ ලිංගික පාප පිළිබඳ පසුතැවිලි නොවන බව පාවුල්තුමා අවධානය යොමු කළේ ය (2 කොරින්ති 12:21). මෙම මනුෂ්‍යයින්ට මනස්ථාපනය යන්නෙන් අර්ථවත් වුයේ තමාගේ සදාචාරවත් නොවන පැවැත්ම නතර කිරීමට ඇති කැමැත්තයි. මනුෂ්‍යයින් "මනස්ථාපනය වූ බව දක්වන ක්‍රියා කරන්න" (ක්‍රියා 26 : 20) අවශ්‍ය බව පාවුල්තුමා දේශනා කළේය. අපි අපගේ ආකල්පය සහ හැසිරීම වෙනස් කරන්නෙමු.

අපගේ ධර්ම නියාමක පදනමේ කොටසක් වන්නේ "නිෂ්ඵල ක්‍රියාවලින් හැරීම" වේ (හෙබ්‍රෙව් 6:1). එහෙත් සර්ව සම්පූර්ණ හැසිරීමක් මෙයින් අදහස් නොවේ. කිතුනුවෝ සර්ව සම්පූර්ණ අය නොවෙති (1 යොහන් 1: 8). මනස්ථාපනය අපි අපගේ ඉලක්කයට ළඟා වූ බවක් අදහස් නොකරයි. එහෙත් අපි නිවැරදි මාර්ගයේ ගමන ආරම්භ කර ඇති බව දක්වයි.

තව දුරටත් අපි අපවම සතුටු කරගන්නේ නැත. අපි ක්‍රිස්තුන්වහන්සේ සතුටු කරන මෙන් ජීවත් වන්නෙමු (2 කොරින්ති 5 : 15, 1 කොරින්ති 6 : 20). "ඔබ වරක් අයුතුකම් කරන ලෙස ඔබේ ඉන්ද්‍රියයන් අපිරිසිදුකමේත්, අයුක්තියේත් වහල් සේවයට භාර දුන්නාක් මෙන් දැන් පාරිශුද්ධත්වය සඳහා ඔබේ ඉඳුරන් ධර්මිෂ්ඨකමේ වහල් සේවයට භාර දෙන්න" යයි පාවුල්තුමා අපට කියයි (රෝම 6 : 19).

**ඇදහිල්ල**

කෙසේ වෙතත්, මනුෂ්‍යයින්ට පසුතැවිලි වීමට සරල ලෙස පැවසීම මඟින් ඔවුන්ගේ අසමත්කම්වලින් ඔවුන් මුදා හැරීමක් සිදු නොවේ. වසර දහස් ගණනාවක් පුරා මනුෂ්‍යයින්ට කීකරු වීමට පවසා ඇත. එහෙත් තවමත් ඔවුන්ට මිදීමක් අවශ්‍ය වේ. වැඩිපුර දෙයක් එනම්, ඇදහිල්ල හෝ විශ්වාසය අවශ්‍ය වේ. පසුතැවිලි වීමට වඩා ඇදහිල්ල පිළිබඳ නව ගිවිසුම පවසයි. සාමාන්‍ය ප්‍රමාණයට වඩා අට වතාවක් ඇදහිල්ල යන්න භාවිත වේ.

යේසුන්වහන්සේ කෙරෙහි අදහන කවරෙක් නමුත් කමාව ලබන්නේ ය (ක්‍රියා 10 : 43). "ස්වාමින් වන යේසුන් ක්‍රිස්තුන් වහන්සේ අදහා ගන්න. එවිට ඔබ ගැළවෙන්නෙහිය" (ක්‍රියා 16 : 31). ශුභාරංචිය "අදහාගන්නා සියල්ලන්ට ... එය ගැළවීම සලසන දෙවියන්වහන්සේගේ බලය" වේ (රෝම 1 : 16). කිතුනුවන් පසුතැවිලි වුවන් ලෙස නොව, ඇදහිලිවතුන් ලෙස හඳුනාගැනේ. විශ්වාසය යනු පැහැදිලි වූ චරිත ලක්ෂණයකි.

විශේෂිත කරුණු සමහරක් විශ්වාස කිරීම - පිළිගැනීම යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? එවැනි වූ විශ්වාසයක් ග්‍රීක වචනයෙන් අර්ථ දැක්විය හැකිය. එහෙත් විශ්වාස කිරීමට වඩා යමක් එයින් ගම්‍ය වේ. ක්‍රිස්තුන් යේසුන් වහන්සේ තුළ අදහාගන්න යයි පාවුල්තුමා ධෛර්ය දෙන කල, ඔහු කරුණු අවධාරණය නොකරයි (යක්ෂයා යේසුන්වහන්සේ ගැන කරුණු දනියි. එහෙත් ඔහු ගැළවීම ලබා නැත.)

අපි යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළ අදහන කල, අපි උන්වහන්සේ විශ්වාස කරන්නෙමු. උන්වහන්සේ විශ්වාසවන්ත සහ විශ්වාස කළ හැකි අයෙක් බව අපි දනිමු. අප ගැන සලකන

බවට සහ උන්වහන්සේ පොරොන්දු වූ දේ අප කෙරෙහි ඉටු කරන බවට අපට සහතික විය හැකිය. මනුෂ්‍යත්වයේ නරකම ප්‍රශ්නවලින් අප මුදාගැනීම සම්බන්ධයෙන් අපට උන්වහන්සේ විශ්වාස කළ හැකිය. ගැළවීම උදෙසා අපි උන්වහන්සේ වෙත හැරෙන කල, අපට උපකාර අවශ්‍ය බවත්, උන්වහන්සේට එය සැපයිය හැකි බවත් අපි පිළිගන්නෙමු.

අපගේ ඇදහිල්ල අප ගළවා නොගනියි. අපගේ ඇදහිල්ල වෙන දෙයක් කෙරෙහි නොව, උන්වහන්සේ තුළ තිබිය යුතු වේ. අපි උන්වහන්සේට අප කැප කරමු, උන්වහන්සේ අප ගළවන සේක. අපි ක්‍රිස්තුන්වහන්සේ තුළ අදහන කල, අප ගළවා ගැනීමට උත්සහා කිරීම අප නතර කරන්නෙමු. අපි යහපත් හැසිරීමක් ඇතිව සිටීමට උත්සහා කළ ද, අපගේ උත්සහායන් අප ගළවන බව අපි විශ්වාස නොකරමු (මහත් උත්සහාය කිසිවෙකු පරිපූර්ණත්වයට පත් නොකරයි). අපගේ උත්සහායන් අසාර්ථක වූ විට අපි නොකැළඹෙන්නෙමු. මන්ද ගැළවීම උදෙසා අපි ක්‍රිස්තුන්වහන්සේ තුළ මිස, අප තුළම විශ්වාසය තබා නොමැති බැවිනි. අපගේ සහතිකය ඇත්තේ උන්වහන්සේ තුළ මිස, අපගේ සාර්ථකත්වය හෝ අසමත්කම මත නොවේ.

ඇදහිල්ල යනු මනස්ථාපනය සඳහා උනන්දු කරවන්නකි. අපගේ ගැළවුම්කරුවාණන් වශයෙන් අපි යේසුන් වහන්සේ විශ්වාස කරන කල, දෙවියන්වහන්සේ අපට බොහෝ ප්‍රේම කරන බවත්, ඒ නිසාවෙන් තම පුත්‍රයාණන් අප වෙනුවෙන් මැරෙන පිණිස එවූ බවත් අපි අවබෝධ කරගන්නා කල, අප වෙනුවෙන් ඉතාම යහපත් දේ උන්වහන්සේට අවශ්‍ය බව දැනගන්නා කල අපි උන්වහන්සේ සතුටු කිරීමටත්, උන්වහන්සේ උදෙසාත් ජීවත් වීමට කැමති වන්නෙමු. අපි තෝරාගැනීමක් කරන අතර, අප මෙතෙක් ගත කළ අර්ථයක් නැති, වියවුල්කමේ ජීවිතය අත්හරින්නෙමු. ජීවිතය කුමනාකාර විය යුතුද යන උන්වහන්සේගේ අරමුණ සහ මාර්ගය පිළිගන්නෙමු.

ඇදහිල්ල යනු, සියලු වෙනස්කම් ඇති කරන අභ්‍යන්තර වෙනස් වීමකි. අපගේ ඇදහිල්ල යේසුන්වහන්සේ අප වෙනුවෙන් උපයා ගත් දෙයට වඩා යමක් උපයා ගන්නේවත්, එකතු කරන්නේවත් නැත. ඇදහිල්ල යනු උන්වහන්සේ කළ දෙය උදෙසා සරල ප්‍රතිචාරයක් සඳහා වූ කැමැත්තකි. අපි මඩ වළවල්වල වැඩ කරන වහලුන් හා සමාන වන්නෙමු. උන්වහන්සේ "මම ඔබගේ නිදහස මිළයට ගතිමි" යයි කියන සේක. මඩ වළෙහි නිදහසේ සිටීමට අපට පුළුවන. නැතිනම්, එය හැර දමා උන්වහන්සේ විශ්වාස කිරීමට පුළුවන. මිදීම සිදු කර හමාරය. අපගේ කොටස වන්නේ එය පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමය.

**අනුග්‍රහය**

ගැළවීම යනු අපට දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අනුග්‍රහයෙන් සහ ත්‍යාගවන්තකමෙන් දුන් ත්‍යාගයකි. අප කුමක් කළ ද, අපට එය උපයාගත නොහැකිය. "ඔබ ගැළවී සිටින්නේ දේව වරප්‍රසාදය මඟින් වූ ඇදහීම කරණකොටගෙනය. එය ඔබගේම ක්‍රියාවක් නොව, දෙවියන්වහන්සේගේ දීමනාවය. ගැළවීම පුණ්‍ය ක්‍රියාවල ප්‍රතිඵලයක් නොවන බැවින්, කිසිවෙකුට පාරට්ටුවට ඉඩක් නැත" (එපීස 2 : 8 - 9). ඔබගේ ඇදහිල්ල පවා දෙවියන්වහන්සේගෙන් වූ ත්‍යාගයකි. අප මෙතැන් සිට සම්පූර්ණ ලෙසම කීකරු වුව ද, අපි කිසිවක් ලබන්නට සුදුසු නොවෙමු (ලූක් 17 : 10).

අප මවනු ලැබ ඇත්තේ යහපත් ක්‍රියා කරන පිණිසය (එපීස 2 : 10). එහෙත් යහපත් ක්‍රියා අප ගළවා ගන්නේ නැත. ගැළවීම ලැබූ විට ඒවා කළ යුතු වේ. එහෙත් ඒවාට ගැළවීම

උපයාගත නොහැකිය. පාවුල්තුමා පවසන පරිදි ගැළවීම ව්‍යවස්ථාව රක්ෂා කිරීමෙන් ලැබේ නම් ක්‍රිස්තුන් වහන්සේ නිකරුණේ මැරුණු සේක (ගලාති 2 : 21). අනුග්‍රහය පාපය සඳහා අපට අවසර නොදෙයි. එහෙත් අප පව් කරන කල අනුග්‍රහය දෙනු ලැබිය (රෝම 6 : 15, 1 යොහන් 1 : 9). අපි කුමන යහපත් ක්‍රියාවක් කළ ද, එය අප තුළ කරන බැවින් අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු (ගලාති 2 : 20, පිලිප්පි 2 : 13).

දෙවියන්වහන්සේ "අප ගළවා ශුද්ධ වූ ජීවිතයකට අප කැඳවූ සේක. එසේ කළේ අපේම පුණ්‍ය ක්‍රියාවක් නිසා නොව, උන්වහන්සේගේම අභිප්‍රායත් දේව වරප්‍රසාදයත් අනුවය" (2 තිමෝති 1 : 9). "අප විසින්ම කළ දැහැමි ක්‍රියාවලින් නොව, හුදෙක් ස්වකීය දයාව ලෙස ... උන්වහන්සේ අප ගැළෙවූ සේක" (තීතස් 3 : 5).

ශුභාරංචියේ හදවත අනුග්‍රහයයි : අප ගැළවී සිටින්නේ දෙවියන්වහන්සේගේ දීමනාවෙන් මිස, අපගේම ක්‍රියාවලින් නොවේ. ශුභාරංචිය යනු, "උන්වහන්සේගේ අනුග්‍රහයේ පණිවුඩයයි" (ක්‍රියා 14 : 3, 20 : 24). "අප ගැළවෙන්නේ යේසුන් ස්වාමින් වහන්සේගේ වරප්‍රසාදයෙනි" (ක්‍රියා 15 : 11). "අප නිදොස් කරනු ලැබුවේ දෙවියන්වහන්සේගේ වරප්‍රසාදයෙන් ක්‍රිස්තුන් යේසුන් වහන්සේ අත් කර දුන් ගැළවීමෙනි" (රෝම 3 : 24). දෙවියන්වහන්සේගේ වරප්‍රසාදයෙන් තොරව අපි බලාපොරොත්තු රහිතව පාපයේත්, වරදකාරී බවෙහිත් සිටින්නෙමු.

අපගේ ගැළවීම රඳා ඇත්තේ ක්‍රිස්තුන්වහන්සේ කළ දේ මතය. උන්වහන්සේ අප මුදවා ගත් මිදුම්කරුවාණෝ වන සේක. අපගේ කීකරුකම සැම විටම දෝෂ සහිත නිසා ඒ ගැන පුරසාරම් කීමට අපට නොහැකිය. අපට ආඩම්බර විය හැකි එකම දෙය වන්නේ ක්‍රිස්තුන්වහන්සේ කළ දෙය පමණි (2 කොරින්ති 10 : 17 - 18). අප වෙනුවෙන් පමණක් නොව, සියලු දෙනා වෙනුවෙන්ම උන්වහන්සේ එය ඉටු කළ සේක.

**ධර්මිෂ්ඨකරණය**

වන්දිය, මිදීම, සමාව දීම, සමගි කිරීම, දරුකමට පිළිගැනීම, ධර්මිෂ්ඨකරණය ආදි ලෙස බයිබලය ගැළවීම විවිධ අයුරින් පැහැදිලි කරයි. එයට හේතුව මනුෂ්‍යයින් තමාගේ ප්‍රශ්න විවිධ අයුරින් තේරුම් ගැනීමයි. අපිරිසිදු ලෙස හැඟෙන අයට ක්‍රිස්තුන්වහන්සේ පවිත්‍රත්වය පිළිගන්වන සේක. වහල් බව හැඟෙන අයට උන්වහන්සේ මිදීම හෝ මිළයට ගැනීම පිළිගන්වන සේක. වරදකාරී බව හැඟෙන අයට උන්වහන්සේ සමාව දෙන සේක.

තමා අන් සතු අයෙක් ලෙස හැඟී දුරස්ව සිටින අයට උන්වහන්සේ සමගි කිරීමත්, මිත්‍රත්වයත් පිළිගන්වන සේක. තමා නොවටිනා බව හැඟෙන අයට උන්වහන්සේ වටිනාකමේ සහතිකයක් දෙන සේක. තමා අයිති නැති බව හැඟෙන අයට උන්වහන්සේ ගැළවීම දරුකමට හදා ගැනීමක් සහ උරුමයක් ලෙස විස්තර කරන සේක. ඉලක්කයක් නැති අයට උන්වහන්සේ අරමුණක් සහ මාර්ගයක් දෙන සේක. විඩාවෙන් සිටින අයට උන්වහන්සේ විවේකය දෙන සේක. බියෙන් සිටින අයට උන්වහන්සේ බලාපොරොත්තුව දෙන සේක. කරදරයෙන් සිටින අයට උන්වහන්සේ සමාදානය දෙන සේක. ගැළවීම යනු මේ සියල්ලත් මෙයට වඩා වැඩි දෙයකුත් වේ.

ධර්මිෂ්ඨකරණය දෙස බලමු. ග්‍රීක් වචනය උසාවියක භාවිත වන වචනකි. ධර්මිෂ්ඨ කරනු ලැබූ අය "වරදකාරී නොවන" අය ලෙස සැලකේ. ඔවුන් වරදෙන් නිදහස් කර ඇත. පවිත්‍ර කර ඇත. චෝදනාවෙන් නිදොස් කර ඇත. නිර්දෝෂ යයි දක්වා ඇත. දෙවියන්වහන්සේ අප

ධර්මිෂ්ඨ කළ විට, අපගේ පාප අපට විරුද්ධව ගණන් නොගන්නා බව උන්වහන්සේ කියන සේක. එය වාර්තාවෙන් ඉවත් කර ඇත.

අප වෙනුවෙන් යේසුන් වහන්සේ මැරුණු බව අපි පිළිගන්නා විට, අපට ගැළවුම්කරුවෙක් අවශ්‍ය බව අපි පිළිගන්නා විට, අපගේ පාපවලට දඬුවම් ලැබීම සුදුසු බවත්, යේසුන්වහන්සේ අප වෙනුවෙන් එම දඬුවම විඳි බවත් පිළිගන්නා විට අපට ඇදහිල්ල ඇත. අප සමාව ලත් අය බව දෙවියන්වහන්සේ සහතික කරන සේක.

ව්‍යවස්ථාව පැවැත්වීමෙන් කිසිවෙකුට ධර්මිෂ්ඨ කළ නොහැකි ය. නැතිනම්, ධර්මිෂ්ඨ යයි කිව නොහැකිය (රෝම 3 : 20). මන්ද ව්‍යවස්ථාව ගළවාගන්නේ නැත. එය අපට ලඟා විය නොහැකි ප්‍රමිතියකි. එම මිනුමෙන් අපි සියල්ලෝම අසමත් වන්නෙමු (23 පදය). "යේසුන්වහන්සේ තුළ ඇදහිල්ල ඇති අය දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨ කරන සේක" (26 පදය). "මනුෂ්‍යයෙක් දේව සබඳතාවයට පමුණුවනු ලබන්නේ ව්‍යවස්ථාවේ නියමයන් පිළිපැදීමෙන් නොව ඇදහිල්ලෙන් පමණි" (28 පදය).

ඇදහිල්ලෙන් වන ධර්මිෂ්ඨකරණය පැහැදිලි කිරීමට පාවුල්තුමා "ආබ්‍රහම් දෙවියන්වහන්සේ අදහා ගත්තේය. ඒ ඇදහිල්ල නිසා ඔහු ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස උන්වහන්සේ පිළිගත් සේක" යනුවෙන් ආබ්‍රහම්ගේ ආදර්ශය භාවිත කරයි (රෝම 4 : 3. උත්පත්ති 15 : 6 හි උපුටා ගැනීමකි). ආබ්‍රහම් දෙවියන්වහන්සේ විශ්වාස කළ නිසා, දෙවියන්වහන්සේ ඔහු ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස ගණන් ගත් සේක. ධර්මිෂ්ඨකම දෙවියන්වහන්සේගේ දීමනාවක් බවත්, එය ඇදහිල්ලෙන් ලබා ගන්නා දෙයක් බවත්, ව්‍යවස්ථාව පැවැත්වීමෙන් උපයා ගත නොහැකි බවත් අපට පෙන්වන මෙය ව්‍යවස්ථාව දීමට බොහෝ කලකට පෙර සිදු වූවකි.

ධර්මිෂ්ඨකරණය සමාව දීමට වඩා වැඩි දෙයකි. අපගේ ණය ඉවත් කිරීමට වඩා වැඩි දෙයකි. ධර්මිෂ්ඨකරණය යනු ධර්මිෂ්ඨ කෙනෙකු ලෙස, යම් කිසි නිවැරදි දෙයක් කළ අයෙකු ලෙසගණන් ගැනීමයි. අපගේ ධර්මිෂ්ඨකම අපගේම ක්‍රියාවලින් නොව, ක්‍රිස්තුන්වහන්සේගෙනි (1 කොරින්ති 1 : 30). ඇදහිලිවන්තයින් ධර්මිෂ්ඨ කරනු ලැබුවේ ක්‍රිස්තුන්වහන්සේගේ කීකරුකම තුළින් යයි පාවුල්තුමා පවසයි (රෝම 5 : 19).

පාවුල්තුමා මෙසේ ද පවසයි. "අභක්තිකයා ධර්මිෂ්ඨ කරන සේක" (රෝම 4 : 5). පව්කරුවෙක් දෙවියන්වහන්සේ විශ්වාස කරන්නේ නම්, දෙවියන්වහන්සේ ඔහු ධර්මිෂ්ඨ ලෙස සලකන සේක (ඒ නිසා විනිශ්චය දිනයේ දී පිළිගන්නා සේක). දෙවියන්වහන්සේ විශ්වාස කරන පුද්ගලයා තව දුරටත් නපුර කරන්නෙක් නොවේ. මෙය ගැළවීම ලැබීමේ ප්‍රතිඵලයක් මිස, ගැළවීමට හේතුවක් නොවේ. මනුෂ්‍යයෝ "ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් නොව ... ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ල තුළින් ධර්මිෂ්ඨ කරනු ලබති" (ගලාති 2 : 16).

**නව ආරම්භයක්**

සමහර මිනිස්සු ක්ෂණයකින් ඇදහිල්ලට පැමිණෙති. ඔවුන්ගේ මොළයේ යමක් ක්ෂණිකව සිදු වී, ආලෝකයක් පැමිණ ඔවුහු යේසුන් වහන්සේ තම ගැළවුම්කරුවාණන් ලෙස පිළිගනිති. අනෙත් මිනිස්සු වඩා ක්‍රමානුකූල ලෙස ඇදහිල්ලට පැමිණෙති. ගැළවීම උදෙසා තමා නොව ක්‍රිස්තුන්වහන්සේ විශ්වාස කළ යුතු බව සෙමින් අවබෝධ කරගනිති.

මේ ක්‍රම දෙකම, මෙය නව උපතක් බව බයිබලය පවසයි. ක්‍රිස්තුන්වහන්සේ තුළ අපට ඇදහිල්ල තැබූ කල, අපි දෙවියන්වහන්සේගේ දරුවන් ලෙස අලුතින් උපදින්නෙමු (යොහන් 1 : 12 -13, ගලාති 3 : 26, 1 යොහන් 5 : 1) ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ වාසය කිරීම ආරම්භ වේ (යොහන් 14 : 17). දෙවියන්වහන්සේ අප තුළ නව මැවිල්ලක් ආරම්භ කරන සේක (2 කොරින්ති 5 : 17, ගලාති 6 : 15). පැරණි මනුෂ්‍යයා මැරෙන අතර, නව මනුෂ්‍යයෙක් මවනු ලැබේ (එපීස 4 : 22 -24). දෙවියන්වහන්සේ අප වෙනස් කරන සේක.

යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළ සහ අපි උන්වහන්සේ තුළ ඇදහිල්ලලෙන් සිටීම තුළ මනුෂ්‍යයාගේ පාපය නිසා ඇති වූ ප්‍රතිඵල දෙවියන්වහන්සේ නැති කරන සේක. අප තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රියා කිරීම නිසා නව මනුෂ්‍යත්වයත් ඇති වී තිබේ. මෙය නියත වශයෙන්ම සිදු වන්නේ කෙසේද යන්න බයිබලය නොපවසන අතර, එය සිදු වන බව පමණක් පවසයි. මෙම ජීවිතයේ ක්‍රියාවලිය ඇරඹී අනෙක් ජීවිතයේ දී අවසාන වේ. පසුව ඇති පාඩමක අපි මේ පිළිබඳ වැඩි දුරට කතා කරමු.

ඉලක්කය වන්නේ අප වඩා යේසුන් ක්‍රිස්තුන් වහන්සේ මෙන් කිරීමයි. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ සම්පූර්ණ ස්වරූපයයි (2 කොරින්ති 4 : 4, කොලොස්සි 1 : 15, හෙබ්‍රෙව් 1 : 3). එසේම අපි උන්වහන්සේගේ ස්වරූපයට පරිවර්තනය විය යුතු වෙමු (2 කොරින්ති 3 : 18, ගලාති 4 : 19, එපීස 4 : 13, කොලොස්සි 3 : 10). අපි ආත්මයෙන් - ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, දයාව සහ අනෙක් දේව ගුණාංගවලින් උන්වහන්සේ මෙන් විය යුතු වෙමු. ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ සිදු කරන්නේ එයයි. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ ස්වරූපය නැවත ඇති කරන සේක.

ගැළවීම යන්න නැවත සමගි කිරීම යන්නෙන්ද හැඳින්විය හැකිය. දෙවියන්වහන්සේ සමඟ වූ අපගේ සම්බන්ධතාවය නැවත ස්ථාපිත කිරීම (රෝම 5: 10-11, 2 කොරින්ති 5 : 18-21, එපීස 2: 16, කොලොස්සි 1:20-22). අපි තව දුරටත් දෙවියන්වහන්සේ එපා කරමින් ප්‍රතික්ෂේප නොකරමු. අපි උන්වහන්සේට ප්‍රේම කරමු. අපි සතුරන්ගෙන් මිතුරන් බවට වෙනස් කරනු ලැබ ඇත. මිතුරන්ට වඩා ඉතා වැඩියෙන් අපි දෙවියන්වහන්සේගේම දරුවන් ලෙස භාරගත් බව උන්වහන්සේ පවසන සේක (රෝම 8: 15, එපීස 1:5). අපි අයිතිවාසිකම්, වගකීම් සහ මහිමාන්විත උරුමයක් සහිත උන්වහන්සේගේ පවුලේ අය වෙමු (රෝම 8: 16, ගලාති 3 : 29, එපීස 1 : 18, කොලොස්සි 1 : 12).

අවසානයේ දී එහි වේදනාවක්, දුකක් තවත් නොවන්නේ ය (එළිදරව් 21 : 4). එහි අර්ථය වන්නේ කිසිවෙක් වැරදි නොකරන බවයි. පාපය තවත් නැත. මරණය ද තවත් නැත (1 කොරින්ති 15 : 26). අපගේ ජීවිත දෙස දැන් බැලූ විට එම ඉලක්කය බොහෝ ඈත බව පෙනේ. එහෙත් චාරිකාව (වෙනත් චාරිකාවන් සේම) ආරම්භ වන්නේ එක් පියවරකිනි. එනම්, ක්‍රිස්තුන්වහන්සේ ගැළවුම්කරුවාණන් ලෙස පිළිගැනීමේ පියවරිනි. ක්‍රිස්තුන්වහන්සේ අප තුළ ආරම්භ කළ වැඩය සම්පූර්ණ කරන සේක (පිලිප්පි 1 : 6).

අනාගතයේ දී, අපි ක්‍රිස්තුන්වහන්සේ මෙන් වන්නෙමු (1 කොරින්ති 15 : 49, 1 යොහන් 3:2). අපි සදාකාලික, විනාශ නොවන, තේජවත් සහ පාපයෙන් තොර අය වන්නෙමු. අපගේ ආත්මික ශරීරවලට අධි ස්වභාවික බලයක් ලැබෙනු ඇත. අපි වර්තමානයේ දැන සිටින ප්‍රමාණයට වඩා ඉතාම වැඩියෙන් උනන්දුව, බුද්ධිමත්භාවය, නිර්මාණශීලි බව, බලය සහ ප්‍රේමය ලබන්නෙමු. පාපය නිසා වරක් දීප්තිය අඩු වූ දෙවියන්වහන්සේගේ ස්වරූපය එය පෙර තිබුණාටත් වඩා හොඳින් නැවත පිහිටුවනු ලැබේ.

# ගෝලත්වය 101

## 6 ආ ඒකකය



දෙවියන්වහන්සේගේ අනුග්‍රහයට අපි ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? අප වෙනත් අයට, අපගේ පවුල තුළ, අසල්වාසීන් සහ වැඩ කරන ස්ථානයේ අයට වෙත එය පතුරුවා හැරීම තුළින් එයට ප්‍රතිචාර දක්වන්නෙමු. එයට නිදසුනක් ලෙස වෛවාහික සම්බන්ධතා ඇසුරෙන් පහත දැක්වෙන ලිපියෙන් ඉදිරිපත් කරන්නෙමු.

# යේසුන්වහන්සේ විවාහ වී සිටි සේක් නම් ...

යේසුන්වහන්සේ විවාහ නොවූ සේක. එහෙත් මොහොතකට උන්වහන්සේ කුමන දේවල් කරන්නට ඇත්දැයි ඇතැම් මිනිසුන් *සිතන* ආකාරය බලමු.

- **යේසුන්වහන්සේ සම්පූර්ණ නිසැකකම ලබා දෙනවා ඇත.** අනේ, එක් ගෝලයෙක් උන්වහන්සේ පාවා දුන්නේය. අනෙක් අය පළා ගියෝ ය. කාන්තාවෝ පමණක් විශ්වාසවන්ත වූහ.
- **සියලුම කතා යේසුන්වහන්සේ කරනවා ඇත.** නැවතත් වැරදිය. යේසුන්වහන්සේට තම භාර්යාව (සහාව) කතා කිරීම අවශ්‍ය ය. ඇය ඇතැම් වැරදි කරන්නීය. ඇත්තෙන්ම අපි ඉගෙන ගන්නා ආකාරය එයයි. කාන්තා සහ පුරුෂ දෙපිරිසම කතා කිරීමට පොළඹවනු ලැබේ.
- **තමාගේ භාර්යාව කෑම පිළිගන්වන විට යේසුන්වහන්සේ රූපවාහිනිය නරඹනවා ඇත.** එය මෝඩ දෙයක් නේ ද? සත්‍ය වන්නේ භාර්යාව රූපවාහිනිය නරඹන විට යේසුන්වහන්සේ කෑම පිළිගන්වන සේක. පසුවදා තමා මිය යන බව උන්වහන්සේ දැන සිටි සේක. එසේ තිබියදීත්, උන්වහන්සේ තම ගෝලයින් එකිනෙකා සමඟ තර්ක කරන විට ගෝලයින්ගේ පාද සේදූ සේක.
- **තමාගේ භාර්යාව නොපෙනෙන තරමට යේසුන්වහන්සේ අධිපතිකම් කරනවා ඇත.** වැරදිය. යේසුනවහන්සේට තම සභාව පෙන්නුම් කිරීමට අවශ්‍ය වේ. ලෝකයට ගොස් වැඩ කිරීමට තම භාර්යාව ධෛර්ය කරමින් උන්වහන්සේ තම අධිකාරිත්වය දක්වන සේක.
- **යේසුන්වහන්සේ තම දරුවන් හොඳින් හසුරුවනවා ඇත.** ප්‍රශ්නය යේසුන්වහන්සේ නොව, අපිමය. අපගේ සභාව තුළ විවාහයන් යේසුන්වහන්සේට වඩා හොඳින් සිදු වෙනවාට අපි බොහෝ විට අපේක්ෂා කරමු. කෙතරම් උපහාසයක් ද? යේසුන්වහන්සේට වඩා අපි වටිනා බව අපි සිතනවා ද?

අපිට විවාහයෙහි සිනහව ඇත්තේ සුළු ප්‍රමාණයක් බවට විවාහය සම්බන්ධව බොහෝ මිථ්‍යා මත තිබේ. එහෙත් අපි මිථ්‍යාවක ජීවත් වීමට උත්සහා කරන විට, අපි මහත් වේදනාවන් ඇති කරන්නෙමු. ස්වාමි පුරුෂයෝ සහ භාර්යාවෝ වේදනාවන් ඇති කරන්නෝ ය. අපි දෙපිරිසම පාපය තුළින් බැට කා තිබෙන අතර, පාපය මිනිසා රිදවයි.

**අවිවාහකයින්**

ඇතැම් අය අවිවාහකව සිටීම වඩා හොඳය. තවත් අය විවාහ වීම වඩා හොඳය. දෙවියන්වහන්සේ පුරුෂයා සහ ස්ත්‍රිය මැව්වේ විවාහ වීම පිණිසය. එහෙත් ඇතැම් අයට අවිවාහකව සිටීමට දෙවියන්වහන්සේ දීමනාවක් දුන් සෙක (1 කොරින්ති 7:7).

විවාහ නොවූ අය අප විසින් අගය කළ යුතු අතර, ඔවුන් සිටින ආකාරයෙන්ම ඔවුන් අගය කළ යුතු ය. අප විවාහය ගැන කතා කරන කල, විවාහ නොවූ අය සුළු කොට තැකීමට අවශ්‍ය නැත. එය සම්පූර්ණ ගෞරවාන්විත තත්වයකි. සමහර විවාහක යුවලයන් වෛවාහික යුතුකම් ඉටු නොකරන්නා සේම, ඇතැම් අවිවාහක අය ද එය ගෞරවාන්විත ලෙස භාවිත නොකරති. අප සිටින්නේ කුමන තත්වයක වුවද ප්‍රශ්නයක් නැත. අප කැඳවා ඇත්තේ සේවය කිරීම පිණිස ය.

අවිවාහකයෙක්, සම්පූර්ණ ලෙස දෙවියන්වහන්සේට කැප විය හැකි බව පාවුල්තුමා පවසයි. විවාහ වුවෙකුගේ ආශාවන් බෙදී පවතී (32-34 පද). අවිවාහක පුරුෂයින් සහ ස්ත්‍රීන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි ගාම්භිර නියෝජිතයින් වීමට පුළුවන. යේසුන්වහන්සේ අවිවාහකයෙක් වූ සේක. පාවුල්තුමා ද අවිවාහකයෙකි. ලිදියා සහ ෆේබි ද අවිවාහකයින් වන්නට ඇත.

**ඔබගේ ශරීර ඔබටම අයිති නැත**

විවාහ වුවන්ට එකානෙකා වෙනුවෙන් ඇති වගකීම් පිළිබඳ පාවුල්තුමා සාකච්ජා කරයි: "භාර්යාවගේ ශරීරයට අයිතිය ඇත්තේ ඇයට නොව පුරුෂයාට ය. එලෙසම පුරුෂයාගේ ශරීරයට අයිතිය ඇත්තේ ඔහුට නොව භාර්යාවට ය" (4 පදය).

ස්වාමි පුරුෂයාටවත්, භාර්යාවටවත් ආත්මාර්ථකාමී තීරණ ගැනීමට නොහැකි ය. තමා සිටින්නේ කොහේදැයි භාර්යාවට දැනුම් නොදී, සමහර සවස් කාලවල දී පිටතට යාමට ස්වාමි පුරුෂයාට තීරණය කළ නොහැකිය. මන්ද ඔහුගේ ශරීරය ඔහුට පමණක් නොව, භාර්යාවට ද අයිති බැවිනි. දැනගැනීමට ඇයට අයිතියක් ඇත. ආත්මිකව යහපතක් ඇති වන විට පවා, ඒක පාර්ශ්වික තීරණ ගැනීම මෙම පදයෙන් තහනම් කෙරෙයි. මෙය මාංශික කාර්යන් සම්බන්ධයෙන් දසත්‍ය වේ. එසේම මෙම ප්‍රතිපත්ති ස්වාමි පුරුෂයින්ට මෙන්ම භාර්යාවන්ට ද අදාළ වේ.

අවධානය යොමු වන්නේ ආත්ම දමනයට මිස, වෙනත් පාලනය කිරීම්වලට නොවේ. අපගේ සහකරුවාගෙන්/ සහකාරියගෙන් අපගේ අයිතිවාසිකම් ඉල්ලීමට නොහැකිය. ඔවුන්ගේ ශරීර පාලනය කිරීමට ඉල්ලීමට අපට නොහැකිය. එය අපගේ අයිතිය වුවත්, එය ඉල්ලා සිටීමෙන් ජීවත් වීමට අපට නොහැකිය. අපට කළ හැකි දෙය නම්, අපගේ සහකරුවා/සහකාරිය ගෞරවයට පත් වන ආකාරයට අපගේම ශරීර පාලනය කරගැනීමයි. වටපිටාවේ සිටින අයට

අණ දීමෙන් තොරව අප ක්‍රියා කළ යුතු වේ. අනෙක් තැනැත්තා සතුටු කිරීමට මිස, එසේ කිරීම පිණිස ඉල්ලීමට අභියෝග නොකළ යුතුය.

මේ හදවත ඔබ තුළ තිබේවා (පිලිප්පි 2: 5-10) යනුවෙන් පාවුල්තුමා ලිව්ය. යේසුන්වහන්සේ කළා සේ සිතන්න. උන්වහන්සේට උතුම් බලයක් තිබූ නමුත්, තමාගේම යහපත පිණිස එය භාවිත නොකළ සේක. උන්වහන්සේ දාසයෙකුගේ ස්වභාවය ගත් සේක. උන්වහන්සේගේ භාර්යාවට සේවය කරන පිණිස යටහත් වූ සේක. අප ක්‍රියා කරන ආකාරයෙන් දෙවියන්වහන්සේ වටිනාකම් මනින්නේ නැත. අප බොහෝ විට බලන අන්දමට නායකත්වය දෙස උන්වහන්සේ නොබලන සේක. යේසුන්වහන්සේ උන්වහන්සේගේ අයිතිවාසිකම් ඉල්ලුවේ නැත. උන්වහන්සේ තමාට පවරා තිබූ කාර්ය ඉටු කළ සේක.

ස්වාමි පුරුෂයින් සහ භාර්යාවන්ට පාවුල්තුමා ඇතැම් මාර්ගෝපදේශ ලබා දුන්නේ ය. භාර්යාවන්ට යටත් වන ලෙස (එපීස 5:22) ඔහු කීවේ ය. භාර්යාවන් උදෙසා තමාවම දීමට ස්වාමි පුරුෂයින්ට ඔහු කිවේය (25 පදය). තම භාර්යාවන් වෙනුවෙන් මිය යාමට වුව ද කැමති බව ඇතැම් ස්වාමි පුරුෂයින් ප්‍රකාශ කළ ද, තමාගේ සිතිවිල්ලක් හෝ වෙනස් කිරීමට අකමැති වෙති. එවන් ස්වාමි පුරුෂයින් උදෙසා සරල මාර්ගෝපදේශයක් මා වෙත තිබේ : දිනපතා මියයන්න. ඔබ සේවය කිරීමට අකමැති නම්, ඔබ කුඩා සිතිවිල්ලකටත් වඩා අන්ත වේ.

තමාගේ භාර්යාවන්ට ප්‍රේම කරමින් ඔවුන් රැක බලාගැනීමට පාවුල්තුමා ස්වාමි පුරුෂයින්ට කිවේය. යටත් වන ලෙස ඉල්ලීමට ඔහු පුරුෂයින්ට නොකීය. භාර්යාවන්ට යටත් වන ලෙස ඔහු කීවේ ය. එහෙත් වැඩියෙන් ප්‍රේමය හෝ වැඩියෙන් පූජා වීම් හෝ ඉල්ලීමට නොකී ය. අනෙක් පුද්ගලයා කළත්, නොකළත් අපගේ වගකීම් ඉටු කිරීම අවශ්‍ය වේ. අනෙක් පුද්ගලයාට කළ නොහැකි දේ කෙරෙහි නොව, අපට කළ හැකි කුමක්ද යන්න කෙරෙහි අවධානය යොමු කළ යුතු වෙමු.

**අද විවේකයක් ගැනීමට ඔබ සුදුසු ද?**

අපට සුදුසු දේ අපි ලැබුවා නම්, අපි මිය ගොස් ඇත්තෙමු. අපි සියල්ලෝම දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙන් ලැබීමට සුදුසු ප්‍රමාණයට වඩා ලබා ඇත්තෙමු. යේසුන්වහන්සේ තුළ අපට සදාකාල ජීවනය ලැබී ඇත. එය අපි උපයා ගත් දෙයක් නොවන අතර, අපිට කිසි දිනක උපයාගත නොහැකි දෙයකි. අපට විරුද්ධව අපගේ පාප ගණන්ගෙන ඇත්නම්, අපි දිනපතා දඬුවම් ලැබීමට සුදුසු වෙමු. එහෙත් ඒ වෙනුවට අපි ආශිර්වාද ලබමු. අපි විවේකයක් ලැබීමට සුදුසු නැති වුව ද, දෙවියන්වහන්සේ කෙසේ හෝ එය ලබා දෙන සේක.

දිනපතා අපි ලැබීමට සුදුසු වන ප්‍රමාණයට වඩා සැම විටම අපට තිබෙන ආශිර්වාද ගැන ස්තුතිවන්ත විය යුතුය. අපි අපගේ සහකරුවා/ සහකාරිය දකින විට, මට ලැබිය යුතුවාට වඩා මෙය හොඳ බව සැම විට මතක් කරගන්න. සැම විට ස්තුතිවන්ත වෙන්න.

දෙවියන්වහන්සේ ඔබට ඩොලර් මිලියන ගණනක් සමාව දී ඇති බව මතක් කරගන්න. ඔබගේ භාර්යාවගේ පාද ලිස්සන විට සමාව දෙන්න (මතෙව් 18:23-35). එකිනෙකාට හදවතින්ම සමාව දෙන්න. එසේම එය ඉක්මනින් කරන්න. අපගේ දිනපතා ජිවිතයේ ගැළවීමේ ශුභාරංචිය

ප්‍රායෝගික ලෙස අදාළ කරගන්නේ මෙසේ ය. එය අපගේ සහකරුවා/ සහකාරිය කෙරෙහි දයාවන්ත වීමට කැඳවයි. එය අප පූජා වීමට කැඳවයි.

ස්වාමි පුරුෂයෙනි, තමාගේ භාර්යාවගේ පාද සේදීමට දණ නැමීමට පවා සිදු වුවත්, ඔවුන්ට ප්‍රේම කරන්න. නැතිනම්, නැගිට පිඟන් කෝප්ප සෝදන්න. ඔවුන්ට ගෞරව කරන්න. ඔවුන් ඔබ සමඟ සදාකාල ජීවනයේ හිමිකරුවන් වන බැවින් ඔවුන් සුළු නොකරන්න.

**සේවය**

නිහතමානී වීමටත්, තමාවම පූජා කිරීමටත් පේදුරුතුමා අප කැඳවයි : සියලු මනුෂ්‍ය නියෝගවලට ස්වාමින්වහන්සේ නිසා යටත් වන්න (1 පේදුරු 2:14). ඔබ දේශයේ නීති පවත්වන්නේ නැතිනම්, ඔබගේ පවුලේ අය ඔබට කීකරු නොවීම ගැන පුදුම නොවන්න. "සේවකයෙනි, ... ඔබගේ ස්වාමිවරුන්ට ගෞරව කරමින් යටත් වෙන්න" (18 පදය). නිවසේ දී ඔබගේ නරක කට ඔබගේ ස්වාමියා දොස් නඟන්නේ නම්, ඔබගේ පවුලේ අය ඔබට ගෞරව නොකිරීම ගැන පුදුම නොවන්න.

"ඔබ කැඳවනු ලැබුයේ මේ සඳහා ය" යනුවෙන් පේදුරුතුමා ලියයි, "ක්‍රිස්තුන්වහන්සේ ඔබ උදෙසා වද විඳ ඔබ උන්වහන්සේගේ අඩි පාරේ යන පිණිස ඔබට ආදර්ශයක් දුන් සේක" (21 පදය). ඔව්. අපි පීඩා විඳීමට, අපගේ ආත්මාභිමානය පූජා කිරීමට උන්වහන්සේ අනුගමනය කරන්නෙමු. අප කරන සියල්ලෙහි දී උන්වහන්සේට කීකරු වීම අපට ප්‍රශ්නයක් නම්, අපට අවශ්‍ය දේ කිරීමේ දී මිනිසුන් අපට ගැටලුවක් වීම ගැන පුදුම විය යුතු නැත.

පේදුරුතුමා භාර්යාවන්ට මෙයට සමාන උපදේශ කිහිපයක් දෙන්නේය : "භාර්යාවෙනි, ඔබගේ ස්වාමි පුරුෂයන්ට යටත් වන්න" (3:1). එසේම ස්වාමි පුරුෂයන්ට ද උපදේශ සමහරක් ඔහු වෙත ඇත : "එසේම පුරුෂයෙනි, ඔබගේ භාර්යාවන්ට කාරුණිකව හැසිරෙන්න. .... එවිට ඔබගේ යාච්ඤාවලට බාධා නොපැමිණෙයි" (7 පදය). ඔබගේ භාර්යාවට ඔබ නිවැරදි ආකාරයට සලකන්නේ නැතිනම්, දෙවියන්වහන්සේ ඔබට සවන් දීම අපේක්ෂා කරන්නේ කෙසේ ද? කාරුණික වන්න ... එහි අර්ථය නම් ඔබගේම අවශ්‍යතාවලට ප්‍රථමයෙන් ඇයගේ අවශ්‍යතා සලකා බැලීමයි. ප්‍රේමයෙන් අර්ථ දැක්වෙන්නේ මෙයයි.

අපි එකිනෙකාට යටත් විය යුතු බව එපීස 5:21 පවසයි. අපි මෙය ඒ ආකාරයෙන්ම ඉටු නොකරන්නෙමු (දෙමාපියන් දරුවන්ට යටත් වන්නේ දරුවන් දෙමාපියන්ට යටත් වනවාට වඩා වෙනස් ආකාරයකට ය). එහෙත් එකිනෙකාගේ අවශ්‍යතා වෙනුවෙන් අපි යටත් විය යුතු වෙමු. අපට වඩා, අප ලැබීමට සුදුසු පමණට වඩා, අපගේ සහකරුවා පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ (පිලිප්පි 2:3). ස්වාමි පුරුෂයෙනි, යටත් වීම නොඉල්ලා, ආදර්ශයෙන් මඟපෙන්විය යුතුය.

තම භාර්යාවන්ට ප්‍රේම කරන පිණිස ස්වාමි පුරුෂයින් කැඳවා ඇත. මෙයින් අදහස් වන්නේ ඔවුන් භාර්යාවන් සමඟ ඉවසීමෙන් සිටිය යුතු බවයි. ඔවුන්ට කාරුණික විය යුතු බවයි. ඔවුහු ඊර්ෂ්‍යා කිරීම හෝ පාරට්ටු කිරීම නොකරති. ඔවුහු ආඩම්බර නොවෙති. නපුරු නොවෙති, තමාගේම කාරණා නොසොයති. ඔවුහු පහසුවෙන් කෝප නොවෙති. පසුගිය වැරදි සිතේ තබා නොගනිති. ස්වාමි පුරුෂයින් සැම විටම රැකබලාගත යුතු ය. සැම විටම විශ්වාස කළ යුතුය, සැම විටම ශුභවාදී විය යුතු අතර, කිසි විට අත්නැරිය යුතු ය (1 කොරින්ති 13:6-8).

ජීවමාන යාගයක් ලෙස අපම පූජා වීමට ක්‍රිස්තුන්වහන්සේ අප කැඳවන සේක. අපි අපගේ ජීවිත උන්වහන්සේට දෙන්නෙමු. උන්වහන්සේ උදෙසා ජීවත් වන්නෙමු. අපගේ දිනපතා සම්බන්ධතාවලදී අප තුළ ජීවත් වීමට උන්වහන්සේට ඉඩ හරින්නෙමු.

යහපත් විවාහ හදිසියේ ඇති නොවේ. එයට ක්‍රියා කිරීම සහ සිහියෙන් යුතුව උද්යෝගි වීම අවශ්‍ය වේ. වසරක් පාසා වසරක් අපි කෙනෙක් සමඟ ජීවත් වන විට, අපගේ ඉවසීම පරීක්ෂා කෙරෙයි. අපගේ ආත්මාර්ථකාමී බව පෙනේ. අපගේ ආත්මිකභාවය (හෝ එහි අඩුකම) සාක්ෂියක් වේ. අපිට වැරදීම් සිදු වේ. අපිට සමාව අවශ්‍ය වේ. අපි සමාව දීම අවශ්‍ය වේ.

අනුග්‍රහය අධික වේවා ! ස්වාමින්වහන්සේ ඔබට කමා කළාක් මෙන්, ඔබත් එකිනෙකාට කමා කළ යුතුය (කොලොස්සි 3:13). යේසුන්වහන්සේ ඔබගේ ස්වාමි පුරුෂයා/ භාර්යාව කරගන්න.

# ගෝලතවය 101

# ඒකකය 6 ඇ



## එකම මාර්ගය යේසුන්වහන්සේ ද?

කිතුනු ඇදහිල්ලෙහි අභිමතාර්ථය වන්නේ යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තුළින් පමණක් ගැළවීම ඇති බව යන්න ඇතැම් විට මිනිස්සු සලකති. අපගේ වර්තමාන බහුත්වවාදී සමාජය තුළ සාධාරණත්වය අපේක්ෂා කෙරේ. සාධාරණත්වය ඉල්ලයි. ආගමික නිදහස යන සංකල්පය (සියලු ආගම්වලට බලපාන) සියලු ආගම් යම් ආකාරයකින් සත්‍ය වන බවට වැරදි ලෙස අර්ථකථනය කෙරේ.

සැම මාර්ගයක්ම එකම දෙවියන් වෙත මඟපෙන්වනු ලබන බව පවසන සමහරුන් පවසන්නේ ඔවුන් එම මාර්ගයේ ගමනාන්තය/අවසානය දක්වා ගොස් පැමිණ සිටින අය ලෙසටය. එක මාර්ගයක් පමණක් විශ්වාස කරන පටු මනසින් යුත් ජනතාවට මෙය සාධාරණ නොවේ. එසේම නිදසුනක් ලෙස, වෙනත් මිනිසුන්ගේ විශ්වාසයන් වෙනස් කිරීමට නින්දාසහගත ප්‍රයත්නයක් ලෙස ඔවුහු ශුභාරංචිකරණය කරති. එසේද වුවත්, ඔවුන් අතරම එකම මාර්ගයක් විශ්වාස කරන මනුෂ්‍යයින්ගේ විශ්වාසයන් පවා වෙනස් කිරීමට ඔවුන්ට අවශ්‍ය වේ.

ඒ ගැන කුමක් ද? - යේසුන්වහන්සේ ගැළවීම උදෙසා වූ එකම මාර්ගය බව ඇත්තෙන්ම කිතුනු ශුභාරංචිය උගන්වන්නේ ද?

**වෙනත් ආගම්**

බොහෝ ආගම් පරම ඒවා වේ. ඕතඩොක්ස් යුදෙව්වරු සත්‍ය මාර්ගය ඇතැයි පවසති. මුස්ලිම්වරු දෙවියන්වහන්සේගෙන් වූ හොඳම එළිදරව්ව ඇති බව පවසති. තමා නිවැරදි බව හින්දුවරු විශ්වාස කරන අතර, තමා කරන දේ පුදුම දෙයක් නොවන බව බෞද්ධයෝ විශ්වාස කරති. මන්ද ඔවුන්ට එය නිවැරදිය. නූතන බහුත්වවාදීහු පවා, බහුත්වවාදය වෙනත් අදහස්වලට වඩා නිවැරදි බව විශ්වාස කරති.

සියලුම මාර්ග එකම දෙවිඳුන් වෙත මඟපෙන්වන්නේ නැත. වෙනස් වූ ආගම් වෙනස් දෙවිවරු ගැන පවා විස්තර කරයි. හින්දුවරුන්ට බොහෝ දෙවිවරු ඇත. එසේම, ගැළවීම යනු කිසිම දෙයක් නැති තත්වයක් ලෙස විස්තර කරයි. මෙය මුස්ලිම්වරුන් අවධාරණය කරන ඒකදේවවාදය සහ ස්වර්ගීය විපාකයන්වලට වඩා නිසැකයෙන්ම වෙනස් වූ අවසානයකි. කිසිම මුස්ලිම්වරයෙක් හෝ හින්දුවරයෙක් හෝ තමන්ගේ මාර්ගයන් එකම අවසානයක් කරා මඟපෙන්වනු ලබන බවට එකඟ නොවේ. වෙනස් වනවාට වඩා ඔවුහු සටන් කරති. එසේම බටහිර බහුත්වවාදීහු තමන්ට විරුද්ධ වීමට අවශ්‍ය නොවන ඇදහිලි සම්බන්ධයෙන් සැලකිල්ලක් නොදක්වති.

කිතුනු ශුභාරංචිය විශ්වාස නොකිරීමට මනුෂ්‍යයින්ට ඉඩහරින අතරම, එය නිවැරදි බව අපි විශ්වාස කරමු. අපි එය තේරුම් ගත් විට, විශ්වාස නොකිරීමට මනුෂ්‍යයින්ට නිදහස ඇති බව තේරුම් ගැනීමට ඇදහිල්ල අවශ්‍ය වේ.

එහෙත් අපි තමා තීරණය කරන පරිදි විශ්වාස කිරීමට ඇති මනුෂ්‍යයින්ගේ අයිතිවාසිකම් තහවුරු කරන කල, සියලුම ඇදහිලි සත්‍ය බව අපි විශ්වාස කරන බවක් අදහස් නොවේ. තමා කැමති ආකාරයට විශ්වාස කිරීමට අනෙක් මනුෂ්‍යයින්ට ඉඩ හැරීමෙන්, ගැළවීම උදෙසා වූ එකම මාර්ගය යේසුන්වහන්සේ බව විශ්වාස කිරීමෙන් අපි වැළකිය යුතු යයි අදහස් නොවේ.

**බයිබලීය ප්‍රකාශයන්**

යේසුන්වහන්සේ දෙවියන්වහන්සේ වෙතට යන එකම මාර්ගය බව උන්වහන්සේ ප්‍රකාශ කළ බව උන්වහන්සේගේ මුල්ම ගෝලයෝ අපට පවසති. ඔබ මා අනුගමනය නොකළොත් මා සමඟ දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි ඔබ නොසිටින බව උන්වහන්සේ කී සේක (මතෙව් 7:26-27). ඔබ මා ප්‍රතික්ෂේප කරන්නහු නම්, මා සමඟ සදාකාලයේ ඔබ නොසිටිනු ඇත (මතෙව් 10: 32-33).

දෙවියන්වහන්සේ "සම්පූර්ණ විනිශ්චය පුත්‍රයාණන් හට පවරා ඇත. එසේ කළේ සියලු දෙනා පියාණන්ට මෙන් ම පුත්‍රයාණෙන්ට ද ගෞරව කරන පිණිස ය. පුත්‍රයාණන්ට ගෞරව නොකරන්නා පුත්‍රයාණන් එවා වදාළ පියාණන්ට ද ගෞරව නොකරන්නේ ය" (යොහන් 5: 22-23) යයි යේසුන්වහන්සේ කී සේක. සත්‍යයේ සහ ගැළවීමේ එකම කතෘවරයාණන් තමා බව යේසුන්වහන්සේ ප්‍රකාශ කළ සේක. උන්වහන්සේ ප්‍රතික්ෂේප කරන අය දෙවියන්වහන්සේ ද ප්‍රතික්ෂේප කරන්නෝ ය.

"මම ලෝකයේ ආලෝකය වෙමි" උන්වහන්සේ කී සේක (යොහන් 8:12). "මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි. මා මඟින් මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය. ඔබ මා හඳුනන්නහු නම්, මාගේ පියාණන්වහන්සෙත් හඳුනන්නහුය" (යොහන් 14:6-7). ගැළවීම සඳහා වෙනත් මාර්ගයන් ඇතැයි කියන මිනිසුන් වැරදි බව යේසුන්වහන්සේ කී සේක.

"අන් කිසිවෙකු මඟින් ගැළවීමක් නැත. මන්ද අපේ ගැළවීම සලසා දෙන ලද අන් කිසි නාමයක් මුළු ලොවෙහිම මිනිසුන් අතර නැත" (ක්‍රියා 4:12) යනුවෙන් කීමේ දී යුදෙව් නායකයින්ට පේදුරුතුමා අවංක හා ඍජු ප්‍රකාශයක් කළේ ය.

ක්‍රිස්තුන්වහන්සේ නොදැන සිටි මිනිසුන්ට "වැරදි ක්‍රියා හා පාප හේතුකොටගෙන ඔබ මැරී සිටි කාලයක් විය" (එපිස 2:1) යනුවෙන් පාවුල්තුමා වඩා පැහැදිලිව මෙය කීවේය. ඔවුන්ට බලාපොරොත්තුවක් නොවීය, ඔවුන්ගේ ආගමික විශ්වාසයන් තිබියදීත් දෙවියන්වහන්සේ නැතිව සිටියහ (12 පදය). සිටින්නේ එකම මැදහත්කරුවෙකි. දෙවියන්වහන්සේ වෙත යාමට ඇත්තේ එක මාර්ගයක් පමණ (1 තිමෝති 2:5) ඔහු කීවේ ය. සියලු දෙනාට අවශ්‍ය මිදීමේ මිලය යේසුන්වහන්සේ ය (1 තිමෝති 4-10).ගැළවීම ලබා දෙන වෙනත් ව්‍යවස්ථාවක් හෝ මාර්ගයක් හෝ තිබේනම්, දෙවියන්වහන්සේ එසේ කරනු ඇත (ගලාති 3:21).

ලෝකයා දෙවියන්වහන්සේ හා සමගි කරනු ලැබුවේ ක්‍රිස්තුන්වහන්සේ තුළිනි (කොලොස්සි 1:20-21). අන්‍ය ජාතීන් අතර ශුභාරංචිය පැතිරවීමට පාවුල්තුමා කැඳවනු ලැබිණි. ඔවුන්ගේ ආගම්

නිෂ්ඵල යයි ඔහු කීවේ ය (ක්‍රියා 14:15). හෙබ්‍රෙව් පොතේ පවසන ආකාරයට : ක්‍රිස්තුන්වහන්සේ අනෙක් මාර්ගවලට වඩා හොඳම මාර්ගය පමණක් නොව, ඔවුන්ට විය නොහැකි උන්වහන්සේ ප්‍රබලම මාර්ගය වන සේක (හෙබ්‍රෙව් 10:11). එය සියලුම හෝ කිසිම වෙනසක් නැත්තකි. එය තවෙකකට සම්බන්ධ ප්‍රතිලාභයක් නොවේ.

ගැළවීමේ එකම මාර්ගය පිළිබඳ කිතුනු ඉගැන්වීමේ පදනම යේසුන්වහන්සේම ප්‍රකාශ කළ දේවල් සහ ශුද්ධ ලියවිල්ලේ ඉගැන්වීම් වේ. මෙයට යේසුන්වහන්සේ කවුරුන්ද යන්නත්, අනුග්‍රහය සඳහා වූ අපගේ අවශ්‍යතාවයත් සම්බන්ධ වී තිබේ.

**අනුග්‍රහය උදෙසා වූ අපගේ අවශ්‍යතාවය**

අද්විතිය ආකාරයෙන් යේසුන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වන බව බයිබලය පවසයි. දෙවියන්වහන්සේ මාංශයෙහි සිටිමින්, අපගේ ගැළවීම උදෙසා උන්වහන්සේ තමාගේ ජීවිතය දුන්සේක. යේසුන්වහන්සේ වෙනත් ආකාරයකට යාච්ඤා කළ සේක. එහෙත් එහි කිසිවෙක් නොවීය (මතෙව් 26:39). ගැළවීම පැමිණෙන්නේ පාපයේ ප්‍රතිඵල විඳීමට අප වෙනුවෙන් වූ උන්වහන්සේගේ ත්‍යාගයක් ලෙස දෙවියන්වහන්සේම මනුෂ්‍ය ලෝකයට පැමිණීමෙන්, තමාම වන්දිය ගෙවීමෙන්, අප පාපයෙන් නිදහස් කිරීමෙනි.

ගැළවීමේ මාර්ගය ලෙස ඇතැම් ක්‍රියාවන් ප්‍රමාණවත් යයි බලාපොරොත්තුවෙන් ඒවා කිරීමට එනම්, නිවැරදි යාච්ඤාවන් කිරීම, නිවැරදි දේවල් කිරීම බොහෝ ආගම්වලින් උගන්වනු ලැබේ. මනුෂ්‍යයින් උත්සහා කළොත් ඔවුන්ට හොඳ අය විය හැකි බව ඒවායින් ඉගැන්වේ. එහෙත් අප කෙසේ උත්සහා කළත්, කමන දේ කළත් හොඳ අය වීමට නොහැකි නිසා අපට අනුග්‍රහය අවශ්‍ය බව කිතුදහම උගන්වයි.

මෙම අදහස් දෙකම සත්‍ය වීමට නොහැකිය. අප කැමති වුවද, නැති වුව ද වෙනත් මාර්ගයක් ගැළවීම වෙත මඟපෙන්වන්නේ නැති බව අනුග්‍රහය පිළිබඳ ධර්ම න්‍යාය උගන්වයි.

**අනාගත අනුග්‍රහය**

යේසුන්වහන්සේ පිළිබඳ අසන්නේ නැතිව මිය යන අයට කුමක් වේ ද? යේසුන්වහන්සේ ඉපදීමට පෙර සැතපුම් ගණනාවක් ඈත ප්‍රදේශවල ජීවත් වූ අයට කුමක් වේද? ඔවුන්ට කිසියම් බලාපොරොත්තුවක් තිබේ ද?

ඔව් - ඇත්තෙන්ම. මන්ද කිතුනු ශුභාරංචිය අනුග්‍රහයේ ශුභාරංචියක් වන නිසාවෙනි. මිනිසුන් ගැළවීම ලබන්නේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා මිස, "යේසුන්වහන්සේගේ" නාමය කීමෙන් හෝ විශේෂ සූත්‍රයන් පිළිබඳ විශේෂ දැනුමක් ඇතිව සිටීම නිසා හෝ නොවන්නේ ය. ලෝකයා දැන සිටිය ද, නැති වුව ද යේසුන්වහන්සේ මුළු ලෝකයාගේ පව් උදෙසා මැරුණු සේක (2 කොරින්ති 5:14, 1 යොහන් 2:2). උන්වහන්සේගේ මරණය සියල්ලන් (අතීත, වර්තමාන, අනාගත, පලස්තීනුවන් හෝ වෙනත් ජාතීන්) උදෙසා වූ පව් සමාවේ පූජාවකි.

දෙවියන්වහන්සේ "සියල්ලන්ට මනස්ථාපනය සඳහා අවස්ථාවක් ලැබෙනු පිණිස" (2 පේදුරු 3:9) යනුවෙන් කියන කල, තමන්වහන්සේගේ වචනයට සත්‍යවාදී වන බව අපි දනිමු. උන්වහන්සේගේ මාර්ග සහ කාලයන් අපට නොපෙනුණ ද, උන්වහන්සේ විසින් සාදන ලද මනුෂ්‍යයින්ට ප්‍රේම කිරීම සම්බන්ධයෙන් අපට උන්වහන්සේ විශ්වාස කළ හැකිය.

යේසුන්වහන්සේ සරල ලෙස මෙසේ කී සේක : "දෙවියන්වහන්සේ ලෝකයාට කෙතරම් ප්‍රේම කළ සේක්ද කීවොත්, ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කළේ, උන්වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිසය" (යොහන් 3:16-17).

උත්ථාන වූ ක්‍රිස්තුන්වහන්සේ මරණය ජයගත් බව අපි විශ්වාස කරමු. එම නිසා, ගැළවීම උදෙසා උන්වහන්සේ විශ්වාස කිරීමට මඟපෙන්වීමට උන්වහන්සේට ඇති හැකියාවට බාදාවක් මතු කිරීමට මරණයට පවා නොහැකිය.

කෙසේද සහ කුමන වේලාවේද යන්න නිශ්චිත වශයෙන් අපි නොදනිමු. එහෙත් අපට උන්වහන්සේගේ වචනය විශ්වාස කිරීමට හැකි ය. එම නිසා, මෙතෙක් ජීවත් වූ සහ මින් පසුව ජීවත් වන්නට යන සියලු මනුෂ්‍යයින් - ඔවුන් මිය යන්නට පෙර, මිය යන මොහොතේ හෝ මිය ගියාට පසුව හෝගැළවීම උදෙසා උන්වහන්සේ තුළ විශ්වාස කිරීම පිණිස උන්වහන්සේ විසින් පොළඹවනු ලබන ක්‍රමයක් විශ්වාස කිරීමට අපට හැකිය. තමන් වෙනුවෙන් උන්වහන්සේ කළ දේ අවසාන මොහොතේ ඉගෙන ගෙන අවසාන විනිශ්චය දිනයේ දී ක්‍රිස්තුන්වහන්සේ වෙත හැරෙන්නෝ නම්, නිසැක ලෙසම උන්වහන්සේ ඔවුන් අහක නොදමන සේක.

එහෙත්, මනුෂ්‍යයින් ගැළවීම ලැබුවේ කවදාද යන්න හෝ එය කෙතරම් හොඳින් ඔවුන් අවබෝධ කරගත්තා ද යන්න ප්‍රශ්නයක් නොවේ. ඔවුන්ට ගැළවීම ලැබිය හැකි වන්නේ ක්‍රිස්තුන්වහන්සේ තුළින් පමණකි. හොඳින් සංවිධානය කළ, යහපත් ක්‍රියාවන් මනුෂ්‍යයෙකු ගළවා ගන්නේ නැත. ඔවුන් මහන්සි වී ඒ සඳහා ක්‍රියා කළොත් ගැළවීම ලැබීමට හැකි යයි විශ්වාස කළත් වැඩක් වන්නේ නැත.

සම්පූර්ණයෙන්ම අනුග්‍රහය සහ යේසුන්වහන්සේගේ පූජාව මිස, යහපත් ක්‍රියාවන්, ආගමික වැඩ ගණන් ගැනීමෙන් කිසිවිටක කෙනෙකු ගැළවීම ලබන්නේ නැත. එවන් වූ වෙනත් ක්‍රමයක් තිබේ නම් , දෙවියන්වහන්සේ එසේ කරනු ඇත (ගලාති 3:21).

වැඩ කිරීමෙන්, භාවනාවෙන්, ශරීරයට හානි කරගැනීමෙන්, තමා බිළි පූජා කිරීමෙන් හෝ වෙනත් මනුෂ්‍යමය උපක්‍රමයක් මඟින් ගැළවීම ලබා ගැනීමට සැබෑ ලෙසම මනුෂ්‍යයෝ උත්සහා කරන්නෝ නම්, ඔවුන්ගේ ක්‍රියාවන් දෙවියන්වහන්සේගෙන් කිසිවක්ම උපයා නොගන්නා බව ඔවුහු ඉගෙන ගන්නෝ ය. ගැළවීම අනුග්‍රහයෙන් වේ. අනුග්‍රහයෙන් පමණක්ම වේ. කිසිවෙකුට එය උපයා ගත් නොහැකි බවත්, එසේද වුවත් එය සියල්ලන්ටම ලැබිය හැකි බවත් කිතුනු ශුභාරංචිය උගන්වයි.

මනුෂ්‍යයෙක් කුමන ආගමික මාර්ගයක ගමන් කළේද යන්න ප්‍රශ්නයක් නොවේ. ක්‍රිස්තුන්වහන්සේට ඔහු එයින් මුදවාගෙන උන්වහන්සේගේ මාර්ගයෙහි පිහිටුවිය හැකිය. සියලු දෙනාට අවශ්‍ය වන පව් සමාවේ පූජාව දුන්නා වූ දෙවියන්වහන්සේගේ එකම පුත්‍රයාණෝ උන්වහන්සේය. දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ සහ ගැළවීමේ අද්විතීය මාධ්‍යය උන්වහන්සේ වන සේක. සත්‍ය යනුවෙන් යේසුන්වහන්සේම ඉගැන්වූයේ මෙයයි. යේසුන්වහන්සේ එකම අවස්ථාවේ දී පරම සහ අද්විතීය වන සේක. පටු මාර්ගය සහ මුළු ලෝකයාගේම ගැළවුම්කරුවාණෝ වන සේක. සියල්ලන්ටම විවෘතව ඇත්තා වූ ගැළවීමේ එකම මාර්ගය වන සේක.

යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තුළ ඉතා සම්පූර්ණ ලෙස පෙන්නුම් කරන ලද දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ඇත්තෙන්ම සියලු දෙනාටම අවශ්‍ය වන්නා වූ දෙයයි. ශුභාරංචිය වන්නේ, එය සියල්ලන්ට නොමිලයේ ලබා දී ඇති බවයි. එය විශිෂ්ට ආරංචියකි. එය වෙනත් අය සමඟ බෙදාගැනීමට වටිනා ආරංචියකි. එය සිහිමට වටිනා දෙයක් ද වන්නේ ය.

ගෝලත්වය 101

ඒකකය 7 අ



# කිතුනු ජීවිතය

අපි යේසුන් ක්‍රිස්තුන්වහන්සේ අපගේ මිදුම්කරුවාණන් ලෙස පිළිගත් අවස්ථාවේ දී අපගේ කිතුනු ජීවිතය ආරම්භ කරන්නෙමු. එහෙත් ක්‍රිස්තුන්වහන්සේ පිළිගැනීම යනු ආරම්භයක් පමණි. දෙවියන්වහන්සේ අප සමඟ එය තවම අවසන් කර නොමැත.

අපි ඇදහිල්ලට පැමිණි පසුව, කරන්නේ කුමක් ද? ඇදහිල්ල අපි ජීවත් වන ක්‍රමයෙහි වෙනසක් කරන්නේ කෙසේ ද? දෙවියන්වහන්සේට අප සම්බන්ධයෙන් කිරීමට අවශ්‍ය කුමක් ද? උන්වහන්සේට අප වෙනස් කිරීමට අවශ්‍ය කෙසේ ද? එසේම එම පරිවර්තනය අපි පහසුවෙන් කරන්නේ කෙසේ ද?

**අපගේ ජීවිතවල දෙවියන්වහන්සේගේ ඉලක්කය**

අප "ස්වකීය පුත්‍රයාණන්ගේ ස්වරූපයට සමාන වීම" (රෝම 8:29) දෙවියන්වහන්සේගේ කැමැත්ත වේ. අප සිටින්නේ "උන්වහන්සේගේ සමානත්වයට වඩ වඩා තේජාන්විතව පමුණුවන" (2 කොරින්ති 3:18) ක්‍රියාවලියක ය.ඇදහිලිවන්තයින් තුළ ක්‍රිස්තු ගතිගුණ "හැඩගැසෙන" පරිදි පාවුල්තුමා සේවය කළේ ය (ගලාති 4:19). ඔහු අපගේ ඉලක්කය මෙලෙස විස්තර කළේ ය : "ක්‍රිස්තුන්වහන්සේගේ පරිණතභාවයෙන් වන පූර්ණ පෞරුෂත්වයට අපි පත් වන්නෙමු" (එපීස 4:13).

දෙවියන්වහන්සේගේ දරුවන් ලෙස, අපි දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ ස්වරූපයට වඩාත් සමීප විය යුතු වෙමු. උන්වහන්සේ අපගේ මිදුම්කරුවාණෝ පමණක් නොව, මනුෂ්‍යයින් කෙබඳු අය විය යුතුදැයි දැක්වූ අපගේ ආදර්ශය ද වන සේක. අපි ක්‍රිස්තුන්වහන්සේ තුළ අදහන කල, අපට නව අනන්‍යතාවක් සහ ජීවත් වීම සඳහා නව අරමුණක් ඇති වේ. අපගේ නව අනන්‍යතාවය වන්නේ "දෙවියන්වහන්සේගේ දරුවෙක්" වීමයි. අපගේ අරමුණ වන්නේ, "සැබෑ ධර්මිෂ්ඨකම සහ ශුද්ධකම තුළ දෙවියන්වහන්සේ මෙන් වීමයි" (එපීස 4:22-24). අප එම නව පුද්ගලයා ලෙස ක්‍රියා කළ යුතු වේ.

කෙතරම් විශාල වූ ඉලක්කයක් ද! අපි දෙවියන්වහන්සේ මෙන් වීම. අප වඩ වඩාත් දෙවියන්වහන්සේ මෙන් වන පිණිස, මාංශයෙහි ජීවත් වෙමින් දෙවියන්වහන්සේ කුමනාකාරදැයි පෙන්නුම් කළ යේසුන්වහන්සේ මෙන් වන පිණිස උන්වහන්සේ අප වෙනස් කරන සේක.

ඇත්තෙන්ම, අපටම දෙවියන්වහන්සේ මෙන් වීමට නුපුළුවන. එහෙත් දෙවියන්වහන්සේට පුළුවන. එසේම උන්වහන්සේ එය කරන සේක ! එය අපගේ කැමැත්තට විරුද්ධව

උන්වහන්සේ සිදු නොකරන සේක. එහෙත් අප උන්වහන්සේ කරන දෙයට එකඟ වූ කල එසේ සිදු කරන සේක. අපගේ හදවත් සහ මනසේ ශුද්ධාත්මයාණන්වහන්සේ ක්‍රියා කිරීම මඟින්, අපට එකඟ වීමට උන්වහන්සේ උපකාර කරන සේක. “ඔබ දෙවියන්වහන්සේගේ යහපත් කැමැත්තට අවනත වී එය ඉෂ්ට කරවීමට උන්වහන්සේම ඔබ තුළ ක්‍රියා කරන සේක” (පිලිප්පි 2:13).

වඩු වැඩවලට දක්ෂ වීමෙන්, සංස්කෘතික චාරිත්‍රවලින් හෝ ශාරීරික පෙනීමෙන් අප ක්‍රිස්තුන්වහන්සේ මෙන් විය යුතු නැත. ඒ වෙනුව “සැබෑ ධර්මිෂ්ඨකම සහ ශුද්ධකම තුළ” අපි උන්වහන්සේ මෙන් විය යුතු වෙමු. අපගේ සදාචාරය තුළ සහ දෙවියන්වහන්සේ වෙත වූ අපගේ භාවනාව තුළ අපි යේසුන් ක්‍රිස්තුන්වහන්සේ මෙන් විය යුතු වෙමු. කිතුනු ජීවිතයේ අරමුණ එයයි. අපි වඩ වඩා උන්වහන්සේ මෙන් වන පිණිස වර්ධනය වීමයි.

අප අපගේ ඇතුළාන්තය, සිතිවිලි වෙනස් කරගත යුතුය. “සිත අලුත් කරගැනීමෙන් වෙනස් අය වන්න” (රෝම 12:2) යනුවෙන් පාවුල්තුමා පවසයි. අපි “ ඒ අලුත් ස්වභාවය එහි මැවුම්කාරයාණන්ගේ රූපය අනුව උන්වහන්සේ නිරන්තරයෙන් අලුත් කරන සේක” (කොලොස්සි 3:10). අපි ක්‍රිස්තුන්වහන්සේ මෙන් සිතන කල, අපි උන්වහන්සේ මෙන් වන්නෙමු.

**අපගේ ජීවිත යටත් කිරීම**

ක්‍රියා කරන තැනැන්වහන්සේ දෙවියන්වහන්සේ වන සේක. එහෙත් අපි ද සහභාගි වන්නෙමු. අපට උන්වහන්සේගේ ක්‍රියාව ප්‍රතික්ෂේප කිරීමට පුළුවන. නැතහොත්, එයට සම්බන්ධ වෙමින් අපි ඒ සඳහා යටත් විය යුතු වෙමු. කිතුනු ඉතිහාසයෙහි කාර්යන් තුනක් සිදු කෙරුණි : යාච්ඤාව, බයිබල් අධ්‍යයනය සහ නමස්කාරය. මෙම ක්‍රියාකාරීත්වයන් (ආත්මික විනයන් යයි ඇතැම් විට හඳුන්වන) අපගේ හදවත් සහ මනස තුළ දෙවියන්වහන්සේගේ කාර්ය කිරීමට අපම දීමක් බව මිලියන ගණනක් කිතුනුවෝ පවසති.

අපට දෙවියන්වහන්සේ අවශ්‍ය බව යාච්ඤාවෙන් අපි පිළිගන්නෙමු. උන්වහන්සේ අපගේ ප්‍රමිතිය සහ අපගේ ජීවිත සඳහා වූ යොමුව බව අපට මතක් කරන්නේ ය. දෙවියන්වහන්සේගේ බලය වර්ණනා කරමින් ද, උන්වහන්සේගේ කරුණාව ගැන ස්තුති කරමින් ද අපි දෙවියන්වහන්සේට ප්‍රේමයෙන් වර්ධනය වන්නෙමු. සැම යහපත් දෙයක් නිසාම උන්වහන්සේට ස්තුති කරමින්, අපගේ ජීවිත සඳහා වූ උන්වහන්සේගේ අරමුණ පිළිගනිමින් එහි නිවැරදි සන්දර්භය තුළ දිනපතා පවතින්නෙමු. අපගේ අවශ්‍යතා, ශාරීරික අවශ්‍යතා පමණක් නොව, අපට අවශ්‍ය කරන ආත්මික පරිවර්තනය ද පවසමින් උන්වහන්සේගේ උපකාරය ඉල්ලන්නෙමු.

යාච්ඤාව යේසුන්වහන්සේගේ ජීවිතයේ නිත්‍ය දෙයක් විය. උන්වහන්සේට එය අවශ්‍ය වී නම්, එයට බොහෝ වැඩියෙන් අපට එය අවශ්‍ය වන්නේ ය. එහෙත් ඇතැම් විට එය අපහසු වේ. කිය යුතු කුමක්ද, ඉල්ලිය යුතු කුමක්ද හෝ ප්‍රශංසා කළ යුතු කෙසේද යන්න සැම විටම අපි නොදනිමු. කාලයක් වෙන් කගැනීම එතරම් පහසු නැත. එහෙත් අපි එය නියත ලෙසම කළ යුතු වෙමු.

යාච්ඤාවෙන්, අපි දෙවියන්වහන්සේට කතා කරනවා පමණක් නොව, ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ මනසට විවිධ සිතිවිලි ගෙන ඒම මඟින් උළුන්වහන්සේගේ හඬට සවන් දෙන්නෙමු. එම අදහස් දෙවියන්වහන්සේ වෙතින් ද නැතිනම් අපගේම මොළයෙන් ද යන්න අපි දැනගන්නේ

කෙසේ ද? මෙම වෙනස වෙන් කර හඳුනා ගැනීමට දෙවියන්වහන්සේගේ මනස පුහුණු වීම, එනම් බයිබල් අධ්‍යයනයෙන් අපි ලබාගන්නා පුහුණුව අවශ්‍ය වේ.

යේසුන්වහන්සේට ශුද්ධ ලියවිලි වැදගත් විය. උන්වහන්සේ ඒවා දැන සිටි අතර, අධිකාරයෙන් යුතුව එය සැලකූ සේක. යක්ෂයාගේ පරීක්ෂාවන් ප්‍රතික්ෂේප කිරීමට උන්වහන්සේ ශුද්ධ ලියවිලි භාවිත කළ සේක (මතෙව් 4:1-11). අපි "රොටිවලින් පමණක් ජීවත්" නොවිය යුතු බව උන්වහන්සේ කී සේක. එසේම "දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන සැම වචනයක්ම" අපට අවශ්‍ය බව කී සේක (4 පදය).

අපට ශුද්ධ ලියවිල්ලේ වචන අවශ්‍ය වේ. අපට අවවාද දීමට සහ ධෛර්ය දීමට (2 තිමෝති 3:16) දෙවියන්වහන්සේ මෙම ග්‍රන්ථය ලිවීමට සලස්වා තිබේ. වඩ වඩා ක්‍රිස්තුන්වහන්සේ මෙන් වන පිණිස අපගේ සිතිවිලි වෙනස් කිරීමට ශුද්ධ ලියවිලි අපට උපකාර කරයි.

අපෝස්තුළුවරුන්ගෙන් ධර්ම නියාමකයන් ඉගෙන ගැනීම පිණිස මුල් කිතුනුවෝ කැප වූහ (ක්‍රියා 2:42). එම ඉගැන්වීම්ම අපට නව ගිවිසුමෙන් ලැබේ. අපගේ පරිවර්තනය උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි කොටසක් වන්නේ ශුද්ධ ලියවිලි ඉගෙන ගැනීමයි. උන්වහන්සේ එය කිරීම සඳ□හා අපට බල කරන්නේ නැත. එය අපගේ තෝරා ගැනීම වේ.

හේතු දෙකක් නිසා එය සැම විටම පහසු දෙයක් වන්නේ නැත. පළමුවැන්න, බයිබලයේ කොටස් තේරුම් ගැනීමට අපහසුය. ඇතැම් විට අර්ථය විවාදාත්මකය. ශුද්ධ ලියවිල්ලෙහි ගැඹුර ජීවිත කාලයටම පවතියි. පළමු වතාවට අපි එයින් සමහරක් තේරුම් ගනිමුව. දෙවන වර තව ටිකක් වැඩිපුර තේරුම් ගනිමු. තුන්වන වර තවත් ටිකක් වැඩියෙන් තේරුම් ගනිමු. එම නිසා එක්වරම එය සම්පූර්ණ ලෙස අවබෝධ කරගැනීම අපට අපේක්ෂා කළ නොහැකි වේ. අපට නොතේරෙන දේ කෙරෙහි නොව, අපිතේරුම් ගන්නා දෙය කෙරෙහි අවධානය යොමු කිරීම ප්‍රයෝජනවත් වේ.

කෙසේ වෙතත්, බොහෝ මිනිසුන්ට බයිබල් අධ්‍යයනය සම්බන්ධව ඇති අසීරුම දේ වන්නේ ඒ සඳහා කාලය වෙන් කර ගැනීමයි. අපි එය පුරුද්දක්, නිතිපතා කරන දෙයක් කරගත යුතු වෙමු. දිනපතා බයිබලයෙන් සුළු කොටසක් කියවීම, ඒ ගැන සිතීම සහ යාච්ඤා කිරීම ප්‍රයෝජනවත් වන බව බොහෝ කිතුනුවෝ සොයාගෙන ඇත. භාවනා අත්පොත් බොහෝ විට උපකාරයක් වේ. ප්‍රධාන දෙය වන්නේ පුරුද්දක් ඇති කරගැනීම සහ එය දිගටම කරගෙන යාමයි.

ක්‍රිස්තුන්වහන්සේ මෙන් වීම සඳහා වර්ධනය වීමට අපට උපකාර වන තුන්වන විනය වන්නේ නමස්කාරයයි. දෙවියන්වහන්සේ තමාට සැබෑකමින් නමස්කාර කරන අය සොයන බව යේසුන්වහන්සේ කී සේක (යොහන් 4:23). මුල් කිතුනුවන් සහභාගිකම, රොටි කැඩීම සහ යාච්ඤා කිරීම සඳහා කැප වූහ (ක්‍රියා 2:42). ඔවුහු නමස්කාරය සඳහා රැස් වූහ. අපි දෙවියන්වහන්සේට වැඩියෙන් නමස්කාර කරන තරමට, අපි උන්වහන්සේට සමීප වන්නෙමු. ඇදහිල්ල ඇති වෙනත් අය සමඟ නිරන්තර සම්බන්ධතාවය පවත්වන කල, අපගේ ඇදහිල්ල ශක්තිමත් වේ.

ආත්මික වර්ධනය උදෙසා වූ තවත් ආත්මික විනයන්, නැතිනම් ක්‍රම බොහෝ ඇත. මේවාට, භාවනාව, නිරාහාරව සිටීම, හුදෙකලා වීම, චාම් බව, ත්‍යාගශීලි බව, සේවය සහ වෙනත් දේවල් අයත් වේ. මේ සියල්ලෙන්ම අප මතක තබාගත යුතු වන්නේ, ආත්මික වර්ධනය වීම

අපගේම ජයග්‍රහණයක් නොවන බවයි. ස්වයං- විනය තුළින් අපි ක්‍රිස්තුන්වහන්සේ මෙන් වන්නේ නැත. ඒ වෙනුවට, මෙම විනයන් වූ කලි අපගේ අවම විරෝධයක් යටතේ දෙවියන්වහන්සේට උන්වහන්සේගේ වැඩය කිරීමට ඉඩ හැරීමකි.

**යේසුන් ක්‍රිස්තුන්වහන්සේ ස්වාමින්වහන්සේ ලෙස**

ග්‍රීක නව ගිවිසුමේ ක්‍රිස්තුන්වහන්සේ පිළිබඳ වූ සුලභ පදවි නාමයක් වන්නේ, “ස්වාමින්” යනුවෙන් සාමාන්‍යයෙන් පරිවර්තනය වන *කිරියොස්* යන්නයි. මෙම ග්‍රීක් වචනය ඉඩම් හිමියෙක්, ආණ්ඩුවේ නිලධාරියෙක් හෝ අධිකාරය සහිත වෙනත් පුද්ගලයෙක් සම්බන්ධයෙන් යෙදේ. එය පැරණි ගිවිසුමේ ග්‍රීක අනුවාදයෙහි දක්වා ඇති පරිදි දෙවියන්වහන්සේ උදෙසා ද භාවිත වේ.

*කිරියොස්* යනුවෙන් මිනිසුන් විසින් තමා අමතනු ලැබීම රෝම අධිරාජ්‍යයාට අවශ්‍ය වූ විට, ඔහු තමා ස්වාමින්, සුපිරි අධිකාරය බව ප්‍රකාශ කළේ ය. කිතුනුවෝ එසේ කීම ප්‍රතික්ෂේප කළෝය. “නීරෝ ස්වාමින්ය” යනුවෙන් කීම වෙනුවට, සමහර විට ජීවිතයෙන් පවා වන්දි ගෙවීමට සිදු වුව ද, ඔවුහු “ක්‍රිස්තුන්වහන්සේ ස්වාමින්ය” යනුවෙන් කීවෝය.ඔවුන්ට හැකි සෑම විටම ඔවුහු රෝම නීතිවලට කීකරු වූහ (රෝම 13:1-7). ඔවුන්ට පක්ෂපාතීත්වය දැක්වීමට හැකි වූයේ යේසුන් ක්‍රිස්තුන්වහන්සේට පමණි. සුපිරි අධිකාරයක් ඇත්තේ උන්වහන්සේට පමණි. උන්වහන්සේ ස්වාමින්වහන්සේ වන සේක.

පේදුරුතුමා අපට මෙසේ කියයි. “ඔබගේ සිතින් ක්‍රිස්තුන්වහන්සේට ස්වාමිනවහන්සේ හැටියට ගෞරව කරන්න” (1 පේදුරු 3:15). අපගේ ස්වාමින්වහන්සේ ලෙස යේසුන්වහන්සේ රැකවලාණෝ සහ ස්වාමියා වන සේක. අපි උන්වහන්සේ විශ්වාස කරමින් කීකරු විය යුතු වෙමු. අප වෙනුවෙන් තම ජීවිතය දුන් තැනැන්වහන්සේ අපට අවශ්‍ය සියල්ල දෙන බවට ගණන්ගත හැකිය.

මෙයින් අපට අවශ්‍ය සියල්ලම අදහස් නොවන අතර, එය සෑම විටම නිරෝගී බව සහ මුදල් ද නොවන්නේය. ඇත්තෙන්ම යේසුන්වහන්සේ අපට පීඩාවන් පවා දෙන සේක (ක්‍රියා 14:22, හෙබ්‍රෙව් 12:5-11). එහෙත් අපි උන්වහන්සේ කරන දේ උන්වහන්සේ දන්නා බවත්, එය අපගේ යහපත උදෙසා බවත් විශ්වාස කිරීම අවශ්‍ය වේ.

අපෝස්තුළු පාවුල්තුමාට බොහෝ පීඩා තිබිණි. එහෙත් ඔහු “කුමන තත්වයක සිටියත් ඇති දෙයින් සතුටු වීමට ඉගෙනගෙන”තිබිණි (පිලිප්පි 4:11). ඇතැම් විට ඔහු දිළිඳුව, සුළු ප්‍රමාණයක් ඇතිව සිටියේ ය, ඇතැම් විට ඔහු පූර්ණව සිටියේය, ඔහු කුසගින්නේ සිටිය දී පවා ක්‍රිස්තුන්වහන්සේ ඔහුගේ ශක්තිය විය (12-13 පද). ඔහුගේ ස්වාමින්වහන්සේ අවශ්‍ය මොහොතේ දී ඔහුට අවශ්‍ය පමණ සැපයූ සේක. පීඩාවෙන් ගැළවීමට මාර්ගයක් ඇතැම් විට උන්වහන්සේ සපයා දුන් සේක. ඇතැම් විට එය දරා ගැනීමට ශක්තිය සපයා දුන් සේක.

අපගේ ස්වාමින්වහන්සේ අපගේ හිමිකරුවා ද වන සේක. උන්වහන්සේ අපට අණ කරමින් අපගේ කීකරුවීම බලාපොරොත්තු වන සේක. ඇදහිල්ලෙන් පැමිණෙන කීකරුකම පිළිබඳ පාවුල්තුමා කතා කරයි (රෝම 1:5). කීකරුකමෙන් තොර ඇදහිල්ල මළ ඇදහිල්ලක් බව යාකොබ්තුමා පවසයි (යාකොබ් 2:17). අපගේ ක්‍රියාවන්වලින් අපි ක්‍රිස්තුන්වහන්සේ විශ්වාස කරන්නෙමුද යන්න පෙන්නුම් වේ. උන්වහන්සේ අප වෙනුවෙන් මැරුණු සේක. එයට ප්‍රතිචාරයක් ලෙස අපි අපි උන්වහන්සේ උදෙසා ජීවත් වෙමින් උන්වහන්සේට සේවය

කරන්නෙමු (2 කොරින්ති 5:15). ධර්මිෂ්ඨකම තුළ භාවිත වන පිණිස අපි අපවම දෙවියන්වහන්සේට පූජා කරන්නෙමු (රෝම 6: 12-13).

**ඇදහිල්ල, බලාපොරොත්තුව සහ ප්‍රේමය**

අපි දෙවියන්වහන්සේට කීකරු විය යුතු මන් ද? සරලම හේතුව නම් : එය අපගේ කාර්යයි. කුරුසිය මත වූ උන්වහන්සේගේ මරණය තුළින් ක්‍රිස්තුන්වහන්සේ අප මිල දී ගත් සේක (ක්‍රියා 20:28). උන්වහන්සේ කියන දේ අප විසින් කිරීම සාධාරණය. අපි දෙවියන්වහන්සේගේ දරුවෝ වෙමු. එසේම උන්වහන්සේ අණ කරන දේ කළ යුතු වෙමු. ඇත්තෙන්ම ගැළවීම ලබන පිණිස අපි කීකරු නොවන්නෙමු. ගැළවීම පළමුව පැමිණෙයි. පසුව කීකරු විය යුතු වේ.

එහෙත් කීකරුකම කාර්යකට වඩා ගැඹුරට විහිදෙයි. අපි කීකරු විය යුතු නිසා නොව, එසේ කළ යුතු නිසා අමනාපයෙන් නොව, කීකරුකම හදවතින්ම පැමිණිය යුතුය. අප කීකරු විය යුතු වන්නේ ඇයි? ප්‍රධාන කාරණා තුනක් ඇත : ඇදහිල්ල, බලාපොරොත්තුව සහ ප්‍රේමය.

දෙවියන්වහන්සේගේ අණපනත් අපගේම යහපත සඳහා වන බව ඇදහිල්ලෙන් අපි විශ්වාස කරමු. උන්වහන්සේ අපට ප්‍රේම කරන අතර, අපට අනවශ්‍ය කරදර නොදී අපට උපකාර කිරීමට උන්වහන්සේට අවශ්‍ය ය. අපගේ මැවුම්කරු ලෙස, අප ජීවත් විය යුතු ආකාරය, වඩාම හොඳ ක්‍රියාවන් මොනවාද සහ දීර්ඝ ධාවනයේදී වඩා සතුට ගෙන දෙන්නේ මොනවාද යන්න දැනගැනීමට උන්වහන්සේට ප්‍රඥාව තිබේ. එසේම උන්වහන්සේගේ දැක්ම අපගේ දැක්මට වඩා පරිපූර්ණ බව අපි විශ්වාස කළ යුතු වෙමු.

උන්වහන්සේගේ ප්‍රඥාව සහ ප්‍රේමය කෙරෙහි ඇදහිල්ල කීකරුකම තුළින් විදහා දැක්වේ. කීකරුකම යනු උන්වහන්සේ අප මැවීමේ පරමාර්ථයයි (එපීස 2:10), අප මවනු ලැබූ අරමුණ උදෙසා ජීවත් වන විට ජීවිතය හොඳින් ක්‍රියාත්මක වේ.

අනාගත ආශිර්වාද සම්බන්ධ බලාපොරොත්තුවක් කීකරුකමෙහි ගැබ් වේ. අනාගත ජීවිතයක් නැති නම්, කිතුනු බව මෝඩකමකි (1 කොරින්ති 15- 14-18). මේ යුගයේ ගෝලයින්ට අත්හැරීමට සිදු වන දෙයට වඩා බොහෝ වටිනා වූ සදාකාල ජීවනය ඔවුන් ලබාගන්නා බව යේසුන්වහන්සේ කී සේක (මාක් 10:29-30). ගැළවීම ලැබූ සියල්ලන්ටම සදාකාල ජීවිතයේ දී දෙවියන්වහන්සේ දැනගැනීමේ ප්‍රීතිය ඇත්තේ ය. එහෙත් සදාකාල ප්‍රීතිය හා සමඟ විපාක ද ඇත්තේ ය.

“ස්වර්ගයෙහි ඔබගේ වස්තු රැස්කරගන්න” (මතෙව් 6:19-21) පිණිස යේසුන්වහන්සේ තම ගෝලයින් ධෛර්යමත් කළ සේක. මෙම ජීවිතයේ අප කළ දේවල්වලට විපාක ලබන බව උපමා කතා බොහොමයකින් පෙන්නුම් කෙරේ. දෙවියන්වහන්සේ සොයන අයට උන්වහන්සේ විපාක දෙන සේක (හෙබ්‍රෙව් 11:6).

විපාක පිළිබඳ පාවුල්තුමා ලිවේ ය : “යමෙකු කරන යහපත් දෙය අනුව දෙවියන්වහන්සේ ඔහුට විපාක දෙන බව මතක තබාගන්න” (එපීස 6:8). මෙය ගැළවීම ගැන කතා නොකරයි. ගැළවීම හා සමඟ ඇති විපාක ගැන කතා කරයි. සෑම මනුෂ්‍යයාගේම වැඩය පිළිබඳ ගින්නෙන් කරන පරීක්ෂාවක් ලෙස ඔහු විනිශ්චය විස්තර කළේ ය. “යමෙකුගේ කර්මාන්තය

නොදැවී පවතී නම්, ඔහු විපාකයක් ලබයි" (1 කොරින්ති 3:14). එය දැවී යන්නේ නම්, ඔහුට අලාභයක් සිදු වේ. එහෙත් ඔහු ගැළවෙනු ඇත (15 පදය).

අප ක්‍රියා කරන්නේ විපාකය නිසා පමණක් නොවේ. අප අපට කරන ගෙවීමට පමණක් වැඩ කරන සේවකයන් නොව, රජතුමාගේ දරුවන් නිසාවෙනි. අපගේ කීකරු වීමේ අවසාන පෙළඹවීම ප්‍රේමයයි. මෙයට අප වටා සිටින මනුෂ්‍යයින්ට ප්‍රේම කිරීම ඇතුළත් වේ. මන්ද අපි දෙවියන්වහන්සේට කීකරු නොවනවාට වඩා කීකරු වීමෙන් ඔවුන් වඩා යහපත් වන නිසාවෙනි. දෙවියන්වහන්සේගේ අනුශාසනා අත්තනෝමතික නීතීන් ඒවා නොව, ප්‍රඥාගෝචර ඒවා ය. ඒවා අනෙක් මනුෂ්‍යයින් සමඟ සම්බන්ධ වීමට උපකාරී වේ.

එහෙත් සියල්ලටම වැඩියෙන්, දෙවියන්වහන්සේට කීකරු විමට අප පොළඹවන්නේ උන්වහන්සේට ඇති අපගේ ප්‍රේමයයි. උන්වහන්සේ අප උදෙසා මහත් දේ කළ සේක. එයට ප්‍රතිඋපකාර කිරීමට අපට නොහැකි අතර, උන්වහන්සේට ස්තුති කරමින් උන්වහන්සේ ප්‍රසන්න කිරීම අවශ්‍ය වේ. "ඔබ මට ප්‍රේම කරන්නහු නම්, ඔබ මාගේ ආඥා පිළිපදින්නහුය" (යොහන් 14:15) යේසුන්වහන්සේ කී සේක. "යමෙක් මට ප්‍රේම කරන්නේ නම්, හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේ ය" (23 පදය). යොහන් පසුව මෙසේ ලිව්ය : "දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම යනු උන්වහන්සේගේ ආඥා පිළිපැදීමයි" (1 යොහන් 5:3). "මම උන්වහන්සේ දනිමියි කියමින් උන්වහන්සේගේ ආඥා නොපිළිපදින තැනැත්තා බොරුකාරයෙකි. ... එහෙත් යමෙක් උන්වහන්සේගේ දහම පිළිපදින්නේ ද, ඒකාන්තයෙන්ම ඔහු තුළ දෙවියන්වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී ඇත" (1 යොහන් 2:4-5).

අප දෙවියන්වහන්සේට ප්‍රේම කරන බව කීකරු වීමෙන් වෙනත් මනුෂ්‍යයින්ට කීමට හැකිය. කීකරුකම උන්වහන්සේ උතුම්, යහපත් සහ ප්‍රඥාවන්ත බවත්, අපි උන්වහන්සේට නමස්කාර කරන බවත් පවසයි. කීකරුකම දෙවියන්වහන්සේ අපට වැදගත් බවත්, උන්වහන්සේ වටිනා බවත්, අපගේ පක්ෂපාතීත්වය ලැබීමට උන්වහන්සේ සුදුසු බවත් පවසයි. ඔබගේ යහපත් ක්‍රියා මනුෂ්‍යයෝ දැක "ස්වර්ගයෙහි සිටින ඔබගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස" (මතෙව් 5:16) ඒවා ඔවුන්ට දකින්නට ලැබේවා.

"ඔබ නපුර කරන්නෝ යයි විජාතීන් ඔබට විරුද්ධව කතා කරන නමුත්, ඔවුන් ඔබගේ යහපත් ක්‍රියා දැක විනිශ්චය දවසේ දී දෙවියන්වහන්සේට ගෞරව කරන පිණිස ඔවුන් අතර යහපත් හැසිරීමෙන් කල් යවන්න" යනුවෙන් පේදුරුතුමා ලිව්ය (1 පේදුරු 2:12). යහපත් ආදර්ශයක් මනුෂ්‍යයින්ට කැමැත්තෙන් දෙවියන්වහන්සේ වෙත පැමිණීමට උපකාරයක් වේ. "කෙසේ වෙතත් ඔබ ක්‍රිස්තුන්වහන්සේගේ සුබ අස්නට ඔබින ලෙසම හැසිරෙන්න" (පිලිප්පි 1: 27).

ශුභාරංචියට උපකාර වන්න. නරක දෙයට නොව, යහපත් දෙයට සම්බන්ධ වන්න. දෙවියන්වහන්සේ උදෙසා වූ අපගේ ආදරයෙන් අදහස් වන්නේ උන්වහන්සේට යහපත් ප්‍රචාරයක් ලබා දීමට අපට අවශ්‍ය බවයි. එසේ අනෙක් අය කැමැත්තෙන් උන්වහන්සේට ප්‍රේම කිරීමට පෙළඹෙනු ඇත. නරක ආදර්ශයක් ශුභාරංචිය අපකීර්තියට පත් කරයි (තිතස් 2:5). තමාගේ වරද ගැන පාරට්ටු කරගන්නා අය හොඳ ප්‍රමිතියක් ඇති අය යැයි ගණන් ගත නොහැකි ය (1 කොරින්ති 5:1-13).

**පාරිශුද්ධකරණය**

wm සාකච්ඡා කරමින් සිටි කාරණයෙහි වැඩි කොටසක් *පාරිශුද්ධකරණය* නමැති දේවධාර්මික පදය යටතේ සාකච්ඡා කෙරේ. එහි අර්ථය "ශුද්ධවත් කිරීම" වේ. කුරුසිය මත උන්වහන්සේගේ මරණය තුළින් ක්‍රිස්තුන්වහන්සේ දැනටමත් අප පාරිශුද්ධ කර ඇත (හෙබ්‍රෙව් 10:10). එහි අර්ථය උන්වහන්සේගේ ප්‍රයෝජනය සඳහා උන්වහන්සේ විසින් අප වෙන් කරගන්නා ලද බවයි. අපි ශුද්ධ අය වෙමු. එසේම ශුද්ධ ලියවිල්ල නිරන්තරයෙන් "ශුද්ධවන්තයින්" එනම්, "ශුද්ධ අය" ලෙස අප අමතයි. අපි දෙවියන්වහන්සේට කැප වූ අය වන්නෙමු.

> කිතුනුවන් සාමාන්‍ය සහභාගිත්වය දැරිය යුතු බවත්, එසේ යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තුළ ඔවුන්ගේ ඇදහිල්ල තබමින් මනුෂ්‍යයින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුළත් වීම සඳහා ශුභාරංචියට සාක්ෂි පිණිස අපි ඇදහිල්ලෙහි ජීවිත ගත කළ යුතු බවත් අපි විශ්වාස කරමු. *Statement of Beliefs of the Worldwide Church of God,* 2001 edition, page 1.

එහෙත් තවත් ආකාරයකින්, අපි තවමත් ශුද්ධවත් කරනු ලැබීමේ ක්‍රියාවලියක සිටින්නෙමු (14 පදය). තවමත් වැඩය අවසන් නැත. අපගේ හැසිරීම සැම විටම විය යුතු දේ නොවන බව ඔබ සමහර විට දක්නට ඇත. පාරිශුද්ධකරණ ක්‍රියාවලියේ දී අපගේ සිතිවිලි සහ හැසිරීම් ඒවා පැවතිය යුතු කෙසේද යන්න පිළිබඳ අනුකූලතාවයකට පැමිණේ. අපි දෙවියන්වහන්සේගේ ශුද්ධ දරුවෝ වෙමු. එසේම අපි ඒ අයුරින් ජීවත් විය යුතු වෙමු.

මෙම ක්‍රියාවලිය දෙවියන්වහන්සේ විසින් බලය දී, ශක්තිමත් කරනු ලැබුව ද, කිතුනුවන්ට මෙහි ක්‍රියාකාරී කොටසක් ඇත්තේය. නියම ආකාරයෙන් සිතීමට, කතා කිරීමට සහ ක්‍රියා කිරීමට ඒවා නැවත නැවත පවසයි. "මා ඔබ වෙත සිටියදී ඔබ කීකරුව සිටියාක් මෙන්ම, දැන් මා ඔබෙන් ඈත්ව සිටින විටත් ඊටත් වඩා කීකරුව, භයෙනුත්, වෙව්ලුමෙනුත් නුඹලාගේම ගැළවීම ඉෂ්ට කරගනිල්ලා. මක්නිසාද තමන්වහන්සේගේ යහපත් කැමැත්ත නිසා කැමති වෙන්ටත් වැඩ කරන්ටත් නුඹලා තුළ ක්‍රියා කරන්නේ දෙවියන්වහන්සේමය" (පිලිප්පි 2:12-13).

"උන්වහන්සේ අප ගළවා කැප වූ ජීවිතයකට අප කැඳවූ සේක" (2 තිමෝති 1:9) යයි පාවුල්තුමා ලිව්ය. දෙවියන්වහනසේගේ කැමැත්ත කරමින් අපගේ ශරීර ජීවමාන යාගයන් කොට ඔප්පු කරන ලෙස ඔහු අප උනන්දු කරන්නේය (රෝම 12:1-2).

"ස්වාමින්වහන්සේට ඔබින ලෙසත්, ප්‍රිය මනාප වන ලෙසත් හැසිරෙන මෙන් ... සියලු ආකාර යහපත් ක්‍රියාවලින් ඵලදායි වන මෙන්ද" (කොලොස්සි 1:10) ජීවත් වීමට ඔහු අපට ධෛර්ය ගෙන දෙයි.

"දෙවියන්වහන්සේගේ කැමැත්ත නම් ඔබ ශුද්ධව සිටීමය ... ඔබ එකිනෙකා තම තමාගේ ශරීරය දමනය කරගෙන එය ශුද්ධව ද, ගෞරවයෙන් යුතුව ද තබාගැනීමට දැනගත යුතුය ... දෙවියන්වහන්සේ අප කැඳවූයේ අපවිත්‍රකමට නොව, පවිත්‍රකමටය" (1 තෙසලෝනික 4:3-7). "සියල්ලන් සමඟ සමාදානයෙන් ඉන්න. ශුද්ධකමින් තොරව කිසිවෙකු ස්වාමින්වහන්සේ නොදක්නා බැවින්, ශුද්ධකම සොයා යන්න" (හෙබ්‍රෙව් 12:14).

යේසුන්වහන්සේ මෙන් වීම - යේසුන්වහන්සේ මෙන් ජීවත් වීම යථාර්ථවාදී නොවන ඉලක්කයක් මෙන් පෙනීමට පුළුවන. එහෙත් එය අපගේ ක්‍රියාවක් නොවේ. මන්ද දෙවියන්වහන්සේ අප

තුළ එම ක්‍රියාව සිදු කරන නිසාවෙනි. අපගේ නොහැකියාවන් තිබියදී උන්වහන්සේ අප තුළ එම වැඩය සම්පූර්ණ කරන බවට අපට නිසැක විය හැකිය (පිලිප්පි 1:6). අපගේ වර්ධනය ඇතැම් විට සෙමින් සිදුවන බව පෙනුණ ද, අප කෙරෙහි නොව, ක්‍රිස්තුන්වහන්සේ තුළ අපි විශ්වාසය තබන්නෙමු.

පාවුල්තුමා ඉතා හොඳ ආකල්පයක් විදහා දක්වයි : "මේ සියල්ල දැනටම මට ලැබී තිබෙන බවක්වත්, දැනටම මා සම්පූර්ණ වී සිටින බවක්වත් මම නොකියමි. යමක් පිණිස ක්‍රිස්තුන් යේසුන් වහන්සේ මා අත්කරගත් සේක් ද ඒ දේ අත්කර ගැනීම පිණිස මමත් වීර්යයෙන් දුවමි" (පිලිප්පි 3:12). ක්‍රිස්තුන්වහන්සේ අප උන්වහන්සේගේ අරමුණ උදෙසා, එනම් අපි උන්වහන්සේගේ ස්වරූපයට වෙනස් වන පිණිස අප අත්කරගෙන සිටින සේක. එම නිසා අපි උන්වහන්සේගේ කැමැත්ත කිරීමටට ඉඩහරිමින්, උන්වහන්සේ ගැන සහතික වෙමින් වීර්යය කළ යුතු වෙමු.

"එකක් කරමි. පසුගිය දේ අමතක කර දමා ඉදිරියෙන් තිබෙන දේ දෙසම නෙත් යොමා ක්‍රිස්තුන් යේසුන් වහන්සේ මඟින් දෙවියන්වහන්සේ දෙන්නට අදහස් කරන ස්වර්ගීය ත්‍යාගය ලබන පිණිස දිනුම් කණුව කරා මම දිව යමි" (13-14 පද).

ඉදිරිය බලා දුවන්න !

# ගෝලත්වය 101

# ඒකකය 7ආ



## කිතුනු ජීවිතයේ ඉලක්කය

කිතුනු ජීවිතයේ ඉලක්කය කුමක් ද? එය සාර්ථක කර ගැනීමට අපි එකිනෙකාට උපකාර වන්නේ කෙසේ ද?

එක් පැරණි කැතිකිස්මයක් මෙසේ පවසයි. එනම් අපගේ ජීවිතයේ ප්‍රධාන ඉලක්කය වන්නේ දෙවියන්වහන්සේ සදහටම ගෞරවයට පත් කිරීම සහ ප්‍රීතිමත් කිරීමයි. මෙය සත්‍ය වේ. අප මවා ඇත්තේ දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිසත්, උන්වහන්සේගේ මහිමය ප්‍රකාශ කිරීම පිණිසත් යයි ශුද්ධ ලියවිල්ල පවසයි (1 කොරින්ති 10:31, එපීස 1:11-12, 1 පේදුරු 2:9). අපි සිටින්නේ දෙවියන්වහන්සේට නමස්කාර කිරීම පිණිසත්, සත්‍යවාදී වීම පිණිසත් ය. මෙම නමස්කාරය හදවතින්ම පැමිණිය යුතු වේ. එය අපගේ සැබෑ හැඟීම්වල සත්‍ය වූ විදහාපෑමක් විය යුතුය. සියල්ලට ඉහළින් අපි දෙවියන්වහන්සේ නමදින්නෙමු. එසේම උන්වහන්සේගේ සැම අණකටම යටත් වන්නෙමු.

මෙම ඉලක්කයට ළඟා වීමට අනෙක් මනුෂ්‍යයින්ට අඅප උපකාර කරන්නේ කෙසේ ද? අපට මෙවැනි කාර්යක් කිරීම ඉතා අපහසුය. මනුෂ්‍යයික්ගේ හදවත් වෙනස් කරන්නේ දෙවියන්වහන්සේ ය, ආත්ම හරවාගන්නේ දෙවියන්වහන්සේ ය, ප්‍රේමයෙන් සහ අනුග්‍රහයෙන් මනුෂ්‍යයින් ස්පර්ශ කරන්නේත්, පසුතැවිලි වීමට මනුෂ්‍යයින් මෙහෙය වන්නේත් දෙවියන් වහන්සේය. අපට දෙවියන්වහන්සේගේ මවිතකර ප්‍රේමය සහ විශ්මයජනක අනුගශය විස්තර කළ හැකිය. එසේම අපගේ මිදුම්කරුවාණන්ට නමස්කාර කරමින් කැපවීමේ ආදර්ශයක් තැබීමට හැකිය. එහෙත් සියල්ල කළ පසු සැම පුද්ගලයෙකුගේම හදවත වෙනස් කරන්නේ දෙවියන්වහන්සේ වන සේක.

අපගේ ජීවිතයේ ඉලක්කය විස්තර කිරීමේ තවත් ක්‍රමයක් වන්නේ ක්‍රිස්තුන්වහන්සේ මෙන් වීමයි. මේ ඉලක්කයට වර්ධනය වීමේ දී එකිනෙකාට උපකාර කිරීමේ යම් ප්‍රායෝගික ක්‍රම කෙටියෙන් පෙන්නුම් කළ හැකි බව මට සිතේ.

“ස්වකීය පුත්‍රයාණන්ගේ ස්වරූපයට සමාන වීම” (රෝම 8 : 29) අප එකිනෙකා උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැලැස්ම වේ. මෙම ජීවිතය තුළ පවා, “අප උන්වහන්සේගේ සමානත්වයට වඩ වඩා තේජාන්විතව පමුණුවනවා ඇත” (2 කොරින්ති 3: 18). “ඔබ (ගලාතිවරු) තුළ ක්‍රිස්තු ගතිගුණ හැඩගැසෙන තුරු” පාවුල්තුමා ගලාතිවරුන් වෙනුවෙන් සේවය කළේ ය (ගලාති 4: 19). ඔහු එපීසවරුන්ට මෙසේ කීවේ ය. “ක්‍රිස්තුන්වහන්සේගේ පරිණතභාවයෙන් වන පරිපූර්ණ පෞරුෂත්වයටත් අපි පත් වන්නෙමු” (එපීස 4 : 13).

ක්‍රිස්තුන්වහන්සේ තුළ අපට නව අනන්‍යතාවක් මෙන්ම ජීවත් වීමට නව අරමුණක් ද ඇත්තේය. නව ජීවිතය වන්නේ “සැබෑ ධර්මිෂ්ඨකමින් සහ භක්තිවන්තකමින් දෙවියන්වහන්සේ මෙන් වීමයි” (එපීස 4 : 22-24). කෙතරම් අපූරු සංකල්පයක් ද! අපි දෙවියන්වහන්සේ මෙන් වන්නේ උත්ථානයෙන් පමණක් නොවේ. මෙම ජීවිතයේ දී පවා විය හැකි උපරිමයෙනි. අපි මාංශයෙහි ජීවත් වෙමින් දෙවියන්වහන්සේ කුමනාකාර ද යන්න පෙන්නුම් කළ යේසුන්වහන්සේ මෙන් වන්නෙමු. මී ළඟ ජීවිතයේ උන්වහන්සේ මෙන් වන්නට අපි උත්සහා කරන්නේ නැත. අපි මේ ජීවිතයේ දීම දැනටමත් උන්වහන්සේ මෙන් වී සිටින්නෙමු.

නිසැක ලෙසම ශාරීරිකව අපි උන්වහන්සේ මෙන් විය යුතු නැත. උන්වහන්සේගේ වඩු වැඩ නිපුණතාවය, භාෂා කුසලතාවය, කෘෂිකර්මය හෝ රෝම ඉතිහාසය සම්බන්ධ උන්වහන්සේගේ දැනුම ආදියට සමාන විය යුතු නැත. ඒ වෙනුවට, “සැබෑ ධර්මිෂ්ඨකමින් සහ භක්තිවන්තකමින්” උන්වහන්සේට සමාන විය යුතු වෙමු. අපගේ හැසිරීමෙන් සහ දෙවියන්වහන්සේට වූ අපගේ භාවනාවෙන් අපි යේසුන් ක්‍රිස්තුන් වහන්සේ මෙන් විය යුතු වෙමු.

**වෙනස් වන්න !**

අපගේ ජීවිතවල මෙම වෙනස් වීම සම්පූර්ණ වන්නේ කෙසේ ද? “සිත අලුත් කරගැනීමෙන් වෙනස් අය වන්න” යයි පාවුල්තුමා පවසයි (රෝම 12:2). අපගේ නව ජීවිතය “එහි මැවුම්කාරයාණන්ගේ ස්වරූපය අනුව උන්වහන්සේ නිරන්තරයෙන් අලුත් කරන සේක” (කොලොස්සි 3:10). සිත සහ මනස යන දෙකම මෙයට අයත් වේ. හැසිරීම ද අයත් වේ. මෙම ක්‍රියාවන් තුන ක්‍රිස්තුන්වහන්සේ මඟින් වෙනස් වන්නේ ය.

මනස පමණක් නොසෑහේ. මනස පමණක් මෙයට අන්තර්ගත වන්නේ නම්, අපි දෙවියන්වහන්සේ පිළිබඳ සත්‍යතාවන් දන්නා, එහෙත් උන්වහන්සේට කීකරු නොවන යක්ෂයයින් හා සමාන වන්නෙමු. සත්‍ය දැනගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. අපි සවන් දෙනවා පමණක් නොව, එය *කිරීම* ද අවශ්‍ය වේ (මතෙව් 7 : 24).

හැසිරීම පමණක් නොසෑහේ. දෙවියන්වහන්සේ සැබෑ ලෙස විශ්වාස නොකර හැඟීම් තුළින් යාමට අපට පුළුවන. අපි දෙවියන්වහන්සේ සැබෑ ලෙසම විශ්වාස නොකර හැඟීම් මත ක්‍රියා කරන්නෙමු නම්, අපි නළුවෝ වන්නෙමු. අපි දෙවියන්වහන්සේ විශ්වාස කර, නිවැරදි ක්‍රියාවන් කරන්නේ වුව ද, අපගේ හදවත දෙවියන්වහන්සේගෙන් බොහෝ දුරස්ථව ඇත්නම්, අපගේ නමස්කාරය නිෂ්ඵල වේ. අපි දෙවියන්වහන්සේට පැසසුම් ගීතිකා ගායනා කරන කල, උන්වහන්සේට සැබෑ ආදරයක් අප කෙරෙහි නැත්නම් අපි වංචාකාරයෝ වන්නෙමු.

කෙටියෙන් පවසතොත්, අපට නිවැරදි, විශ්වාසයන්, නිවැරදි ක්‍රියාවන් සහ නිවැරදි උද්වේගයන් අවශ්‍ය වේ. අපගේ හදවත නිවැරදි නම්, අපගේ විශ්වාසයන් නිවැරදි නම්, ප්‍රතිඵලය වන්නේ නිවැරදි හැසිරීමයි. අපට නිවැරදි හැසිරීම අවශය වේ. එහෙත් අය අවසාන ඉලක්කය නොව, වෙනත් දේවල ප්‍රතිඵලයක් බව අපි සිහි තබාගත යුතු වෙමු.

මගේ හැඳින්වීමෙහි ඇසූ පරිදි, අපි එකිනෙකා කිතුනු ඉලක්කය කරා වර්ධනය වන්නේ කෙසේ ද? ධර්මිෂ්ඨකමින් සහ භක්තිවන්තකමින් කවඩ වඩා ක්‍රිස්තුන්වහන්සේ මෙන් වීමට අපි එකිනෙකාට උපකාර කරන්නේ කෙසේ ද?

***පියවර කිහිපයක්***

මෙම ක්‍රියාවලියෙහි පියවර තුනක් හෝ හතරක් හෝ මට පෙනේ. පළමුවැන්න, එහි සංවර්තනය[1] ඇත්තේය. අපට ශුභාරංචිය දේශනා කළ හැකිය. අපි එසේ නොකළොත් අපට දුක් වේ ! එහෙත් හදවත් මෘදු කර, ප්‍රතිචාරයක් ඇති කරන්නේ දෙවියන්වහන්සේය. බයිබලිය වචන සහ නූතන වචන සහිතව, අපට හැකි තරම් හොඳින් පැහැදිලිව, හැකි පමණ මාර්ගවලින් අප ශුභාරංචි පණිවුඩය කිව යුතු ය. එහෙත් දෙවියන්වහන්සේගේ පණිවුඩයේ සාර්ථකත්වය සම්බන්ධයෙන් අපට සාමාර්ථ්‍යයක් ලබාගත නොහැකිය. කළ යුතු වන්නේ අප විශ්වාසවන්ත ගබඩාකරුවන් වී, අප පාපයෙන් ගළවා ගැනීමට තම පුත්‍රයාණන් එවීමට තරම් දෙවියන්වහන්සේ ලොවට ප්‍රේම කළ සේක යන සත්‍ය ප්‍රකාශ කිරීම පමණි.

දෙවැන්න, ඇතිදැඩි කිරීමයි. යේසුන්වහන්සේ අණ කළ දේවල් උගන්වන පිණිස බොහෝ සිසුන් සහ බොහෝ ගෝලයින් ඇති කරන්න කියා යේසුන්වහන්සේ තම ගෝලයින්ට කී සේක. කිතුනු ඇදහිල්ලේ සත්‍යතාවන් ඉගැන්වීමට පාවුල්තුමා තිමෝති, තිතස් සහ වෙනත් අයට අනුශාසනා කළේ ය. ධර්ම නියාමක වැදගත් වේ. ශුද්ධ ලියවිල්ල සුවිශේෂී ලෙස අපට වැඩ කිරීමට අනුශාසනා කරන පැතිකඩක් වන්නේ මෙයයි. සෑම සභා නායකයෙක්ම ශුද්ධ ලියවිල්වලින් අර්ථ දක්වන ධර්ම නියාමකවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් මහත් සේ උනන්දු විය යුතු ය.

ධර්ම නියාමක සාධම්මතාව (ලෝක සම්මතය) ළඟා කරගැනීමට පහසු වේවා යයි මම පතමි. අපි ඉතා වැදගත් ධර්ම නියාමකවලින් එසේ වැදගත් නොවන ධර්ම නියාමක වෙන් කර ගත යුතු වෙමු. සැබෑ ක්‍රිස්තියානිකාරකම නිගමනය කිරීමට පරීක්ෂාවක් ලෙස සෑම ධර්ම නියාමකයක්ම යොදා ගැනීමට අපට නොහැකි ය. "ඉතා වැදගත්" ධර්ම නියාමකයන්ගෙන් සමහරක් පවා කෙනෙකුගේ පෞද්ගලික ගැළවීම උදෙසා වැදගත් වන්නේ නැත. එහෙත්, දෙවියන්වහන්සේගේ පණිවුඩයේ විශ්වාසවන්ත සම්ප්‍රේෂකයින් වීම සඳහා සභාවට ඒවා ඉතා වැදගත් වේ.

තුන්වැන්න, ධර්ම නියාමක ස්වභාවයට අමතරව, හදවතේ ස්වභාවය ද ඇත්තේ ය. අනෙක් කිතුනුවන් හා සමඟ *ප්‍රජාවක්* තුළ කිතුනුවාගේ වර්ධනය තිබෙන්නේ මේ නිසාවෙනි. සාමාජීය අත්දැකීම්, එනම්, අපි *එකමුතුව* කරන වැඩ උද්වේගී ලෙස වර්ධනය වීමට උපකාරී වේ. මේවා අන්තර් පුද්ගල සම්බන්ධතාවයන් නිසා ඇති වන ප්‍රේමය සහ සමාව දීම වැනි ශුභවාදී උද්වේගයන් හෝ පාපයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන අශුභවාදී උද්වේගයන් හෝ විය හැකිය. දෙවියන්වහන්සේගේ ප්‍රේමණීය උපකාරය සහ සහයෝගය තුළින් මේවා සමඟ වැඩ කිරීමට ඉගෙන ගන්නා විට මෙම වේදනාකාරී හැඟිම් ශුභවාදී හැඟිම්වලට වඩා ඇත්තෙන්ම වර්ධනය වීමට වඩාත් උපකාරී වේ.

සාමාජිය/ උද්වේගී ස්වභාවය පොතකින් ඉගෙන ගත නොහැකිය. එය ප්‍රාදේශිය වශයෙන්, එඬේර නායක මඟපෙන්වීමක් සහ ආදර්ශයක් සහිත කුඩා කන්ඩායම් තුළින් සහ වෙනත් අවිධිමත් සම්බන්ධතාවලින් උගත යුතුය. එඬේරා වර්ධනය වීම සඳහා උපකාරී වන්නේ ඔවුන් වෙනුවෙන් සියල්ල කිරීමෙන් නොවේ (ඒවා කළ හැකි වුවත්). එහෙත් ඒවා අනෙක් අය වෙනුවෙන් සාමාජිකයින්ටම කිරීමට ඉගැන්වීමෙන් සහ ඔවුන් සන්නද්ධ කිරීමෙනි. ගුණාත්මක එඬේර රැකවරණයක් දක්නට ඇත්තේ කුඩා කණ්ඩායම් තුළය. කුඩා කණ්ඩායම් තුළ සිටීමට

[1] කිතුනු නොවන පුද්ගලයෙක් ශුභාරංචිය අසා එය පිළිගෙන ජීවිත වෙනස් වීම

තෝරා ගනු ලබන සාමාජිකයින් සභාවේ එඬේර රැකවරණය තුළය ඉතා ලෙන්ගතුව සහභාගි වේ. සභාවක් නිරෝගි වීමට කුඩා කණ්ඩායම් උපකාරී වේ.

**හැසිරීමේ වෙනස්කම්**

ධර්ම නියාමක අවබෝධයෙන් සාමාජිකයින් වර්ධනය වන විට, දෙවියන්වහන්සේ පිළිබඳ වැඩි වශයෙන් *දැනගැන්මට* පැමිණෙන විට, සහ උද්වේගකර පරිණතභාවයට පැමිණෙන විට, දෙවියන්වහන්සේට වැඩි වශයෙන් *ප්‍රේම කිරීමට* පැමිණෙන විට, ඔවුහු වෙනත් ආකාරවලින් ද වර්ධනය වන්නාහ. ඔවුන්ගේ හැසිරීම වෙනස් වේ. වඩා වැඩි ප්‍රේමයෙන්, ප්‍රීතියෙන්, සමාදානයෙන්, නිහතමානිකමෙන් සහ සමාව දීමෙන් ඔවුන් අනන්‍යයන්ට සලකනවා ඇත. ඔවුහු ලිංගික දුරාචාරය, කෑදරකම සහ අගෞරව කිරීම ප්‍රතික්ෂේප කරනවා ඇත. අපි දෙවියන්වහන්සේ වැඩි වශයෙන් දැනගෙන උන්වහන්සේට වැඩියෙන් ප්‍රේම කරන විට, අපි වැඩි වශයෙන් උන්වහන්සේ මෙන් ජීවත් වන්නෙමු. හැසිරීමේ වෙනස් වීමට පෙර හදවතේ වෙනස්වීම පැමිණේ. හැසිරීමේ වෙනස්කම ඇති කරන්නේ හදවතෙහි ඇති වන වෙනස්කමයි. අපගේ ජීවිත තුළ ක්‍රියා කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේට ඉඩ දෙන්නේ හදවතෙහි ඇති වන වෙනස්කමයි.

මෙම හැසිරීමේ වෙනස්කම් වෙනස් වූ හදවතක මුල්බැස ඇත. එහෙත් ක්‍රියාවලිය බොහෝ විට සෙමින් සිදු වේ. එඬේරා නිරන්තරයෙන් හැසිරීම් වෙනස් වීම කෙරෙහි ධෛර්ය දීම අවශ්‍ය වේ. එවිට නව සහ පැරණි, ශක්තිමත් සහ දුර්වල ඇදහිලිවතුන් දෙවියන්වහන්සේ ඔවුන් තුළ නිර්මාණය කරන නව ජීවිතය ගත කිරීමට ධෛර්ය ලබනවා ඇත. දෙවියන්වහන්සේ අප තුළ ක්‍රියා කරන සේක. එහෙත් උන්වහන්සේ අප උදෙසා එය ඉටු නොකරන සේක. උන්වහන්සේ අපගේ හදවත් වෙනස් කරමින් ධර්මිෂ්ඨකමින් උන්වහන්සේට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය දේ දෙනවා ඇත. එහෙත් උන්වහන්සේ අප දිනාගත් කාර්ය වන "කීකරුවීමට නිදහස" භාවිත කිරීමට අප ඇදහිල්ල ක්‍රියාවේ යෙදවීම බලාපොරොත්තු වන සේක.

තමාගේ දුෂ්චරිතය ගැන අහංකාර වන අය හොඳ ප්‍රමිතියක් සහිත සාමාජිකයෝ නොවෙති. අපි පිළිගන්නේ පසුතැවිලි වූ සහ අරගල කරන පව්කරුවන්ය. පසුතැවිලි නොවූ, නොසැලකිලිමත් අය නොවේ. අපගේ ආදර්ශය යේසුස් ක්‍රිස්තුන්වහන්සේ වන සේක. උන්වහන්සේ අපරාධකරුවන් සහ වේශ්‍යාවන් පිළිගත් සේක. එහෙත් පසුතැවිලි වීම තමාට අවශ්‍ය නැතැයි සිතූ අය උන්වහන්සේ නොපිළිගත් සේක.

> අපි අපගේ ගැළවුම්කරු සහ ගුරුවරයාණන් වූ යේසුස් ක්‍රිස්තුන්වහන්සේ අනුගමනය කිරීමට උනන්දු වන කල, උන්වහන්සේ තමන්වහන්සේගේ පියාණන්වහන්සේ හා සමඟ තිබූ සම්බන්ධතාවය සහ තමා අවට සිටි මිනිසුන් හා සමඟ තිබූ උන්වහන්සේගේ සම්බන්ධතාවය විශේෂයෙන්ම සලකා බැලිය යුතු වෙමු. දෙවියන්වහන්සේ සමඟ වූ උන්වහන්සේගේ සම්බන්ධතාවය යාච්ඤාව සහ ශුද්ධ ලියවිල්ල මත රැඳී සිටීම සහ ඒ පිළිබඳ තිබූ දැනීමෙන් පෙන්නුම් වේ. යාච්ඤාව සහ අධ්‍යයනය කිතුනුවාගේ ආත්මික වර්ධනය උදෙසා ප්‍රධාන තැනක් ගනී. ඒවා වැදගත්ය ! ඒ ඇයි? වෙනත් "කාර්යක්" හෝ නීතිගරුක බවක් ලෙස නොවේ. එහෙත් දෙවියන්වහන්සේ සමඟ සිටීමේ ආකාරයක් ලෙසය. එවිට අපට උන්වහන්සේගේ හඬ අපගේ ජීවිත තුළ ඇසීමටත්, අපගේ සැබෑ තත්වය මතක් කරගැනීමටත් පුළුවන : අප පාපයෙන් ගළවනු ලැබ සිටිමු. අපි උන්වහන්සේට අයිති

වන්නෙමු. අපගේ ගැළවීම උන්වහන්සේ තුළ සුරක්ෂිතය. උන්වහන්සේ අසීමිත ලෙස අපට ප්‍රේම කරන සේක. අපගේ උපකාරකරුවාණෝ උන්වහන්සේ වන අතර කිසිදිනක අප අත්හරින්නේවත්, අප හැර දමා යන්නේවත් නැත.

යේසුන්වහන්සේ මනුෂ්‍යයින්ට කැප වී සිටි සේක - උන්වහන්සේ නැති වූ අයට ප්‍රේම කළ සේක. තමා ආගමික වශයෙන් අන් අයට වඩා ශ්‍රේෂ්ඨ (නමස්කාරය සඳහා වැඩ කිරීමේ ප්‍රවේශයකින් වූ හැඟීමක්) යයි සිතූ අයට උන්වහන්සේ පහර දුන් සේක. ඇදහිලිවන්තයින් අතර උන්වහන්සේ සමීප සම්බන්ධතාවක් පැවැත්වූ සේක. උන්වහන්සේගේ ගෝලයින් පෞද්ගලික ලෙස හුදෙක් ශිෂ්‍යයින් තමාගේ ගුරුවරයාට මෙන් නොව, එකිනෙකා අතර සම්බන්ධතාවයක් විය. යේසුන්වහන්සේ ඔවුන් එකිනෙකාට පරිණත වීමට උපකාර සලසන, අනෙකා අය වෙතට ගොස් ඔවුන් තමාගේ කණ්ඩායම තුළට ගෙන එන පිණිස ඔවුන් කණ්ඩායමකට, ශරීරයකට එකතු කළ සේක.

# අපගේ ඉලක්කය : ක්‍රිස්තුන්වහන්සේ අප තුළ මූර්තිමත් කිරීම

අපගේ ඉලක්කය දෙස බැලීම සැම විටම ප්‍රයෝජනවත් වේ. අප ක්‍රියා කරන්නේ කුමක් උදෙසා ද? අපගේ වෙහෙස වීමේ අරමුණ කුමක් ද? අපෝස්තුළු පාවුල්තුමා ඔහුගේ කාර්ය මෙසේ විස්තර කරයි : “මාගේ දරුවෙනි, ඔබ තුළ ක්‍රිස්තු ගතිගුණ හැඩගැසෙන තුරු ඔබ උදෙසා නැවතත් මම ප්‍රසව වේදනා විඳිමි” (ගලාති 4 : 19). ගලාතියේ සභාවේ පාවුල්තුමාගේ කාර්ය වූයේ ක්‍රිස්තු ගතිගුණ ඔවුන් තුළ ඇති කිරීමයි. ක්‍රිස්තුන්වහන්සේ ඔවුන් තුළ ජීවත් වන පිණිස ඔහු වැඩ කළේ ය (ගලාති 2 : 20). එවිට ඔවුන් වඩා වැඩි වශයෙන් ක්‍රිස්තුන්වහන්සේ මෙන් වනවා ඇත.

සභාවක් ලෙස අපගේ ඉලක්කය වන්නේ අපගේ සෙනඟ තුළ, අපගේ සහෝදර සහෝදරියන් තුළ ක්‍රිස්තු ගතිගුණ හැඩගැස්වීමයි. එය ආරම්භ වන්නේ නායකයින්ගෙනි. එවිට ඔවුන් ක්‍රිස්තුන්වහන්සේ ආදර්ශයට ගන්නාක් මෙන් මනුෂ්‍යයින්ට ඔවුන් ආදර්ශයට ගත හැකිය (1 කොරින්ති 1 : 11). වචනවලින් පමණක් නොව, ඔවුහු තබන ආදර්ශයෙන්ද මඟපෙන්වන්නෝය.

මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, යේසුන් ක්‍රිස්තුන්වහන්සේගේ ස්වරූපය අනුව (රෝම 12 : 2) අපගේ මනස අලුත් කරගැනීමෙන් අප සියලු දෙනා වෙනස් අය විය යුතුය. මෙය ආත්මික වෙනස් වීමයි. උන්වහන්සේට අපගේ ජීවිත යටත් කර ඇති බැවින්, ක්‍රිස්තුන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ හැඩගැස්වීමෙන් උන්වහන්සේට අවශ්‍ය ආකාරයට අප එකිනෙකාට උන්වහන්සේ විසින් දෙන ලද දීමනා භාවිත කරමින්, උන්වහන්සේ විසින් අපට දෙන ලද කාර්ය කරමින්, ධර්මිෂ්ඨකමේ උපකරණ ලෙස අප වෙනස් වීමයි.

අපි වඩ වඩා ක්‍රිස්තුන්වහන්සේ මෙන් වන්නේ කෙසේ ද? එය අහම්බෙන් සිදු නොවේ. එසේම බලහත්කාරයෙන් ද සිදු නොවේ. දෙවියන්වහන්සේ අපගේ ස්ව කැමැත්ත අපෙන් උදුරාගෙන වෙනස් වීමට අපට බල කරන්නේ නැත. ඒ වෙනුවට, අප උන්වහන්සේ වෙතට හැරී උන්වහන්සේ සෙවිය යුතුය. ආත්මික විනය ඇති කර තිබෙන්නේ මේ නිසාවෙනි. යාච්ඤාවෙන් සහ අධ්‍යයනයෙන්, නමස්කාරයෙන් සහ සේවයෙන් අපගේ ජීවිතයේ ප්‍රමුඛත්වය කුමක්ද යන්න පිළිබඳ තෝරාගැනීම් කරන්නෙමු. අපි නමස්කාර කරන්නේ සහ සේවය කරන්නේ කුමන දෙවියන්ටද යන්න පිළිබඳ දිනපතා තෝරාගැනීම් කරන්නෙමු.

අපගේ ආශාව වන්නේ ක්‍රිස්තුන්වහන්සේ මෙන් වීමයි. උන්වහන්සේ තිරණ ගත් ආකාරයට තිරණ ගැනීමයි. සැබෑ දෙවියන්වහන්සේට සේවය කිරීමට සම්පූර්ණ ලෙස කැප වීමයි. අපගේ කිතුනු ඉලක්කය වන්නේ "ඇදහිල්ලේද, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් දැනගැන්මේද එකමුතුකමටත්, ක්‍රිස්තුන්වහන්සේගේ පරිණතභාවයෙන් වන පරිපූර්ණ පෞරුෂත්වයටත් පත් වීම" (එපිස 4 : 13) යනුවෙන් පාවුල්තුමා එපීසවරුන්ට කිවේය. කෙතරම් විශ්මයජනක ඉලක්කයක් ද ! කෙදිනකවත් මෙවන් පරමාදර්ශී ඉලක්කයකට අපි ළඟා වන්නේ කෙසේ ද?

මෙම ජීවිතයේ දී, අපි ක්‍රිස්තුන්වහන්සේ මෙන් සම්පූර්ණ ලෙස පරිපූර්ණත්වයට පත් නොවන්නෙමු. එසේ වුවත්, එය අපගේ ඉලක්කය වන්නේය. එම අභියෝගය අප වළකන්නේ නැත. අත්හැරීමට සලස්වන්නේ නැත. ඒ වෙනුවට අප ඉදිරියෙහි ඇති දිවීම ඉවසිල්ලෙන් දුවමු. මන්ද අපි විශ්වාසවන්ත ලෙස එය කළහොත් ධර්මිෂ්ඨකමේ ඔටුන්නක් සහතික ලෙසම අපට ලැබෙන බව දන්නා නිසාවෙනි. දැන් පවා, "අප උන්වහන්සේගේ සමානත්වයට වඩ වඩා තේජාන්විතව පමුණුවනු ඇත" යනුවෙන් පාවුල්තුමා පවසයි (2 කොරින්ති 3 : 18). කොරින්ති සභාව පවා, එහි පැවති දෘශ්‍යමාන ප්‍රශ්න තුළ පවා ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ඔවුන් ජේසුන් ක්‍රිස්තුන්වහන්සේගේ තේජසට හැඩගස්වනු ලැබීමේ ක්‍රියාවලියෙහි සිටියේය.

අප වෙනස් වෙමින් සිටින්නෙමු ද? අපි වෙනස් වෙමින් සිටින බව ශුද්ධ ලියවිල්ල පවසයි. සමහර විට එය සෙමින් සිදු වන බව පෙනේ. එහෙත් එය යථාර්ථයකි. ඇත්තෙන්ම තව වඩා දේවල් පැමිණෙන්නට තිබේ. ක්‍රිස්තුන්වහන්සේගේ තේජසේ දී අපි උන්වහන්සේ මෙන් වන්නෙමු (රෝම 8 : 29, 1 යොහන් 3 : 2). එහෙත් පාවුල්තුමා දක්වන කරුණ වන්නේ අපි *දැනටමත්* ක්‍රිස්තුන්වහන්සේගේ සමානත්වයට වෙනස් වී සිටින බවයි. උන්වහන්සේ දැනටමත් අප තුළ හැඩගැස්වී සිටින සේක. ගැළවීම සම්බන්ධව ඇති සියල්ල මෙයයි : දිනපතා අපි උන්වහන්සේට අපගේ ජීවිත දෙන්නෙමු. වඩ වඩා උන්වහන්සේ මෙන් වන පිණිස උන්වහන්සේ අප හැඩගස්වන සේක. මේ උදෙසාම දෙවියන්වහන්සේ අප ගළවන සේක : එනම් අපි උන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ සවරූපයට පැමිණීමයි.

එය සිදු වන්නේ කෙසේ ද? කොලොස්සි 3 : 9 - 10 මෙයට පිළිතුරු සපයයි. "ඔබ පරණ ස්වභාවය එහි දුසිරිත් සමඟ ඉවත ලා, අලුත් ස්වභාවයකින් සැරසී සිටින්නහුය. දෙවියන්වහන්සේ පිළිබඳ සම්පූර්ණ දැනගැන්මට ඔබ පමුණුවන පිණිස ඒ අලුත් ස්වභාවය එහි මැවුම්කාරයාණන්ගේ රූපය අනුව උන්වහන්සේ නිරන්තරයෙන් අලුත් කරන සේක". මෙයට සමාන පිළිතුරක් එපීස 4 : 22 - 24 සපයයි : "එබැවින් ඔබගේ පසුගිය පැවැත්මට අයිති වූ තෘෂ්ණාවලින් මුළා වී විනාශ වන්නාවූ පරණ ස්වභාවය අහක දමා, ආධ්‍යාත්මික නවතාවයක් ඇති කරගන්න. දෙවියන්වහන්සේගේ ස්වරූපය අනුව මවන ලද ධර්මිෂ්ඨකමින් ද, ශුද්ධවන්තකමින් ද ප්‍රකාශ වන අලුත් ස්වභාවය පැළඳගන්න". පරණ ස්වභාවයෙන් අහක් වී නව ස්වභාවයට ඇතුළු වන්න ! වැරදි ස්වභාවය ඉවත ලා ක්‍රිස්තුන්වහන්සේගේ මාර්ගය පැළඳගන්න. (එසේ නොමැතිනම්, උන්වහන්සේට එය ඔබ තුළ පැළඳවීමට ඉඩ දෙන්න. එවිට එය බොරුවට කරන්නක් නොව, ඔබගේ හදවත තුළ තිබෙනු ඇත.)

මෙය ජීවිතය පුරා කිතුනුවන්ට ඇති කාර්යයකි. දිනපතා කාර්යයකි. ක්‍රිස්තුන්වහන්සේ තුළ අපට ඇති අනන්‍යතාවය අත්දකින කල එය දිනපතා *ප්‍රීතියකි.* අපගේ ජීවිතය ජේසුන්වහන්සේ මත කේන්ද්‍ර වී ඇත. උන්වහන්සේ අපට පියාණන්වහන්සේ පෙන්වනවා පමණක් නොව, අපි උන්වහන්සේ අනුගමනය කරන විට අපට විය හැකි කවුරුන්ද යන්නත් පෙන්වන සේක.

ක්‍රිස්තුන්වහන්සේ මෙන් වන සෙනඟක් ලෙස, අපට ක්‍රිස්තුන්වහන්සේගේ මෙන් වූ කාර්යක් ඇත. යේසුන්වහන්සේ තම ගෝලයින්ම මෙසේ කී සේක. "ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයට ඔවුන් බව්තීස්ම - ස්නාපනය කරන්න. මා ඔබට අණ කල සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න" (මතෙව් 28 : 19 - 20). උන්වහන්සේ ඉගැන්වූ දේවල් අප විසින් ඉගැන්විය යුතුය. උන්වහන්සේ කරන්නට කී දේවල් කළ යුතුය. උන්වහන්සේ විශ්වාස කරන්නට කී දේවල් විශ්වාස කළ යුතුය. එය අපගේ වැඩයත්, කාර්යත් වේ.

අපගේ කාර්ය ආරම්භ වන්නේ නිවසෙනි. යේසුන්වහන්සේ ඉගැන්වූ දේවල් අප දැනගන්නේත්, එයට කීකරු වන්නේත් එහිදී ය. අපි බොහෝ දෙනෙක් නිවසේ දී, අපගේ පවුල තුළ සහ අසල්වාසීන් අතර නොකඩව වැඩ කරන්නෙමු. සැම කිතුනුවෙකුටම මුළු ලෝකය කරා යාම පහසු නැත. සැම ඇදහිලිවන්තයෙක්ම ගමන් කිරීම අවශ්‍ය වන්නේ නැත. යේසුන්වහන්සේ කී කාරණය නම්, වාර්ගික කණ්ඩායම්, සාමාජීය පංති හෝ ස්ත්‍රී පුරුෂභාවය නිසා අපගේ කාර්ය සීමා නොකළ යුතු බවයි (ගලාති 3 : 28).

මිත්‍රවරුනි, මනුෂ්‍යයින්ගේ ජීවිත වෙනස් වෙමින් පවතී ! ශුභාරංචිය ප්‍රකාශ කරනු ලැබේ. මනුෂ්‍යයින් බව්තිස්ම කරනු ලබති. සියලු යුගවල මිනිස්සු ක්‍රිස්තුන්වහන්සේ වෙත පැමිණෙන්නෝය. මේ සියල්ල ගැන මම ප්‍රීති වෙමි.

දැන් කරන්නට තවත් බොහෝ දේ තිබේ. යේසුන්වහන්සේ ඉගැන්වූ දේවල් අප විසින් නව ඇදහිලිවන්තයින්ට ඉගැන්විය යුතුය. එය වචනයෙන් පමණක් නොව, අපගේ ක්‍රියාවෙන් ද විය යුතුය. අනුග්‍රහයේ සහ දයානුකම්පාවේ ක්‍රියාවලින්, නමස්කාරයේ සහ සේවයේ ක්‍රියාවලින් විය යුතුය. ක්‍රිස්තුන්වහන්සේ මෙන් වූ පුද්ගලයා පොළොවේ ලුණු වේ. ලෝකයේ ආලෝකය වේ. පිළිතුරක් දීමට සූදානම් අයෙක් වේ. ගෝලයින් බිහි කිරීමට සූදානම් අයෙකු වේ. ක්‍රිස්තුන්වහන්සේ මෙන් වන පුද්ගලයා යේසුන්වහන්සේගේ අණපනත් උගන්වමින් කීකරු වෙයි. අන් අයට ප්‍රේම කරයි, අන් අය උදෙසා යාච්ඤා කරයි, අන් අයට උපකාර කරයි, මෙසේ කිරීමෙන් අපි යේසුන් ක්‍රිස්තුන්වහන්සේ අනුගමනය කරන බවට ජීවමාන සාක්ෂියක් වන්නේය (යොහන් 13 : 35). අපි ස්වාමියා මෙන් වන්නෙමු.

එහෙත් පරෙස්සම් වන්න ! අපි ක්‍රිස්තුන් වන්නේ මෙන් වූ විට, පීඩා ද පැමිණෙන බව අපට ස්ථිරය. සමහර ඒවා දෙවියන්වහන්සේ විසින් ඉඩ හරින ලද අහඹු සිදුවීම් බව පෙනෙන්නේය. සමහරක් පීඩාකරුවන් විසින් ඇති කරනු ලබන ඒවාය. සමහරක් ඒවා දෙවියන්වහන්සේ ප්‍රේම කරන අය විනයානුකූල කරන පිණිස උන්වහන්සේ වෙතින්ම පැමිණෙන ඒවාය (හෙබ්‍රෙව් 12 : 6). යේසුන්වහන්සේට පවා අමාරුකම් තුළින් යාමට සිදු විය. එම නිසා අපට අමාරුකම් එන විට පුදුම විය යුතු නැත. දෙවියන්වහන්සේ සියල්ල යහපත පිණිස හරවන බවට අපට සහතික විය හැකිය (රෝම 8 : 28). එය ධර්මිෂ්ඨකමේ සමාදාන ඵල නිසැක ලෙසම ඇති කරන්නේය (හෙබ්‍රෙව් 12 : 11).

දෙවියන්වහන්සේ අප ප්‍රතික්ෂේප නොකරන බවට අපට සහතික විය හැකිය. උන්වහන්සේ තමාගේ එකම පුත්‍රයාණන් පවා අප වෙනුවෙන් මැරෙන පිණිස එවීමේ අන්තයටම ගිය සේක. උන්වහන්සේ අපගේ ජීවිතවල කරමින් සිටින දෙය උන්වහන්සේට අමතක නොවන බවට අපට සහතික විය හැකිය. උන්වහන්සේ අප උසස් කරන සේක, වෙනස් කරන සේක, වඩ වඩා යේසුන්වහන්සේ මෙන් වීම පිණිස අප වෙනස් කරන සේක. ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් අලුතින් මවන ලද, සදාකාලයටම ක්‍රිස්තුන්වහන්සේ මෙන් තේජස උදෙසා නිර්මාණය කරන ලද

අපි උන්වහන්සේගේ දරුවෝ ද වන්නෙමු. අපට *තේජාන්විත* අනාගතයක් තිබේ. අපි දැනටමත් එම තේජසට ඇතුළු වීම ආරම්භ කර සිටිමු. දැනටමත් ක්‍රිස්තුන්වහන්සේ අප තුළ හැඩ ගැසී ඇත්තේය. වඩ වඩා තේජාන්විතව අපි උන්වහන්සේගේ ස්වරූපයට වෙනස් වන්නෙමු.

ක්‍රිස්තුන්වහන්සේ ඔබ තුළ සිටිමින් ක්‍රියා කිරීමට ඉඩ දෙන්න. එසේ මුළු සභාවේම උන්වහන්සේ වැඩ සිටින සේක්වා. අපි පියාණන්වහන්සේගේ කැමැත්ත, උන්වහන්සේ සෙවීමෙන් උන්වහන්සේගේ වැඩය කරමු. උන්වහන්සේගේ අරමුණ ලෙස අප වෙනස් කිරීමට උන්වහන්සේට ඉඩ හරිමු. අපගේ මහිමය උන්වහන්සේගේ මහිමය වේවා.

මිත්‍රවරුනි, ඔබගේ යාච්ඥාවන් සහ උපකාර නිසා ඔබට ස්තූතියි. අපට පීඩා තිබුණ ද, අපට ඇදහිල්ල ද තිබේ. අපට උන්වහන්සේ භාර දුන් කාර්ය අප කරන කල යේසුන් වහන්සේ අප දෙස බලන සේක.

# ගෝලත්වය 101

# ඒකකය 7 ඈ



දෙවියන්වහන්සේ අපට ලබා දුන් ජීවිතයට අපි ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? අපගේ ප්‍රතිචාරයෙහි එක් වැදගත් පැතිකඩක් වන්නේ අනෙක් මනුෂ්‍යයින්ට උපකාර කිරීමට කැමති වීමයි. දෙවියන්වහන්සේ අපට දී ඇති යහපත් දේවල් අන් අයට සේවය කිරීමට භාවිත කිරීම පිණිස බව පහත පාඩමෙන් පෙන්නුම් කරයි.

### ආශිර්වාද දීමේ අරමුණ

දෙවියන්වහන්සේ පීඩාවලට ඉඩ හරින්නේ මන්ද යන්න මිනිස්සු නිතර අසති. අපි පීඩාවක සිටින විට, ඒ මන්ද යන්න දැනගැනීමට අපට අවශ්‍ය වේ. අප පිට මෙම වේදනාව පැමිණියේ මන් ද? ඇයි මට? අපි ඒ ගැන සිතමින්, ඒ ගැන යාච්ඤා කරමින් රාත්‍රියේ නිදි නොලබා සිටීමට පවා පුළුවන.

එහෙත් දෙවියන්වහන්සේ ආශිර්වාද එවීමට ඉඩ හරින්නේ මන්ද යන්න කිසි දිනක අපි සිතා තිබෙනවා ද? මෙවන් දෙයක් මට සිදු වීමට දෙවියන්වහන්සේ ඉඩ හැරියේ මන්දැයි සිතමින් කිසි විටක රාත්‍රියේ නිදි නොලබා නොසිටින්නෙමු. දෙවියන්වහන්සේ අප හට යහපත් ජීවිතයක් ලබා දීම අපි සාමාන්‍ය දෙයක් වශයෙන් සලකා ක්‍රියා කරන්නෙමු. අපි සාමාන්‍යයෙන් මෙම ආශිර්වාද පිළිබඳ වැඩිපුර නොසිතා ස්තුති දීමෙන් සහ ඒ ගැන ප්‍රීති වීමෙන් යුක්තව පිළිගන්නෙමු.

එහෙත් ඇත්තෙන්ම අපි ආශිර්වාද ලැබීමට සුදුසු අය නොවෙමු. එම නිසා ඒවා පැමිණි කල, ඒ ඇයි යන්න ඇසිය යුතු වෙමු. දෙවියන්වහන්සේ අපට කිසිවක් ණය නැත. උන්වහන්සේ සෞඛ්‍ය සම්පන්න බවත්, සෞභාග්‍යයත් අපට පොරොන්දු වී නොමැත. එසේ වුවත්, අපි සියලු දෙනාටම ආශිර්වාද ඇත්තේ ය. ස්වාමිනි, මට මෙය සිදු වූයේ මන්ද යන්න අප විසින් ඇසිය යුතු වේ.

### සාමාන්‍ය දෙය කුමක් ද?

ලූක් 13 සඳහන් ඵල නැති අත්තික්කා ගසේ උපමාව ආශිර්වාද පිළිබඳ නිදර්ශනයක් සපයයි. අපි පළමුවන පදයෙන් ආරම්භ කළහොත් මෙම උපමාවේ සන්දර්භය අපට දැකගත හැකිය : "ඒ අවස්ථාවේ දී එහි සිටි සමහරෙක් කතා කොට, පිලාත් විසින් ගලීලයන් මරා ඔවුන්ගේ ලේ ඔවුන්ගේම යාග සමඟ මිශ්‍ර කළ අන්දම උන්වහන්සේට දැන්වූහ."

මෙහිදී පෙනී යන දෙයක් නම්, වරදකට අසු වූ තැනැත්තා අනෙක් මිනිසුන්ට වඩා පාපී බවින් වැඩි බව ඔවුන් සිතූ බවයි. යේසුන්වහන්සේ 2 වන පදයෙහි පිළිතුරු දෙන්නේ මෙම සිතිවිල්ලටයි: "ඒ ගලීලයන් එබඳු විපතක් වින්ද බැවින් ඔවුහු අන් හැමටම වඩා පාපී වූහයි

ඔබ සිතන්නහු ද? එසේ නොවේ යයි මම ඔබට කියමි. මනස්ථාපනය නොවුවොත් ඔබ හැමද එසේම විනාශ වන්නහුය."

එම මනුෂ්‍යයින් සිතු පොදු කරුණ වන්නේ ඔවුන් ලැබීමට සුදුසු දේ ලද බවයි. වේදනාව සහ පීඩා විඳීම පාපයේ ප්‍රතිඵල වේ. එහෙත් පීඩා විඳින පුද්ගලයින්ගේ පාප සැම විටම පීඩා විඳීමට හේතු නොවේ. පාපය අහිංසක මිනිසුන් රිදවයි. දෙවියන්වහන්සේ පාපයට මෙතරම් වෛර කිරීමට එක් හේතුවක් වන්නේ එයයි. බොහෝ විට මිනිසුන් පීඩා විඳින්නේ වෙනත් මනුෂ්‍යයින්ගේ පාප නිසාවෙනි.

ජෙරුසලමේ මිනිස්සු පීඩා විඳි ගලීලයේ මිනිසුන් නිදසුන් වශයෙන් ගත්හ. යේසුන්වහන්සේ පීඩා විඳි ජෙරුසලමේ වැසියන් පිළිබඳ නිදසුනක් දක්වන සේක : "සිලෝවම්හි බලකොටුව වැටී ඊට යට වී මළ දස අට දෙන ජෙරුසලමෙහි විසූ අන් හැමටම වඩා දුෂ්ට වූහයි ඔබ සිතන්නාහු ද? එසේ නොවේ යයි ඔබට කියමි. මනස්ථාපනය නොවුවොත් ඔබ හැමටම වන්නේත් එම විපත්තියමය" (4-5 පද).

මෙම වැටුණා වූ ලෝකයේ විනාශයන් සාමාන්‍ය ඒවා වේ. ඒවාට අපගේ ප්‍රතිචාරය විය යුත්තේ මනස්ථාපනයයි. ඵල නැති අත්තික්කා ගසේ උපමාවෙහි සන්දර්භය එයයි.

**අරමුණක් සහිත ගසක්**

පසුව යේසුන්වහන්සේ උපමාව වදාළ සේක : "එක් මිනිසෙකුගේ මිදි වත්තෙහි වැඩුණු අත්තික්කා ගසක් විය. ඔහු ඒ ගසේ ගෙඩි සොයා ආවේ ය. එහෙත් කිසිවක් සම්බ නොවී ය. එවිට ඔහු උයන් ගොවිවාට කතා කරමින්, බලන්න, දැන් අවුරුදු තුනක්ම මේ ගසේ ගෙඩි සොයා ආ නමුත් කිසිවක් සම්බ නොවී ය. ගස කපා දමන්න. එය පොළොවට බරක්ව තිබිය යුතු මන්දැයි කිය. ඔහු උත්තර දෙමින්, ස්වාමිනි, එය වටකර හාරා පෝර දමන පිණිස මේ අවුරුද්දටත් තිබුණාවේ. ඉන්පසු පල දැරුවොත් හොඳය. නැතිනම් එය කපා දමන්නට පුළුවන" (6-9 පද).

අයිතිකරුවාට එම ස්ථානය මිදි වැල් වැවීමට භාවිත කළ හැකිව තිබිණි. එහෙත් ඔහුට අත්තික්කා අවශ්‍ය විය. එම නිසා ඔහු අත්තික්කා ගසක් සිටෙව්වේ ය. එහෙත් ගස විසින් කළ යුතුව තිබූ දෙය ගස නොකළේ ය. අයිතිකරුවා ව්‍යාපාරික තීරණයක් ගත්තේ ය : එනම්, නිකම්ම බිමෙන් කොටසක් යනවාට වඩා එය ඉවත් කිරීමයි.

යේසුන්වහන්සේ අපට කෘෂිකාර්මික උපදෙසක් නුදුන් සේක. උපමාව ඇත්තෙන්ම ගස් සම්බන්ධ වුවක් නොව, මිනිසුන් සම්බන්ධ වුවකි. යේසුන්වහන්සේ පළමුවරට උපමාව කී අවස්ථාවේ දී කතා කළේ යුදෙව් මනුෂ්‍යයින් පිළිබඳව ය. එහෙත් එම ප්‍රතිපත්තියම වර්තමානයේ කිතුනුවන්ට අදාළ වන්නේ ය. මිනිසුන් යහපත් ප්‍රතිඵලවලින් ඵල දැරීම දෙවියන්වහන්සේට අවශ්‍ය වේ. ඔවුන් උන්වහන්සේට ප්‍රේම කිරීම උන්වහන්සේට අවශ්‍ය වේ. එහෙත් බොහෝ මිනිසුන් හුදෙක් ඉඩකඩ ගන්නවා පමණි. විශේෂ දෙයක් ඔවුහු සිදු නොකරති. දෙවියන්වහන්සේ අප මැව්වේ කිසිම දෙයක් නොකර සිටීමට නොවේ. උන්වහන්සේ අප මැව්වේ යහපත් ක්‍රියා කිරීම පිණිස ය (එපීස 2 : 10). යහපත් ක්‍රියා අපගේම ප්‍රයෝජනය උදෙසා නොවේ. පලයක් එය නිපදවූ ගසට ප්‍රතිලාභයක් නොවන්නා සේම, යහපත් ක්‍රියා අන් අයට උපකාර පිණිස විය යුතුයි.

අප කිසිවක් නොකර සිටීම දෙවියන්වහන්සේට අවශ්‍ය නැත. ආත්මාර්ථකාමී වනවාට වඩා වැඩි දෙයක් පිණිස උන්වහන්සේ අප සැදූ සේක. අප අපගේ අසල්වාසීන්ට ප්‍රේම කළ යුතු වේ. එහි අර්ථය කිසියම් දෙයක් කිරීමයි. එහි අර්ථය ඵල දැරීමයි. එහි අර්ථය අනෙක් මනුෂ්‍යයින්ගේ ජීවිතවල වෙනසක් ඇති කිරීමයි. ඇත්තෙන්ම සෑම මනුෂ්‍යයෙකුගේම සෑම අවශ්‍යතාවයක්ම සැපිරීමට අපට නොහැකිය. එහෙත් අප සෑම කෙනෙකුටම සමහර මිනිසුන්ට සමහර ආකාරවලින් උපකාර කිරීමට පුළුවන. අපි අන් මනුෂ්‍යයින්ට ආශිර්වාදයක් ද?

**ගස උදෙසා වූ ආශිර්වාද**

එහෙත් යේසුන්වහන්සේ සමාව ද පිළිගන්වන සේක. අත්තික්කා ගස උදුරා දැමීමෙන් උපමාව අවසන් වන්නේ නැත. එහි වෙනස් කොටසක් ඇත. දැන් අප අවධානය යොමු කළ යුතු වන්නේ එය වෙතටයි. උයන් ගොව්වා ඉවසීම සහ කරුණාව ඉල්ලීය. මඳක් නවතින්න. ගස කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට මට ඉඩ දෙන්න. මම ගස වටේ හාරා, පොහොර යොදන්නම්. එසේ කළ විටත් එය ඵල නොදැරුවොත් අපි එය කපා දමමු යයි ඔහු කීය.

උයන් ගොව්වා කීවේ මෙයයි. එනම් මෙම ගසට වැඩිපුර ආශිර්වාද දීමට මට ඉඩ දෙන්න. ආශිර්වාද ලැබූ කලත් එය ඵල නොදැරුවොත් එපි එය ඉවත් කරමු. එම නිසා අපගේ ජීවිතවල අපට ආශිර්වාද තිබේ නම්, ඒවා අප ඵල දරන පිණිස දී ඇති පොහොර බව සිතා, හුදෙක් ඉඩ ලබාගන්නේ නැතිව යහපත් ක්‍රියා කරමු.

අප සියලු දෙනාගේම ජීවිතවල ඵල නොදරන ලද කාලයන් තිබේ. දෙවියන්වහන්සේ ඉවසිලිමත්ව සහ කරුණාවන්තව සිටින සේක. අපි නැවත වරක් ඵල දැරීම ආරම්භ කරනු ඇතැයි බලාපොරොත්තුවෙන් උන්වහන්සේ ආශිර්වාද ලබා දෙන සේක. අපි දඬුවම ලබන්නට සුදුසු අය වන්නෙමු. එහෙත් ඇතැම් විට අපි අනුග්‍රහයත්, ආශිර්වාදත් ලබන්නෙමු. එහි අරමුණ අප විසින් ඵල දරනු ලැබීම වේ. ආශිර්වාද වෙනත් අයට ආශිර්වාදයක් වන පිණිස අපට අවස්ථාවක් සලසයි.

**පෙනීමෙන් විනිශ්චය කළ නොහැකිය**

ගසට පොහොර ලැබී ඇති බව කෙනෙක් දකින විට, එම ගස එවැනි සැලකිල්ලක් ලබන්නට නියත ලෙසම වටිනා බව ඔහුට සිතෙන්නට පුළුවන. එහෙත් සත්‍යය එයට ප්‍රතිවිරුද්ධ වේ. මෙහි දී ආශිර්වාද සහිත ගස වන්නේ නරක ගසයි.

මේ හා සමානව, ඉතා පොහොසත් ලෙස ආශිර්වාද ලත් පුද්ගලයා ධර්මිෂ්ඨ පුද්ගලයා නොවන්නේ ය. ඇතැම් විට ඔහු ධර්මිෂ්ඨ වන්නට පුළුවන. එසේ නොවීමට ද පුළුවන. ආශිර්වාද ලබා දී ඇත්තේ එම පුද්ගලයා ඵල නොදරන නිසාවෙනි. ඔහු හෝ ඇය ආශිර්වාද ලබන්නේ අන් අයට ආශිර්වාදයක් වනු ඇතැයි අපේක්ෂාවෙනි.

මෙම උපමාව සාමාන්‍ය පරිකල්පනාවලට අභියෝග කරයි. මනුෂ්‍යයින් සෑම විටම ඔවුන් ලැබීමට සුදුසු වන දේ ලබන්නේ නැත. පීඩා සහිත කිතුනුවන් ඵල දරන කිතුනුවන් විය හැකිය. අනාගතයේ දී වඩා හොඳින් ඵල දැරීමට ඔවුන්ට උපකාර වන පිණිස එය කෙටිකාලීන කප්පාදු කිරීමක් විය හැකි ය.

අනෙක් අතට, අප පිරී ඉතිරී යන තරමට ආශිර්වාද ලැබූ විට, අපගේ යහපත් හැසිරීම නිසා එසේ ආශිර්වාද ලැබූ බව සිතන්නට පුළුවන. එහෙත් ඇත්තෙන්ම එය එසේ නොවේ.

මෙයට වඩා නරක දේ වන්නේ අපට ආශිර්වාද ඇති විට පීඩා මධ්‍යයේ සිටින මනුෂ්‍යයින් පහත් කොට සැලකීමට පහසු වීමයි. එහෙත් ඉතා හොඳින් පොහොර යොදන ලද ශාකය කප්පාදු කරන ලද ශාකයට වඩා කිසිසේත්ම හොඳ වන්නේ නැත. අපට පෙනීමෙන් විනිශ්චය කිරීමට නොහැකිය.

**ආශිර්වාද ලැබෙන්නේ බෙදාගැනීම උදෙසාය**

ආශිර්වාද ලබා ගැනීමත් එය තමාවෙතම තබාගෙන ප්‍රීති වීමත් මිනිසුන්ට පහසු දෙයකි. ආශිර්වාද ව්‍යාජ ලෙසින් දෙවියන්වහන්සේ වෙතින් තමා වෙතටම යාමට හේතු වේ. එහෙත් අපට ආශිර්වාද ලබා දී තිබෙන්නේ අප වඩා ඵල දරන පිණිස වේ. අපි ඵල නොදරමු නම්, මෙහි අනතුරු ඇඟවීමේ වදනක් ඇත්තේ ය. ආශිර්වාද යනු දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ සලකුණකි. අප ලැබීමට සුදුසු නැති වුවත් ඒවා අප වෙත වූ උන්වහන්සේගේ යහපත්කමයි. ඒවා යහපත් ක්‍රියාවල ප්‍රතිඵලයක් නොවන්නේ ය. දෙවියන්වහන්සේට අවශ්‍ය ආකාරයට අප විසින් ඒවා භාවිත කළ යුතුව ඇත.

අපට අනුග්‍රහය ලබා දී ඇත්තේ දෙවියන්වහන්සේ උදෙසාත්, අන් මනුෂ්‍යයින් උදෙසාත් අප ඵල දරන පිණිස වේ. එම නිසා අපි අන් අයට උපකාර කරමින් අන් අයට ආශිර්වාදයක් විය යුතුව ඇත. දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ සහ අනුග්‍රහයේ මාධ්‍යයක් වීමට සහ අන් අයට ආශිර්වාදයක් වීමට අනුග්‍රහය අප දිරිමත් කරන්නේය.

උන්වහන්සේ අපට ප්‍රේම කළ සේ අප විසින් ද එකිනෙකාට ප්‍රේම කළ යුතු වේ. උන්වහන්සේ අප වෙත කමා වුවාක් මෙන්ම, අප විසින් ද අන් අය වෙත කමාව දැක්විය යුතු ය. උන්වහන්සේ අප වෙත ත්‍යාගශීලි වූවාක් මෙන්ම, අප විසින් ද අන් අයට ත්‍යාගශීලි විය යුතු ය.

අපි අපගේ භෞතික ආශිර්වාද දෙවියන්වහන්සේගේ ගෞරවය උදෙසා භාවිත කරන්නේ කෙසේ ද යන්න සිතා බලමු. අපි සියලු දෙනාටම ආත්මික ආශිර්වාද ද ඇත්තේ ය. එම ආශිර්වාද ඇතිව ඵල දැරීමට දෙවියන්වහන්සේට අවශ්‍ය කෙසේ ද, පොදු යහපත උදෙසා ඒවා භාවිත කරන්නේ කෙසේ ද යන්න අපි සිතා බැලිය යුතු වෙමු (1 කොරින්ති 12 : 7).


ආශිර්වාද යහපත් ය. දෙවියන්වහන්සේගේ සෙනඟ වශයෙන් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ යහපත් දීමනා අප සමඟ බෙදා ගත් ආකාරයට ආශිර්වාද අනෙක් අය සමඟ බෙදා ගන්නේ කෙසේ ද යන්න අපිට උගත හැකිය.

## ශෝලත්වය 101

## ඒකකය 8 අ



# සභාව යනු කුමක් ද?



ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ල ඇති මිනිසුන් "සභාවේ" කොටසක් වන බව බයිබලය පවසයි. සභාව යනු කුමක් ද? එය සංවිධානය වී ඇත්තේ කෙසේ ද? එහි අරමුණ කුමක් ද?

**යේසුන්වහන්සේ උන්වහන්සේගේ සභාව ගොඩනගන සේක**

යේසුන්වහන්සේ මෙසේ කී සේක. "මම මාගේ සභාව ගොඩනගන්නෙමි" (මතෙව් 16 : 18). සභාව උන්වහන්සේට වැදගත් වේ. උන්වහන්සේ එයට කෙතරම් ප්‍රේම කළ සේක්ද කිවහොත් උන්වහන්සේගේ ජීවිතය ඒ වෙනුවෙන් දුන් සේක (එපීස 5 : 25). අපට ක්‍රිස්තුන්වහන්සේගේ හදවත තිබේ නම්, අපි ද සභාවට ප්‍රේම කර, අපගේ ජීවිත එයට දෙන්නෙමු.

"සභාව" යන්නට ග්‍රීක වචනය *එක්ලීසියා* යන්නයි. එහි අර්ථය රැස්වීම වේ. ක්‍රියා 19 : 39, 41 පදවල එය විශාල ප්‍රමාණයක් වූ නගරබද සෙනඟට භාවිත කර ඇත. එහෙත් කිතුනුවන් අතර *එක්ලීසියා* යන පදයට විශේෂ අර්ථයක් ඇත : එනම්, යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තුළ අදහන සියලු දෙනා යන්න වේ.

නිදසුනක් ලෙස, ලූක්තුමා පළමුවරට මෙම වචනය භාවිත කිරීමේ දී මෙසේ ලියයි : "මුළු සභාව ද එය ඇසූ සියල්ලෝ ද අතිශයින් බියපත් වූහ" (ක්‍රියා 5: 11). එම වචනයේ අර්ථය පැහැදිලි කිරීමට ඔහුට අවශ්‍ය වූයේ නැත. මන්ද මෙම පාඨකයින් දැනටමත් මෙම වචනය හොඳින් දන්නා බැවිනි. එයින් අර්ථවත් වන්නේ සියලුම කිතුනුවෝ මිස, එම විශේෂිත අවස්ථාවේ දී එහි සිටි අය පමණක් නොවේ. "සභාව" යන්නෙන් අදහස් වන්නේ ක්‍රිස්තුන්වහන්සේගේ සියලු ශෝලයෝ ය. එයින් සඳහන් වන්නේ මනුෂ්‍යයින් ගැන මිස, ගොඩනැගිල්ලක් ගැන නොවේ.

සැම ප්‍රාදේශීය ඇදහිලිවතුන් කණ්ඩායමක්ම සභාවක් වේ. පාවුල්තුමා "කොරින්තියේ පිහිටා ඇති දෙවියන්වහන්සේගේ සභාව වෙතට" ලිවීය (1 කොරින්ති 1 : 2). ඔහු "ක්‍රිස්තුන්වහන්සේගේ සියලුම සභාවෝ" (රෝම 16 : 16) සහ "ලවොදීසයේ සභාවෙහි ද" (කොලොස්සි 4 : 16) යනුවෙන් දක්වයි. එසේම *සභාව* යන වචනය සියලු තැන්හි සිටින

සියලුම ඇදහිලිවතුන් දැක්වීම සඳහා ද භාවිත කළ හැකි විය : “ක්‍රිස්තුන්වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන් සිය දිවි පුද කළ සේක” (එපීස 5 : 25).

සභාව විවිධ මට්ටම්වල පවතියි. එක මට්ටමක දී එය යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තමන්ගේ ස්වාමීන් සහ ගැළවුම්කරුවාණන් ලෙස පිළිගත් ලෝකයේ සිටින සියලුම දෙනා අයත් වන විශ්වීය සභාව වේ. ප්‍රාදේශීය සභාවන් නිතර එකට රැස්වන මිනිසුන් ඇතුළත්ව විවිධ මට්ටම්වල පවතී. නිකායන් ප්‍රාදේශීය සභාවේ කණ්ඩායම් සහිතව අතරමැදි මට්ටමේ ඇත. එය එකම ඉතිහාසයක් සහ විශ්වාසයන් සහිතව වඩා සමීපව කටයුතු කරන්නේ ය.

ප්‍රාදේශීය රැස්වීම්වලට ඇතැම් විට නොඇදහිලිවන්තයින්, එනම් යේසුන්වහන්සේ ගැළවුම්කරුවාණන් ලෙස නොපිළිගත් පවුලේ සාමාජිකයින් අයත් වේ. එසේ වුවත්, ඔවුන් ඇදහිලිවන්තයින් සමඟ නිතරම හමු වේ. තමා කිතුනුවන් යයි සිතාගත් පිරිසක් ද ප්‍රාදේශීය රැස්වීමට අයත් වේ. එහෙත් ඇත්තෙන්ම ඔවුහු තමාවම රවටා ගනිති. අත්දැකීම්වලින් පසුව ඔවුන් ඇත්තෙන්ම කිතුනුවන්ව නොසිටි බව පෙන්නුම් කෙරේ.

**අපට සභාවක් අවශ්‍ය වන්නේ ඇයි?**

බොහෝ මිනිස්සු යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තුළ අදහන බව පවසති. එහෙත්, උන්වහන්සේගේ කිසිම සභාවකය නොයති. සමහර අය තමන්වම රවටා ගනිති. ඇදහිලිවන්තයින්ගේ සාමාන්‍ය ක්‍රමය වන්නේ එකට රැස්වීම බව නව ගිවිසුම පෙන්වයි (හෙබ්‍රෙව් 10 : 25).

“එකිනෙකාට” (රෝම 12 : 10, 15 : 7, 1 කොරින්ති 12 : 25, ගලාති 5 : 13, එපීස 4 : 32, පිලිප්පි 2 : 3, කොලොස්සි 3 : 13, 1 තෙසලෝනික 5 : 13) විවිධ දේ ඉටු කිරීමට පාවුල්තුමා නැවත නැවත කිතුනුවන් ධෛර්යමත් කරයි. අනෙක් ඇදහිලිවන්තයින්හා සමඟ එකතු නොවුවහොත්, මෙම අණපනත්වලට කීකරු වීම අපහසු හෝ නොහැකි හෝ වනු ඇත.

ප්‍රාදේශීය සභාවක් අනෙක් ඇදහිලිවන්තයින් සමඟ සහභාගි වීමෙන් අපට අයිති වීමේ හැඟීමක් ලබා දෙන්නේය. එය අපට ආත්මික සුරක්ෂිත බවක් ලබා දෙන්නේ ය. එම නිසා ආගන්තුක අදහස්වලින් අප ඉවතට ගසාගෙන යන්නේ නැත. ප්‍රාදේශීය සභාවක් අපට මිත්‍රත්වයක්, සහභාගීත්වයක් සහ ධෛර්යක් ලබා දීමට පුළුවන. අපට තනිවම කිසිදිනක ඉගෙන ගැනීමට නොහැකි දේවල් එය අපට උගන්වන්නට පුළුවන. සභාවක් අපගේ දරුවන් පුහුණු කිරීමට උපකාර කළ හැකිය. වඩා ඵලදායි සේවයක් සඳහා එක්ව ක්‍රියා කිරීමට අපට උපකාර කිරීමටත්, අප බලාපොරොත්තු නොවන ආකාරයේ වර්ධනයක් වීම සඳහා අපට උපකාර වන අන් අයට සේවය කිරීමේ අවස්ථාවන් ලබා දීමටත් පුළුවන. පොදු වශයෙන්, ප්‍රාදේශීය සභාවකින් අප ලබන වටිනාකම, අපි එයට දෙන සහභාගීත්වයට සමානුපාතික වේ.

එහෙත් සමහර විට, ප්‍රාදේශීය සභාවකට ඇදහිලිවන්තයෙක් සහභාගි වීමේ වැදගත්ම හේතුව වන්නේ සභාවට අප අවශ්‍ය වීම වේ. දෙවියන්වහන්සේ විවිධ ඇදහිලිවන්තයින්ට විවිධ දීමනා දී ඇත. උන්වහන්සේට “පොදු යහපත උදෙසා” (1 කොරින්ති 12 : 4 - 7) අප එකමුතුව ක්‍රියා කිරීම අවශ්‍ය වේ. වැඩයේ එක් කොටසක් පමණක් කිරීමට බල කරනු ලැබේ නම්, අපි කැමති ආකාරයට සභාව ක්‍රියාත්මක නොවන බව දැක පුදුම විය යුතු නැත. නැතිනම්, අපි කැමති ආකාරයට නිරෝගි වීමට නොහැකිය. අවාසනාවන්ත ලෙස ඇතැම් මිනිසුන්ට උපකාර කිරීමට වඩා විවේචනය කිරීමට පහසුය.

සභාවට අපගේ කාලය, අපගේ හැකියාවන්, අපගේ සම්පත් අවශ්‍ය වේ. සභාවට එය පවත්වාගෙන යාමට මිනිසුන් අවශ්‍ය වේ. එයට අපගේ කැපවීම අවශ්‍ය වේ. වැඩකරුවන් ගැන යාච්ඤා කරන්න යැයි සේසුන්වහන්සේ පැවසූ සේක (මතෙව් 9 : 38). අප පැත්තකට වී වාඩි වී සිටීම නොව, සැම දෙනාම වැඩ කිරීම උන්වහන්සේට අවශ්‍ය වේ.

සභාවකින් තොරව කිතුනුවන් වීමට උත්සහා දරන පුද්ගලයෝ බයිබලයේ සඳහන් වන ආකාරයට අන් අයට උපකාර කිරීමට අසමත් වෙති. සභාව යනු අන්‍යෝන්‍ය ආධාර සහිත සමාජයකි. අපටද උපකාර අවශ්‍ය වන එම දවස පැමිණෙන බව දැන (ඇත්තෙන්ම එම දවස පැමිණ ඇත) අපි එකිනෙකාට උපකාර කරන්නෙමු.

**සභාව විස්තර කිරීම**

සභාව විවිධ අයුරින් විස්තර කර ඇත : දෙවියන්වහන්සේගේ සෙනඟ, දෙවියන්වහන්සේගේ පවුල, ක්‍රිස්තුන්වහන්සේගේ මනාලිය. අපි ගොඩනැගිල්ලක් දේව මාලිගාවක් සහ ශරීරයක් වන්නෙමු. යේසුන්වහන්සේ අප බැටළුවන්, කමතක් සහ මිදි වත්තක් ලෙස විස්තර කළ සේක. සැම විග්‍රහයක්ම සභාවේ විවිධ අංග විස්තර කරන්නේ ය.

දේව රාජ්‍ය පිළිබඳ වූ යේසුන්වහන්සේගේ උපමා බොහොමයකින්ම සභාවද විස්තර කරන්නේය. අබ ඇටයක් ලෙසින් සභාව කුඩාවට ආරම්භ වී විශාල වශයෙන් වර්ධනය වන්නේ ය (මතෙව් 13 : 31 - 32). සභාව තිරිඟු අතර කිරිඳි වපුරා ඇති කෙතකට සමාන වේ (24 - 30 පද). එය හොඳ සහ නරක මාලු අසු වන මාලු දැලකට සමාන වේ (47 - 50 පද). සභාව ඇතැම් මිනිසුන් අඩු කාලයක් සහ තවත් අය වැඩි කාලයක් වැඩ කරන මිදි වත්තකට සමාන ය (මතෙව් 20 : 1 - 16). සභාව ස්වාමියා වෙනුවෙන් ආයෝජනය කරන පිණිස මුදල් දී ඇති මෙහෙකරුවන්ට සමාන වේ. එහි සමහර අය තවත් අයට වඩා වැඩියෙන් ඵල නිපදවති (මතෙව් 25 : 14 - 30).

යේසුන්වහන්සේ තමා එඬේරෙක් ලෙසත්, උන්වහන්සේගේ ගෝලයින් බැටළුවන් ලෙසත් විස්තර කළ සේක (මාක් 26 : 31). උන්වහන්සේගේ මෙහෙය වූයේ නැති වූ බැටළුවන සෙවීමයි (මතෙව් 18 : 11 - 14). උන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟ පෝෂණය කළ යුතු සහ රැක බලාගත යුතු බැටළුවන් ලෙස විස්තර කළ සේක (යොහන් 21 : 15 - 17). පාවුල්තුමා සහ පේදුරුතුමා සභා නායකයින් රැළේ එඬේරුන් විය යුතු බව දක්වමින් ඇතැම් විග්‍රහයක් කළහ (ක්‍රියා 20 : 28, 1 පේදුරු 5 : 2).

“ඔබ ... දෙවියන්වහන්සේගේ ගොඩනැගිල්ලය” පාවුල්තුමා කීවේය (1 කොරින්ති 3 : 9). අත්තිවාරම යේසුන් ක්‍රිස්තුන්වහන්සේ වන සේක (11 පදය). මනුෂ්‍යයෝ ඒ මත වූ ගොඩනැගිල්ල වෙති. “ආධ්‍යාත්මික ගෘහයක් ගොඩනඟන ලෙස ඔබ ජීවමාන ගල් මෙන් ...” යනුවෙන් පේදුරුතුමා කීවේය (1 පේදුරු 2 : 5). අපි එකමුතුව ගොඩනගන ලදුව, අපි “ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ වාසස්ථානය සඳහා එක්කොට ගොඩනගනු ලැබේ” (එපීස 2 : 22). අපි දෙවියන්වහන්සේගේ මාලිගාව වන්නෙමු. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගාව වන්නෙමු (1 කොරින්ති 3 : 17, 6 : 19). විවිධ ස්ථානවලදී දෙවියන්වහන්සේ නමස්කාර කරනු ලැබුව ද, සභාවට විශේෂ අරමුණක් උදෙසා වූ නමස්කාරයක් තිබේ.

අපි "දෙවියන්වහන්සේගේ සෙනඟය" යනුවෙන් 1 පේදුරු 2 : 10 අපට පවසයි. ඉශ්‍රායෙල් ජනතාව විය යුතුව සිටි අය අපි වෙමු : "තෝරාගත් වංශයක් ද, රාජකීය පූජක පෙළක් ද, ශුද්ධ ජාතියක් ද, දෙවියන්වහන්සේ සතු සෙනඟක් ද වන්නහුය" (9 පදය, නික්මයාම 19 : 6 බලන්න). ක්‍රිස්තුන්වහන්සේ උන්වහන්සේගේ රුධිරයෙන් අප මිළ දී ගත් නිසා අපි දෙවියන්වහන්සේට අයිති වෙමු (එළිදරව් 5 : 9). අපි උන්වහන්සේගේ දරුවෝ වෙමු. උන්වහන්සේගේ පවුලේ අය වෙමු (එපීස 3 : 15). උන්වහන්සේගේ සෙනඟ වශයෙන්, අපට උතුම් උරුමයක් දී තිබේ. එයට ප්‍රතිචාරයක් ලෙස අපි උන්වහන්සේ සතුටු කිරීමට උත්සහා කළ යුතු අතර, උන්වහන්සේගේ නාමයට ප්‍රශංසාව ගෙන ආ යුතුය.

අපි ක්‍රිස්තුන්වහන්සෙගේ මනාලිය ලෙස ශුද්ධ ලියවිල්ල හඳුන්වයි. මෙය අප උදෙසා වූ උන්වහන්සේගේ ප්‍රේමය හඟවයි. එසේම අපගේ ජීවිතවල අති විශාල වෙනස්කමක් එනම් දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් සමඟ අපට ඇති සමීප සම්බන්ධතාවක් හඟවයි. උන්වහන්සේගේ උපමා සමහරක මිනිස්සු මංගල උත්සවයකට සහභාගි වීමට ඇරයුම් ලබති. එහෙත් මෙම විග්‍රහයේ දී, අපි මනාලිය වීම සඳහා ඇරයුම් ලබා ඇත්තෙමු.

"අපි අතිශයින් ප්‍රීති සන්තෝෂ වෙමු. උන්වහන්සේට ගෞරවය පිරිනමමු. මන්ද බැටළු පෝතකයාණන්ගේ සරණ මංගලයය පැමිණ ඇත. උන්වහන්සේගේ මනාලිය සැරසී සිටින්නිය" (එළිදරව් 19 : 7). අපි මේ සඳහා සූදානම් වන්නේ කෙසේ ද? එය ත්‍යාගයකි : "බැබළෙන, පිවිතුරු සිනිඳු වස්ත්‍රයෙන් සැරසෙන්නට ඇයට අවසර දී ඇත" (8 පදය). ක්‍රිස්තුන්වහන්සේ "වතුරෙන්ද වචනයෙන්ද සභාව සෝදා පිරිසිදු කර, කැප කර" ඇත (එපීස 5 : 26) උන්වහන්සේ සභාව කැළලක්වත්, එබඳු කිසිවක්වත් නැතිව විශුද්ධව නිකෙලෙස්ව තමන්ටම ප්‍රදානය කරගෙන ඇත (27 පදය). උන්වහන්සේ අප තුළ ක්‍රියා කරන සේක.

## එක්ව ක්‍රියා කිරීම

සභාවේ එකිනෙක සාමාජිකයින් අතර ඇති සම්බන්ධතාවය ශරීරයක් මඟින් ඉතා හොඳින් නිරූපණය කරයි. "ඔබ ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරයයි" යනුවෙන් පාවුල්තුමා පවසයි. "ඔබ සියල්ලෝ එහි අවයවයෝය" (1 කොරින්ති 12 : 27). යේසුන් ක්‍රිස්තුන්වහන්සේ "සභාව නමැති ශරීරයේ හිස වන සේක" (කොලොස්සි 1 : 18). අපි සියල්ලෝ ශරීරයෙහි සාමාජිකයෝ වෙමු. අපි ක්‍රිස්තුන්වහන්සේට එක් වී සිටිමු නම්, අපි එකිනෙකාට ද එකතු වී සිටින්නෙමු. එසේම එකිනෙකා කෙරෙහි අපට වගකීම් ඇත්තේය.

කිසිවෙකුට "මට ඔබ අවශ්‍ය නැතැයි" කීමට නුපුළුවන (1 කොරින්ති 12 : 21). එසේම "මම සභාවකට අයිති නොවෙමි" යයි කිසිවෙකුට කිව නොහැකිය (18 පදය). දෙවියන්වහන්සේ අපගේ හැකියාවන් බෙදා දෙන අතර, අප පොදු යහපත වෙනුවෙන් එකිනෙකාට උපකාර කරමින් සහ එක්ව ක්‍රියා කරමින් උපකාර ලබමින් ක්‍රියා කළ යුතු වෙමු. "ශරීරයෙහි කිසි බෙදීමක් නොතිබිය යුතු වේ" (25 පදය). බෙදීමේ පාපය පිළිබඳ, බෙදීමට හේතු වන පුද්ගලයා සභාවෙන් නෙරපිය යුතු බව දක්වමින් පාවුල්තුමා නිතර කතා කළේය (රෝම 16 : 17, තීතස් 3 : 10). විවිධ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් "සෑම අවයවයම තමාගේ කාර්ය කරන කල" ක්‍රිස්තුන්වහන්සේ සභාව වර්ධනය වීමට සලස්වන සේක (එපීස 4 : 16).

අවාසනාවන්ත ලෙස, කිතුනු සභාව එකිනෙකා සමඟ ඇතැම් විට දබර වී විවිධ නිකායන්ට බෙදී පවති. සභාව තවම පරිපූර්ණත්වයට පැමිණ නැත. එම නිසා එහි එකම සාමාජිකයෙක්වත් පරිපූර්ණ නැත. එසේ වුවත්, සභාව එක්සත් වීම ක්‍රිස්තුන්වහන්සේට අවශ්‍ය

වේ (යොහන් 17 : 21). මෙයට ආයතනික ඒකාබද්ධතාවක් අවශ්‍ය නැත. එහෙත් එයට පොදු අරමුණක් අවශ්‍ය වේ. සැබෑ එක්සත්කමක් ඇති වන්නේ අපි ක්‍රිස්තුන්වහන්සේට සමීප වුවහොත්, උන්වහන්සේගේ ශුභාරංචිය දේශනා කළහොත් සහ උන්වහන්සේ මෙන් ජීවත් වුවහොත් පමණි. ඉලක්කය වන්නේ උන්වහන්සේ උසස් කිරීම මිස, අපවම උසස් කිරීම නොවේ. විවිධ නිකායන් පැවතීමෙන් ඇතැම් ප්‍රතිලාභ තිබේ. කෙසේ වෙතත්, වෙනස් ප්‍රවේශයන් තුළින් බොහෝ මිනිසුන් වෙත ඔවුන්ට වැටහෙන ආකාරයෙන් ක්‍රිස්තුන්වහන්සේගේ ශුභාරංචිය ළඟා වී ඇත.

**ආයතනය**

කිතුනු ලෝකයේ සභා ආයතනයට සහ නායකත්වයට ප්‍රාථමික ප්‍රවේශයන් තුනක් තිබේ : ඒවා නම්, ධූරාවලිය, ප්‍රජාතන්ත්‍රවාදය සහ නියෝජනයයි. මේවා එපිස්කෝපල් (බිෂොප්වරුන්ගේ පාලනය), සාමුහික පාලනය සහ වැඩිමහල්ලන්ගේ පාලනය යනුවෙන් වේ.

සෑම ක්‍රමයකමවෙනස්කම් තිබේ. එහෙත් පොදු වශයෙන්, එපිස්කෝපල් ක්‍රමයෙන් අර්ථවත් වන්නේ නිකායේ නිලධාරියෙකුට ප්‍රතිපත්ති සකස් කිරීමට සහ සභා පාලකයින් ආලේප කිරීමට බලය තිබීම වේ. සාමුහික ක්‍රමයේදී සභා සාමාජිකයින් විසින් තමාගේ ප්‍රතිපත්ති සහ සභා පාලකවරයා තෝරා ගනු ලැබේ. වැඩිමහල්ලන්ගේ ක්‍රමයේ දී, බලය නිකාය සහ ප්‍රාදේශීය සභා අතර බෙදී පවතී. වැඩිමහල්ලන් තෝරාගෙන පාලනය සඳහා බලය දී ඇත.

කිසිම ආකාරයක සභා ව්‍යුහයක් නව ගිවිසුම නියම කර නැත. එය බිෂෝප්වරුන්, වැඩිමහල්ලන් සහ එඬේරුන් පිළිබඳ කතා කරයි. මෙය සභා නායකයින් සඳහා වන විවිධ නම් වේ. වැඩිමහල්ලන් හට එඬේරුන් සහ බිෂෝප්වරුන් වන ලෙස පේදුරුතුමා කීවේය (1 පේදුරු 5 : 1 - 2). මෙයට සමාන ලෙස, පාවුල්තුමා වැඩිමහල්ලන් කණ්ඩායමකට ඔවුන් බිෂෝප්වරුන් සහ එඬේරුන් වශයෙන් සිටි බව කීවේය (ක්‍රියා 20 : 17, 28).

යෙරුසලමේ සභාවේ නායකත්වය දැරුවේ වැඩිමහල්ලන් කණ්ඩායමකි. පිලිප්පි සභාවේ නායකත්වය දැරුවේ බිෂෝප්වරු කිහිප දෙනෙකි (ක්‍රියා 15 : 2-6, පිලිප්පි 1:1). පාවුල්තුමා ක්‍රීතයේ වැඩිමහල්ලන් පත් කරන පිණිස තීතස් උසස් කළේය. සභා නායකයින් සඳහා භාවිත වන පද නිසා ඔහු වැඩිමහල්ලන් පිළිබඳ එක් පදයකුත්, බිෂොප්වරු පිළිබඳ පද කිහිපයකුත් ලිව්ය (තීතස් 1:5-9). හෙබ්‍රෙව් පොතේ නායකයින් "නායකයින්" ලෙස හඳුන්වයි (හෙබ්‍රෙව් 13:7).

සමහර සභා නායකයින් "ගුරුවරුන්" ලෙස ද හඳුන්වා තිබේ (1 කොරින්ති 12: 29, යාකොබ් 3:1). එපීස 4 : 11 වන පදයෙහි සඳහන් වන ව්‍යාකරණයෙන් සභා පාලකයින් සහ ගුරුවරුන් එක කොටසක සිටි බව පෙන්නුම් කෙරේ. සභා නායකයාගේ ප්‍රාථමික කාර්යයන්ගෙන් එකක් වන්නේ ඉගැන්වීමයි. නායකත්වයේ එක් ගුණාංගයක් වන්නේ "ඉගැන්වීමට හැකියාව" තිබීමයි (1 තිමෝති 3:2).

මෙහිදී එක් දෙයක් ස්ථිරය : එනම්, නායකයින් ලෙස විවිධ මනුෂ්‍යයින් පත් කර ඇත. ප්‍රාදේශීය සභාවන්ට ඇතැම් සංවිධාන තිබිණි. එහෙත් එයට ගැළපෙන නියම තේමාව නොපෙනේ. මෙම නායකයින්ට ගරු කිරීමටත්, කීකරු වීමටත් සාමාජිකයින් ධෛර්යවත් කර ඇත (1 තෙසලෝනික 5: 12, 1 තිමෝති 5:17, හෙබ්‍රෙව් 13:17).

නායකයා වැරදි දෙයක් අණ කළහොත්, සාමාජිකයින් කීකරු විය යුතු නැත. එහෙත් වැඩි කොටසක් සාමාජිකයින් ඔවුන්ගේ නායකයින්ට උපකාර කළ යුතු වේ.

නායකයින් කරන්නේ කුමක් ද? ඔවුහු "සභාවේ කටයුතුවලට යොමු කරති" (1 තිමෝති 5:17). ඔවුහු ආදර්ශයෙන් සහ ඉගැන්වීමෙන් නායකත්වය දෙමින් රැළෙහි එඬේරකම් කරති. ඔවුහු සභාව රැක බලා ගනිති (ක්‍රියා 20: 28). ඔවුහු එය අන්‍යයන්ට පැවරීම නොකර, ඔවුන්ට සේවය කළ යුතුය (1 පේදුරු 5:2-3). ඔවුහු "දෙවියන්වහන්සේගේ සෙනඟ දේව සේවය සඳහා සම්පූර්ණයෙන් පුහුණු කිරීමටත්, ක්‍රිස්තු ශරීරය වර්ධනය කිරීමටත්" සිටින්නෝය (එපිස 4:12)

නායකයින් තෝරා ගන්නේ කෙසේ ද? අපිට මෙය අවස්ථා කිහිපයකදී පමණක් දක්වා ඇත : පාවුල්තුමා වැඩිමහල්ලන් පත් කළේය (ක්‍රියා 14:23). තිමෝතිට බිෂොප්වරු පත් කිරීමට කීවේය (1 තිමෝති 3:1-7). එසේම වැඩිමහල්ලන් පත්කිරීමට තිතස්ට අධිකාරය දුන්නේය (තීතස් 1:5). අවම වශයෙන් මෙම සිද්ධීන්වලින් එහි ධූරාවලියක් විය. සභා සාමාජිකයින් ඔවුන්ගේ නායකයා පත් කර ගැනීමේ නිදසුනක් අපි නොදකිමු.

**වැඩිමහල්ලෝ**

කෙසේ වෙතත්, ක්‍රියා 6 : 1- 6 සාමාජිකයින් විසින් නායකයින් තෝරාගැනීම අපි දකිමු. මෙම මනුෂ්‍යයින් තෝරා ගනු ලැබුවේ අවශ්‍යතා ඇති අයට ආහාර බෙදා දීම උදෙසා ය. පසුව අපෝස්තුළුවරු ඔවුන් මේ සඳහා පත් කළහ. ඒ ආකාරයෙන් අපෝස්තුළුවරුන්ට ආත්මික කාරණා කෙරෙහි අවධානය යොමු කළ හැකි විය. එසේම භෞතික අවශ්‍යතාද සම්පූර්ණ විය (2 පදය). ආත්මික නායකත්වය සහ භෞතික නායකත්වය අතර වූ මෙම වෙනස 1 පේදුරු 4 : 11 -12 පදවලද දැකගත හැකිය.

ශාරීරික කාර්යයන් කරන නායකයින් සේවය කිරීම යන්නෙන් අදහස් වන *ඩියාකෝනියෝ* යන ග්‍රීක වචනයෙන් බිඳී ආ ඩියාකෝන්වරු (උපස්ථායකයින්) ලෙස ද හඳුන්වනු ලැබේ. සියලුම සාමාජිකයින් සහ නායකයින් සේවය කළ යුතුව ඇතත්, සමහර අය සේවය කිරීමේ භූමිකාවට විශේෂ ලෙස පත් කර ඇත. අවම වශයෙන් එක් කාන්තාවක් හෝ උපස්ථායිකාවක් ලෙස හඳුන්වා ඇත (රෝම 16:1). (කාන්තාව උදෙසා පුරුෂලිංග පදයක් භාවිත කර තිබීමෙන් සාමාන්‍ය තේමාව සම්බන්ධ බව යෝජනා කෙරේ.)

උපස්ථායකයෙක් තුළ තිබිය යුතු ගුණාංග ලැයිස්තුවක් පාවුල්තුමා තිමෝතිට දුන්නේය (1 තිමෝති 3:8-12). එහෙත් ඔවුහු කළ දේවල් ඔහු දක්වන්නේ නැත. විවිධ නිකායන් ඔවුන් පාලනය යටතේ තබාගැනීමේ සිට මූල්‍ය කළමනාකරණය දක්වා වූ විවිධ භූමිකා සඳහා පත්කරති.

නායකත්වයේ වැදගත්ම දෙය වන්නේ මනුෂ්‍යයින් කැඳවනු ලැබුවේ කුමක්ද, ඔවුන් ව්‍යුහය කෙසේ වීද හෝ ඔවුන් පත් කළේ කෙසේද හෝ යන්න නොවේ. වැදගත්ම දෙය වන්නේ නායකත්වයේ අරමුණයි : එනම්, දෙවියන්වහන්සේගේ සෙනඟ ක්‍රිස්තුන්වහන්සේ මෙන් පරිණත බවට වර්ධනය වීමයි (එපිස 4:13)

**සභාවෙහි අරමුණු**

ක්‍රිස්තුන්වහන්සේ උන්වහන්සේගේ සභාව ගොඩනඟා, උන්වහන්සේගේ සෙනඟට දීමනා සහ නායකත්වය දුන් සේක. එසේම උන්වහන්සේ අපට කිරීම සඳහා කාර්යක් ද දුන් සේක. අපි දැන් සභාවේ අරමුණු නැවත බලමු.

සභාවේ ප්‍රධානම අරමුණ වන්නේ නමස්කාරයයි. දෙවියන්වහන්සේ අප කැඳෙව්වේ "අපි උන්වහන්සේගේ මහිමාන්විත ක්‍රියා දන්වනු පිණිසය". උන්වහන්සේ "අන්ධකාරයෙන් ස්වකීය විස්මපත් ආලෝකයට ඔබ කැඳවාගත්" සේක (1 පේදුරු 2 : 9). උන්වහන්සේ තමන්වහන්සේට නමස්කාර කරන අය සොයන සේක (යොහන් 4 : 23). සියල්ලටම ඉහළින් උන්වහන්සේට ප්‍රේම කරන අය සොයන සේක (මතෙව් 4 : 10). පෞද්ගලික ලෙස හෝ සභාවක් ලෙස හෝ අපි කරන සියල්ල උන්වහන්සේගේ ගෞරවය සඳහා විය යුතුය (1 කොරින්ති 10 : 31). අප කැඳවා ඇත්තේ "දෙවියන්වහන්සේට අපගේ පැසසුම් පූජාව නොකඩව පුද කරන" පිණිසය (හෙබ්‍රෙව් 13 : 15).

"ගීතිකා, තුති ගී හා ශුද්ධ ගී එකිනෙකාට ගයන්න" අපි අණ ලබා ඇත්තෙමු (එපීස 5 : 19). සභාවක් ලෙස අපි එකතු වන විට, අපි දෙවියන්වහන්සේට ප්‍රශංසා ගායනා කරන්නෙමු. අපි උන්වහන්සේට යාච්ඤා කරන අතර, උන්වහන්සේගේ වචනයට සවන් දෙන්නෙමු. නමස්කාර කිරීමේ විවිධ ක්‍රම තිබේ. එය අවසාන රාත්‍රි භෝජනයේ ද, බෞතීස්මයේ ද, කීකරුකමේ ද ඇත්තේය.

ඉගැන්වීම සභාවේ තවත් අරමුණකි. එය මහා ආඥාවේ හදවත ඇතිවය : "මා විසින් ඔබලාට අණ කළ සියල්ල පවත්වන්ට ඔවුන්ට උගන්වන්න" (මතෙව් 28 : 20). සභා නියකයින් ඉගැන්විය යුතුය. එසේම සැම සාමාජිකයෙක්ම එකිනෙකාට ඉගැන්විය යුතු වේ (කොලොස්සි 3 : 16). අපි එකිනෙකා ධෛර්ය කළ යුතු වෙමු (1 කොරින්ති 14 : 31, 1 තෙසලෝනික 5 : 11, හෙබ්‍රෙව් 10 : 25). අන්‍යෝන්‍ය සේවය සඳහා කුඩා කණ්ඩායම් ඉතා හොඳ ක්‍රමයක් සපයයි. අපිට ආත්මික වීමට අවශ්‍ය නම්, "සභාව ගොඩනැගීම" අවශ්‍ය බව පාවුල්තුමා පවසයි (1 කොරින්ති 14 : 12). ඉලක්කය වන්නේ සන්නද්ධ කිරීම, ශක්තිමත් කිරීම, ධෛර්ය දීම සහ සැනසීමයි (3 පදය). මුළු රැස්වීමම "සභාව ශක්තිමත් කිරීම පිණිස" විය යුතුයි (26 පදය). අපි දෙවියන්වහන්සේගේ වචනය ඉගෙන ගෙන එය අදාළ කරගන්නා ගෝලයෝ වෙමු. මුල් සභාව "ප්‍රේරිතයන්ගේ ඉගැන්වීමෙහි ද, සහභාගිකමෙහිද, රොටි කැඩීමෙහි ද, යාච්ඤාවෙහි ද නිරතව කල් ගත කළහ" (ක්‍රියා 2 : 42). එම නිසා ඔවුන්ට ප්‍රශංසා ලැබිණි.

සේවය කිරීම සභාවේ තුන්වන ප්‍රධාන අරමුණ වේ. "එබැවින් අපට ඉඩ ප්‍රස්ථා ඇති හැටියට සියල්ලන්ටම, ප්‍රධාන කොට ඇදහිල්ලේ පවුලට අයිති අයට යහපත්කම් කරමු" (ගලාති 6 : 10) යනුවෙන් පාවුල්තුමා ලියයි. අපගේ පළමුවන වගකීම අපගේ පවුල වේ. පසුව සභාව සහ ඉන්පසුව අවට ලෝකය වේ. දෙවන උතුම්ම ආඥාව වන්නේ අපගේ අසල්වාසියාට ප්‍රේම කිරීමයි (මතෙව් 22 : 39).

මෙම ලෝකයේ විවිධ භෞතික අවශ්‍යතා තිබේ. අපි ඒවා ප්‍රතික්ෂේප නොකළ යුතුය. එහෙත් උතුම්ම අවශ්‍යතාවය වන්නේ ශුභාරංචියයි. අපි එය ද ප්‍රතික්ෂේප නොකළ යුතු වෙමු. ලෝකයට ඇති අපගේ සේවයේ කොටසක් වශයෙන්, යේසුන් ක්‍රිස්තුන්වහන්සේ තුළින් වන ගැළවීම පිළිබඳ සභාව දේශනා කළ යුතු වේ. අන් කිසි ආයතනයක් මෙය ඉටු කරන්නේ නැත. එය සභාවේ මෙහෙය වේ. ඇතැම් අය ඉදිරි පේළියේ ද, තවත් අය උපකාර පිණිස ද

සෑම සේවකයෙක්ම අවශ්‍ය වේ. සමහරු සිටවති, සමහරු පෝෂණය කරති, තවත් අය අස්වැන්න නෙළා ගනිති. අපි එක්ව ක්‍රියා කරන කල, ක්‍රිස්තුන්වහන්සේ සභාව වර්ධනය වීමට සලස්වන සේක (එපිස 4 : 16).

**ගෝලත්වය 101**

**ඒකකය 8 ආ**



# සභාවේ කාර්යයන් හය

නමස්කාරය සහ අනුශාසනාව උදෙසා අපි සතිපතා රැස්වන්නේ මන් ද? අපට නිවසේ දී කරදරයකින් තොරව නමස්කාර කිරීමට, බයිබලය කියවීමට සහ ගුවන් විදුලියෙන් දේශනාවක් ඇසීමට නොහැකි ද?

පළමුවන ශත වර්ෂයේ දී ශුද්ධ ලියවිලි ඇසීමට සතිපතා මිනිස්සු රැස් වූහ. එහෙත් වර්තමානයේ අපට කියවීම පිණිස අපගේම බයිබල් පිටපතක් තිබේ. එම නිසා අපම බයිබලය කියවා ගැනීම පිණිස නිවසේ නතර නොවන්නේ ඇයි? එය නිසැක ලෙසම පහසු මෙන්ම වියදමෙන් අඩු දෙයක් ද වන්නේ ය.

නවීන තාක්ෂණය හරහා ලෝකයේ සිටින සියලු දෙනාටම සෑම සතියකම ලොව හොඳම දේශකයින්ට සවන් දීමට හැකියාව ඇත ! නැතිනම් අපට විකල්ප තිබේ. අපට අදාළ වන දේශනා පමණක් ඇසීම හෝ අප කැමති විෂයන්වලට පමණක් සවන් දීම කළ හැකිය. එය හොඳ දෙයක් නොවේ ද?

ඇත්තෙන්ම එසේ නොවේ. නිවසේ සිටින කිතුනුවන්ට කිතුදහමේ බොහෝ වැදගත් අංග මඟහැරෙන බව මම සිතමි. විශ්වාසවන්ත ලෙස සභාවට සහභාගි වන අය අපගේ රැස්වීම්වලින් වඩා වැඩිපුර දෙයක් ලබාගැනීම පිණිස දිරිමත් කිරීමටත්, අනෙක් අය සතිපතා රැස්වීම්වලට සහභාගි වන පිණිස දිරිමත් කිරීමටත් මෙම පාඩමින් මම බලාපොරොත්තු වෙමි.

අප සෑම සතියකදීම රැස්වන්නේ මන්දැයි අවබෝධ කරගැනීමට දෙවියන්වහන්සේ සභාව නිර්මාණය කළේ මන්දැයි ඇසීම ප්‍රයෝජනවත් වේ. එයට ඇත්තේ කුමන අරමුණක් ද? සභාවේ ක්‍රියාකාරීත්වයන් ඉගෙන ගැනීමෙන් *අපගේ සතිපතා රැස්වීම් දෙවියන්වහන්සේගේ දරුවන් උදෙසා උන්වහන්සේගේ ආශාව විවිධ අරමුණු මඟින් ඉටු කරන්නේ* කෙසේද යන්න අපට දැකගත හැකිය.

දෙවියන්වහන්සේ *පනින්න* යයි කී විට පැනීමට තරම් උන්වහන්සේගේ අණපනත් අත්තනෝමතික ඒවා නොවන්නේ ය. උන්වහන්සේගේ අණපනත් ලබා දී ඇත්තේ අපගේම යහපත උදෙසා ය.

ඇත්තෙන්ම අප තරුණ කිතුනුවන් ලෙස සිටියදී උන්වහන්සේ විවිධ දේවල් අණ කරන්නේ *මන්දැයි* අපට අවබෝධ කරගත නොහැකි වේ. එයට හේතුව කුමක්දැයි දැනගැනීමට පෙර අපි මෙම අණපනත් සියල්ලට කීකරු විය යුතු වේ. අපි දෙවියන්වහන්සේ හොඳම දෙය දන්නා

බවත්, එම නිසා අපි උන්වහන්සේ කියන දේ කරන බවත් විශ්වාස කරන්නෙමුව. එම නිසා තරුණ කිතුනුවෙක් දේවස්ථානයට සහභාගි වන්නේ කිතුනුවන් එය කළ යුතු නිසාවෙනි. තරුණ කිතුනුවෙක් දේවස්ථානයට සහභාගි වන්නේ හෙබ්‍රෙව් 10:25 සඳහන් වන “අපේම රැස්වීම්වලින් ඈත්ව නොසිට” සිටීමේ හේතුවෙනි.

මේ දක්වා එය කදිමය. එහෙත් අපි ඇදහිල්ලෙහි මුහුකුරා යන විට දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟට රැස්වීමට කිවේ මන්දැයි ගැඹුරු අවබෝධයක් අපට ඇති වේ.

**අණපනත් කිහිපයක්**

මෙම විෂය වඩා පුළුල්ව අපි අධ්‍යයනය කිරීම සඳහා කිතුනුවන් එකිනෙකා සමඟ රැස් විය යුතු බව හෙබ්‍රෙව් පොත පමණක් නොපවසන බව පෙන්වන්නෙමු. “එකිනෙකාට ප්‍රේම කරන්න” යනුවෙන් යේසුන්වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට පැවසූ සේක (යොහන් 13:34). “එකිනෙකාට” යනුවෙන් යේසුන්වහන්සේ කී කල, සියලුමනුෂ්‍යයින්ට ප්‍රේම කරන්න යනුවෙන් උන්වහන්සේ නොදැක්වූ සේක. ඒ වෙනුවට, විශේෂයෙන් ගෝලයින් අනෙක් ගෝලයින්ට ප්‍රේම කළ යුතු බව දැක්වූ සේක. එය අන්‍යෝන්‍ය ප්‍රේමයක් විය යුතුය. මෙම ප්‍රේමය යේසුන්වහන්සේගේ ගෝලයින්ගේ ප්‍රධාන චරිත ලක්ෂණයක් විය (35 පදය).

අන්‍යෝන්‍ය ප්‍රේමය කඩ සාප්පුවක හෝ ක්‍රීඩා තරඟයක දී හෝ අහඹු හමුවීම්වල විදහා පාන්නේ නැත. යේසුන්වහන්සේගේ අණ උන්වහන්සේගේ ගෝලයින් නිතර හමු වන බවට පූර්ව කල්පනාවකි. කිතුනුවන් අනෙක් කිතුවන් සමඟ නිතර සහභාගිකම් පැවැත්විය යුතු වේ.

“එබැවින් අපට ඉඩප්‍රස්ථා ඇති හැටියට සියල්ලන්ටම ප්‍රධානකොට ඇදහිල්ලේ පවුලට අයිති වූ අයට යහපත්කම් කරමු” (ගලාති 6:10) යනුවෙන් පාවුල්තුමා ලිවීය. මෙම අණට කීකරු වීමට ඇදහිල්ලේ පවුලේ අය කවුරුන්දැයි දැනගැනීම අවශ්‍ය වේ. අපි ඔවුන් දැකීම අවශ්‍ය වේ. එසේම ඔවුන්ගේ අවශ්‍යතා දැකීම අවශ්‍ය වේ.

“එකිනෙකාට සේවය කරන්න” (ගලාති 5:13) යයි පාවුල්තුමා ගලාතියේ සභාවට ලියුවේය. නොඇදහිලිවතුන්ට විවිධ ආකාරයෙන් අප උපකාර කළ ද, පාවුල්තුමා මෙම පදය එම දේ අපට කීමට භාවිත නොකරයි. මෙම පදය තුළ ඔහු අපට ලෝකයාට සේවය කිරීමට අණ කරන්නේ නැත. එසේම අපට සේවය කිරීමට ලෝකයාට අණ කරන්නේ ද නැත. ඒ වෙනුවට, ඔහු *යේසුන් ක්‍රිස්තුන්වහන්සේ අනුගමනය කරන අය අතර අන්‍යෝන්‍ය සේවය කිරීමට* අණ කරයි. “එකිනෙකාගේ බර උසුලා එසේ ක්‍රිස්තුන්වහන්සේගේ ආඥාව පිළිපදින්න” (ගලාති 6:2). යේසුන් ක්‍රිස්තුන්වහන්සේට කීකරු වීමට අවශ්‍ය මිනිසුන්ට, අනෙක් ඇදහිලිවන්තයින් උදෙසා වූ ඔවුන්ගේ වගකීම පිළබඳ පාවුල්තුමා කතා කරන්නේය. එහෙත් අනෙක් අයගේ බර කුමක්දැයි නොදැන එම බර අපි උසුලන්නේ කෙසේ ද? එසේම අපි නිතර එකිනෙකා මුණගැසුණේ නැතිනම් අපි ඒවා දැනගන්නේ කෙසේ ද?

“අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම්, එකිනෙකා සමඟ සහභාගිකම අපට ඇත” (1 යොහන් 1 : 7) යනුවෙන් යොහාන්තුමා ලිවීය. යොහන්තුමා කතා කරන්නේ ආලෝකයේ ගමන් කරන අය පිළිබඳව ය. ඔහු කතා කරන්නේ ආත්මික සහභාගිත්වයක් පිළිබඳව මිස, නොඇදහිලිවන්තයින් සහ වූ සාමාන්‍ය දැන ඇඳුනුම්කමක් ගැන නොවේ. අපි ආලෝකයෙහි ගමන් කරන්නෙමු නම්, සහභාගිකම් පැවැත්වීම පිණිස අපි අන් ඇදහිලිවතුන් දෙස බලන්නෙමු.

මෙයට සමාන ලෙස, පාවුල්තුමා මෙසේ ලියයි. “එකිනෙකා පිළිගන්න” (රෝම 15 : 7). “එකිනෙකා කෙරෙහි කරුණාව ද දයානුකම්පාව ද ඇතුව සිට, දෙවියන්වහන්සේ ක්‍රිස්තුන්වහන්සේ තුළින් ඔබට කමා කළාක් මෙන් ඔබත් එකිනෙකාට කමා කරන්න” (එපීස 4 : 32). කිතුනුවන්ට එකිනෙකා වෙත වූ විශේෂ වගකීම් ඇත.

නව ගිවිසුම පුරාම එක්ව නමස්කාර කිරීම, එකට ඉගෙන ගැනීම, තමන්ගේ ජීවිත එකිනෙකා සමඟ බෙදා ගැනීම පිණිස මුල් කිතුනුවෝ එකිනෙකා රැස් වූහ (නිදසුනක් ලෙස ක්‍රියා 2 : 41 - 47). පාවුල්තුමා ගිය සෑම ස්ථානයකදීම විසිරී ගිය ඇදහිලිවතුන් අත්නොහැර සභාවන් ඇති කළේය. ඔවුහු ඔවුන්ගේ ඇදහිල්ල බෙදා ගැනීමට මහත් උනන්දුවෙන් සිටි අතර, එකිනෙකා සමඟ ජ්වලිතව සිටියහ. මෙය බයිබලීය ක්‍රමය වේ.

එහෙත් දේශනාවලින් තමන් කිසිවක් ලබා නොගන්නා බව ඇතැම් මිනිස්සු පැමිණිලි කරති. එය සත්‍ය වන්නට පුළුවන. එහෙත් රැස්වීමට සහභාගි වීම නතර කිරීමට එය හේතුවක් නොවේ. එවැනි මිනිස්සු “ලබා ගැනීම” වෙතින් “දීම” වෙත තම දැක්ම වෙනස් කරගත යුතු වේ.

අපි නමස්කාර මෙහෙයන්වලට සහභාගි වන්නේ ලබා ගැනීම පිණිස පමණක් නොව, දීම සඳහා ද වේ. දෙවියන්වහන්සේට අපගේ මුළු හදවතින් නමස්කාරය දීම සහ සභාවේ අනෙක් සාමාජිකයින්ට සේවය කිරීම වේ.

සභාවේ මෙහෙයන්වල දී අපි අන් අයට උපකාර කළ හැකි වන්නේ කෙසේ ද? දරුවන්ට ඉගැන්වීමෙන්, ගොඩනැගිල්ල පිරිසිදු කිරීමට උපකාර කිරීමෙන්, ගීතිකා ගායනා කිරීමෙන් සහ විශේෂ සංගීතයෙන්, පුටු සකස් කිරීමෙන්, මිනිසුන්ට ආචාර කිරීමෙන් ආදියෙන්ය. දේශනාවලින් යමක් ලබා ගැනීම පිණිස අපි අවකාශය සලසන්නෙමු. අපි සහභාගි වීම තුළින් සතිය පුරා යාච්ඤා කිරීමට අවශ්‍යතා මෙන්ම, අන් අයට උපකාර කිරීම පිණිස කළ හැකි දේ සොයා ගන්නෙමු. දේශනාවලින් කිසිවක් ඔබ ලබා නොගන්නෙහි නම්, අන් අයට දීම පිණිසවත් එයට සහභාගි වන්න.

පාවුල්තුමා මෙසේ ලියුවේ ය. “එහෙයින් මේ වචනවලින් එකිනෙකා සනසන්න” (1 තෙසලෝනික 4 : 18). “ප්‍රේමයට හා යහපත් ක්‍රියාවලට එකිනෙකා පොළඹවන පිණිස එකිනෙකා ගැන සලකමු” (හෙබ්‍රෙව් 10 : 24). හෙබ්‍රෙව් 10 : 25 සඳහන් රැස්වීම්වලට සහභාගි වීමේ අණට ප්‍රධාන හේතුව වන්නේ මෙයයි. අපි අන් අය ධෛර්යවත් කළ යුතු වේ. ශුභවාදී වචනවල මූලයක් විය යුතු වේ. සත්‍ය වූ, ආදරණීය වූ සහ යහපත් කීර්තියක් ඇති කොයි යම් දෙයක් හෝ කළ යුතු වේ.

යේසුන්වහන්සේ නිදසුනක් ලෙස සලකන්න. උන්වහන්සේ නිතර සිනගෝගයට ගොස් ශුද්ධ ලියවිලි කියවීම්වලට සවන් දුන් සේක. එය උන්වහන්සේගේ අවබෝධයට කිසිවක් එකතු කළේ නැත. පාවුල්තුමා වැනි උගත් අයෙකුට එය කම්මැලි දෙයක් වන්නට ඇත. එහෙත් එය තමා නැවතීමට ඔහු ඉඩ දුන්නේ නැත.

**රාජකාරිය සහ ආශාව**

සදාකාල මරණයෙන් යේසුන් වහන්සේ තමා ගළවාගත් බව විශ්වාස කරන මිනිස්සු සැබවින්ම එය සම්බන්ධව උනන්දු විය යුතුය. ඔවුන්ගේ ගැළවුම්කරුවාණන්ට ප්‍රශංසා කිරීම සඳහා එක්රැස්වීම ඔවුන්ට ප්‍රීතියකි.

ඇත්තෙන්ම, අපට නරක සමහර දවස් තිබෙන අතර, සහභාගි වීමට නොහැඟේ. එම අවස්ථාවේ දී එය අපගේ ආශාව නොවුව ද, එය අපගේ වගකීම වේ. යේසුන් ක්‍රිස්තුන්වහන්සේ අපගේ ස්වාමින් වහන්සේ ලෙස අපි අනුගමනය කරන්නෙමු නම්, අපි කරන්නට කැමති දේවල් පමණක් කරමින් ජීවත් වීමට අපට නොහැකිය. උන්වහන්සේ තමාගේම කැමැත්ත කිරීමට සෙව්වේ නැත. එහෙත් උන්වහන්සේගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කළ සේක. ඇතැම් විට අප දැවෙන්නේ මේ නිසාවෙනි. අනෙක් සියල්ල අසමත් වන විට, උපදේශයන් කියවන්න යනුවෙන් පැරණි කියමනක් ඇත. උපදේශයෙන් පවසන්නේ අපට සහභාගි වන්නට කියාය.

එහෙත් ඇයි? සභාව ඇත්තේ කුමක් උදෙසා ද?

සභාවට විවිධ ක්‍රියාකාරීත්වයන් තිබේ. අපි මීට පෙර ඒවා කොටස් තුනකට බෙදා දැක්වීමු. එනම්, ඉහළට, ඇතුළට සහ පිටතට යනුවෙනි. මෙම සංවිධානාත්මක ක්‍රමයට වෙනත් ක්‍රම මෙන්ම සදාචාරයන් සහ සීමාවන් ඇත. එය සරල වන අතර, සරල බව යහපත් වේ.

එහෙත් එයින් අපගේ ඉහළට ඇති සම්බන්ධතාවය පෞද්ගලික සහ පොදු විදහා පැමක් බව පෙන්වන්නේ නැත. සභාව තුළ අපගේ සම්බන්ධතාවය සභාව ඇතුළත සිටින සියලු දෙනා සමඟම එක සමාන වන්නේ නැත. සභාව ඇතුළත සහ අවට සිටින ප්‍රජාව වෙත ඇතුළට සහ පිටතට සේවයක් දී ඇති බව එයින් පෙන්වන්නේ නැත.

සභා කාර්යන්වල සාම්ප්‍රදායික අංග ගෙන ඒම පිණිස ඇතැම් කිතුනුවෝ උපක්‍රම හතරක් හෝ පහක් භාවිත කර ඇත. මෙම පාඩමට මම කොටස් හයක් භාවිත කරමි.

**1) නමස්කාරය**

දෙවියන්වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවය පෞද්ගලික සහ පොදු වූවකි. අපට ඒ දෙකම අවශ්‍ය වේ. අපි දෙවියන්වහන්සේට ඇති අපගේ පොදු අන්තර් ක්‍රියාව වන නමස්කාරයෙන් ආරම්භ කරමු. ඇත්තෙන්ම අපි තනිවම සිටින විට දෙවියන්වහන්සේට නමස්කාර කිරීම පහසුය. එහෙත් *නමස්කාරය* යන වචනය අපි පොදුවේ කරන යමක් හඟවයි. නමස්කාරය යන්නෙහි ඉංග්‍රීසි වචනය වටිනා යන වචනයට සම්බන්ධව පවතී. අපි දෙවියන්වහන්සේට නමස්කාර කරන කල උන්වහන්සේගේ වටිනාකම ප්‍රකාශ කරන්නෙමු.

මෙම වටිනාකම් ප්‍රකාශ කිරීම අපගේ යාච්ඤාවලින් පෞද්ගලිකව සහ පොදු වශයෙන් වචන, ගීතිකා සහ ප්‍රශංසා මඟින් සිදු කෙරේ. අපි දෙවියන්වහන්සේගේ මහිමතාවන් දක්වන පිණිස සිටින බව 1 පේදුරු 2:9 පවසයි. මෙහි අවධාරණය නම්, මෙය *පොදු* ප්‍රකාශ කිරීමක් බවයි. ප්‍රජාවක් ලෙස දෙවියන්වහන්සේගේ සෙනඟ එක්ව නමස්කාර කරන බව පැරණි සහ නව ගිවිසුම් පෙන්වයි.

පැරණි සහ නව ගිවිසුම්වල බයිබලීය ක්‍රමය වන්නේ ගීතිකා බොහෝ විට නමස්කාරයේ කොටසක් බවයි. දෙවියන්වහන්සේ සමඟ ඇති උද්වේගයන් සමහරක් ගීතිකාවලින් විදහා දැක්වේ. ගීතිකාවලින් දෙවියන්වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවයේ බිය, ඇදහිල්ල, ප්‍රේමය, ප්‍රීතිය, නිසැකකම, ගෞරවය සහ වෙනත් උද්විගයන්ගේ විශාල ප්‍රමාණයක් විදහා දක්වයි.

ඇත්තෙන්ම, රැස්වී සිටින සියලු දෙනාගේම උද්වේගයන් එකම අවස්ථාවේ දී එක සමාන වන්නේ නැත. එසේ වුවත්, අපි සියල්ලෝ එක්ව ගායනා කරන්නෙමු. සමහර සාමාජිකයෝ එකම උද්වේගය වෙනස් ආකාරවලින්, විවිධ ගීතිකාවලින් සහ විවිධ ක්‍රමවලින් විදහා දක්වති. එසේද වුවත් අපි තවම එක්ව ගායනා කරන්නෙමු. "ගීතිකා තුති ගීතිකා හා ශුද්ධ ගී එකිනෙකාට ගයන්න" (එපීස 5:19). අපි හමු විය යුත්තේ මේ දේ කිරීම උදෙසා ය !

සංගීතය එකමුතුකමේ විදහාපෑමක් විය යුතුය. එසේ වුවත් එය බොහෝ විට එකඟ නොවීම්වලට හේතුවක් වේ. විවිධ සංස්කෘතීන් සහ විවිධ වයස් කාණ්ඩවල අය විවිධ ආකාරයෙන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරති. සැම සභා ප්‍රදේශයක්ම පාහේ විවිධ සංස්කෘතීන් නියෝජනය කරන්නේය. සමහර සාමාජිකයින්ට අලුත් ගීතිකා ඉගෙන ගැනීමට අවශ්‍ය වේ. සමහර අයට පැරණි ගීතිකා භාවිත කිරීම අවශ්‍ය වේ. දෙවියන්වහන්සේ මේ දෙකටම කැමති බව මෙයින් පෙනේ. උන්වහන්සේ වසර දහස් ගණනක් පැරණි ගීතාවලියට ප්‍රිය කරන සේක. එසේම උන්වහන්සේ අලුත් ගීතිකාවලට ද ප්‍රිය කරන සේක. සමහර පැරණි ගීතිකා - ගීතාවලිය - අලුත් ගීතිකාවල බලපැවැත්වෙන බව දැනගැනීම ප්‍රයෝජනවත් වේ :

"දමිටුනි, හිමිතුමන් කෙරේ ප්‍රීති සන්තෝෂ වන්න. ප්‍රශංසාව අවංක අයට හොබනා දෙයකි. වීණාව වයා හිමිතුමන් පසසන්න. තත් දසයේ වීණාව ගෙන එතුමන්ට පැසසුම් ගීත ගයන්න. එතුමන්ට නව ගීතයක් ගයන්න.මහ හඬකින් දක්ෂ ලෙස වාදනය කරන්න" (ගීතාවලිය 33:1-3).

පළමුවරට අපගේ දේව මෙහෙයන්වලට සහභාගි වන පිරිසෙහි අවශ්‍යතා පිළිබඳ අපගේ සංගීතයේ දී සැලකිලිමත් විය යුතුය. ඔවුන් අර්ථවත් යයි දකින, ඔවුන් ප්‍රීතිමත් යයි අවබෝධ කරගන්නා ආකාරයේ සංගීතයක් අපට අවශ්‍ය වේ. අප ආශා කරන ගීතිකා පමණක් ගායනා කළහොත්, ඒ මඟින් අප අන් අය ගැන සලකනවාට වැඩියෙන් අපගේම සුව පහසුව සලකන බවට වූ පණිවුඩය යැවේ.

එසේම අපි සමකාලීන රටාවේ ගීතිකා ඉගෙන ගැනීම ආරම්භ කිරීමට අලුත් අය සහභාගි වීම ආරම්භ කරන තෙක් සිටීමට නොහැකිය. අපි ඒවා දැන්ම ඉගෙනගත යුතුය. එවිට ඒවා අර්ථවත් ලෙස ගායනා කළ හැකි වේ. එහෙත් සංගීතය යනු අපගේ නමස්කාර මෙහෙයන්වල එක් අංගයක් පමණි. උද්වේගයන් විදහා දැක්වීමට වඩා යමක් නමස්කාරයේ අන්තර්ගත වේ. දෙවියන්වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවයට අපගේ මනස, අපගේ සිතීමේ ක්‍රියාවලිය ද ඇතුළත් වේ. දෙවියන්වහන්සේ සමඟ වූ අපගේ අන්තර් සම්බන්ධතාවයේ ඇතැම් දේවල් යාච්ඤාවේ ස්වභාවයෙන් ද පැමිණිය හැකිය. එක්රැස්වූ දෙවියන්වහන්සේගේ සෙනඟ වශයෙන් අපි දෙවියන්වහන්සේට කතා කරන්නෙමු. ගීතිකා සහ කවිවලින් පමණක් නොව, සාමාන්‍ය කතාවලින් සහ සාමාන්‍ය වචනලින්ද අපි උන්වහන්සේට ප්‍රශංසා කරන්නෙමු. ශුද්ධ ලියවිල්ලේ ආදර්ශය වන්නේ අපි පෞද්ගලිකව සහ පොදුවේ යාච්ඤා කරන බවයි.

දෙවියන්වහන්සේ ප්‍රේමය පමණක් නොව, සත්‍යය ද වන සේක. මෙහි උද්වේගකර කොටසක් සහ කරුණු සම්බන්ධ වූ කොටසක් ඇත. එම නිසා අපගේ නමස්කාර මෙහෙයන්වලදී අපට සත්‍යය අවශ්‍ය වේ. එසේම අපගේ දෙවියන්වහන්සේගේ වචනයේ අපට සත්‍යය හමු වේ. බයිබලය අපගේ අවසාන අධිකාරය වේ. අපි කරන සියල්ලෙහි පදනම වේ. දේශනාවන් එම අධිකාරයෙන් පදනම් විය යුතු වේ. අපගේ ගීතිකා පවා සත්‍යවාදී විය යුතු වේ.

එහෙත් සත්‍යය යන්න උද්වේග යන්න නොමැතිව අපට සාකච්ඡා කළ හැකි නොපැහැදිලි අදහසක් නොවේ. දෙවියන්වහන්සේගේ සත්‍යය අපගේ ජීවිත සහ හදවත්වලට බලපායි. එය

අපගෙන් ප්‍රතිචාරයක් බලාපොරොත්තු වේ. එයට අපගේ හදවත, මනස, ආත්මය සහ ශක්තිය යන සියල්ල අවශ්‍ය වේ. දේශනාවන් ජීවිතවලට අදාළ විය යුත්තේ ඒ නිසාවෙනි. ඉරිදා, සඳුදා, අඟහරුවාදා ආදි සැම දිනකදීම නිවසේ දී සහ වැඩ කරන ස්ථානයේ දී අප ජීවත් වන විධිය සහ අප සිතන විධියට බලපෑම් කරන සංකල්ප දේශනාවලින් ඉදිරිපත් කළ යුතුය.

දේශනාවන් සත්‍යය විය යුතු අතර, ශුද්ධ ලියවිලි මත නිසියාකාරව පදනම් විය යුතුය. දේශනාවන් ප්‍රායෝගික සහ ජීවිතවලට යොමු වූ ඒවා විය යුතුය. දේශනාවන් චිත්තවේගී, හදවතට දැනෙන ප්‍රතිචාරයක් දක්වන පිණිස වූ නිසියාකාර හඬගැසීමක් විය යුතුය. අපගේ නමස්කාරයට දෙවියන්වහන්සේගේ වචනයට සවන් දීම ද, පාපය ගැන පසුතැවිලි වෙමින්, උන්වහන්සේ අපට දුන් ගැළවීම පිළිබඳ ප්‍රීතියෙන් යුතුව එයට ප්‍රතිචාර දැක්වීම ද අන්තර්ගත වේ.

අපට නිවසේ දී පටිගත කළ හෝ ගුවන් විදුලියේ විකාශය වන දේශනාවලට සවන් දිය හැකිය. ඉතා හොඳ දේශනා තිබේ. එහෙත් මෙය සම්පූර්ණ සභා අත්දැකීම නොවේ. නමස්කාරයේ ක්‍රමයක් ලෙස එය සහභාගි වීමේ කොටසක් පමණි. එය නමස්කාරයේ අංගයක් වන අපි එක්ව ගීතිකා කරමින් ප්‍රශංසා කරන, එක්ව දෙවියන්වහන්සේගේ වචනයට ප්‍රතිචාර දක්වන, සත්‍යය අපගේ ජීවිතවල ක්‍රියාත්මක කරන ලෙස එකිනෙකා ධෛර්යමත් කරන ප්‍රජාව මඟහරියි.

ඇත්තෙන්ම, සමහර මිනිසුන්ට රෝගී බව නිසා මෙහෙයන්වලට සහභාගි විය නොහැකිය.තමාට එය මඟ හැරෙන බව බොහෝ අය හොඳින් දනිති. අපි ඔවුන් උදෙසා යාච්ඤා කරමු. අන්‍යෝන්‍ය සේවය ඔවුන්ට කළ හැකි වීම පිණිස අපි ඔවුන් බැහැදැකීමට යමු (යාකොබ් 1:27).

විවෘත නැති කිතුනුවන්ට භෞතික වශයෙන් සේවය ලැබීමට අවශ්‍ය වුව ද, ඔවුහු බොහෝ විට අන් අයට චිත්තවේගී සහ ආත්මික ආකාරවලින් සේවය කරති. මේ ආකාරයෙන් නිවසේ සිටීමේ ක්‍රිස්තියානිකාරකම අවශ්‍යතාවය මත පදනම් වූ විකල්පයකි. එය යේසුන්වහන්සේ තම හැකියාවන් ඇති ගෝලයින්ගෙන් බලාපොරොත්තු වන දේ නොවේ.

**2) ආත්මික විනයන්**

නමස්කාර මෙහෙයන් අපගේ නමස්කාරයේ එක් කොටසක් පමණි. දෙවියන්වහන්සේගේ වචනය සතිය පුරා අපි කරන්නා වූ දේවල්වල දී අපගේ හදවත් සහ මනසේ බලපෑමක් ඇති වන පරිදි ඇතුළත් විය යුතුය. නමස්කාරයේ දී එහි ක්‍රමය වෙනස් කළ හැකිය. එහෙත් එය කිසි විටෙකත් නොනැවතිය යුතුය.

දෙවියන්වහන්සේට වූ අපගේ ප්‍රතිචාරයේ එක් කොටසකට පෞද්ගලික යාච්ඤාව සහම බයිබල් අධ්‍යයනය ඇතුළත් වේ. මේවා වර්ධනය සඳහා අවශ්‍ය වන බව අපගේ අත්දැකීම්වලින් අපට පෙන්නුම් කෙරේ. ආත්මික ලෙස පරිණත වන මනුෂ්‍යයින් හට දෙවියන්වහන්සේගේ වචනයෙන් ඉගෙන ගැනීමට පිපාසයක් ඇත. ඔවුහු උන්වහන්සේට ඔවුන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කිරීමට, ඔවුන්ගේ ජීවිත උන්වහන්සේ සමඟ බෙදා ගැනීමට, උන්වහන්සේ සමඟ ගමන් කිරීමට, ඔවුන්ගේ ජීවිතවල උන්වහන්සේගේ නිරන්තර අබිමුඛය පැවතීමට උනන්දු වෙති.

දෙවියන්වහන්සේට වූ අපගේ කැපවීමට අපගේ හදවත, මනස, ආත්මය සහ ශක්තිය අන්තර්ගත වේ. යාච්ඤාව සහ අධ්‍යයනය කිරීම අපගේ ආශාව විය යුතුය. එහෙත් ඒවා තවමත් අපගේ ආශාවන් නොවන්නේ නම්, කෙසේ හෝ වේවා අපි ඒවා කළ යුතු වෙමු.

ජෝන් වෙස්ලි මව්සින් දෙන ලද අවවාදයක් මට මතක් වෙයි. ඔහුගේ ජීවිත කාලයේ දී ඔහු වෙත කිතු දහම කෙරෙහි බුද්ධිමය වටහා ගැනීමක් විය. එහෙත් ඔහුගේ හදවතෙහි ඇදහිල්ලක් නොවීය. එම නිසා ඔහු මෙසේ අවවාද කළේය : ඔබට ඇදහිල්ල ඇති තෙක් ඇදහිල්ල දේශනා කරන්න. ඔබට ඇදහිල්ල ඇති වූ විට, ඔබ නියත වශයෙන්ම එය දේශනා කරනවා ඇත ! ඔහුට එය දේශනා කිරීමට වගකීමක් තිබූ බව ඔහු දැන සිටියේය. එම නිසා ඔහු එම කාර්යය කළ යුතුව තිබිණි. කාලයක් ගත වීමෙන් දෙවියන්වහන්සේ ඔහුට අඩුව තිබූ දේ දුන් සේක. උන්වහන්සේ ඔහුට හදවතට දැනෙන්නා වූ ඇදහිල්ලක් දුන් සේක. ඔහු මීට පෙර කළ දේ කාර්යක් ඉටු කිරීමක් විය. පසුව ඔහු එය කළේ ආශාවෙනි. ඔහුට අවශ්‍ය වී තිබූ ආශාව දෙවියන්වහන්සේ ඔහුට දුන් සේක. දෙවියන්වහන්සේ ඒ දෙයම අප උදෙසා ද ඉටු කරන සේක.

යාච්ඤාව සහ අධ්‍යයනය කිරීම ඇතැම් විට ආත්මික විනයන් ලෙස හැඳින්වේ. "විනයානුකූල කිරීම" යන්න දඬුවම් ලෙස හැඟේ. නැතිනම්, එය අපට බල කරමින් කළ යුතු අසතුටුදායක දෙයක් ලෙස දැනේ. එහෙත් *විනයානුකූල කිරීම* යන්නෙහි සැබෑ අර්ථය වන්නේ, අප "ගෝලත්වයට" පත් කරන යම් දෙයකි. එනම්, අපට ඉගැන්වීම හෝ ඉගෙන ගැනීමට අපට උපකාර කිරීම හෝ යන්න වේ. දෙවියන්වහන්සේ ගැන ඉගෙන ගැනීම උදෙසා මෙවන් ක්‍රියාකාරකම් උපකාර වන බව යුග ගණනාවක් පුරා ආත්මික නායකයින් සොයාගෙන ඇත.

දෙවියන්වහන්සේ සමඟ ගමන් කිරීමට අපට උපකාර වන විවිධ ක්‍රියාකාරකම් තිබේ. බොහෝ සභාවල සාමාජිකයෝ යාච්ඤාව, බයිබල් අධ්‍යයනය, මෙනෙහි කිරීම සහ නිරාහාරව සිටීම සිදු කරති. එසේම සරල බව, ත්‍යාගශීලි බව, සැමරීම හෝ වැන්දඹුවන් බලන්නට යාම වැනි තවත් විනයන්වලින් අපට ඉගෙනගත හැකිය. දේවස්ථානයට සහභාගි වීම ද දෙවියන්වහන්සේ සමඟ වන පෞද්ගලික සම්බන්ධතාවයට උපකාර වන ආත්මික විනයකි.

යාච්ඤාව, අධ්‍යයනය සහ අනෙක් ආත්මික හැසිරීම් පිළිබඳ බොහෝ දේ කුඩා කණ්ඩායම්වලට සහභාගි වීම මඟින් අන් කිතුනුවන් මෙම නමස්කාරයේ ක්‍රියාකාරකම් සිදු කරන්නේ කෙසේදැයි බලා අපට උගත හැකිය.

කීකරු වීම සුව පහසු නොවන විට දී පවා, එය කම්මැලි දෙයක් වන විට පවා, එය අපගේ හැසිරීම වෙනස් කිරීමට අවශ්‍ය වන විට පවා සැබෑ ඇදහිල්ල සැබෑ කීකරුකමට මඟපෙන්වන්නේ ය. අපි දේවස්ථානයේ දී, නිවසේ දී, වැඩ පොළේ දී සහ අපි යන සැම ස්ථානයක දී ආත්මයෙන් සහ සත්‍යයෙන් උන්වහන්සේට නමස්කාර කරන්නෙමු.

සභාව දෙවියන්වහන්සේගේ සෙනඟගෙන් සැදී ඇත. දෙවියන්වහන්සේගේ සෙනඟට පෞද්ගලික නමස්කාරයක් සහ පොදු නමස්කාරයක් ඇත්තේ ය. මේ දෙකම සභාවට අත්‍යවශ්‍ය ක්‍රියාකරකම් වේ.

### 3) ගෝලත්වය

නව ගිවිසුම පුරාම ආත්මික නායකයින් අනෙක් අයට ඉගැන්වීම අපට පෙනේ. මෙය කිතුනු ජීවන රටාවේ කොටසක් වේ. එය මහා නියෝගයේ කොටසක් වේ. "එබැවින් ඔබ ගොස් සියලු ජාතීන් ගෝලයන් කරන්න.... මා විසින් ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න" (මතෙව් 28:19-20).

සැම කෙනෙකුම ඉගෙනගන්නා කෙනෙක් නැතිනම් උගන්වන කෙනෙක් විය යුතුය. අපි ඇතැම් විට මේ දෙකම කරන්නෙමු. "එකිනෙකාට ඥානවන්ත ලෙස අවවාදානුශාසනා කරන්න (කොලොස්සි 3:16). අපි එකිනෙකාගෙන්, අනෙක් කිතුනුවන්ගෙන් ඉගෙනගත යුතු වේ. සභාව යනු අධ්‍යාපනික ආයතනයකි.

පාවුල්තුමා තිමෝති හට මෙසේ කීවේය. "බොහෝ සාක්ෂිකරුවන් ඉදිරියෙහි ඔබ මගෙන් අසා දැනගත් දේ අන්‍යයන්ට ඉගැන්වීමට හැකි විශ්වාසවන්ත පුද්ගලයන්ට පවරා දෙන්න" (2 තිමෝති 2:2). සැම කිතුනුවෙක්ම ඇදහිල්ලෙහි මූලික දේවල් ඉගැන්වීමට, යේසුන් ක්‍රිස්තුන්වහන්සේ වෙත අපගේ ඇති බලාපොරොත්තුව පිළිබඳ පිළිතුරු දීමට හැකි අය විය යුතුය.

මේ වන විටත් ඉගෙනගෙන ඇති අය සම්බන්ධව කුමක් කිව හැකි ද? ඔවුහු අලුත් පරම්පරාවට සත්‍යය පවරා දෙන ගුරුවරු විය යුතුය.

බොහෝ විට ඉගැන්වීම් සිදු කරන්නේ සභා පාලකවරුන් විසින් වේ. එහෙත් පාවුල්තුමා සැම කිතුනුවෙකුටම ඉගැන්වීමට අණ කරයි. මේ දේ ඉටු කිරීම සඳහා එක් ක්‍රමයක් කුඩා කණ්ඩායම්වලින් සපයයි. පරිණත කිතුනුවන්ට වචනයෙන් සහ ආදර්ශයෙන් ඉගැන්විය හැකිය. ඔවුන්ට ක්‍රිස්තුන්වහන්සේ උපකාර කළේ කෙසේද යන්න අන් අයට කීමට ඔවුන්ට පුළුවන. ඔවුන්ගේ ඇදහිල්ල දුර්වල වූ විට, ඔවුන්ට අන් අයගේ ධෛර්ය දීම් සෙවිය හැකිය. ඔවුන්ගේ ඇදහිල්ල ශක්තිමත් වූ විට දුර්වල අයට උපකාර කිරීමට ඔවුන්ට පුළුවන.

මනුෂ්‍යයෙක් තනිව සිටීම හොඳ නැත. එසේම කිතුනුවෙක් තනිව සිටීම ද හොඳ නැත. "එක් කෙනෙකුට වඩා දෙදෙනෙක් හොඳය. දෙදෙනෙක් එක්ව වැඩ කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගනු ඇත. ඔවුන්ගෙන් කෙනෙකු වැටුණොත් අනෙක් තැනැත්තා සිය යහළුවා නැගිටුවනු ඇත. එහෙත් තමා නැඟිටුවන්නට එවැනි කෙනෙකු නැතිව තනිව සිට වැටෙන්නාට වන විපතක මහත... තනිව සිටින කෙනෙකු පරාජය විය හැකිය. එහෙත් සතුරාට විරුද්ධව සිටින්නට දෙදෙනෙකුට හැකි වෙයි. තුන් පොටේ ලණුවක් පහසුවෙන් නොකැඩෙන්නේය" (ධර්මදේශකයා 4 : 9-12).

එක්ව වැඩ කිරීමෙන් අපි එකිනෙකාගේ වර්ධනයට උපකාර කරන්නෙමු.

ගෝලත්වය බොහෝ විට අන්‍යෝන්‍ය ක්‍රියාවලියකි. එක් සාමාජිකයෙක් තවත් සාමාජිකයෙකුට උපකාර කරන්නේය. එහෙත් ඇතැම් ගෝලත්ව වඩා අරමුණු සහිතව, වඩා හොඳ ඉලක්කයක් ගලා දෙමින් ගලා යයි. මේ කාරණය උදෙසා දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සභාවෙහි ඇතැම් අය පත් කළ සේක :

"මේ ක්‍රිස්තුන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන් ද, සමහරුන් දිවැසිවරුන් ද, සමහරුන් ධර්ම දේශකයන් ද, සමහරුන් සභා පාලකයන් ද, සමහරුන් ගුරුවරුන් ද වශයෙන් පත් කළ සේක. එසේ කළේ දෙවියන්වහන්සේගේ සෙනඟ දේව සේවය සඳහා සම්පූර්ණයෙන් පුහුණු කිරීමටත්, ක්‍රිස්තු ශරීරය වර්ධනය කිරීමටත්ය. මේ ආකාරයෙන් ඇදහිල්ලේ ද දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් දැනගැන්මේ ද එකමුතුකමටත්, ක්‍රිස්තුන්වහන්සේගේ පරිණතභාවයෙන් වන පරිපූර්ණ පෞරුෂත්වයටත් අපි පත් වන්නෙමු" (එපීස 4 : 11 -13).

දෙවියන්වහන්සේ සපයන නායකයින්ගේ භූමිකාව වන්නේ අනෙක් අය ඔවුන්ගේ භූමිකා සඳහා සූදානම් කිරීම වේ. දෙවියන්වහන්සේගේ අභිප්‍රාය පරිදි වැඩ සිදු වීමට ඉඩ හැරියහොත්, ප්‍රතිඵලය වන්නේ වර්ධනය වීම, පරිණත වීම සහ එක්සත් බවයි.

සමහර කිතුනුවන්ගේ වර්ධනය සහ ඉගෙන ගැනීම සමවයස් කාණ්ඩවලින් ඇති වේ. සමහර කිතුනුවන්ගේ ඉගෙන ගැනීම පැමිණෙන්නේ විශේෂිත ඉගැන්වීමේ සහ කිතුනු ජීවිත ආදර්ශය සහිත සභාවේ පුද්ගලයන් වෙතිනි. තනිව සිටින මිනිස්සුන්ට ඇදහිල්ලේ මෙම කොටස මඟහැරේ.

සභාවක් ලෙස අපි නිතරම ඉගෙන ගැනීමට කැමති වෙමු. අපි අපට හැකි පමණ විෂයන්වල සත්‍යතාවය දැනගැනීමට උනන්දු වීමු. අපි බයිබලය අධ්‍යයනය කිරීමට උනන්දු වීමු. දැන් ජ්වලිතය නැති වී තිබෙන බව පෙනේ. සමහර විට මෙය ධර්ම නියාමක වෙනස්වීම්වල දී අනිවාර්යයෙන් විය යුතු දෙයක් නිසාය. එහෙත් ඉගෙන ගැනීමට අප තුළ වරක් තිබූ ප්‍රේමය නැවත ඇති කරගත යුතු වෙමු.

අපට ඉගෙන ගැනීමට බොහෝ දේ ඇත. එසේම අදාළ කරගැනීමට බොහෝ දේ ඇත. ප්‍රාදේශීය සභාවන් විසින් බයිබල් අධ්‍යයනයන්, අලුත් ඇදහිලිවතුන්ට පන්ති, ශුභාරංචිකරණයට පුහුණුවීම් ආදිය පැවැත්විය යුතු වේ. අපි අවසරය දීම, පුහුණුව දීම, ආම්පන්න දීම, පාලනය දීම සහ පිටතට යාම උදෙසා ගිහි සේවයට දිරි දිය යුතු වෙමු.

**4) සහභාගීත්වය**

සහභාගීත්වය පැහැදිලිවම කිතුනුවන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයකි. අපි සියලු දෙනාම සහභාගීත්වය දීම සහ ලැබීම අවශ්‍ය වේ. අපි සියලු දෙනා ප්‍රේමය දීම සහ ලැබීම අවශ්‍ය වේ. ඓතිහාසිකව මෙන්ම වර්තමානයේ දී ද අපගේ සතිපතා රැස්වීම් සහභාගීත්වය අපට වැදගත් වන බව පෙන්වයි.

සහභාගීත්වය යනු එකිනෙකා සමඟ ක්‍රීඩා, ඕපාදූප සහ ක්‍රීඩා පිළිබඳ කතා කිරීමට වඩා වැඩි දෙයකි. එයින් අර්ථවත් වන්නේ ජීවිත, උද්වේග බෙදා ගැනීම, එකිනෙකාගේ බර ඉසිලීම, එකිනෙකාට ධෛර්ය දීම සහ අවශ්‍යතා ඇති අයට උපකාර කිරීමයි.

බොහෝ මිනිස්සු තමාගේ අවශ්‍යතා අන් අයගෙන් සැඟවීමට වෙස් මුහුණක් දමා ගනිති. අපි සැබවින්ම එකිනෙකාට උපකාර කරන්නෙමු නම්, වෙස් මුහුණට එපිටින් අපි එකිනෙකාගේ අවශ්‍යතා සමීපව බැලිය යුතු වෙමු. එහි අර්ථය නම් අනෙක් අය අපගේ අවශ්‍යතාවන් දකින පිණිස අපගේ වෙස් මුහුණ මඳකට ඉවත් කිරීමයි.

මෙය කිරීමට කුඩා කණ්ඩායම් හොඳ ස්ථානයකි. අපි ඉතා හොඳින් මිනිසුන් දැන හඳුනාගන්නා අතර, ඔවුන් සමඟ සුරක්ෂිත බවක් දැනේ. බොහෝ විට අප දුර්වල වන අංශවල දී ඔවුහු ශක්තිමත්ය. ඔවුහු දුර්වල වන විට අප ශක්තිමත්ය. එම නිසා එකිනෙකාට උපකාර කිරීමෙන්, දෙපිරිසම ශක්තිමත් වන්නේය. අපෝස්තුළු පාවුල්තුමාට පවා, ඔහු ඇදහිල්ලෙහි යෝධයෙක් වුව ද, අනෙක් කිතුනුවන්ගෙන් ඔහුගේ ඇදහිල්ල ශකිත්මත් වූ බව දැනුණේය (රෝම 1 : 12).

පුරාණ කාලයේ දී මිනිස්සු නිතරම ගමන් ගියේ නැත. මිනිස්සු එකිනෙකා හොඳින් දැනගන්නා තරමට ප්‍රජාවන් දියුණු වේ. එහෙත් වර්තමාන කාර්මික සමාජවල මිනිස්සු බොහෝ විට තමාගේ අසල්වැසියන් නොදනිති. මිනිස්සු පවුලෙන් සහ මිතුරන්ගෙන් වෙන් වී සිටිති. තමා ඇතුළාන්තයෙන් කවුරුන්දැයි දැනගැනීම ආරක්ෂිත බව කිසි විට නොසිතන බැවින්, මිනිස්සු නිතරම වෙස් මුහුණු පළඳිති.

පුරාණ සභාවලට කුඩා කණ්ඩායම් අවශ්‍ය නොවීය. ඔවුහු ස්වාභාවික ලෙස පෙනී සිටියහ. වර්තමානයේ කුඩා කන්ඩායම් අනිවාර්යෙන් පැවතිම අවශ්‍ය වන්නේ සමාජය වෙනස් වී තිබෙන නිසාවෙනි. කිතුනු සභාවල තිබිය යුතු අන්තර් පුද්ගල සම්බන්ධතාවය ඇති කිරීම සඳහා අපි කිතුනු මිත්‍රත්වය / අධ්‍යයනය / යාච්ඤා දම්වැල් ආදිය ඇති කළ යුතුය.

මෙය කිරීමට කාලයක් ගත වේ. අපගේ කිතුනු වගකීම් සම්පූර්ණ කිරීමට ඇත්තෙන්ම කාලයක් ගත වේ. අන්‍යයන්ට සේවය කිරීමට කාලයක් ගත වේ. ඔවුන්ට අවශ්‍ය කුමන අන්දමේ සේවයක්දැයි දැනගැනීමට පවා කාලයක් ගත වේ. එහෙත් අපි යේසුන්වහන්සේ අපගේ ස්වාමින්වහන්සේ ලෙස පිළිගත් විට අපගේ කාලය අපට අයිති නැත. යේසුන් ක්‍රිස්තුන්වහන්සේ අපගේ ජීවිත ඉල්ලන සේක. කිතුනුවන් ලෙස පෙනී සිටීම නොව, උන්වහන්සේ අපගේ කැපවීම ඉල්ලන සේක.

**5) සේවය**

මම මෙහි "සේවය" යන්න තවත් කොටසක් ලෙස දැක්වීමේ දී, ඉගැන්වීමේ සේවය නොව, භෞතික සේවය අදහස් කරමි. ගුරුවරයා යේසුන්වහන්සේ සිටි නම් කුමක් කරනු ඇත්දැයි ක්‍රිස්තියානිකමේ ආදර්ශයෙන් පෙන්වමින් පාද සෝදන්නෙක් ද විය යුතුය. ආහාර සහ සෞඛ්‍ය සම්පන්න බව වැනි භෞතික අවශ්‍යතාවයන් පිළිබඳ යේසුන්වහන්සේ සැලකිලිමත් වූ සේක. භෞතික වශයෙන් උන්වහන්සේ අප උදෙසා තමන්වහන්සේගේ ජීවිතය දුන් සේක. තමාගේ දේපොළ අවශ්‍යතා ඇති අය සමඟ බෙදා ගනිමින්, කුසගිනි අය වෙනුවෙන් පූජා එකතු කරමින් මුල් සභාවේ අය භෞතික වශයෙන් උපකාර කළහ.

සේවය සභාව තුළ සිදු කළ යුතු බව පාවුල්තුමා පවසයි. "එබැවින් අපට ඉඩ ප්‍රස්ථා ඇති හැටියට සියල්ලන්ටම, ප්‍රධාන කොට ඇදහිල්ලේ පවුලට අයිති වූ අයට යහපත්කම් කරමු" (ගලාති 6 : 10). අනෙක් ඇදහිලිවතුන්ගෙන් වෙන්ව වසන ජනතාවට ක්‍රිස්තියානි බවේ මෙම කොටස අහිමි වේ. ආත්මික දීමනා සංකල්පය මෙහිදී වැදගත් වේ. දෙවියන්වහන්සේ අප එකිනෙකා ශරීරයෙහි තබා ඇත්තේ "පොදු යහපත උදෙසාය" (1 කොරින්ති 12 : 7). අනෙක් අයට උපකාර කරන පිණිස අප සැම දෙනාටම හැකියාවන් තිබේ.

ඔබට තිබෙන ආත්මික දීමනා මොනවා ද? මෙය සොයාගැනීම සඳහා ඔබට පරීක්ෂණයක් කළ හැකිය. එහෙත් බොහෝ පරීක්ෂණ ඔබගේ අත්දැකීම් මත පදනම් වී ඇත්තේය. අතීතයේ යහපතට හැරුණු ඔබ කළ දේවල් මොනවා ද? ඔබ කුමක් සඳහා දක්ෂ බව අන් අය පවසා

තිබේ ද? අතීතයේ දී ඔබ අන් අයට උපකාර කළේ කෙසේ ද? ආත්මික දීමනා සම්බන්ධ හොඳම පරීක්ෂණය වන්නේ කිතුනු ප්‍රජාව තුළ සේවය කිරීම වේ. සභාව තුළ විවිධ භූමිකා කරන්න. ඔබ වඩා දක්ෂ කුමටදැයි අන් අයගෙන් අසන්න. සැම සාමාජිකයෙක හටම සභාව තුළ අවම වශයෙන් එක් භූමිකාවක් තිබේ.

අන්‍යෝන්‍ය සේවය සඳහා කුඩා කණ්ඩායම් ඉතා හොඳ අවස්ථාවක් බව මම නැවතත් කියමි. ඒවා වැඩ කිරීමට බොහෝ අවස්ථා සපයයි. එසේම ඔබ ඉතා හොඳින් කරන්නේ කුමක්ද යන්න සහ ඔබ ප්‍රීති වන්නේ කුමක් කිරීමෙන් ද යන්න නැවත සිතා බැලීමට අවස්ථා ලබා දෙයි.

කිතුනු ප්‍රජාව අප අවට ඇති ලෝකයට ද සේවය කරන්නේය. එය වචනයෙන් පමණක් නොව, එම වචනවලට අදාළ ලෙස ක්‍රියා කිරීමෙන් ද වේ. දෙවියන්වහන්සේ හුදෙක් කතා නොකර ක්‍රියා කළ සේක. අපි දුප්පතුන්ට උපකාර කරන විට, අධෛර්ය වූවන් සනසන විට, අපරාධකරුවන්ට ඔවුන්ගේ ජීවිතවල අර්ථය දැනගැනීමට උපකාර කරන විට අපි අපගේ හදවත් තුළ ක්‍රියා කරන දෙවියන්වහන්සේගේ ප්‍රේමය පෙන්නුම් කරන්නෙමු. ප්‍රායෝගික අවශ්‍යතා ඇති අය බොහෝ විට ශුභාරංචි පණිවුඩයට ප්‍රතිචාර දක්වති.

සමහර විට භෞතික උපකාර ශුභාරංචියට උදව්වක් වන බව පෙනේ. එය ශුභාරංචිකරණයට උපකාර වන ක්‍රමයක් සේ පෙනෙන්නට පුළුවන. එහෙත් සමහර සේවාවන් කළ යුත්තේ වෙනත් දේවල් එකතු නොකරය. යමක් ලැබීමේ පරමාර්ථයෙන් නොවේ. දෙවියන්වහන්සේ අපට සම්පත් දී තිබෙන නිසාත්, අවශ්‍යතා දකින පිණිස අපගේ ඇස් විවෘත කර තිබෙන නිසාත් අපි සේවය කරන්නෙමු.

යේසුන්වහන්සේ තමාගේ ගෝලයින් වීමට ක්ෂණිකව ආයාචනා නොකර බොහෝ අයට කෑම දුන් සේක, බොහෝ අය සුව කළ සේක. උන්වහන්සේ එය කළේ එම දේ සිදු කළ යුතු නිසාවෙනි. එසේම උන්වහන්සේට සපුරාලිය හැකි අවශ්‍යතාවයක් උන්වහන්සේ දුටු සේක.

**6) ශුභාරංචිකරණය**

"ලෝකයට ගොස් ශුභාරංචිය දේශනා කරන්න" යයි යේසුන්වහන්සේ අපට අණ කළ සේක. අපට මෙම අංශයේ දියුණු වීම අවශ්‍ය වේ. අපි ඇදහිල්ල අප වෙතම තබා ගැනීමට බොහෝ කොන්දේසි දමන්නෙමු. ඇත්තෙන්ම පියාණන්වහන්සේ මනුෂ්‍යයින් කැඳවන්නේ නැතිව ඔවුහු හැරීම නොලබති. එහෙත් අප ශුභාරංචිය දේශනා නොකළ යුතු බව ඉන් අදහස් කරන්නේ නැත.

ශුභාරංචි පණිවුඩයේ සඵලවත් ගබඩාකරුවන් වීම සඳහා සභාව තුළ අපට සංස්කෘතිකමය වෙනස් වීමක් අවශ්‍ය වේ. අනෙක් මනුෂ්‍යයින්ට එය කිරීමට ඉඩ හැර අපට සැහීමට පත් විය නොහැකිය. ගුවන් විදුලියෙන් හෝ සඟරාවකින් හෝ මනුෂ්‍යයින්ට එය දැනගැනීමට ඉඩ හැර අපට සැහීමට පත් විය නොහැකි වේ. එවැනි ආකාර වූ ශුභාරංචිකරණය වැරදි නැත. එහෙත් ඒවා ප්‍රමාණවත් නැත.

ශුභාරංචිකරණයට පෞද්ගලික මුහුණක් අවශ්‍ය වේ. මනුෂ්‍යයින්ට පණිවුඩයක් එවීමට දෙවියන්වහන්සේට අවශ්‍ය වූ කල, උන්වහන්සේ එය කිරීම සඳහා මනුෂ්‍යයින් භාවිත කළ සේක. උන්වහන්සේ තමන්වහන්සේගේම පුත්‍රයාණන්, මාංශවත් වූ දෙවියන්වහන්සේ දේශනා කිරීම පිණිස එවූ සේක. වර්තමානයේ දී උන්වහන්සේ තම දරුවන්, ආත්මයාණන්වහන්සේ

ඔවුන් තුළ වැඩ වසන මනුෂ්‍යයින් පණිවුඩය දේශනා කිරීම පිණිසත්, සැම සංස්කෘතියකදීම එයට ගැළපෙන හැඩයක් දීම පිණිසත් යවන සේක.

අපගේ පැරණි සංස්කෘතිය අක්‍රිය වූවකි. එය අපි විය යුතු සහ එසේ වීම සඳහා පුහුණු වූයේ ඒ නිසාවෙනි. අපගේ නව සංස්කෘතිය ක්‍රියාකාරී විය යුතුය. ඇදහිල්ල බෙදා ගැනීම සඳහා කැමැත්තක් සහ උනන්දුවක් තිබිය යුතු වේ. අපට ශුභාරංචිය සම්බන්ධ උනන්දුවක් තිබිය යුතු වේ. අපගේ අසල්වාසීන් සමඟ ක්‍රිස්තියානියේ සුළු දෙයක් හෝ බෙදා ගැනීමට උනන්දුවක් තිබිය යුතුය. (ඔවුන් අපි කිතුනුවන් බව දන්නවා ද? අපි කිතුනුවන් වීම ගැන සතුටු බව පෙනෙන්නෙ ද?) අපි මෙහි වර්ධනය වෙමින්, දියුණු වන්නෙමු. එහෙත් අපට වඩා වැඩි වර්ධනයක් අවශ්‍ය වේ.

අපි අප අවට සිටින අයට කිතුනු සාක්ෂිකරුවන් වන්නේ කෙසේද යන්න පිළිබඳ සිතිවිල්ලක් ලබා දීමට ඔබ ධෛර්ය කරමි. පිළිතුරක් දීම උදෙසා සූදානම්ව සිටීම සම්බන්ධ අණට කීකරු වීමට සැම සාමාජිකයෙක්ම ධෛර්යමත් කරන්නෙමි. ශුභාරංචිකරණය පිළිබඳ කියවීමට සහ කියවන දේ අදාළ කරගැනීමට මම සැම සාමාජිකයෙක්ම ධෛර්යමත් කරන්නෙමි. අපිට එක්ව ඉගෙන ගනිමින් යහපත් ක්‍රියා කිරීම සඳහා එකිනෙකා ධෛර්ය කළ හැකිය. කුඩා කණ්ඩායම්වලට ශුභාරංචිකරණය සඳහා පුහුණුවක් දිය හැකිය. එසේම කුඩා කණ්ඩායම්වලට ඔවුන් අතරම ශුභාරංචිකරණයේ නායකත්වයන් විය හැකිය.

සාමාජිකයෝ ඇතැම් විට ඔවුන්ගේ සභා පාලකයින්ට වඩා ඉක්මනින් ඉගෙන ගනිති. එයට කමක් නැත. ඉන්පසුව සභා පාලකයාට සාමාජිකයාගෙන් උගත හැකිය. දෙවියන්වහන්සේ ඔවුන්ට විවිධ ආත්මික දීමනා දී තිබේ. ඇතැම් අයට දෙවියන්වහන්සේ ශුභාරංචිකරණයේ දීමනාව දී ඇති අතර, ඔවුන් ඒ සඳහා උනන්දු කර මඟපෙන්වීම අවශ්‍ය වේ. සභා පාලකවරයාට මෙවැනි සේවයක් කිරීම සඳහා සාමාජිකයා සන්නද්ධ කළ නොහැකි නම්, අවම වශයෙන් එම පුද්ගලයා ඉගෙන ගැනීමට, එය ක්‍රියාත්මක කිරීමට සහ අන් අයට ආදර්ශයක් සැපයීමට උනන්දු කිරීම කළ යුතු වේ. එවිට සමස්ත සභාව වර්ධනය වන්නේය.

සභාවේ වැඩ සම්බන්ධ මෙම ක්‍රියාවන් හය, මෙහිදී ශුභාරංචිකරණය විශේෂයෙන් දැක්වීම අවශ්‍ය යයි මම සිතමි. අපට වැඩියෙන්ම වර්ධනයක් අවශ්‍ය මෙම අංශයෙනි.

**අවසානය**

මම සභාවෙහි අරමුණුවල ප්‍රමාණය සම්බන්ධ යෝජනාවක් කළෙමි. එසේම අපිට වර්ධනයක් අවශ්‍ය අංශ සම්බන්ධව විශේෂයෙන් දැක්වීමි. අපි කරන දේවල පුළුල් චිත්‍රයක් දැකීමට එය සාමාජිකයින්ට උපකාර වනු ඇතැයි මම සිතමි.

මෙම ලිපිය කියවන බොහෝ සාමාජිකයෝ විශ්වාසවන්ත සහ උපකාරවන්ත අය වෙති. කෙසේ වෙතත්, කිසි විටක දේවස්ථානයට සහභාගි නොවන අය උදෙසා වචන කිහිපයක් එකතු කිරීමට කැමැත්තෙමි. මට ඔබගේ හදවත දැනගත නොහැකිය. මම ඔබගේ වේදනාවන් සහ ප්‍රශ්න සියල්ල නොදන්නෙමි. එහෙත් ඔබ කිතුනු ජීවිතයේ විශාල ප්‍රතිශතයක් මඟහැර ඇති බව මම දනිමි. බයිබලය පුරා පෙනෙන දෙය නම් කිතුනුවන් නිතරම රැස් විය යුතු බවයි. ඔබ එසේ සහභාගි නොවන්නෙහි නම්, සහභාගි වීම පිළිබඳ කරුණාකර නැවත සිතන්න. ඔබගේ ජීවිතයේ බොහෝ දේවල් සිදු කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍ය ය.

ඔබට රිදවන යමක් අපි කළෙමු නම්, මම ඔබෙන් සමාව ඉල්ලමි. කුමන හෝ හේතුවක් නිසා ඔබට අප සමඟ සහභාගි වීමට නොහැකි නම්, යේසුන්වහන්සේ ස්වාමින් සහ ගැළවුම්කරු ලෙස දේශනා කරන වෙනත් සභාවකට කරුණාකර සහභාගි වන්න. කරුණාකර තේරුම්ගන්න: ඔබගේම ප්‍රයෝජනය සහ වර්ධනය උදෙසා ඇතුළාන්තයට යොමු වී, නිවසේ සිටීමට වඩා ඔබ වෙනත් සභාවකට හෝ සහභාගි වීම දැකීමට කැමැත්තෙමි. අපි එක පවුලක් වන්නෙමු. සහභාගි නොවන සහ නමස්කාර නොකරන සියලුම පවුලේ සාමාජිකයින් නැවත නිවසට පැමිණීම අපගේ කැමැත්ත වේ.

# ගෝලත්වය 101



# ඒකකය 8ඇ

## *සභාව තුළ කණ්ඩායම් සේවය*

සම්පූර්ණ කාලීන සභා පාලකවරුන් අනෙක් සාමාජිකයින්ට වඩා වැඩියෙන් ස්වාමින්වහන්සේට සේවය කරන බව ඇතැම් කිතුනුවෝ සිතති. එය ඇතැම් අවස්ථාවල දී සත්‍ය වුව ද, සැම විටම එය සත්‍ය නොවේ. පාවුල්තුමා අපට මෙසේ පවසයි. "එහෙයින් ඔබ කෑවත්, බීවත්, වෙන දෙයක් කළත් සියල්ල දේව ගෞරවය පිණිස කරන්න" (1 කොරින්ති 10 : 31). කිතුනුවා බැංකුවක වැඩ කරන කොයි මොහොතක වුවත් ඔහු හෝ ඇය එය කරන්නේ දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිසය. පාසලක උගන්වන ගුරුවරයෙක් එය කරන්නේ දෙවියන්වහන්සේ ගෞරවයට පත් කරන පිණිසය. නිවසේ දී දරුවන් රැක බලා ගන්නා කිතුනුවෙක් එය කරන්නේ දේව ගෞරවය උදෙසා ය. ඔවුහු සියලු දෙනාම දෙවියන්වහන්සේට සම්පූර්ණකාලීනව සේවය කරති. ඇතැම් විට සතියකට පැය 100ක් වැඩ කරති.

සියලුම සාමාජිකයින් ජීවත් වන්නේ යේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ ගෞරවය සහ මහිමය පිණිසය (2 කොරින්ති 5 : 15). සැම සාමාජිකයෙක්ම අවස්ථාවන් සහ හැකියාවන් ඇති විට උන්වහන්සේට සේවය කරන්නෝය. සැම සාමාජිකයෙක්ම යේසුස් ක්‍රිස්තුන්වහන්සේ උදෙසා ලෝකයේ වැඩ කරන සාක්ෂිකරුවෙකි. එයට ලෞකික රැකියාවන් මෙන්ම ආගමික වැඩ ද අයත් වේ. වසර ගණනාවක් වඩුවෙක් ලෙස වැඩ කරමින් යේසුන්වහන්සේ දෙවියන්වහන්සේට සේවය කළ සේක. වර්තමානයේ පවා කිතුනු වඩුවෝ ඔවුන් කරන වැඩවලින් දෙවියන්වහන්සේට සේවය කරති.

### සාමාජිකයින්ට මෙහෙයක් ඇත

අපි දන්නා ආකාරයට, සභාව යනු ගොඩනැගිල්ලක් නොවේ. එය සමාජ ශාලාවක් හෝ පෞද්ගලික ප්‍රයෝජනය උදෙසා වූ සමාජයක් ද නොවේ. සභාව යනු දෙවියන්වහන්සේගේ සෙනඟ වෙති. එයින් දේව සේවකයින් සහ ගිහි සේවකයින් අර්ථවත් වේ. සභාවට ලෝකය වෙත වූ මෙහෙයක් තිබෙන බව අපි දැන් බලමු. දෙවියන්වහන්සේගේ සෙනඟට ලෝකය වෙත මෙහෙයක් ඇත. දේව සේවකයින් සහ සාමාජිකයින්ට ලෝකය වෙත මෙහෙයක් ඇත.

ගිහි සාමාජිකයින්ට සභා මෙහෙයේ විශේෂ භූමිකාවක් තිබේ. එයට හේතුව වන්නේ පැවිදි (ආලේප ලත්) දේව සේවකයින්ට වඩා සාමාජිකයින් වැඩි පිරිසක් සිටින බැවිනි. ගිහි සාමාජිකයින් සම්බන්ධ වූ තවත් වැදගත් කාරණාවක් වන්නේ ඔවුන් බොහෝ විට "ලෝකයේ" සිටීමයි. ඔවුන්ගේ රැකියාවේ ස්වභාවය අනුව, දේව සේවකයින් වැඩිපුර අන්තර් සම්බන්ධතා පවත්වන්නේ දැනටමත් කිතුනුවන් වී සිටින අය සමඟය. දිනපතා රැකියාවේ දී, අසල්වාසීන්, විනෝදාංශ සහ ක්‍රීඩාවේ දී කිතුනු නොවන අය සමඟ මිශ්‍ර වන්නේ ගිහි සාමාජිකයන්ය. ඔවුහු ක්‍රිස්තුන්වහන්සේ මෙන් වූ ජීවිතයෙන් ආදර්ශයක් සපයති. බලාපොරොත්තුවේ ජීවිතයක් ගත

කරමින් මෙම ලෝකයේ කරදර තිබියදීත් ඔවුහු බලාපරොත්තුවෙන් සහ ප්‍රීතියෙන් ජීවත් වෙති. කිතුනු නොවන අයට එවැනි වූ ආදර්ශයක් අවශ්‍ය වේ.

සෑම සතියකදීම පැය කිහිපයකට නමස්කාරය සහ සහභාගිත්වය සඳහා සභාව රැස් වේ. සතියේ අනෙක් දිනවල දී වැඩිපුර වේලාවක් සභාව කුමක් කරන්නේ ද? අපගේ රැකියාවල, අපගේ අසල්වාසීන් සමඟ, අපගේ පවුල තුළ පවා අපගේ කාලයෙන් වැඩි කොටසක් ලෝකය සමඟ මිශ්‍ර වී ගත කරන්නෙමු. වැඩි කාලයක් ලෝකය තුළ ආදර්ශයක් තබමින් සභාව සෑම තැනම විසිරී ඇත. මෙය අපගේ කිතුනු කැඳවීමේ කොටසකි. අපගේ මෙහෙයේ කොටසකි. එසේම මෙය අප කරන සියල්ලෙහි දී දෙවියන්වහන්සේ මහිමයට පත් කිරීමට සොයමින් කරන නමස්කාරයේ කොටසක් ද වන්නේය.

අපගේ සතිපතා නමස්කාරය අප ගැළවීමේ ප්‍රීතියෙන් පූර්ණ කළ යුතුය. ක්‍රිස්තුන්වහන්සේ තුළ සතිය පුරා ජීවත් වීම පිණිස ශක්තිමත් කරමින් අනුශාසනා කළ යුතුය. ඒවා අපගේ ජීවිතය කුමක් උදෙසා ද යන්න මතක් කරන්නේය. දෙවියන්වහන්සේගේ අබිමුඛයට එක්සත්ව පැමිණීමටත්, පසුගිය සතිය තුළ උන්වහන්සේ අපගේ ජීවිත තුළ කළ දේවල් සම්බන්ධ ස්තුති ප්‍රකාශ කිරීමට එය අපට අවස්ථාවක් දෙන්නේය. සාමුහික යාච්ඤාවෙන් සහ ගීතිකාවලින් දෙවියන්වහන්සේට නමස්කාර කරමින් දේව දූතයින්ගේ ගායන කණ්ඩායමට එක් වීමට ඒවා අපට අවස්ථාවක් දෙන්නේය. එය පැමිණෙන්නා වූ සතිය පුරා අපි උන්වහන්සේට සේවය කරන්නේ කෙසේද යන්න පිළිබඳ උන්වහන්සේගේ වචනයෙන් මාර්ගෝපදේශ සෙවීමට අපට උපකාර වේ.

ඒ ආකාරයෙන් අපගේ කුඩා කණ්ඩායම් රැස්වීම් ද දෙවියන්වහන්සේගේ වචනය ප්‍රතිරූපණය කිරීමට අවස්ථාවක් දෙන අතර, අපගේ ජීවිතවල දෙවියන්වහන්සේ කරමින් පවතින දේවල් බෙදාගැනීමට අවස්ථාවක් දෙන්නේය. ඒ හේතුවෙන් අපට එකිනෙකා ධෛර්යමත් කිරීමට හැකි වේ. අපගේ සේවයන් වඩා ඵලදායි වන පිණිස එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කිරීමට හැකි වේ.

සෑම සාමාජිකයෙක්ම යේසුන් ක්‍රිස්තුන්වහන්සේගේ සේවකයෝ වෙති. අපි සියල්ලෝ උන්වහන්සේට සේවය කරන්නෙමු. ඇතැම් අය යාච්ඤාවෙන් ද, තවත් අය දුප්පතුන් හට උපකාර කිරීමෙන් ද, තවත් අය ඔවුන්ගේ පවුල් සහ අසල්වාසීන් උදෙසා වූ වගකීම් ඉටු කිරීමෙන් ද සේවය කරති. සෑම කෙනෙක්ම තමාට ඇති අවස්ථාවන්වලට අනුව, තමාට ඇති හැකියාවන්ට අනුව සේවය කරති. සභා පාලකයෝ තමාගේ රැළ රැකබලා ගනිමින් ද , සාමාජිකයෝ ආත්මික නිරෝගී බව සහ රැළෙහි එක්සත්කම පැවතීමට උපකාර කරමින් ද උන්වහන්සේට සේවය කරති. එසේම සතිය පුරාම අපගේ සාමාන්‍ය ක්‍රියාවලින් ද අපි උන්වහන්සේට සේවය කරන්නෙමු.

ඔබගේ කුරුසිය රැගෙන මා අනුව එන්න යයි ක්‍රිස්තුන්වහන්සේ කී විට, උන්වහන්සේ එය කීවේ සභා පාලකවරුන්ට පමණක් නොවේ. අප වෙනුවෙන් අපගේ කිතුනු සේවය කිරීම උදෙසා තව කෙනෙකුට ගෙවීමක් කිරීමට අපට නුපුළුවන. සභා පාලකයින් සිටින්නේ මඟ පෙන්වීම, ඉගැන්වීම සහ සාමාජිකයින් සේවය සඳහා සන්නද්ධ කිරීම උදෙසාය. එහෙත් අපි එකිනෙකා කැඳවීම ලබා තිබෙන නිසාත්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ලබා ඇති නිසාත් අපගේ කාර්ය ඉටු කළ යුතුය. අන් අයට සේවය කිරීම තුළ තමාව අමතක කරමින් සෑම කිතුනුවාම ක්‍රිස්තුන්වහන්සේ අනුගමනය කරන්නේය. ස්වාමින්වහන්සේ අන් අයට සේවය කළ සේක. යේසුන්වහන්සේගේ මරණය ඔහුගේ හෝ ඇයගේ පාප වෙනුවෙන් වූ ගෙවීමක් බව පිළිගැනීම

නිසා එයට ගෞරවයක් ලෙස සේවය කළේ නැත. උන්වහන්සේ අපට සේවය කළ සේක. එසේම අන් අයට සේවය කරන පිණිස, සියල්ලන්ට යහපත කරන පිණිස අප කැඳවා ඇත.

ප්‍රශ්නය වන්නේ අපි ක්‍රිස්තුන්වහන්සේට සතිය පුරා සේවය කරනවාද යන්න නොවේ. ප්‍රශ්නය වන්නේ අපි උන්වහන්සේට සේවය කරන්නේ කෙසේද යන්නයි. අපට එය කිරීමට අවශ්‍ය ද, නැද්ද යන්නයි. අපි කාර්යාලයේ දී, මහා මාර්ගයේ දී, අපගේ නිවසේ දී යේසුන් ක්‍රිස්තුන්වහන්සේ නියෝජනය කරන්නෙමු. මාගේ අසල්වාසියාට උපකාර කිරීමට වෙනත් ක්‍රම මට තිබේ ද? නව ගිවිසුම අපගේ සතිය පුරා අපි කරන දේ අවධාරණය කරයි. අපි යේසුන් ක්‍රිස්තුන්වහන්සේ මෙන් වෙනස් වූ බවට පෙන්වන ජීවිතයක් සම්බන්ධ ධර්ම නියාමය මෙහිදී පැමිණේ. උන්වහන්සේ අප තුළ ජීවත් වන සේක යයි පාවුල්තුමා කීවේය. උන්වහන්සේ අපගේ ජීවත තුළ කරන බලපෑම සීමාව අපි උන්වහන්සේ කෙරෙහි තබා ඇති ඇදහිල්ලෙහි උනන්දුව මතය.

අපි වැඩි දෙනෙක් අපගේ ස්වාමින්වහන්සේගේ කැමැත්තට ප්‍රතිචාර දක්වන්නෙමු. එහෙත් අපි බොහෝ දෙනෙක් අපි යේසුන් ක්‍රිස්තුන්වහන්සේගේ සේවකයෝ ලෙස නොසිතන්නෙමු. සෑම සාමාජිකයෙක්ම වැඩ කිරීමට සහ සේවය කිරීමට ක්‍රිස්තුන්වහන්සේගේ මඟපෙන්වීම ලබමින් ලෝකය තුළ සේවය කරන්නේය. මෙය සතිය පුරා අප ක්‍රිස්තුන්වහන්සේගේ නාමයෙන් හුදෙක් අපි කරන වැඩ පමණක් නොව, අප සමඟ වැඩ කරන මිනිසුන් සමඟ වූ අපගේ සම්බන්ධතාවයෙන් ද කුමක් කරන්නේද යන්නෙහි වැදගත්කම පෙන්වයි.

අපගේ වැඩය සේවයක් යන කාරණය ප්‍රජා සේවයන්හි ඇති වැදගත්කම පෙන්වයි. ඇත්තෙන්ම සේවයේ කාර්යන් ඔවුන්ගේ වටිනාකම් වේ. එසේම ඒවා ක්‍රිස්තුන්වහන්සේ අපගේ ජිවිත තුළ කරන්නේ කුමක්ද යන්න පැවසීමට ඇති අවස්ථාවන් ද වන්නේය. ඇතැම් මිනිස්සු වචනයෙන් ශුභාරංචිය ප්‍රකාශ කිරීමට දක්ෂයෝය. තවත් අය එය වැඩ තුළින් ප්‍රකාශ කිරීමට දක්ෂ වෙති. කිතුනුවන් එක්ව ක්‍රියා කරන කල, ඔවුන් තනිව කරනවාට වඩා කාර්යක්ෂම දෙයක් කළ හැකිය.

**අන්‍යෝන්‍ය සහයෝගය**

සතිය පුරාම සාමාජිකයෝ සභාවේ වැඩවල "ඉදිරි පේළියේ" සිටිති. අපට මෙම සතියේ දී එකිනෙකා වෙනුවෙන් යාච්ඤාවෙන් සහයෝගය දැක්විය හැකිය. අපි සේවය කරන්නේ කෙසේද යන්න පිළිබඳ අපි අවදියෙන් සිටිය යුතු වෙමු. එවිට අපට ඔවුන් වඩා හොඳින් ධෛර්යමත් කළ හැකි වේ. අපි හමු වන අවස්ථාවන්වල දී අපගේ අත්දැකීම් සහ අවස්ථාවන් ඔවුන් හා සමඟ බෙදා ගැනීමට හැකිය. මේ කාර්ය උදෙසා නමස්කාර මෙහෙයන් ද අප ශක්තිමත් කර සන්නද්ධ කරන්නේය. සභාවක් ලෙස අපගේ සාර්ථකත්වයෙන් වැඩි කොටසක් මනිනු ලබන්නේ අපි සතිය ඇතුළත කරන දේවලිනි. නමස්කාර මෙහෙයන්වල දී සහ කුඩා කණ්ඩායම් රැස්වීම්වල දී ඔවුන් කරන සහ අසන දේවලින් සාමාජිකයින් ශක්තිමත්ව ධෛර්ය ලැබ යේසුන්වහන්සේගේ නාමයෙන් සතිය තුළ දී යහපත කරන කල, ශුභාරංචිය පැතිරේ.

සාමාජිකයින් ඔවුන් යේසුන් ක්‍රිස්තුන්වහන්සේගේ සේවකයින් බව වටහා ගත් කල ඔවුන් කවුරුන්ද, ඔවුන් කැඳවා ඇත්තේ කුමක් උදෙසාද සහ කෙසේ ජීවත් විය යුතුද යන්න පිළිබඳ යථාර්ථවාදී දැක්මක් ඔවුන්ට ඇත්තේය. ඔවුන්ගේ අනන්‍යතාවය ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇත්තේය. ඔවුන් නමස්කාර මෙහෙයන්වලට පැමිණෙන්නේ නමස්කාරය දීම පිණිස පමණක් නොව, සතිය තුළ දී වඩා හොඳින් සේවය කරන පිණිස අනුශාසනා ලැබීම පිණිසත්‍ය. සමහර

විට එහිදී "මම කිසි දෙයක් නොලැබුවෙමි" යනුවෙන් සුළු ප්‍රමාණයක් පැමිණිලි ලැබෙන්නට හැකි අතර, "මාගේ ජීවිතයෙන් මම දෙවියන්වහන්සේ ගෞරවයට පත් කරන්නේ කෙසේ ද" යයි විශාල ප්‍රමාණයක් සිතිවිලි ඇති වන්නට පුළුවන.

සභා පාලකවරයාගේ කාර්යය වන්නේ සාමාජිකයින් ඔවුන්ගේ සේවාවල සන්නද්ධ කරමින් ඒ සඳහා දර්ශනයක් සහ නායකත්වයක් සැපයීමයි. මෙයින් අදහස් වන එක් දෙයක් වන්නේ ඔවුන් සියලුම සේවාවන්වල මූලය වන දෙවියන්වහන්සේට සම්බන්ධ වීමට උපකාර කිරීමයි. මෙයින් අර්ථවත් වන්නේ පෙළඹවීම, ධෛර්ය දීම, සැනසීම, උනන්දු කිරීම සහ අභියෝග කිරීමයි. මෙයට දේශනා කිරීම සහ පරිපාලනය අයත් වේ. එසේම එයට කුඩා කණ්ඩායම් සඳහා නායකයින් පුහුණු කිරීම සහ වෙනත් සේවාවන් සඳහා නායකයින් වර්ධනය කිරීම සහ උපදේශ දීම ද ඇතුළත් වේ.

සභාවෙන්, දේශනා කුඩුවෙන් සහ කුඩා කණ්ඩායම්වලින් අපගේ ක්‍රියාකාරකම් යේසුන් ක්‍රිස්තුන්වහන්සේට සේවය කිරීම උදෙසා බව මතක් කරමින්, උන්වහන්සේගේ කැමැත්ත ඉදිරියට ගෙන යාමට අවශ්‍ය බලය සහ ධෛර්ය උන්වහන්සේ දෙන බැවින් සිදු කරන්නා වූ වැඩ සඳහා සදාචාරාත්මක සහයෝගයක් සැපයීමට හැකිය. කුඩා කණ්ඩායම් තුළ සහ අනෙක් ක්‍රියාකාරකම්වල හැකියාවන් දියුණු කරගැනීමට සහ ආත්මික දීමනා හඳුනාගැනීමට සහ සේවයන්ට ධෛර්ය දීම පිණිස සභාව ප්‍රායෝගික අවස්ථාවන් සපයයි.

සභා පාලකවරුන්ට අමාරු කාර්යයක් තිබේ. සාමාජිකයින්ට ඔවුන්ගේ සභා පාලකවරුන්ට උපකාර කළ හැකි වන්නේ කෙසේ ද? එක් දෙයක් නම්, ඔවුන් උදෙසා යාච්ඤා කිරීමයි. සභා පාලකවරයාගේ කාර්යය අධි ස්වභාවික උපකාරයෙන් තොරව කළ නොහැකි වේ. තවත් දෙයක් වන්නේ කුමක් කළ යුතුදැයි සභා පාලකවරුන්ගෙන් ඇසීමයි. ස්වෙච්ඡාවෙන් එය කරන්න. එය කිරීමට පවරන තෙක් නොසිටින්න. තුන්වැන්න, සෙනඟ අතර ප්‍රේමයේ පරිසරයක් නිර්මාණය කිරීමට උපකාර වන්න. මෙය ඔවුන්ගේ අවශ්‍යතා මධ්‍යයේ සේවය කරන කල "දුර්වල" සාමාජිකයින්ට සැනසීමක් සහ "අවකාශයක්" සලසන්නේය. ශක්තිමත් සාමාජිකයින් ක්‍රිස්තුන්වහන්සේගේ ශරීරය තුළ සිත් රිදවීම් නැති කරමින් සමගි කිරීම පිණිස එකිනෙකා ධෛර්යමත් කරමින්, සනසමින් සහ සන්නද්ධ කරමින් සේවයට සහයෝගය දැක්විය යුතුය.

හතරවැන්න, බොහෝ සාමාජිකයන්ට සභා පාලක හැකියාවන් තිබේ. ඔවුන්ට අනෙක් සාමාජිකයින් සේවයේ කාර්යයන් උදෙසා සන්නද්ධ කළ හැකිය. ඔවුන්ගේ මෙම සතිය තුළ කරන සේවාවන්වල දී ඔවුන් සමඟ එක් වීමට අනෙක් සාමාජිකයින්ට ආරාධනා කළ හැකිය. ඔවුන්ට සේවයේ ආදර්ශයන් දක්වමින් නායකත්වය දීමට පුළුවන. කුඩා කණ්ඩායම්වල සහ එක්කෙනා - එක්කෙනා බැගින් වූ කණ්ඩායම්වල දී ඔවුන්ට ක්‍රිස්තුන්වහන්සේ කෙරෙහි වූ ඔවුන්ගේ ඇදහිල්ල අනෙක් සාමාජිකයින්ගේ ඇදහිල්ල ශක්තිමත් කරන පිණිස ඔවුන් සමඟ බෙදාගත හැකිය. ඔවුන්ට අනෙක් සාමාජිකයින් වෙනුවෙන් යාච්ඤා කළ හැකිය. මේ සියලු ආකාරවලින් සාමාජිකයින්ට සභා පාලකවරයාට උපකාර කළ හැකිය.

සැම සාමාජිකයෙක්ම දේව සේවකයෙක් වේ.

**ගෝලත්වය 101**

**ඒකකය 9 අ**



# දෙවියන් වහන්සේගේ ලිඛිත වචනය

යේසුන් වහන්සේ කවුරුන්ද හෝ උන් වහන්සේ ඉගැන්වූ දේවල් මොනවාද යන්න අප දන්නේ කෙසේ ද? ශුභාරංචියක් වැරදි බව අපි දැනගන්නේ කෙසේ ද? සැබෑ ඉගැන්වීමේ සහ නිවැරදි ජීවත් වීමේ අධිකාරය කොහි ද? අපි දැනගැනීමට සහ කිරීමට අවශ්‍ය දේ සම්බන්ධ දෙවියන් වහන්සේගේ කැමැත්ත සහිත ආනුභාවයෙන් යුතු සහ නොවරදින සුළු වාර්තාව බයිබලය වේ.

**යේසුන් වහන්සේට සාක්ෂියක්**

"යේසුන් වහන්සේගේ සම්මන්ත්‍රණය" යන විශාරදයින් කණ්ඩායමක් විසින් යේසුන් වහන්සේ කී බවට වූ බයිබලයේ බොහෝ ඉගැන්වීම් යේසුන් වහන්සේ නොකී බව පවසන පුවත්පත් වාර්තා ඇතැම් විට ඔබ දැක තිබෙන්නට පුළුවන. මෙම කියමන්වල නිර්ව්‍යාජ බව දැක්වීම පිණිස ඔවුහු විවිධ කාරණා භාවිත කරති. එසේ නැතිනම් බයිබලය ප්‍රතිවිරුද්ධ වූ කතා සහ මිථ්‍යා කතාවල එකතුවක් බව ඇතැම් විශාරදයින් පවසනු ඔබ අසා ඇත.

බොහෝ උගත් මිනිස්සු බයිබලය නිශ්ප්‍රභ කරති. තවත් බොහෝ උගත් පිරිසක් බයිබලය දෙවියන් වහන්සේ කළ කී දෑ සම්බන්ධ විශ්වාසදායි වාර්තාවක් ලෙස සලකති. යේසුන් වහන්සේ පිළිබඳ බයිබලය පවසන දේ විශ්වාස කිරීමට අපට නොහැකි නම්, අපි උන්වහයන්සේ පිළිබඳ කිසිවක්ම නොදනිමු.

යේසුන් වහන්සේ නම් වූ සම්මන්ත්‍රණය ආරම්භ වූයේ යේසුන් වහන්සේ කුමක් උගන්වන්නට ඇතිද යන පූර්ව කල්පනාව පෙරදැරිකරගෙන වේ. මෙම අදහසට ගැළපෙන කියමන් ඔවුහු පිළිගනිති. එසේ නොවන කියමන් ප්‍රතික්ෂේප කරති. ඒ හේතුවෙන් ඔවුන්ගේම ස්වරූපයට යේසුන් වහන්සේ නිර්මාණය කරති. මෙය යහපත් විශාරදත්වයක් නොවන්නේය. මෙම සම්මන්ත්‍රණයට නිදහස් විශාරදයෝ බොහෝ දෙනෙක් පවා එකඟ නොවෙති.

යේසුන් වහන්සේ පිළිබඳ බයිබලීය වාර්තා විශ්වාස කිරීමට තරම් හොඳ හේතු අපට තිබේ ද? ඇත්තෙන්ම ඒවා ලියනු ලැබුවේ යේසුන් වහන්සේගේ මරණයට දශක කිහිපයකට පසුව, ඇසින් දුටු සාක්ෂිකරුවන් ජීවත්ව සිටින කාලයකය. යුදෙව් මිනිස්සු බොහෝ විට ඔවුන්ගේ ගුරුවරුන්ගේ වචන මතක තබා ගනිති. එම නිසා නිරවද්‍යතාවයෙන් යුතුව යේසුන් වහන්සේගේ ඉගැන්වීම් උන් වහන්සේගේ ගෝලයෝ ආරක්ෂා කරගත් බව සිතිය හැකිය. මුල් සභාවේ අවධානය යොමු වූ කාරණා, චර්මඡේදනය වැනි දේ සම්බන්ධයෙන් ඔවුන් විසින් කියමන්

සොයාගන්නා ලද බවට අපට සාක්ෂි නැත. මෙය ඒවා යේසුන් වහන්සේ ඉගැන්වූ දේ සම්බන්ධ විශ්වාස කළ හැකි වාර්තා බව යෝජනා කරන්නේය.

අත්පිටපත් ඉතා හොඳින් සංරක්ෂණය කර තිබූ බව සම්බන්ධයෙන් ද අපට සහතික විය හැකිය. හතරවන සියවසේ ඇතැම් අත්පිටපත් ද, දෙවන සියවසේ අත්පිටපත්වල කුඩා කොටස් ද අප වෙත ඇත්තේය. මෙය අනෙක් ඓතිහාසික පොත් සියල්ලටම වඩා ඉතාම හොඳය. (වර්පිල්ගේ පැරණිම පිටපත පිටපත් කරන ලද්දේ වර්පිල් මිය ගොස් වසර 350කට පසුවය. ප්ලේටෝගේ වසර 1,300කට පසුවය.) අත්පිටපත් සංසන්දනය කිරීමෙන් බයිබලය ඉතාම පරෙස්සමින් පිටපත් කරන ලද බවත්, අපට ඉතා උසස් මට්ටමේ විශ්වාස කළ හැකි පාඨ ඇති බවත් පෙනේ.

**ශුද්ධ ලියවිලිවලට යේසුන් වහන්සේගේ සාක්ෂි**

යේසුන් වහන්සේ පරිසිවරුන් සමඟ බොහෝ ගැටලු සම්බන්ධයෙන් තර්ක කිරීමට කැමැති වූ නමුත්, උන් වහන්සේ ඔවුන්ගේ ශුද්ධ ලියවිලි සම්බන්ධ දැක්ම පිළිබඳ තර්ක කිරීමට කැමති නොවූ සේක. උන් වහන්සේ අර්ථකථනයන් සහ සම්ප්‍රදායන්වලට එකඟ නොවුව ද, ඇදහිල්ල සහ භාවිතය සඳහා ශුද්ධ ලියවිලි ආධිපත්‍යධාරී බවට උන් වහන්සේ අනෙක් යුදෙව් නායකයින් හා එකඟ වූ සේක.

යේසුන් වහන්සේ ශුද්ධ ලියවිලිවල ඇති සෑම වදනක්ම සම්පූර්ණ වන බවට අපේක්ෂා කළ සේක (මතෙව් 5:17-18, මාක් 14:49). උන් වහන්සේ තමන් වහන්සේගේ කරුණු ඔප්පු කිරීම පිණිස ශුද්ධ ලියවිලි උපුටා ගත් සේක (මතෙව් 9:13, 22: 31, 26 : 24, 26 : 31, යොහන් 10 : 34). අවධානයෙන් යුතුව ශුද්ධ ලියවිලි නොකියවීම සම්බන්ධයෙන් උන් වහන්සේ මිනිසුන්ට චෝදනා කළ සේක (මතෙව් 22:29, ලූක් 24:25, යොහන් 5:39). උන් වහන්සේ පැරණි ගිවිසුමේ මිනිසුන් සහ සිද්ධීන් පිළිබඳ ඒවා සත්‍ය නොවූ බවට කිසිම ඉඟියක් නොකොට සඳහන් කළ සේක.

ශුද්ධ ලියවිල්ලට දෙවියන් වහන්සේගේ අධිකාරය තිබේ. යේසුන් වහන්සේ සාතන්ගේ පරීක්ෂාවන්ට පිළිතුරු දෙන අවස්ථාවේ දී, "එය ලියා තිබේ" යනුවෙන් උන් වහන්සේ කී සේක (මතෙව් 4 : 4-10). ශුද්ධ ලියවිලිවල යම් දෙයක් ලියා ඇති බව කීමෙන් යේසුන් වහන්සේ අදහස් කළේ එය නිසැකවම අධිකාරයක් සහිත බවයි. දාවිත්ගේ වචන ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙන් යුක්ත විය (මාක් 12:36). දානියෙල් "තුළින්" අනාවැකියක් දෙන ලද්දේය (මතෙව් 24:15). මන්ද එහි සත්‍ය වූ මූලාරම්භය දෙවියන් වහන්සේ වූ නිසාවෙනි.

මැවුම්කරුවාණන් වහන්සේ උත්පත්ති 2:24 කී දෙය මතෙව් 19:4-5 යේසුන් වහන්සේ කී සේක. "මිනිසෙකු තම පියා ද මව ද අත්හැර සිය භාර්යාවට ඇලුම් වන්නේය". කෙසේ වෙතත් උත්පත්ති පොතේ මෙම වචන දෙවියන් වහන්සේගේ වචන බව විස්තර නොකරයි. ශුද්ධ ලියවිල්ලෙහි එය තිබූ බැවින් දෙවියන් වහන්සේ විසින් ඒවා කියන ලද බවට යේසුන් වහන්සේට කිව හැකිව තිබිණි. මෙහි උපකල්පනය වන්නේ දෙවියන් වහන්සේ ශුද්ධ ලියවිල්ලෙහි පරම කතුවරයා බවයි.

යේසුන් වහන්සේ ශුද්ධ ලියවිලි විශ්වාස කළ හැකි සහ විශ්වසනීය ලෙස දැක්වූ බවට ශුභාරංචි පොත් පුරාම සාක්ෂි ඇත. උන් වහන්සේ යුදෙව් නායකයින්ට මතක් කළ අන්දමට "ශුද්ධ ලියවිල්ල ප්‍රතික්ෂේප කළ නොහැකිය" (යොහන් 10 : 35). යේසුන් වහන්සේ එය වලංගු

දෙයක් බවට අපේක්ෂා කළ සේක. තවමත් පැරණි ගිවිසුම ප්‍රධානව පවතින කාලයක පැරණි ගිවිසුමේ වලංගුභාවය උන් වහන්සේ උසස් කොට සැලකූ සේක (මතෙව් 8:4, 23:23).

**අපෝස්තුළුවරුන්ගේ සාක්ෂි**

අපෝස්තුළුවරු ඔවුන්ගේ ගුරුතුමා මෙන්ම ශුද්ධ ලියවිලිවල අධිකාරීත්වය සැලකූහ. බොහෝ විට තර්කයකට සාක්ෂියක් ලෙසින් ඔවුහු එය නිතරම උපුටා දැක්වූහ. ශුද්ධ ලියවිලිවල කියමන් දෙවියන් වහන්සේගේ වචන ලෙසින් සලකනු ලැබිණි. ආබ්‍රහම්ට සහ පාරාවෝට දෙවියන් වහන්සේ විසින් කතා කළ දේ ලෙසින් ද ශුද්ධ ලියවිලි පෞද්ගලිකකරණය විය (රෝම 9:17, ගලාති 3:8). දාවිත් හෝ යෙසායා හෝ යෙරමියා හෝ ලියූ දේවල් ඇත්තෙන්ම දෙවියන් වහන්සේ කතා කළ දේවල් වේ. එම නිසා නිසැක දේවල් වේ (ක්‍රියා 1:16, 4:25, 13:35, 28:25, හෙබ්‍රෙව් 1:6-10, 10:15). මෝසෙස්ගේ ව්‍යවස්ථාව දෙවියන් වහන්සේගේ මනස ප්‍රතිරූපයක් ලෙස කල්පනා කරන ලදී (1 කොරින්ති 9:9). ශුද්ධ ලියවිල්ලේ සැබෑ කතුවරයා දෙවියන් වහන්සේ වන සේක (1 කොරින්ති 6:16, රෝම 9:25).

පාවුල්තුමා ශුද්ධ ලියවිල්ල "දෙවියන් වහන්සේගේම වචන" ලෙස හඳුන්වයි (රෝම 3:2). ප්‍රොපේතවරු "ශුද්ධාත්මානුභාවයෙන් පොළඹවනු ලැබ දෙවියන් වහන්සේගේ වචනය කතා කළහ" යනුවෙන් පේදුරුතුමා පවසයි (2 පේදුරු 1: 20). ප්‍රොපේතවරු එය සාදා නොගත්හ - දෙවියන් වහන්සේ ඔවුන්ට ආනුභාවය දුන් සේක. එම වචනවල නියම මූලාරම්භය උන් වහන්සේ වන සේක. ඔවුහු බොහෝ විට"දෙවියන් වහන්සේගේ වචනය මා වෙතට පැමිණ ..." හෝ "ස්වාමින් වහන්සේ මෙසේ කියන සේක" යනුවෙන් ලියූහ.

පාවුල්තුමා තිමෝතිට මෙසේ ද කීවේය. "දේවානුභාවයෙන් යුත් මුළු ශුද්ධ ලියවිල්ල ඉගැන්වීමට ද, දුර්මත දුරු කිරීමට ද, හික්මවීමට ද, ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම පිණිස උපදෙස් දීමට ද ප්‍රයෝජනවත් වෙයි" (2 තිමෝති 3:16). එය බයිබලීය කතුවරුන් තුළට දෙවියන් වහන්සේගේ පණිවුඩය හුස්ම ගලා යාමක් මෙනි.

කෙසේ වෙතත්, අපි අපගේ නූතන අදහස් සමඟ මෙම "දෙවියන් වහන්සේගේ හුස්ම යැවීම" යන්න අර්ථයක් ඇති දෙයක් සේ නොසලකමු. පාවුල්තුමා මෙය ග්‍රීක සෙප්තුවාජින්ත පරිවර්තනයේ දී පවසා ඇති බව අපි මතක තබා ගත යුතු වේ (තිමෝති බාල කාලයේ පටන් දැන සිටි ශුද්ධ ලියවිලි - 15 පදය). හෙබ්‍රෙව් මුල් පිටපතේ සඳහන් දෙයට වඩා මෙම පරිවර්තනයේ ඇතැම් ස්ථානවල සැලකිය යුතු වෙනසක් ඇත. පාවුල්තුමා මෙම පරිවර්තනය එය සම්පූර්ණ පාඨයක් ලෙස තේරුම් නොගෙන දෙවියන් වහන්සේගේ වචනය ලෙස භාවිත කළේය. එහි පරිවර්තන වෙනස්කම් තිබියදීත් එය දෙවියන් වහන්සේගේ හුස්ම ලද, එමෙන්ම මනුෂ්‍යයින් "ක්‍රිස්තුන් යේසුන් වහන්සේ තුළ ඇදහිල්ල මඟින් ගැළවීම ලැබීමට ඥානවන්ත කරන" සහ ඇදහිලිවන්තයින් "ඕනෑම යහපත් ක්‍රියාවකට" සන්නද්ධ කරන්නා වූ දෙයකි (17 පදය).

**අසම්පූර්ණ සන්නිවේදනය**

දෙවියන් වහන්සේ යන්නෙහි මුල් වචනය සම්පූර්ණත්වය වේ. එය නිරවද්‍ය තත්වයට පත් කිරීමට මෙන්ම, එය නිවැරදි ලෙස ආරක්ෂා කිරීමට සහ (සන්නිවේදනය සම්පූර්ණ කිරීමට) එය නිවැරදි ලෙස තේරුම් ගැනීමට මනුෂ්‍යයින් යොමු කිරීමට නියත වශයෙන්ම දෙවියන් වහන්සේට හැකි වේ. එහෙත් දෙවියන් වහන්සේ මේ සියල්ල සිදු කර නැත. අපගේ

පිටපත්වල ව්‍යාකරණ දෝෂ, පිටපත් කිරීමේ දෝෂ සහ (ඉතාම සුවිශේෂි ලෙස) මනුෂ්‍යයෝ පණිවුඩය ලැබීමේ දී සැම විටම වැරදි සිදු කරති. ශුද්ධ ලියවිලි ලිවීම සඳහා ආනුභාවය ලද දෙවියන් වහන්සේගේ වචනය සම්පූර්ණ ලෙස සවන් දීමෙන් අප වැළකීමට "හඬක්" ඇත්තේය. එසේ වුව ද, දෙවියන් වහන්සේ වර්තමානයේ අපට කතා කිරීම පිණිස ශුද්ධ ලියවිලි භාවිත කරන සේක.

දෙවියන් වහන්සේ සහ අප අතර මනුෂ්‍යමය වැරදි ඇති කරන එම "හඬ" තිබියදීත්, ශුද්ධ ලියවිලිවල අරමුණ සම්පූර්ණ වී ඇත : එනම් අපට ගැළවීම පිළිබඳව සහ නිවැරදි හැසිරීම පිළිබඳ පැවසීමයි. දෙවියන් වහන්සේ ශුද්ධ ලියවිලි සම්බන්ධ උන් වහන්සේගේ අරමුණ සම්පූර්ණ කළ සේක: උන් වහන්සේ අප ගැළවීම ලැබීමට හැකි පමණ පැහැදිලි බවකින් සහ අප කළ යුතු බවට උන් වහන්සේ කැමති දේ ඉගෙන ගැනීමට හැකි අයුරින් අපට උන් වහන්සේගේ වචනය සන්නිවේදනය කරන සේක.

ශුද්ධ ලියවිල්ල, පරිවර්තන පවා, උන් වහන්සේගේ අරමුණ උදෙසා නිරවද්‍යව පවතී. දෙවියන් වහන්සේ බලාපොරොත්තු වනවාට වඩා එයින් අප යමක් අපේක්ෂා කිරීම වැරදි විය හැකිය. උන් වහන්සේ අපට තාරකා විද්‍යාව හෝ විද්‍යාවාව උගන්වන්නේ නැත. ශුද්ධ ලියවිල්ලෙහි අංක වර්තමානයේ ගණිත ක්‍රම ප්‍රමිතින්ට අනුව සැම විටම සකස් කර නැත. අපි ශුද්ධ ලියවිල්ල දෙස සුළු කරුණු සොයා ගැනීමට නොව, එහි අරමුණ අනුව බැලිය යුතු වෙමු.

නිදසුනක් ලෙස, ක්‍රියා 21:11 පාවුල්තුමා යුදෙව්වන් විසින් බඳිනු ලැබ අන්‍යජාතීන්ට දෙනු ලබන බව කීමට අගබස් ආනුභාවය ලැබීය. සමහර මිනිස්සු පාවුල්තුමා බඳිනු ලබන්නේ කවරෙකු විසින්ද යන්නත්, ඔවුන් ඔහුට කුමක් කරනු ඇතැයි යන්නත් අගබස් පවසනු ඇතැයි සිතන්නට ඇත. එහෙත් කථාව වෙනස් වෙමින් පාවුල්තුමා අන්‍ය ජාතීන් විසින් බේරාගනු ලැබ, අන්‍ය ජාතීන් විසින්ම බඳිනු ලැබීය (21:30-33).

මෙය පරස්පර විරෝධී දෙයක් ද? ක්‍රමානුකූලව ඔව්. අනාවැකිය ප්‍රතිපත්ති අනුව සත්‍ය වේ. එහෙත් විස්තර අනුව සත්‍ය නොවේ. ඇත්තෙන්ම, ලූක්තුමා මෙය ලියන අවස්ථාවේ දී, ඔහුට පහසුවෙන්ම සිදු වූ දෙය හා ගැළපෙන ලෙස අනාවැකිය ලිවිය හැකිව තිබිණි. එහෙත් මෙම වෙනස්කම් පෙනෙන්නට සැලැස්වීමට ඔහු කැමති විය. මිනිසුන් මෙවැනි විස්තරවල යථාර්ථය බලාපොරොත්තු වීම ඔහු අපේක්ෂා නොකළේය. මෙය ශුද්ධ ලියවිල්ලෙහි සියලුම විස්තරවල යථාර්ථය අපේක්ෂා කිරීම සම්බන්ධයෙන් මෙය අපට අනතුරු හඟවයි. අපි පණිවුඩයේ ප්‍රධාන කරුණ වෙත අවධානය යොමු කළ යුතු වෙමු. මෙයට සමාන ලෙස, 1 කොරින්ති 1:14 - ලියන අවස්ථාවේ දී පාවුල්තුමා කළ අත්වරදක් ඔහු 16 වන පදයෙහි නිවැරදි කර ඇත. ආනුභාවය ලද ශුද්ධ ලියවිල්ලෙහි අත්වැරදීම් සහ නිවැරදි දේ අන්තර්ගත වී ඇත.

ඇතැම් මිනිස්සු ශුද්ධ ලියවිල්ල සහ යේසුන් වහන්සේ සංසන්දනය කරති. එකක් නම් දෙවියන් වහන්සේ මනුෂ්‍යමය භාෂාවකින් සිටීමයි, අනෙක වන්නේ වචනය මාංශවත් වීමයි. යේසුන් වහන්සේ පාප රහිත බව යන්නෙන් සර්ව සම්පූර්ණ වන සේක. එහෙත් උන් වහන්සේ කෙදිනකවත් කිසිම අත්වැරදීමක් සිදු නොකළ බව එයින් අදහස් නොවේ. ළමයෙකු ලෙස මෙන් පවා, එසේම වැඩිහිටියෙකු ලෙස පවා උන් වහන්සේ ව්‍යාකරණ අතින් ද, වඩු කාර්මිකයෙකු ලෙස ද අත් වැරදීම් සිදු කරන්නට ඇත. එහෙත් එම අත්වැරදීම් පාපයන් නොවීය. ඒවා උන් වහන්සේගේ අරමුණෙන් - එනම් අප වෙනුවෙන් පාප රහිත පූජාවක් වීමෙන් උන් වහන්සේ ඉවත් නොකළේය. එයට සමාන ආකාරයට, ව්‍යාකරණමය ලෙස සහ

අනෙක් නොවැදගත් විස්තරවල අත්වැරදීම් බයිබලය එහි අරමුණ සම්පූර්ණ කිරීමෙන් ඉවත් නොකරන්නේය. එනම් ක්‍රිස්තුන් වහන්සේ තුළින් වන ගැළවීම පිළිබඳ ඉගැන්වීම වේ.

**බයිබලයෙහි සාක්ෂි**

කිසිවෙකුට බයිබලයෙහි ඇති සියල්ල සත්‍ය වන බව ඔප්පු කළ නොහැකි වේ. ඔවුන්ට එක් සුවිශේෂ අනාවැකියක් සම්පූර්ණ වීම පෙන්නුම් කළ හැකිය. එහෙත් ඔවුන්ට සම්පූර්ණ බයිබලය සතුව ඇති වලංගුභාවය පෙන්නුම් කළ නොහැකිය. මෙය වැඩි වශයෙන් පදනම් වන්නේ ඇදහිල්ල මතය. පැරණි ගිවිසුම දෙවියන් වහන්සේගේ වචනය ලෙස යේසුන් වහන්සේ සහ අනෙක් අපෝස්තුළුවරු පිළිගත් බවට අපට ඓතිහාසික සාධක දැකිය හැකි වේ. බයිබලීය යේසුන් වහන්සේ පමණි අපට ඇත්තේ, අනෙක් අදහස් අනුමානයන්ගෙන් වූ දේවල් මිස, අලුත් සාධක නොවේ. ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් වඩා සත්‍ය තුළට ගෝලයින් මඟපෙන්වනු ලැබූ යේසුන් වහන්සේගේ ඉගැන්වීම් අපි පිළිගනිමු. පාවුල්තුමා දිව්‍යමය අධිකාරයෙන් යුක්තව ලියූ බවට වූ ඔහුගේ ප්‍රකාශය අපි පිළිගනිමු. දෙවියන් වහන්සේ කවුරුන්ද යන්න සහ උන් වහන්සේ සමඟ අපි සහභාගිකම් පවත්වන්නේ කෙසේද යන්න පිළිබඳ බයිබලය එළිදරව් කරන බව අපි පිළිගනිමු.

ඇදහිල්ල සහ භාවිතය පිළිබඳ බයිබලය ප්‍රයෝජනවත් වන බව සියවස් ගණනාවක් පුරා කිතුනුවන් පිළිගත් බවට වූ සභා ඉතිහාසයේ සාක්ෂි අපි පිළිගනිමු. මෙම පොත දෙවියන් වහන්සේ කවුරුන්ද යන්නත්, අප උදෙසා උන් වහන්සේ කුමක් කළේද යන්නත්, අප උන් වහන්සේට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද යන්නත් අපට පවසයි. එසේම බයිබලීය කැනොනයට අයිති කුමන පොත්ද යන්න සම්ප්‍රදාය පවසන්නේය. දෙවියන් වහන්සේ ක්‍රියාවලිය මඟපෙන්වූ බවත්, එම නිසා අවසාන ප්‍රතිඵලය අරමුණ සම්පූර්ණ කරන ලද බවත් අපි විශ්වාස කරමු.

ශුද්ධ ලියවිල්ලෙහි නිරවද්‍යභාවයට අපගේ අත්දැකීම ද සාක්ෂි දෙයි. අපගේ පාපී බව සහ අනුග්‍රහය පවිත්‍ර කරනු ලැබුවා වූ හෘදය සාක්ෂියක් අපට පිළිගැන්වූ බව කීමට අවංක බවක් මෙම පොතට ඇත්තේය. එය නීති සහ අණපනත් වලින් නොව, බලාපොරොත්තු නොවන ආකාරයකට අපට සදාචාරාත්මක ශක්තිය ලබා දෙන්නේය. එනම් අනුග්‍රහය තුළින් සහ ස්වාමින් වහන්සේගේ නින්දිත මරණය තුළිනි.

බයිබලය විස්තර කරන ආකාරයට වන හැඟීම්, වචනවලට නැංවීමට අපට නොහැකි තරම් ඔබ්බෙන් වූ බයිබලය ඇදහිල්ල තුළින් අපට ඇති වන ප්‍රේමය, ප්‍රීතිය සහ සමාදානයට සාක්ෂි දරයි. දිව්‍යමට මැවීම සහ මිදීම පිළිබඳ අපට පවසමින් ජීවිතයේ අර්ථය සහ අරමුණ මෙම පොත අපට ලබා දෙයි. බයිබලීය අධිකාරය සම්බන්ධයෙන් වූ මෙම අංග සැකයට ඔප්පු කළ නොහැකිය. එහෙත් එය අප අත්දකින දේවල්වලින් ශුද්ධ ලියවිල්ල පැහැදිලි කරගැනීමට උපකාර කරයි.

බයිබලය එහි වීරවරයින් අතිශයෝක්තියෙන් වර්ණනා නොකරයි. මෙය ද එහි අවංකභාවය පිළිගැනීමට උපකාර වේ. එය ආබ්‍රහම්ගේ, මෝසෙස්ගේ, දාවිත්ගේ සහ ඉශ්‍රායෙල් ජාතියේ සහ ගෝලයින්ගේ අසමත් වීම් පිළිබඳ පවසයි. වචනය මාංශවත් වීම, එසේම දෙවියන් වහන්සේගේ ශුභ ආරංචිය සම්බන්ධ වඩා අධිකාරයෙන් යුත් වචනයකට සාක්ෂි දරන්නකි බයිබලය.

බයිබලය ඉතාම සරල දෙයක් නොවන්නේය. එය පහසු මඟක් නොගනියි. පැරණි ගිවිසුම හා සමඟ නොකඩව ගලා යන්නාක් මෙන්ම, එසේ නොකඩව ගලා නොයන බවක් ද නව ගිවිසුම පෙන්නුම් කරන්නේය. එකකින් හෝ අනෙකින් එය සරල ලෙස අඩු කොට දැක්විය හැකි වේ. එහෙත් දෙකොටසම තිබීම වඩා අභියෝගාත්මක වේ. එම ආකාරයෙන්ම, යේසුන් වහන්සේ මනුෂ්‍යමය සහ දිව්‍යමය යන දෙයාකාරයෙන්ම පිළිගන්වනු ලැබූ සේක. එය හෙබ්‍රෙව්, ග්‍රීක් හෝ නූතන මතවලට තේරුම් ගත නොහැකි සංයුක්ත බවකි. මෙම සංකීර්ණ බව නොදැනුවත්කම තුළින් හෝ දාර්ශනික ප්‍රශ්න තුළින් නිර්මාණය නොකර ඒවාට ප්‍රතිවිරුද්ධ ලෙස බිහි කර ඇත.

බයිබලය අභියෝගාත්මක පොතකි. එය ප්‍රෝඩාවක් ඉදිරිපත් කිරීමට හෝ මුළාවක් කිරීමට වෑයම් කරන්නක් නොවේ. යේසුන්වහන්සේගේ උත්ථානය මෙවන් වූ ආශ්චර්යමත් සිදුවීමක් සම්බන්ධයෙන් වූ බරක් එක් කරන්නේය. එය යේසුන් වහන්සේ කවුරුන්ද යන්න සහ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්ගේ මරණය තුළින් මරණය ජය ගැනීමේ අනපේක්ෂිත තර්කය සම්බන්ධ ගෝලයින්ගේ සාක්ෂියට අමතර බරක් ලබා දෙන්නේය.

නැවතත්, බයිබලය දෙවියන් වහන්සේ, අප, ජීවිතය, නිවැරදි දේ සහ වැරදි දේ පිළිබඳ වූ අපගේ සිතිවිලිවලට අභියෝග කරන්නේය. වෙනත් කිසිම තැනකින් අපට හමු නොවන පුඩිමක් ආහාරයට ගන්නා විට ඇති වන සාක්ෂිය සේම, අපගේ ජීවිතවලට බයිබලය අදාළ කරගැනීමේ දී ඇති වන සාක්ෂිය ද වේ.

ශුද්ධ ලියවිල්ල, සම්ප්‍රදාය, පෞද්ගලික අත්දැකීම සහ හේතු යන සියල්ලෙහි සාක්ෂිය බයිබලයෙහි අධිකාරය තහවුරු කරන්නේය. සංස්කෘතීන් හරාහා කතා කිරීමට හැකියාව, එය ලියන ලද කාලයෙහි නොතිබූ සිදුවීම් සම්බන්ධයෙන් කතා කිරීමට හැකියාව ආදියද එහි ඇති අධිකාරයට සාක්ෂි වේ. බයිබලයෙහි සාක්ෂි ඇදහිලිවන්තයින්ගේ හදවත් සහ ජීවිත වෙනස් කිරීම උදෙසා ශුද්ධාත්මයාණන් වහන්සේ එය භාවිත කරනු ලැබීමෙන් පෙන්නුම් වේ.

# වරදින් තොර බව සහ නොවරදින සුලු බව

ඇතැම් එවැන්ජලිස්ත කිතුනුවෝ බයිබලය වරදින් තොර වූවක් ලෙස කිතුනුවන් විසින් හඳුන්වනු ලැබිය යුතු බව සිතති. තවත් අය බයිබලය නොවරදින සුලු දෙයක් ලෙස හැඳින්වීමට කැමැත්තෝය. එසේ වුවත් මෙම වචන සාමාන්‍ය භාවිතයේදී ප්‍රායෝගික ලෙස එකම දේ අදහස් කරයි. දේව ධර්මයේදී ඒවා විවිධ සංකල්ප සඳහා භාවිත වේ.

*වරදින් තොර වීම* යන්න පොදුවේ දේවධර්මයේදී, ඉතිහාසයේදී හෝ විද්‍යාවේදී වැරැද්දකින් තොර බව අර්ථ දෙයි. *නොවරදින සුලු බව* (ඇතැම් විට සීමා සහිත වරදින් තොර බව යන්වෙන්ද හැඳින්වේ) ධර්ම නියාමක සඳහා ද භාවිත වේ. එය විද්‍යාත්මක හෝ ඓතිහාසික හෝ වශයෙන් වන නිරවද්‍යතාව නොවේ. මන්ද ඒවා බයිබලයේ අරමුණෙන් බැහැරව ඇති නිසාවෙනි.

ඇතැම් උසබ සාමාජිකයෝ බයිබලය වරදින් තොර බව බව විශ්වාස කරති. තවත් අය එය නොවරදින සුලු බව කීමට කැමැත්තෝය. අපගේ විශ්වාස ප්‍රකාශනය අවම - සුවිශේෂී වචනයක් වන නොවරදින සුලු බව යන්න භාවිත කරයි. එයට බොහෝ සාමාජිකයින්ට එකඟ වීමට පුළුවන. මන්ද වරදින් තොර වීම කෙරෙහි විශ්වාස කරන මනුෂ්‍යයෝ නොවරදින සුලු බව කෙරෙහි ද විශ්වාස කරන නිසාවෙනි.

ජෝන් ස්ටොට්, වරදින් තොර බව පිළිගන්නා නමුත්, "මෙම වචනය මා අපහසුතාවට පත් කරන්නේ මන්ද යන්නට හේතු පහක්" ලැයිස්තුගත කරයි. පළමුවැන්න, ශුද්ධ ලියවිල්ලෙහි දෙවියන් වහන්සේ තමාවම එළිදරව් කිරීම ඉතා වැඩි වශයෙන් සිදු කර ඇත. එය අන්තර්ගතයෙන් සහ ස්වභාවයෙන් ද වේ. එම නිසා "සත්‍යය" හෝ "වැරදි" යන ලේබලයන්ට අන්තර්ගත කළ හැකි තරමට එය කම්බියක් සේ අඩු කළ නොහැකිය. "සත්‍යය ද නැතිනම් වැරදි ද?" යන්න ශුද්ධ ලියවිලි සමඟ කටයුතු කිරීමේ දී අදාළ නොවන ප්‍රශ්නයකි. (අණ පනත් සත්‍ය හෝ වැරදි හෝ නොවේ.)

"දෙවැන්න, වරදින් තොර බව යන වචනය නැත යන අර්ථය දෙවරක් ගෙන දේ. එම නිසා මම සැම විටම නැත යන අර්ථය දෙවරක් ලබා දෙන වචනයට වඩා ඇත යන එක් වරක් ඇති පදයට කැමැත්තෙමි. බයිබලය සත්‍ය වේ, එම නිසා විශ්වාස කළ හැකිය යනුවෙන් පිළිගැනීම වඩා හොඳය ...

"තුන්වැන්න, වරදින් තොර වීම යන වචනය වැරදි සංඥා මගින් වැරදි ආකල්ප වර්ධනය කරයි. අප අනුග්‍රහයෙන් සහ දෙවියන් වහන්සේ පිළිබඳ දැනුමෙන් වර්ධනය වන පිණිස ශුද්ධ ලියවිලි සෙවීම පිණිස අප ධෛර්යමත් කරනු වෙනුවට, එය අප රහස් පරීක්ෂක ක්‍රියාවන්ට යොමු කරමින් ඉඟි පරික්ෂා කිරීමටත්, අප පෙනෙන විෂමතාවලින් බෙහෙවින් ආරක්ෂා කිරීමටත් යොමු කරන්නේය.

"හතරවැන්න, එවැන්ජලික කවුද සහ එසේ නොවන්නේ කවුද යන්න හඳුනාගැනීම පිණිස මිථ්‍යා විශ්වාසයක් ලෙස වරදින් තොර බව භාවිත කිරීම අඥාන මෙන්ම අසාධාරණ වේ. නිර්ව්‍යාජ එවැන්ජලිස්ත බවේ සලකුණ වන්නේ අපි බයිබලය පිළිබඳ නිර්දෝෂී සූත්‍රයකට සම්මාදම් වනවාද යන්න නොව, බයිබලය උගන්වන දෙයට ප්‍රායෝගිකව අවනත වනවාද යන්නෙනි....

“පස්වැන්න, බයිබලයෙහි වැරදි අන්තර්ගත නොවන බව ඔප්පු කිරීම අපහසු වේ. පෙනෙන්නා වූ සම්මාදමකට මුහුණ දෙන කල, බොහෝ කිතුනුවන්ගේ ප්‍රතිචාරය වන්නේ නොමේරූ අසුබවාදී විනිශ්චයක් නොකිරීමත්, එකමුතු වීමට උපා යෙදීමත් නොව, ඒ වෙනුවට ඉදිරියේ අපට දෙන්නට යන්නාවූ ආලෝකයේ විනිශ්චය අත්හිටුවීමටය. :*ඥ්බටැකසප්ක ඔරමඑයල* වචග 61-62-ග

වරදින් තොර බව යන වචනය හා සම්බන්ධ තවත් ප්‍රශ්නයක් ඇත. එය ටිකින් ටික වර්ධන සුදුසුකම් ලැබිය යුතු වේ. බයිබලය සම්බන්ධ මධ්‍යස්ථ මතධාරීහු පවා බයිබලයේ ව්‍යාකරණමය අක්‍රමිකතා, අතිශයෝක්ති වර්ණනා, සුළු වරදින් යුතු උපුටා දැක්වීම් සහ සීමාසහිත දැක්මෙන් යුක්ත වූ නිරීක්ෂණයන් ඇති බවට එකඟ වෙති :,ඔයැ සයසප්ටද ~ඒඑැපැබඑ දබ ඊසඉකසප්ක ෂබැරර්බජහල, 'රඑසජකැ ඨෂෂල වරසබඑා සබ හදරප්බ බග ඨැසිකැරල ටසඑදරල *ෂබැරර්බජහල* ❑දබාැරඩ්බල 1979ල ඊටැ 496-ග

වෙනත් වචනවලින් පවසතොත්, වරදින් තොර බව යන්න “කිසිම ආකාරයක වරදකින් තොර වීම” අදහස් නොකරයි. වැඩිදුරටත්, වරදින් තොර බව අදාළ කරන්නේ අත් අකුරින් ලියන ලද පිටපත්වලට මිස, වර්තමානයේ අප සතු පිටපත්වලට නොවේ. මෙම සුදුසුකම් වරදින් තොර බව යන්න එහි නියම අරුතින් ඇදගන්නා බව පෙනේ. ප්‍රධාන කරුණ නම්, මිලඩ් එරික්සන් කී ආකාරයට, “බයිබලයේ ප්‍රකාශයන් ඒවා ලියන ලද අරමුණට අනුව විනිශ්චය කරන කල සම්පූර්ණයෙන්ම සත්‍ය වේ” (කිතුනු ධර්ම නියාමක හැඳින්වීම, පිටුව 64). එය ප්‍රඥාවන්ත සුදුසුකමකි.

# ගෝලත්වය 101

# ඒකකය 9 ආ



## ධර්ම නියාමකවල වැදගත්කම

“මට ධර්ම නියාමක ඉගෙන ගැනීමට අවශ්‍ය නැත” යනුවෙන් එක් පුද්ගලයෙක් පැවසීය. “මම ධර්ම නියාමකවලින් හෙම්බත් වී සිටිමි. මට කෙටි සහ බලපෑමක් කළ හැකි දේශනා අවශ්‍ය වේ. ඒවා ධර්ම නියාමක වීම මට අවශ්‍ය නොවේ.”

මට මෙම හැඟීම් තේරුම්ගත හැකිය. ධර්ම නියාමක සම්බන්ධ තර්කයන් ඇත්තෙන්ම නීරස විය හැකිය. එසේම ධර්ම නියාමක මිනිසුන් වෙහෙසට පත් කරයි. එහෙත් අපට තවමත් ධර්ම නියාමක අවශ්‍ය වන මට කිව හැකිය. එය තර්ක කිරීමට නොව, එහෙත් අපගේ ඇදහිල්ල අවබෝධ කරගැනීම උදෙසාය. “ධර්ම නියාමකයක්” “ඉගැන්වීමක්” වන අතර, *දෙවියන් වහන්සේ සම්බන්ධ වූ සත්‍යයන්වලට* සම්බන්ධ වන්නා වූ සභාවේ වැදගත් ඉගැන්වීම් වන්නේය.

දේශනාවන් ආනුභාසම්පන්න විය යුතු වේ. එහෙත් එම ආනුභාවය පැමිණෙන්ගේ කථකයාගේ හැකියාවෙන් නොවන අතර, එය පැමිණෙන්නේ දෙවියන් වහන්සේ පිළිබඳ වූ සත්‍යයෙනි. නිදසුනක් ලෙස, අප ආනුභාවයෙන් පිරී දෙවියන් වහන්සේ යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළ කළ දේ නිසාවෙන් අනාගතය පිළිබඳ නිසැකකමක් ඇති කරගත හැකිය. ගැටලු සහිත ලොවක් තුළ දී පවා අපට සුබවාදී විය හැකිය. මන්ද අපට යේසුන් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ උගන්වනු ලැබ ඇත. යේසුන් වහන්සේ සම්බන්ධයෙන් වූ අපගේ ඉගැන්වීම් සහ විශ්වාසයන් ධර්ම නියාමක, දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යය සහ අප කරන සියල්ලෙහි පදනම වේ.

ස්ථිර කිතුනු ඇදහිල්ල යහපත් හැඟීම්, මැවිල්ලෙහි අලංකාරත්වයෙන් දෙවියන් වහන්සේගේ අභිමුඛය අත්දකින සුළු මොහොතකට, හෝ සතියකට වරක් ආනුභාවයෙන් පිරී කෙටි කතාවක් මත හෝ රැඳී නැත. යහපත් හැඟීම් සහ ආනුභා සම්පන්න අවස්ථාවන් ඇත්තෙන්ම යහපත් ආශිර්වාදයන් වේ. එහෙත් එම හැඟීම් පමණක් යේසුන් ක්‍රිස්තුන් වහන්සේ දැනගෙන විශ්වාස කිරීම තුළින් වන වෙනස් ජීවිත සහිත දෙවියන් වහන්සේ සමඟ එක්සත්කමටත් සමගිකමටත් මඟ පෙන්වන්නේ නැත. අපට දෙවියන් වහන්සේ ගැන සත්‍යය දැනගෙන එය අවබෝධ කරගෙන ඇති වන්නා වූ ස්ථිර ඇදහිල්ලක් අවශ්‍ය වේ.

ධර්ම නියාමක උපදේශ වැදගත් වන්නේ සහ සතියකට වරක් විනාඩි දහයේ දේශනාවලට වඩා යමක් කිතුනුවන්ට අවශ්‍ය වන්නේ මේ නිසාවෙනි. අපි කටයුතු කරන්නේ සදාකාලික සත්‍යයන් සහ අවසාන යථාර්ථයන් සමඟය. එසේම දිනපතා ජීවිතයේ දී අවම වැදගත් දේවල් එහෙත් ඉතා ඉක්මනින් කළ යුතු කාරණා මෙන් පෙනේ. ඇතැම් විට ගැඹුරු කරුණක් විනාඩි දහයක දී සැදිය හැකිය. එහෙත් දෙවියන් වහන්සේ කවුරුන්ද සහ උන් වහන්සේ

කළේ කුමක්ද යන්න පිළිබඳ නොකඩව දැනුමෙන් වර්ධනය වීම සඳහා කාලය දිගටම ක්‍රමානුකූල ලෙස කැප කිරීම අවශ්‍ය වේ.

අප වෙනුවෙන් යේසුන් වහන්සේ කළේ කුමක්ද සහ එය අපට බලපාන්නේ කෙසේද, අප ජීවත් වන ක්‍රමය කුමක්ද යන්න දෙවියන් වහන්සේ අපට ඉගැන්වීමට දුන් දේ නැවත නැවතත්, නොකඩව, සතියක් පාසා සතියක්, විවිධ කෝණවලින්, විවිධ බයිබල් පාඩම්, අනාගතවාක්‍ය, උපදේශ සහ කතාන්දර යළි යළිත් විමසමින් පැහැදිලි කිරීම අවශ්‍ය වේ. බොහෝ දේශනා විනාඩි 10ක් පමණක් වුවහොත්, ආවරණය කිරීමට වටිනා වූ විෂයන් ආවරණය කිරීම පිණිස අවුරුදු 20ක් ගත වන බව අපට පහසුවෙන්ම පෙනෙන්නේය. එහෙත් කිතුනුවන්ට එයට වඩා යමක් අවශ්‍ය වේ.

කතාන්දරයේ එක් පැත්තක් පමණක් ඉදිරිපත් කිරීමට එය විනාඩි 10කට පමණ ඉක්මවා සරල කොට දැක්වීම පහසුය. එහෙත් කිතුනු ජීවිතය සංකීර්ණ වූවකි. යේසුන් වහන්සේගේ කුරුසිය අපගේ අසල්වාසියාට අප සලකන ආකාරයට බලපෑමක් විය යුතු කෙසේද යන්න මනුෂ්‍යයෝ ඉබේම වටහා නොගනිති. ඔවුන් අසන සෑම දෙයක්ම ඔවුහු ඉබේම විශ්වාස නොකරති. කිතුදහමේ බොහෝ අංග පැහැදිලි කිරීමට විනාඩි 10කට වඩා ගත වේ. දේශනා අලුත් අයට මෙන්ම දීර්ඝකාලීන සාමාජිකයින්ට විය යුතුය.

**පන්තිවල අවශ්‍යතාවය**

සභාවන් ගෝලත්ව පන්ති සහ දේශනා යන දෙකම පැවැත්විය යුතුය. පන්ති වඩාත් ධර්ම නියාමක සහ පැහැදිලි විය යුතුය. එසේම ප්‍රශ්න ඇසීමට සහ සාකච්ඡාවට අවස්ථා තිබිය යුතුය. එය විශේෂිත කණ්ඩායම්වලට අවශ්‍ය පරිදි, එනම් නව කිතුනුවන්, තරුණ අය, ළමා සහ වෙනත් ආදි වශයෙන් පැවැත්විය යුතුය. එවිට වැඩිපුර පෙළඹවීමේ අවධාරණයක් සහිතව, ශුද්ධ ලියවිල්ලේ කෙටි කොටසක් මත පදනම්ව දේශනා කෙටි කළ හැකිය. සිහින් සුළඟකින් හෝ විශේෂිත කථා විලාසයකින් හෝ පෙළඹවීම පැමිණෙන්නේ නැත. එය පැමිණිය යුත්තේ යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ අප වෙනුවෙන් කළ දේ සම්බන්ධ සත්‍යයෙනි. දේශනාවට දක්ෂ කියමන් සහ හොඳ අදහස් පමණක් නොව, ශක්තිමත් උපදේශ කිහිපයක්ද ඇතුළත් විය යුතුය.

ආනුභාවය සහ අනුශාසනය සත්‍යය සහ ගෝලත්වය යන්නෙන් වෙන් කළ නොහැකිය. බයිබල් අධ්‍යයනය සහ ධර්ම නියාමක අධ්‍යයනය වූ කලි නමස්කාරයේ විධියකි. එය නමස්කාර මෙහෙයක දී වුවද සිදු කළ හැකිය. දේශනාව අනුශාසනා දීම සහ ධෛර්ය දීම යන දෙකටම භාවිත කළ යුතු වේ. බයිබලීය අර්ථ පැහැදිලි කිරීමේ දේශනා මාලාවකින් ධර්ම නියාමක විෂයන් ආවරණය කළ හැකිය.

බයිබලීය පදනමෙන් යුත් ධර්ම නියාමක දේශනාවක් හෝ බයිබල් අධ්‍යයනයක් පිළියෙළ කිරීමේදී සහ සවන් දීමේදී විනාඩි 10ක "සතියක් උදෙසා වූ සිතිවිල්ලකට" වඩා වැඩි මානසික ශක්තියක් අවශ්‍ය වේ. එහෙත් කිතුනුවන් තම ඇදහිල්ල අවබෝධ කරගැනීම අවශ්‍ය වේ. එසේ කිරීම පිණිස කිතුනු නායකයින් සහ ගුරුවරුන් ඔවුන්ට උපකාර කළ යුතුය. ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇදහිල්ල යහපත් හැඟීම් සහ ප්‍රබෝධාත්මක කියමන්වලට වඩා ගැඹුරට යන්නක් බව කිතුනුවන් අවබෝධ කරගත යුතු වේ. එවිට දෙවියන් වහන්සේගේ වචනයේ හැකි සියලු යහපත් දෙයින් පෝෂණය වීමෙන් ඔවුහු ප්‍රීතියට පත්ව අගය කරනු ඇත.

ඇත්තෙන්ම, මම දීර්ඝ දේශනා වර්ණනා නොකරමි. මිනිසුන්ට අවධානය යොමු කිරීමට නොහැකි තරම් කාලයක් කථා කිරීමේ යහපතක් නැත. ඇතැම් දේශකවරුන්ට තවත් අයට වඩා වැඩියෙන් අවධානය ලබා ගැනීමේ හැකියාව ඇත. එහෙත් ඉතාම හොඳ කෙනාට පවා සියයට සියයක්ම එසේ කළ නොහැකිය. කෙසේ වෙතත් කථිකයින් දෙවියන් වහන්සේගේ වචනය පැහැදිලි කිරීම, එහි ඇති සුවිශේෂ දෙයක් පැහැදිලි කිරීම, එය ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇති ඇදහිල්ලට අදාළ වන්නේ කෙසේදැයි පෙන්වීම, එය ජීවිතයේ සහ මරණයේ ප්‍රායෝගික කාරණාවලට අදාළ වන්නේ කෙසේද සහ එය දෙවියන් වහන්සේ කළ කී දේවලට පදනම් වන්නේ කෙසේද යන්න දැක්වීම ඔවුන්ට හැකි උසස්ම අන්දමින් කළ යුතුය. එයට කාලයක් ගත වේ. එසේම එයට සවන් දෙන්නන් සහ කථිකයාගෙන් යම් ක්‍රියාවන් ද අවශ්‍ය වේ.

දේශනාවක් කොපමණ වේලාවක් තිබිය යුතු ද? හොඳ කාලයක් වන්නේ විශේෂ අවස්ථාවල නම්‍යතාවයෙන් යුතුව සාමාන්‍යයෙන් මිනිත්තු 30 - 45 අතර කාලයයි. ඇතැම් කථිකයෝ දීමනා අඩු අය වන අතර, සාමාජිකයින්ට සාක්ෂි දැරීමට, ප්‍රබෝධමත් කථා සහ කතාන්දර හෝ දේශනා මාතෘකාවට අදාළ වන තේමාවක් යටතේ ආත්මික දර්ශනයක් කීමට කාලයක් දෙමින්, ඔවුහු කෙටි දේශනා පවත්වන්නේ නම් වැඩි බලපෑමක් කරන අය වෙති. එය රැඳී ඇත්තේ මිනිසුන් සතිය තුළ කොපමණ ආත්මික පෝෂණයක් ලබා ගන්නවාද යන්න මතය. යාච්ඤාවෙන්, බයිබල් අධ්‍යයනයෙන් සහ කුඩා කණ්ඩායම් සහභාගිත්වයෙන් ඔවුහු තමන්වම දෙවියන් වහන්සේගේ උපදේශවලට විවෘත කරන්නෝද? වැඩිපුර බයිබල් අධ්‍යයනයන් කරන මිනිසුන්ම දේශනා ඇසීමට වඩා උනන්දු වන බව ඇතැම් විට දකින්නට ඇත්තේය. ඔවුන්ට දෙවියන් වහන්සේ උදෙසා පිපාසයක් ඇත්තේය. අවසාන වශයෙන් අපගේ ජීවිතවල සහ අපගේ අනාගතයේ ඉතාම වැදගත් දේ ක්‍රිස්තුන් වහන්සේ වන සේක.

සෑම ධර්ම නියාමකයක්ම එක සේ වැදගත් නොවන නමුත්, ධර්ම නියාමක වැදගත් බව මට ප්‍රත්‍යක්ෂය. සමහර මිනිසුන්ට ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය මෙන්ම භූමිකම්පා ද වැදගත් වන බව පෙනේ. ඇතැම් විට එය වර්තමාන ජීවිතයට වඩා අදාළ වන බව පෙනේ. එහෙත් සත්‍ය වශයෙන්ම, සෑම විටම, අප භූමිකම්පාවක් මධ්‍යයේ සිටින විට පවා යේසුන් වහන්සේගේ උත්ථානය අපට ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම මරණය ඇත්ත වශයෙන්ම සිදු විය හැකි දෙයක් වන නිසා උත්ථානය පිළිබඳ ධර්ම නියාමකය සෑම විටම අදාළ වන්නේය! සෑම දේශනාව සහ බයිබල් අධ්‍යයන උපදේශයක්ම යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළ මුල් ඇද තිබීම වැදගත් වේ.

**දුර්මත ප්‍රතික්ෂේප කරන්නේ කෙසේ ද?**

තීරණාත්මක ඉගැන්වීම් අඩු වැදගත්කමක් සහිත අදහස්වලින් වෙන් කර හඳුනාගැනීම පිණිස කිතුනුවන්ට ශක්තිමත් ධර්ම නියාමක අත්තිවාරමක් අවශ්‍ය වේ. ඇතැම් කිතුනුවන් ධර්ම නියාමක පසුබිමේ අඩුව නිසාවෙන් නව යුගයේ ඉගැන්වීම් හෝ අර්ධ කිතුනු ලබ්ධි ඉගැන්වීම්වලින් ආකර්ෂණය කර ගනු ලබති. අපි ධර්ම නියාමක ඉගැන්වීම අවශ්‍ය වේ. මන්ද මහත් උනන්දුවෙන් සහ සහතික බවකින් යුතුව උගන්වනු ලබන දුර්මතවලට විරුද්ධ වීමට හැකි ආරක්ෂාව මිනිසුන්ට ලබා දෙන්නේ ධර්ම නියාමක පමණි.

මුල් සභාවට ධර්ම නියාමක පිළිබඳ විශාල අවශ්‍යතාවක් තිබිණි. නව ගිවිසුම යේසුන් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ තොරතුරු සහ උන් වහන්සේ අප ජීවිත තුළ සිදු කරන වෙනස සහිතව ධර්ම නියාමකවලින් පිරී ඇත. එහෙත් සෑම බයිබලීය ඉගැන්වීමක්ම එක සමාන

වැදගත්කමෙන් යුතු නොවේ. නිදසුනක් ලෙස, අපෝස්තුළුවරුන් 12 දෙනෙක් සිටි බවට වන ඉගැන්වීම යේසුන් වහන්සේ මළවුන්ගෙන් නැගිටි බවට වන ඉගැන්වීම තරම් වැදගත් නැත.

**ප්‍රධාන විශ්වාසයන්**

මුල් සභාව නව ඇදහිලිවතුන් දැනගත යුතු සහ පිළිගැනීම වැදගත් යයි සිතූ ධර්ම නියාමක සුළු ගණනක් වර්ධනය කළහ. විවිධ කලාපීය සභාවන්වල සුළු වශයෙන් වෙනස් වූ ලැයිස්තු තිබේ. එසේම කාලයක් ගත වන විට මෙම ලැයිස්තු වඩාත් ප්‍රමිතියකට පත් විය. වර්තමානයේ ඒවා පිළිගත් ධර්ම ලෙස හැඳින්වේ. එය "මම විශ්වාස කරමි" යන ලතින් වචනයෙන් බිඳී ආවකි. මෙම ධර්ම සරල විශ්වාස ප්‍රකාශනයන් විය.

අපගේ ධර්ම නියාමක කණ්ඩායමේ බොහෝ සාකච්ඡා කරණකොටගෙන වර්ධනය වූ විශ්වාස භාෂිතයක් අපගේ සභාවට ද ඇත. මෙය මූලික ධර්ම නියාමකවල ලැයිස්තුවක් සපයයි. එයට සියල්ලම ඇතුළත් නොවේ. එහෙත් කිතුනු ඇදහිල්ලට *අත්‍යාවශ්‍ය* කාරණා ලැයිස්තුවකට වඩා අපගේ විශ්වාස භාෂිතය දිගය. එම නිසා ධර්ම නියාමක කණ්ඩායම වැදගත් විශ්වාසයන් දහයක් සහිත කෙටි ලැයිස්තුවක් සකස් කර තිබේ. එයට අපි ධර්ම නියාමක සාරාංශය යයි කියමු. ප්‍රධාන ධර්ම නියාමක මේවාය. මේවා දේශනා මාලාවක් සඳහා පිළියෙළ කළ හැකිය. එසේම ස්ථිර ධර්ම නියාමක පදනමක් ලබා දෙන්නේය. ධර්ම නියාමක සාරාංශය මෙසේය :

- එකම ශුද්ධ, ප්‍රේමවන්ත, සර්ව බලධාරී සහ කරුණාවන්ත මැවුම්කාර දෙවියන් වහන්සේ පියාණන්, පුත්‍රයාණන් සහ ශුද්ධාත්මයාණන් යන පුද්ගලභාවයන් තුනක වැඩවසන සේක.
- බයිබලය ආනුභාවයෙන් යුත් සහ නොවරදින සුලු දෙවියන් වහන්සේගේ වචනය වේ. එය ඇදහිල්ල සහ භාවිතය පිළිබඳ සම්පූර්ණ අධිකාරයෙන් යුක්ත වේ.
- කන්‍යා මරියතුමියගෙන් උපන් යේසුන් ක්‍රිස්තුන්වහන්සේ සම්පූර්ණ දෙවියන් වහන්සේ සහ සම්පූර්ණ මනුෂ්‍යයෙක් වන අතර, උන් වහන්සේ ස්වාමින් වහන්සේ සහ ගැළවුම්කරුවාණන් වන සේක.
- යේසුන් ක්‍රිස්තුන් වහන්සේ මනුෂ්‍යයාගේ පාපය උදෙසා කුරුසියේ දුක් විඳ මැරුණු සේක. තුන්වනදා ශරීරාකාරයෙන් නැගුටුවනු ලැබූ සේක. උන් වහන්සේ ස්වර්ගයට ඔසවාගනු ලැබ දෙවියන් වහන්සේගේ දකුණුපස වැඩහිඳගත් සේක.
- යේසුන් ක්‍රිස්තුන් වහන්සේ ජීවත් වන අය සහ මළවුන් විනිශ්චය කරන පිණිසත්, සියල්ල කෙරෙහි රජකම් කරන පිණිසත් නැවත වඩින සේක.
- ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ පව්කරුවන් පසුතැවිලි වන පිණිස ගෙනෙන අතර, ඇදහිලිවන්තයින්ට සදාකාල ජීවනය ලබා දෙමින්, ඔවුන් තුළ ජීවත් වෙමින් ඔවුන් යේසුන් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වරූපයට වෙනස් කෙරේ.
- ඇදහිලිවන්තයින් සහභාගිකම් පැවැත්වීම සඳහා නිතර රැස්විය යුතු අතර, සුබ අස්නට සාක්ෂි වන පිණිසත්, යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළ විශ්වාසය තබමින් මනුෂ්‍යයින් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වන පිණිස ඇදහිල්ලේ ජීවිත ගත කළ යුතු ය.
- සියලු ඇදහිලිවන්තයින්ගේ ආත්මික එක්සිත් බව ඇත්තේ අපගේ ස්වාමින් වන යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළය.
- ගැළවීම පැමිණෙන්ගේ ක්‍රියාවලින් නොව, යේසුන් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇදහිල්ල කරණකොටගෙගන දෙවියන් වහන්සේගේ අනුග්‍රහයෙන් පමණි.

- පැමිණෙන්නට තිබෙන ලෝකයේ දී මළවුන් නැගිටුවනු ඇත

යනුවෙන් අපි විශ්වාස කරමු.

මිත්‍රවරුනි, මෙම ධර්ම නියාමකයන් කෙදිනකවත් නිරස බවට පත් වන්නේවත්, කෙදිනකවත් අදාළ නොවන බවට පත් වන්නේවත් නැති බව මම අපේක්ෂා කරමි. මනුෂ්‍ය කථකයන් වන අපි ඇතැම් විට ඒවා නීරස හෝ අදාළ නොවන බවට පත් කිරීමට ඉඩ ඇත. එහෙත් ධර්ම නියාමක අපි සියල්ලන්ටම ඉතා වැදගත් වේ. මේවා කෙටි සහ ආනුභා සම්පන්න ධර්ම නියාමක වේ. අපගේ ගුරුවරයාණන් වන යේසුන් වහන්සේ අනුගමනය කරන කල, නැවත නැවතත් දෙවියන් වහන්සේ උන් වහන්සේගේ සත්‍ය වූ වටිනා ඉගැන්වීම් ලබා දී ඇති බැවින් ස්තුතිවන්ත වෙමි.

# ගෝලත්වය 101

# ඒකකය 9 ඇ



***"ඔබ ශුද්ධ ලියවිලිවලට කැපවෙන්න"***

කිතුනු ධර්ම නියාමකවලින් ඉතා වැදගත් එකක් වන්නේ ශුද්ධ ලියවිලිවල අධිකාරයයි. අපි උගන්වන්නා වූ දේවල පදනම වන්නේ ශුද්ධ ලියවිල්ලයි.

ඇදහිල්ල කිතු දහමෙහි වැදගත් අංගයකි. එසේම අත්‍යාවශ්‍ය අංගයකි. එහෙත් හුදෙක් ඕනෑම ඇදහිල්ලක් මෙන් කරන්නා වූ දෙය මත නොව, අපගේ ඇදහිල්ල සත්‍ය වූ දෙයක් තුළ තිබිය යුතු වේ. ඇදහිල්ල වැරදි බලාපොරොත්තුවක් නොවිය යුතු වේ. එය සාක්ෂි මත පදනම් වූවක් විය යුතුය. එවැනි සාක්ෂිවලට ඉගැන්වීම අවශ්‍ය වන්නේය. යේසුන් වහන්සේ ස්ථාපිත කළ සභාව වනාහි ඉගැන්වීමේ සභාවක් විය යුතුය, උන් වහන්සේගේ සෙනඟ ඉගෙනගන්නා සෙනඟක් විය යුතුය. ("ගෝලයා" යන පදයෙහි අර්ථය "ඉගෙනගන්නා තැනැත්තා" යනුය.)

ගැළවුම්කරුවාණන් තුළ විශ්වාස කරන මිනිස්සු උන් වහන්සේ පිළිබඳ වැඩිදුර ඉගෙන ගැනීමට උනන්දු වෙති. ඔවුහු දෙවියන් වහන්සේ පිළිබඳ වූ හැඟීමකට පමණක් පිපාසයක් නොදක්වති. එහෙත් කරුණු සහිත වූ දැනගැනීමක් උදෙසා ද උනන්දු වෙති. ඔවුන්ට ඉගෙන ගැනීමට අවශ්‍ය වේ. ධර්ම නියාමක ඉතා වැදගත්ය. නව ගිවිසුම එය පැහැදිලි කරන්නේය. යේසුන් වහන්සේ සභාවට *ඉගැන්වීමට* කී සේක. අපෝස්තුළුවරු ඉගැන්වීමට වැඩි ප්‍රමුඛතාවයක් දුන් බව ක්‍රියා පොත අපට පවසයි. ඉගැන්වීම වැදගත් බව පාවුල්තුමා යළි යළිත් ලිවේය. ඉගැන්වීම වනාහි අපගේ කාර්යයෙහි ඉතා වැදගත් කොටසකි.

**වචනයේ සේවයේ වැදගත්කම**

යේසුන් වහන්සේ ස්වර්ගයට ඔසවාගනු ලැබීමෙන් පසුව, ශුද්ධාත්මයාණන් වහන්සේ ගෝලයින් පූර්ණ කළ අතර, සභාව දහස් ගණනින් වර්ධනය වීම ආරම්භ විය. මනුෂ්‍යයින් කළේ කුමක්ද? "ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද, සහභාගිකමෙහි ද, රොටි කැඩීමෙහි ද, යාච්ඤාවෙහි ද නිරතව කල් ගත කළහ" (ක්‍රියා 2:42).

මෙහිදී අනියම් අවශ්‍යතාවයන් ද විය. මන්ද ඇතැම් මිනිසුන් පෙන්තකොස්ත මංගල්‍යය සඳහා යෙරුසලමට පැමිණ සිටි අතර, ඔවුන් බලාපොරොත්තු වූ කාලයට වැඩියෙන් එහි ගත කර තිබිණි. මිනිසුන් මෙම අනපේක්ෂිත අවශ්‍යතාවයට කෙසේ ප්‍රතිචාර දැක්වීද? "ඔවුහු තමන්ගේ ඉඩකඩම් හා දේපළ විකුණා එකිනෙකාගේ වුවමනාවේ හැටියට සියලු දෙනා අතර බෙදාගත්හ" (45 පදය).

එය කුමනාකාර අන්දමේ දෙයක්දැයි අපට සිතාගැනීමට හැකිද? නව නායකයින්, නව අනුගාමිකයින් සහ නව සැලැස්මකින් යුත් නව ප්‍රජාවක් ඇති විය. පැරණි සාමාජීය ක්‍රමය පැරණි මුද්‍රක බඳුනක් මෙන්, මෙම මනුෂ්‍යයින්ගේ අවශ්‍යතාවන් සැපයුවේ නැත. බොහෝ අය තම පවුල්වලින් සහ තමාට සිටි මිතුරන් වෙතින් නෙරපන ලදහ. එම නිසා අලුත් බැඳීම් ඇති කරගත යුතු විය. පළමුව, සැම දෙනාගේම අවශ්‍යතාවන් අනියම් ලෙස සලකා බලනු ලැබිය. එහෙත් ක්‍රම ක්‍රමයෙන් අවශ්‍යතා සපුරාලන ක්‍රමයක් ඇති කරනු ලැබිය. අවශ්‍යතා ඇති අය අතර බෙදා දෙන පිණිස අපෝස්තුළුවරුන්ට ආධාර දෙනු ලැබිණි (ක්‍රියා 4:34-35).

මෙම දයාවේ සේවයේ වැදගත් වුවද, අපෝස්තුළුවරු සැම විටම මෙම දේවල නිරතව නොසිටියහ. ඔවුහු ඉගැන්වීම සඳහා වූ ඔවුන්ගේ කාර්යට නොකඩව අවධානය යොමු කළහ. "තවද ඔවුහු දිනපතාම දේව මාලිගාවේද ගෙදරක් ගෙදරක් පාසා දඉගැන්වීමෙහිත් යේසුන් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ සුබ අස්න දේශනා කිරීමෙහිත් නිරත වූහ" (ක්‍රියා 5:42).

දිළිඳුන් සැලකීම සම්බන්ධ වගකීම ගෝලයින් විසින් අනෙක් ඇදහිලිවතුන්ට පවරා දෙනු ලැබූ බව පෙනේ. කෙසේ වෙතත්, වැඩිකලක් යාමට මත්තෙන් මිනිස්සු පැමිණිලි කරන්නට පටන් ගත්හ. මෙම ක්‍රමය සාධාරණ ලෙස ඉටු නොවන බව ඔවුහු පැවසූහ (ක්‍රියා 6:1). අපි අපෝස්තුළුවරුන්ව සිටියා නම්, එම දේවල් නිවැරදිව ඉටු වනවාද යන්න සොයා බලා සිදු කිරීමේ පරීක්ෂාවට අසු වනු නිසැකය. එහෙත් දොළොස්දෙනා එම පරීක්ෂාව ප්‍රතික්ෂේප කළහ. ඔවුහු ගිහි සාමාජිකයින්ට මෙම අවශ්‍යතාව ගැන සලකා බැලීමට ඉඩ හැරියෝය.

මෙම වැදගත් අවශ්‍යතාව අපෝස්තුළුවරුන් ඉටු නොකළේ මන්ද? "අප දෙවි දහම දේශනා කිරීම අතපසු කොට සහනාධාර කටයුතුවල යෙදී සිටීම කිසිසේත් සුදුසු නැත. එබැවින් සහෝදරයෙනි, මේ තනතුරට පත් කරන පිණිස යහපත් යයි පිළිගත්, එසේම ශුද්ධාත්මයෙන් ද, ප්‍රඥාවෙන් ද පූර්ණ සත්දෙනෙකු ඔබ අතරෙන් තෝරාගන්න. ඉන්පසු අපි යාච්ඥාවෙහි ද, ධර්ම දේශනාවෙහි ද නියුක්තව සිටිමු" (2-4 පද).

මෙම ආත්මික නායකයින් විසින් ප්‍රමුඛතාවන් පිළියෙළ කළ ආකාරය බලන්න: යාච්ඥාව, ඉගැන්වීම සහ දේශනා කිරීම. මෙම ප්‍රමුඛතාවන් තවමත් එසේම පවතී. යාච්ඥාව සහ දෙවියන් වහන්සේගේ වචනයෙන් ඉවත් වීමට සලස්වන දේවලින් ආත්මික නායකයින් පසුබට නොවිය යුතු වේ. සභාවේ අපගේ මූලික භූමිකාව වන්නේ ඉගැන්වීම සහ දේශනා කිරීම වේ. එසේම ස්ථිර යාච්ඥාවේ සහ අධ්‍යයනයේ පදනමකින් තොරව අපට මෙය කළ නොහැකි වේ.

කිරීමට වඩා කීම ඉතා පහසු වේ. බොහෝ සභා පාලකවරු කිසිසේත් අවසන් නොවන අවශ්‍යතාවන් උදෙසා තම කාලය මිඩංගු කරනු දැකිය හැකිය. බොහෝ විට මේවා නීතිමය අවශ්‍යතාවන් වන අතර, ඒ සැම එකක්ම කාලය වැය වන දෙයකි. එහෙත් ඒවා සියල්ලම එකට එක් කළ විට ඒවා පාලනය කළ නොහැකි කරදරයක් බවට පත් වේ. තමා වෙතට එන සියලුම දෙනාට උපකාර කිරීමට සභා පාලකවරුන් කැමති වන තරමට, ඔවුන් විසින් තම කාලය ප්‍රමුඛතාවන්ට අනුව සකස් කළ යුතු වන අතර, අපෝස්තුළුවරු කළාක් මෙන් ද්විතික අවශ්‍යතාවන් බෙදා දීම අවශ්‍ය වේ (ක්‍රියා 6). ප්‍රමුඛතා ලැයිස්තුවේ ඉහළම ඇත්තේ යාච්ඥාව සහ වචනයේ සේවය වේ.

මෙහිදී "වචනයේ සේවයේ වැදගත්කම" පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමට කැමැත්තෙමි. මෙම වාක්‍ය ඛණ්ඩය ශුද්ධ ලියවිලි උනන්දුවෙන් අධ්‍යයනය කිරීම, පණිවුඩය පිළිබඳ හොඳින් සිතා බැලීම, ක්‍රමානුකූල ඉගැන්වීම සහ දේශනා කිරීම යනාදිය සංක්ෂිප්ත කර දක්වයි.

**ඉගැන්වීම සහ දේශනා කිරීම**

ශුද්ධ ලියවිල්ල ධර්ම නියාමක, ඉගැන්වීම, සත්‍යය ආදියේ වැදගත්කම අවධාරණය කරයි. සභාවට දුන් යේසුන් වහන්සේගේ නියෝගයට ඉගැන්වීම ද ඇතුළත් වේ (මතෙව් 28:20). "ඉගැන්වීම" යේසුන් වහන්සේගේ සේවයෙහි විශාල කොටසක් වූ බව සමපද අකාරාදියක් ඉතා ඉක්මනින් පෙන්නුම් කරයි. එය මනුෂ්‍යයින් නිදහස් කරන සත්‍යය වන්නේය. එසේම සත්‍යය ඉගැන්වීම අවශ්‍ය වේ. යහපත් හැඟීම් සහ හොඳ වචන පමණක් ප්‍රමාණවත් නොවේ.

මුල් සභාවේ අපෝස්තුළුවරු දේශනා කිරීම සහ ඉගැන්වීම සිදු කළහ :

- "ඔවුන් සෙනඟට අනුශාසනා කළ නිසාද, යේසුන් වහන්සේගේ උත්ථානය මඟින් පුනරුජ්ජීවනය ඇති වන බව ප්‍රකාශ කළ නිසා ..." (ක්‍රියා 4:2).
- "ඔවුහු ඒ අසා අලුයම දේව මාලිගාවට පිවිස ඉගැන්වූහ" (ක්‍රියා 5-21).
- "ඔවුහු දිනපතාම ... ඉගැන්වීමෙහිත් යේසුන් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ සුබ අස්න දේශනා කිරීමෙහිත් නිරත වූහ" (42 පදය).
- "බාර්ණබස් සහ සාවුල් අවුරුද්දක් මුළුල්ලෙහිම සභාව හා එක් රැස්ව මහත් සමූහයකට ඉගැන්වූහ" (ක්‍රියා 11:26).
- "පාවුලු ද බාර්ණබස් ද තවත් බොහෝ ස්වාමින් වහන්සේගේ සුබ අස්න උගන්වමින් ද දේශනා කරමින්ද අන්තියෝකියෙහි නැවතී සිටියහ" (ක්‍රියා 15:35).
- "ඔහු දෙවියන් වහන්සේගේ වචනය ඔවුන් අතර උගන්වමින් එක් අවුරුදු සමසක් එහි වාසය කළේය" (ක්‍රියා 18:11).
- "ඔබට වැඩදායක වූ කිසිවක් කීමෙන් නොවැළකී ප්‍රසිද්ධියේ ද ගෙයින් ගෙට යමින් ද ඔබට උගන්වමින් ..." (ක්‍රියා 20:20).
- "දෙවියන් වහන්සේගේ රාජ්‍යය දේශනා කරමින් ස්වාමින් වන යේසුන් ක්‍රිස්තුන් වහන්සේ ගැන අනුශාසනා කළේය" (ක්‍රියා 28:31).

**අපෝස්තුළු පාවුල්තුමා**

පාවුල්තුමා ගුරුවරයෙක් ලෙස තමා හඳුන්වා ගත්තේය (1 තිමෝති 2:7, 2 තිමෝති 1:11). ඔහු තමාගේ සියලුම සභාවන්වල ඉගැන්විය (1 කොරින්ති 4:17), එසේම ශුද්ධාත්මයාණන් වහන්සේ ද බොහෝ සභාවන්වලට ලිවීමට ඔහු පෙළඹවූ සේක. ඔහුගේ ලිපි පුරාම ඔහු ශුභාරංචිය පිළිබඳ උගන්වයි. මුල් සභාව ඉගැන්වීම මත ගොඩනැගුණු බවටත්, ඉගැන්වීමේ නිමග්න වූ බවටත් ඔහුගේ ලිපි නිදසුන් වේ. මෙම ලිපි සභාවන්වල කියවනු ලැබූ අතර, ඒවා ඇදහිල්ල සහ භාවිතය පිළිබඳ පදනම විය.

"ස්ථිරව සිට අපගේ දේශනා කිරීමෙන් හෝ අපගේ හසුනින් හෝ අප ඔබට ඉගැන්වූ සත්‍යයන් හොඳින් සිතට ගන්න" (2 තෙසලෝනික 2:15) යයි පාවුල්තුමා තෙසලෝනිකවරුන්ගෙන් උදක්ම ඉල්ලීය. ඔහු "සැබවින්ම ඔබ ඇසුවා පමණක් නොව, කිතුනුවන් වශයෙන් උන් වහන්සේ තුළ වූ සත්‍යය ද ඔබට උගන්වන ලදී" (එපීස 4:21) යනුවෙන් එපීසවරුන්ට කීවේය. කොලොස්සිවරුන්ට "අප ප්‍රකාශ කරන්නේ ඒ ක්‍රිස්තුන් වහන්සේය. ...සියලු දෙනාට දැනමුතුකම් දෙමින් සියලු ආකාර ප්‍රඥාවෙන් අනුශාසනා කරමු...

එබැවින් උන් වහන්සේ හා ඒකාබද්ධ වී ජීවත් වන්න... ක්‍රිස්තුන් වහන්සේගේ දහම් පණිවුඩය ඔබ තුළ සියලු ප්‍රඥාවෙන් සමෘද්ධව පවතිවා" (1:28, 2:6-7, 3:16) යයි කීවේය.

පාවුල්තුමා කොරින්තිවරුන්ට ඔවුන්ගේනමස්කාර මෙහෙයන්වල කරන සියල්ල ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය වර්ධනය කිරීම නැතහොත් ගොඩනැගීම පිණිස කළ යුතු බව පැවසීය (1 කොරින්ති 14: 26). කුමන ශුද්ධාත්ම දීමනාවක් භාවිත වුව ද, එය වර්ධනය උදෙසා භාවිත විය යුතු වේ. ප්‍රමුඛතාව වන්නේ වර්ධනය කිරීම වේ. අපි කතා කරන එකම වචන විය යුත්තේ "අසන්නන්ට ශුභ සිද්ධ වන විධියේ අවස්ථාවොචිත මනහර වචන" වේ (එපීස 4:29).

පාවුල්තුමා කළ සියලු දේ ඔහු කළේ වර්ධනය කිරීමේ අරමුණෙනි (2 කොරින්ති 12:19). "එබැවින් අපි සාමය උපදවන පොදු ජන ශුභ සිද්ධිය සලසන දෙය අනුගමනය කරමු" (රෝම 14:19). "එකිනෙකාට ධෛර්ය දෙන්න. එකිනෙකා ශක්තිමත් කරන්න" (1 තෙසලෝනික 5:11). මෙය වර්තමානයේ අපගේ කාර්යයේ වැදගත් කොටසක් ලෙස නොකඩව සිදු කළ යුතුය. අපගේ සාමාජිකයින්ට ඉගැන්වීම සඳහා අපට දෙවියන් වහන්සේ විසින් දෙන ලද වගකීමක් ඇත.

**සභාපාලක යැවුම්පත්‍ර**

පාවුල්තුමා ශුභාරංචිය දේශනා කිරීමෙන් සභාවන් ගොඩනැගීමෙන් ධර්ම නියාමක වැරදි නිවැරදි කිරීමෙන් සහ සහායකවරුන් පුහුණු කිරීමෙන් පසුව, ඔහු නායකත්වය අනෙක් අයට පවරා දුන්නේය. ඔහුගේ ජීවිතයේ අවසානය ළඟා වූ කල, ඔහු ඊ ළඟ පරම්පරාවේ සභා නායකයින්ට උපදෙස් දුන්නේය. තිමෝතිට සහ තීතස්ට යැවූ හසුන්වල සභා පාලකවරුන්ට වැදගත් වගකීමක් ඇති බව ඔහු අපට ද පවසයි:

- "මා එනතුරු ප්‍රසිද්ධියේ ශුද්ධ ලියවිලි කියවීමට ද, අනුශාසනා කිරීමට ද, ඉගැන්වීමට ද අවධානය යොමු කරන්න" (1 තිමෝති 4:13).
- "ඔබ ගැනත් ඔබේ ඉගැන්වීම් ගැනත් සැලකිලිමත් වන්න. මේ දේවල නිරතව සිටින්න. ඔබ මෙසේ කිරීමෙන් ඔබ ද ඔබට සවන් දෙන්නන් ද ගළවා ගන්නෙහි ය" (16 පදය).
- "ඔබේ ඉගැන්වීම්වල දී මේ කාරණා තරයේ කියන්න" (1 තිමෝති 6:2).
- "බොහෝ සාක්ෂිකරුවන් ඉදිරියෙහි ඔබ මාගෙන් අසා දැනගත් දේ අන්‍යයන්ට ඉගැන්වීමට හැකි විශ්වාසවන්ත පුද්ගලයන්ට භාර දෙන්න" (2 තිමෝති 2:2).
- "දේවානුභාවයෙන් යුත් මුළු ශුද්ධ ලියවිල්ල ඉගැන්වීමට ද, දුර්මත දුරු කිරීමට ද, හික්මවීමට ද, ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම පිණිස උපදෙස් දීමට ද ප්‍රයෝජනවත් වෙයි" (2 තිමෝති 3:16).
- "දේව වචනය දේශනා කරන්න. කලටත් අකලටත් එහි නිරතව සිටින්න. ඉවසිලිවන්තව උගන්වමින් සත්‍යය පහදා දෙන්න. තරවටු කරන්න. දිරි ගන්වන්න. මන්ද සාර ධර්මය නොතකා තමන් රිසි රිසි දෙය ඇසීමේ ආශාවෙන් ගුරුවරුන් රැස් කරගන්නා කාලයක් පැමිණෙන්නේය" (2 තිමෝති 4:2-3).
- "තවද ඔහු සාර ධර්මයෙන් අවවාද කරන්නට ද විරුද්ධවාදීන් නිහඬ කරන්නට ද සමත් වන පිණිස ධර්මානුකූල ඇදහිල්ලෙහි ස්ථිරව පිහිටා සිටින තැනැත්තෙකු විය යුතුය" (තීතස් 1:9).

- “ඔබ නම් නිවැරදි ධර්මයට අනුකූල දේ ඉගැන්විය යුතුය” (තීතස් 2:1).

පැහැදිලිවම ධර්ම නියාමක සභාවෙහි වැදගත් දෙයකි. අපට කාර්යක්ෂම සහ නිරවද්‍ය ලෙස ශුද්ධ ලියවිලි අධ්‍යයනය මත පදනම් වූ ස්ථිර ඉගැන්වීම් අවශ්‍ය වේ. අපට කිසිවෙකුගේ සුළු කරන න්‍යායන් අවශ්‍ය නැත. ඒ වෙනුවට වෙනත් විශ්වාසවන්ත කිතුනුවන් විසින් එම අදහස්වලට විරුද්ධව පරීක්ෂා කර ඇති ඒවා අවශ්‍ය වේ.

ස්ථිර ඉගැන්වීම් අපට සැම විටම යහපත් හැඟීම් ගෙන දෙන්නේ නැත. ස්ථිර ඉගැන්වීම් ඇතැම් විට අපගේ සුවපහසු කලාපයන්ට අභියෝග කරන්නේය. අපට ඇතැම් විට අවශ්‍ය වන්නේ එය වේ.

**වැඩ කිරීම අවශ්‍ය වේ**

කිසියම් ස්ත්‍රියෙකු හෝ පුරුෂයෙකු නිවැරදි යයි තමන් එකඟ නොවන්නා වූ දේ ප්‍රකාශ කිරීම, එම නිසාම ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම නොමැතිව තමාගේම වචනය අවසාන වචනය ලෙස ගැනීම මුරණ්ඩු මෙන්ම භයානක දෙයක් ද වේ. නැත. අපි ශුද්ධ ලියවිල්ලට ප්‍රවේශ වන කල, වර්තමාන ඇදහිලිවන්ත ප්‍රජාව සහ ඓතිහාසික කිතුනු සභාව ඒ දේ භාරගත් ලෙස සන්දර්භයට අනුව ගැනීම ප්‍රයෝජනවත් වන්නේය. අපි අනෙක් අය අපෙන් ඉගෙන ගැනීම අපේක්ෂා කරන ලෙසම, අනෙක් අය ඔවුන්ගේ කිතුනු අත්දැකීම්වලින් සහ ශුද්ධ ලියවිලි පිළිබඳ සාකච්ඡාවලින් ඉගැන්වූ දෙයින් ද අපටද ඉගෙන ගැනීමට පුළුවන.

බොහෝ විට, එක් කණ්ඩායමක් හෝ ගුරුකුලයක් වෙනත් කණ්ඩායමක් හෝ ගුරුකුලයක් විසින් නොදක්නා ලද දෙයක් පිළිබඳ වැරදි හඳුනාගත හැකිය. එම නිසා, අවධානයෙන් බලන විට අපට අන් අයගෙන් උගත හැකිය. සමහර අවස්ථාවන්වල දී අපට වැඩිදුර සමීක්ෂණයක් අවශ්‍ය අංග පිළිබඳ පෙන්වාදීම ඔවුන්ට කළ හැකිය. අපි අන් අය කියන දේ අන්ධ බවින් යුතුව පිළිගන්නා බව ඉන් අදහස් නොවේ. අපට එය කිරීම අවශ්‍ය නම්, එය අපහසු දෙයක් බව පෙනේ. මන්ද ඇතැම් අදහස් පිළිබඳ සමහරු විරුද්ධ වෙති. අපට ඒ සියල්ල විශ්වාස කළ නොහැකිය.

එසේ නම් සත්‍යය පිළිබඳ ප්‍රමිතිය කුමක් ද? එය ශුද්ධ ලියවිල්ලයි. අපගේ අත්තිවාරම ශුද්ධ ලියවිල්ල මත ශක්තිමත් කරගැනීම අත්‍යාවශ්‍ය වන්නේ ඒ නිසාය.

වචනයේ සේවයට වැඩ කිරීම ද අවශ්‍ය වේ. එයට කාලය අවශ්‍ය වේ. සභා පාලකවරු සැලකිය යුතු තරම් කාලයක් අධ්‍යයනය කිරීමෙන් ද, සමීක්ෂණය කිරීමෙන් ද, සවිමත් අත්තිවාරමක් මත පදනම් වූ දේශනා සූදානම් කිරීමෙන් ස ගත කිරීම අවශ්‍ය වේ. බොහෝ විට මෙම කාර්යන් දක්නට නැත. එහෙත් එය අත්‍යවශ්‍ය වේ. අපට පුස්තකාලයක් තිබිය යුතුය. එහෙත් අපි දේශනා කරන කල පුස්තකාලය එහි රැගෙන නොපැමිණෙන්නෙමු. එහෙත් අපි සොයාගත් කරුණු සියල්ල උපුටා දක්වන්නේ නැත. අපි පරීක්ෂා කළ සියලුම ග්‍රීක් වදන් උපුටා දක්වන්නේ නැත. අප ශුද්ධ ලියවිල්ලේ පණිවුඩය තේරුම් ගැනීමට, එය වර්තමාන ජීවිතයට අදාල වන ආකාරය දැක්වීමට, එය රසවත් ලෙස ඉදිරිපත් කිරීමට කාලය ගැනීම අවශ්‍ය වේ.

සභා පාලකවරයෙක් ක්‍රියාශීලි විය යුතු අතර, “හොඳින් පළපුරුදු ලෙස” තමාගේ අධ්‍යයනය, විමර්ශන කටයුතු සහ වෙනත් සම්පත් පිළියෙළ කිරීම අවශ්‍ය වේ. එසේම ඔහු තමා සේවය

කරන අය ජීවත් වන සහ වැඩ කරන වෙළඳසලේදී ක්‍රියාශීලීව සහ "පළපුරුදු ලෙස" සිටිය යුතු වේ. ඔහුගේ භූමිකාව වන්නේ දෙදෙනෙකු අතර ඇති හිඩැසෙහි පාලමක් තැනීම - ශුභාරංචිය පරිවර්තනය කොට පැහැදිලි ලෙස සහ රසවත්, බලපෑමක් වන ලෙසින් පැවසීම වේ.

සාමාජිකයින්ට ඉගැන්වීම උදෙසා වගකීමක් සභා පාලකවරුන්ට ඇත. එසේම සභාවේ සාමාජිකයින්ට ඉගෙන ගැනීමට වගකීමක් ඇත. අපි යාච්ඤා කිරීමට සහ අධ්‍යයනය කිරීමට, දේශනා කිරීමට සහ ඉගැන්වීමට කැප වෙමු.

**බයිබල් අධ්‍යයනය උදෙසා වූ සරල නීති පහක්**

බයිබලය සංකීර්ණ පොතකි. එහෙත් එහි ඇත්තේ සරල පණිවුඩයකි. පිවිතය පුරාවටම විස්තරාත්මකව අධ්‍යයනය කිරීම සඳහා එහි ප්‍රඥාව ඇත්තේය. එසේම ආධුනිකයින්ට පහසුවෙන්ම සොයාගත හැකි ප්‍රඥාව එහි ඇත්තේය. නිවැරදි ආකාරයෙන් ආරම්භ කිරීම සඳහා ප්‍රාථමික නීති කිහිපයක් මෙහි ඇත.

ඔබ කිසි විටකත් පිටු 1,000ක් ඇති පොතක් කියවා නැති නම්, බයිබලය කියවීම අමාරු මෙන්ම එයට ප්‍රවේශ වීම අපහසු බව පෙනෙන්නට පුළුවන. අමුතු නම් සහ අමුතු චාරිත්‍ර තැතිගන්වන සුළු විය හැකිය. එහෙත් සමහර විට අමාරුකම් තිබියදීත්, ඔබ සෑදූ සහ ඔබට ප්‍රේම කරන දෙවියන් වහන්සේ පිළිබඳ ඔබට වැඩි වශයෙන් එයට කිව හැකි බව ඔබ අසා ඇති බැවින්, ඔබට බයිබලය කියවන්නට *අවශ්‍ය* වේ. එයට ඔබගේ ගැළවුම්කරු වන යේසුන් වහන්සේ පිළිබඳ සහ උන් වහන්සේ කළ දේවල් සහ ඉගැන්වූ දේවල් ඔබට පැවසීමට හැකිය. මෙම පොතෙහි නිධාන සැඟවී ඇත්තේය. එහෙත් එය සොයා යන්නේ කෙසේද යන්න ඔබ නොදන්නෙහිය.

ඔබට උපකාර වන සරල නීති පහක් මෙන්න :

**ආරම්භ කරන්න**

එය විශාල පොතකි. කිසිවක් එය වෙනස් නොකරයි. එය ආරම්භ කිරීමට ඇති එකම ක්‍රමය ආරම්භ කිරීම පමණි. සැතපුම් දහයක පා ගමනක් ආරම්භ වන්නේ පළමු පියවරෙනි. එම නිසා කියවීම ආරම්භ කරන්න! එහෙත් සියල්ල එක විටම කියවීමට උත්සහා නොකරන්න. බයිබලය නිර්මාණය කර ඇත්තේ වේගයෙන් කියවීම උදෙසා නොවේ. එය නව කථාවක්, අභිරහසක් හෝ ත්‍රාසජනක කථාවක් නොවේ. එය විවිධ ආකාර ලියවිලිවල එකතුවකි.

නිදසුනක් ලෙස උත්පත්ති පොතෙහි, විවිධ ප්‍රධාන චරිත ආවරණය කරමින් විවිධ ආකාර කතාන්දර ඇත. ඒ හැම එකකටම ඒවාටම ආවේණික සිතිවිල්ලක් අවශ්‍ය වේ. ඔබ එය කියවූ බව කීම උදෙසා පමණක් ඉක්මනින් කියවීමට ඉක්මන් නොවන්න. දිනපතා ඔබගේ කාලය ගෙන කුඩා කොටසක් කියවන්න. ඔබගේ කාලසටහන පිළියෙළ කරන්න. එවිට මේ සඳහා ඔබට කාලයක් වෙන් කරගැනීමට හැකි වනු ඇත. එහෙත් ඔබ ආරම්භ කරන්නේ කුමන ස්ථානයෙන් ද?

උත්පත්ති පොතෙහි ඇතැම් රසවත් කතාන්දර තිබේ. නික්මයාම පොත ආරම්භ වන්නේ මහා කතාන්දරයකිනි. එහෙත් පසුව ක්‍රම ක්‍රමයෙන් ඉතා සෙමින් නාට්‍යාකාරයෙන් ගලා යන අතර,

බොහෝ අය එයටත් වඩා සෙමින් ගලා යන ලෙවී කතාව සහ ගණන් කතාව කියවන විට උනන්දුව නැති කරගනිති.

යේසුන් වහන්සේගේ කතාන්දර සහිත නව ගිවිසුමෙන් ආරම්භ කිරීම බොහෝ විට හොඳය. මාක් ඉක්මනින් ගලා යන ශුභාරංචියකි. එසේම ක්‍රියා පොතේ උසස් කතාන්දරයක් ගලා යයි. පාවුල්තුමාගේ ලිපිවලට මේවා සන්දර්භය අනුව යා හැකිය.

සැම පොතක්ම අනිවාර්යෙන්ම "පිළිවෙළට" කියවාගෙන යා යුතු බව නොසිතන්න. රෝමයේ වූ කිතුනුවෝ පළමුවෙන්ම රෝම පොත කියවීම සිදු කළහ. ලූක් පොත කියවන අතර, හෙබ්‍රෙව් හසුන හෝ වෙනත් පොතක් කියවීම වැනි එකිනෙක ස්ථානවලින් කියවීමට උත්සහා කරන්න. පසුව ඔබට ගීතාවලිය හෝ සාමුවෙල් වැනි පැරණි ගිවිසුමේ පොතක් කියවීමට අවශ්‍ය වන්නට පුළුවන.

ඔබ අලුත් පොතක් ආරම්භ කරන සැම අවස්ථාවකදීම පළමු පිටුවේ දිනය යොදන්න. ඔබ කියෙව්වේ කුමන පොත්ද සහ නොකියෙව්වේ කුමන පොත්දැයි දැනගැනීමේ ක්‍රමය එයයි. ඔබ දිගටම එසේ කළහොත් ක්‍රම ක්‍රමයෙන් ඔබ සියල්ල කියවනවා ඇත.

ඔබට නූතන පරිවර්තනයක් අවශ්‍ය වන්නට පුළුවන. වසර 400ක් වන ඉංග්‍රීසි භාෂාවේ විශේෂ ශුද්ධවන්ත බවක් හෝ උපකාරයක් හෝ නැත. නව ජාත්‍යාන්තර අනුවාදය, නව ජීවන පරිවර්තනය හෝ වෙනත් පහසු පරිවර්තනයක් කියවන්න.

**කියවන්න**

ඔබ එක් වාක්‍යයක් පමණක් කියවුවහොත් ඔබ එය *වැරදි ලෙස තේරුම් ගැනීමට* පුළුවන. නිදසුනක් ලෙස මම "ගින්දර" කියා කෑ ගැසුවොත්, එය ඔබට කරන අනතුරු ඇඟවීමක්ද, නැතහොත් වෙඩි තැබීමට අණ කිරීමක්දැයි වැටහෙන්නේ නැත. එම නිසා එම වචනය තේරුම් ගැනීමට භාවිත කරන සන්දර්භය අවශ්‍ය වේ.

එය ශුද්ධ ලියවිල්ලෙහි වාක්‍ය සම්බන්ධයෙන් ද සත්‍යය වේ. නිදසුනක් ලෙස, "මෙම නිවසේ කිසිවෙකු මට වඩා උතුම් නැත. ඔබ හැර කිසිවක් මගේ ස්වාමියා මගෙන් වළක්වා නැත." මෙම වාක්‍ය තේරුම් ගැනීම පිණිස කතා කරන්නේ කවුරුන්ද ඔහු කතා කරන්නේ කා හට ද සහ ඒ මන්ද යන්න අපි දැනගත යුතු වෙමු. අපට සන්දර්භයක් අවශ්‍ය වේ.

එම නිසා සිදු වන්නේ කුමක්ද යන්න ඔබට තේරුම් ගැනීමට අවශ්‍ය නම්, ඔබ විසින් පිටුවේ ඇති ස්වාධීන අර්ථයක් සහිත වාක්‍ය නොව, *කොටස්* කියවිය යුතුය. ඇතැම් විට ඒවා අර්ථයක් දෙන නමුත්, බොහෝ විට එසේ නොවේ. එම නිසා එහි අර්ථය දැනගැනීමට, මෙම සම්පූර්ණ කොටස කථා කරන්නේ කුමක් පිළිබඳවද යන්න දැනගැනීමට ඇති එකම ක්‍රමය වන්නේ එයට ඉදිරියෙන් සහ පසුව ඇති වාක්‍ය කිහිපයක් කියවීමයි. කථා කරන්නේ කවුද, ඔවුන් කරන්නේ කුමක්ද සහ ඇයි?

බොහෝ නූතන අනුවාදයන් ඡේදවලට වචන යොදමින්, ප්‍රධාන කොටස්වලට උප මාතෘකා යොදමින් සන්දර්භය දැකීමට උපකාර කරයි. මෙම සලකුණු එක් විෂයක් ආරම්භ වී එය අවසන් වන්නේ කොතැනදැයි දැක්වීමට සාමාන්‍යයෙන් උපකාරයක් වේ. වැදගත් කරුණ නම්,

සෑම පදයක්ම සන්දර්භය තුළ *කියවීම* මිස, සම්පූර්ණයෙන්ම ස්වාධීන සිතිවිල්ලක් ලෙස කියවීම නොවේ.

**ඉල්ලන්න**

අවාසනාවකට, අප කියවන සියල්ල අප තේරුම් නොගනිමු. නූතන නව කතාවක හෝ චිත්‍රපටයක සියල්ල වුවද අපට තේරෙන්නේ නැත. එහෙත් අපට කථාවේ ගලා යාමෙන් සතුටු විය හැකිය. එහෙත් එය බයිබලයට අදාළ කරන විට බොහෝ විට මනුෂ්‍යයෝ ඔවුන්ට සියල්ල වැටහෙන්නේ නැති බැවින් කරදර වෙති. සියල්ලට පසුව එය දෙවියන් වහන්සේ වෙතින් වූ පණිවුඩයකි. අපි එය තේරුම් ගත යුතු වෙමු. අපි එය තේරුම් නොගන්නා විට මෝඩයින් ලෙස හැඟේ.

හොඳයි, අපි එය පැහැදිලි කරගනිමු. අවුරුදු පනහක් අධ්‍යයනය කිරීමෙන් පසුව පවා, කිසිවෙකු බයිබලයේ ඇති සියල්ල අවබෝධ කරගන්නේ නැත. කිසිවෙකු තමන් එය කියවන පළමු වතාවේදීම අවබෝධ කරගන්නේ නැත. (ඇතැම් අය ඔවුන් එය තේරුම් ගන්නා බව *සිතති*. එහෙත් ඔවුන්ට විශාල ප්‍රශ්නයක් ඇත!) දෙවියන් වහන්සේගේ දේවල්වලට පැමිණෙන කල, අපි සියල්ලෝ මඳක් අනුවණ අය වන්නෙමු. ඒ නිසා පහසුවෙන් සිටින්න. ඔබට ඇතැම් විට තේරුම් ගැනීමට නොහැකි වූ විට ප්‍රශ්න අසන්න. බයිබලයෙන් අසන්න. (ඔබට අවශ්‍ය නම් හයියෙන් කථා කරන්න. එහෙත් කිසිම හඬක් ඇසීම අපේක්ෂා නොකරන්න.)

බයිබලයෙන් ප්‍රශ්න අසන්න: මෙහි කථා කරන්නේ කවුද? ඔහුට හෝ ඇයට හැඟෙන්නේ කෙසේද? මෙම මනුෂ්‍යයින් මේ ආකාරයෙන් කටයුතු කරන්නේ මන් ද? මමත් සාමාන්‍යයෙන් මේ දේවල්ම කරන්නෙම් ද? අපි මේවා වචනාර්ථයෙන් ගත යුතු ද, නැතහොත් එය ඇත්තෙන්ම වෙනත් දෙයක් පිළිබඳ කථා කරන්නේ ද? එය යහපත් දෙයක් ද, නැතිනම් නරක දෙයක් ද? මට තේරුම් ගැනීමට උපකාර වන ඉඟි එම පාඨයෙහිම තිබේ ද?

ඇතැම් විට පිළිතුරු ඉතා පැහැදිලිය. ඇතැම් විට එසේ නොවේ. සමහර විට අපට ලොකු ප්‍රශ්නාර්ථ ලකුණක් පසෙකින් ලකුණු කොට ඉදිරියට යාමට සිදු වේ. බයිබලයෙහි ආකාරය එය වේ. සමහර විට අපි අවුරුදු පහකට පසුව එය තේරුම් ගන්නෙමු. බයිබල් අත් පොතක් අපට එය තේරුම් ගැනීමට උපකාර විය හැකිය. අපි එය නොදනිමු. එහෙත් අපි සහතික වශයෙන්ම දන්නා දෙය වන්නේ, අපට මෙම මොහොතේදී එය තේරුම් ගැනීමට නොහැකි බවයි. එයට කමක් නැත. ඇතැම් විට අනෙක් කොටස් කියවීම ඉතා හොඳය. ප්‍රශ්න තිබුණාට කම් නැත.

**කථා කරන්න**

බොහෝ විට ඔබට නොතේරෙන දේවල් තවත් කෙනෙකුට වැටහේ. එසේ අපට බොහෝ විට බයිබලයේ තේරුම් සම්බන්ධ ප්‍රශ්න ඇත. අපට ඒවා අනෙක් කිතුනුවන් හා සමඟ කථා කිරීමට පුළුවන. ඔවුන් ඇතැම් විට මේ ප්‍රශ්න ගැනම අධ්‍යයනය කර තිබෙන්නට පුළුවන. එම නිසා ඇතැම් විට එය පැහැදිලි කර දීමට හැකි වේ.

නැත්නම් ඔබ ඉගෙන ගත් දෙයක් බෙදා ගැනීමට අවශ්‍ය වන්නට පුළුවන. ඔබ සිටින්නා වූ තත්වයට අදාළ වන්නා වූ උපදේශයක් සමහර විට ඔබ දැකිය හැකිය. ඔබ ඇතැම් විට ඇදහිල්ලේ කතාන්දරයක් කියවා තිබෙන්නට පුළුවන. නැතිනම් එය උතුම් වූ දෙවියන් වහන්සේ කුමනාකාරද යන්න පිළිබඳ දැක්මක් විය හැකිය. එකිනෙකා ධෛර්යමත් කරන පිණිස මේ දේවල්ද කථා කරන්න.

නව ගිවිසුම මුල් සභාව සහභාගිකමක්, දෙවියන් වහන්සේ පිළිබඳ නිතරම එකිනෙකා සමඟ කථා කළ මිනිසුන් කණ්ඩායමක් ලෙස විස්තර කරන්නේය. ඔවහු අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම්වලට කැප වූහ. ඔවුහු ඉගෙනගත් දේ පිළිබඳ සතුටු වූ අතර, ඔවුන්ගේ ප්‍රීතිය පිළිබඳ කථා කළහ.

නූතන ලෝකයේ කිතුනුවෝ බොහෝ විට දේව මෙහෙයට පෙර හෝ පසුව හෝ සතිපතා කුඩා කණ්ඩායම් - කුඩා කණ්ඩායම් විශේෂිත අරමුණක් ඇතිව එක්ව යාච්ඤා කිරීමටත්, ශුද්ධ ලියවිල්ල සාකච්ඡා කිරීමටත්, එකිනෙකාට උපකාර කිරීමටත් තම නිවෙස්වල එකතු වන විට හෝ කථා කරන්නෝය. මෙයින් එක කණ්ඩායමකට ඔබගේ බයිබල් කියවීමේ දී ඔබට උපකාර වීමට හැකිය. එය වඩා හොඳ අවබෝධ කරගැනීමක් උදෙසා වූ යහපත් පියවරකි: අනෙක් කිතුනුවන් හා සමඟ බයිබලය පිළිබඳ කථා කරන්න.

**නවත්වන්න එපා**

එය විශාල පොතක් නිසා, සහ එය පළමු වතාවේදීම අපට නොතේරෙන නිසා එය නොකඩව කිරීම අවශ්‍ය වේ. බයිබලයෙන් දෙවියන් වහන්සේ අපට කථා කරන්නේ කෙසේද යන්න ඇත්ත වශයෙන්ම ඔබට දැනගැනීමට අවශ්‍ය නම්, ජීවිත කාලය පුරාම පවතින කියවීමේ, සිතීමේ සහ බයිබලය පිළිබඳ කථා කිරීමේ පුරුද්ද ඔබ ඇති කරගත යුතු වේ.

එය සම්පූර්ණ ලෙස දැනගැනීමට ප්‍රථම අපි මිය යන්නෙමු. සැම විටම වැඩිපුර දෙයක් ඉගෙන ගැනීමට ඇත්තේය. මෙය නොකඩව කියවීමට පෙළඹවීමක් මිස එසේ නොකිරීමට හේතුවක් නොවේ. බයිබලයේ ඇත්තෙන්ම වස්තු සැඟවී ඇත්තේය. ඒවා දකින පිණිස ඉවසීමත් නොකඩව කිරීමත් අවශ්‍ය වේ. සමහර මැණික් අපට එක්වරම හමු වේ. අනෙක් ඒවා බොහෝ කාලයකට පසුව ආලෝකයට පැමිණේ. සැමවිටම අපට දැකීමට යමක් අප වෙනුවෙන් ඇත්තේය.

එසේම අපි සියල්ලෝ එය පිළිගත යුතු වෙමු. අපි බාල වියට පත් නොවන්නෙමු. අපට ඇතැම් දේ අමතක වේ. අප වරක් උගත් පාඩම් අපට අමතක වේ. අප වරක් දැන සිටි පොරොන්දු අපට අමතක වේ. ශුද්ධ ලියවිල්ල සම්බන්ධ අපගේ මතකය අපි අලුත් කර නොගන්නෙමු නම්, වරක් අපට තිබූ යමක් අප නැති කර ගන්නෙමු. නිතර නොදකින විට මනසේ නොරැඳේ.


එම නිසා නතර නොකර පොත දිගටම කියවන්න !

## ගෝලත්වය 101

## ඒකකය 10 අ



# අවසානය



අනාගතයක් නැති නම් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇදහිල්ල ඇතිව සිටීම මෝඩකමක් බව පාවුල්තුමා ලියයි (1 කොරින්ති 15:19). අනාගතවාක්‍ය කිතුනු ඇදහිල්ලෙහි ඉතා වැදගත් මෙන්ම ධෛර්යමක් කරන්නා වූ කොටසක් ද වන්නේය. බයිබල් අනාවැකි අති උසස් ලෙස අපට සුබ අස්න ප්‍රකාශ කරන්නේය. විවාදාත්මක තොරතුරුවලට යොමු නොවී ප්‍රධාන පණිවුඩයට අවධානය යොමු කරන කල අපට මහත් ධෛර්යයක් ලැබේ.

**අනාවැකිවල අරමුණ**

අනාවැකියක් එම අනාවැකිය ප්‍රකාශ කිරීමෙන් පමණක් අවසන් නොවේ. එය ඉතා වැදගත් සත්‍යයක් ප්‍රකාශ කරයි. දෙවියන් වහන්සේ මනුෂ්‍යත්වය උන් වහන්සේට සමගි කරගනිමින්, අපගේ පාපවලට සමාව දෙමින් සහ උන් වහන්සේ සමඟ අප මිත්‍රත්වයට පත් කරගනිමින් සිටින සේක. අනාවැකි මෙම සත්‍යතාව ප්‍රකාශ කරයි.

අනාවැකි හුදෙක් සිද්ධීන් පිළිබඳ පූර්වයෙන් පවසනවා පමණක් නොව, දෙවියන් වහන්සේ වෙත අප යොමු කිරීම ද සිදු කරන්නේය. එය දෙවියන් වහන්සේ කවුරුන්ද, උන් වහන්සේ කුමනාකාර ද, උන් වහන්සේ කුමක් කරන්නේද සහ අප කුමක් කරනවාට උන් වහන්සේට අවශ්‍ය ද යන්න අපට පවසයි. ක්‍රිස්තුන් යේසුන් වහන්සේ තුළ ඇදහිල්ල තුළින් දෙවියන් වහන්සේ හා සමගිකම ලබා ගැනීමට මනුෂ්‍යයින් පෙළඹවීම අනාවැකි මගින් සිදු වේ.

බොහෝ සුවිශේෂී අනාවැකි පැරණි ගිවිසුම් යුගයේදී සම්පූර්ණත්වයට පත් විය. එසේම අනෙක් ඒවායේ සම්පූර්ණ වීම අපි තවමත් බලා සිටින්නෙමු. එහෙත් සියලු අනාවැකිවල සියුම් අරමුණ වන්නේ මිදීමයි - පාපවලට සමාව සහ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළින් පැමිණෙන සදාතන ජීවනයයි. ඉතිහාසය දෙවියන් වහන්සේගේ පාලනයට යටත්ව තිබූ බව අනාවැකි අපට සහතික කරයි (දානියෙල් 4:17). එය ක්‍රිස්තුන් වහන්සේ තුළ වූ අපගේ ඇදහිල්ල ශක්තිමත් කරන්නේය (යොහන් 14:29). එසේම අපට අනාගතය උදෙසා බලාපොරොත්තුවක් ලබා දෙන්නේය (1 තෙසලෝනික 4:13-18).

මෝසෙස් සහ අනාගතවක්තෘවරු ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ ලියූහ. එයට උන් වහන්සේ මරනු ලබන බවත්, උත්ථාන වන බවත් ඇතුළත් විය (ලූක් 24:27, 46). ශුභාරංචිය දේශනා කිරීම වැනි, ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් පසුව සිදුවීම් පවා ඔවුහු කලින් කීහ (47 පදය).

අනාවැකි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ ගැළවීම පිණිස අප යොමු කරයි. අපි ගැළවීම නොලැබුවහොත්, අනාවැකි අපට කිසිම යහපතක් ඉටු නොකරයි. සදාකාලයට ජීවත් වන පිණිස අපට දේව රාජ්‍යයේ කොටසක් විය හැකි වන්නේ ක්‍රිස්තුන් වහන්සේ තුළින් පමණි (දානියෙල් 7:13-14, 27).

බයිබලය ක්‍රිස්තුන් වහන්සේගේ නැවත පැමිණීම, අවසාන විනිශ්චය සහ සදාකාල දඬුවම හා විපාක පිළිබඳ ප්‍රකාශ කරයි. මෙම පූර්ව කියමන්වලින් අනාගතවාක්‍ය මිනිස් සංහතියට ගැළවීම උදෙසා වූ *අවශ්‍යතාව* ගැන අනතුරු අඟවන අතර, එම ගැළවීමේ ප්‍රතිඥාව පිළිබඳව ද ප්‍රකාශ කරයි. දෙවියන් වහන්සේ අප ගණන් දීමකට කැඳවන බව (යූද් 14-15), අප ගැළවීම ලැබීම උන් වහන්සේට අවශ්‍ය බව (2 පේදුරු 3:9), සහ උන් වහන්සේ ඇත්තෙන්ම අප ගළවා ඇති බව (1 යොහන් 2:1-2) පිළිබඳ අනාවැකි පවසයි. සියලු නපුර පරාජයට පත් වන බව සහ සියලු අසාධාරණයත්, වේදනා විඳීමත් අවසන් වන බව එය අපට සහතික කරයි (1 කොරින්ති 15:25, එළිදරව් 21:4).

අනාවැකි අපගේ වෙහෙස නිෂ්ඵල නොවන බව පවසමින් ඇදහිලිවන්තයින් ධෛර්යමත් කරන්නේය. අප පීඩා විඳීම්වලින්, දෝෂාරෝපණවලින් ආරක්ෂා කරනු ලැබ, යහපත් විපාක ලබනවා ඇත. අනාවැකි දෙවියන් වහන්සේගේ ප්‍රේමය සහ විශ්වාසවන්තකම අපට මතක් කර දෙමින්, උන් වහන්සේට විශ්වාසවන්ත වීමට අපට උපකාර කරන්නේය (2 පේදුරු 3:10-15, 1 යොහන් 3:2-3). සියලු භෞතික වස්තූන් තාවකාලික බව අපට සිහි කරමින්, තවමත් අප නුදුටු දෙවියන් වහන්සේගේ දේවල්, වස්තූන් රැස් කරගැනීමට සහ උන් වහන්සේ සමඟ අපගේ සදාකාලික සම්බන්ධතාවය ඇති කරගැනීමට අනාවැකි අප ධෛර්යමත් කරන්නේය.

පසුතැවිලි වීමට කැඳවීමක් ලෙසින් සෙකරියා තම අනාවැකිය ඉදිරිපත් කරන්නේය (සෙකරියා 1:3-4). දෙවියන් වහන්සේ දඬුවම් පිළිබඳ අනතුරු අඟවන සේක. එහෙත් පසුතැවිලි වීම බලාපොරොත්තුව සිටින සේක. ජෝනාගේ කතාන්දරයේ පෙන්නුම් කරන ආකාරයට, මනුෂ්‍යයින් පසුතැවිලි වීමට කැමති නම් පමණක් දෙවියන් වහන්සේ උන් වහන්සේගේ පූර්වයෙන් කී දේවල් ආපසු ගැනීමට කැමති වන සේක. අනාවැකිවල අරමුණ වන්නේ, අප වෙනුවෙන් ඉතා හොඳ සැලැස්මක් ඇතිව සිටින දෙවියන් වහන්සේ වෙතට අප යොමු කිරීම වේ. “රහස්” දේවල් දැනගැනීමෙන් අපගේ බලවත් ආශාව සංසිඳුවීම එහි අරමුණ නොවේ.

**අනතුරු ඇඟවීමේ අවශ්‍යතාවය**



බයිබල් අනාවැකි අප අවබෝධ කරගන්නේ කෙසේ ද? පරෙස්සම් වීමෙන් පමණි. ඉතා හොඳින් තේරුම් ගත හැකි අනාවැකි වැරදි පූර්ව කියමන් සහ නොමග යවන සුළු කියමන්වලින් ශුභාරංචියට අපකීර්තියට පත් කර ඇත. මෙවන් ආකාරයෙන් අනාවැකි වැරදි අන්දමින් භාවිත කිරීම නිසාවෙන්, ඇතැම් මිනිස්සු බයිබලය හෙළා දකිමින් ක්‍රිස්තුන් වහන්සේට සමච්චල් කරති. ඉටු නොවූ අනාවැකි පෞද්ගලික ස්ථිර කිරීමක්

සත්‍යයට සහතිකයක් නොවන බවට මධ්‍යස්ථ අනතුරු ඇඟවීමක් විය යුතුය. ඉටු නොවන අනාවැකි ඇදහිල්ල දුර්වල කරන නිසාවෙන්, අපි පරෙස්සම් විය යුතු වෙමු.

අප ආත්මික වර්ධනය සහ කිතුනු ජීවිතය පිළිබඳ පුදුම අනාවැකි ඇති කර නොගත යුතුය. දින සහ වෙනත් විස්තර පිළිබඳ දැනුම (ඒවා නිවැරදි බවට පත් වූයේ නම් පවා) ගැළවීම පිළිබඳ සහතිකයක් නොවන්නේය. අපගේ යොමුව ක්‍රිස්තුන් වහන්සේ වෙත විය යුතු වේ. එය විය හැකි දේවල සාක්ෂි ළඟාකර ගැනීමක් නොවන්නේය.

අනාවැකි පිළිබඳ සිතෙහි බලපාන දෙයක් වන්නේ අප ශුභාරංචියට ප්‍රමාණවත් අවධානයක් නොදෙන බව අදහස් කිරීමයි. මනුෂ්‍යයින් පසුතැවිලි වීමත්, ක්‍රිස්තුන් වහන්සේගේ නැවත පැමිණීම සමීප වුවත්, නැතත්, තවත් සහස්‍රකයක් ඇති වුවත් නැතත්, බයිබල් අනාවැකිවල ඇමරිකාව පිළිබඳ සඳහන් වුවත් නැතත් උන් වහන්සේ විශ්වාස කිරීමත් අවශ්‍ය වේ.

අනාගතවාක්‍ය අර්ථකථනය කිරීම මෙතරම් අමාරු ඇයි? ඇතැම් විට ලොකුම හේතුව වන්නේ එය බොහෝ විට රූපක භාෂාවකින් දෙනු ලැබීම වේ. මෙහි පළමු පාඨකයින් මෙම සලකුණුවලින් අදහස් කළේ කුමක්ද යන්න ඇතැම් විට දැන සිටින්නට ඇත. එහෙත් අප වෙනස් වූ සංස්කෘතියක සහ කාලයක ජීවත් වන නිසා, අපට සැම විටම ඒවා පිළිබඳ ප්‍රත්‍යක්ෂභාවයක් නැත.

රූපක භාෂාවට ගීතාවලිය 18 හොඳ නිදසුනකි. එහි කාව්‍ය දෙවියන් වහන්සේ දාවිත් ඔහුගේ සතුරන්ගෙන් මුදවාගත් ආකාරය විස්තර කරන්නේය (1 පදය). මේ සඳහා දාවිත්තුමා විවිධ චිත්‍ර භාවිත කරයි : සොහොනෙන් පැන යාම (4-6), භූමිකම්පාව (7 පදය), ස්වර්ගීය ලකුණු (8-14 පද), මුහුදේදී පවා ආරක්ෂා වීම (15-18 පද). මෙම කාරණා වචනාර්ථයෙන් සිදු නොවූ ඒවාය. එහෙත් බයිබලීය භාෂාව මෙවන් මනඃකල්පිත රූපක භාෂාව භාවිත කරයි. මෙය අනාවැකි සම්බන්ධයෙන් ද සත්‍යයකි.

යෙසායා 40:3-4 කඳු පහත් වී පාරවල් සමතල කරනු ලැබ කෙළින් කරනු ලබන බව පවසයි. එහෙත් මෙය වචනාර්ථයෙන් ගැනීම සුදුසු නැත. මෙම අනාවැකිය යොහන් බව්තීත්ස මඟින් සම්පූර්ණ වූ බව ලූක් 3:4-6 දක්වයි. එය කෙසේවත් කඳු හා මාර්ග පිළිබඳ අනාවැකියක් නොවීය.

ජොවෙල් 2:28-29 දෙවියනක්වහන්සේගේ ආත්මය "සියලු මනුෂ්‍යයින්" මත වගුරුවනු ලබන බව පූර්වයෙන් පවසා ඇත. එහෙත් එය පෙන්තකොස්තයේදී දුසිම් ගණනක් වැඩියෙන් සම්පූර්ණත්වයට පත් වූ බව පේදුරුතුමා පැවසීය (ක්‍රියා 2:16-17). ජෝවෙල් විසින් පවසන ලද සිහින සහ දර්ශන පිළිබඳ අනාවැකි වචනාර්ථයේ ඒවා නොවිණි. එහෙත් පේදුරුතුමා මෙම අනාවැකි විස්තර එතරම් දුරට ගත්තේ නැත. අපිද එසේ නොකරමු. අපි දෘෂ්ටාන්ත භාෂාවක් කියවන කල, අනාවැකියේ සම්පූර්ණ වීම අනාවැකියේ වචනාර්ථ අර්ථයට සමාන වීම අවශ්‍ය නොවේ.

මෙම කරුණු මනුෂ්‍යයින් බයිබලීය අනාවැකි අර්ථකථනය කරන ආකාරයට බලපෑමක් කරන්නේය. එක් පාඨකයෙක් වචනාර්ථ අර්ථයට කැමති විය හැකි අතර, තවත් කෙනෙක් දෘෂ්ටාන්ත අර්ථයට කැමති වේ. එසේම නිවැරදි වන්නේ කුමක්දැයි ඔප්පු කිරීම කළ නොහැකි දෙයකි. මෙය විස්තරවලට නොව, විශාල චිත්‍රය දෙස බැලීමට අප යොමු කරන්නේය. අපි බලන්නේ මීදුම් සහිත කණ්ණාඩියකින් මිස, විශාලක කණ්ණාඩියකින් නොවේ.

අනාවැකිවල ප්‍රධාන අංග බොහොමයක කිතුනු පොදු එකඟත්වයක් ඇත්තේ නැත. ඔසවා ගැනීම, පීඩා කාලය, සහස්‍රකය, අතර - මැදි රජය සහ නිරය පිළිබඳ වූ අදහස් විවාදාත්මක ඒවාය. (මෙම විෂයන් සම්බන්ධ වාර්තා අපගේ වෙබ් අඩවියෙන් බලන්න.) මෙම විස්තර එතරම් වැදගත් නැත.

ඒවා දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි කොටසක් සහ උන්වහන්සේට වැදගත් ඒවා වුව ද, අපි සියලු දේ උදෙසා නිවැරදි පිළිතුරු ලබා ගැනීම අවශ්‍ය නොවේ. විශේෂයෙන්ම විවිධ පිළිතුරු ඇති සුළුතරයක් දෙස අප සිතන්නෙහි නම් එසේ අවශ්‍ය නොවේ. සියල්ල උදෙසා නිවැරදි පිළිතුරු ලැබීමට වඩා අපගේ ආකල්පය වැදගත් වන්නේය.

සමහර විට අනාවැකි ගමනක් හා සංසන්දනය කළ හැකිය. අපගේ ගමනාන්තය ඇත්තේ



කොහේද යන්න, අපි යන්නේ කුමන මාර්ගයෙන්ද යන්න හෝ අප කෙතරම් වේගයෙන් ගමන් කරන්නෙමුද යන්න හරියටම දැනගැනීම අවශ්‍ය නැත. මේ සියල්ලටම වඩා අපට අවශ්‍ය වන්නේ අප ඇදගෙන යන්නා වූ රථය වන ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ මත විශ්වාස කිරීම වේ. මාර්ගය දන්නා වූ එකම තැනැත්තා උන්වහන්සේ වන සේක. එසේම උන්වහන්සේ නොමැතිව අපට එසේ යාමටද නොහැකි වේ. උන්වහන්සේ සමඟ රැඳී සිටින්න, එවිට උන්වහන්සේ අනෙක් විස්තර සියල්ල බලාගන්නවා ඇත.

මෙම අනතුරු ඇඟවීම් සිතෙහි තබාගෙන අනාගතය සම්බන්ධ ඇතැම් මූලික කිතුනු විශ්වාසයන් දෙස බලමු.

**ක්‍රිස්තුන් වහන්සේගේ නැවත පැමිණීම**

අපගේ විශ්වාසයන්හි අනාගතය පිළිබඳ වූ මිනුම් ලකුණ වන්නේ ක්‍රිස්තුන්වහන්සේගේ දෙවන පැමිණීමයි. ජේසුස්වහන්සේ නැවත පැමිණෙන බවට වූ කරුණ සම්බන්ධයෙන් පුදුමාකාර පොදු එකඟත්වයක් ඇත්තේය.

ජේසුස්වහන්සේ තමා "නැවත පැමිණෙන බව" තම ගෝලයින්ට පැවසූ සේක (යොහන් 14:3). එය කවදා සිදුවේද යන්න දක්වමින් තම කාලය නාස්ති නොකරන ලෙස ද ජේසුස්වහන්සේ තම ගෝලයින්ට අනතුරු ඇඟවූ සේක (මතෙව් 24:36). එම කාලය ඉක්මනින් පැමිණේ යයි සිතූ අය (මතෙව් 25:1-13), එසේම එය බොහෝ ප්‍රමාද වේයැයි සිතූ අය උන්වහන්සේ විවේචනය කළ සේක (මතෙව් 24:45-51). කුමක් වුවද කම් නැත, අපගේ වගකීම වන්නේ එකම දෙයකි. එනම්, සූදානම්ව සිටීමයි.

සැබෑ ලෙසම ජේසුස්වහන්සේ ස්වර්ගයට නැගුණු ලෙසම උන්වහන්සේ නැවත පැමිණෙන බව දේවදූතයෝ ගෝලයින්ට කීවෝය (ක්‍රියා 1:11). උන්වහන්සේ "ස්වකීය බලසම්පන්න දූතයින් සමඟ ස්වර්ගයෙන් ප්‍රකාශ වන" සේක (2 තෙසලෝනික 1:7). පාවුල්තුමා මෙය "මහෝත්තම දෙවියන්වහන්සේගේ ද, අපගේ ගැළවුම්කාර ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේද තේජාන්විත ආගමනය" (තීතස් 2:13) ලෙස දක්වයි. පේදුරුතුමා ජේසුස්වහන්සේ "එළිදරව්" කරනු ලබන බව දක්වයි (1 පේදුරු 1:7, 13). යොහන්තුමා ද උන්වහන්සේ ප්‍රකාශ වන බව දක්වා තිබේ (1

යොහන් 2:28). එසේම හෙබ්‍රෙව් 9:28 "උන්වහන්සේගේ ආගමනය බලා සිටින්නන්ට ගැළවීම දෙන පිණිස උන්වහන්සේ දෙවන වර ප්‍රකාශ වන සේක" යනුවෙන් පවසයි.

"ස්වාමීන්වහන්සේම අණ දීමේ මහත් ශබ්දය ද, අග්‍ර දේව දූතයෙකුගේ හඬ ද, දෙවියන්වහන්සේගේ හොරණෑ නාදය ද ඇතිව ස්වර්ගයෙන් බැස වදාරන සේක" (1 තෙසලෝනික 4:16). එහි කිසිම වරදක් සිදු නොවේ.

ක්‍රිස්තුන්වහන්සේ නැවත පැමිණෙන කල තවත් කාරණා දෙකක් සිදු වේ : ඒවා නම්, නැවත නැගිටීම සහ විනිශ්චයයි. ක්‍රිස්තුන්වහන්සේ තුළ මළා වූ අය ස්වාමින්වහන්සේගේ පැමිණීමේ දී නැවත නැගිටින බව පාවුල්තුමා පවසයි. එසේම ජීවත්ව සිටින ඇදහිලිවන්තයින් ද ක්‍රිස්තුන්වහන්සේ පොළොවට පැමිණෙන කල උන්වහන්සේ හමු වීමට නැගිටිනු ඇත (1 තෙසලෝනික 4:16-17). "අන්තිම හොරණෑව පිඹින කල, මිය ගිය අය අජරාමර ස්වභාවයෙන් උත්ථාන කරනු ලබන්නාහ" (1 කොරින්ති 15:52) යනුවෙන් පාවුල්තුමා ලියයි. අපි නොදිරන්නා වූ, තේජාන්විත, ප්‍රබල, ආධ්‍යාත්මික ශරීරයකට වෙනස් කරනු ලබන්නෙමුව (42-44 පද).

මතෙව් 24:31 මෙම සිදුවීම වෙනත් දෘෂ්ටියකින් විස්තර කරන බව පෙනේ. ක්‍රිස්තුන්වහන්සේ "මහත් හොරණෑ හඬක් සහිතව තම දූතයන් එවන සේක. ඔවුහු අහසේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වා සිව් දිගින් තෝරාගත්තවුන් රැස් කරන්නෝය". කිරිඳි ගැන උපමාවෙහි යුගයේ අවසානයේ උන්වහන්සේ දේවදූතයින් එවන බව පැවසූ සේක. "මනුෂ්‍ය පුත්‍රයාණෝ ස්වකිය දූතයන් එවන සේක. ඔවුහු උන්වහන්සේගේ රාජ්‍යයෙහි බාධා උපදවන සියල්ල ද, අදම්ටුකම් කරන්නන් ද එක් කොට ගිනි උදුනෙහි හෙළන්නෝය" (මතෙව් 13:40-41).

මනුෂ්‍ය පුත්‍රයාණෝ සිය පියාණන්ගේ තේජශ්‍රීයෙන් තම දූතයන් පිරිවරා වඩින සේක. එකල උන්වහන්සේ එකිනෙකාට තම ක්‍රියා අනුව විපාක දෙන සේක (මතෙව් 16:27). විශ්වාසවන්ත ගබඩාකරුගේ උපමාවේ දී ස්වාමියාගේ පැමිණීමේ දී විනිශ්චය ද එක් අංගයක් බව දක්වා ඇත (මතෙව් 24: 45-51). එසේම තලෙන්ත පිළිබඳ උපමාවේ ද එය දැක්වේ (මතෙව් 25:14:30).

ස්වාමින්වහන්සේ පැමිණෙන කල "උන්වහන්සේ අඳුරෙහි සැඟවුණු දේ ආලෝකයට පමුණුවා, සිත් සතන්හි අදහස් හෙළි කරන සේක. එවිට හැම කෙනෙක්ම තම තමන්ට හිමි ප්‍රශංසාව දෙවියන්වහන්සේගෙන් ලබති" (1 කොරින්ති 4:5) යනුවෙන් පාවුල්තුමා පවසයි. ඇත්තෙන්ම දෙවියන්වහන්සේ දැනටමත් සෑම මනුෂ්‍යයෙකුම දන්නා සේක. ඒ ආකාරයෙන් ක්‍රිස්තුන්වහන්සේගේ පැමිණීමට බොහෝ කාලයකට පෙර විනිශ්චය සිදු වන්නේය. එහෙත් එම විනිශ්චය සියල්ලන්ට පොදුවේ පවත්වන්නේ උන්වහන්සේගේ පැමිණීමෙන් පසුවය.

අප නැවත ජීවත් වීම සම්බන්ධ කරුණු, එසේම අපට විපාක ලැබෙන බවට වූ කරුණ, අපට මහත් ධෛර්යයකි. උත්ථානය පිළිබඳ සාකච්ඡාවෙන් පසුව, පාවුල්තුමා මෙසේ පවසයි. "එහෙත් අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ කරණකොටගෙන අපට ජය අත් කර දෙන දෙවියන්වහන්සේට ස්තුති වේවා. එහෙයින් මාගේ ප්‍රේමවන්ත සහෝදරවරුනි, ස්වාමින්වහන්සේ තුළ ඔබගේ සේවය නිරර්ථක නොවන බව ඔබ දන්නා බැවින් ස්ථිර වන්න, නොසෙල්වී සිටින්න. ස්වාමින්වහන්සේගේ සේවයෙහි අධික ලෙස නිරත වන්න" (1 කොරින්ති 15:57-58).

**අවසාන දවස්**

කුතුහලය ඇවිස්සීම පිණිස ඇතැම් දිවැසිවාක්‍ය පිළිබඳ උගන්වන ගුරුවරු මෙසේ අසති. “අප ජීවත් වන්නේ අවසාන දවස්වල ද?” මෙයට නිවැරදි පිළිතුර වන්නේ “ඔව්” යන්නයි. එය වසර 2000ක් සම්බන්ධයෙන් සත්‍යයක්ව පැවතිණි. පේදුරුතුමා අවසාන දවස් පිළිබඳ අනාවැකියක් දක්වමින් එය ඔහුගේ කාලයට අදාළ කර දැක්වීය (ක්‍රියා 2:16-17). හෙබ්‍රෙව් කතුවරයා ද එසේ කළේ ය (හෙබ්‍රෙව් 1:2). අවසාන දවස් යන්න ඇතැම් අය සිතනවාට වඩා දීර්ඝ කාලයකි. ජේසුස්වහන්සේ සතුරා පරාජය කොට නව යුගයක් ආරම්භ කළ සේක.

වසර දහස් ගණනක් පුරා යුද්ධ සහ ප්‍රශ්න මනුෂ්‍ය සංහතියට මහත් හිරිහැර ඇති කර තිබේ. එය තව දුරටත් නරක අතට හැරේවි ද ? ඇත්තෙන්ම එසේ විය හැකිය. ඉන්පසුව එය වඩා යහපත් වනු ඇත. නැවතත් වඩා නරක අතට හැරෙනු ඇත. එසේ නැතිනම් එය ඇතැම් මිනිසුන්ට වඩා හොඳ වන අතර, තවත් අයට වඩා නරක අතට හැරෙනු ඇත. ඉතිහාසය පුරාම දුක්ඛිත බව අනුක්‍රමික ආකාරයෙන් පැවත ඇත. බොහෝ විට ඉදිරියටත් එය එසේ වනු ඇත.

එහෙත් යුග ගණනාවක් තුළ ඇතැම් කිතුනුවන්ට එය වඩාත් නරක අතට හැරීම අවශ්‍ය වූ බව පෙනේ. ඔවුහු ලෝකයේ කෙදිනකවත් සිදු නොවූ ආකාර පීඩාවන් ලෙස විස්තර කර ඇති පරිදි මහා පීඩාවක් බලාපොරොත්තු වෙති (මතෙව් 24:21). ඔවුහු අන්ත ක්‍රිස්තුස්ට, මෘගයා, පාපයේ මනුෂ්‍යයා සහ දෙවියන්වහන්සේගේ අනෙකුත් සතුරන්ට ආකර්ශනය වෙති. දෙනු ලබන ඕනෑම අමාරුකමක්ම ක්‍රිස්තුන්වහන්සේගේ පැමිණීම ඉතා ආසන්න බව පෙන්වන බවට ඔවුහු විශ්වාස කරති.

මහා පීඩාවේ කාලයක් පිළිබඳ ජේසුස්වහන්සේ අනාවැකි කී බව සත්‍යයකි (මතෙව් 24:21). එහෙත් මතෙව් 24 පරිච්ඡේදයේ උන්වහන්සේ කලින් කී බොහෝ කාරණා ක්‍රි. ව. 70 දී යෙරුසලම වටලෑමේ දී ඉටු විය. ජේසුස්වහන්සේ තම ගෝලයින් ජීවත් වන කාලයේ දී දකින්නට සිදු වන දේ සම්බන්ධයෙන් සහ ජුදයාවේ මිනිසුන් කඳුවලට පළා යාම අවශ්‍ය බවටත් අනතුරු ඇඟවූ සේක (16 පදය).

ජේසුන් වහන්සේ තමාගේ පැමිණීම දක්වා නියත වශයෙන්ම සිදු වන්නට යන පීඩාව පිළිබඳ කලින් පැවසූ සේක. “මේ ලෝකයේ නුඹලාට පීඩා තිබේ” (යොහන් 16:33) යනුවෙන් ජේසුස්වහන්සේ පැවසූ සේක. උන්වහන්සේගේ ගෝලයෝ බොහෝ දෙනෙක් ජේසුස්වහන්සේ තුළ වූ තම විශ්වාසය නිසා තම ජීවිත පවා පූජා කළහ. පරීක්ෂාවන් කිතුනු ජීවිතයේ කොටසකි. දෙවියන්වහන්සේ අපගේ සැම ප්‍රශ්නයකින්ම අප ආරක්ෂා කරන්නේ නැත (ක්‍රියා 14:22, 2 තිමෝති 3:12, 1 පේදුරු 4:12). අපෝස්තුළුවරුන්ගේ යුගයේ පවා අන්ත ක්‍රිස්තුස්ගේ ක්‍රියාකාරීත්වය පැවතිණි (1 යොහන් 2:18, 22, 2 යොහන් 7).

අනාගතයේ වන මහා පීඩාවක් පිළිබඳ කලින් පවසා තිබේ ද? බොහෝ කිතුනුවෝ එසේ විශ්වාස කරති. ඇතැම් විට ඔවුහු නිවැරදිය. එහෙත් මිලියන ගණනාවක් වූ ලොව පුරා කිතුනු ප්‍රජාව එයට වර්තමානයේ මුහුණපාති. බොහෝ අය මරා දමනු ලැබේ. සැම කෙනෙක් උදෙසාම මෙයට පෙර තිබූ ආකාරයෙන් පීඩාව වඩා නරක තත්වයේ නැත. සහස්‍ර වර්ෂ දෙකක් පුරා අමාරු කාලයන්ට මුහුණ පෑමට කිතුනුවන්ට සිදු විය. සමහර විට මහා පීඩා කාලය බොහෝ අය සිතනවාට වඩා දීර්ඝ වන්නට පුළුවන.

පීඩා කාලය ආසන්න වුව ද, නැත ද, එය දැනටමත් ආරම්භ වී තිබුණ ද අපගේ කිතුනු වගකීම් එක සමාන වේ. අනාගතය පිළිබඳ අනුමානයන් අප වඩා ක්‍රිස්තුන්වහන්සේ මෙන් වීම

උදෙසා උපකාර කරන්නේ නැත. එසේම මිනිසුන් පසුතැවිලි වීම පිණිස පීඩනයට පත් කරන කල, කණගාටුදායක ලෙස එය වැරදි අන්දමින් සිදු කෙරේ. මහා පීඩාව පිළිබඳ වූ අනුමාන කිරීම අපගේ කාලය යහපත් අන්දමින් භාවිත කිරීමක් නොවේ.

**සහශ්‍රකය**

ක්‍රිස්තුන්වහන්සේ සහ ශුද්ධවන්තයින්ගේ සහශ්‍ර වර්ෂ රජකම් කිරීම පිළිබඳ එළිදරව් 20 කථා කරයි. ඇතැම් කිතුනුවෝ මෙය ක්‍රිස්තුන්වහන්සේගේ පැමිණීමේ දී වසර දහසක් රජකම් කිරීම ලෙස වචනාර්ථයෙන් අර්ථකථනය කරති. තවත් කිතුනුවෝ මෙම සහශ්‍ර වර්ෂය දෘෂ්ටාන්ත ලෙස බලමින්, ක්‍රිස්තුන්වහන්සේගේ පැමිණීමට පෙර සභාව තුළ උන්වහන්සේගේ රජකම් කිරීම සංකේතවත් කරන බව දක්වති.

නිදසුනක් ලෙස, 1,000 යන ඉලක්කම දෘෂ්ටාන්ත ලෙස භාවිත කරනවා ඇත (ද්වීතිය නීති සංග්‍රහය 7:9, ගීතාවලිය 50:10). එසේම එළිදරව් පොතෙහි එය වචනාර්ථයෙන් ගත් බවට සාධක නොමැත. එළිදරව් පොත ලියනු ලැබුවේ විශාල වශයෙන් දෘෂ්ටාන්ත ආකාරයකටය. වෙනත් කිසිම ශුද්ධ ලියවිල්ලක් ක්‍රිස්තුන්වහන්සේගේ පැමිණීමේ දී සිදු වන තාවකාලික රජකම් කිරීමක් පිළිබඳ දක්වන්නේ නැත. ඇත්තෙන්ම දානියෙල් 2:44 වැනි පද රාජධානිය සදාකාලික බවත්, වසර 1,000කට පසුව කිසිම අර්බුදයකින් තොර බවත් පෙන්වයි.

ක්‍රිස්තුන්වහන්සේගේ නැවත පැමිණීමෙන් පසුව ඇත්තේ සහශ්‍ර වර්ෂයක රාජධානියක් පමණක් නම්, ධර්මිෂ්ඨ අයගෙන් පසුව වසර 1,000කින් දුෂ්ටයින් නැගිටුවනු ලැබ, විනිශ්චය කරනු ලබනවා ඇත (එළිදරව් 20:5). එහෙත් ජේසුස්වහන්සේගේ උපමාවන් කිසිම විවේකයක් පිළිබඳ කථා නොකරයි (මතෙව් 25:31-46, යොහන් 5: 28-29).සහශ්‍රකය යන්න ජේසුස්වහන්සේගේ ශුභාරංචියේ කොටසක් නොවන්නේය. එකම දිනයේ ධර්මිෂ්ඨ අය සහ දුෂ්ට අය නැගිටුවනු ලබන බව පාවුල්තුමා පවසයි (2 තෙසලෝනික 1: 6-10).

මෙම මාතෘකාව යටතේ තවත් බොහෝ දේ සාකච්ඡා කිරීමට පුළුවන. එහෙත් මෙහිදී එය අත්‍යවශ්‍ය නැත. සැම දෘෂ්ටි කෝණයකටම සහයෝගය දක්වන ආකාරයට ශුද්ධ ලියවිලි එක් කළ හැකිය. එහෙත් මනුෂ්‍යයෙකු සහශ්‍ර වර්ෂය පිළිබඳ කුමක් සිතුව ද ප්‍රශ්නයක් නැත. මෙය වඩා පැහැදිලිය : එළිදරව් 20 සඳහන් කර ඇති කාල පරිච්ඡේදය ක්‍රමයෙන් අවසන් වනු ඇත. එයට පසුව සදාකාලික සහ තේජාන්විත අලුත් අහසක් සහ අලුත් පොළොවක් ඇති වනු ඇත. එය සහශ්‍රකයට වඩා උතුම්, වඩා යහපත් සහ දීර්ඝ වනු ඇත. එම නිසා, අප වඩා යහපත් අනාගතයක් පිළිබඳ සිතන කල තාවකාලික කොටසක් ගැන නොව, සදාකාලික, පරිපූර්ණ රාජධානිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ. අපට බලාපොරොත්තු වීමට සදාකාලයක් තිබේ!

**ප්‍රීතිමත් සදාකාලය**

සදාකාලය කුමනාකාර වේ ද? අප දන්නේ එහි කොටසක් පමණි (1 කොරින්ති 13:9, 1 යොහන් 3:2). මන්ද අපගේ වචන සහ අදහස් පදනම්ව ඇත්තේ වර්තමාන ලෝකය ඇසුරින් වන බැවිනි. ජේසුස්වහන්සේ අපගේ සදාකාලික විපාකයන්/ ත්‍යාගයන් පිළිබඳ විවිධ ආකාරයෙන් විස්තර කළ සේක : එය වස්තුවක් සම්බ වීමට සමානය, නැතිනම් බොහෝ දේපළ උරුම කරගැනීමට සමානය. නැතිනම් රාජධානියක් පාලනය කිරීමට සමානය, නැතිනම් විවාහ උත්සවයකට සහභාගි වීමට සමානය. එය මේ සියල්ල හා සමාන වේ. එහෙත් එය මේ හා

සමාන කිසිම දෙයක් නොමැති බව කීම වඩා සුදුසුය. අපගේ වචනවලින් විස්තර කරනවාට වඩා ඉතා වැඩියෙන් දෙවියන්වහන්සේ සමඟ අපගේ සදාකාලය ඉතා හොඳය.

දාවිත්තුමා එය මෙසේ පවසයි : "ඔබ මට ජීවන මඟ හෙළි කරන සේක. ඔබ අබිමුවෙහි පිරිපුන් සතුට මට වන්නේය. ඔබ දකුණුපස සැප සම්පත් සදහටම ඇත්තේය" (ගීතාවලිය 16:11). සදාකාලයේ ඉතා හොඳම කොටස වන්නේ දෙවියන්වහන්සේ සමඟ ජීවත් වීමයි, උන්වහන්සේ මෙන් වීමයි, උන්වහන්සේ සැබෑ ලෙසම කුමනාකාරද යන්න දැකගැනීමයි, වඩා සම්පූර්ණ ලෙස උන්වහන්සේ දැනගැනීමයි (1 යොහන් 3:2). දෙවියන්වහන්සේ අප මවා තිබෙන අරමුණ මෙය වන්නේය. මෙය අප තෘප්තිමත් කොට සදහටම ප්‍රීතිය ගෙන දෙනු ඇත.

එසේම වසර 10,000 තුළ දී, පැමිණෙන්නට ඇති විශාල වසර ගණනාවක් තුළ දී අපට ඇති කරදරවල දී සිනහ වෙමින්, අපි තාවකාලික අයව සිටියදී දෙවියන්වහන්සේ කෙතරම් ඉක්මනින් උන්වහන්සේගේ ක්‍රියාව ඉටු කළේද යන්න පිළිබඳ මවිත වෙමින් අපි අපගේ ජීවිත දෙස වර්තමානයේ බලන්නෙමු. එය ආරම්භය පමණි. අවසානයක් ඇත්තේම නැත.

## ගෝලත්වය 101

## ඒකකය 10 ආ



# උත්ථානය : අනාගතය උදෙසා වූ අපගේ බලාපොරොත්තුව



1 කොරින්ති 15: 13-14 පදවල පාවුල්තුමා මෙසේ පවසයි. "මළවුන්ගෙන් උත්ථාන වීමක් නැත්නම්, ක්‍රිස්තුන්වහන්සේත් උත්ථාන කරනු නොලැබූ සේක. ක්‍රිස්තුන්වහන්සේත් උත්ථාන කරනු නොලැබූ සේක් නම් අපගේ දේශනා කිරීම නිරර්ථකය. ඔබගේ ඇදහීමත් නිරර්ථකය."

කිතුදහම මේ භෞතික ජීවිතය උදෙසා පමණක් නම්, අපි මැරී නැවත කිසිදාක නොපවතිමු නම්, අප කරන දේ හෝ, අප ජීවත් වන ආකාරය හෝ අප විශ්වාස කරන දෙය හෝ කුමක් වුව ද ප්‍රශ්නයක් නැත. 19 වන පදයෙහි පාවුල්තුමා පවසන පරිදි, "ක්‍රිස්තුන්වහන්සේ තුළ අපේ බලාපොරොත්තුව මේ ජීවිතයට පමණක් සීමා වූවක් නම්, අපි සියල්ලන්ටම වඩා අනුකම්පා ලැබිය යුතු වෙමු"

අපට අනාගතයක් නොමැති නම්, අපට දැනෙන ප්‍රමාණයට අනුවත්, අපගේ පුළුවන්කමේ ප්‍රමාණයටත් අපගේ ජීවිත යහපත් කාලයක් ගත කිරීම පිණිස යොමු කිරීමට හැකිය (32 පදය). නැවත නැගිටීමක් නැති නම්, ක්‍රිස්තුන්වහන්සේ විශ්වාස කිරීමෙන් අපට කිසි ප්‍රයෝජනයක් නොමැත. මන්ද එයින් පූජා වීම සහ පීඩා විඳීම අර්ථවත් වීමට හැකි නිසාවෙනි. එසේම නැවත නැගිටීමක් නොමැති නම්, ක්‍රිස්තුන්වහන්සේගේ කුරුසිපත් වීමෙන් අප උදෙසා කිසිවක් ලබාගෙන නොමැත. අප තවමත් අපගේ පාපවල සිටින්නෙමු (17 පදය).

ක්‍රිස්තුන්වහන්සේට පමණක් නොව, අපට ද එහෙත් නැවත නැගිටීමක් තිබේ. එසේම එය කිතුනු ඇදහිල්ලේ අත්‍යාවශ්‍යම අංගයක් ද වන්නේය. හුදෙක් අනාගතය උදෙසා පමණක් නොව, අපගේ දිනපතා ජීවිතය උදෙසා ද වූ මෙම ධර්ම නියාමකයේ වැදගත්කම දෙස අපි බලමු. එය අපගේ ජීවිතයේ සෑම දිනකටම අදාළ වන්නේය.

### බයිබලීය සාක්ෂි

පැරණි ගිවිසුම උත්ථාන වීම පිළිබඳ වැඩිපුර දේවල් නොපවසයි. එසකියෙල් සුළු වශයෙන් ඒ පිළිබඳ කථා කරයි. එසේම දානියෙල් ද මඳක් ඒ ගැන කථා කරයි. එහෙත් අපගේ විශ්වාසය පදනම් වන්නේ වැඩි වශයෙන් නව ගිවිසුම මතය. විවිධ උපමාවල දී ජේසුස්වහන්සේ උත්ථානය පිළිබඳ කථා කළ සේක. උන්වහන්සේම තමා නැවත නැගිටීමත් ජීවනයත් බව

පැවසූ සේක (යොහන් 11:25). ක්‍රියා පොතෙහි ස්ථාන කිහිපයකම උත්ථානය පිළිබඳ දක්වා ඇත. එසේම හෙබ්‍රෙව් පොතේ ද ඒ පිළිබඳ දක්වා ඇත. එහෙත් බොහෝ කොටස්වල දී නැවත නැගිටීමක් *තිබෙන බවට* වඩා යමක් අප ඉගෙන ගන්නේ නැත.

මඳක් වැඩිපුර විස්තර සහිතව නැවත නැගිටීම පිළිබඳ දක්වන කොටස් දෙකක් ඇත්තේය. එනම් තෙසලෝනිකයට යවන ලද පාවුල්තුමාගේ පළමුවන හසුන සහ කොරින්තියට යවන ලද ඔහුගේ පළමු හසුන වේ.

1 තෙසලෝනික 4: 13-18 දක්වා පාවුල්තුමා මෙසේ ලියයි.

> "සහෝදරවරුනි, මතු බලාපොරොත්තුවක් නැති සෙසු අය මෙන් ඔබ ශෝක නොවන පිණිස, මියගියවුන් ගැන ඔබ නොදැන සිටීම කිසිසේත් අපගේ කැමැත්ත නොවේ. යේසුන් වහන්සේ නැසී නැවත උත්ථාන වූ සේකැයි අපි අදහමු. එසේම, යේසුන් වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් පරලෝ සැපත් වූ අය උන් වහන්සේ මඟින් දෙවියන් වහන්සේ නැවත ගෙනෙන සේකැයි ද අදහමු. අප දැන් ඔබට කියන්නේ ස්වාමින් වහන්සේම වදාළ කරුණකි. එනම් : ස්වාමින් වහන්සේගේ ආගමනයේ දී ජීවත්ව සිටින අපට පරලෝ සැපත් වූ අයට නොමැති විශේෂ වාසියක් නැති බවය. මන්ද ස්වාමින් වහන්සේම අණ දීමේ ශබ්දය ද, අග්‍ර දේව දූතයෙකුගේ හඬ ද, දෙවියන් වහන්සේගේ හොරණෑ නාදය ද ඇතිව ස්වර්ගයෙන් බැස වදාරණ සේක. ක්‍රිස්තුන් වහන්සේ අදහමින් පරලෝ සැපත් වූ අය පළමුකොට නැඟිටින්නෝය. එවිට ජීවතුන් අතර සිටින අපි, ඔවුන් සමඟ ස්වාමින්වහන්සේ හමු වන පිණිස, වළාකුළුවලින් අහසට ඔසවාගනු ලබන්නෙමු. මෙසේ අපි නිතරම ස්වාමින්වහන්සේ සමඟ සිටින්නෙමු. එහෙයින් මේ වචනවලින් එකිනෙකා සනසන්න."

මෙහිදී, පාවුල්තුමා නැවත නැගිටීමේ කාලය පිළිබඳ මිස, නැවත නැගිටීම සම්බන්ධ වැඩිපුර කථා නොකරයි. නැවත නැගිටීමක් තිබේ. එයට හේතුව වන්නේ අප දන්නා ආකාරයට සැබෑ මනුෂ්‍යත්වයේ ආදර්ශය වන මළවුන්ගෙන් නැවත නැගිටුවනු ලැබූ ජේසුස්වහන්සේය. අපි උන්වහන්සේගේ උත්ථානය විශ්වාස කරන්නෙමු. එම නිසා උන්වහන්සේ තුළ විශ්වාස කරන සියල්ලන්ම නැවත නැගිටුවනු ලබන බව අපි විශ්වාස කරමු. මෙය සිදු වන්නේ ජේසුස්වහන්සේ පොළොවට නැවත පැමිණෙන අවස්ථාවේ දීය. මළා වූ කිතුනුවෝ නැගිටුවනු ලබති. එසේම ජීවත් වන කිතුනුවෝ වෙනස් කරනු ලැබ, ස්වාමින්වහන්සේගේ නැවත පැමිණීමේදී උන්වහන්සේ මුණගැසෙන පිණිස වළාකුළුවලට ඔසවනු ලබති. අපි සදහටම උන්වහන්සේ සමඟ වාසය කරන්නෙමු.

1 කොරින්ති පොතෙහි පාවුල්තුමා වැඩිදුර විස්තර කරයි. උත්ථානයක් ඇති බව පමණක් නොපවසා, උත්ථාන වීමෙන් පසු තත්වය කෙටියෙන් විස්තර කරයි. පළමුවැන්න, ඔහු උත්ථානය බීජයක් පැළ කිරීම හා සමඟ සංසන්දනය කරන්නේය. බීජය පෙනෙන්නේ බීජයක් ලෙසය. එහෙත් එම බීජයේ ස්වභාවය මත පදනම්ව එයින් පැල වන ගස වෙනස් ආකාරයකට දිස් වේ (37-38 පද).

> "මළවුන්ගෙන් උත්ථානය ඊට සමානය. වළලනු ලබන සිරුර දිරා යන්නකි. උත්ථාන කරනු ලබන්නේ නොදිරන්නකි. වළලනු ලබන්නේ අගෞරවාන්විත වූවකි. උත්ථාන කරනු ලබන්නේ තේජාන්විත වූවකි. වළලනු ලබන සිරුර දුබල වූවකි. උත්ථාන කරනු ලබන්නේ ප්‍රබල වූවකි. වළලනු ලබන්නේ ස්වභාවික ශරීරයකි. උත්ථාන කරනු

ලබන්නේ ආධ්‍යාත්මික ශරීරයකි. ස්වභාවික ශරීරයක් ඇති සේ ම ආධ්‍යාත්මික ශරීරයක් ද ඇත (42-44 පද).

අප උත්ථාන වූ පසුව, අපි වෙනස් වන්නෙමු. ඇතැම් විට එය කොළයක් සහ බීජයක් වෙනස් වන්නාක් මෙන් වන්නට පුළුවන. වැදගත්ම වෙනස වන්නේ අපි නොදිරන, තේජාන්විත, ප්‍රබල සහ ආධ්‍යාත්මික ශරීරයක් ලබන්නෙමු. *එසේම* අපි ක්‍රිස්තුන්වහන්සේ මෙන් වන්නෙමු.

> "අපි භෞමික තැනැත්තාගේ ස්වරූපය දරන්නා සේ ම, ස්වර්ගීක තැනැත්තාගේ ස්වරූපය ද දරන්නෙමු. සහෝදරවරුනි, මා කියන්නේ මෙයයි. ලේ මස් සහිත සිරුරට ස්වර්ග රාජ්‍යය උරුම කරගත නොහැක. එසේම දිරා යන්නකට නොදිරන්නක් උරුම කරගත නොහැක. මෙන්න, මම ඔබට අබිරහසක් පවසමි. අපි සියල්ලෝම නොමැරෙන්නෙමු. එහෙත් අන්තිම හොරණෑව පිඹින කල, මොහොතකින්, ඇසිපිය හෙළන සැණෙකින් අපි සියල්ලෝම වෙනස් කරනු ලබන්නෙමු. මන්ද, හොරණෑව පිඹිනු ලබයි. එකල මිය ගිය අය අජරාමර ස්වභාවයෙන් උත්ථාන කරනු ලබන්නාහ. අපි ද වෙනස් කරනු ලබන්නෙමු. දිරන සුලු මේ සිරුර නොදිරන සුලු බවටත්, මැරෙන සුලු මේ ස්වභාවය අමරණීයත්වයට පත් විය යුතුය."

මෙහිදී පාවල්තුමා වෙනස් ආකරයක කථනයක් භාවිත කරයි. එනම් අලුත් ඇඳුම් ඇඳ ගැනීමයි. ඔහු වැඩිපුර අවධාරණය කරන කාරණාව නම්, ඔහු වැඩිපුර දක්වන කාරණාව නම්, අපි නොදිරන සුලු අය වන බවයි. අපගේ ශරීර දිරා නොයනු ඇත. අපි කෙදිනකවත් නොමැරෙන්නෙමු. අපි ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ක්‍රිස්තුන්වහන්සේ මෙන් වෙනස් කරනු ලැබූ අලුත්, තේජාන්විත ශරීර ලබන්නෙමු.

**සදාකාලික වැදගත්කම**

මෙම ධර්ම නියාමකය අපට වැදගත් වනනේ කෙසේ ද? සදාකාලික වැදගත්කම වන්නේ අප සදාකාලිකව ජීවත් වීමයි. හුදෙක් සදාකාලිකව ජීවත් වනවා පමණක් නොව, ක්‍රිස්තුන්වහන්සේ සමඟ අප සදාකාලිකව ජීවත් වන්නෙමුව. එපමණක් නොව, අපට උන්වහන්සේගේ මෙන් තේජාන්විත ශරිර ලැබෙනු ඇත. වර්තමානයේ අපට දක්නට ඇති ප්‍රමාණයට *වඩා ඉතා වැඩියෙන්* වූ බලයෙන් සහ තේජසින්ද යුත් ජීවිතයක් ගත කරන්නෙමු.

අප උදෙසා විශාල විපාකයක් ඇත්තේය. එම විපාකය ක්‍රිස්තු භක්තිකයින් ලෙස ඇතැම් විට අපට ඇති වන අපහසුතාවලට ප්‍රතිඵල වශයෙන් ලැබෙන්නකි. සදාකාලික විපාකය වැදගත් වේ. පාවුල්තුමා කී පරිදි, ඇදහිල්ල මේ ජීවිතය සඳහා පමණක් යහපත් වේ නම්, එහි යහපතක් ඇත්තේ නැත. එහෙත් මෙයට පසුව ජීවිතයක් තිබේ. නැවත නැගිටීමක් තිබේ. එසේම අප වෙනුවෙන් මහත් විපාක ද තබා ඇත්තේය. අප මේ ජීවිතයේ කුමනාකාර පූජාවීම් කළ ද කම් නැත. ඒවා විඳීම ඉතා වටින්නේය. මන්ද අපට එයට වඩා සිය වාරයක් හා ඊටත් වැඩියෙන් මතු පැමිණෙන්නා වූ ලෝකයේ දී ලැබෙනු ඇත. මෙම නිරූපණයේ ඉතාම වැදගත් කොටස වන්නේ උත්ථානයයි.

**දිනපතා වැදගත්කම**

ඉහත දක්වා ඇති පරිදි උත්ථානය පිළිබඳ වූ අපගේ විශ්වාසයට වර්තමානයේ අපගේ ජීවිතයට ප්‍රතිවිපාක ඇත්තේය. නිදසුනක් ලෙස අප වටා සිටින බොහෝ දෙනා ක්‍රිස්තුන්වහන්සේ විශ්වාස නොකළ ද, උත්ථානය පිළිබඳ වූ දැනගැන්ම උන්වහන්සේ විශ්වාස කිරීම නිසා ඇති වන අමාරුකම් සහ පීඩා සමඟ කටයුතු කිරීමට පහසුවක් සපයයි. අපගේ ජීවිතයේ සහ සේවයේ ප්‍රශ්න පැනනගින කල අපි නොනවතින්නෙමු. කමු, බොමු, ප්‍රීතිමත් වෙමු. මන්ද කිසිවකින් ප්‍රශ්නයක් නැත. යනුවෙන් අපි නොකියන්නෙමු. අනාගතයක් ඇති බව අපි දකින්නෙමු. මේ ජීවිතය වටිනාකමක් තිබේ. අපි අපගේ අනාගතය මනසේ තබාගෙන ජීවත් විය යුතු වෙමු.

උත්ථානය පිළිබඳ ධර්ම නියාමකය විනිශ්චය පිළිබඳ ධර්ම නියාමකය හා එක්ව යන්නේය. ජේසුස්වහන්සේ කී ආකාරයට, ඇතැම් අය ජීවිතයේ නැවත නැගිටීමටත්, තවත් අය විනිශ්චයේ නැවත නැගිටීමටත් උත්ථාන කරනු ලබන්නෝය. මෙය අප ජීවත් වන ආකාරය පිළිබඳ දෙවියන්වහන්සේ සලකන බව කියා පාන්නේය. අප ජීවත් වන ආකාරය පිළිබඳ පැවසීමට යමක් උන්වහන්සේට තිබේ. එසේම අප ජීවත් වන ආකාරය පිළිබඳ *ගණන් දීමට* උන්වහන්සේ අප කැඳවන සේක.

විනිශ්චය දිනයේ දී අපට ණයෙන් නිදහස් වීමට හැකි වන්නේ කෙසේද යන්න සුබ අස්න අපට පවසයි. ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ල තුළින් අපට ධර්මිෂ්ඨකම ලැබෙන බව එය අපට පවසයි. සුබ අස්න සැදී ඇත්තේ උත්ථානය හා විනිශ්චය පිළිබඳ යථාර්ථයන් මත පදනම්වය. උත්ථානයක් තිබීමෙන් සුබ අස්නේ අත්‍යාවශ්‍ය බව පැහැදිලි කරන්නේය. එසේම එය සුබ ආරංචියක් වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්නේය.

ශුභාරංචිය යහපත් ආරංචියක් වන්නේ විශ්වාස කරන අයට පමණක් නොවේ. *තවමත්* විශ්වාස නොකරන අයට ද එය ශුභ ආරංචියකි. අප දේශනා කරන්නා වූ වචනයට *අසීමිත* වැදගත්කමක් තිබේ. අපි යහපත් හැඟීම් සහිත අවුරුදු කිහිපයක් ගැන හෝ යහපත් දේවල් සහිත අවුරුදු 70ක් සම්බන්ධයෙන් හෝ කථා නොකරන්නෙමු. අප කථා කරන්නේ සදාතන ජීවනයක් සම්බන්ධවය. මේ ජීවිතයේ ලැබිය හැකි සියල්ලටම වඩා ඉතා හොඳ වූ සදාකාලයක් පිළිබඳවය. එම නිසා, අපි ක්‍රිස්තුන්වහන්සේට සේවය කරමින් සිදු කරන කාරණා ශුභාරංචියට උපකාර කරමින් සිදු කරන දේවල් සිදු කිරීම වටින්නේය. එය ශුභාරංචිය ඇසීමට අවශ්‍ය සියල්ලන්ට වැදගත් වන්නේය.

උත්ථාන වීම සම්බන්ධ කරුණු සුබ අස්න අන් අය සමඟ බෙදාගැනීමේ වැදගත්කම අවධාරණය කරන්නේය. පාවුල්තුමා උත්ථානය සම්බන්ධ පරිච්ඡේදය අවසන් කරන්නේ මේ ආකාරයෙනි. “එහෙයින් මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, ස්වාමින්වහන්සේ තුළ ඔබගේ සේවය නිරර්ථක නොවන බව ඔබ දන්නා බැවින් ස්ථිර වන්න. නොසෙල් වී සිටින්න. ස්වාමින්වහන්සේගේ සේවයෙහි අධික ලෙස නිරත වන්න” (58 පදය). උත්ථානය යනු හුදෙක් අනාගතය පිළිබඳ රසවත් අගයක් නොමැති ඉතා සුළු දේවල් නොවන්නේය. එහි අපගේ වර්තමාන ජීවිතවල ප්‍රායෝගික ප්‍රතිවිපාක අන්තර්ගත වේ. එය වැඩ කිරීමට අපට හේතුවක් සපයන්නේය. අප මුහුණපාන අමාරුකම් කුමනාකාර වුව ද ඒවා දරාගැනීමට හේතුවක් සපයන්නේය.

උත්ථානය වර්තමාන කිතුනු පැවැත්මට ද අදාළ වන්නේය. රෝම 6 අපි මෙය දකින්නෙමු. "එබැවින් අපේ බෞතිස්ම ස්නාපනයෙන් ක්‍රිස්තුන් ජේසුස්වහන්සේ හා සමඟ ඒකාබද්ධ වූ අප සියල්ලන්ම එම බෞතිස්ම ස්නාපනයෙන් උන්වහන්සේගේ මරණයෙහි, උන්වහන්සේ හා සමඟ ඒකාබද්ධ වූ බව ඔබ නොදන්නහු ද?" (4 පදය). 6 වන පදයෙහි පාවුල්තුමා "මින් මතු අප පාපයට වහල් නොවන පිණිස අපේ පාපී ස්වභාවය නැති වන සේ අපගේ පූර්ව මිනිස් ගතිය උන්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබූ බව" පැහැදිලි කරන්නේය.

පාවුල්තුමා කථා කරන්නේ හැසිරීමෙහි වෙනස් වීමක් පිළිබඳවය. අපි ක්‍රිස්තුන්වහන්සේ සමඟ අප හඳුනාගත් කල, පාපයේ ක්‍රියා මරා දමන්නෙමු. ඒවා අපගේ ජීවිතවලින් බැහැර කරන්නෙමු. ක්‍රිස්තුන්වහන්සේ අලුත් ජීවිතයකට නැගිටුවනු ලැබූ ලෙස, අපි අලුත් ආකාරයකට ගමන් කරමින් ජීවත් වන්නෙමු. එමනිසා අපගේ හැසිරීම ක්‍රිස්තුන්වහන්සේගේ මරණය සහ උත්ථානය පිළිඹිබු කරන්නේය. පැරණි දෙයින් ඉවත් වී අලුත් දෙයට ඇතුළත් වන්නෙමු.

11- 13 දක්වා පදවල පාවුල්තුමා අපට මෙසේ පවසයි. "ඔබත් එසේම පාප විමුක්තිය ලත් අය බව ද, ක්‍රිස්තුස් ජේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ උදෙසා ජීවත් ව සිටින්නන් බව ද සිතට ගන්න. ඔබ කායික තෘෂ්ණාවලට අවනත නොවන ලෙස මින්මතු ඔබගේ මැරෙන සුලු ශරීරයෙහි පාපය රජකම් නොකෙරේවා. තවද ඔබේ ඉන්ද්‍රියයන් අධර්මිෂ්ඨකමේ ආයුධ වන ලෙස පාපයට භාර නොදෙන්න. එසේ නොකර මළවුන් කෙරෙන් උත්ථාන වූ අය මෙන් දෙවියන්වහන්සේට කැප වී, ඔබේ ඉඳුරන් ධර්මිෂ්ඨකමේ ආයුධ වන ලෙස උන්වහන්සේට භාර කරන්න."

උත්ථාන වීමක් ඇති නිසාවෙන් අපි අලුත් සහ වෙනස් ආකාරයකට ජීවත් විය යුතු වෙමු. මාංශයේ තෘෂ්ණාවන්ට සේවය කරනු වෙනුවට, අපි ස්වාමින්වහන්සේට සේවය කිරීම සොයන්නෙමු. මන්ද අපි උන්වහන්සේ සමඟ සදහටම සිටින්නට යන්නෙමු. ක්‍රිස්තුන්වහන්සේ තුළ ඇදහිල්ල තුළින් වරදට පත් කරනු ලැබීමෙන් නිදහස් වීමට අපට පුළුවන. එහෙත් දෙවියන්වහන්සේගේ සමාව දීම, උන්වහන්සේ අප ජීවත් වන ආකාරය පිළිබඳ සැලකිලිමත් නොවන බව අදහස් නොකරයි. උන්වහන්සේ තවමත් අප ගැන සලකන සේක. තවමත් අණ දෙන සේක. එසේම ජීවිතයේ අලුත් ආකාරයකට ගමන් කිරීමට උත්ථානය පිළිබඳ තේරුම් ගැනීම අපට ප්‍රයෝජනවත් වේ.

1 යොහන් 3: 2-3 දක්වන ආකාරයට, "ප්‍රේමවන්තයෙනි, අපි දැනටම දෙවියන්වහන්සේගේ දරුවෝය. එහෙත් අනාගතයේ දී අපි කොයි ආකාර අය වන්නෙමුදැයි තවම ප්‍රකාශ වී නැත. කෙසේ වෙතත් උන්වහන්සේ ප්‍රකාශ වන විට අපි උන්වහන්සේට සමාන වන බව දනිමු. මන්ද උන්වහන්සේගේ ප්‍රකෘති ස්වභාවයෙහිම අපි උන්වහන්සේ දකින්නෙමු. උන්වහන්සේ පිළිබඳ මේ බලාපොරොත්තුව ඇති හැම කෙනෙක්ම උන්වහන්සේ පිරිසිදුව සිටින්නාක් මෙන්, තමන් ද පිරිසිදු කරගනිති."

4-6 දක්වා පදවල යොහන්තුමා වැඩි දුරටත් මෙසේ පවසයි. අපි ක්‍රිස්තුන්වහන්සේ තුළ ජීවත් වන කල, පව් නොකරන්නෙමු. අපි නිහඬ වන්නෙමු. එහෙත් අපි සියල්ලෝම කරන ආකාරයට අපි පව් කරන්නෙමු නම්, අප උදෙසා ක්‍රිස්තුන්වහන්සේ වන මැදහත්කාරයෙක් සිටින සේක. එසේම අප උදෙසා වූ සමඟ කිරීමේ පූජාව දැනටමත් පූජා කර ඇත්තේය. එම නිසා අප වරදට පත් කරනු නොලබන්නේය. එහෙත් උත්ථානය පිළිබඳ විශ්වාස කරන මිනිස්සු තමාගේ ජීවිත රටාව වෙනස් කරගන්නා බවට වූ කාරණය තවමත් එසේමය. ක්‍රිස්තුන්වහන්සේ සමඟ

අපි සදහටම ජීවත් වන බව දැනගැනීම උන්වහන්සේ සමග❑ වර්තමානයේ අපි ජීවත් වන ආකාරය වෙනස් කරන්නේය.

අවසාන වශයෙන්, නැවත නැගිටීම පිළිබඳ දැනගැනීම මරණය පිළිබඳ නව දැක්මක් ලබා දෙන්නේය. මරණය එහි අවසානය නොවන බව අපි දනිමු. අපි අපගේ ආදරණීයයන් නැවත දකින බව අපි දනිමු. ජීවිතය සදාකාලයටම ඇති බව අපි දනිමු. හෙබ්‍රෙව් 2:14-15 අපට මෙසේ පවසයි. "එසේ කළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයා මරණය මඟින් විනාශ කොට, දිවි ඇති තාක් මරණ භයින් වහල්කමට යටත්ව සිටින සියල්ලන් නිදහස් කරන පිණිසය."

නැවත නැගිටීම පිළිබඳ දැනගැනීමෙන් අපි මරණය පිළිබඳ ඇති බියෙන් නිදහස් වන්නෙමු. එම සතුරා පරාජයට පත් කර ඇත. ක්‍රිස්තුන්වහන්සේ දිනාගත් ජයග්‍රහණය ලබාගත් අය අපි වන්නෙමු. උන්වහන්සේ මරණය පරාජය කළ සේක. අපි උන්වහන්සේගේ ජීවිතය බෙදා ගන්නෙමු. එනම් මරණ බියෙන් නිදහස් වීමයි. අපි 1 තෙසලෝනික පොතෙන් කියවූවාක් මෙන් අනෙක් මනුෂ්‍යයින් මෙන් අපි වේදනාවට පත් නොවන්නෙමු. අපට වේදනාව ඇත්තේය (එසේ තිබුණාට කමක් නැත. මන්ද මරණය පරාජිත සතුරෙක් වන්නේ නමුත්, තව දුරටත් සතුරෙකුව සිටින නිසාවෙනි.) එහෙත් අපට අනෙක් අයට නැති බලාපොරොත්තුවක් ඇත්තේය.

නැවත නැගිටීම පිළිබඳ දැනුම අනාගතය සම්බන්ධ බලාපොරොත්තුවෙන් සහ සහතිකයෙන් යුතුව විශ්වාසවන්ත ලෙස මරණයට පත්වීමට අපට උපකාර කරයි. ඉතා හොඳම දෙය තවමත් පැමිණ නැති බව අපි දනිමු. 1 තෙසලෝනික 4:18 පවසන පරිදි, "එහෙයින් මේ වචනවලින් එකිනෙකා සනසන්න".

ගෝලත්වය 101

ඒකකය 10 ඇ



# ශුභාරංචිය බෙදාගැනීම

ජේසුස්වහන්සේ උත්ථාන වීමෙන් පසුව සහ සති කිහිපයක් තුළදී පසු ගෝලයින්ට දර්ශනය වීමෙන් අනතුරුව උන්වහන්සේ ඔවුන් ඔලිව කන්දට රැගෙන ගිය සේක. ගෝලයෝ උන්වහන්සේගෙන් මෙසේ ඇසුවෝය. "ස්වාමිනි, ඔබ යළිත් ඉශ්රායෙල් රාජ්‍ය පිහිටුවන කාලය මෙය ද?" (ක්‍රියා 1:6). වෙනත් වචනවලින් පවසතොත් දිවැසිවරුන්ගේ කාල සටහනෙහි දැන් අප සිටින්නේ කොහේ ද? අපි අවසානයට ළඟා වී සිටින්නෙමු ද?

ජේසුස්වහන්සේ පිළිතුරු දෙමින් "පියාණන්වහන්සේ ස්වකීය ආධිපත්‍යයෙන් නියම කළ කාලයන් ද, අවස්ථාවන් ද දැන ගැනීම ඔබට අයිති කාරියක් නොවේ. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල ඔබ බලය ලබන්නහුය. එවිට ඔබ ජෙරුසලමෙහි ද, මුළු ජුදයෙහි හා සමාරියෙහි ද පොළොවේ සීමාන්තයන් දක්වා ද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය" (7-8 පද). වෙනත් වචනවලින් නම්, ඔබ දිවැසිවර කාල සටහන දැනගැනීම අවශ්‍ය නොවේ. ඔබ කළ යුතු කාර්ය නම් ශුභාරංචිය දේශනා කිරීම වන්නේය.

යේසුන්වහන්සේ ගෝලයින්ට පැවසූ දේ තවමත් සත්‍යයක්ව පවතී. දිවැසි වාක්‍යයේ අපගේ ස්ථානය වන්නේ දින ගණනය කිරීම නොවේ. ශුභාරංචිය දේශනා කිරීමයි. දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි ඊ ළඟ කොටස සම්බන්ධයෙන් අප කරදර විය යුතු නැත. අප *වර්තමානයේ* සිටින ඓතිහාසික ස්ථානයේ දී කාර්යක්ෂම ලෙස ක්‍රියා කළ යුතු වේ. මෙය සභා යුගයයි. ශුභාරංචිය දේශනා කරන යුගයයි. උන්වහන්සේ අපට පැවරූ ලෙස කාර්ය ඉටු කිරීම අවශ්‍ය වන්නේය.

"මහා නියෝගයෙහි" විස්තර කර ඇති පරිදි, ශුභාරංචිකරණය අපගේ මෙහෙයේ කේන්ද්‍රය වන්නේය. "එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ගෝලයින් කරන්න. පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බෞතීස්ම- ස්නාපනය කරන්න. මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න" (මතෙව් 28:19-20).

**අපෝස්තුළුවරුන් උදෙසා පමණක් ද?**

කෙසේ වෙතත්, මනුෂ්‍යයෝ කිහිප දෙනෙක් පුදුම වෙමින්, මෙසේ කියති. "මෙම පදවල ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අණ කර තිබෙන්නේ ගෝලයින්ට නිසා වර්තමානයේ සිටින අපට එය අදාළ වන බව දැනගන්නේ කෙසේ ද? අපගේ භූමිකාව වන්නේ ආදර්ශයක් දීම පමණක් නොවන්නේ ද? පසුව අපෙන් ඒ පිළිබඳ අසන අයට පමණක් ශුභාරංචිය පැවසීම නොවන්නේ ද? ඇත්තෙන්ම බයිබලය එය ප්‍රසිද්ධියේ දේශනා කිරීමට අපට පවසා නැත."

සමහර අය එම අණ දෙනු ලැබුවේ ගෝලයින්ට පමණක් බවත්, අපට නොවන බවත් කියමින් තර්ක කරන්නට පුළුවන. එය සත්‍යයකි. එම ආඥාව දෙනු ලැබුවේ ගෝලයින්ටය. ශුභාරංචිය දේශනා කිරීමටත්, ඇදහිලිවන්තයින් බෞතීස්ම කිරීමටත් ඔවුහු අණ ලැබූහ. එහෙත් කතාන්දරයට තවත් ටිකක් එකතු වේ.

මතෙව් 28:19-20 අපි නැවත බලමු. ජේසුස්වහන්සේ තමා අණ කළ සියල්ලට කීකරු වීමට මනුෂ්‍යයින්ට උගන්වන ලෙස ගෝලයින්ට කී සේක. ඔවුන් වෙත උන්වහන්සේගෙන් වූ එක් ආඥාවක් වූයේ දේශනා කිරීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ශුභාරංචිය ප්‍රකාශ කිරීමට ජේසුන්වහන්සේ කළ ආඥාව ගෝලයෝ ඇදහිලිවන්තයින්ට ඉගැන්වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස, ජේසුස්වහන්සේ ස්ව- අනන්‍යතාවයෙන් යුතු ආඥාවක් දුන් සේක. අනාගත ගෝලයෝ මෙම ආඥාව ඉදිරියට ගෙන යා යුතුය. තමාගේ පාඨකයින් කීකරු විය යුතු ආඥාවක් දක්වමින් මතෙව් තම ග්‍රන්ථය අවසන් කරන්නේය.

20 වන පදය ජේසුස්වහන්සේ 20 වන පදය ජේසුස්වහන්සේ “මම ද කල්පාන්තය දක්වා සදහටම ඔබ හා සමඟ සිටිමි” යනුවෙන් පොරොන්දු වූ බව පවසයි. ජේසුස්වහන්සේ හුදෙක් ගෝලයින් සමඟ සිටින බවට පොරොන්දු වූයේ නැත. එහෙත් සියවස් ගණනාවක් තුළ සභාව සමඟ සිටින බවට පොරොන්දු වූ සේක. එසේම ආඥාව ද මුල් ගෝලයින්ගේ සිට යුගාන්තය දක්වා වූ සභාවට අදාළ වන්නේය. ශුභාරංචිය ප්‍රකාශ කිරීමට ක්‍රිස්තුන්වහන්සේ ගෝලයින් සහ වෙනත් ඇදහිලිවන්තයින් සමඟ සිටිමින් ඔවුන් පොළඹවන ලද බව නව ගිවිසුම වාර්තා කරන්නේය.

**“දේශනා කිරීම” පිළිබඳ වචනයක්**

දේශනා කිරීම සඳහා දුන් අණ සභාව විසින් ක්‍රියාත්මක කළ ආකාරය සම්බන්ධ නව ගිවිසුමේ නිදසුන් විමසා බැලීමට පෙර, “දේශනා” “දේශනා කිරීම” යන්නෙන් පරිවර්තනය වී ඇති ග්‍රීක වචනවල අදහස අපි විමසා බලමු. සෑම ඇදහිලිවන්තයෙක්ම “දේශනා කිරීම” උදෙසා කැඳවා ඇති බව ඇතැම් කිතුනුවෝ සිතති. ඔවුහු කණ්ඩායමක් ඉදිරියේ නැගී සිටිමින් ශුභාරංචිය පිළිබඳ දක්ෂ ලෙසත්, ප්‍රබල ලෙසත් කථා කිරීම “දේශනා කිරීම” ලෙස තේරුම් ගනිති. ස්වභාවයෙන්ම එවන් වූ “දේශනාවක්” කිරීමට සන්නද්ධ වී ඇත්තේ ඉතා සුළු පිරිසක් පමණි. එසේම එය බලපෑමක් ඇති කරන ආකාරයෙන් සහ වගකීමක් සහිතව කරන්නේ සුළු පිරිසකි.

එහෙත් “දේශනා කිරීම” යන්න ග්‍රීක වචනයක් පරිවර්තනය කළ හැකි එක් ආකාරයකි. බහුල වශයෙන් “දේශනා කිරීම” යන්නට පරිවර්තනය වී ඇති එක් වචනයක් වන්නේ එවෝගෙලිසෝ *ැම්ටටැකස*□*ද* යන්නයි. එහි අර්ථය වන්නේ “යහපත් ආරංචියක් ගෙන ඒම හෝ ප්‍රකාශ කිරීම” යන්නයි. ඇත්ත වශයෙන්ම, “දේශනා කිරීම” යන්නෙහි පොදු තේරුම් ගැනීම ශුභාරංචිය ප්‍රකාශ කිරීම උදෙසා වැදගත් ක්‍රමයක් වේ. එහෙත් එම පොදු තේරුම්ගැනීම ශුභාරංචිය ගෙන ඒමේ එකම ක්‍රමය නොවේ.

නිදසුනක් ලෙස ලූක් 1:19 සහ 2:10 පදවල එවෝගෙලිසෝ යන පදය පරිවර්තනය වී ඇත්තේ ශුභාරංචිය “පෙන්වීම” හෝ “ගෙන ඒම” යනුවෙනි. “දේශනා කිරීම” යන අපගේ සංකල්පය තව දුරටත් පුළුල් ලෙස ශුභාරංචිය අනෙක් අයට දීම සම්බන්ධ විවිධ වූ ආකාරවලින් ද ගත යුතු වේ. එවෝගෙලිසෝ යන්නෙහි ඇති සංකල්පය වන්නේ පුද්ගලයෙකු හෝ පුද්ගලයින් ශුභාරංචියේ යහපත් පණිවිඩය වෙනත් මනුෂ්‍යයින් හරහා තවත් මනුෂ්‍යයින්ට දීමයි. දේශනා කිරීමට අමතරව එය කිරීම උදෙසා තවත් බොහෝ ක්‍රම ඇත්තේය.

“දේශනා කිරීම” සම්බන්ධයෙන් පරිවර්තනය වී ඇති තවත් වචනයක් වන්නේ කෙරුස්සෝ *නැරමිද* යන්නයි. මෙහි අර්ථය වන්නේ දැනුම් දීමක්, ප්‍රකාශ කිරීම, දැනගැනීමට සැලැස්වීම යන්න වේ. ඇත්තෙන්ම මෙය වෙනත් ආකාරවලින් ද සිදු කළ හැකිය. මාක් 16:15 “දේශනා කිරීම” යන්නට පරිවර්තනය වී ඇත්තේ කෙරුස්සෝ යන පදය වේ.

විවිධ පරිවර්තකයෝ එවෝගෙලිසෝ හෝ කෙරුස්සෝ හෝ යන්න පරිවර්තනයේ දී විවිධ වචන භාවිත කරති. නිදසුනක් ලෙස ලූක් 9:2 පදයෙහි දැක්වෙන කෙරුස්සෝ යන්න “දේශනා කිරීම” සහ “ප්‍රකාශ කිරීම” යන දෙවිධියටම විවිධ අනුවර්තනවල දී පරිවර්තනය වී ඇත. ලූක් 1:19 පදයෙහි දුක්වෙන එවෝගෙලිසෝ යන්න “මෙම සතුටුවායක ආරංචිය අසන්න”, “මෙම සුබ අස්න ඔබ වෙත ගෙනෙමි” සහ “මෙම ශුභ ආරංචිය ඔබට කියමි” යන ආකාරවලින් පරිවර්තනය වී ඇත.
ශුභාරංචිය වෙනත් අය වෙත ගෙන යාම යන්න, දේශනා කිරීම සම්බන්ධ ජනප්‍රිය අදහස්වලට සීමා නොවේ. ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ තුළ තිබෙන දෙවියන්වහන්සේගේ කරුණාව අන් අයට දැන්වීම විවිධ ආකාරවලින් සිදු විය හැකිය. අපි සියලු දෙනාම කුමන හෝ ආකාරයකට ශුභාරංචිය අන් අය වෙත ගෙන යාම උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් දීමනා ලබා ඇත්තෙමු.

**මුල් සභාවේ ශුභාරංචිකරණය**

ගෝලයෝ ජේසුස්වහන්සේගේ අණ ක්‍රියාත්මක කිරීම ක්‍රියා පොත පුරාම අපි දකිමු. ඔවුහු ජේසුස්වහන්සේ ක්‍රිස්තුන්වහන්සේ බවත්, උන්වහන්සේ කුරුසිපත් කරනු ලැබ නැව. උත්ථාන කරනු ලැබූ බවත්, උන්වහන්සේ තුළින් ගැළවීම ලබා ගත හැකි බවත් ප්‍රකාශ කළහ. එය ක්‍රිස්තු කේන්ද්‍රිය පණිවුඩයක් විය. එය “ශුභාරංචිමය” හෝ “ශුභාරංචිය පදනම් /මූලික” පණිවුඩයක් විය.

එහෙත් ශුභාරංචිය ප්‍රකාශ කරනු ලැබුවේ ගෝලයින් විසින් පමණක් ද? ඇත්තෙන්ම එසේ නොවේ. ස්තේපන් ක්‍රිස්තුන්වහන්සේගේ නාමයෙන් උතුම් දේ කළේය. එසේම ජේසුස්වහන්සේ ක්‍රිස්තුන්වහන්සේ බවට තර්ක කළේය (ක්‍රියා 6:8-10). සැන්හෙඩ්‍රියන් සභාව ඉදිරියේ දී ශුද්ධ ලියවිලිවල කලින් දක්වා ඇති ධර්මිෂ්ඨ තැනැන්වහන්සේ, මෙසියස්වහන්සේ ජේසුස්වහන්සේ බවට ඔහු ප්‍රබල ලෙසින් තර්ක කළේය (ක්‍රියා 7:51-52). එසේම ඔහුගේ මරණය ක්‍රිස්තුන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ සමාව දීම සම්බන්ධ කදිම සාක්ෂියකි (60 පදය).

දෙවියන්වහන්සේ ස්තේපන් ආනුභාවයෙන් පූර්ණ කළ සේක. එසේම ඔහු බොහෝ අය උන්වහන්සේ ආනුභාවයෙන් පූර්ණ කළේය. “ඒ දවසේ දී ජෙරුසලමෙහි වූ සභාවට විරුද්ධව දරුණු පීඩාවක් හට ගත්තේය. එවිට ප්‍රේරිතයන් හැර, සෙසු සියල්ලෝ ජුදයේ සහ සමාරියේ පළාත්වල විසුරුවනු ලැබූහ.... විසුරුවනු ලැබූ අය දේශයෙහි සැරිසරමින් දේව වචනය දේශනා කළහ (එවෝගෙලිසෝ) (ක්‍රියා 8:1, 4). ඔවුන්ගේ ජීවිත අනතුරේ තිබිය දී පවා, මෙම ගිහි කිතුනුවෝ ශුභාරංචිය අන්‍යයන්ට ලබා දුන්හ. ඔවුහු කළේ කිතුනුවන් ස්වභාවිකවම කරන කාර්යකි. ඔවුන්ට ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මඟ පෙන්වනු ලැබ, ඔවුන්ට දෙවියන්වහන්සේ ආශිර්වාදයක් ලෙස ලබා දී ඇති ශුභාරංචිය අන් අයට පැවසීමට බල කරනු ලැබිණි. ලූක්තුමා අපට අනුගමනය කිරීමට හොඳ ආදර්ශයක් ලබා දෙමින් මෙය ඉදිරිපත් කරන්නේය.

මී ළඟට, පිලිප් "සාමාරියේ නුවරකට ගොස් එහි ක්‍රිස්තුන්වහන්සේ ගැන දේශනා කළේය" (5 පදය). දෙවියන්වහන්සේ ඇතැම් සමාරිතයින් ගැළවීමට පැමිණවීමෙන් මෙම ශුභාරංචිකරණයට ආශිර්වාද කළ සේක. ශුභාරංචිය නොකඩවා ව්‍යප්ත විය.

"ස්තේපන් නිසා හටගත් පීඩාව කරණකොටගෙන විසුරුවනු ලැබූ අය, ජුදෙව්වරුන්ට මිස, අන් කිසිවෙකුට දහම ප්‍රකාශ නොකොට, පිනිසිය ද, සයිප්‍රසය ද, අන්තියෝකිය ද දක්වා ගමන් කළහ. එහෙත් ඔවුන් අතරෙන් සයිප්‍රසයේ ද, සිරේනියේ ද වැසියන් වූ සමහරෙක් අන්තියෝකියට පැමිණ, ග්‍රීකයන්ටත් කථා කරමින්, ජේසුස් ස්වාමින්වහන්සේ පිළිබඳ ශුභාරංචිය ප්‍රකාශ කළහ. ස්වාමින්වහන්සේගේ බලය ඔවුන් මත පහළ විය. එකල විශාල සංඛ්‍යාවක් අදහාගෙන ස්වාමින්වහන්සේ වෙතට හැරුණාහ" (ක්‍රියා 11:19-21). නැවතත්, ජේසුස්වහන්සේ පිළිබඳ ශුභාරංචිය කීම සඳහා දෙවියන්වහන්සේ උන්වහන්සේගේ මනුෂ්‍යයින් ආනුභාවයෙන් පූර්ණ කළ සේක. එසේම එහි ප්‍රතිඵලවලට උන්වහන්සේ ආශිර්වාද කළ සේක.

පාවුල්තුමාට අන්‍ය ජාතීන්ගේ අපෝස්තුළුවරයා ලෙස විශේෂ ආඥාවක් ලැබිණි. එහෙත් අන්‍ය ජාතීන් හා සමඟ ශුභාරංචිය බෙදාගත් එකම පුද්ගලයා පාවුල්තුමා නොවන බව ලූක්තුමා අපට පවසයි. "පාවුලු ද, බාර්ණබස් ද තවත් බොහෝ දෙනෙකු සමඟ ස්වාමින්වහන්සේගේ සුබ අස්න උගන්වමින් දදේශනා කරමින් ද අන්තියෝකියෙහි නැවතී සිටියහ" (ක්‍රියා 15:34). මෙම ආඥාව අදාළ වන්නේ ගෝලයින්ට පමණක් වන බව පැහැදිලිවම ලූක්තුමා සිතුවේ නැත. සභාවේ අනාගත පරම්පරාව කළ යුතු වන්නේ කුමක් ද යන්න පිළිබඳ ආදර්ශයක් ලෙස ඔහුගේ පොත පෙනී සිටියි.

එසේම ක්‍රියා පොතෙහි අපට අපොල්ලොස්ගේ නිදර්ශනය ද ගත හැකිය. ඔහු "ජේසුස්වහන්සේ ක්‍රිස්තුන් බව ශුද්ධ ලියවිල්ලෙන් පෙන්වා දෙමින්, ජුදෙව්වරුන්ගේ තර්ක ප්‍රසිද්ධියේ ම එඩිතර ලෙස බිඳ හරිමින් පරාජය කෙළේ ය" (ක්‍රියා 18:28). පසුව පාවුල්තුමා බොහෝ අය ක්‍රිස්තුන්වහන්සේ දේශනා කිරීම පිළිබඳ ප්‍රීති වන්නේය (පිලිප්පි 1:15-18, කෙරුස්සෝ යන්න 15 වන පදයෙහි භාවිත කර තිබේ. "ප්‍රකාශ කිරීම" යන අරුත් දෙන කටාග්ගෙලෝ, යන්න 16 සහ 18පදවල භාවිත කර ඇත).

පාවුල්තුමා තිමෝතිට (2 තිමෝති 4:5) ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකුගේ වැඩය කරන්නට කීවේය. (*එව්ගෙලිස්ටස්*- සුබ ආරංචියක් ගෙන එන්නා). දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟගෙන් සමහරෙකුට ශුභාරංචිය කීමේ දීමනාව දුන් සේක (එපීස 4:11). පුහුණුව ලැබීමෙන් ඔවුන්ගේ සේවය තව වඩා කාර්යක්ෂමව ඉටු කළ හැකි වේ. සභාව මනුෂ්‍යයින් තමා වෙතට පැමිණෙන තුරු බලා සිටියහොත් සභාවේ මෙහෙය සම්පූර්ණ කළ නොහැකි වේ. සභාව ක්‍රිස්තුන්වහන්සේගේ නාමයෙන් පිටතට යාම සහ ශුභාරංචියෙන් මනුෂ්‍යයින් ස්පර්ශ කිරීම අවශ්‍ය වේ.

**පෞද්ගලික ශුභාරංචිකරණය**

එක් මට්ටමකින් හෝ වෙනත් මට්ටමකින් ශුභාරංචිකරණයට සභාවේ සෑම සාමාජිකයෙක්ම, ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ සෑම ගෝලයෙක්ම සහභාගි වන්නේය. අප ඇදහිල්ලෙහි මුහුකුරා යන විට, සෑම සාමාජිකයෙක්ම කිතුනු පණිවුඩය සෑහෙන පමණ වඩා හොඳින් දැනගනියි. හෙබ්‍රෙව් 5:12 "මේ කාලයෙහි ඔබ ගුරුවරුන්ව සිටින්න ඕනැය" කියමින් කිතුනුවෙකුව සිටින සෑම කෙනෙකුම ස්වල්ප කාලයකින් වෙනත් අයට ශුභාරංචිය ඉගැන්වීමට හැකි අය විය යුතුය.

ජේසුස් ක්‍රිස්තුන්වහන්සේ කරණකොටගෙන සමගි කරනු ලැබූ සැම දෙනාටම දෙවියන්වහන්සේ "සමගි කිරීමේ පණිවුඩය" දී තිබේ (2 කොරින්ති 5: 18-19). ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ ශුභාරංචිය තුළින් දෙවියන්වහන්සේ හා සමඟ සමගි වීමට අපි අනෙක් අය ධෛර්යමත් කළ යුතු වෙමු.

ක්‍රිස්තුන්වහන්සේගේ නියෝගවලට සභාව කීකරු වන ආකාරය සහ අපි අපගේ ජීවිත හසුරුවන ආකාරය "ක්‍රිස්තුන්වහන්සේගේ සුබ අස්නට ඔබින ආකාරයේ විය යුතුය" (පිලිප්පි 1:27). මනුෂ්‍යයෝ අප වෙත ඇවිත් උපකාර ඉල්ලති. මෙය ආදර්ශයෙන් සුබ අස්න ප්‍රකාශ කිරීමකි. එසේම එයට ප්‍රකාශ කිරීමට ඇති අපගේ වගකීමට වඩා යමක් ඇතුළත් වේ. අපි මේ දෙකම කළ යුතු වෙමු. අපගේ ආදර්ශයේ කොටසක් වන්නේ අප තුළ ක්‍රියා කරන තැනැන්වහන්සේට මහිමය දීමට කැමත්තක් අප තුළ තිබීම වේ.

අපි ශුද්ධ සෙනඟක් වන්නෙමු. අප කැඳවනු ලැබ ඇත්තේ "අන්ධකාරයෙන් ස්වකීය විස්මපත් ආලෝකයට ඔබ කැඳවාගත් තැනැන්වහන්සේගේ මහිමාන්විත ක්‍රියා දන්වනු පිණිසය" (1 පේදුරු 2: 9). අපි මෙය සිදු කරන්නේ කෙසේ ද? එක් ක්‍රමයක් වන්නේ "ඔබගේ යහපත් ක්‍රියා දැක විනිශ්චය දවසේ දී දෙවියන්වහන්සේට ගෞරව කරන පිණිස ඔවුන් අතර යහපත් හැසිරීමකින් කල් යැවීමෙනි" (12 පදය).

එය යහපත් හැසිරීම සම්බන්ධයෙන් පේදුරුතුමා ලියා දක්වන "ඔබට ඇති බලාපොරොත්තුව ගැන ඔබෙන් ප්‍රශ්න කරන සියල්ලන්ට පිළිතුරු දීමට නිතර සූදානම්ව සිටින්න" යන සන්දර්භයෙනි (1 පේදුරු 3:15). ආදර්ශය සහ ශුභාරංචිකරණය එක්ව ගමන් කරන්නේය.

වර්තමාන ලෝකයේ, කිතුනුවන්ගේ ජීවිත රටාව වෙනස්ව ඇත. ලෝකය සර්ව ශුභවාදී සහ උදාසීන වන විට, කිතුනුවන්නේ බලාපොරොත්තුව සහ අරමුණ පිළිබඳ වඩා සැලකිලිමත් විය යුතු වේ. මනුෂ්‍යයින්ට, ඔවුන් මේ වන විට තේරුම් ගත්ත ද, නැත ද ක්‍රිස්තුන්වහන්සේගේ සමාදානය අවශ්‍යව තිබේ. ඔවුන් උපකාර ඉල්ලන කල, අපි ක්‍රිස්තුස් ජේසුස්වහන්සේ තුළ බලාපොරොත්තුව තබා ඇත්තේ මන්දැයි අපගේ වචනවලින් පැවසීමට අපට හැකිය. යහපත් ආදර්ශයක් සහ අපගේ ඇදහිල්ලට ප්‍රඥාවන්ත සාක්ෂි දැරීමක් සුබ අස්න දේශනා කිරීමට උපකාර වේ.

"ඔබ වංක, හිතුවක්කාර පරම්පරාවක් මධ්‍යයෙහි, දෙවියන්වහන්සේගේ නිර්දෝෂ දරුවන්ව" (පිලිප්පි 2:15) සිටින ලෙස පාවුල්තුමා කිතුනුවන් ධෛර්යවත් කළේ ය. එහෙත් පාපය ප්‍රතික්ෂේප කිරීමෙන් පමණක් සමාජයේ දී කිතුනුවන්ගේ භූමිකාව අවසන් වන්නේ නැත. පාවුල්තුමා ඒ සමඟම පවසන වචන වන්නේ "ඔවුන් අතර ජීවන පණිවුඩය ප්‍රදානය කරමින්, අඳුරු ලෝකයක දීප්තිමත් තාරකා මෙන් බබළන්නහුය" (16 පදය) යන්නයි. ඔවුන්ගේ ක්‍රියා ඔවුන්ගේ වචන හා සමඟ බැඳී පවතී. යහපත් ක්‍රියාවන් ශුභාරංචිය හා එක්ව යන්නේය. එසේම ඒවා එකට බැඳී පැවතීම ශුභාරංචිකරණයේ කාර්යක්ෂම බවකි.

## පිළිතුරක් දීමට සූදානම්ව සිටීම

සෑම කිතුනුවෙක්ම ඇදහිල්ලේ මූලික කාරණා පිළිබඳ පැහැදිලි කිරීමට හැකි අයෙක් විය යුතු වේ. ඇතැම් විට එය ඉතා දක්ෂ කථා විලාසයකින් නොව, ඇත්තෙන්ම තර්ක කිරීමේ ක්‍රමයකින් ද නොව, එහෙත් නිසැක ලෙස පැවසීමට හැකි විය යුතුය. අපි අපගේ ජීවිත තුළ තිබෙන දෙවියන්වහන්සේගේ සමාදානය දන්නෙමු. අපි නැවත නැගිටුවනු ලබන බව දනිමු. අපගේ ජීවිතය වටිනා එකක් බව දනිමු. අපගේ පාපවලට අපට සමාව ලැබී තිබෙන බව අපි දනිමු. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ පුත්‍රයාණන් අප වෙනුවෙන් මැරෙන්නට එවූ බව අපි දනිමු. එසේම උන්වහන්සේ දැන් අප උදෙසා ජීවත් වන බව ද දනිමු. අපි අප උදෙසාම ජීවත් වීම නවතා, උන්වහන්සේ උදෙසා ජීවත් වීම ආරම්භ කිරීම උන්වහන්සේට අවශ්‍ය බව අපි දනිමු (2 කොරින්ති 5:15).

කිතුනුවන්ට බයිබලයේ හැම පදයක්ම පැහැදිලි කිරීමට නොහැකිය. එහෙත් ඔවුන් විශ්වාස කරන්නේ මන්දැයි දැක්වීම පිණිස ඔවුන්ගේම සාක්ෂිය දීමට ඔවුන්ට පුළුවන. ඔවුන්ට සෑම කරුණක්ම නිශ්චිතවම ඔප්පු කිරීමට නොහැකිය. එසේම එය අවශ්‍ය වන්නේ ද නැත. ඔවුන්ගේ සාක්ෂිය විශ්වසනීය එකක් වන්නේ "ක්‍රිස්තුන්වහන්සේ තුළ ඔවුන්ගේ යහපත් හැසිරීම" මත වේ (1 පේදුරු 3:16). අප තුළ ජීවත් වන බලාපොරොත්තුව පිළිබඳ අප පිළිතුරක් දෙන කල, අපගේ ක්‍රියාවල සහ අපගේ වචනවල සාක්ෂිය ඇත්තේය. මේ දෙකම කාර්යක්ෂම වීමට එක්ව යා යුතු අතර, එසේ නොමැති විට ඒවායෙහි කැමැත්ත සිදු කරන්නේය.

දෙවියන්වහන්සේගේ කරුණාව පිළිබඳ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් සෑම සාමාජිකයෙක්ම එක හා සමාන ලෙස දීමනා ලබා නැත. එසේම සෑම සාමාජිකයෙක්ම එය එකම ආකාරයට සිදු නොකරන්නේය. "ශුභාරංචිකරණය" යන්න ශුභාරංචිය සමඟ නොකඩව අනෙක් අයට ප්‍රවේශ වීම යන්න අරුතින් ගත් කල, ආත්මික දීමනාවකි. සෑම කිතුනුවෙකුටම මෙම සුවිශේෂී දීමනාව තිබේ යයි අපේක්ෂා කිරීමට අපට නොහැකිය. එහෙත් සෑම කිතුනුවෙක්ම පිළිතුරක් දීමට සූදානම්ව සිටින පිණිස අණ ලබා ඇත්තේය. අපගේ අසල්වාසීන් ක්‍රිස්තුන්වහන්සේ නොදැන ජීවත් වනවාට වඩා, උන්වහන්සේ දැනගැනීමේ ආශිර්වාදය ලැබීම අප සියල්ලන්ටම අවශ්‍ය වේ. සුදුසු අවස්ථාවන් ඇති විට දෙවියන්වහන්සේ විසින් පාවිච්චි කරනු ලැබීම පිණිම සෑම කිතුනුවෙක්ම සූදානම්ව සිටිය යුතු වේ.

පෞද්ගලික ශුභාරංචිකරණය නොසලකා හැරිය යුතු නොවේ. ශුද්ධාත්මයාණන්වහන්සේ සෑම කිතුනුවෙක්ම වචනයෙන් සහ හැසිරීමෙන් මඟපෙන්වන සේක. එයින් අදහස් වන්නේ අපි සෑම කෙනෙක්ම ප්‍රජාවෙහි යහපත් ආදර්ශයක් ඇතිව සිටිය යුතු බවත්, අප තුළ ජීවත් වන ඇදහිල්ල සම්බන්ධයෙන් ඵලදායී සාක්ෂිකරුවන් විය යුතු බවත් ය. ඔබ වැඩි වශයෙන් වෙන් වී සිටින පුද්ගලයෙක් නම්, ඔබට ඇති පළමු ප්‍රමුඛතාවය ආගම නොවන්නේ නම්, ප්‍රශ්නයක් නොවේ. ඔබට දෙවියන්වහන්සේ ලබා දී තිබෙන්නා වූ දීමනාව ලෙස ක්‍රිස්තුනවහන්සේ උදෙසා ජ්වලිතව සිටින්න. එහෙත් පිළිතුරක් දීම පිණිස සෑම විටම සූදානම්ව සිටින්න. සූදානම්ව සිටීමට නිවැරදි වචන පමණක් නොව, මහත් ආශාවක් තිබීම ද ඇතුළත් වේ.

ශුභාරංචිය අන් අයට පැවසීම සම්බන්ධයෙන් වූ ක්‍රිස්තුන්වහන්සේගේ අණ ඉටු කිරීම අප විසින් නොකඩවා කළ යුතු කාර්යයකි. අපි ශුභාරංචිකරණයට කැපවී එය ඉටු කරන්නේ ඒ නිසාවෙනි. එය අපි ජේසුස් ක්‍රිස්තුන්වහන්සේට කීකරු වීමේ එක් ක්‍රමයකි. එය අපගේ නියෝගවල එක් කොටසකි. අපගේ වගකීමේ එක් කොටසකි.